# දෙවැනි කොටස

# දෙවැනි කොටස

## ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් හා කටයුතු

පිටුව


| | | |
|---|---|---|
| 1. | ගිණුම්කරණ සහ මූල්‍ය | 1 |
| 2. | බැංකු අධීක්ෂණ | 65 |
| 3. | බැංකු විද්‍යා පියෙස | 68 |
| 4. | සන්නිවේදන | 69 |
| 5. | ව්‍යවහාර මුදල් | 71 |
| 6. | දේශීය කටයුතු | 74 |
| 7 | ආර්ථික පර්යේෂණ | 77 |
| 8. | සේවක අර්ථසාධක අරමුදල | 82 |
| 9. | විනිමය පාලනය | 86 |
| 10. | පහසුකම් කළමනාකරණ | 91 |
| 11. | මූල්‍ය කටයුතු | 91 |
| 12. | මූල්‍ය බුද්ධි ඒකකය | 93 |
| 13. | මානව සම්පත් | 95 |
| 14. | තොරතුරු තාක්ෂණ | 100 |
| 15. | අභ්‍යන්තර විගණන | 102 |
| 16. | ජාත්‍යන්තර මෙහෙයුම් | 103 |
| 17. | නීති සහ අනුකූලතා කටයුතු | 106 |
| 18. | සාර්ව විචක්ෂණතා අධ්‍යයන | 106 |
| 19. | ගෙවීම් සහ පියවීම් | 107 |
| 20. | ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ | 110 |
| 21. | රාජ්‍ය ණය | 111 |
| 22. | ප්‍රාදේශීය සංවර්ධන | 113 |
| 23. | ප්‍රාදේශීය කාර්යාල කළමනාකරණ | 118 |
| 24. | අවදානම් කළමනාකරණ | 119 |
| 25. | ලේකම් දෙපාර්තමේන්තුව | 121 |
| 26. | ආරක්ෂක සේවා | 122 |
| 27. | කාර්ය මණ්ඩල සේවා කළමනාකරණ | 123 |
| 28. | සංඛ්‍යාන | 124 |
| 29. | ක්ෂුද්‍ර මූල්‍ය ආයතන අධීක්ෂණ | 128 |
| 30. | බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ | 129 |
| 31. | පුහුණු හා සංවර්ධන | 134 |

# 1. ගිණුම්කරණ සහ මූල්‍ය

## මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේ 2016 වසර සඳහා ක්‍රියාකාරී වාර්තාව

### 1. හැඳින්වීම

ශ්‍රී ලංකා මහ බැංකුවේ විගණන කමිටුව 2001 වසරේ දී ස්ථාපිත කළ අතර 2009 වසරේ දී එය මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුව ලෙස නැවත නම් කරන ලදී. කමිටුව විසින් ප්‍රතිපත්ති සහ බැංකුවේ මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලන සහ අවදානම් කළමනාකරණ පද්ධති, අනුකූලතා, අභ්‍යන්තර විගණන සහ බාහිර විගණන යන ක්ෂේත්‍රයන්හි විගණනයට අදාළ කරුණු පිළිබඳව මුදල් මණ්ඩලයට උපදෙස් ලබාදීම සිදු කරයි. කමිටුවෙහි නිර්දේශ සහ ක්‍රියාකාරිත්වය කාර්තුමය වාර්තා මගින් සහ අවශ්‍ය පරිදි අනිකුත් අවස්ථාවන්හි දී මුදල් මණ්ඩලයේ සලකා බැලීම සඳහා වාර්තා කරනු ලබයි.

### 2. මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේ සංයුතිය

මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේ සභාපති වශයෙන් මුදල් මණ්ඩලයෙන් පත් කරන ලද සාමාජිකයකු කටයුතු කරන අතර එහි සෙසු සාමාජිකයන් ලෙස බාහිර විගණන වෘත්තීයවේදීන් දෙදෙනෙක් කටයුතු කරති. මුදල් මණ්ඩලයේ ලේකම්, මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේ ද ලේකම් ධූරය උසුලනු ලබන අතර අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ කමිටුවේ සහකාර ලේකම් ලෙස කටයුතු කරයි. කමිටුවේ ලේඛන කටයුතු සඳහා අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව පහසුකම් සලසනු ලබයි. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු, නිරීක්ෂකයෙකු ලෙස කමිටු රැස්වීම්වලට සහභාගි වේ.

මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුව මුදල් මණ්ඩලයේ අතුරු කමිටුවක් වන අතර 2016 දෙසැම්බර් මස 31 දිනට සංයුතිය පහත පරිදි වේ.

i) ඒ.එන්.ෆොන්සේකා මහතා - සභාපති (2016.08.16 සිට ක්‍රියාත්මක වන පරිදි)

ii) එම්.ආර්.මිහුලාර් මහතා - සාමාජික

iii) ඒ.එම්.ජේ.පැට්‍රික් මහත්මිය - සාමාජික

මුදල් මණ්ඩලයේ හිටපු සාමාජිකයෙකු වූ ආර්.ඒ.ජයතිස්ස මහතා 2016.05.24 දින දක්වා කමිටුවේ සභාපති ලෙස සේවය කළ අතර මුදල් මණ්ඩලයේ සාමාජිකයෙකු වන එම්.රාමනාදන් මහත්මිය 2016.05.25 දින සිට 2016.08.15 දක්වා සභාපති ධූරය දරණ ලදී. කමිටු රැස්වීම්වලට සහභාගි වන අනෙකුත් නිලධාරීන් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුකූලතා නිලධාරී සහ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ අදාළ නිලධාරීන් සහභාගී වෙති. කමිටුවේ සභාපති විසින් දෙපාර්තමේන්තු ප්‍රධානීන් අවශ්‍ය වූ විට කැඳවීම් කරනු ලබයි. ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව සාකච්ඡා කිරීමේ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන ගණකාධිකාරී සහ විගණකාධිපති විසින් පත්කළ විගණන ආයතනයේ ශ්‍රී ලංකා මහ බැංකු බාහිර විගණනය සඳහා අනුයුක්ත කර ඇති හවුල්කරු ද කමිටුවට සහභාගී වෙති.

කමිටුව අවම වශයෙන් වසරකට හය (06) වතාවක් එහි සභාපතිගේ තීරණය මත හෝ මුදල් මණ්ඩලයේ විධානයන් මත රැස්විය යුතුය. කමිටුවේ ලේකම් විසින් කමිටු රැස්වීම් කැඳවනු ලබයි. රැස්වීමක් සඳහා අවශ්‍ය ගණ පූර්ණය වනුයේ සභාපති ඇතුළු සාමාජිකයන් දෙදෙනෙකි.

### 3. 2016 වසරේ දී ක්‍රියාත්මක කළ කාර්යයන්

2016 වසර තුළ දී රැස්වීම් අටක් (08) පැවැත්වූ කමිටුව පහත කරුණුවලට අදාළව මුදල් මණ්ඩලය වෙත නිර්දේශයන් ඉදිරිපත් කරන ලදී.

අ) <u>මූල්‍ය වාර්තාකරණය:</u>

කමිටුව විසින්,

i) 2015 වසර සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන විගණනය මත නිකුත් කරන ලද අතුරු නිරීක්ෂණ පත්‍රිකාව සමාලෝචනය කර ගිණුම්කරණ ප්‍රතිපත්තීන්ට සිදු කළ යුතු වෙනස්කම්, සුවිශේෂී ගනුදෙනු සඳහා ගිණුම්කරණයේ දී පවත්නා වෙනත් ක්‍රම සහ බැංකුවේ මූල්‍ය වාර්තාවන්හි හෙළිදරව් කිරීමෙහි පැහැදිලි බව වැඩිදියුණු කිරීමේ නිර්දේශ මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී.

ii) 2015 වර්ෂය සඳහා කළමනාකාරීත්ව ලිපිය සමාලෝචනය කර ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යයන් හා ක්‍රියා පටිපාටීන්හි අභ්‍යන්තර පාලනයන් වැඩිදියුණු කිරීමට අවශ්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්තීන්ට සහ ගිණුම්කරණ ක්‍රමයන්ට සිදු කළ යුතු වෙනස්කම් පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

ආ) <u>අභ්‍යන්තර පාලනයන් සහ අවදානම් කළමනාකරණ පද්ධති</u>

කමිටුව විසින් ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව, ජාත්‍යන්තර මෙහෙයුම් දෙපාර්තමේන්තුව ආදී විවිධ දෙපාර්තමේන්තුවල අභ්‍යන්තර පාලනයන් සහ අවදානම් කළමනාකරණ පද්ධතීන්හි ප්‍රමාණවත් බව සහ සඵලතාව සමාලෝචනය කර අදාළ උපදෙස් ලබා දෙන ලදී.

ඇ) <u>අනුකූලතාව:</u>

කමිටුව විසින්,

i) මූල්‍ය වාර්තාකරණයේ හෝ ඊට අදාළ කරුණු සම්බන්ධව සිදුවිය හැකි වැරදි පිළිබඳ වාර්තා කිරීමට සේවා නියුක්තිකයන් සහ බාහිර පාර්ශවයන්ට අවකාශ ලබා දෙමින් පවත්නා අභ්‍යන්තර පාලනයන් සමාලෝචනය කර උපදෙස් ලබාදෙන ලදී.

ii) අභ්‍යන්තර පාලනයන්හි සඵලතාවය ඇගයීම සඳහා වන ක්‍රියාපටිපාටීන් පිළිබඳව සමාලෝචනය කර උපදෙස් ලබා දෙන ලදී.

ඈ) <u>අභ්‍යන්තර විගණනය:</u>

කමිටුව විසින්

i) අභ්‍යන්තර විගණන අධිකාරී පත්‍රය සමාලෝචනය කර සංශෝධනය කරන ලද අතර එසේ සංශෝධනය කරන ලද අධිකාරී පත්‍රය සඳහා මුදල් මණ්ඩලයේ අනුමැතිය ලබා ගන්නා ලදී.

ii) අදාළ වන වෘත්තීය ප්‍රමිතීන්ට අනුකූලව කාර්යක්ෂමව අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ කාර්යයන් සිදු කරන බව තහවුරු කර ගැනීම සඳහා පිළිගත් ස්වාධීන බාහිර විගණකයෙකු විසින් නිකුත් කරන ලද බාහිර ගුණාත්මකභාවය සමාලෝචන වාර්තාව පරීක්ෂා කර බලන ලදී.

iii) අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව යොදාගනු ලබන අවදානම පදනම් වූ විගණන ක්‍රමවේදය සමාලෝචනය කරන ලදී.

iv) අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව මගින් පිළියෙළ කරන ලද වාර්ෂික අභ්‍යන්තර විගණන සැලසුම සහ තුන් අවුරුදු උපාය මාර්ගික විගණන සැලසුම සමාලෝචනය කර මුදල් මණ්ඩලයේ අනුමැතිය ලබා ගන්නා ලදී.

v) අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් දෙපාර්තමේන්තු ප්‍රධානීන් හට පෙන්වා දුන් නිරීක්ෂණයන් මත වූ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සහ පසු විපරම් තත්ත්වයන් සමාලෝචනය කරන ලදී.

vi) අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් තොරතුරුවලට නිසි ලෙස ප්‍රවේශ වීම පිළිබඳ ප්‍රමාණවත් බව තක්සේරු කොට ඒ සම්බන්ධව මුදල් මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

vii) අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ කාර්යයන්හි විෂය පථය සංශෝධනය කරමින් මේ දක්වා සිදු කරන ලද පූර්ව විගණන සත්‍යාපන කාර්යයන් නවතා දැමීම සහ ඒ වෙනුවට අවදානම පදනම් කරගත් විගණන පිවිසුම යටතේ එතැන්, හදිසි සහ පරීක්ෂා ආවේක්ෂණය (test check) හඳුන්වා දීම සිදු කරන ලදී.

viii) අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව සතු සම්පත්හි ප්‍රමාණවත් බව සමාලෝචනය කර එම දෙපාර්තමේන්තුව සඳහා ශක්‍යතා සංවර්ධන වැඩපිළිවෙළක් සාකච්ඡා කරන ලදී.

ඉ) <u>බාහිර විගණනය:</u>

කමිටුව විසින්,

i) 2015 වසර සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන විගණනය මත නිකුත් කරන ලද අතුරු නිරීක්ෂණ පත්‍රිකාව, එයට සපයන ලද කළමනාකාරීත්වයේ ප්‍රතිචාර සහ බාහිර විගණනයේ නිර්දේශයන් සමාලෝචනය කරන ලදී.

ii) 2015 වසර සඳහා කළමනාකාරීත්ව ලිපිය, එයට කළමනාකාරීත්වයේ ප්‍රතිචාර සහ බාහිර විගණනයේ නිර්දේශයන් සමාලෝචනය කරන ලදී.

**4. මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේ රාමුවට සංශෝධනයන්**

කමිටු රැස්වීම් කිහිපයක දී සමාලෝචනය කළ මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේ රාමුව සංශෝධනය කරන ලද අතර එයට 2016 සැප්තැම්බර් මස දී මුදල් මණ්ඩලයේ අනුමැතිය ලබාගන්නා ලදී.

**ශ්‍රී ලංකා මහ බැංකුව**

**2016 දෙසැම්බර් 31 දිනට කළමනාකාරිත්ව ප්‍රකාශය**

**ස්වකීය අරමුණුවලට අදාලව ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම්කටයුතු භාවය සහ මූල්‍ය කාර්යසාධනය**

ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය සහ ගෙවීම් පද්ධති පරිපාලනය, අධීක්ෂණය සහ නියාමනය කිරීම සඳහා වගකිවයුතු අධිකාරිය ලෙස මහ බැංකුව මුදල් නීති පනත යටතේ ස්ථාපිත කරන ලදී. එම පනතේ විධිවිධාන පරිදි ප්‍රධාන පරමාර්ථයන් වන ආර්ථික සහ මිල ස්ථායිතාවය හා මූල්‍ය පද්ධති ස්ථායිතාවය සාක්ෂාත් කර ගැනීමේ වගකීම බැංකුව වෙත පැවරී ඇත.

එබැවින්, මහ බැංකුවේ ගිණුම්කටයුතුභාවය සහ එකී මෙහෙයුම් වල සාර්ථකත්වය වන්නේ එම ප්‍රධාන පරමාර්ථයන් කරා ළඟාවීම සඳහා වන ප්‍රතිපත්ති හා මෙහෙයුම් වල සඵලතාවය විනා එහි ලාභදායීත්වය නොවන්නේය. මහ බැංකුව, වෙනත් පුද්ගලික හෝ රාජ්‍ය ආයතනවලින් වෙන් කොට හඳුනා ගැනෙන මූලික ලක්ෂණය නම් මෙම ව්‍යවස්ථාපිත පරමාර්ථයන්ය. පොළී අනුපාතය සහ විදේශ විනිමය අනුපාතය කෙරෙහි බලපාන මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන් මගින් ලාභ ජනනය කිරීමේ අද්විතීය හැකියාවක් මහබැංකුව සතු බැවින් බැංකුව විසින් ලාභදායිත්ව ප්‍රවේශයක් අනුගමනය කළේ නම් ලාභ ජනනය වන අතර ප්‍රධාන පරමාර්ථ නොසලකා හැරීමක් වනු ඇත. එබැවින් මහ බැංකුවේ ආර්ථික හා මිල ස්ථායිතා මූල්‍ය පද්ධති ස්ථායිතා පරමාර්ථයන්, ලාභදායිතා අරමුණු වලින් වියුක්ත කළයුතු අතර එය හුදෙක් ආනුශාංගික අරමුණක් වියයුතු වන්නේය.

මහ බැංකුවේ ප්‍රතිපත්ති මෙහෙයුම්, විනිමය අනුපාත කළමනාකරණය, මුදල් නෝට්ටු නිකුතුව ආදිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵල, උපලබ්ධි වටිනාකම් මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශනයන්හි අදාල ගිණුම්කරණ සහ වාර්තාකරණ ප්‍රමිතයන්ට අනුකූලව සටහන් කරන අතර, මෙය සමස්ත රාජ්‍ය ගිණුම්කරණ කටයුතුභාවයෙන් කොටසක් සාක්ෂාත් කර ගැනීමක් ලෙස මූල්‍ය ගිණුම්කරණ කටයුතුභාවය සඳහා පදනම සපයනු ලබන අතර, මෙම ප්‍රකාශයන්හි වාර්තා කර ඇති මූල්‍ය කාර්යසාධනය සහ අවබෝධ කර ගැනීම එම පසුතලයේ පිහිටා කළයුතුය.

මුදල් නීති පනතේ 42 හා 43 වගන්ති ප්‍රකාර විගණකාධිපති විසින් කරනු ලබන බාහිර විගණනයකට ශ්‍රී ලංකා මහ බැංකුව භාජනය වේ. ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතයන්ට අනුකූල බවට සහතික වීම සඳහා ජාත්‍යන්තර විගණක ප්‍රමිතයන්ට අනුකූලව විගණනයක් කිරීම සඳහා අර්න්ස්ට් සහ යංග් වරලත් ගණකාධිකාරීවරුන්ගේ සේවය විගණකාධිපතිතුමා විසින් ලබාගෙන ඇත.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | පීඑෆ්/එච්/සීබීඑස්එල්/1/16/1 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2017 මාර්තු 28 දින |

ගරු මුදල් අමාත්‍යතුමා,

**ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මුදල් නීති පනතේ 42(2) වගන්තිය (422 අධිකාරිය) ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

**මතය**

2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, මූල්‍ය ප්‍රකාශන සටහන් සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති ඇතුළත් සාරාංශයකින් සමන්විත ශ්‍රී ලංකා මහ බැංකුවේ (බැංකුව) මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය හා මුදල් නීති පනතේ 42(2) වගන්තිය (422 අධිකාරිය) සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම විගණනය කරගෙන යාමේදී, ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලවීම පරීක්ෂා කිරීම සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලි වරලත් ගණකාධිකාරී සමාගමක් මට සහාය විය.

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ සියලු ප්‍රමාණාත්මක කරුණුවලින් සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට (IFRS) අනුකූලව සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**මතය සඳහා පදනම**

මා විසින් ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISA) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. එම ප්‍රමිතීන් යටතේ මාගේ වගකීම් මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම් කොටසේ තවදුරටත් විස්තර කරනු ලැබේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආචාර ධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළවන ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට අනුකූලව බැංකුව කෙරෙහි මම ස්වාධීන වන අතර, එම අවශ්‍යතාවයන්ට අනුකූලවන පරිදි මාගේ වෙනත් ආචාරධර්ම වගකීම් මා විසින් සම්පූර්ණ කර ඇත.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்ல, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**මුදල් මණ්ඩලයේ වගකීම**

මූල්‍ය ප්‍රකාශන ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම මුදල් මණ්ඩලයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අඛණ්ඩ පැවැත්මෙන් යුතුව පවත්වා ගැනීම සඳහා අඛණ්ඩ පැවැත්මට අදාලවන කරුණු අදාළ වන පරිදි හෙළිදරව් කිරීම සහ ගිණුම්කරණයේ අඛණ්ඩ පැවැත්ම පදනම යොදාගනිමින් පවත්වා ගැනීම සඳහා බැංකුවේ හැකියාව ඇගයීම සම්බන්ධයෙන් මුදල් මණ්ඩලය වගකිව යුතු වේ.

**මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් වශයෙන් මූල්‍ය ප්‍රකාශන වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන බවට සාධාරණ තහවුරුවක් ලබාගැනීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාවක් නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරන තහවුරුවක් යන්න,ඉහල මට්ටමේ,තහවුරුවක් වන නමුත් ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISA) අනුකූලව විගණනයන් ක්‍රියාත්මක කිරීමේදී සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගැනීම සඳහා තහවුරුවක් නොවේ. සාවද්‍ය ප්‍රකාශන වංචා හෝ වැරදි හේතුවෙන් පැන නැගිය හැකි අතර එය තනිකර හෝ සමස්තයක් ලෙස ගත්කල ප්‍රමාණාත්මක ලෙස සැලකේ නම්, භාවිතා කරන්නන්ට මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්ව ආර්ථික තීරණ ගැනීම සඳහා බලපෑනු ලබන බවට සාධාරණව අපේක්ෂා කළ හැකිය.

ජාත්‍යන්තර විගණන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව විගණනයේ කොටසක් ලෙස සමස්ත විගණනය තුළ මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය විචක්ෂණභාවය පවත්වා ගෙන යන ලදී. එසේම මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි මූල්‍ය ප්‍රකාශන පිළිබඳ ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ එම අවදානම්වලට ප්‍රතිචාර දක්වන විගණන පරිපාටි සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සහ මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ප්‍රමාණාත්මක සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීම. වංචාවල ප්‍රතිඵලයක් ලෙස ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් සොයා නොගැනීම වැරදි එළිදරව් නොකිරීමට වඩා වැඩි අවදානමකට හේතු වන අතර දුස්සන්ධානය, කූට රචනය,

අභිප්‍රායික අත්හැරීම්, වරදවා දැක්වීම් හෝ අභ්‍යන්තර පාලනය අක්‍රීය කරන වංචා, මෙයට හේතුවේ.

- * අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විගණනයට අදාළවන අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගන්නා නමුත් බැංකුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකෙරේ.

- * යොදාගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල අදාළත්වය හා ගිණුම්කරණ ඇස්තමේන්තු සහ මුදල් මණ්ඩලය විසින් කරන ලද අදාළ හෙළිදරව් කිරීම් පිළිබඳ සාධාරණත්වය ඇගයීම.

- * අඛණ්ඩ පැවැත්ම පදනම් කරගත් ගිණුම්කරණය පිළිබඳ මුදල් මණ්ඩලයේ යොදාගැනීම පිළිබඳ අදාළත්වය නිගමනය කිරීම සහ ලබාගත් විගණන සාක්ෂි පදනම් කරගෙන, අඛණ්ඩ පැවැත්මක් සහිතව පවත්වා ගෙන යාමට බැංකුවේ හැකියාව පිළිබඳ සැලකිය යුතු සැකයකට හේතුවන සිද්ධිවලට හෝ කරුණුවලට අදාළවන ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවතින්නේද යන්න නිගමනය කිරීම. ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවතින බවට මා විසින් නිගමනය කෙරේ නම් හෝ මාගේ මතය විකරණය කිරීම සඳහා එම හෙළිදරව් කිරීම් ප්‍රමාණාත්මක නොවේ නම් මූල්‍ය ප්‍රකාශනවල අදාළ හෙළිදරව් කිරීම් පිළිබඳ මාගේ විගණන වාර්තාවට අවධානය යොමු කිරීම අවශ්‍ය වේ. මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගන්නා ලද විගණන සාක්ෂි මාගේ නිගමනයන්ට පදනම් වේ. කෙසේ වුවද අනාගත සිද්ධි හෝ තත්වයන් බැංකුවේ අඛණ්ඩ පැවැත්ම නතර කිරීමට හේතු විය හැක.

- * හෙළිදරව් කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම ව්‍යුහය හා අන්තර්ගතය ඇගයීම සහ සාධාරණ ඉදිරිපත් කිරීම ඉටු කරගැනීමට පාදක වූ ගනුදෙනු හා සිද්ධි මූල්‍ය ප්‍රකාශනවලින් නියෝජනය වේද යන්න ඇගයීම.

මාගේ විගණනයේදී හඳුනාගත් අනෙකුත් කරුණු අතර සැලසුම් කරන ලද විෂය පථය, විගණනයේ කාලය සහ අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු යම් අඩුපාඩු ඇතුළත් සැලකිය යුතු සොයාගැනීම් සම්බන්ධයෙන් මුදල් මණ්ඩලය වෙත මා විසින් සන්නිවේදනය කරනු ලැබේ.

අත්සන්කලේ :

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

## ශ්‍රී ලංකා මහ බැංකුව

### 2016 දෙසැම්බර් 31 වැනි දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය

| | සටහන | 2016 රු. 000 | 2015 රු. 000 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **විදේශීය මූල්‍ය වත්කම්** | | | |
| මුදල් සහ මුදල් සමානයන් | | **423,783,737** | 557,474,685 |
| ලාභ හෝ අලාභ මත සාධාරණ මිලට ඇති සුරැකුම්පත් | 5 | **43,278,755** | 35,779,665 |
| විකුණුම් සඳහා වු ආයෝජන | 5 | **348,544,650** | 352,054,482 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 6 | **198,880** | 4,145 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මු.අ.) සම්බන්ධ වත්කම් | 7 | **117,008,340** | 83,636,350 |
| අනිකුත් ලැබිය යුතු දෑ | | **6,175,049** | 5,075 |
| **මුළු විදේශීය මූල්‍ය වත්කම්** | | **938,989,411** | 1,028,954,402 |
| **දේශීය මූල්‍ය වත්කම්** | | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | 8 | **351,426,470** | 102,866,995 |
| රජයට දෙන ලද කාලීන අත්තිකාරම් | 9 | **83,306,771** | 151,131,671 |
| බැංකු සඳහා දෙන ලද ණය | 10 | **484,043** | 886,357 |
| මූල්‍ය සහ අනිකුත් ආයතනයන්හි හිමිකරු ප්‍රාග්ධන ආයෝජන | 11 | **41,095** | 41,095 |
| අනිකුත් වත්කම් | 12 | **12,322,596** | 11,164,424 |
| **මුළු දේශීය මූල්‍ය වත්කම්** | | **447,580,975** | 266,090,542 |
| **මුළු මූල්‍ය වත්කම්** | | **1,386,570,386** | 1,295,044,944 |
| **විදේශීය මූල්‍ය නොවන වත්කම්** | | | |
| රන් | 13 | **111,009,339** | 97,723,836 |
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| තොගය | 14 | **6,114,861** | 3,419,964 |
| අනෙකුත් ලැබිය යුතු දෑ හා කලින් ගෙවීම් | | **7,226,801** | 14,347,811 |
| දේපල පිරියත සහ උපකරණ | 15 | **18,132,390** | 15,422,315 |
| අස්පෘශ්‍ය වත්කම් | 16 | **156,320** | 240,610 |
| **මුළු මූල්‍ය නොවන වත්කම්** | | **142,639,711** | 131,154,536 |
| **මුළු වත්කම්** | | **1,529,210,097** | 1,426,199,480 |
| **බැරකම් සහ හිමිකරු ප්‍රාග්ධනය** | | | |
| **විදේශීය මූල්‍ය බැරකම්** | | | |
| බැංකු සහ මූල්‍ය ආයතන | 17 | **45,566,681** | 12,048,241 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 6 | **14,573,675** | 24,280,308 |
| ආසියානු නිශ්කාෂණ සංගමය | 18 | **79,863,615** | 68,887,459 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මු.අ.) | 19 | **269,540,596** | 251,644,344 |
| අනිකුත් | 20 | **96,250,032** | 217,924,142 |
| **මුළු විදේශීය මූල්‍ය බැරකම්** | | **505,794,599** | 574,784,494 |
| **දේශීය මූල්‍ය බැරකම්** | | | |
| බැංකු සහ මූල්‍ය ආයතන විසින් තැන්පතු | 21 | **303,251,290** | 181,726,732 |
| රජය සහ රජයේ ආයතන විසින් තැන්පතු | 22 | **450,884** | 428,142 |
| ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කළ සුරැකුම්පත් | 23 | **70,054,436** | 105,491,006 |
| සේවක ප්‍රතිලාභ සැලසුම්වල ශේෂයන් | 24 | **51,744** | 7,212 |
| සංසරණයෙහි පවතින මුදල් | 25 | **552,777,865** | 491,699,948 |
| අනිකුත් ගෙවිය යුතු දෑ | 26 | **8,563,548** | 6,824,992 |
| **මුළු දේශීය මූල්‍ය බැරකම්** | | **935,149,767** | 786,178,032 |
| **මුළු මූල්‍ය බැරකම්** | | **1,440,944,366** | 1,360,962,526 |
| **අනිකුත් බැරකම්** | | | |
| විලම්භිත ප්‍රදාන | 27 | **80** | 106 |
| විශ්‍රාම වැටුප් හා අනෙකුත් පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලසුම් | 45 | **2,429,153** | 10,942,541 |
| විවිධ බැරකම් සහ උපචිතයන් | 28 | **193,297** | 199,325 |
| **මුළු අනිකුත් බැරකම්** | | **2,622,530** | 11,141,972 |
| **මුළු බැරකම්** | | **1,443,566,896** | 1,372,104,498 |
| **හිමිකරු ප්‍රාග්ධනය** | | | |
| ප්‍රාග්ධන අරමුදල | | **50,000,000** | 50,000,000 |
| සංචිත | | **35,643,201** | 4,094,982 |
| **මුළු හිමිකරු ප්‍රාග්ධනය** | | **85,643,201** | 54,094,982 |
| **මුළු බැරකම් සහ හිමිකරු ප්‍රාග්ධනය** | | **1,529,210,097** | 1,426,199,480 |

මෙම මූල්‍ය ප්‍රකාශයන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති සහ ප්‍රධාන ගණකාධිකාරී විසින් 2017 මාර්තු 07 වැනි දින මුදල් මණ්ඩලය වෙනුවෙන් නිකුත් කිරීම සඳහා අනුමත කරන ලදී.

ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි - අධිපති

එම්.අයි. සුහියාන් - ප්‍රධාන ගණකාධිකාරී

පිටු අංක 11 සිට 64 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.

## ශ්‍රී ලංකා මහ බැංකුව
### 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා
### ආදයම් ප්‍රකාශනය

| | සටහන | 2016<br>රු. 000 | 2015<br>රු. 000 |
|---|---|---|---|
| **මෙහෙයුම් ආදායමඃ** | | | |
| **විදේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත ආදායම** | | | |
| පොළී ආදායම | 31 | 14,869,835 | 13,047,314 |
| උපලබ්ධි නොවූ ප්‍රත්‍යාගණනයන්ගෙන් වාසිය/(පාඩුව) | 32 | 9,739,043 | (34,853,795) |
| මිල වෙනස්වීම්වලින් උපලබ්ධි වාසිය | | 1,755,321 | 6,686,252 |
| **විදේශීය මූල්‍ය වත්කම්වලින් මුළු ආදායම** | | 26,364,199 | (15,120,229) |
| **විදේශීය මූල්‍ය බැරකම් ආශ්‍රිත වියදම්** | | | |
| පොළී වියදම | 33 | (3,953,835) | (3,622,737) |
| **විදේශීය මූල්‍ය බැරකම් ආශ්‍රිත මුළු වියදම** | | (3,953,835) | (3,622,737) |
| ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන වාසිය / (පාඩුව) | | (6,775,246) | 10,589,267 |
| **විදේශීය මූල්‍ය ආයෝජන ආදායම / (පාඩුව)** | | 15,635,118 | (8,153,699) |
| **දේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත ආදායම** | | | |
| පොළී ආදායම | 31 | 21,020,691 | 9,323,553 |
| පොළී වියදම | 33 | (2,197,815) | (8,919,984) |
| **දේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත මුළු ආදායම / (වියදම)** | | 18,822,876 | 403,569 |
| අනිකුත් ආදායම් | 34 | 1,508,261 | 1,577,442 |
| **මුළු ශුද්ධ මෙහෙයුම් ආදායම / (පාඩුව)** | | 35,966,255 | (6,172,688) |
| **මෙහෙයුම් වියදම් :** | | | |
| **සේවක මණ්ඩල වියදම් :** | 35 | | |
| - වැටුප් සහ වේතන | | (4,258,884) | (4,201,583) |
| - නිශ්චිත දායක සැලසුම් පිරිවැය | | (629,786) | (629,357) |
| - පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම් පිරිවැය සඳහා වූ දායකත්වය | | (1,479,963) | (1,329,578) |
| | | (6,368,633) | (6,160,518) |
| ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය | | (520,961) | (557,158) |
| තොග පිරිවැය (නව මුදල් නිකුතු පිරිවැය) | | (3,076,747) | (3,311,761) |
| පරිපාලන සහ අනිකුත් වියදම් | 36 | (1,468,009) | (1,611,537) |
| ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන අලාභ | | (378,907) | - |
| වත්කම් මත හානිකරණ ගාස්තු | | (139,131) | - |
| මුළු මෙහෙයුම් වියදම් | | (11,952,388) | (11,640,974) |
| **බදු වලට පෙර ලාභය / (අලාභය)** | | 24,013,867 | (17,813,662) |
| රඳවා ගැනීම් මත බද්ද | 37 | (1,834,348) | (1,788,157) |
| **වර්ෂය සඳහා ශුද්ධ ලාභය/(අලාභය)** | | 22,179,519 | (19,601,819) |

පිටු අංක 11 සිට 64 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.

## ශ්‍රී ලංකා මහ බැංකුව
### 2016 දෙසැම්බර් 31 න් අවසන් වූ කාලපරිච්ඡේදය සඳහා
### විස්තීරණ ආදායම් ප්‍රකාශනය

| | 2016<br>රු. 000 | 2015<br>රු. 000 |
|---|---|---|
| වර්ෂය සඳහා වූ ශුද්ධ ලාභය/(අලාභය) | 22,179,519 | (19,601,819) |
| **අනෙකුත් විස්තීරණ ආදායම්** | | |
| **පසු කාලපරිච්ඡේදයේ ලාභ/(අලාභ) වලට නැවත වර්ගීකරණය විය යුතු විස්තීරණ ආදායම** | | |
| විකුණුම් සුරකුම්පත් සඳහා වූ ශුද්ධ සාධාරණ වටිනාකම ලාභය/(අලාභය) | 2,022,241 | (624,957) |
| **පසු කාලපරිච්ඡේදයේ ලාභ/(අලාභ) වලට නැවත වර්ගීකරණය නොවිය යුතු විස්තීරණ ආදායම** | | |
| දේපල පිරියත උපකරණ ප්‍රත්‍යාගණන ලාභ | 3,036,305 | - |
| විස්තීරණ ආදායමට ගලපන ලද පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම් වියදම | 9,485,849 | (7,257,078) |
| **මුළු විස්තීරණ ආදායම/(අලාභය)** | 36,723,914 | (27,483,854) |

පිටු අංක 11 සිට 64 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.

## ශ්‍රී ලංකා මහ බැංකුව
## 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා
## ස්කන්ධ ප්‍රාග්ධනයේ වෙනස්වීම් ප්‍රකාශනය

| | ආයක ප්‍රාග්ධනය රු. 000 | ප්‍රත්‍යාගණන සංචිතය රු. 000 | අනිකුත් සංචිත (සටහන 29) රු. 000 | රඳවාගත් ලාභ රු. 000 | එකතුව රු.000 |
|---|---|---|---|---|---|
| 2015 ජනවාරි 1 දිනට | 50,000,000 | 5,986,602 | 31,493,260 | (5,768,011) | 81,711,851 |
| ශුද්ධ අලාභය | - | - | - | (19,601,819) | (19,601,819) |
| තත්කාලීන දළ පියවුම් පද්ධතිය සඳහා වූ නිධන්ගත අරමුදලට පැවරීම | - | - | 256,478 | (256,478) | - |
| අනෙකුත් විස්තීරණ ආදායමේ හඳුනාගත් පශ්චාත් සේවක ප්‍රතිලාභ පිරිවැය | - | - | - | (7,257,078) | (7,257,078) |
| ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන ලාභය මාරු කිරීම (IRR) | - | - | 10,589,267 | (10,589,267) | - |
| ශ්‍රී.ලං.ම.බැ. විශේෂ සංචිතවලට මාරු කිරීම | - | - | - | (132,839) | (132,839) |
| විකුණුම් සඳහා වූ සුරැකුම්පත් හි ශුද්ධ සාධාරණ වටිනාකම මත වූ ලාභය/(අලාභය) | - | - | (624,957) | - | (624,957) |
| ශ්‍රී ලංකා මහ බැංකු සේවාදායක සහ විශ්‍රාම ආපදා සහන අරමුදලට අරමුදල් මාරු කිරීම | - | - | - | (176) | (176) |
| නව විශ්‍රාම යෝජනා ක්‍රමය පිහිටුවීමට විශ්‍රාම අරමුදල් සංචිතයෙන් අරමුදල් මාරු කිරීම | - | - | (2,000,000) | 2,000,000 | - |
| **2016 ජනවාරි 1 දිනට** | **50,000,000** | **5,986,602** | **39,714,048** | **(41,605,668)** | **54,094,982** |
| ශුද්ධ ලාභය | - | - | - | **22,179,519** | **22,179,519** |
| තත්කාලීන දළ පියවුම් පද්ධතිය සඳහා වූ නිධන්ගත අරමුදලට පැවරීම | - | - | **220,272** | **(220,272)** | - |
| අනෙකුත් විස්තීරණ ආදායමේ හඳුනාගත් පශ්චාත් සේවක ප්‍රතිලාභ පිරිවැය | - | - | - | **9,485,849** | **9,485,849** |
| ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන අලාභය මාරු කිරීම (IRR) | - | - | **(6,775,246)** | **6,775,246** | - |
| ශ්‍රී.ලං.ම.බැ. විශේෂ සංචිතවලට මාරු කිරීම | - | - | - | **(175,470)** | **(175,470)** |
| විකුණුම් සඳහා වූ සුරැකුම්පත් හි ශුද්ධ සාධාරණ වටිනාකම මත වූ ලාභය/(අලාභය) | - | - | **2,022,241** | - | **2,022,241** |
| 2016 වර්ෂයට අදාළ අන්තර් ලාභයන් රජයට පැවරීම | - | - | - | **(5,000,000)** | **(5,000,000)** |
| ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන සංචිතයට මාරු කිරීම | - | **3,036,305** | - | - | **3,036,305** |
| ශ්‍රී ලංකා මහ බැංකු සේවාදායක සහ විශ්‍රාම ආපදා සහන අරමුදලට අරමුදල් මාරු කිරීම | - | - | - | **(225)** | **(225)** |
| වෙළඳපොල ප්‍රත්‍යාගණන සංචිතයෙන් රඳවාගත් ලාභ වලට අරමුදල් මාරු කිරීම | - | - | **(4,650,806)** | **4,650,806** | - |
| **2016 දෙසැම්බර් 31 දිනට** | **50,000,000** | **9,022,907** | **30,530,509** | **(3,910,215)** | **85,643,201** |

පිටු අංක 11 සිට 64 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.

## ශ්‍රී ලංකා මහ බැංකුව

### 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා
### මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | සටහන | 2016<br>රු. 000 | 2015<br>රු. 000 |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්** | | | |
| **ලැබීම්:** | | | |
| ලැබුණු පොළිය - විදේශීය මුදල් | | **11,097,325** | 14,641,329 |
| ලැබුණු පොළිය - දේශීය මුදල් - අනිකුත් | | **690,326** | 600,046 |
| ද්‍රවශීලතා කළමනාකරණ සහ වෙළෙඳ ආදායම් | | **1,755,321** | 6,686,252 |
| උපලබ්ධි වූ විනිමය වාසිය / (පාඩුව) | | **(19,001,328)** | (13,838,368) |
| ලැබුණු අනිකුත් ආදායම් | | **1,500,669** | 1,570,072 |
| | | **(3,957,687)** | 9,659,331 |
| **වියදම් පැහැදම්:** | | | |
| ගෙවන ලද පොළිය - විදේශීය මුදල් | | **3,922,805** | 3,740,805 |
| ගෙවන ලද පොළිය - දේශීය මුදල් | | **2,196,385** | 10,967,407 |
| සේවකයින්ට ගෙවීම් | | **5,464,654** | 6,267,998 |
| සැපයුම්කරුවන්ට ගෙවීම් | | **5,557,729** | 6,645,579 |
| ගෙවන ලද බදු | | **2,595,700** | 1,817,747 |
| | | **19,737,273** | 29,439,536 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ලද/ (සඳහා භාවිතා කළ) ශුද්ධ මුදල් ප්‍රවාහය** | 38 | **(23,694,960)** | (19,780,205) |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්** | | | |
| **ලැබීම් :** | | | |
| අනිකුත් දේශීය මූල්‍ය වත්කම්වල ශුද්ධ (වැඩිවීම) / අඩුවීම | | **(2,100,302)** | (823,124) |
| අනිකුත් ආයතනවලට ප්‍රදානය කළ ණය සහ අත්තිකාරම් - ප්‍රාග්ධන අයකරගැනීම් | | **890,497** | 1,523,438 |
| දේපළ, පිරියත සහ උපකරණ විකිණීම් | | **709** | 749 |
| ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගත් සුරැකුම්පත්වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | | **(35,429,276)** | (222,787,000) |
| | | **(36,638,372)** | (222,085,937) |
| **වියදම් පැහැදම් :** | | | |
| විදේශ මුදල් සුරැකුම්පත්වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | | **(7,066,141)** | (89,998,376) |
| අනිකුත් විදේශීය මූල්‍ය වත්කම්වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | | **30,222,682** | (289,309) |
| අනිකුත් විදේශීය මූල්‍ය බැරකම්වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | | **89,038,712** | (139,352,884) |
| අනිකුත් දේශීය තැන්පතු සහ ගෙවිය යුතු මුදල්වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | | **(791)** | 2,274 |
| දේපල, පිරියත හා උපකරණ මිලට ගැනීම් (ප්‍රදානයන් අඩු කිරීමෙන් පසු) | | **488,036** | 1,206,040 |
| අස්පෘෂ්‍ය වත්කම් මිලදී ගැනීම් | | **1,124** | 21,627 |
| කල්බදු වත්කම් මිලදී ගැනීම් | | **5,135** | 14,361 |
| රන් තොගයේ ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | | **-** | (5,124,212) |
| අනෙකුත් ආයතන වෙත ලබා දුන් ණය හා අත්තිකාරම් | | **488,183** | 920,424 |
| | | **113,176,940** | (232,600,055) |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද/ (සඳහා භාවිතා කළ) ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(149,815,312)** | 10,514,118 |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්** | | | |
| **ලැබීම් :** | | | |
| සංසරණ මුදල් නිකුතුව | | **(595,035,881)** | (504,508,531) |
| සංසරණ මුදල් ආපසු ගැනීම් | | **656,113,797** | 579,313,118 |
| සංසරණ මුදල් ශුද්ධ නිකුතුව | | **61,077,916** | 74,804,587 |
| **වියදම් පැහැදම් :** | | | |
| රජයේ ගනුදෙනු ආශ්‍රිත සංසරණ මුදල් ශුද්ධ නිකුතුව / (ආපසු ගැනීම්) | 39 | **160,378,295** | (23,208,921) |
| බැංකු සහ මූල්‍ය ආයතන ගනුදෙනු ආශ්‍රිත සංසරණ මුදල් ශුද්ධ නිකුතුව / (ආපසු ගැනීම්) | 40 | **(121,524,559)** | (20,944,825) |
| සංසරණ මුදල් ශුද්ධ නිකුතුව / (ආපසු ගැනීම්) | | **38,853,736** | (44,153,746) |
| **සංසරණ මුදල් ශුද්ධ වැඩිවීම/(අඩුවීම)** | | **22,224,180** | 118,958,333 |
| **වියදම් පැහැදම් :** | | | |
| විදේශීය මුදල් කාලීන බැරකම් ආපසු ගෙවීම | | **(13,612,965)** | 68,788,313 |
| අනිකුත් අරමුදල් සඳහා ගෙවීම | | **225** | 175 |
| රජයේ ඒකාබද්ධ අරමුදල සඳහා ලාභ පැවරීම | | **5,000,000** | - |
| | | **(8,612,740)** | 68,788,488 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් ලද/ (සඳහා භාවිතා කළ) ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **30,836,920** | 50,169,845 |
| **මුදල් සහ මුදල් සමානයන්ගේ ශුද්ධ වැඩිවීම / (අඩුවීම)** | | **(142,673,352)** | 40,903,760 |
| මුදල් සහ මුදල් සමානයන් මත වන විනිමය අනුපාතයන්ගේ බලපෑම | | **8,982,404** | 29,500,154 |
| වර්ෂය ආරම්භයේ දී මුදල් සහ මුදල් සමානයන් | | **557,474,685** | 487,070,771 |
| **දෙසැම්බර් 31 දිනට මුදල් සහ මුදල් සමානයන්** | 41 | **423,783,737** | 557,474,685 |

පිටු අංක 11 සිට 64 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.

## 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා මූල්‍ය ප්‍රකාශනයන්ගේ කොටසක් ලෙස කියවිය යුතු සටහන

### 1. වාර්තා කිරීමේ ඒකකය සහ ව්‍යවස්ථාපිත පදනම

ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය සහ ගෙවීම් පද්ධති පරිපාලනය, අධීක්ෂණය සහ නියාමනය කිරීම සඳහා වගකිවයුතු අධිකාරිය ලෙස 1949 අංක 58 දරණ මුදල් නීති පනත (සංශෝධිත පරිදි) යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව ("බැංකුව" හෝ "ශ්‍රී.ලං.ම.බැ.") ආයතනයක් ලෙස ස්ථාපිත කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව නිත්‍යව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය තුළ පිහිටුවා ඇති අතර, කොළඹ 01, ජනාධිපති මාවතේ අංක 30 දරණ ස්ථානයේ පිහිටා ඇත.

මුදල් මණ්ඩලය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති සහ ප්‍රධාන ගණකාධිකාරී විසින් මෙම මූල්‍ය ප්‍රකාශනයන්, 2017 මාර්තු 07 වැනි දින අනුමත කරන ලදී.

### 2. ගිණුම්කරණ ප්‍රතිපත්ති

#### 2.1 පිළියෙල කිරීමේ පදනම

පහත සඳහන් නිශ්චිත ගණකාධිකරණ ප්‍රතිපත්තිවලින් හඳුන්වා දී ඇති පරිදි සාධාරණ වටිනාකමට අගය කරන ලද ඉඩම්, ගොඩනැගිලි, රන් සහ ඇතැම් මූල්‍ය වත්කම් හැර, ඓතිහාසික පිරිවැය පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙල කරන ලදී.

#### 2.1.1 වාර්තා කිරීමේ ආකෘතිය

බැංකුව විසින් මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම් ද ඒවාට අදාල ආදායම් සහ වියදම් මාර්ග ද විදේශීය මුදල් සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් ලෙස වෙන්කොට ඉදිරිපත් කරනු ලැබේ. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ වත්කම් සහ බැරකම් ඉදිරිපත් කිරීමේ දී පුළුල් වශයෙන් එක් එක් වර්ගයන් යටතේ ද්‍රවශීලතාවයේ පිළිවෙලට දක්වා ඇත. මෙම වාර්තාකරණ ප්‍රවේශය මගින්, අංක 4 දරණ සටහනෙහි විස්තරාත්මකව දක්වා ඇති බැංකුවේ ක්‍රියාකාරකම් උචිතව වාර්තා කෙරෙන බව බැංකුවේ අදහස වේ.

#### 2.1.2 අනුකූලතා ප්‍රකාශනය

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශනයන් ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (ජා.මූ.වා.ප්‍ර.) ප්‍රකාර පිළියෙල කර තිබේ. එකී මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති විසින් විගණනය කර නීතිමය අවශ්‍යතා මත ගැසට් පත්‍රයේ පල කර ඇත. කෙසේ වුවද, යම් යම් වර්ගීකරණ වෙනස්කම් හේතුකොටගෙන ගැසට් පත්‍රයේ පලකර ඇති මූල්‍ය ප්‍රකාශන වල ඇති අගයන් මෙහි ප්‍රකාශයට පත් කර ඇති මූල්‍ය ප්‍රකාශන සමගින් වෙනස් විය හැක.

#### 2.1.3 වාර්තා කිරීමේ මුදල් ඒකකය

වෙනත් අන්දමකට දක්වා නොමැති නම්, සියළුම සංඛ්‍යා ආසන්නතම ශ්‍රී ලංකා රුපියල් දහස් වලින් දැක්වේ.

#### 2.2 වැදගත් ගිණුම් නිශ්චයන් සහ ඇස්තමේන්තු

බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම මත, වාර්තා කරන ලද ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් ප්‍රමාණයන් සහ අනුගාමී හෙළිදරව් කිරීම් මෙන්ම අසම්භාව්‍ය බැරකම්වල හෙළිදරව් කිරීම්වලට බලපාන්නා වූ නිශ්චයන් ඇස්තමේන්තු හා උපකල්පනයන් සකස් කිරීමට කළමනාකරණයට සිදු වේ. මෙම උපකල්පනයන් හා ඇස්තමේන්තු හා සම්බන්ධ අවිනිශ්චිතතාවය, වත්කම් හා බැරකම්හි ධාරණ අගයන්වලට අනාගත කාලපරිච්ඡේදවලදී බලපාන ලෙස ප්‍රමාණාත්මක ගැලපීමක් අවශ්‍ය කරන ප්‍රතිඵලයක් ඇති කළ හැක.

#### 2.2.1 විකිණීමට ඇති ආයෝජන හානිකරණය

සැලකිය යුතු ලෙස සහ අඛණ්ඩව සාධාරණ අගය එහි පිරිවැයට වඩා පහළට යනවිට, විකිණීම සඳහා ඇති ආයෝජන අගය හානි වී ඇති බව බැංකුව තීරණය කරයි. මෙම ආයෝජන සම්බන්ධයෙන් සැලකිය යුතු බව හෝ අඛණ්ඩ බව යන කරුණු නිශ්චය කිරීමේ දී යම් විනිශ්චයක් කිරීම අවශ්‍ය වේ.

#### 2.2.2 විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්වල පිරිවැය ආයුගණන ඇගයීම් මත තීරණය කරනු ලැබේ. ආයුගණන ඇගයීමක දී වට්ටම් අනුපාත, අනාගත වන්දි ගෙවීම් වැඩිවීම්, මරණ අනුපාතය සහ විශ්‍රාම වැටුප්වල අනාගත වැඩිවීම් පිළිබඳ උපකල්පනයන් සිදුකරනු ලැබේ. මෙම සැලසුම් වල දිගුකාලීන ස්වභාවය හේතුවෙන් එවැනි ඇස්තමේන්තු සැලකිය යුතු ලෙස අවිනිශ්චිතතාවයකට භාජනය වේ. භාවිතා කරන ලද උපකල්පන සටහන් අංක 45 හි දැක්වේ.

#### 2.2.3 මූල්‍ය උපකරණවල සාධාරණ අගය

මූල්‍ය වත්කම් හා වගකීම්වල සාධාරණ අගයන් මූල්‍ය තත්ව ප්‍රකාශනයේ වාර්තාගත කරන විට එම අගයන් සක්‍රීය වෙළඳපළ තුළින් ලබාගත නොහැකි අවස්ථාවලදී, එම අගයන් ලබා ගැනීම සඳහා විවිධ ආකාරයේ ආගණනය කරනු ලබන ගණිතමය ආකෘතිවලින් යුතු ශිල්පීය ක්‍රම උපයෝගී කරගෙන ඇත. මෙම ආකෘති තුළට යොදාගන්නා යෙදවුම් හැකි සෑම විටම නිරීක්ෂිත වෙළඳපොළ දත්ත මත ලබාග න්නා අතර, එවැනි දත්ත නොමැති අවස්ථාවන්හිදී නිගමන මගින් සාධාරණ අගය ලබාගනු ලබයි. නිගමනවලට එළඹීමේදී ද්‍රවශීලතාවය සහ දීර්ඝ කාලීන ව්‍යුත්පන්න මූල්‍ය උපකරණවල (longer-dated derivatives) වෙනස්වීම වැනි ආකෘතිවලට යොදාගන්නා යෙදවුම් සැලකිල්ලට ගෙන ඇත.

#### 2.3 ප්‍රකාශිත කර ඇති නමුත් මේ වන තෙක් බල සහිත නොවූ ප්‍රමිතීන්

ප්‍රකාශිත නමුත් බැංකු මූල්‍ය වාර්තා ප්‍රකාශයට පත් කරන දිනය වන තෙක් බල සහිත නොවූ ප්‍රමිතීන් සහ අර්ථ නිරූපණයන් පහත පරිදි වේ. මෙම ප්‍රමිතීන් සහ අර්ථ නිරූපණයන් අනාගත දිනක දී අදාළ වන බවට බැංකුව බලාපොරොත්තු වේ. මෙම ප්‍රමිතීන් බල සහිත වූ විට ඒවා අදාළ කරගැනීමට බැංකුව අපේක්ෂා කරයි.

**2.3.1 ජා.මූ.වා.ප්‍ර. 9 මූල්‍ය උපකරණ**

2014 ජූලි මස අන්තර්ජාතික ගිණුම්කරණ ප්‍රමිති (අ.ගි.ප්‍ර.) ආයතනය විසින් ජා.මූ.වා.ප්‍ර. 9 මූල්‍ය උපකරණ ප්‍රමිතියේ අවසාන සංස්කරණය නිකුත් කරන ලද අතර, එමගින් මූල්‍ය උපකරණ ව්‍යාපෘතීන්හි සියලුම අවධීන් නිරූපණය වන අතර අ.ගි.ප්‍ර. 39: හඳුනාගැනීම හා මිනුම් කිරීම සහ ජා. මූ. වා. ප්‍ර. 9 හි සියලුම පසුගිය සංස්කරණයන් අහෝසි විය. මෙම ප්‍රමිතිය මගින් වර්ගීකරණය සහ මිනුම් කිරීම, හානිකරණය හා ඉදිරි රැකුම් ගිණුම්කරණය සම්බන්ධ නව අවශ්‍යතා හඳුන්වා දෙන ලදී. 2018 ජනවාරි 01 දිනෙන් ආරම්භ වන වාර්ෂික කාලච්ඡේදයන් සඳහා ජා.මූ.වා.ප්‍ර. 9 බලපැවැත්වෙන අතර කලින් අදාළ කිරීම වලංගු වේ. අතීතයට බලපාන පරිදි අදාළ කළයුතු නමුත් සන්සන්දනාත්මක තොරතුරු අත්‍යාවශ්‍ය නොවේ. ජා.මූ.වා.ප්‍ර. 9 හි කලින් කළ සංස්කරණයන් (2009, 2010 සහ 2013) අනුව කලින් අදාළ කිරීම වලංගු වනුයේ ආරම්භක අදාළ කිරීම 2015 පෙබරවාරි 01 දිනට පෙර සිදුකළේ නම් පමණි. ජා.මූ.වා.ප්‍ර. 9 යොදා ගැනීම බැංකුවේ මූල්‍ය වත්කම් වර්ගීකරණය සහ මිනුම් කිරීම සම්බන්ධයෙන් බලපානු ලබන අතර බැංකුවේ මූල්‍ය වගකීම් වර්ගීකරණය හා මිනුම් කිරීම සම්බන්ධයෙන් බල නොපායි.

**2.3.2 අ.ගි.ප්‍ර. 7 මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා සංශෝධනයන්**

IASB විසින් 2016 ජනවාරි මස දී, මූල්‍ය ක්‍රියාකාරකම් ආශ්‍රිත හෙළිදරව් කිරීම් වැඩිදියුණු කිරීම සඳහා සහ මූල්‍ය ප්‍රකාශ භාවිත කරන්නන් හට වඩාත් හොඳින් වාර්තාකරණ ඒකකයේ ද්‍රවශීලතා තත්ත්වය අවබෝධ කර ගැනීම සඳහා අ.ගි.ප්‍ර. 7 මුදල් ප්‍රවාහ ප්‍රකාශ සම්බන්ධ සංශෝධනයක් ඉදිරිපත් කරන ලදි. මෙම නව සංශෝධිත අවශ්‍යතාවයන් යටතේ, ආයතනයන්ට මුදල් ප්‍රවාහයන් සහ මුදල් නොවන අයිතම ආදී මූල්‍ය කටයුතු නිසා තම මූල්‍ය බැරකම්වල සිදුවන වෙනස්වීම් හෙළිදරව් කිරීමට සිදුවනු ඇත (උදා:- විදේශ විනිමය අනුපාත වෙනස්වීම නිසා සිදුවන ලාභ හා පාඩු). අදාළ සංශෝධනය 2017 ජනවාරි 01 දින සිට බලාත්මක වන අතර බැංකුව දැනට එහි බලපෑම අගය කරමින් සිටී.

**2.3.3. ජා.මූ.වා.ප්‍ර. 16 - කල්බදු**

2016 ජනවාරි මස දී, IASB විසින් කල්බදු ගිණුම් තැබීම සඳහා නව ප්‍රමිතියක් ලෙස ජා.මූ.වා.ප්‍ර. 16 නිකුත් කරන ලදි. නව ප්‍රමිතිය මගින් කල්බදු හිමියා වෙනුවෙන් ගිණුම් තැබීමෙහි සැලකිය යුතු වෙනසක් සිදුකර නොමැත. කෙසේවෙතත්, කල්බදු ගැනුම්කරුවන් හට තම බොහොමයක් කල්බදු අනුරූප පාවිච්චි කිරීමේ අයිතියද සමග මූල්‍ය තත්ත්ව ප්‍රකාශයන්හි කල්බදු වගකීම් ලෙස හඳුනාගැනීම අවශ්‍ය වේ. කල්බදු ගැනුම්කරුවන් සියලුම හඳුනාගත් කල්බදු සඳහා එක් ආදර්ශකයක් යොදා ගත යුතු නමුත් කෙටිකාලීන කල්බදු සහ අඩු අගයන්ගෙන් යුත් වත්කම්වල කල්බදු හඳුනා නොගැනීමට විකල්පයක් පවතිනු ඇත. සාමාන්‍යයෙන් හඳුනාගත් කල්බදු සඳහා වන ලාභ සහ අලාභ ගිණුම්කරණ රටාව, වර්තමාන මූල්‍ය කල්බදු ගිණුම්ගත කරන ආකාරයට සමාන වන අතර එහි දී පොළී වියදම සහ ක්ෂය වියදම යන කොටස් දෙක ද ආදායම් ප්‍රකාශය තුළ වෙනම හඳුනා ගනු ලැබේ.

ජා.මූ.වා.ප්‍ර. 16, 2019 ජනවාරි 01 වන දිනට හෝ ඊට පසු එළඹෙන වාර්ෂික කාලපරිච්ඡේදයන්වලට බලාත්මක වේ. නව ආදායම් ප්‍රමිතිය වන ජා.මූ.වා.ප්‍ර. 15 ද මෙම කල්බදු ප්‍රමිතිය සමගම එකම දින ප්‍රායෝගිකව භාවිත කිරීම ආරම්භ කිරීමට යටත්ව ජා.මූ.වා.ප්‍ර. 16 කලින් ක්‍රියාත්මක කිරීමට අවසර ඇත. කල්බදු ගැනුම්කරුවන් විසින් ජා.මූ.වා.ප්‍ර. 16 මුළුමනින් ම හෝ වෙනස් කරන ලද අතීතානුයෝගී ගැලපුමක් වශයෙන් යොදා ගත යුතුය.

**2.3.4 ජා.මූ.වා.ප්‍ර. 15 - ගණුදෙණුකරුවන් සමග වූ කොන්ත්‍රාත්තු මත ආදායම**

IASB විසින් 2014 මැයි මස ගණුදෙණුකරුවන් සමග වූ කොන්ත්‍රාත්තු මත ආදායම මැයෙන් වන ජා.මූ.වා.ප්‍ර. 15, 2018 ජනවාරි 01 දින සිට ආරම්භ වන මූල්‍ය වර්ෂයන්ට බලාත්මක වන අයුරින් හා කලින් ක්‍රියාත්මක කිරීමට අවසර ලබා දෙමින් නිකුත් කරන ලදි. ජා.මූ.වා.ප්‍ර. 15 ආදායම් හඳුනාගැනීම සඳහා ප්‍රතිපත්ති නිර්වචනය කරන අතර ගනුදෙනුකරුවන් සමග වන සියලු ගිවිසුම් සඳහා අදාළ වනු ඇත. කෙසේවෙතත්, මූල්‍ය උපකරණ හා කල්බදු සම්බන්ධයෙන් වන පොළී සහ ගාස්තු ආදායම ජා.මූ.වා.ප්‍ර. 15 හි විෂයපථයෙන් පරිබාහිරව පවතිනු ඇති අතර වෙනත් සුදුසු ප්‍රමිතීන් මගින් නියාමනය වනු ඇත (උදා:- ජා.මූ.වා.ප්‍ර. 9 මූල්‍ය උපකරණ සහ ජා.මූ.වා.ප්‍ර. 16 කල්බදු). ජා.මූ.වා.ප්‍ර. 15ට අනුව ආදායම හඳුනා ගත හැකි වන්නේ පැවරුම්කරු භාණ්ඩ හා සේවාවල අයිතිය අපේක්ෂා කරන තෙක් වේ. මෙම ප්‍රමිතිය මගින් ආදායමේ ස්වභාවය, ප්‍රමාණය, කාල නිශ්චය, ආදායමෙහි අනියතතාවය සහ ගණුදෙනුකරුවන් සමග වන මුදල් ප්‍රවාහ යනාදී විස්තීරණ හෙළිදරව් කිරීම් රැසක් විශේෂණය කරනු ලබයි.

බැංකුව ජා.මූ.වා.ප්‍ර. 15 කලින් යොදාගැනීමක් අපේක්ෂා නොකරන අතර වර්තමානයේ එහි බලපෑම අගයමින් සිටී.

**3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය**

**3.1 විදේශීය මුදල් පරිවර්තනය**

බැංකුවේ ගනුදෙනු සඳහා භාවිතා වන සහ ඒවා ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය ශ්‍රී ලංකා රුපියල වේ. විදේශීය මුදල්වලින් වන ගනුදෙනු, එකී ගනුදෙනු සිදුවන දිනයේ දී පවතින විනිමය අනුපාතික ප්‍රකාර බැංකුවේ භාවිතා වන මුදල් වටිනාකමට සටහන් කරනු ලැබේ. විදේශීය මුදල්වලින් වූ මූල්‍ය වත්කම් සහ බැරකම්, වාර්තාකරන දිනට පවතින විනිමය අනුපාතිකයන් ප්‍රකාර නැවත පරිවර්තනය කරනු ලැබේ. වෙනස්කම් සියල්ල ආදායම් ප්‍රකාශනයට ගනු ලැබේ. වටිනාකම් නැවත පරිවර්තනය කිරීමේ දී, ප්‍රධාන ව්‍යවහාර මුදල්වලට වූ පහත දැක්වෙන ශ්‍රී ලංකා රුපියලේ විනිමය අනුපාතයන් භාවිතා කරන ලදී.

| | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|
| ඕස්ට්‍රේලියානු ඩොලර් 1 | 108.2380 | 105.3888 |
| කැනේඩියානු ඩොලර් 1 | 111.0617 | 103.7278 |
| යුරෝ 1 | 158.4959 | 157.4097 |
| ජපන් යෙන් 1 | 1.2818 | 1.1970 |
| විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) 1 | 201.3811 | 199.6310 |
| ස්ටර්ලින් පවුම් 1 | 184.5087 | 213.5508 |
| ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 1 | 149.8000 | 144.0623 |
| චීන යුවාන් 1 (අක්වෙරළ) | 21.4901 | 21.9285 |

මූල්‍ය නොවන අයිතමයන් ඒවා සිදුවුන දින තිබූ විදේශීය මුදල් පරිවර්තනයට අනුව ඓතිහාසික අගයට පොත්වලට සටහන් කර ඇත.

### 3.2 සාධාරණ අගය මිනුම් කිරීම

බැංකුව විසින් මූල්‍ය සුරැකුම්පත්, ව්‍යුත්පන්න උපකරණ වැනි මූල්‍ය උපකරණයන් සහ ඉඩම් හා ගොඩනැගිලි ආදී වූ මූල්‍ය නොවන උපකරණයන් එකී වාර්තාකරණ දිනයන්හි දී සාධාරණ අගයන්ට මිනුම්ගත කර ඇත. මීට අමතරව, ක්‍රමක්ෂය පිරිවැයට මිනුම්ගත කරන ලද මූල්‍ය උපකරණයන්හි සාධාරණ අගයන් අංක 46 සටහනෙහි හෙළිදරව් කර ඇත.

සාධාරණ අගය යනු වෙළෙඳපොළ හවුල්කරුවන් අතර සිදුවන ක්‍රමවත් ගනුදෙනුවක දී, මිනුම්ගත කරන ලද දිනයට, වත්කමක් විකිණීමෙන් ලැබෙන මුදල හෝ වගකීමක් හුවමාරු කිරීමේ දී ගෙවීමට සිදුවන මුදල ය.

මෙම සාධාරණ අගය මිනුම් කිරීම සඳහා පදනම් වන පූර්ව නිගමනය වනුයේ වත්කමක් විකිණීම හෝ වගකීමක් හුවමාරු කිරීම යන ගනුදෙනුවක්:

- වත්කම හෝ වගකීම අදාළ ප්‍රධාන වෙළෙඳපොළෙහි දී සිදුවීම හෝ,
- එවැනි ප්‍රධාන වෙළෙඳපොළක් නොමැති අවස්ථාවකදී එම වත්කම හෝ වගකීම සඳහා වඩාත් ම වාසි සහගත වෙළෙඳපොළෙහි දී සිදුවීමය.

මෙම ප්‍රධාන වෙළෙඳපොළ හෝ වඩාත් වාසිසහගත වෙළෙඳපොළ බැංකුවට පිවිසිය හැක්කක් විය යුතු ය.

වත්කමක හෝ වගකීමක සාධාරණ අගය මිනුම් ගත කරනු ලබන්නේ වෙළෙඳපොළ හවුල්කරුවන් ඔවුන් උපරිම ආර්ථික වාසියක් ලබාගැනීම උදෙසා හැසිරෙනු ඇතැයි යන උපකල්පනය මත වත්කමක් හෝ වගකීමක් මිලකිරීමේදී යොදාගන්නා උපකල්පනයන් යොදා ගැනීමෙනි. මූල්‍ය නොවන වත්කමක සාධාරණ අගය මිනුම්ගත කිරීමේ දී වෙළෙඳපොළ හවුල්කරුවන්ගේ වත්කමක් එහි උපරිම හා විශිෂ්ට ලෙස භාවිතා කිරීම මගින් හෝ උපරිම හා විශිෂ්ට වාසි ලැබෙන ලෙස භාවිතාවේ යොදා ගන්නා වෙනත් වෙළෙඳපොළ හවුල් කරුවකුට විකිණීම මගින් හෝ, ආර්ථික වාසි ජනනය කිරීමේ හැකියාව සලකා බලනු ලබයි.

බැංකුව විසින් සාධාරණ අගයයන් මිනුම් කිරීමේ ක්‍රියාවලිය උදෙසා අවස්ථාවට ඉතාමත් උචිත සහ සාධාරණ අගයන් මිනුම්ගත කිරීම අදාළ නිරීක්ෂණ යෙදවුම් හි උපරිම භාවිතය සහ අපරීක්ෂාකාරී යෙදවුම් භාවිතය අවම කිරීම යන කාර්යයන් සඳහා ප්‍රමාණවත් දත්ත අගය කිරීමේ ක්‍රමවේදයන් යොදා ගනු ලබයි. මූල්‍ය වාර්තාවන්හි සාධාරණ අගය මිනුම්ගත කළ හෝ හෙළිදරව් කළ සියළු වත්කම් හා වගකීම් සාධාරණ අගයන් ධූරාවලිය තුළ පහත දැක්වෙන පරිදි වර්ගීකරණයට ලක් කර ඇති අතර එය සමස්තයක් වශයෙන් සාධාරණ අගයන් නිශ්චය කිරීම සඳහා වැදගත් වන අවම මට්ටමේ යෙදවුම් මත පදනම් වේ.

| | |
|---|---|
| පළමුවන මට්ටම | - අනන්‍ය වත්කම හා වගකීම සඳහා ක්‍රියාකාරී වෙළෙඳපොළ තුළ හිමි ප්‍රකාශිත (නො සැකසූ) මිළ ගණන් |
| දෙවන මට්ටම | - ඍජුව හෝ වක්‍රාකාරයෙන් නිරීක්ෂණය කළ හැකි, සාධාරණ අගයන් මිනුම් කිරීම සඳහා වැදගත් වන අවම මට්ටමේ යෙදවුම් භාවිතා කරන ඇගයුම් ක්‍රමවේදයන් |
| තෙවන මට්ටම | - නිරීක්ෂණය කළ නොහැකි, සාධාරණ අගයන් මිනුම්ගත කිරීම සඳහා වැදගත්වන අවම මට්ටමේ යෙදවුම් භාවිතා කරන ඇගයුම් ක්‍රමවේදයන්. |

මූල්‍ය වාර්තාවන්හි පුනරාවර්තන පදනම මත හඳුනාගන්නා ලද වත්කම් හා වගකීම් සම්බන්ධයෙන්, මෙම ධූරාවලියෙහි මට්ටම් අතර හුවමාරු වීම් සිදුවී ඇත්දැයි බැංකුව විසින් සාධාරණ අගයන් මිනුම්කරණය උදෙසා සමස්තයක් වශයෙන් වැදගත් වන අවම මට්ටමේ යෙදවුම් මත පදනම්ව මෙම වර්ගීකරණය නැවත තක්සේරු කිරීම තුළින් වාර්තා කිරීමේ කාල පරිච්ඡේදය අවසානයේ තීරණය කරනු ලබයි.

### 3.3 මූල්‍ය වත්කම් සහ බැරකම්

බැංකුව, මූල්‍ය වත්කම් සහ බැරකම් සහ ආශ්‍රිත ආදායම් හා වියදම් මාර්ගයන් ඉදිරිපත් කරනු ලබන්නේ විදේශීය මුදල් සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් වෙන්කොට හඳුනා දැක්වීමෙන්ය. විදේශීය මුදල් ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් උද්ගත වන්නේ බැංකුවේ විදේශීය සංචිත කළමනාකරණ කාර්යයන්ගෙන්ය. මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, මුදල් නිකුතු සහ බැංකු කටයුතුවලට ආශ්‍රිත වත්කම් සහ බැරකම් දේශීය මූල්‍ය ක්‍රියාකාරකම්වලින් පිළිබිඹු වේ.

මෙම ක්‍රියාකාරකම් වෙන් වෙන්ව වාර්තා කිරීම මගින්, බැංකුවේ මූල්‍ය තත්ත්වය මූල්‍ය කාර්ය සාධනය සහ අවදානම් ආකෘතිය වඩා යෝග්‍ය අයුරින් ඉදිරිපත් කිරීම අපේක්ෂා කරනු ලැබේ. විදේශීය සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් ඒකාබද්ධව වාර්තා කිරීමෙන් මූල්‍ය ප්‍රකාශනයන්හි දැනුවත් කිරීමේ අගය දුර්වල වන බව බැංකුව විසින් සලකනු ලැබේ.

සියළු මූල්‍ය වත්කම්, මූලිකව පිරිවැය මත හඳුනාගනු ලබන අතර ආයෝජනයට අදාල අත්පත් කර ගැනීමේ වියදම් ද ඇතුළුව, ඉදිරිපත් වන ප්‍රතිෂ්ඨාවෙහි සාධාරණ වටිනාකම පිරිවැයට ඇතුළත් වේ. මෙම මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව මිනුම් පදනම්, පහත විස්තර කරනු ලැබේ. සාමාන්‍යයෙන් මිලට ගනු ලබන සහ විකුණනු ලබන සියළු මූල්‍ය වත්කම් වෙළෙඳාම් දිනයේ දී හඳුනාගනු ලැබේ. මෙලෙස මිලට ගනු ලබන සහ විකුණන මූල්‍ය වත්කම් වූ කලි සාමාන්‍ය රෙගුලාසි මගින් හෝ වෙළෙඳපොළේ පවත්නා සම්ප්‍රදාය මගින් නියමිත කාල රාමුව තුළ දී භාරදිය යුතු මිලට ගනු ලැබූ හෝ විකුණනු ලැබූ මූල්‍ය වත්කම් වන්නේය.

#### 3.3.1 ලාභය හෝ පාඩුව මත සාධාරණ අගයට ඇති සුරැකුම්පත්

වෙළෙඳාම සඳහා ගැනෙන මූල්‍ය වත්කම්, "ලාභය හෝ පාඩුව මත සාධාරණ අගයට ඇති වත්කම්" යටතේ වර්ග කර ඇතුළත් කර ඇත. මෙම සුරැකුම්පත් අනතුරුව ප්‍රකාශිත

වෙළෙඳපොළ මිල ප්‍රකාර අගය කරනු ලැබේ. වෙළෙඳපොළ අගයෙහි වෙනස්වීම, මූල්‍ය තත්ව ප්‍රකාශනයෙහි සුරැකුම්පත් යටතේ වටිනාකම් වැඩිවීමක් හෝ අඩුවීමක් ලෙස හඳුනා ගන්නා අතර එයින් උද්ගත වන වාසිය/අවාසිය ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ඇත.

සුරැකුම්පත් තවදුරටත් අයිතිව පවතින්නේ නම් අදාල වාසිය/අවාසිය "උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණනයෙන් වාසිය/(පාඩුව)" ලෙස වාර්තා කරනු ලැබේ. සුරැකුම්පත් විකිණීම මගින් වාසියක් හෝ අවාසියක් උද්ගත වන්නේ නම්, එය "මිල වෙනස්වීමේ උපලබ්ධි වාසිය/(පාඩුව)" ලෙස වාර්තා කරනු ලැබේ.

### 3.3.2 අලෙවිය සඳහා ඇති විදේශ විනිමය සුරැකුම්පත්

වෙළෙඳාම සඳහා ගැනෙන විදේශ විනිමය සුරැකුම්පත් පසුව වෙළෙඳපොළ මිල අනුව අගය කරනු ලැබේ. වෙළෙඳපොළ අගයෙහි වෙනස්වීම, මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ විකිණීමට ඇති සුරැකුම්පත්වල වටිනාකම වැඩිවීම හෝ අඩුවීම වශයෙන් හඳුන්වනු ලැබේ.

වෙළෙඳාම සඳහා ගැනෙන විදේශීය මුදල් සුරැකුම්පත්වල වෙළෙඳපොළ අගය වෙනස්වීමෙන් උද්ගතවන වාසිය හෝ අවාසිය, එම ආයෝජන විකුණා, ප්‍රතිග්‍රහණය කර හෝ වෙනත් අයුරකින් බැහැර කරන තෙක් හෝ එම ආයෝජනය දුබල බවට නිරීක්ෂණය කරන තෙක් හෝ හිමිකරු ප්‍රාග්ධනයේ වෙනම සංරචකයන් (මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ වෙනත් සංචිත ලෙස දක්වා ඇති) ලෙස හඳුන්වනු ලබන අතර, එවැනි අවස්ථාවක් උද්ගතවීමේ දී හිමිකරු ප්‍රාග්ධනය ලෙස මුලින් වාර්තා කළ වාසිය හෝ අවාසිය ආදායමට එකතු කරනු ලැබේ.

### 3.3.3 ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ

මුදල් හුවමාරු, ඉදිරි විදේශ විනිමය ගිවිසුම් සහ පොලී අනුපාත හුවමාරු වැනි ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ බැංකු විසින් භාවිතා කරනු ලබන අතර ඒවා භාවිතා කරනුයේ අවදානම් කළමනාකරණය කිරීමේ අරමුණු සඳහා මිස සමපේක්ෂාත්මක අරමුණු සඳහා නොවේ. ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ එහි සාධාරණ අගයට වාර්තා කරන අතර එහි සාධාරණ අගය ධන අගයක් ගන්නා විට වත්කමක් ලෙසත් එම අගය ඍණ අගයක් ගන්නා විට වගකීමක් ලෙසත් වාර්තා කරයි. ව්‍යුත්පන්න මූල්‍ය උපකරණයන්ගේ සාධාරණ අගයෙහි ඇතිවන චලනයන් "උපලබ්ධි නොවූ ප්‍රත්‍යාගණනයන්ගෙන් වාසිය/(පාඩුව)" යටතේ වාර්තා කරනු ලැබේ.

### 3.3.4 එක් දින වෙනස

ගනුදෙනුවක මිල ඒ හා සමාන ගණුදෙණු පවතින්නා වූ නිරීක්ෂණය කළ හැකි වර්තමාන වෙළෙඳපළක සාධාරණ අගයෙන් වෙනස් වේ නම් හෝ මිල නිරීක්ෂණය කල හැකි වර්තමාන වෙළෙඳපළෙහි දත්ත පමණක් විචල්‍යන් ලෙස යොදාගත් ඇගයීම් ශිල්ප ක්‍රමයක් භාවිතයෙන් ලබාගත් මිලෙන් වෙනස් වේ නම්, බැංකුව විසින් එම ගණුදෙණුවේ මිල හා සාධාරණ අගය අතර වෙනස (දිනට වෙනස) ඉක්මනින්ම "උපලබ්ධි නොවූ ප්‍රත්‍යාගණන ලාභ/(පාඩු)" ලෙස හඳුනාගනු ලබයි. ගණුදෙණුවක සාධාරණ අගය නිරීක්ෂණය කළ නොහැකි දත්ත මත පැනවිම තිරණය කළ අවස්ථාවක එම ගණුදෙණුවේ මිල හා අදාල ඇගයීම් රාමුවේ මිල අතර වෙනස, අදාළ යෙදවුම් නිරීක්ෂණය කළ හැකි වූ විට හෝ එම උපකරණ මූල්‍ය ප්‍රකාශන තුළින් ඉවත්ව ගිය විට පමණක් අදායම් ප්‍රකාශය තුළ ගලපනු ලබයි.

### 3.3.5 ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ශේෂයන් (IMF)

බැංකුව විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මු.අ.) සමග කරනු ලබන ගනුදෙනු ශ්‍රී ලංකා රජයේ නියෝජිතයෙකු ලෙස නොව, තම බලතල ප්‍රකාර සිදුකරනු ලැබේ. බැංකුව විසින් ජා.මු.අ. සමග සිදුකෙරෙන සියළු ගනුදෙනු එම පදනම මත මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුළත් කර ඇත.

ජා.මු.අ. සමග වු පංගුව වත්කමක් වශයෙන් බැංකුව විසින් සටහන් කර ඇති අතර, එම පංගුව සඳහා ජා.මු.අ. වෙත ගෙවිය යුතු මුදල බැංකුවේ බැරකමක් ලෙස සටහන් කර ඇත. ජා.මු.අ. විසින් වෙන් කරන ලද සමුච්චිත විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) ප්‍රමාණය බැරකමක් ලෙස සලකනු ලැබේ. ජා.මු.අ. විසින් වාර්තාකරණ දිනට ප්‍රකාශයට පත්කරන ලද විනිමය අනුපාතිකයන් අනුව ජා.මු.අ. වත්කම් සහ බැරකම් ප්‍රත්‍යාගණනයෙන් උද්ගත වන විනිමය ලාභ හෝ පාඩු ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ.

ජා.මු.අ. සමග වූ ශේෂයන්ට අදාළ සියළුම ගාස්තු සහ පොළිය එසැනින් ආදායම් ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ.

### 3.3.6 මුදල් සහ මුදල් සමානයන්

විදේශීය බැංකු සහ මූල්‍ය ආයතනයන්හි ඇති මුදල් සහ කෙටිකාලීන තැන්පතු, මුදල් සහ මුදල් සමානයන්ට අයත් වේ.

දේශීය මුදල් ක්‍රියාකාරකම්වල අංගයක් වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව ඇතැම් ආදායම් ඉපැයීම් ද ඇතැම් වියදම් දැරීම ද සිදුකරන නමුත්, එමගින් මුදල් චලනයක් සිදු නොවේ. එම ක්‍රියාකාරකම්වලින් ඇතැම් වත්කම් සහ බැරකම් ද උද්ගත වන අතර එයට ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකා රජය සමග සහ දේශීය බැංකු සහ මූල්‍ය ආයතන සමග ගනුදෙනු අදාළ වේ. ශ්‍රී ලංකා රජය සමග වන ගනුදෙනුවලට මූල්‍ය ප්‍රතිපත්ති කාරකයක් ලෙස රජය විසින් නිකුත් කරනු ලබන භාණ්ඩාගාර බිල්පත්වල ආයක නොවූ කොටසක් සහ රජය විසින් නිකුත් කරනු ලබන බැඳුම්කර අයත් වේ. එවැනි මිලට ගැනීම්, බැහැර කිරීම් හෝ ඒ මත පොළිය හුදෙක් පොත් සටහන් වශයෙන් පමණක් ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවල සටහන් කරනු ලැබේ. මේවා මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් 38 සහ සටහන් 39 යටතේ වෙන් වෙන්ව හෙළිදරව් කර ඇත.

මුදල් නීති පනතේ විධිවිධාන ප්‍රකාර, ව්‍යවස්ථාපිත අධිකාරිය වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මහජනයා වෙත මුදල් නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන මුදල්, දරන්නා වෙනුවෙන් බැංකුව මත හිමිකමක් පවතී. මෙය බැංකුවට බැරකමක් වන අතර දරන්නාට අතැති මුදල් වේ. සංසරණ මුදල්වල චලනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙන් ඉදිරිපත් කරන අතර, මහ බැංකු අතර පවත්නා පරිචය ප්‍රකාර, මූල්‍ය ක්‍රියාකාරකම්වල කොටසක් ලෙස ඇතුළත් කරනු ලැබේ.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල්/ගෙවීම් නියෝග ක්‍රියාවලිය මගින් නෝට්ටු සහ කාසි හෝ ශ්‍රී ලංකා මහ බැංකුව මත නිකුත් කරන චෙක්පත් මගින් ලබාගන්නා භාණ්ඩ සහ සේවා සඳහා සැපයුම්කරුවන් සහ සේවකයින් වන විවිධ අණ ලද්දන් වෙත මුදල් ගෙවනු ලැබේ. ඒවා සංසරණ මුදල් බැරකමට හෝ වාණිජ බැංකු සමග වන ශේෂයන්ට හෝ එකතු කරනු ලැබේ. එවැනි කටයුතු සඳහා වූ මුදල් භාවිතා කිරීම ශ්‍රී ලංකා මහ බැංකුවෙන් පිටතට යන මුදල් ප්‍රවාහයට අයත් වේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි, මුදල් සහ මුදල් සමානයන්ට මුදල්/මුදල් විධානයන්ගේ ශුද්ධ ගලායෑම් හා ඉහත විස්තර කරන ලද මුදල් සහ මුදල් සමානයන් ද අඩංගු වේ.

**3.3.7 ප්‍රතිමිලදී ගැනුම් සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනු**

ප්‍රතිමිලදී ගැනීම සඳහා ගිවිසුම් යටතේ විකුණනු ලබන සුරැකුම්පත්, වත්කම් ලෙස අඛණ්ඩව ශේෂ පත්‍රයෙහි සටහන් කරනු ලැබේ. ප්‍රතිමිලදී ගැනීම සඳහා වූ වගකීම් (ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් මත විකුණන ලද සුරැකුම්පත්) බැරකමක් ලෙස හෙළිදරව් කරනු ලැබේ. ප්‍රතිමිලදී ගැනීම් ගනුදෙනුවල විකුණුම් සහ ප්‍රතිමිලදී ගැනීමේ මිල සහ ප්‍රතිවර්තන මිලදී ගැනීමේ ගනුදෙනුවල මිලදී ගැනීමේ මිල සහ විකුණුම් මිල අතර වෙනස පිළිවෙලින් වියදමක් සහ ආදායමක් වන අතර, එය ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ.

ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත රඳවාගෙන ඇති සුරැකුම්පත් (නැවත විකිණීම සඳහා වූ ගිවිසුම් මත මිලදීගත් සුරැකුම්) වත්කම් ලෙස ශේෂ පත්‍රයෙහි සටහන් කරනු ලැබේ. ප්‍රතිමිලදී ගැනීමේ සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනු නිසා උපචිත ආදායමක් හෝ උපචිත වියදමක් උද්ගත වුයේ නම්, එය ද ප්‍රතිමිලදී ගැනීමේ සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනු වටිනාකම සමග වාර්තා කරනු ලැබේ.

**3.3.8 නිත්‍ය තැන්පතු පහසුකම්**

2014 පෙබරවාරි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි නිත්‍ය තැන්පතු පහසුකම (පෙර නිත්‍ය මිලදී ගැනුම් පහසුකම) සුරැකුම් රහිත තැන්පතු පහසුකමක් බවට පරිවර්තනය කරන ලදී. එබැවින් සහභාගී වන ආයතන තම අතිරේක අරමුදල් නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාත යටතේ දෛනිකව ආයෝජනය කරනු ලබයි.

නිත්‍ය ණය පහසුකම, පෙර නිත්‍ය ප්‍රතිවිකුණුම් පහසුකම හා සර්ව සම වේ.

**3.3.9 ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත්**

වෙළෙඳපොළේ අතිරික්ත ද්‍රවශීලතාවය අන්තර්ග්‍රහණය කර ගැනීම සඳහා මුදල් ප්‍රතිපත්ති ක්‍රියාත්මකවීම් යටතේ බැංකුව විසින් කලින් කලට ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් නිකුත් කරනු ලබයි.

නිකුත් කරනු ලබන සුරැකුම්පත් වගකීමක් ලෙස වාර්තා කරන අතර මුහුණත අගය සහ නිකුතු මිල අතර වෙනස ආදායම් ප්‍රකාශනයේ වියදමක් ලෙස වාර්තා කරනු ලබයි.

**3.3.10 ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්**

ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්, ශ්‍රී ලංකා රජයෙන් මිලට ගන්නා ලද භාණ්ඩාගාර බිල්පත්වලින් සමන්විත වේ. ඒවායින් බැංකුව විසින් ශ්‍රී ලංකා රජයට සපයන ලද ණය නියෝජනය කෙරෙන බැවින් එම කළඹ ක්‍රමක්ෂය පිරිවැයට සටහන් කරනු ලැබේ.

**3.3.11 රජයට දෙන ලද කාලීන අත්තිකාරම්**

1949 අංක 58 දරණ මුදල් නීති පනතේ (සංශෝධිත පරිදි) 89 වගන්තිය යටතේ ශ්‍රී ලංකා රජය වෙත සෘජුව දෙන ලද කාලීන අත්තිකාරම්වලින්, රජයට දෙන ලද අත්තිකාරම් නියෝජනය වේ. මෙම අත්තිකාරම් පසුව ක්‍රමක්ෂය පිරිවැයට දක්වා ඇත.

**3.3.12 අනිකුත් ආයතනවලට දෙන ලද ණය**

අනිකුත් ආයතනවලට දෙන ලද ණය මුදලින් අයකරගත නොහැකි ප්‍රමාණයන් සඳහා වූ මුදල් අඩුකර, ක්‍රමක්ෂය පිරිවැයට හඳුනාගෙන දක්වා ඇත. අයකරගත යුතු සියළු මුදල් බැංකුවට අයකරගත නොහැකි බවට නිශ්චිත සාක්ෂි තිබේ නම්, ඒ සඳහා (ණය අඩාලවීම) අඩමාන ණය ප්‍රතිපාදනයන් සලසනු ලැබේ. එම ප්‍රතිපාදනයේ ප්‍රමාණය ධාරණ මුදල් සහ ඇස්තමේන්තුගත අයකරගත හැකි මුදල අතර වෙනස වේ. බොල් ණය හඳුනාගත් අවස්ථාවේ දී කපාහරිනු ලැබේ.

**3.3.13 සුරැකුම්පත් ණයට දීම සහ ණයට ගැනීම**

බැංකුව විසින් එහි මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාකාරිත්ව අවශ්‍යතා සඳහා ප්‍රධාන සංස්ථාපිත ආයෝජකයින් වෙතින් රාජ්‍ය සුරැකුම්පත් ණයට ගැනීම සිදු කරයි. මෙම ණයට ගත් සුරැකුම්පත්, බැංකුව විසින් ප්‍රතිමිලදී ගැනීමේ ක්‍රියාකාරිත්වය මත වෙළෙඳපොළ තුළ පවතින අතිරික්ත ද්‍රවශීලතාවය අවශෝෂණය කර ගැනීමට යොදා ගනී.

සුරැකුම්පත් ණයට ගැනීම යනු නැවත බාරදීම අතපසු වන විටක දී, සුරැකුම්පත් නැවත භාරදීම, එකඟ වූ ගාස්තු ගෙවීම සහ වෙළෙඳපොළ වටිනාකම මත වන්දි ගෙවීම (බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ප්‍රාථමික වෙළෙඳපොළ සහභාගීවන්නන්ට දැනුම් දී ඇති වෙළෙඳපොළ මිල) සඳහා වන කොන්දේසි විරහිත ඇපවීමකි. ණයට ගත් සුරැකුම්පත් වෙළෙඳපොළ වටිනාකමින් කිසියම් අවස්ථාවක දී ප්‍රතිමිලදී ගැනීමේ ක්‍රියාකාරකම් සඳහා යොදා නොගත් සුරැකුම්පත් අසම්භාව්‍ය වගකීම් ලෙස වාර්තා කරනු ලැබේ. අදාළ ගාස්තු ගෙවීම උපචිත පදනම මත වර්තාකරණු ලබයි.

ණයට දීමේ ගනුදෙනුවක් යටතේ ප්‍රතිපාර්ශවයකට සුරැකුම්පත් මාරු කිරීම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි පෙන්නුම් කරෙනුයේ හිමිකාරිත්වයේ අවදානම් හා ප්‍රතිලාභයන්ද මාරු වූයේ නම් පමණි.

**3.3.14 සේවක ණය**

සහනදායී පොළී අනුපාත යටතේ ණය පහසුකම් ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු සේවකයන්ට හිමිකම ලැබේ. 2008 වසරේ සිට නිකුත් කල මෙම ණය, ජා.ගි.ප්‍ර. 39 අනුව, වට්ටම් කරන ලද මුදල් ප්‍රවාහ ක්‍රමය භාවිතා කරමින් ඒවායේ සාධාරණ අගයට ගණනය කරනු ලැබේ.

වට්ටම් අනුපාතය - මෙම අනුපාතය ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් ඉලක්ක කරගත් දිගුකාලීන උද්ධමනය පදනම් කොට ශ්‍රී ලංකා මහ බැංකු ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව මගින් සම්පාදනය කරන ලදී. විගණන කමිටුව මගින් එකඟ වී ඇති පරිදි වාණිජ්‍ය පොළී නිර්දේශිත අනුපාතය (CIRR) සඳහා සියයට 1 ක අවදානම් අධිකයක් ද එකතු කරමින් වට්ටම් අනුපාතය භාවිත කොට ඇති අතර එය ණයවල කාලපරිච්ඡේදය සමඟ වෙනස් වේ.

මෙම ණය සහනදායී පොළී අනුපාතයන් යටතේ ලබාදීම නිසා බැංකුව විසින් දරණ ලද වියදම වාර්තා කිරීමට සේවක ණයවල වර්ෂ ආරම්භ දිනට සහ වර්ෂ අවසාන දිනට වර්තමාන අගයන්ගේ වෙනස වාර්ෂිකව ක්‍රමක්ෂය කරන අතර බැංකුව විසින් මෙම ණය, වෙළෙඳපොළ අනුපාතිකයන්ට දෙනු ලැබුවේ නම්, බැංකුව විසින් උපයනු ලබන ආදායම වාර්තා කිරීමට සමාන අගයක්, අනෙකුත් ආදායම් ලෙස වාර්තා කරයි.

**සාධාරණ අගයකරන ගණනය සඳහා යොදාගනු ලබන උපකල්පනයන් :**

- සේවක ණය ලබාදුන් දිනය ලෙස ජනවාරි 01 දින සලකන ලදී.
- මෙම ණය සඳහා කිසිඳු ආකාරයක ගැලපීමක් හෝ පියවීමක් සිදුවී නොමැත.

### 3.3.15 මූල්‍ය වත්කම් හානිකරණය

කිසියම් මූල්‍ය වත්කමක් හානිකරණය වී ඇත්දැයි බැංකුව විසින් වාර්තාකරණ දිනයන්හි දී තක්සේරු කරනු ලැබේ.

### 3.3.16 ක්‍රමක්ෂය පිරිවැයට ධාරණය කළ වත්කම් හානිකරණය

ක්‍රමක්ෂය පිරිවැයට ධාරණය කළ ණයක් හෝ ලැබිය යුතු මුදලක් හානිකරණය වී ඇති බවට සාධාරණ සාක්ෂි ඇත්නම්, එම අලාභය ගණනය කරනු ලබන්නේ වත්කමේ ධාරණ අගය සහ ඇස්තමේන්තු කළ අනාගත මුදල් ප්‍රවාහයන්ගේ (මෙතෙක් දරා නොමැති අනාගත ණය අලාභ හැර) වත්කමේ මුල් සඵල පොළී අනුපාතයත්, වට්ටම් කළ අගයත් අතර වෙනස මගිනි. වත්කමක ධාරණ අගය සෘජුව හෝ දීමනා ගිණුමක් මගින් හෝ අඩුකරනු ලැබේ. පාඩු වූ ප්‍රමාණය ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගනු ලැබේ.

බැංකුව ප්‍රථමයෙන් තනිව වැදගත් සහ තනිව හා සාමූහිකව නොවැදගත් මූල්‍ය වත්කම් හානිකරණය වී ඇති බවට සාධාරණ සාක්ෂි තිබේදැයි විමර්ෂණය කරනු ලබයි. එසේ වැදගත් හෝ නොවැදගත් තනිව විමර්ෂණය කළ මූල්‍ය වත්කමක් හානිකරණය වී ඇති බවට සාධාරණ සාක්ෂි නොමැති යැයි තීරණය කළහොත් එම මූල්‍ය වත්කම සමාන ණය අවදානමක් ඇති මූල්‍ය වත්කම්වලට ඇතුළත් කර, එම වත්කම් හානිකරණය සඳහා සාමූහිකව විමර්ශණය කරනු ලැබේ. තනිව හානිකරණ පාඩු සඳහා තක්සේරු වට්නාකමට අදාළව හානිකරණ පාඩු පවතී නම් හෝ ඒ බව අඛණ්ඩව හඳුනාගෙන තිබේ නම් ඒවා සාමුහික තක්සේරුවකට ඇතුළත් කරනු නොලැබේ.

පසුකාලයේ දී හානිකරණ අලාභයේ අගය අඩුවන්නේ නම් සහ හානිකරණය හඳුනාගැනීමෙන් පසු සිදු වූ සිදුවීමකට විෂයානුබද්ධව අදාල කර ගතහැකි නම් කලින් හඳුනාගත් හානිකරණ අලාභය ආපසු ගලපයි. පසුකාලයක දී ආපසු ගලපන ලද ඕනෑම හානිකරණ අලාභයක් ආපසු ගලපන ලද දිනට වත්කමේ ධාරණ අගය එහි ක්‍රමක්‍ෂය පිරිවැය නොඉක්මවන ප්‍රමාණයක් දක්වා ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ.

### 3.3.17 විකිණීමට ඇති ආයෝජන හානිකරණය

විකිණීමට ඇති වත්කමක් හානිකරණය වී ඇත්නම් එහි පිරිවැය (මූලික ගෙවීම සහ ක්‍රමක්ෂය අතර ශුද්ධ අගය) හා එහි වර්තමාන සාධාරණ අගය, මීට පෙර ලාභය හෝ අලාභය යටතේ හඳුනාගත් හානිකරණ අලාභයක් වේ නම් එය අඩුකර හිමිකරු ප්‍රාග්ධනයෙන් ආදායම් ප්‍රකාශනයට මාරුකරනු ලැබේ. විකිණීමට ඇති ලියවිලි ලෙස වර්ගකර ඇති හිමිකම් ප්‍රාග්ධන ලියවිලි නැවත ගැලපීම් ලාභය සඳහා හඳුනාගන්නේ නැත. ණය ලියවිලිවල හානිකරණ අලාභ, ලියවිල්ලෙහි සාධාරණ අගයෙහි වැඩිවීම, හානිකරණ පාඩුව හඳුනා ගැනීමට පසුව වූ සිද්ධියකට අදාල වන බවට නිශ්චිත සාක්ෂි තිබේ නම් පමණක්, එය ලාභ හෝ පාඩු හරහා නැවත ගැලපිය හැකිය.

### 3.3.18 විදේශීය මුදල් කාලීන බැරකම්

විදේශීය මුදල් කාලීන බැරකම්, බැරකම්වල ක්‍රමක්ෂය පිරිවැයට පසුව වාර්තා කරනු ලැබේ. මෙම බැරකම්වල අගය වෙනස්වීම කාලීන බැරකම්වල වැඩිවීමක් හෝ අඩුවීමක් ලෙස ශේෂ පත්‍රයෙහි දක්වනු ලැබේ. විදේශීය මුදල් කාලීන බැරකම්වල වෙනස්වීම් වලින් උද්ගතවන වාසි සහ අවාසි වහාම ආදායම් ප්‍රකාශනයෙහි වියදමක් ලෙස හඳුනාගනු ලැබේ. බැරකමේ අයිතිය තවදුරටත් පවතී නම් වාසිය හෝ අවාසිය උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණනයෙන් වාසිය/(පාඩුව) ලෙස වාර්තා කරනු ලැබේ. වාසිය හෝ අවාසිය උපලබ්ධි වූ (බැරකම ආපසු ගෙවීම් මගින්) අවස්ථාවන්හිදී එය මිල වෙනස්වීම්වලින් උපලබ්ධි වූ වාසිය/(පාඩුව) ලෙස වාර්තා කරනු ලැබේ.

### 3.3.19 වෙනත් මූල්‍ය වත්කම් සහ බැරකම්

මුදල්, තැන්පතු සහ කෙටිකාලීන අත්තිකාරම් වශයෙන් වූ දේශීය සහ විදේශීය මුදල් වෙළෙඳ දිනයේ දී හඳුනාගනු ලැබේ.

## 3.4 අනිකුත් වත්කම් සහ බැරකම්

### 3.4.1 රන්

මුදල් නීති පනතේ 67(1) වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකා මහ බැංකුවට තම ජාත්‍යන්තර සංචිතයේ කොටසක් ලෙස, රන් දැරිය හැක. එම නිසා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ජාත්‍යන්තර සංචිතයේ කොටසක් ලෙස දරා සිටි රන් වල අගය 2016 දෙසැම්බර් 31 දිනට රුපියල් බිලියන 124.41 කි (බෙදා වෙන්කළ හැකි රන් රුපියල් බිලියන 111.01 ක් සහ බෙදා වෙන් කළ නොහැකි රන් රුපියල් බිලියන 13.40 ක් වශයෙන්). මෙම රන් තොගය ජාත්‍යන්තර සංචිතයේ කොටසක් වන බැවින් සහ සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී වෙළෙඳ භාණ්ඩයක් ලෙස හුවමාරු නොවන බැවින් රන් සාධාරණ අගයට අගය කොට ලාභය හෝ අලාභය ආදායම් ප්‍රකාශයට මාරු කරනු ලැබේ. රන්වලින් උපලබ්ධි නොවූ ලාභය හෝ අලාභය ලාභාලාභ විසර්ජනයට පෙර අදාළ සංචිත ගිණුමට මාරු කරනු ලැබේ.

### 3.4.2 තොග

#### 3.4.2.1 මුදල් තොග

බැංකුවේ තොගය තුල, සංසරණය සඳහා නිකුත් කර නොමැති නව ව්‍යවහාර මුදල් අන්තර්ගත වේ. නව මුදල් නෝට්ටු සහ කාසිවලට අදාල නිෂ්පාදන සහ නිර්මාණ පිරිවැය, මුල්වරට පිරිවැයට හඳුනාගනු ලැබේ. සංසරණය සඳහා නිකුත් කරනු ලබන නව මුදල් නෝට්ටු සහ කාසිවල අදාල පිරිවැය බර තබන ලද සාමාන්‍ය පදනමක් මත තීරණය කරන අතර, නිකුත් කරන අවස්ථාවේදී එය ආදායම් ප්‍රකාශනයට ගලපනු ලැබේ. සෙමෙන් චලනය වන තොගය සඳහා වෙන් කිරීම් සිදු කර ඇත.

**3.4.2.2 අනෙකුත් තොග**

අනෙකුත් තොග, පිරිවැය හෝ උපලබ්ධි වටිනාකම් වන දෙකෙන් අඩු ප්‍රමාණය මත දක්වා ඇත. බර තබන ලද සාමාන්‍ය පිරිවැය පදනම්ව පිරිවැය නිශ්චය කරනු ලැබේ. සෙමින් වැයවන තොග සඳහා වෙන් කිරීමක් සලසා ඇත.

**3.4.3 දේපළ, පිරියත සහ උපකරණ**

දේපළ, පිරියත සහ උපකරණ එදිනෙදා සේවා වියදම් හැර, සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානිකරණ වටිනාකම අඩුකළ පිරිවැයට දක්වනු ලැබේ. එකී දේපළ, පිරියත සහ උපකරණවල කොටස් ආදේශ කිරීමේ පිරිවැය එය දරන අවස්ථාවේදී හඳුනා ගැනීම සඳහා වූ නිර්නායකයන් සපුරන ලද්දේ නම්, එකී වියදම් ද එවැනි පිරිවැයට ඇතුළත් වනු ඇත.

ගොඩනැගිලි සඳහා වූ ක්ෂය සහ ප්‍රත්‍යාගණන දිනයට පසුව අඩුකළ හානිකරණ පාඩු අඩුකර, ඉඩම් සහ ගොඩනැගිලි ගණනය කර ඇත.

සින්නක්කර ඉඩම් හැර, වත්කම්වල පහත සඳහන් ඇස්තමේන්තු කළ ජීවකාලය තුළ සරළ මාර්ග ක්‍රමය අනුව ක්ෂය ගණනය කරනු ලැබේ.

| වත්කම් වර්ගය | ජීවකාලය |
|---|---|
| සින්නක්කර ඉඩම්වල | |
| පිහිටි ගොඩනැගිලි | වර්ෂ 50 ක් තුළ |
| කල්බදු ඉඩම්වල පිහිටි | |
| ගොඩනැගිලි | කල්බදු කාල පරිච්ඡේදය තුළ |
| පිරියත සහ පිරියත | |
| කොටස් | වර්ෂ 20 ක් තුළ |
| ලී බඩු සහ උපකරණ | වර්ෂ 10 ක් තුළ |
| මෝටර් රථ | වර්ෂ 5 ක් තුළ |
| 2014 වර්ෂයේ සිට මිලදී | |
| ගත් මෝටර් රථ | වර්ෂ 10 ක් තුළ |
| පරිගණක දෘඪාංග | වර්ෂ 4 ක් තුළ |
| වෙනත් | වර්ෂ 3 ක් තුළ |

ධාරණ අගයක් අයකරවාගත නොහැකි බවට සිද්ධීන් හෝ අවස්ථානුකූල වෙනස්කම් හෝ මගින් පෙන්නුම් කරන විටක යන්ත්‍ර හා උපකරණවල සාධාරණ අගය හානිකරණය සඳහා සමාලෝචනය කළ යුතුය. පළමුව පිරිවැය මත හඳුනා ගැනීමෙන් අනතුරුව ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කළ වටිනාකම පවත්වා ගෙන යනු ලබන අතර, එය වූ කලී පසුකාලීන සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හානිකරණ අලාභ අඩුකළ සාධාරණ අගය වේ.

බැංකුවේ ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය සඳහා වූ ප්‍රතිපත්තිය වන්නේ අවම වශයෙන් වසර 5කට වරක් හෝ සැලකිය යුතු තක්සේරු ගැලපීමක් ඊට අඩු කාලසීමාවක් තුළදී ප්‍රත්‍යක්ෂ වූ විටය.

ප්‍රත්‍යාගණන අතිරික්තය ප්‍රත්‍යාගණන සංචිතයට බැරකර, ශේෂ පත්‍රයේ හිමිකරු ප්‍රාග්ධනය යටතේ දක්වනු ලැබේ. කෙසේ වුවද මීට පෙර එම වත්කමෙහි හඳුනාගත් ප්‍රත්‍යාගණන අඩුවීමක් ප්‍රතිවර්තනය කරනු ලබන ප්‍රමාණයට එම ප්‍රත්‍යාගණන වැඩිවීම, ආදායමක් ලෙස හඳුනාගෙන ආදායම් ප්‍රකාශනයෙහි දක්වනු ලැබේ. ප්‍රත්‍යාගණන අඩුවීම් ද ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ. කෙසේ වුවද, ප්‍රත්‍යාගණන අඩුවීමක් එම වත්කම සම්බන්ධයෙන්ම වූ පෙර ප්‍රත්‍යාගණන අතිරික්තයක් නිෂ්ප්‍රභා කරන්නේ නම්, එම ප්‍රත්‍යාගණන අඩුවීම්, ප්‍රත්‍යාගණන සංචිතයේ ඇති අතිරික්තය සමග ගලපනු ලැබේ. වත්කමක් බැහැර කිරීමේදී, කිසියම් වත්කමකට සම්බන්ධ ප්‍රත්‍යාගණන අතිරික්තයක් වෙතොත් එය රඳවාගත් ඉපැයීම්වලට මාරු කරනු ලැබේ. කිසියම් වත්කමක් ඉවත් කිරීමෙන් භාවිතා කිරීමෙන් හෝ ඉවත්කිරීමේ අනාගත ප්‍රතිලාභ ලැබීමේ අපේක්ෂාවක් නොමැතිනම් එය දේපළ, පිරියත සහ උපකරණ ලෙස හඳුනා ගනු නොලැබේ. එවැනි අවස්ථාවක උද්ගත වන ලාභ හා අලාභ (ඉවත් කිරීමෙන් ලබන ශුද්ධ මුදල සහ ධාරණ අගය අතර වෙනස) එම වර්ෂයේදීම ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ. වත්කමෙහි අවශේෂ වටිනාකම, ජීවකාලය සහ ක්‍රමයන් සමාලෝචනයට භාජනය කරනු ලබන අතර අවශ්‍ය වේ නම් නිරතුරුව ගැලපීම් කරනු ලැබේ.

**3.4.4 අස්පෘශ්‍ය වත්කම්**

පරිගණක දෘඪාංගවල සංරචකයන් නොවන පරිගණක මෘදුකාංග, අස්පෘෂ්‍ය වත්කම් ලෙස දක්වා පිරිවැයට හඳුනාගනු ලැබේ. මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව මෙම අස්පෘෂ්‍ය වත්කම්, වර්ෂ 4 ක ජීවකාලයක් පදනම් කළ සමුච්චිත ක්‍රමක්ෂය අඩුකළ ධාරණ අගයකට පවත්වා ගෙන යනු ලැබේ.

**3.4.5 අනෙකුත් වත්කම්**

අනෙකුත් වත්කම් අපේක්ෂිත උපලබ්ධි වටිනාකමට පවත්වාගෙන යනු ලැබේ.

**3.4.6 මූල්‍ය නොවන වත්කම් හානිකරණය**

කිසියම් මූල්‍ය නොවන වත්කමක් හානිකරණයට භාජනය වීමේ සලකුණු දක්වන්නේ නම් හෝ පවත්නා සිද්ධීන් හෝ වෙනත් තත්ත්වයක් හේතුවෙන් ධාරණ අගය හානි වියහැකි බව පෙන්නුම් කරන්නේ නම් බැංකුව විසින් ඒවා එක් එක් වාර්තා කිරීමේ දිනයේ දී සමාලෝචනය කරනු ලැබේ. එවැනි ඉඟියක් පවතී නම්, බැංකුව විසින් වත්කමෙන් අයකර ගත හැකි මුදල් ප්‍රමාණය ඇස්තමේන්තු කරනු ලැබේ. වත්කමක ධාරණ අගය අයකරගත හැකි මුදල් ප්‍රමාණය ඉක්මවන්නේ නම් වත්කම හානිකරණය වූ ලෙස සලකා, අයකර ගත හැකි වටිනාකමට ගිණුම් තබනු ලැබේ.

**3.4.7 ප්‍රතිපාදන**

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් බැංකුවට වර්තමාන වගකීමක් (නෛතික හෝ සම්මුතියකින්) ඇතිවිටෙක දී වගකීම බේරුම් කිරීම සඳහා ආර්ථික වාසි ඇතුළු සම්පත් ගලායාමක් අවශ්‍යවීමත්, එම වගකීම පිළිබඳ විශ්වසනීය ඇස්තමේන්තුවක් පිළියෙල කිරීමට හැකිවීමත් මත ප්‍රතිපාදන හඳුනාගනු ලැබේ. ප්‍රතිපාදනයක් ප්‍රතිපූර්ණය කිරීමට බැංකුව අපේක්ෂා කරන්නේ නම්, එම ප්‍රතිපූර්ණය නිසැකවම තහවුරු වන්නා වූ අවස්ථාවලදී, එය වෙන ම වත්කමක් ලෙස හඳුන්වනු ලැබේ.

**3.4.8 සංසරණයේ පවතින මුදල්**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන මුදල් ඒවා දරන්නන්ට බැංකුව මත හිමිකමක් පවතී. සංසරණයේ පවතින මුදල් සඳහා බැරකම, ඒවායේ මුහුණත වටිනාකම මත මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ සටහන් කරනු ලැබේ.

**3.4.9 විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවක ප්‍රතිලාභ යෝජනාක්‍රම**

බැංකුව විසින් මෙහෙයවනු ලබන විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවක ප්‍රතිලාභ යෝජනා ක්‍රම 45 වැනි සටහනෙහි හෙළිදරව් කර ඇත.

**3.4.10 නිශ්චිත ප්‍රතිලාභ යෝජනා ක්‍රම**

බැංකුව විසින් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම, වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප්, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප්, විශ්‍රාම පාරිතෝෂික සහ විශ්‍රාම සේවක වෛද්‍ය ප්‍රතිලාභ යන නිශ්චිත ප්‍රතිලාභ යෝජනාක්‍රම පවත්වා ගෙන යනු ලබයි. ඉන් වෙන් වෙන්ව පරිපාලනය කරනු ලබන පළමු යෝජනා ක්‍රම 3 ට බැංකුව සහ සුදුසුකම් ලත් ප්‍රතිලාභීන් විසින් දායක මුදල් ගෙවනු ලැබේ. නිශ්චිත ප්‍රතිලාභ යෝජනාක්‍රම යටතේ ප්‍රතිලාභ ගෙවීමේ පිරිවැය, පුරෝකථනය කළ ඒකීය බැර ආයුගණන ක්‍රමයක් මත එක් එක් යෝජනා ක්‍රමයට වෙන් වෙන් වශයෙන් තීරණය කරනු ලැබේ.

**3.4.11 නිශ්චිත දායක යෝජනා ක්‍රම**

අදාල ව්‍යවස්ථා සහ රෙගුලාසි ප්‍රකාර සේවකයින්ට සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලේ දායකත්වයට හිමිකමක් ලැබේ. බැංකුව විසින් සේවකයින්ගේ දළ පාරිශ්‍රමිකයෙන් සියයට 24 ක් සහ සියයට 3 ක් පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායක වශයෙන් ගෙවනු ලැබේ. මෙම අරමුදලේ නිශ්චිත දායක සැලසුම් වෙන් වෙන්ව පරිපාලනය කරනු ලැබේ.

**3.4.12 ප්‍රදානයන්**

සාධාරණ වටිනාකමට හඳුනාගෙන ඇති ප්‍රදානයන්, ඒවා ලබා ගැනීම සඳහා පමුණුවා ඇති කොන්දේසිවලට අනුකූලවීමට ඇති ඉඩකඩ පිළිබඳ සාධාරණ තහවුරුවක් ඇතිවිට ඒවා හිමිකරු ප්‍රාග්ධනය යටතේ දක්වනු ලැබේ. ප්‍රදානයන් වියදම් විෂයකට අදාල වන අවස්ථාවක දී වියදමට සරිලන කාල පරිච්ඡේදයක් තුළ ක්‍රමානුකූල පදනමක් මත එය ආදායම් ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ. ප්‍රදානයක් වත්කමට අදාල වන අවස්ථාවක දී එහි සාධාරණ අගය රජයේ විලම්භිත ප්‍රදාන ගිණුමකට බැරකර, එම වත්කමේ ක්ෂය ප්‍රතිපත්තියට අනුකූල වූ ක්‍රමානුකූල පදනමක් මත එහි අපේක්ෂිත ප්‍රයෝජනවත් ආයුකාලය තුළ ආදායම් ප්‍රකාශනයට මුදාහරිනු ලැබේ.

**3.4.13 සේවක මණ්ඩල වියදම්**

සේවක මණ්ඩල වියදම්වලට, මුළු කාර්ය මණ්ඩල ප්‍රතිලාභවල පූර්ණ පිරිවැය ඇතුළත් ය. වර්ෂය අවසානයේ දී ගෙවිය යුතු වැටුප් සහ සම්බන්ධිත වියදම්, අනිකුත් දේශීයව ගෙවිය යුතු ශේෂයන් යටතේ දක්වනු ලැබේ.

**3.4.14 ක්‍රියාත්මක කල්බදු**

බැංකුව කල්බදු ගැනුම්කරු වන අවස්ථාවන්හි දී, කල්බදු ගත් වත්කම්වලින් අපේක්ෂිත ප්‍රතිලාභ පදනම් කරගෙන, ක්‍රියාත්මක කල්බදු සඳහා ගෙවිය යුතු කුලිය එය බල පවත්නා කාල පරිච්ඡේදය තුළ ආදායම් ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ.

**3.4.15 බදුකරණය**

1949 අංක 58 දරණ මුදල් නීති පනතේ 118 වැනි වගන්තිය ප්‍රකාර බැංකුවේ ආදායම, ආදායම් බද්දෙන් නිදහස් වේ. තවද 2013 අංක 06 දරණ ආර්ථික සේවා ගාස්තු (සංශෝධිත) පනත යටතේ සහ 2013 අංක 17 දරණ එකතුකළ අගය මත බදු (සංශෝධිත) පනත යටතේ ආර්ථික සේවා ගාස්තු සහ මූල්‍ය සේවා සැපයීම මත වන එකතුකළ අගය මත බද්දෙන් බැංකුව නිදහස් වේ.

**3.4.16 ආදායම සහ වියදම**

බැංකුව වෙත ආර්ථික ප්‍රතිඵල ගලාඒමේ හැකියාව සහ ආදායම නිසැකව ම මිනුම් කළ හැකි ප්‍රමාණය අනුව ආදායම් ගිණුම්ගත කරනු ලැබේ. දරන ලද පිරිවැය සහ උපයන ලද නිශ්චිත ආදායම අතර සෘජු සම්බන්ධතාවය පදනම් කරගෙන ආදායම් ප්‍රකාශනයෙහි වියදම් සටහන් කරනු ලැබේ. ව්‍යාපාරය පවත්වාගෙන යාම සහ දේපල, පිරියත, උපකරණ කාර්යක්ෂමව පවත්වා ගැනීම සඳහා දරන ලද සියළුම වියදම්, වර්ෂය සඳහා ප්‍රතිඵල ගණනය කිරීම පිණිස ආදායමට එරෙහිව සටහන් කර ඇත.

ආදායම් හා වියදම් හඳුනාගැනීමට පෙර පහත දැක්වෙන ගිණුම්ගත කිරීම් හඳුනාගැනීමේ නිර්ණායකයන් සපුරාලිය යුතුය.

**3.4.16.1 පොළිය**

පොළිය ලැබීම පිළිබඳ සැකයක් නොමැති නම්, මිලට ගැනීමේ සත්‍ය මිල පදනම්ව, සඵල ඵලදායිත්ව ක්‍රමයට, උපචිත පදනම මත පොළී ආදායම සහ වියදම, ආදායම් ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ. ස්ථාවර ආදායම් ආයෝජන, සුරැකුම්පත් මත උපයන කූපන්, භාණ්ඩාගාර බිල්පත්, අනිකුත් වට්ටම් උපකරණ මත උපචිත වට්ටම් සහ අධිමිල පොළී ආදායමට ඇතුළත් ය. ණය අයකර ගැනීම සැක සහිත අවස්ථාවල දී පොළී ආදායම අත්හිටුවන අතර, ඒවා ලැබෙනතුරු පොළී ආදායමෙන් බැහැර කරනු ලැබේ.

**3.4.16.2 ලාභාංශ**

ලාභාංශ ආදායම කොටස්හිමියා වෙත ලැබීමේ අයිතිය තහවුරු වූ විට හඳුනාගනු ලැබේ.

**3.4.16.3 විවිධ**

විවිධ ආදායම් සහ වියදම් උපචිත පදනම මත හඳුනාගනු ලැබේ. දේපල, පිරියත සහ උපකරණ බැහැර කිරීමේදී උද්ගතවන ආදායම් ස්වභාවයේ ශුද්ධ ලාභ හෝ පාඩු, වත්කම් ධාරණ අගය සහ විකුණුම් වියදම්, බැහැර කිරීමේදී දරණ ලද වියදම් අඩුකොට ආදායම් ප්‍රකාශනයෙහි ගිණුම්ගත කර ඇත. ප්‍රධාන ලාභ උත්පාදන ක්‍රියාකරකම්වලට අනුෂාංගික ක්‍රියාකාරකම්වලින් උද්ගතවන සහ සමාන ගනුදෙනු සමූහයකින් උද්ගතවන එතරම් වැදගත් නොවන ලාභ සහ පාඩු එකතුකොට ශුද්ධ පදනම මත වාර්තාකර ඉදිරිපත් කරනු ලැබේ.

**3.4.17 අසම්භාව්‍ය වගකීම් සහ බැඳීම්**

ණය ගැතිකම් සහතිකවීම්, ඉදිරි විදේශ විනිමය ගනුදෙනු සහ අනිකුත් බැඳීම් සියල්ල ශේෂ පත්‍රයේ හඳුනා නොගන්නා අතර අදාල ශීර්ෂ යටතේ අසම්භාව්‍ය වගකීම් හා ප්‍රාග්ධන බැඳීම් අයිතම ලෙස හඳුනාගෙන ඇත. අවශ්‍යවන අවස්ථාවන්හිදී මෙම ප්‍රමාණ වඩාත් උචිත ඇස්තමේන්තු අනුව මිනුම් කර ඇත.

## 4. ක්‍රියාකාරකම්වල ස්වභාවය සහ විෂය පථය

1949 අංක 58 දරණ මුදල් නීති පනත (සංශෝධිත පරිදි) යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්ති පියවර නිශ්චය කිරීමට අමතරව මහ බැංකුවේ බලතල, යුතුකම් සහ කර්තව්‍යයන් පැවැරෙන අතර, බැංකුවේ කළමනාකාරිත්වය, මෙහෙයුම් සහ පරිපාලනය සඳහා පොදුවේ වගකිවයුතු වන්නේය. බැංකුව විසින් මූලිකව ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය සහ ගෙවීම් පද්ධති පරිපාලනය, අධීක්ෂණය සහ නියාමනය සඳහා පොදුවේ වගකිවයුතු අතර රජයේ මූල්‍ය නියෝජිත ලෙස ද කටයුතු කරනු ලැබේ. බැංකුවේ ක්‍රියාකාරකම්වලට ප්‍රධාන වශයෙන් පහත සඳහන් දෑ ඇතුළත් ය.

- මුදල් සහ විනිමය අනුපාත ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
- මුදල් නිකුත් කිරීම.
- මූල්‍ය පද්ධතියෙහි නිදහස් තරගකාරිත්වය සහ ස්ථායීතාවය සැලසීම.
- සුදුසුකම්ලත් මූල්‍ය ආයතනවලට බලපත්‍ර ලබාදීම සහ අධීක්ෂණය.
- අන්තර් බැංකු බේරුම් කිරීමේ පද්ධතිය සංවිධානය හා කළමනාකරණය සහ ගෙවීම් පද්ධතියෙහි නිසි ක්‍රියාකාරීත්වය ප්‍රවර්ධනය කිරීම.
- විවිධ පහසුකම් යටතේ රජයට, බැංකුවලට සහ මූල්‍ය ආයතනවලට ණය සහ අත්තිකාරම් සැපයීම.
- රජය සහ රජය වෙනුවෙන් ක්‍රියාකරන නියෝජිත ආයතන සමග නිශ්චිත විධිවිධාන යටතේ සුරක්ෂිතාගාරයක් ලෙස ක්‍රියාකිරීම.

ශ්‍රී ලංකාවේ ඵලදායී සම්පත් සංවර්ධනය, දිරි ගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීමේ අදහසින් යුතුව එහි පරමාර්ථය වන ආර්ථික, මිල සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සපුරාගැනීම සඳහා පවත්වා ගෙනයන ක්‍රියාකාරකම්, විදේශීය මුදල් ක්‍රියාකාරකම් සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් ලෙස පුළුල්ව වෙන්කර දැක්විය හැකිය. මෙම ක්‍රියාකාරකම්වල ප්‍රතිඵල ආදායම් ප්‍රකාශනයට අදාළව මෙහෙයුම් ක්‍රියාකාරකම් වේ.

**4.1 විදේශීය මුදල් ක්‍රියාකාරකම්**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එහි විදේශීය සංචිත කළමනාකරණය යටතේ පවත්වාගෙන යනු ලබන විදේශීය මුදල් වත්කම්වලින් විදේශීය මුදල් ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් ජනිත වේ. විදේශීය සංචිත කළමනාකරණ කළඹ, විදේශීය මුදල් මැදිහත්වීමේ කාර්යයන් සඳහා වූ විදේශීය මුදල් වත්කම් සහ වෙළෙඳ කටයුතු සඳහා වූ අනිකුත් විදේශීය මුදල් වත්කම්වලින් සමන්විත වේ.

විදේශීය මුදල් වත්කම් විවිධ මුදල් වර්ගවලින් පවත්වා ගනු ලැබේ. එයින් වැඩි ප්‍රමාණයක් ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර්, ඔස්ට්‍රේලියානු ඩොලර්, යූරෝ, බ්‍රිතාන්‍ය පවුම්, ජපන් යෙන් සහ නවසීලන්ත ඩොලර් වලින් හඳුන්වා ඇත.

මෙම විදේශීය මුදල් කළඹ තුළ වූ මූල්‍ය ලියවිලි ප්‍රධාන වශයෙන් ඍෛවරී සුරැකුම්පත් ප්‍රතිවර්තිත මිලදී ගැනීමේ ගනුදෙනු යටතේ දරනු ලබන සුරැකුම් හෝ අනිකුත් මහ බැංකු, වාණිජ බැංකු හා අනිකුත් භාරකාර ආයතන වෙත වූ ශේෂයන්ගෙන් සමන්විත වේ.

විදේශීය වෙළෙඳපොළේ මෙහෙයුම්වලින් උද්ගත වන්නා වූ විදේශීය මුදල් වත්කම් සහ බැරකම් ද, කලින් කලට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දරනු ලැබේ.

**4.2 දේශීය මුදල් ක්‍රියාකාරකම්**

දේශීය මුදල් ක්‍රියාකාරකම් පහත සඳහන් පරිදි උද්ගත වේ.

(i) ද්‍රවශීලතා කළමනාකරණ මෙහෙයුම්: බැංකු පද්ධතියට අරමුදල් අත්තිකාරම් දීමෙන් හෝ බැංකු පද්ධතියෙන් අරමුදල් ආපසු ගැනීමෙන් රජයට හෝ මූල්‍ය වෙළෙඳපොළට දෛනිකව සිදුවන ශුද්ධ ගලායාම් හිලව් කරනු ලැබේ. මෙම කටයුතු බොහොමයක් දෛනික වෙළෙඳපොළ මෙහෙයුම් මගින් සිදුකරනු ලැබේ.

(ii) විවෘත වෙළෙඳපොළ කටයුතු සඳහා ආධාරකයක් වශයෙන් ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් වලින් සමන්විත ආයෝජන කළඹක් බැංකුව පවත්වා ගනී. බැංකුවේ ප්‍රතිපත්තිය වන්නේ මෙම ආයෝජන වෙළඳාම සඳහා නොව මුදල් මෙහෙයුම් කටයුතු සඳහා පමණක් පවත්වා ගැනීමය.

**4.3 භාර සහ භාරකාරත්ව ක්‍රියාකාරකම්**

භාරකාර සහ පරිපාලන විධිවිධාන යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පරිපාලනය කරනු ලබන මුදල්, බැංකුවේ මූල්‍ය ප්‍රකාශනයන් ගෙන් අන්තර්ගත කොටසක් නොවන බැවින් ඒවා මෙම මූල්‍ය ප්‍රකාශනයෙහි ඇතුළත් කර නොමැත.

**5. විදේශීය සුරැකුම්පත්වල ආයෝජනයන්**

| | 2016 රු. 000 | 2015 රු. 000 |
|---|---|---|
| **ලාභ/අලාභ මත සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත්** | | |
| - විදේශීය සුරුකුම්පත්වල ආයෝජනයන් | **29,882,588** | 23,986,740 |
| - රන් (බෙදා වෙන් කළ නොහැකි) | **13,396,167** | 11,792,925 |
| | **43,278,755** | 35,779,665 |
| **විකිණීම සඳහා ඇති ආයෝජන** | | |
| - විදේශීය සුරුකුම්පත්වල ආයෝජනයන් | **341,225,162** | 344,668,225 |
| - ඒකක ආයෝජන | **7,319,488** | 7,386,257 |
| | **348,544,650** | 352,054,482 |
| **විදේශ සුරුකුම්පත්වල එකතුව** | **391,823,405** | 387,834,147 |

විදේශීය සුරැකුම්පත් ආයෝජන තුළ ශ්‍රී ලංකා මහ බැංකුව 2016 වසර තුළදී ලෝක බැංකුව මගින් පාලනය කරනු ලබන සංචිත කළමනාකරණය සහ උපදේශන වැඩසටහන (RAMP)හි කරන ලදි ආයෝජන ඇතුළත් වේ. එම RAMP ආයෝජනයේ 2016 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු. මිලියන 29,882.59 ක් වේ.

**6. ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ**

අ) පහත දක්වා ඇති වගුව මගින් ව්‍යුත්පන්න මූල්‍ය උපකරණයන්හි සාධාරණ අගයන් එහි කාල්පනික අගයන් සමග වත්කම් හෝ බැරකම් වශයෙන් වාර්තා කර ඇත. දළ අගයන් වශයෙන් වාර්තා කර ඇති කාල්පනික අගයන් ලෙස හඳුනා ගනුයේ ව්‍යුත්පන්නයට පාදක වූ වත්කමෙහි නිර්දේශ අනුපාතයෙහි හෝ දර්ශකයෙහි අගය වන අතර ව්‍යුත්පන්න උපකරණයන්ගේ අගයන්හි සිදුවන වෙනස්වීම් මිනුම් කිරීමේ පදනම ද වේ. කාලපරිච්ඡේදයේ අවසාන දිනට හිඟව පවතින ගනුදෙණුවල පරිමාව කාල්පනික අගයන්ගෙන් නිරූපණය වන අතර එමගින් වෙළඳපල අවදානම හෝ ණය අවදානම නොහැඟවේ.

| | 2016 | | | 2015 | | |
|---|---|---|---|---|---|---|
| | වත්කම් රු. 000 | වගකීම් රු. 000 | කාල්පනික අගය රු. 000 | වත්කම් රු. 000 | වගකීම් රු. 000 | කාල්පනික අගය රු. 000 |
| මුදල් හුවමාරු (Currency SWAPS) | **198,880** | **8,659,453** | **374,297,030** | - | 13,989,728 | 379,377,271 |
| ඉදිරියෙහි වූ හුවමාරු (Forward Forex) | - | **2,410** | **2,771,960** | 2,259 | 169 | 4,725,243 |
| අන්තර්ගත ව්‍යුත්පන්න විනිමය විකල්පයන් (Currency Option) | - | **5,911,812** | **85,524,565** | - | 10,290,162 | 157,782,073 |
| පොලී අනුපාත හුවමාරු (Interest Rate SWAP) | - | - | - | 1,886 | 249 | 1,440,623 |
| එකතුව | **198,880** | **14,573,675** | **462,593,555** | **4,145** | **24,280,308** | **543,325,210** |

ආ) ඉහත සඳහන් ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ සමන්විත වනුයේ මුදල් හුවමාරු, මුදල් විකල්ප, ඉදිරි විදේශ විනිමය ගිවිසුම්, සහ පොලී අනුපාත හුවමාරුවලිනි. මෙවැනි උපකරණ යොදා ගනුයේ බැංකුවේ ව්‍යවස්ථාපිත අරමුණක් වන ජාත්‍යන්තර අරමුදල් පවත්වා ගැනීමේ දී පැන නගින්නා වූ වෙළඳපොල සහ ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය කිරීම සඳහාය. මීට අමතරව මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ විදේශ මහ බැංකු සමඟ හුවමාරු ගිවිසුම්වලට එළඹීම මගින් ශ්‍රී ලංකා රුපියල අන්තර්ජාතිකව ස්ථාවරව පවත්වා ගැනීමත්, දේශීය මූල්‍ය පද්ධතිය ශක්තිමත් කිරීමත්, විදේශ මුදල් රටතුලට ගෙන ඒමට එම බැංකු දිරිමත් කිරීමත් අපේක්ෂා කෙරේ.

ඇ) ව්‍යුත්පන්නයන් යනු පොලී අනුපාත, මූල්‍ය උපකරණවල වටිනාකම, භාණ්ඩ මිල ගණන්, විදේශ විනිමය අනුපාත, ණය අවදානම් සහ දර්ශක වෙනස්වීම්වලට අනුව අගය තීරණය වන මූල්‍ය ගිවිසුම්ය.

ඈ) කෙටිකාලීන ද්‍රවශීලතාවය පාලනය කිරීම සඳහා වූ උපායමාර්ගයක් ලෙස එළඹුණු මුදල් හුවමාරු (Currency SWAP) බැංකුවේ ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ කළඹයෙහි වැදගත් කොටසක් වශයෙන් අඩංගු වී ඇත. මුදල් හුවමාරුවකදී බැංකුව, නියමිත දින දෙකකදී එක් මුදල් වර්ගයකින් නිශ්චිත ප්‍රමාණයක් තවත් මුදල් වර්ග යක් සමඟ එකඟ වූ අනුපාතයන් යටතේ හුවමාරු කර ගනී.

ඉ) ඉදිරි විදේශ විනිමය ගිවිසුම් මගින් බැංකුව, එකඟ වූ අනුපාතයකට, එකඟ වූ ඉදිරි දිනයකදී නිශ්චිත විදේශ මුදල් ප්‍රමාණයක් මිලදී ගැනීමට හෝ විකිණීමට බැඳී සිටී.

(ඊ) පොලී අනුපාතික හුවමාරුවේදී බැංකුව විසින් ප්‍රතිපාර්ශ්වකරුවන්ට නිශ්චිත පොලී අනුපාතිකයක් (හුවමාරු අනුපාතිකය) ගෙවනු ලබන අතර නිර්දේශිත අනුපාතික දර්ශකයක් වන විචල්‍ය පොලී අනුපාතිකයක් හිමි වේ (තෙමසක අන්තර් බැංකු අර්පණ අනුපාතිකය + ආන්තිකය). මෙහි ප්‍රතිලෝමයද ක්‍රියාත්මක වේ.

උ) සමස්ථ අවදානම් කළමනාකරණයෙහි කොටසක් ලෙස ව්‍යුත්පන්න මූල්‍ය උපකරණවලින් අපේක්ෂිත ප්‍රතිලාභ බැංකුව වෙත ලැබීම තහවුරු කිරීමට, බැංකුව විසින් ව්‍යුත්පන්න ගිවිසුම් වෙත නිරාවරණය වීම සමීප වශයෙන් අධීක්ෂණය කරනු ලබයි.

**7. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.) සම්බන්ධ වත්කම්**

| | 2016 රු. 000 | 2015 රු. 000 |
|---|---|---|
| විශේෂ ගැනුම් හිමිකම් ඇරීම | **303,070** | 970,272 |
| ජා.මූ.අ. පංගුව | **116,559,364** | 82,527,455 |
| ජා.මූ.අ. තැන්පතුව | **145,906** | 138,623 |
| මුළු ජා.මූ.අ. වත්කම් | **117,008,340** | 83,636,350 |

**අ) විශේෂ ගැනුම් හිමිකම් දැරීම**

විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) දැරීම වූ කලී ජා.මූ.අ. සාමාජිකයන් හට බාධාවකින් තොරව පාවිච්චි කළ හැකි මුදල් වර්ග සඳහා පවතින විභව්‍ය හිමිකමකි. එනම්, වි.ගැ.හි. දරන්නන් විසින් එම මුදල් සඳහා අනෙකුත් සංචිත මුදල් හුවමාරු කරගත හැකිවීමය. එකී සාමාජිකයන් එම මුදල් වි.ගැ.හි. දැරීමට සහ පිළිගැනීමට බැඳී සිටීම සහ වි.ගැ.හි. පද්ධතියේ මෙහෙයුම්වලට අදාලව විවිධ වගකීම්වලට ගරු කිරීමට බැඳී සිටීම නිසා සංචිත වත්කමක් ලෙස වි.ගැ.හි. විශේෂ වේ. අබාධව පාවිච්චි කළ හැකි මුදල් මත වි.ගැ.හි. වල පවතින හිමිකම දෙයාකාරයකින් ගරු කිරීම ජා.මූ.අ. විසින් තහවුරු කරනු ලැබේ. එනම්, දුර්වල විදේශීය තත්ත්වයන්හි පවතින සාමාජිකයන්ගෙන් වි.හැ.ගි. මිලට ගැනීම සඳහා බලවත් විදේශීය තත්ත්වයන් පවත්නා සාමාජිකයන් නම් කිරීම මගින් සහ කළමනාකරණය කළ වෙළෙඳපොළක් තුළ සාමාජිකයන් අතර, ස්වෙච්ඡා හුවමාරු කිරීම මගින් ය. අදාළ වාර්තාකරණ දිනයේ දී බැංකුව විසින් දරන ලද මුළු ප්‍රමාණය ඉහත සංඛ්‍යාවන්ගෙන් දැක්වේ.

**ආ) ජා.මූ.අ. පංගුව**

ජා.මූ.අ. හි වත්කම් වල ප්‍රාථමික මූලාශ්‍රය වන්නේ එහි සාමාජික රටවලින් ලබා ගන්නා ලද ජාත්‍යන්තර මූල්‍ය අරමුදල් පංගුව හෙවත් ප්‍රග්ධන දායකත්වයයි. එක් එක් රටවල පංගුව, පුළුල් වශයෙන්, එම රටෙහි සාපේක්ෂ ආර්ථික වටිනාකම පදනම් කර ගනිමින් තීරණය කරනු ලබයි. ජා.මූ.අරමුදලෙහි සාමාජිකත්වය ලබාගැනීමෙන් පසු තම පංගුවෙන් 25%ක ප්‍රමාණයක් පුළුල්ව පිළිගත් විදේශ මුදලකින් හෝ විදේශ ගැනුම් හිමිකම මගින්ද ඉතිරි 75%ක මුදල එම රටෙහි දේශිය මුදලින්ද ගෙවිය යුතුය. ජා.මූ. අරමුදලේ කොන්දේසිවලට අනුව රජය වෙනුවෙන් බැංකුව සිය ගිණුමෙන්ම ගනුදෙනු සිදුකරනු ලබන හෙයින් ජා.මූ.අ. පංගුව බැංකුවේ වත්කමක් ලෙස නියෝජනය වේ.

එහි ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකා ජ.මූ.අ. පංගුව වි.ගැ.හි. මිලියන 413.40 ක් වූ පෙර පංගු ප්‍රමාණයේ සිට 2016 පෙබරවාරි 17 වන දිනට වි.ගැ.හි. මිලියන 578.80 දක්වා වර්ධනය විය. ජා.මූ අරමුදලේ පොදු පංගු සමාලෝචන ගිවිසුම යටතේ, 2016 ජනවාරි මස දී 189ක් වූ ජා.මූ.අ සාමාජිකයන්ගේ පංගුව වැඩි කිරීමට තීරණය කරන ලදී.

ජා.මූ.අ. පංගුව සඳහා ගෙවිය යුතු මුදල 19 වන සටහනේ පංගු බැරකම ශීර්ෂය යටතේ දක්වා ඇත. සාමාජික පංගුව මගින් ජා.මූ.අ. සමඟ රටක පවතින මූල්‍යමය සහ සංවිධානාත්මක සම්බන්ධතාවය තහවුරුකරනු ලබන අතර පහත පහසුකම් ද මේ සඳහා ඇතුළත් වේ.

i.) **දායකය** - ජා.මූ.අ. වෙත සාමාජිකයකුගේ දායකය සාමාජිකයාගේ පංගුවට සමාන වේ. එමගින් සාමාජිකයා විසින් ජා.මූ.අ. වෙත ලබාදීමට බැඳී ඇති උපරිම මූල්‍ය සම්පත් ප්‍රමාණය නිශ්චය කරනු ලැබේ. සාමාජිකයකු විසින් දායකය සම්පූර්ණයෙන් ම ගෙවිය යුතු අතර, සියයට 25 ක් ජා.මූ.අ. විසින් නියම කරනු ලබන සංචිත වත්කම්වලින් (වි.ගැ.හි. හෝ පාවිච්චි කළ හැකි මුදල්) ගෙවිය යුතුය. ඉතිරි ප්‍රමාණය සාමාජිකයාගේ ව්‍යවහාර මුදලින් ගෙවිය යුතුය.

ii.) **ඡන්දය දීමේ බලතල** - ජා.මූ.අ. තීරණවලදී සාමාජිකයාගේ ඡන්දය දීමේ බලතල පංගුව මගින් නිර්වචනය වේ. එක් එක් ජා.මූ.අ. සාමාජිකයාට මූලික ඡන්දයක් ද පංගුවෙහි සෑම වි.ගැ.හි. 100,000 ක් සඳහා එක් අතිරේක ඡන්දයක් ද බැගින් හිමි වේ. 2008 ප්‍රතිසංස්කරණ මගින් මූලික ඡන්ද සංඛ්‍යාව මුළු ඡන්ද සංඛ්‍යාවෙන් සියයට 5.50 ක් ලෙස ස්ථාවර කරන ලදී.

iii.) **මූල්‍යකරණයට පිවිසීම** - ජා.මූ.අ. මගින් සාමාජිකයෙකුට ලබාගත හැකි මූල්‍ය පහසුකම් ප්‍රමාණය (පිවිසීමේ සීමා) සාමාජිකයාගේ පංගුව මත තීරණය වේ. සමීපස්ථ සහ ව්‍යාප්ත කළ සැලසුම් ප්‍රකාර සාමාජිකයෙකුට වාර්ෂිකව පංගුවෙන් සියයට 200 ක් ද සමුච්චිත වශයෙන් සියයට 600 ක් ද දක්වා ණය ලබාගත හැකිය. අසාමාන්‍ය අවස්ථාවකදී සහ නිශ්චිත ගැටළු විසඳා ගැනීම සඳහා ප්‍රවේශය මීට වැඩිවිය හැකිය.

iv.) **වි.ගැ.හි. වෙන්කිරීම්** - සාමාජිකයන්ගේ පංගුවලට සමානුපාතිකව ඔවුන්ගේ වි.ගැ.හි. වෙන්කිරීම් ප්‍රමාණය නියම කරනු ලැබේ.

**ඇ) ජා.මූ. අරමුදලේ තැන්පතු - දිළිඳුකම පිටුදැකීමේ සහ වර්ධන පහසුකම - (PRGF - HIPC) භාර තැන්පතුව**

දැඩි ණයගැති භාවයට පත්වී සිටින රටවල් වෙනුවෙන් දිළිඳුකම පිටුදැකීමේ සහ වර්ධන පහසුකම (PRGF - HIPC) වෙනුවෙන්, 2000 අප්‍රේල් 21 වන දින, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ශ්‍රී ලංකාව පවත්වාගෙන යනු ලබන (පරිපාලිත -Administered) වි.ගැ.හි. 788,783 ක ශේෂයකින් යුත් විශේෂ විලම්භිත ගිණුම (SCA 2) පැවරීමෙන් අරඹන ලදී. මෙම ගිණුම අරඹන ලද්දේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි මග පෙන්වීම මත SCA 2 ගිණුම වසා දැමීමට තීරණය කිරීමේ දී SCA 2 ගිණුමෙහි පැවැති ශේෂය මාරු කිරීමෙනි.

මෙම ගිණුමෙහි ශේෂයන් ඇති රටවලින් ජා.මූ.අ. පහත දැක්වෙන ඉල්ලීම් කරන ලදී. උක්ත ගිණුමෙහි සඳහන් ශේෂයන් (PRGF-HIPC) භාර ගිණුම වෙත ප්‍රතිපාදන කිරීම කළ යුත්තේ එකවර දෙනු ලබන පැවැරුමක් ලෙසින් හෝ සහනාධාරයක් ලෙසිනි. මෙය PRGF-HIPC ණය වෙනුවෙන් සපයා දිය යුතුය. ඒ අනුව SCA 2 ගිණුමේ ශේෂය PRGF-HIPC භාර ගිණුම වෙත පවරා දීමට ශ්‍රී ලංකා රජය එකඟ විය. මෙය පවරා දෙනු ලබන්නේ එකවර මුදාහරිනු ලබන සහනාධාරයක් ලෙසින් නොව 2018 වසර දක්වා බල පැවැත්වෙන පොළී රහිත තැන්පතුවක් වශයෙනි.

**8. ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්**

මුදල් ප්‍රතිපත්ති යටතේ විවට වෙළෙඳපොළ කටයුතු පවත්වාගෙන යාම සඳහා මුදල් නීති පනතේ 90(2) වගන්තිය අනුව ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ලබාගත් සහ පවත්වාගෙන යනු ලබන රාජ්‍ය සුරැකුම්පත් කළඹ මේ යටතට ගැනේ.

**9. රජයට දෙන ලද කාලීන අත්තිකාරම්**

රජයේ ඒකාබද්ධ අරමුදලින් දැරීම සඳහා අවසර ලබාදී ඇති වියදම් මූල්‍යනය සඳහා වූ නියමයන්හි සඳහන් කර ඇති තත්ත්වයන්ට යටත්ව මුදල් නීති පනතේ 89 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා රජයට ලබාදෙන අත්තිකාරම් මෙමගින් නියෝජනය කරයි.

**10. බැංකුවලට දෙන ලද ණය**

මුදල් නීති පනතේ 5 වන පරිච්ඡේදයේ III (අ) කොටසට අනුව ඵලදායිතා කටයුතු සඳහා ලබාදෙනු ලබන ණය වේ.

| | 2016<br>රු. 000 | 2015<br>රු. 000 |
|---|---|---|
| මධ්‍යම සහ දිගුකාලීන ණය යෝජනා ක්‍රමය | | |
| - සම්බන්ධිත පාර්ශවයන් | 31,340 | 33,534 |
| සුසහන සුනාමි ණය යෝජනා ක්‍රමය (I සහ II අදියර) | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | - | 10,665 |
| පළාත්බද සංවර්ධන ණය යෝජනා ක්‍රමය | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | 112,652 | 233,867 |
| සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | 101,176 | 175,296 |
| - අනෙකුත් | 30,768 | 47,864 |
| නැගෙනහිර ආර්ථික කටයුතු නැවත නගා සිටුවීම | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | 115,977 | 212,265 |
| - අනෙකුත් | 53,296 | 76,984 |
| උතුරු හා නැගෙනහිර හානි වූ නිවාස ප්‍රතිසංස්කරණය | | |
| - සම්බන්ධිත පාර්ශවයන් | 30,310 | 36,267 |
| පිබිදෙන උතුර ණය යෝජනා ක්‍රමය (අදියර II) | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | 34,632 | 84,140 |
| - අනෙකුත් | 1,194 | 2,778 |
| අඩුකළා: | | |
| අඩමාන ලැබිය යුතු මුදල් සඳහා වෙන් කිරීම | (27,302) | (27,302) |
| ශුද්ධ ලැබිය යුතු මුදල | 484,043 | 886,357 |

අඩමාන ණය සඳහා වෙන් කිරීමේ චලනය

| | 2016<br>රු. 000 | 2015<br>රු. 000 |
|---|---|---|
| ආරම්භක ශේෂය | 27,302 | 27,302 |
| අඩමාණ ණය කපා හැරීම | - | - |
| දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය | 27,302 | 27,302 |

## 11. මූල්‍ය සහ අනිකුත් ආයතන වල හිමිකරු ප්‍රාග්ධන ආයෝජන

මුදල් නීති පනතේ 105 (අ) වගන්තිය යටතේ මෙම ආයෝජන සිදු කරනු ලබයි. මෙය යටතේ මුදල් මණ්ඩලයේ අභිමතය පරිදි බැංකු සහ මූල්‍ය අංශයේ මානව සම්පත් සහ තාක්ෂණික සංවර්ධනය, දියුණුව සහ ප්‍රවර්ධනය සඳහා හෝ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වාණිජ බැංකුවල ගනුදෙනු නිශ්කාෂණය කිරීම පහසු කිරීම සඳහා පිහිටුවන ලද සමාගමක කොටස් අත්පත්කර ගැනීමට බැංකුව වෙත බලතල පවරා තිබේ.

(i) ආයෝජන තත්ත්වය

| ආයතනය | ව්‍යාපාර කටයුතුවල ස්වභාවය | දරණ ප්‍රතිශතය 2016 | 2015 |
|---|---|---|---|
| සීමාසහිත ලංකා ක්ලියර් (පුද්ගලික) සමාගම | ස්වයංක්‍රීය චෙක්පත් නිශ්කාෂණය | 19.66 | 19.66 |
| සීමාසහිත ෆිච් රේටින්ග්ස් ලංකා සමාගම | ණය ශ්‍රේණිගත කිරීම | 10.00 | 10.00 |
| ලංකා ෆයිනෑන්ෂල් සර්විසස් බියුරෝ ලිමිටඩ් | ස්වයංක්‍රීය අරමුදල් හුවමාරුව | 7.50 | 7.50 |
| සීමාසහිත ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය | ණය තොරතුරු සම්පාදනය | 19.30 | 19.30 |

(ii) අදාළ ආයතනවල වූ ආයෝජනයන්ගේ ධාරණ වටිනාකම

| ආයතනය | 2016<br>රු. 000 | 2015<br>රු. 000 |
|---|---|---|
| සීමාසහිත ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය | 5,845 | 5,845 |
| සීමාසහිත ලංකා ක්ලියර් (පුද්ගලික) සමාගම | 29,500 | 29,500 |
| සීමාසහිත ෆිච් රේටින්ග්ස් ලංකා සමාගම | 3,500 | 3,500 |
| ලංකා ෆයිනෑන්ෂල් සර්විසස් බියුරෝ ලිමිටඩ් | 2,250 | 2,250 |
| මුළු ආයෝජනය | 41,095 | 41,095 |

## 12. අනිකුත් වත්කම්

| | 2016<br>රු. 000 | 2015<br>රු. 000 |
|---|---|---|
| අභ්‍යන්තර අරමුදල්හි ආයෝජන | 5,208,837 | 4,302,590 |
| වත්කම් මත හානිකරණ ගාස්තු | (139,131) | - |
| ශුද්ධ අභ්‍යන්තර අරමුදල්හි ආයෝජන | 5,069,706 | 4,302,590 |
| ක්‍රමක්ෂය පිරිවැයට කාර්ය මණ්ඩල ණය | 4,588,285 | 4,234,875 |
| භාණ්ඩාගාර සහ අනෙකුත් අමාත්‍යාංශ වලින් ලැබිය යුතු දෑ | 1,401,497 | 1,378,695 |
| ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු දෑ | 208,977 | 311,572 |
| ක්‍රමක්ෂය පිරිවැයට ණයකර ආයෝජන | 11,964 | 10,564 |
| අනෙකුත් ලැබිය යුතු දෑ | 26,941 | 27,103 |
| | 11,307,370 | 10,265,399 |
| මූල්‍ය නොවන වත්කම් | | |
| කාර්ය මණ්ඩල ණය මත වූ විලම්භිත වත්කම් | 1,015,226 | 899,025 |
| | 12,322,596 | 11,164,424 |

ණයකරවල ආයෝජන මගින් නියෝජනය වන්නේ මර්කන්ටයිල් ක්‍රෙඩිට් සමාගම වෙත 1988 දී බැංකුව විසින් ලබා දී තිබූ සහ 2011 දී සම්පූර්ණයෙන්ම කපා හරින ලද ප්‍රතිමූල්‍ය ණය පහසුකමෙන් කොටසක් පියවා ගැනීම සඳහා ලැබුණු ණයකරවල වටිනාකමයි. මෙම සමාගම ඈවර කිරීමේ කටයුතු තවමත් සම්පූර්ණ කර නොමැති අතර ඉතිරි මුදල ඈවර කිරීමෙන් උත්පාදනය වන මුදලින් පියවා ගනු ඇත.

ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව නිකුත් කරනු ලදුව බැංකුව වෙත හිමි වූ රු. 10,839,500 වටිනාකමින් යුත් ණයකර ක්‍රමක්ෂය පිරිවැයට වාර්තා කර ඇත. සුරැකු නොලත් මෙම ණයකර වර්ෂ 10 ක් සඳහා යටත්, නිදහස් කල හැකි හා 5% වාර්ෂික පොළී හිමිකමක් හෝ එක් අවුරුදු භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිලාභ අනුපාතයන් අතුරින් අඩු අගයට වාර්ෂිකව උපචිත කරයි.

## 13. රන්

මුදල් නීති පනතේ 67(1) සහ 67(2) වගන්ති ප්‍රකාරව බැංකුවේ ජාත්‍යන්තර සංචිතයේ කොටසක් ලෙස බැංකුව සතුව ඇති රන්වල වටිනාකම මෙයින් අදහස් වේ. තවද මුදල් නීති

පනතේ වගන්ති 67(2) ප්‍රකාරව, අවම වශයෙන් රන් න්‍යෂ්ටික සංචිතයක් ලෙසින් හෝ රන්වලට නිදහසේ සෘජුව හෝ වක්‍රව පරිවර්ථනය කළ හැකි විනිමයක් ලෙසින් පවත්වාගැනීමට මුදල් මණ්ඩලයට සිදු වේ.

## 14. තොග

| | 2016<br>රු. 000 | 2015<br>රු. 000 |
|---|---|---|
| සංසරණය සඳහා ඇති නෝට්ටු | **3,402,661** | 2,179,294 |
| සංසරණය සඳහා ඇති කාසි | **1,779,021** | 961,716 |
| මාර්ගස්ථ කාසි | **116,197** | 143,336 |
| මාර්ගස්ථ නෝට්ටු | **803,227** | 128,026 |
| | **6,101,106** | 3,412,372 |
| *අඩුකළා :* සෙමින් චලනය වන අයිතමයන් සඳහා වෙන්කිරීම් | **(45,000)** | (45,000) |
| | **6,056,106** | 3,367,372 |
| ලිපි ද්‍රව්‍ය සහ විවිධ තොග | **58,557** | 52,259 |
| වෛද්‍ය මධ්‍යස්ථාන තොගය | **198** | 333 |
| පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි වටිනාකම යන දෙකෙන් අඩු වටිනාකමට මුළු තොගය | **6,114,861** | 3,419,964 |

## 15. දේපළ පිරියත සහ උපකරණ

| පිරිවැය | ඉඩම් සහ ගොඩනැගිලි | පිරියත සහ පිරියත උපකරණ | ලී බඩු සහ උපකරණ | මෝටර් වාහන | පරිගණක | අනිකුත් කියවීම් උපකරණ | අනිකුත් නොනිමි ඉදිකිරීම් | එකතුව 2016 | එකතුව 2015 |
|---|---|---|---|---|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| ජනවාරි 01 දිනට අගය | 13,369,401 | 1,283,488 | 1,230,501 | 489,475 | 810,574 | 53,007 | 1,366,603 | **18,603,049** | 17,422,764 |
| ප්‍රත්‍යාගණනය | 1,848,249 | - | - | - | - | - | - | **1,848,249** | - |
| එකතු කිරීම් | - | 5,295 | 49,535 | - | 47,988 | 764 | 389,590 | **493,172** | 1,235,918 |
| බැහැර කිරීම් | - | - | (1,145) | - | (18,176) | - | - | **(19,321)** | (25,756) |
| මාරු කිරීම් | 1,506,711 | 207,139 | 2,923 | - | 2,653 | 237 | (1,724,798) | **(5,135)** | (29,877) |
| දෙසැම්බර් 31 දිනට අගය | 16,724,361 | 1,495,922 | 1,281,814 | 489,475 | 843,039 | 54,008 | 31,395 | **20,920,014** | 18,603,049 |

| ක්ෂය | ඉඩම් සහ ගොඩනැගිලි | පිරියත සහ පිරියත උපකරණ | ලී බඩු සහ උපකරණ | මෝටර් වාහන | පරිගණක | අනිකුත් කියවීම් උපකරණ | අනිකුත් නොනිමි ඉදිකිරීම් | එකතුව 2016 | එකතුව 2015 |
|---|---|---|---|---|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| ජනවාරි 01 දිනට අගය | 662,493 | 718,434 | 706,812 | 340,845 | 718,222 | 33,928 | - | **3,180,734** | 2,736,068 |
| වර්ෂය සඳහා ක්ෂය | 198,998 | 66,408 | 81,326 | 35,611 | 51,125 | 1,220 | - | **434,688** | 469,674 |
| ප්‍රත්‍යාගණනය | (809,150) | - | - | - | - | - | - | **(809,150)** | - |
| බැහැර කිරීම් | - | - | (1,089) | - | (17,559) | - | - | **(18,648)** | (25,008) |
| දෙසැම්බර් 31 දිනට අගය | 52,341 | 784,842 | 787,049 | 376,456 | 751,788 | 35,148 | - | **2,787,624** | 3,180,734 |
| ශුද්ධ පොත් අගය | 16,672,020 | 711,080 | 494,765 | 113,019 | 91,251 | 18,860 | 31,395 | **18,132,390** | 15,422,315 |

ඉඩම් සහ ගොඩනැගිලිවල ධාරණ වටිනාකම, සාධාරණ වටිනාකම අනුව සටහන් කරනු ලැබේ. ඉතා ආසන්නම ස්වාධීන තක්සේරුව 2016 දෙසැම්බර් 31 දිනට එෆ්.එම්. වැලුවරස් විසින් සිදු කරන ලද අතර 2016 දෙසැම්බර් 31 දිනට එය වාර්තාගත කර තිබුණි.

බැංකුවේ දේපලක් වන නිව්යෝර්ක් සහ බ්‍රසිල් දේපල සාධාරණ අගයට වාර්තා කර නොමැති අතර එහි පිරිවැය අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව 2016 නොවැම්බර් මස දී විදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම් යටතට මාරු කිරීමට තීරණය කර ඇත. තවද මෙම දේපළ, විකිණීම සඳහා රඳවාගෙන ඇති වත්කම් යටතේ වර්ගීකරණය නොකර දේපළ, පිරියත සහ උපකරණ යටතේ හෙළිදරව් කර ඇත.

මෙම මූල්‍ය වර්ෂය තුළදී බැංකුව විසින් මුදල් ගෙවීම මගින් රු. මිලියන 488.04 (2015 - රු.මිලියන 1,206.04) මුළු වටිනාකමින් යුත් දේපල, පිරියත සහ උපකරණ අත්පත් කරගන්නා ලදී.

2016 දෙසැම්බර් 31 දිනට මුළුමනින්ම ක්ෂය කරන ලද නමුත් භාවිතයේ ඇති වත්කම්වල වටිනාකම රු. මිලියන 1,404.91 ක් වේ (2015 රු. මිලියන 1,303.09).

## බැංකුවේ සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලි හා කල්බදු ඉඩම්වල ඇති ගොඩනැගිලිවල තක්සේරු තොරතුරු

| දේපළ | වරලත් තක්සේරුකරුවන්ගේ නම් | තක්සේරු ප්‍රවේශය | පර්චස් එකක ඇස්තමේන්තුගත මිල | වර්ග අඩියක ඇස්තමේන්තුගත මිල | ඇස්තමේන්තුගත මාසික කුලිය | පිටතට යන වියදම් | වසර මිලදී ගැනීම් |
|---|---|---|---|---|---|---|---|
| **ඉඩම් හා ගොඩනැගිලි** | | | | | | | |
| ප්‍රධාන කාර්යාලය - කොළඹ 01 | ඒ.ඒ.එම්. ෆාතිහු | වෙළඳපොල ප්‍රවේශය හා පිරිවැය ප්‍රවේශය | 12,500,000 | 9,000 - 15,000 | - | - | - |
| වයිට්(අ)වේස් ගොඩනැගිල්ල -කොළඹ - 01 | - එම - | ආදායම් ප්‍රවේශය | 13,500,000 | - | 6,000,000 | 40% | 16.66 |
| ලොයිඩ්ස් ගොඩනැගිල්ල -කොළඹ - 01 | - එම - | ආදායම් ප්‍රවේශය | 13,500,000 | - | 6,750,000 | 40% | 16.66 |
| සෙන්ට්‍රල් පොයින්ට් ගොඩනැගිල්ල කොළඹ - 01 | - එම - | ආදායම් ප්‍රවේශය | 14,000,000 | - | 7,500,000 | 35% | 16.66 |
| බැංකු විදු පියස - රාජගිරිය | - එම - | වෙළෙඳපොල ප්‍රවේශය හා පිරිවැය ප්‍රවේශය | 2,500,000 - 3,500,000 | 2,500 - 9,500 | - | - | - |
| අධිපති නිල නිවස - කොළඹ 07 | - එම - | වෙළඳපොල ප්‍රවේශය හා පිරිවැය ප්‍රවේශය | 7,500,000 | 3,500 - 8,500 | - | - | - |
| ප්‍රාදේශීය කාර්යාලය - මාතර | - එම - | වෙළඳපොල ප්‍රවේශය හා පිරිවැය ප්‍රවේශය | 1,500,000 - 3,000,000 | 4,000 - 7,500 | - | - | - |
| ප්‍රාදේශීය කාර්යාලය - මාතලේ | - එම - | වෙළඳපොල ප්‍රවේශය හා පිරිවැය ප්‍රවේශය | 100,000 - 500,000 | 2,500 - 7,500 | - | - | - |
| නිවාඩු නිකේතනය - නුවරඑළිය | - එම - | වෙළඳපොල ප්‍රවේශය හා පිරිවැය ප්‍රවේශය | 1,000,000 | 2,000 - 7,000 | - | - | - |
| නිවාඩු නිකේතනය - කතරගම | - එම - | වෙළඳපොල ප්‍රවේශය හා පිරිවැය ප්‍රවේශය | 200,000 | 4,500 - 10,000 | - | - | - |
| **කල්බදු ඉඩම්වල ඇති ගොඩනැගිලි** | | | | | | | |
| ප්‍රාදේශීය කාර්යාලය - අනුරාධපුරය | - එම - | පිරිවැය ප්‍රවේශය | - | 3,500 - 7,500 | - | - | - |
| නිවාඩු නිකේතනය - අනුරාධපුරය | - එම - | පිරිවැය ප්‍රවේශය | - | 5,500 | - | - | - |
| ප්‍රාදේශීය කාර්යාලය - කිලිනොච්චි | - එම - | පිරිවැය ප්‍රවේශය | - | 1,500 - 7,000 | - | - | - |
| නිවාඩු නිකේතනය - සෝමාවතිය | - එම - | පිරිවැය ප්‍රවේශය | - | 10,000 | - | - | - |

### ඉඩම් සහ ගොඩනැගිලිවල සංයුතිය

| | ධාරණ අගය 2016 රු. 000 | ධාරණ අගය 2015 රු. 000 |
|---|---|---|
| සින්නක්කර ඉඩම් | **8,976,339** | 5,689,063 |
| සින්නක්කර ඉඩම්වල ගොඩනැගිලි | **7,424,982** | 6,935,388 |
| කල්බදු ඉඩම්වල ගොඩනැගිලි | **270,700** | 82,457 |
| | **16,672,021** | 12,706,908 |

ප්‍රත්‍යාගණනය කළ ඉඩම් සහ ගොඩනැගිලි, මූල්‍ය ප්‍රකාශනයන්හි ක්ෂය අඩුකළ පිරිවැයට දැක්වුයේ නම් ඒවායේ ධාරණ වටිනාකම රු.මි. 8,762.63 ක් වේ (2015 - රු.මි. 9,998.75).

## 16. අස්පෘෂ්‍ය වත්කම්

| පරිගණක මෘදුකාංග : | 2016 රු. 000 | 2015 රු. 000 |
|---|---|---|
| **පිරිවැය:** | | |
| ජනවාරි 01 දිනට අගය | **948,648** | 927,022 |
| එකතු කිරීම් | **1,124** | 21,626 |
| දෙසැම්බර් 31 දිනට අගය | **949,772** | 948,648 |
| **ක්‍රමක්ෂය සහ හානිකරණය:** | | |
| ජනවාරි 01 දිනට අගය | **708,038** | 620,938 |
| වර්ෂය සඳහා ක්‍රමක්ෂය ගාස්තුව | **85,414** | 87,100 |
| දෙසැම්බර් 31 දිනට අගය | **793,452** | 708,038 |
| **ශුද්ධ පොත් අගය:** | | |
| ජනවාරි 01 දිනට අගය | **240,610** | 306,084 |
| දෙසැම්බර් 31 දිනට අගය | **156,320** | 240,610 |

මෙම මූල්‍ය වර්ෂය තුල දී බැංකුව විසින් මුදල් ගෙවීම මගින් රු.මි. 1.12 (2015 - රු.මි. 21.63) මුළු වටිනාකමකින් යුතු අස්පෘෂ්‍ය වත්කම් අත්පත් කර ගන්නා ලදී.

2016 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන් ක්‍රම ක්ෂය කරන ලද එහෙත් තව දුරටත් ප්‍රයෝජනයට ගන්නා අස්පෘශ්‍ය වත්කම්වල ප්‍රමාණය රු. මි. 613.34 ක් වේ (2015 රු. මි. 594.08).

## 17. බැංකු සහ මූල්‍ය ආයතන

| | 2016 රු. 000 | 2015 රු. 000 |
|---|---|---|
| විදේශීය බැංකුවලට ගෙවිය යුතු මුදල් | **45,267,025** | 11,524,984 |
| අනිකුත් විදේශීය මූල්‍ය ආයතනයන්ට ගෙවිය යුතු මුදල් | **299,656** | 523,257 |
| | **45,566,681** | 12,048,241 |

## 18. ආසියානු නිශ්කාෂණ සංගමය

සහභාගිවන රටවල මහ බැංකු අතර ගෙවීම් බේරුම් කිරීමේ ආයතනයක් වශයෙන් එක්සත් ජාතීන්ගේ ආසියානු සහ පැසිෆික් කලාපයේ ආර්ථික සහ සාමාජික කටයුතු කොමිසමේ මූලිකත්වය යටතේ ආසියානු නිශ්කාෂණ සංගමය (ආ.නි.ස.) 1974 වර්ෂයේ දී පිහිටුවන ලදී. ශ්‍රී ලංකාව, බංගලාදේශය, ඉරානය, නේපාලය, පකිස්ථානය, ඉන්දියාව, භූතානය, මියන්මාරය සහ මාලදිවයින එහි සහභාගි රටවල් වේ. මෙය සහභාගි වන රටවල් අතර ප්‍රවර්තන ජාත්‍යන්තර ගනුදෙනු බහුපාර්ශ්වීය පදනමක් මත බේරුම් කිරීම සඳහා වු නිශ්කාෂණ ක්‍රමයකි. එක් එක් මාසය අවසානයේ දී පවත්නා ශුද්ධ තත්ත්වය මාස දෙකක ණය කාල පරිච්ඡේදයකින් පසුව බේරුම් කිරීම හෝ ලබාගැනීම සිදුකරනු ලැබේ. ශුද්ධ ණයගැතියන් විසින් 0.34% ක සිට 0.51% ක් දක්වා වු පොළියක් ඇ.එ.ජ. ඩොලර් සඳහා ද (2015 දී එය 0.02% ක් සහ 0.23% ක් විය) යුරෝ සඳහා 0.00% ක සිට 0.00% දක්වා වූ පොළියක් (2015 - 0.00% සහ 0.00%) මෙම පහසුකම් සඳහා ගෙවනු ලැබේ. එය බේරුම් කිරීමේ දිනයන් අතර ශුද්ධ ණය හිමියන්ගේ දෛනික පරිශේෂ ශේෂයන්ට මාරු කරනු ලැබේ. එම ශේෂයෙන් අදාල වාර්තාකරණ දිනට ආ.නි.ස. වෙත ගෙවිය යුතු ප්‍රමාණය නියෝජනය වේ.

## 19. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.)

| | 2016 රු. 000 | 2015 රු. 000 |
|---|---|---|
| පොළිය දරන ණය - ප්‍රවර්තන නොවන | **48,288,764** | 34,386,440 |
| පොළිය දරන ණය - ප්‍රවර්තන | **34,687,890** | 65,334,236 |
| වි.ගැ.හි. වෙන්කිරීම් | **79,638,200** | 78,946,116 |
| ජා.මූ.අ. වෙත ගෙවිය යුතු අනිකුත් මුදල් | **52,858,160** | 47,512,222 |
| පංගු බැරකම් | **54,067,582** | 25,465,330 |
| | **221,251,832** | 217,257,904 |
| ජා.මූ.අ. සම්බන්ධ මුළු බැරකම් | **269,540,596** | 251,644,344 |

අ) පොළී දරණ ණය, විස්තිර්ණ ණය පහසුකම් (EFF) හා ජා.මු. අරමුදලෙන් ලබාගන්නා සමීපස්ථ ණය පහසුකම් වලින් සමන්විත වේ.

ආ) විස්තිර්ණ ණය පහසුකම යනු රජයේ ආර්ථික ප්‍රතිසංස්කරණ න්‍යායාය පත්‍රයට සහය දීමට හා ශේෂය පියවීම සඳහා සහය දීමට ජා.මු.අ. විසින් දෙන ලද තුන් අවුරුදු පහසුකමකි. ජා.මු.අ. 2016 ජුනි හිදි විස්තිර්ණ ණය පහසුකම් වි.ගැ.හි බිලියන 1.10ක් (ආසන්න වශයෙන් ඇ.ඩො.බිලියන 1.5 ක්) ලබා දීමට අනුමැතිය දී තිබේ. මෙම මුදල ජා.මු. අරමුදලේ රටවල්වල වර්තමාන පංගුවෙන් සියයට 185 කට සමාන වේ. 2016 ජුනි මස විස්තිර්ණ ණය පහසුකම යටතේ පළමුවැනි වාරිකය ලෙස වි.ගැ.හි මිලියන 119.89 ක් (ආසන්න වශයෙන් ඇ.ඩො.මිලියන 168.10) මුදලක්ද, දෙවන ණය වාරිකය, දෙවන සමාලෝචනයෙන් පසු 2016 නොවැම්බර් මස වි.ගැ.හි මිලියන 119.89 (ආසන්න වශයෙන් ඇ.ඩොලර් මිලියන 162.56ක්) ගෙවන ලදී. ඉතිරි මුදල වසර 3ක් ඇතුළත වාරික පහකින් බෙදා හැරීමට අපේක්ෂා කරන අතර එහි අවසන් වාරිකය 2019 අප්‍රේල් මස දී සිදු කිරීමට නියමිතය. විස්තීරණ ණය පහසුකම සඳහා අදාල වන පොළී අනුපාතය භාර මූලික අනුපාතය වේ. මෙය වි.ගැ.හි. පොළී අනුපාතය (වර්තමානයේ දී වාර්ෂිකව 0.05%) සහ පදනම් අංක 100හි එකතුවට සමාන වේ.

ඇ) සමිපස්ථ ණය පහසුකම (SBA) යනු ණය ගනු ලබන රටවල්වල සාර්ව ආර්ථික කළමණාකරණ කටයුතු සදහා වු නිශ්චිත කොන්දේසිවලට යටත් ව ගෙවුම් ශේෂ කටයුතු මූල්‍යකරණය සදහා ලබා දෙනු ලබන තවත් පහසුකමකි. ජා.මූ.අ. විසින් 2009 ජූලි මස වි.ගැ.හි. බිලියන 1.65ක් (ඇ.එ.ජ. ඩොලර් බිලියන 2.6) සමීපස්ථ ණය පහසුකමක් ගෙවුම් ශේෂ කටයුතුවලට සහය දීම සඳහා අනුමත කරන ලදී. 2012 ජූලි මස අවසාන වාරිකය හිමිවීමත් සමග සමීපස්ථ ණය පහසුකම 2012 වසර තුළදී සාර්ථකව අවසන් වන ලදී. මෙම ණය මුදල ආපසු ගෙවීම සඳහා වර්ෂ 5ක කාලසීමාවක් හිමිවන අතර එය 2012 ඔක්තෝබර් මසින් ආරම්භ වුනි. මෙම ණය පහසුකම සඳහා අයකරන පොළී අනුපාතය, සේවා ගාස්තු හා ස්ථාවර ආන්තිකය යන කොටස් දෙකකින් සමන්විත වේ. සේවා ගාස්තුව, විශේෂ ගැනුම් හිමිකම් පොළී අනුපාතයට යටත්ව සතිපතා ගණනය කරනු ලැබේ. නොගෙවූ ණය මුදල ජා.මූ. අරමුදලේ පංගුවෙන් 300% වන තෙක් ස්ථාවර ආන්තිකය වාර්ෂිකව 1% වේ. නොගෙවූ ණය මුදල ජා.මූ. අරමුදලේ පංගුවෙන් 300%ක් ඉක්මවන අවස්ථාවකදී එම ඉක්මවූ ප්‍රමාණය මත වර්ෂයකට 2% ක් වූ අමතර ගාස්තුවක් අයබදු ලෙස ගෙවිය යුතුවේ. 2012 ඔක්තෝබර් 25 වන දින වි.ගැ.හි. මිලියන 25.80 ක මුදලක් ප්‍රථම ආපසු ගෙවීම ලෙස පියවන ලදී. වි.ගැ.හි. මිලියන 1,128.24 ක් සහ වි.ගැ.හි. මිලියන 327.28 මුදලක් පිළිවෙළින් 2013-2015 සහ 2016 වසරවලදී ආපසු ගෙවන ලද අතර 2016 දෙසැම්බර් 31 දිනට නොගෙවූ ශේෂය වි.ගැ.හි. මිලියන 172.25 වේ.

පොළී දරණ ණය සඳහා මාස 12 කට පෙර සහ පසු බේරුම් කිරීමට අපේක්ෂිත මුදල් පහත සඳහන් පරිදි වේ.

| | සඵල පොළී අනුපාතිකය % | පරිණත වර්ෂය | 2016 රු. 000 | 2015 රු. 000 |
|---|---|---|---|---|
| ප්‍රවර්තන සමීපස්ථ ණය පහසුකම (SBA) | **0.244** | **2017** | **34,687,890** | 65,334,236 |
| | | | **34,687,890** | 65,334,236 |
| ප්‍රවර්තන නොවන විස්තීර්ණ ණය පහසුකම (EFF) | **0.244** | **2026** | **48,288,764** | - |
| සමීපස්ථ ණය පහසුකම (SBA) | | **2017** | - | 34,386,440 |
| | | | **48,288,764** | 34,386,440 |
| පොළී දරණ මුළු ණය මුදල | | | **82,976,654** | 99,720,675 |

ඈ) **විශේෂ ගැණුම් හිමිකම (වි.ගැ.හි.)** යනු පවත්නා සංචිත වත්කම්වලට පරිපුරණයන් වශයෙන් දිගුකාලීන ගෝලීය අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා ජා.මූ.අ. විසින් පිහිටුවන ලද සංචිත වත්කමකි. සාමාජික රටවලට ඒවායේ ජා.මූ.අ. පංගු ප්‍රකාර වි.ගැ.හි. වෙන්කිරීම් සිදු කරයි. ජා.මූ.අරමුදලෙහි වි.ගැ.හි. දෙපාර්තමේන්තුවට (ජා.මූ.අ. තුළ පිහිටි ගිණුම් ඒකකයකි), සහභාගී වන රටවලට පමණක් වි.ගැ.හි. වෙන් කළ හැකිය. ජා.මූ.අ. සතු රන්, විදේශ විනිමය සහ සංචිත තත්වයන් ආදී වූ නිල සංචිත වත්කම්වලට පරිපූරක වශයෙන් ජා.මූ.අ. විසින් වි.ගැ.හි. බිහි කරන ලදී. බැංකුව විසින් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් අත්සන් කරන ලද ගිවිසුමේ සඳහන් ඇතැම් කොන්දේසි ප්‍රකාර, ජා.මූ.අ. විසින් සාමාජිකයන්ට

ඔවුන්ගේ ජා.මූ.අ. පංගු ප්‍රමාණය අනුව වි.ගැ.හි. වෙන් කළ හැකි වන්නේය. ජා.මූ.අ. විසින් වි.ගැ.හි. වෙන්කිරීම මගින් එක් එක් සාමාජිකයාට පිරිවැය රහිත වත්කමක් උද්ගත වන අතර ඒ සඳහා පොළී ඉපැයීමක් හෝ ගෙවීමක් සිදු නොවේ. වි.ගැ.හි. අවලංගු කිරීමට ද ගිවිසුමේ කොන්දේසිවලින් විධිවිධාන සලසා තිබෙන නමුත් මෙතෙක් එම විධිවිධාන ක්‍රියාත්මක කර නොමැත. වි.ගැ.හි. වෙන් කිරීම් වැඩි වීමෙන් 7 වැනි සටහනේ විස්තර කර ඇති පරිදි වි.ගැ.හි. දැරීම් වැඩි වේ. ජා.මූ.අරමුදලෙහි වි.ගැ.හි. දෙපාර්තමේන්තුව අවසන් කරන හෝ ඇවර කරන අවස්ථාවක දී සාමාජිකයන් විසින් ශුද්ධ සමුච්චිත වෙන්කිරීම්වලට සමාන මුදලක් සහ වි.ගැ.හි. දෙපාර්තමේන්තුවේ කටයුතුවලට සහභාගී වීම හේතුවෙන් ගෙවිය යුතු අනෙකුත් යම් මුදලක් වෙතොත් එය ද ජා.මූ.අ. වෙත ගෙවීමට බැඳී සිටී.

ඉ) **ජා.මූ.අ. වෙත ගෙවිය යුතු අනිකුත් මුදල් :** මෙහෙයුම් සහ පරිපාලන ගනුදෙනු වෙනුවෙන් බැංකුව ජා.මූ.අ. වෙත ගෙවිය යුතු ප්‍රමාණය මෙයින් දැක්වේ.

ඊ) **පංගු බැරකම:** අංක 7 දරණ සටහනේ විස්තර කර ඇති ජා.මූ.අ. පංගුව සඳහා ගෙවිය යුතු මුදල පංගු බැරකම ශීර්ෂය යටතේ දක්වා ඇත.

## 20. අනෙකුත්

| | 2016 රු. 000 | 2015 රු. 000 |
|---|---|---|
| DST එස්ක්‍රෝ ගිවිසුම (Escrow Agreement) යටතේ ක්‍රියාත්මක වන ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය II (අ) | **364,794** | 1,413,418 |
| එස්ක්‍රෝ ගිවිසුම (Escrow Agreement) යටතේ ක්‍රියාත්මක වන මොරගහකන්ද සංවර්ධන ව්‍යාපෘති ණය (ආ) | **5,857,173** | 11,957,787 |
| DST එස්ක්‍රෝ ගිවිසුම (Escrow Agreement) යටතේ ක්‍රියාත්මක වන ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය III (ඇ) | **13,245,476** | 21,701,612 |
| DST - එස්ක්‍රෝ ගිවිසුම (Escrow Agreement) යටතේ ක්‍රියාත්මක වන ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය III අදියර II (ඈ) | **12,754,696** | 14,406,230 |
| DST විශේෂ ඩොලර් ගිණුම - කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත (SME) සහ ගෝලීය හරිත ශක්ති ණය (ඉ) | **2,195,121** | - |
| DST විශේෂ යුරෝ ගිණුම - කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත (SME) සහ ගෝලීය හරිත ශක්ති ණය (ඉ) | **-** | 7,483,465 |
| DST විශේෂ ඩොලර් ගිණුම - අඹතලේ ජල සම්පාදන ප්‍රවර්ධන ව්‍යාපෘතිය (ඊ) | **291,768** | 720,312 |
| DST පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ NORAD WASO ASIA ව්‍යාපෘතිය සඳහා වන ගිණුම (උ) | **6,409** | - |
| සා(ර්)ක් විනිමය හුවමාරුව (SAARC SWAP facility) යටතේ ඉන්දියානු මහ බැංකුවට (Reserve Bank of India) ගෙවිය යුතු මුදල (ඌ) | **59,920,000** | 158,468,530 |
| අනෙකුත් විදේශීය බැරකම් | **1,614,595** | 1,772,788 |
| | **96,250,032** | 217,924,142 |

**(අ) එස්ක්‍රෝ ගිවිසුම (Escrow Agreement) යටතේ ක්‍රියාත්මක වන ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය II**

ඇ.එ.ජ. ඩොලර් මිලියන 500 ණය පහසුකමක් ලබා ගැනීම සඳහා 2011 මාර්තු 31 දින ශ්‍රී ලංකා රජය හා චීන සංවර්ධන බැංකුව (CDB) අතර පහසුකම් එකඟතාවක් සඳහා අත්සන් තබන ලදී. මෙම පහසුකම් එකඟතාවේ අරමුදල් ප්‍රමුඛතා මාර්ගයන් සංවර්ධනය හා පුනරුත්ථාපනය සඳහා යොදා ගැනේ. පහසුකම් එකඟතාවය අනුව, බැංකුව එස්කෝරු නියෝජිතයා ලෙස පත් කරන ලදී. ඒ අනුව ණය තැන්පත් කිරීම හා එලෙස ලැබෙන මුදල් මාර්ග ව්‍යාපෘති සඳහා බෙදා හැරීමේ හුදු අරමුණ ඇතුව එස්කෝරු ගිණුමක් බැංකුවේ විවෘත කරන අතර සහ එකී ගිවිසුම ප්‍රකාරව ණයහිමියා (චීන සංවර්ධන බැංකුව) හා ණය ගැනුම්කරු (ශ්‍රී ලංකා රජය) යන දෙපාර්ශවයම එම එස්කෝරු ගිණුම හවුලේ බල පවත්වනු ලබයි.

මෙම ණය පහසුකම යටතේ ඇ.එ.ජ. ඩොලර් මිලියන 326 මුදලක් ප්‍රථම වාරිකය ලෙස 2011 ජූනි 29 දින ලැබුණු අතර දෙවන වාරිකය වූ ඇ.එ.ජ. ඩොලර් මිලියන 174 ප්‍රමාණය 2011 ඔක්තෝබර් 28 දින ලංකාවට ලැබුණි.

වැය අනුමත නිවේදනය එස්කෝරු නියෝජිතයා වෙත එවීම මගින් ණයහිමියා විසින් එස්කෝරු ගිණුමේ ඇති මුදල් වැය ඉල්ලුම් පත්‍රයේ සඳහන් ගිණුම් වෙත වැය කිරීම සඳහා උපදෙස් ලබාදේ.

ඒ අනුව චීන සංවර්ධන බැංකුවෙන් වැය අනුමත නිවේදනයක් ලැබීමෙන් අනතුරුව 2011 ඔක්තෝබර් 18 දින ඇ.එ.ජ. ඩොලර් මිලියන 1.77 ප්‍රමාණයක් ප්‍රථමයෙන් බෙදා හරින ලදී.

චීන සංවර්ධන බැංකුවෙන් කරන ලද වැය ඉල්ලුම් අනුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2011 සහ 2012 වර්ෂයන් තුළ ඇ.එ.ජ. ඩොලර් මිලියන 157.50 ක මුදලක් බෙදා හැර ඇත.

ඇ.එ.ජ. ඩොලර් මිලියන 118.52 ක්, ඇ.එ.ජ. ඩොලර් මිලියන 161.01 ක් සහ ඇ.එ.ජ. ඩොලර් මිලියන 51.37ක මුදලක් පිළිවෙලින් 2013, 2014 සහ 2015 වර්ෂයන් හිදී බෙදා හැරීම් කර ඇත. 2016 වසරේදී ඇ.එ.ජ. ඩොලර් මිලියන 7.38 ක් බෙදා හරින ලද අතර 2016 දෙසැම්බර් මස 31 වන දින වන විට ඉතිරි ශේෂය ඇ.එ.ජ. ඩොලර් මිලියන 2.44 කි.

**(ආ) මොරගහකන්ද සංවර්ධන ව්‍යාපෘති ණය**

ඇ.එ.ජ.ඩො. මිලියන 214.20 සදහා වූ මෙම ණය ගිවිසුම චීන සංවර්ධන බැංකුව (ණය හිමියා) සහ ශ්‍රී ලංකා රජය (ණය ගැනුම්කරු) අතර 2012 ජූනි 28 දින අත්සන් කර ඇත. මෙම ණය ගිවිසුමේ අරමුණ වන්නේ මොරගහකන්ද ජල විදුලි බලාගාරය ඉදිකිරීම සඳහා පහසුකම් සැපයීමයි. ජල සම්පාදන හා ජල සම්පත් කළමණාකරණ අමාත්‍යාංශය විසින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබයි. මෙම ගිවිසුමෙහි බැංකුකරු වශයෙන් ණය ලැබීමට හා බෙදා හැරීමට විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි බැංකුව විසින් පොදු ලෙජරයේ ගිණුමක් විවෘත කරන ලදී.

2012 ජූනි 29 ඇ.එ.ජ. ඩොලර් මිලියන 214.20 ක ණය මුදලක් චීන සංවර්ධන බැංකුවෙන් ලැබී ඇත. 2012 අගෝස්තු 24 දින ප්‍රථම බෙදාහැරීම ලෙස ඇ.එ.ජ. ඩොලර් මිලියන 64.34 ක ගෙවීම් කර ඇත. 2013 - 2015 වසර වලදී ඇ.එ.ජ. ඩොලර් මිලියන 66.86 ක් බෙදා හැර ඇත.

2016 වසරේදී ඇ.එ.ජ. ඩොලර් මිලියන 43.90 ක් බෙදා හරින ලද අතර 2016 දෙසැම්බර් 31 දිනට ඉතිරි වූ ශේෂය ඇ.එ.ජ.ඩො. මිලියන 39.10 කි.

**(ඇ) එස්ක්‍රෝ ගිවිසුම යටතේ ක්‍රියාත්මක වන ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය III**

ඇ.එ.ජ. ඩොලර් මිලියන 300 ක් සඳහා වූ මෙම පහසුකම් ගිවිසුම චීන සංවර්ධන බැංකුව (ණය හිමියා) සහ ශ්‍රී ලංකා රජය (ණය ගැණුම්කරු) අතර 2014 මාර්තු 11 වන දින අත්සන් කර ඇත. ප්‍රමුඛතා මාර්ග I I I වන ව්‍යාපෘතියේ I වන අදියර තවදුරටත් දියුණු කිරීම සහ යළි නගා සිටුවීම සඳහා වන වියදම් මූල්‍යනය කිරීම මෙම ණය මුදලේ අරමුණ වේ. ණය පහසුකම් ගිවිසුමට අනුව රජයේ බැංකුව ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව පත් කරගන්නා ලදී. ඒ අනුව, හුදෙක් ණය මුදල් තැන්පත් කිරීම සහ එවැනි ලැබුනු මුදල් මාර්ග ව්‍යාපෘති වෙත බෙදා හැරීම සඳහා පමණක් පොදු ලෙජරයේ ගිණුමක් විවෘත කෙරිණි. 2014 මාර්තු 28 වන දින ඉහත ගිණුමට ඇ.එ.ජ. ඩොලර් මිලියන 300 ක් ලැබුණි. 2014 සහ 2015 වර්ෂයන් තුළ දී ඇ.එ.ජ. ඩොලර් මිලියන 149.36 ක් බෙදා දී ඇති අතර 2016 වර්ෂය තුළදී ඇ.එ.ජ ඩොලර් මිලියන 62.22ක් බෙදාහරින ලදී. 2016 දෙසැම්බර් 31 වන විට ඉතිරි වී ඇති ශේෂය ඇ.එ.ජ. ඩොලර් මිලියන 88.42කි.

**(ඈ) එස්ක්‍රෝ ගිවිසුම යටතේ ක්‍රියාත්මක වන ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය III අදියර II**

එස්ක්‍රෝ ගිවිසුම යටතේ ක්‍රියාත්මක වන II වන අදියර සඳහා වන ඇ.එ.ජ. ඩොලර් මිලියන 100 ක් 2014 නොවැම්බර් 24 වන දින හිමි විය. 2016 වසරේදී ඇ.එ.ජ. ඩොලර් මිලියන 14.86 ක් බෙදාහරින ලද අතර 2016 දෙසැම්බර් 31 දින වන විට ඉතිරි ශේෂය ඇ.එ.ජ. ඩොලර් මිලියන 85.14 කි

**(ඉ) කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ ගෝලීය හරිත ශක්ති ණය**

මෙය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ යුරෝපීය ආයෝජන බැංකුව අතර 2013 නොවැම්බර් 13 වන දින ඇති වූ මූල්‍ය ගිවිසුමකි. මෙම පහසුකම් එකඟතාවය අනුව, ශ්‍රී ලංකා රජයේ බැංකුව ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව තෝරා ගැණිනි. ඒ අනුව, හුදෙක් ලැබෙන ණය මුදල් තැන්පත් කිරීමට සහ එම මුදල් ව්‍යාපෘති සඳහා බෙදා හැරීමේ පරමාර්ථය ඇතිව පොදු ලෙජරයේ ගිණුමක් විවෘත කරන ලදී. 2014 ඔක්තෝම්බර් 06 වන දින මෙම ගිණුමට ඇ.එ.ජ. ඩොලර් මිලියන 21.13 ක් ලැබිණි. 2014 වසර තුළදී ඇ.එ.ජ. ඩොලර් මිලියන 11.80 ක් බෙදා හැර ඇති අතර 2014 දෙසැම්බර් 31 දිනට ඉතිරිව තිබූ ශේෂය ඇ.එ.ජ. ඩොලර් මිලියන 9.33 කි. එම ශේෂය 2015 වසර තුළදී බෙදා හරින ලදි.

ඉහත කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ ගෝලීය හරිත ශක්ති ණයෙහි දෙවන වාරිකය 2015 ජූලි 09 වන දින යුරෝ වලින් ලැබුණි. ඒ අනුව හුදෙක් ණය මුදල් තැන්පත් කිරීම සහ එවැනි ලැබුණු මුදල් ව්‍යාපෘති වෙත බෙදා හැරීම සඳහා පොදු ලෙජරයේ ගිණුමක් විවෘත කෙරිණි. 2015 ජූලි 09 සහ 2015 දෙසැම්බර් 23 දිනයන්හි දී ඉහත ගිණුමට පිළිවෙලින් යුරෝ මිලියන 26.68 ක් සහ යුරෝ මිලියන 46.87 ක් ලැබුණි.

2015 වර්ෂය තුළ දී යුරෝ මිලියන 26.01 ක් බෙදා දී ඇති අතර 2015 දෙසැම්බර් 31 වන විට ඉතිරි වී ඇති ශේෂය යුරෝ මිලියන් 47.54 කි.

යුරෝ ගිණුමේ ඉතිරි ශේෂය වන යුරෝ 37,337,757.66 ක මුදල භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ එකඟතාවය මත ඇ.එ.ජ. ඩොලර් ගිණුමට හුවමාරු කරන ලද අතර එහි වටිනාකම ඇ.එ.ජ. ඩොලර් 42,204,394.11 ක් වේ. 2016 වසර තුළදී ඇ.එ.ජ. ඩොලර් මිලියන 27.55 ක් බෙදා හරින ලද අතර 2016 දෙසැම්බර් 31 දින වන විට ඉතිරි ශේෂය ඇ.එ.ජ. ඩොලර් මිලියන 14.65 කි.

**(ඊ) DST විශේෂ ඩොලර් ගිණුම - අඹතලේ ජල සම්පාදන ප්‍රවර්ධන ව්‍යාපෘතිය**

මෙම ණය පහසුකම් ගිවිසුම Agence Francaise de Development (ණය හිමියා) සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ණය ගැණුම්කරු) අතර 2014 සැප්තැම්බර් 29 වන දින අත්සන් කර ඇත. මෙම ගිවිසුමෙහි බැංකුකරු වශයෙන් ණය ලැබීමට හා බෙදා හැරීමට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි බැංකුව විසින් පොදු ලෙජරයේ ගිණුමක් විවෘත කරන ලදී. 2015 සැප්තැම්බර් 14 වන දින ඉහත ගිණුමට ඇ.එ.ජ. ඩොලර් මිලියන 5 ක් ලැබුණි. 2016 වසර තුළදී ඇ.එ.ජ. ඩොලර් මිලියන 3.05 ක් බෙදා හරින ලද අතර 2016 දෙසැම්බර් 31 වන විට ඉතිරි ශේෂය ඇ.එ.ජ. ඩොලර් මිලියන 1.95 කි.

**(උ) පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ NORAD WASO ASIA ව්‍යාපෘතිය සඳහා වන ඩොලර් ගිණුම**

හැකියාවන් ප්‍රවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් NORAD වෙතින් ලැබෙන අරමුදල් ලබා ගැනීම සඳහා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ NORAD WASO ASIA ව්‍යාපෘතිය සඳහා වන ගිණුම විශ්ව විද්‍යාලය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වාගෙන යනු ලබයි. භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව හරහා මුදල් නැවත ලබා ගැනීමේ අයදුම්පත්‍රයක් ඉදිරිපත් කර ඇ.එ.ජ. ඩොලර් හෝ රුපියල් වශයෙන්, ගිණුමෙන් අරමුදල් ලබා ගැනීමට පේරාදෙණිය විශ්ව විද්‍යාලය අපේක්ෂා කරයි. ඉහත සඳහන් ගිණුමට 2016 දෙසැම්බර් 23 වන දින ඇ.එ.ජ. ඩොලර් 42,784.73 ක් ලැබී ඇත.

**(ඌ) සා(ර්)ක් විනිමය හුවමාරුව යටතේ ඉන්දියානු මහ බැංකුවට ගෙවිය යුතු මුදල**

සා(ර්)ක් රටවල් සඳහා මුදල් හුවමාරු ගිවිසුම් රාමුවට 2011 සැප්තැම්බර් 25 වන දින වොෂින්ටන් ඩී.සී. හිදී පැවැත් වූ සා(ර්)ක් රටවල්වල මූල්‍ය අධිපතිවරුන්ගේ සම්මන්ත්‍රණය විසින් මූල්‍යමය එකඟතාවය ලබා දෙන ලදී. සා(ර්)ක් ජාතීන්ට විධිවිධානයන් පිරිනැමීමේ දින සිට වර්ෂ 3 ක් යන තෙක් හුවමාරු ගිවිසුම වලංගු වේ. මෙම විධිවිධානය යටතේ ඉන්දියානු මහ බැංකුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව ද්විපාර්ශ්වික හුවමාරු ගිවිසුමකට එළඹ ඇත.

ගිවිසුමෙහි වලංගු කාලය තුළ දී අරමුදල් ලබා ගැනීම් වාරික කිහිපයකින් සිදු කිරීමට අනුමැතිය ලබා දී ඇත. සෑම ගැනීමක් ම මාස 3 ක් සඳහා වන අතර එක් වරක් පමණක් තවත් මාස 3 ක් සඳහා දීර්ඝ කිරීමට අවසරය ඇත. මෙම ලබා ගැනීම් සඳහා අදාළ වන පොලී අනුපාතිකය වන්නේ, ණය ලබා ගන්නා දිනයේ දී පවත්නා මාස 3 ඇ.එ.ජ. ඩොලර් අන්තර් බැංකු අර්පණ අනුපාතිකයෙහි සහ 200 පදනම් අංක පොලී අනුපාතිකයෙහි එකතුවයි.

2016 දෙසැම්බර් 31 දිනට හිඟ ශේෂය, 2016 දෙසැම්බර් 16 වන දින කරන ලද ඇ.එ.ජ. ඩොලර් මිලියන 400 ක ගැනීම නිරූපණය කරන අතර මෙම වාරිකය නැවත ගෙවීමේ කාලය 2017 මාර්තු 16 දිනෙන් අවසන් වේ.

### 21. බැංකු සහ මූල්‍ය ආයතනයන් විසින් තැන්පතු

මුදල් නීති පනතේ 93 වන වගන්තිය ප්‍රකාරව ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා සපුරාලීම පිණිස බලපත්‍රලාභී වාණිජ බැංකු පවත්වාගෙන යන තැන්පතු සහ මුදල් නීති පනතේ විධිවිධාන යටතේ තත්කාලීන දළ පියවුම් ක්‍රමය යටතේ (RTGS) සහභාගීවන්නන් වන බලපත්‍රලාභී වාණිජ බැංකු රජයේ සුරැකුම්පත්වල ප්‍රාථමික වෙළෙඳුන් සහ සේවක අර්ථසාධක අරමුදල් යන ආයතනවල තැන්පතු මේ යටතේ වේ. මෙම ක්‍රමය යටතේ, පියවුම් පද්ධතියේ සුමට ක්‍රියාකාරීත්වය සඳහා සහභාගී පාර්ශවයන්ට අදාල ගෙවීම් අවශ්‍යතාවයන් දිනක් තුළදී සපුරාලීමට රජය විසින් සම්පූර්ණයෙන්ම සුරැකුම් සහිත, පොලී රහිත එක් දින ද්‍රවශීලතා පහසුකම ලබා ගැනීමේ හැකියාව ඇත. ගිණුම්කරණ හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයන් මත මෙම තැන්පතු, සම්බන්ධිත පාර්ශ්ව සහ අනෙකුත් ලෙස වර්ග කළද, එය බැංකුව හා සඳහන් කළ ආයතන අතර වූ විශේෂ ව්‍යාපාර සම්බන්ධතා නිසා හටගන්නක් නොවේ.

| | 2016<br>රු. 000 | 2015<br>රු. 000 |
|---|---|---|
| බැංකුව විසින් තැන්පත් කිරීම්: | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **183,836,224** | 89,340,293 |
| - අනිකුත් | **110,060,140** | 92,380,448 |
| | **293,896,364** | 181,720,741 |
| මූල්‍ය ආයතන විසින් තැන්පත් කිරීම්: | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **477** | 729 |
| - අනිකුත් | **9,354,449** | 5,262 |
| | **9,354,926** | 5,991 |
| බැංකු සහ අනිකුත් මූල්‍ය ආයතන විසින් කරන ලද මුළු තැන්පතු | **303,251,290** | 181,726,732 |

### 22. රජය සහ රජයේ ආයතන විසින් තැන්පතු

| | 2016<br>රු. 000 | 2015<br>රු. 000 |
|---|---|---|
| රජයේ තැන්පතු | **167,615** | 174,871 |
| රජයේ නියෝජිතයන් සහ අරමුදල් | **283,269** | 253,271 |
| | **450,884** | 428,142 |

රජයේ සහ/හෝ රජයේ නියෝජිතයන්ගේ හෝ ආයතනවල නිල තැන්පතුධාරී වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල් නීති පනතේ අංක 106 (1) දරන වගන්තියට යටත්ව මෙම තැන්පතු පවත්වාගෙන යනු ලබයි.

### 23. ප්‍රති මිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කළ සුරැකුම්පත්

| | 2016<br>රු. 000 | 2015<br>රු. 000 |
|---|---|---|
| රජයේ සුරැකුම්පත් | **21,383,724** | 23,662,520 |
| නිත්‍ය තැන්පතු පහසුකම (සටහන 3.3.8) | **48,670,712** | 81,828,486 |
| | **70,054,436** | 105,491,006 |

මූල්‍ය ප්‍රතිපත්තිය හැසිරවීමේ අංගයක් ලෙස මුදල් නීති පනතේ වගන්ති 90 හා 91 යටතේ මුදල් වෙළෙඳපොළ ද්‍රවශීලතාවය නියාමනයට විවෘත වෙළඳපල මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම සඳහා බැංකුව විසින් ප්‍රති මිලදී ගැනීමේ එකඟතාවන් නිර්මාණය කරනු ලබයි. මෙම ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවයන් බැංකුව විසින් කලින් කලට තීරණය කරනු ලබන වෙළෙඳපළ ද්‍රවශීලිතා ප්‍රතිපත්තිය මත රඳා පවතිමින් එක් දිනක් සඳහා වන පදනම් මත හෝ කාලීන පදනම මත රජයේ සුරැකුම්පත් පමණක් යොදා ගනිමින් ක්‍රියාත්මක කරනු ලැබේ.

### 24. සේවක ප්‍රතිලාභ සැලසුම්වල වූ ශේෂයන්

බැංකුව විසින්, බැංකුවේ සාමාන්‍ය කාර්යයන් ලෙස එහි සේවක ප්‍රතිලාභ සැලසුම් සඳහා ජංගම ගිණුම් පහසුකම් සපයනු ලැබේ. වෙනමම පරිපාලනය කරනු ලබන බැංකුවේ සේවක ප්‍රතිලාභ සැලසුම්වලට අදාළ ජංගම ගිණුම්වල සහ අන්තර් ඒකක ගිණුම්වල ශේෂයන් මෙසේය.

| | 2016<br>රු. 000 | 2015<br>රු. 000 |
|---|---|---|
| ශ්‍රී.ලං.ම.බැ. අර්ථසාධක අරමුදල, ශ්‍රී.ලං.ම.බැ. විශ්‍රාම යෝජනා ක්‍රමය සහ වැන්දඹු/ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම යෝජනා ක්‍රමයෙන් හි ශේෂය | **51,744** | 7,212 |
| | **51,744** | 7,212 |

### 25. සංසරණයේ ඇති මුදල්

ශ්‍රී ලංකාවේ මුදල් නිකුත් කිරීමේ එකම බලධාරියා වශයෙන් බැංකුව විසින් අඛණ්ඩව නීතියෙන් වලංගු මුදල් නිකුත් කිරීම සිදු කරනු ලැබේ. වාර්තාකරණ දිනට නිකුත්කර සංසරණයේ තිබූ මුදල් ප්‍රමාණයන් පහත සඳහන් පරිදි විය.

| වර්ගය | 2016<br>රු. 000 | 2015<br>රු. 000 |
|---|---|---|
| **කාසි** | | |
| සත 1 | **3,631** | 3,631 |
| සත 2 | **5,703** | 5,703 |
| සත 5 | **23,247** | 23,247 |
| සත 10 | **39,208** | 39,208 |
| සත 25 | **120,586** | 120,558 |
| සත 50 | **185,611** | 185,371 |
| රුපියල් 1 | **851,968** | 794,975 |
| රුපියල් 2 | **1,272,301** | 1,155,840 |
| රුපියල් 5 | **3,725,947** | 3,473,827 |
| රුපියල් 10 | **4,505,834** | 3,345,748 |
| අනිකුත් සමරු කාසි | **584,177** | 582,423 |
| | **11,318,213** | 9,730,531 |
| **නෝට්ටු** | | |
| රුපියල් 1 | **4,981** | 4,981 |
| රුපියල් 2 | **26,696** | 26,696 |
| රුපියල් 5 | **37,194** | 37,194 |
| රුපියල් 10 | **1,382,089** | 1,449,773 |

| | | |
|---|---|---|
| රුපියල් 20 | **5,331,571** | 4,882,579 |
| රුපියල් 50 | **5,141,033** | 4,671,924 |
| රුපියල් 100 | **20,590,404** | 18,979,404 |
| රුපියල් 200 | **130,526** | 131,246 |
| රුපියල් 500 | **33,475,699** | 31,656,334 |
| රුපියල් 1,000 | **141,169,379** | 133,243,521 |
| රුපියල් 2,000 | **20,436,195** | 38,973,585 |
| රුපියල් 5,000 | **313,733,885** | 247,912,180 |
| | **541,459,652** | 481,969,417 |
| සංසරණයේ ඇති මුළු මුදල් ප්‍රමාණය | **552,777,865** | 491,699,948 |

## 26. අනෙකුත් ගෙවිය යුතු දෑ

| | 2016 රු. 000 | 2015 රු. 000 |
|---|---|---|
| වෙන්කිරීම් සහ අයකිරීම් | **563,783** | 556,337 |
| ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් කළ තැන්පතු | **2,440,187** | 2,314,645 |
| අත්හරින ලද දේපළ ලැබීම් සඳහා වූ වගකීම් | **4,094,268** | 3,221,244 |
| අනෙකුත් ගෙවිය යුතු මුදල් | **1,465,310** | 732,766 |
| | **8,563,548** | 6,824,992 |

අත්හරින ලද දේපලවලට අදාළව ගෙවිය යුතු මුදලින් නියෝජනය වන්නේ බලපත්‍රලාභී වාණිජ බැංකුවල අත්හරින ලද දේපළ හඳුනාගැනීම, වාර්තා කිරීම, මාරු කිරීම හා පවත්වාගෙන යෑමට අදාළ 2009 අංක 05 දරණ බැංකු පනතේ විධානයට අනුකූලව බලපත්‍රලාභී වාණිජ බැංකුවලින් රැස් කරගත් අරමුදල වේ. අත්හරින ලද දේපල වලට හිමිකම් පාන අවස්ථාවකදී බැංකුව තැන්පතු මුදල හා එයට අදාල පොළිය ගෙවීමට වගකීමෙන් බැඳේ. එම නිසා මුළු තැන්පතු මුදල හා බරතැබූ සාමාන්‍ය භාණ්ඩාගාර බිල්පත් පොළී අනුපාතය අනුව ගණනය කරන ලද පොළිය බැංකුවෙහි වගකීමක් ලෙස වාර්තා කරයි.

## 27. විලම්භිත ප්‍රදානයන්

| | 2016 රු. 000 | 2015 රු. 000 |
|---|---|---|
| ජනවාරි 01 වන දිනට | **106** | 515 |
| වර්ෂය තුල ක්‍රමක්ෂය | **(26)** | (409) |
| දෙසැම්බර් 31 දිනට | **80** | 106 |

විලම්භිත ප්‍රදානයන් අදාල වත්කමෙහි ක්ෂය පිළිවෙතට සරිලන පරිදි කාලය පුරා ක්‍රමක්ෂය කරනු ලැබේ. ගෙවීමක් නොමැතිව බැංකුවට හිමි වූ වත්කම් මෙහි ඇතුලත් වේ. වත්කමෙහි සාධාරණ අගය විලම්භිත ප්‍රදානයන් ගිණුමට බැර කරන ලද අතර අදාල වත්කමෙහි ක්ෂය පිළිවෙත හා සංගත වන පරිදි ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා අනෙකුත් ආදායම් වෙත ලියා හරින ලදී.

## 28. විවිධ බැරකම් හා උපචිතයන්

විවිධ බැරකම් හා උපචිතයන්හි ශේෂයන් තුළ ගෙවීමට ඇති ගිණුම්, කොන්ත්‍රාත් මත රඳවා ගැනීම්, නැවත ලබා දිය යුතු ටෙන්ඩර් තැන්පතු සහ රජයට ගෙවිය යුතු දඩ මුදල් අන්තර්ගතය.

## 29. හිමිකරු ප්‍රාග්ධනය

**හිමිකරු ප්‍රාග්ධන විෂයයන්ගේ ස්වභාවය**

**ප්‍රාග්ධන අරමුදල්**

(අ) **ආයක ප්‍රාග්ධනය** : මුදල් නීති පනතේ 6 වැනි වගන්තිය ප්‍රකාර බැංකුවේ ප්‍රාග්ධනය, ප්‍රාග්ධන ගිණුමෙන් පෙන්නුම් කරයි. 2014 අංක 15 දරණ මුදල් නීති පනතෙහි (සංශෝධිත) 6 වන වගන්තියට අනුව බැංකුවේ ආයක ප්‍රාග්ධනය රුපියල් බිලියන 50 ක් දක්වා ඉහළ නංවන ලදී. ඒ අනුව බැංකුව විසින් මුදල් ඇමතිගේ එකඟතාවය ඇතිව 2014 සැප්තැම්බර් මස බැංකුවේ සංචිත ප්‍රාග්ධනීත කරමින් ආයක ප්‍රාග්ධනය රුපියල් බිලියන 50 තෙක් වැඩි කරන ලදී.

(ආ) **ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන සංචිතය** - ජා.ගි.ප්‍ර. අංක 16 ප්‍රකාරව දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණන අතිරික්තයන් තුළින් මෙම සංචිතය ගොඩනැගී ඇත.

(ඇ) **අනෙකුත් සංචිත පහත සඳහන් දේ වලින් සමන්විත වේ;**

**i.** **ජාත්‍යන්තර ප්‍රත්‍යාගණන සංචිතය (IRR)** : ජාත්‍යන්තර ප්‍රත්‍යාගණන සංචිතය වූ කලී මුදල් නීති පනතේ 41 වැනි වගන්තිය ප්‍රකාර පිහිටුවන ලද සංචිතයකි. මෙම වගන්තිය ප්‍රකාර, රන් සහ විදේශ මුදල්වලින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ වත්කම් සහ බැරකම් ප්‍රත්‍යාගණනයෙන් උපලබ්ධි නොවූ ලාභ හෝ පාඩු බැංකුවේ ශුද්ධ ලාභය ගණනය කිරීම සඳහා සැලකිල්ලට නොගත යුතු අතර, ඒ වෙනුවට එම ලාභ හෝ පාඩු ජාත්‍යන්තර ප්‍රත්‍යාගණන සංචිතයට මාරු කළ යුතුය.

**ii.** **වෙළඳපල ප්‍රත්‍යාගණන සංචිතය (MRR)** : ජාත්‍යන්තර වෙළඳපල තුල සිදුවන අහිතකර චලන ප්‍රතිවිපාකයන් හි ප්‍රතිඵලයක් ලෙස ජාත්‍යන්තර මූල්‍ය වත්කම් වල වෙළඳපල මිල ගණන් හි සිදුවන අහිතකර වෙනස් වීම්වලට මුහුණ දීමේ පරමාර්ථයෙන් ජාත්‍යන්තර වත්කම් වෙළඳපල මිල මත ඇගැයීමේ ලාභ මාරු කිරීම සඳහා 2003 ජනවාරි 30 දින ලබා දුන් මුදල් මණ්ඩල තීරණයට අනුව වෙළඳපල ප්‍රත්‍යාගණන සංචිතය පිහිටුවන ලදී. මුදල් මණ්ඩලය විසින් මෙම සංචිතය ශ්‍රී.ලං.ම.බැ. දළ විදේශ සංචිත වලින් සියයට දහයක ප්‍රමාණයක් දක්වා ගොඩනැගීමට තීරණය කරන ලදී.

තවද, 2016 පෙබරවාරි 29 වන දින MB/DG(W)/7/1/2016 දරන මුදල් මණ්ඩලයේ යෝජිත සංශෝධිත බැංකුවේ ලාභ බෙදා දීමේ ප්‍රතිපත්තියට අනුව, මුදල් මණ්ඩලයට අවශ්‍යයැයි සලකන ඕනෑම අවස්ථාවකදී උපලබ්ධි නොවූ ප්‍රත්‍යාගණනයන්ගෙන් ඇතිවන්නා වූ පාඩු වැඩිවීම නිසා රඳවාගත් ලාභයන් ඍණ වන අවස්ථාවකදී වෙළෙඳපොල ප්‍රත්‍යාගණන සංචිතයේ සිට රඳවාගත් ලාභයන් වෙත හුවමාරු කිරීමක් සිදු කල හැක.

ඒ අනුව, ප්‍රධාන වශයෙන්ම පසුගිය වසරවලදී උපලබ්ධි නොවූ ප්‍රත්‍යාගණනයන්ගෙන් ඇතිවන සැළකිය යුතු අලාභයන් එකතු වීමේ ප්‍රතිඵලයක් ලෙස බැංකුවේ දැනට පවතින ඍණ රඳවාගත් ලාභයන් වැඩි දියුණු කරවීම සඳහා වෙළෙඳපොළ ප්‍රත්‍යාගණන සංචිතයේ සිට රඳවාගත් ලාභයන් වෙත රුපියල් බිලියන 4.65 ක් මාරු කර ඇත.

**iii.** **අනෙකුත් සංචිත :** පොදු සංචිතය, ගොඩනැගිලි සංචිතය හා ණය ඇපකර සංචිතයන් අනෙකුත් සංචිතයන් තුල ඇතුලත් වේ. මුදල් මණ්ඩලය විසින් රඳවාගත් ලාභයන්ගෙන් වෙන්කල ප්‍රමාණයන්ගෙන් පොදු සංචිතය සමන්විත වේ.

**iv.** **විකිණීම සඳහා තිබෙන සුරකුම්පත්වල ශුද්ධ සාධාරණ ලාභය/(අලාභය) :** විකිණීමට තිබෙන ලෙස නම් කර ඇති සුරකුම්පත් සහ ඒකක ආයෝජනයන් ප්‍රත්‍යාග ණනයෙන් උපලබ්ධි නොවූ ලාභ සහ පාඩු මෙම සංචිතයට මාරු කරන ලදී.

**v.** **තත්කාලීන දළ පියවුම් නිධන් අරමුදල :** තත්කාලීන දළ පියවුම් පද්ධතිය සඳහා සහභාගිවන්නන්ගේ අයකිරීම්වලින් මෙම අරමුදල ගොඩනගා ඇත.

**vi.** **විශ්‍රාම ප්‍රතිලාභ සංචිතය :** මෙම සංචිතය 2007 වර්ෂයේ ලාභයෙන් රුපියල් බිලියන 3 ක් මාරු කිරීමෙන් ආරම්භ කරන ලද අතර, බාහිර අවදානම් තත්ත්වයන් යටතේ බැංකුවේ ආදායම් ඉපැයීමේ ධාරිතාවයේ වන උච්ඡාවචනයන් හමුවේ විශ්‍රාම අරමුදලේ වන හිඟතාවයන් සඳහා යොදාගැනීමට අපේක්ෂා කෙරේ. 2011 ලාභවලින් තවත් රුපියල් බිලියන 1 ක් මෙම සංචිතයට මාරු කරන ලදී. MB/HR/11/12/2015 දරණ මුදල් මණ්ඩල පත්‍රිකාව අනුව නව විශ්‍රාම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා 2015 ජූනි මාසය තුළදී විශ්‍රාම ප්‍රතිලාභ සංචිතයෙන් රුපියල් බිලියන 2ක් නව විශ්‍රාම ගිණුමට මාරු කරන ලදී.

**vii.** **තාක්ෂණික අභිවර්ධන සංචිතය :** මෙම සංචිතය 2007 වර්ෂයේ ලාභයෙන් ගොඩනගා ඇති අතර මහ බැංකුවේ දැනට භාවිතා කරන පොදු ලෙජර පද්ධතිය, තත්කාලීන ගෙවුම් පියවුම් පද්ධතිය, භාණ්ඩාගාර මෙහෙයුම් කළමනාකරණ පද්ධතිය හා නිර්ලේඛනගත සුරකුම්පත් පියවීම් ක්‍රමය යන පද්ධතීන්වල සිදු කළ යුතු නවීකරණ කටයුතු හෝ වැඩි දියුණු කිරීම් සඳහා අවශ්‍ය අරමුදල් සැපයීම සඳහා මෙය යොදා ගැනීමට අපේක්ෂා කෙරේ.

**viii.** **පළාත් සංවර්ධන ණය යෝජනා ක්‍රම අරමුදල :** 2010 වර්ෂය තුළ බැංකුවේ ලාභවලින් රුපියල් බිලියන 2.90 ක අරමුදලක් ගොඩනගා, එමගින් කලාපවල මධ්‍ය හා දිගුකාලීන සංවර්ධන අරමුණු සඳහා, ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමයක් ආරම්භ කරන ලදී. එම ණය ප්‍රදානයන් ලංකා බැංකුව හා මහජන බැංකුව හරහා සිදුවිය.

**ix.** **විශේෂිත ණය ඇප ක්‍රම අරමුදල :** මධ්‍යම හා දීර්ඝකාලීන ණය අරමුදලින් රුපියල් බිලියන 2 ක් මාරු කිරීමෙන් 2014 දී මෙම අරමුදල පිහිටුවන ලද අතර ඉන් රුපියල් බිලියන 1 ක් බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන සෞභාග්‍යා ණය ක්‍රමය, පිබිදෙන උතුර අදියර II, නැගෙනහිර පළාත තුල ආර්ථික කටයුතු ප්‍රතිස්ථාපනය කිරීම II සහ උතුරු හා නැගෙනහිර හානි වූ නිවාස ප්‍රතිසංස්කරණය කිරීම යන ණය ක්‍රමයන් ප්‍රති ව්‍යුහගත කිරීම සඳහා වෙන්කර ඇත. අනෙක් රුපියල් බිලියන 1 කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාරවලට ණය දීම සඳහා වානිජ බැංකු මගින් විශේෂිත ණය ඇප ක්‍රමයක් ක්‍රියාවට නැංවීමට වෙන් කර ඇත.

අනෙකුත් සංචිතවල වෙනස් වීම පහත පරිදි වේ.

| | මධ්‍ය සහ දිගු කාලීන ණය සංචිතය | වෙළෙඳපල ප්‍රත්‍යාගණන සංචිතය | අනෙකුත් සංචිත | විශේෂිත ණය ඇප ක්‍රම සංචිතය | තත් කාලීන දළ පියවුම් නිධන් අරමුදල | ජාත්‍යන්තර ප්‍රත්‍යාගණන සංචිතය | විකිණීම සඳහා තිබෙන සුරකුම්පත්වල ශුද්ධ සාධාරණ ලාභය/අලාභය | විශ්‍රාම අරමුදල් සංචිතය | තාක්ෂණික අභිවර්ධන සංචිතය | පළාත් සංවර්ධන ණය යෝජනාක්‍රම අරමුදල | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| 2016 ජනවාරි 01 දිනට | 2,925,000 | 4,650,806 | 2,489,920 | 2,000,000 | 1,332,628 | 19,157,122 | 1,258,572 | 2,000,000 | 1,000,000 | 2,900,000 | 39,714,048 |
| තත්කාලීන දළ පියවුම සංචිතයට මාරු කිරීම | - | - | - | - | 220,272 | - | - | - | - | - | 220,272 |
| විදේශ විනිමය ප්‍රත්‍යාගණන ශුද්ධ අලාභ මාරු කිරීම. | - | - | - | - | - | (6,775,246) | - | - | - | - | (6,775,246) |
| විකිණීම සඳහා තිබෙන සුරකුම්පත්වල ශුද්ධ සාධාරණ ලාභය | - | - | - | - | - | - | 2,022,241 | - | - | - | 2,022,241 |
| වෙළෙඳපොළ ප්‍රත්‍යාගණන සංචිතයේ සිට රඳවාගත් ලාභයන් වෙත අරමුදල් මාරු කිරීම. | - | ( 4,650,806) | - | - | - | - | - | - | - | - | (4,650,806) |
| 2016 දෙසැම්බර් 31 දිනට | 2,925,000 | - | 2,489,920 | 2,000,000 | 1,552,900 | 12,381,876 | 3,280,813 | 2,000,000 | 1,000,000 | 2,900,000 | 30,530,509 |

## 30. ලාභ බෙදාහැරීම

මුදල් නීති පනතට අනුව සහ 2015 වසරේ සිට බලපැවැත්වෙන මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ලාභ බෙදාහැරීමේ ප්‍රතිපත්තියට අනුකූලව, බෙදිය හැකි ලාභය ගණනය කිරීමේදී ජා.මු.වා.ප්‍ර. ප්‍රකාර වසර සඳහා වන ශුද්ධ ලාභය / අලාභය සඳහා පහත දැක්වෙන ගැලපීම් කරනු ලැබේ.

(අ) මුදල් නීතිපනතේ වගන්ති අංක 41 ට අනුකූලව විදේශ විනිමය ප්‍රත්‍යාගණනයෙන් වන ලාභ/අලාභ ඉවත්කරනු ලැබේ.

(ආ) විදේශ වත්කම්වල උපලබ්ධි නොවූ ප්‍රත්‍යාග ණනයන්ගෙන් ඇතිවන්නාවූ පාඩු ගලපනු ලබන අතර (ඉවත්කිරීමක් නොකෙරේ) උපලබ්ධි නොවූ ප්‍රත්‍යාගණනයන්ගෙන් ඇතිවන්නාවූ වාසි ඉවත් කෙරේ (ලාභ බෙදා හැරීමේ ප්‍රතිපත්තීන්ට අනුකූලව).

(ඇ) මුදල් මණ්ඩලය විසින් තීරණය කරන ලද පරිදි මුදල් නීති පනතේ වගන්නි අංක 38 අනුව සංචිතයන්ට සිදු කරනු ලබන වෙනත් ඕනෑම මාරු කිරීමක් සහ මුදල් නීතිපනතේ වගන්ති අංක 39 අනුව කළ යුතු ගැලපුම් කරනු ලැබේ.

තවද ගිණුම්කරණ ප්‍රමිති සහ කළමණාකාරීත්වයේ තීරණ අනුව කළ යුතු ගැලපුම් ද බෙදිය හැකි ලාභය ගණනය කිරීමේ දී ගලපනු ලැබේ.

ඉහත සඳහන් ගැලපුම් වලට අනුව ගණනය කරන ලද 2016 දෙසැම්බර් 31 දිනට බෙදිය හැකි ලාභය පහත පරිදි වේ.

| අයිතමය | 2016<br>රු. 000 |
|---|---|
| **ජා.මු.වා.ප්‍ර. ප්‍රකාර ලාභය / (අලාභය)** | **22,179,519** |
| **අඩුකළා :** | |
| විදේශ විනිමය ප්‍රත්‍යාගණන අලාභය ජාත්‍යන්තර ප්‍රත්‍යාගණන සංචිතයට මාරු කිරීම. (මුදල් නීති පනතේ වගන්ති අංක 41 ප්‍රකාර) | **(6,775,247)** |
| විදේශ වත්කම්වල උපලබ්ධි නොවූ ප්‍රත්‍යාගණනයන්ගෙන් ඇති වන්නා වූ ලාභ වෙළෙඳපොළ ප්‍රත්‍යාගණන සංචිතයට මාරු කිරීම | **14,028,792** |
| අභ්‍යන්තර අරමුදල්වලින් ලද පොලී ආදායම් අදාළ අරමුදල් වෙත මාරු කිරීම. | **396,063** |
| **මුදල් නීති පනතට අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ ලාභය බෙදා හැරීමේ ප්‍රතිපත්තීන් සහ අනෙකුත් ගැලපුම්වලට අනුකූලව බෙදා හරින ලද ලාභය/(අලාභය) - උපලබ්ධි වූ ලාභය/ (අලාභය)** | **14,529,911** |
| සංචිත සඳහා මාරු කිරීම් (මුදල් නීති පනතේ වගන්ති අංක 38 ප්‍රකාර) | **-** |
| පශ්චාත් සේවක ප්‍රතිලාභ සැළසුම් ආයුගණනයෙන් ලද ප්‍රතිලාභ පිරිවැයෙන් 50% කට සමාන අගයක් අදාළ විශේෂිත සංචිතයක් වෙත මාරු කිරීම. | **689,026** |
| පොදු සංචිත වෙත මාරු කිරීම. | **7,462,613** |
| රජයේ ඒකාබද්ධ අරමුදලට මාරු කිරීම් සහ මහ බැංකුව වෙත ඇති රජයේ බැඳීම් යළි පියවා ගැනීම. (මුදල් නීති පනතේ වගන්ති අංක 39 ප්‍රකාර) | **6,378,272** |

## 31. මූල්‍ය වත්කම්වලින් පොලී ආදායම

| | 2016<br>රු. 000 | 2015<br>රු. 000 |
|---|---|---|
| **විදේශීය මූල්‍ය වත්කම්වලින් ඉපැයූ පොලී ආදායම** | | |
| මුදල් හා කෙටිකාලීන තැන්පතු | **1,479,882** | 1,464,525 |
| මූල්‍ය වත්කම් | **4,628,934** | 6,635,778 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | **8,761,019** | 4,947,011 |
| **විදේශීය මූල්‍ය වත්කම්වලින් ඉපැයූ මුළු පොලී ආදායම** | **14,869,835** | 13,047,314 |
| **දේශීය මූල්‍ය වත්කම්වලින් ඉපැයූ පොලී ආදායම** | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | **20,333,567** | 8,749,944 |
| අනිකුත් ණය සහ අත්තිකාරම් | **687,124** | 573,609 |
| **දේශීය මූල්‍ය වත්කම් වලින් ඉපැයූ මුළු පොලී ආදායම** | **21,020,691** | 9,323,553 |
| **මුළු මූල්‍ය වත්කම්වලින් ඉපැයූ මුළු පොලී ආදායම** | **35,890,526** | 22,370,867 |

## 32. උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණනයන්ගෙන් ලද ලාභ/ (අලාභ)

| | 2016<br>රු. 000 | 2015<br>රු. 000 |
|---|---|---|
| විදේශ සුරැකුම්පත් | **3,166** | 397,078 |
| රන් | **8,306,063** | (17,305,760) |
| විදේශ විනිමය සහ මුදල් හුවමාරු | **5,719,563** | (11,565,555) |
| පොලී අනුපාතික හුවමාරු | **(1,637)** | 2,017 |
| අන්තර්ගත ව්‍යුත්පන්න විනිමය විකල්පයන් | **(4,288,112)** | (6,381,575) |
| **උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණනයන්ගෙන් ලද සම්පූර්ණ ලාභය/ (අලාභය)** | **9,739,043** | (34,853,795) |

## 33. මූල්‍ය බැරකම් මත පොලී වියදම

| | 2016<br>රු. 000 | 2015<br>රු. 000 |
|---|---|---|
| **විදේශීය මූල්‍ය බැරකම් මත වූ පොලී වියදම** | | |
| ආසියානු නිශ්කාෂණ සංගමයට ගෙවිය යුතු මුදල | **174,504** | 38,009 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සම්බන්ධ වගකීම් | **1,180,604** | 1,394,723 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | **396** | 341,117 |
| වෙනත් විදේශ ගෙවිය යුතු මුදල් | **2,598,331** | 1,848,888 |
| **විදේශීය මූල්‍ය බැරකම් මත වූ මුළු පොලී වියදම** | **3,953,835** | 3,622,737 |
| **දේශීය මූල්‍ය බැරකම් මත වූ පොලී වියදම** | | |
| ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම මත අලෙවිකරණ ලද සුරැකුම්පත් | **345,835** | 4,067,059 |
| නිත්‍ය තැන්පතු පහසුකම | **1,519,585** | 4,582,318 |
| ණයට ගත් බැඳුම්කර | **-** | 82,711 |
| අත්හල දේපල | **332,395** | 187,896 |
| **දේශීය මූල්‍ය බැරකම් මත වූ මුළු පොලී වියදම** | **2,197,815** | 8,919,984 |
| **මූල්‍ය බැරකම් මත වූ සම්පූර්ණ පොලී වියදම** | **6,151,650** | 12,542,721 |

බැංකුව විසින් මුදල් වෙළෙඳපොල තුළ ඇති වූ ඌණ ද්‍රවශීලීතාවය මඟ හැරවීමට රුපියල් මුදා හැරීම තුළින් රු.මි. 9,366.62 ක ශුද්ධ නිවාරණ ලාභයක් 2016 වර්ෂය තුළදී උපයාගෙන ඇත (2015 - ශුද්ධ නිවාරණ පිරිවැය රු.මි. 4,354.36 කි). මෙම නිවාරණ පිරිවැය/(ලාභය) ප්‍රති මිලදීගැනුම් ගිවිසුම් යටතේ සුරැකුම්පත් විකිණීම මත වූ පොලී වියදම, බැඳුම්කර ණයට ගැනීම මත වූ පොලී වියදම, නිත්‍ය තැන්පතු පහසුකම් මත පොලී වියදම සහ ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්වලින් ලද පොලී ආදායමෙහි අඩංගු නැවත විකිණීමේ ගිවිසුම් යටතේ මිලදී ගත් සුරැකුම්පත්වලින් ලද පොලී ආදායම සහ විදේශ මූල්‍ය වත්කම් මත වූ පොලී ආදායමෙහි අඩංගු ඇ.එ.ජ. ඩොලර්/රුපියල් ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ ලාභයන්ගේ ශුද්ධ අගය වේ.

| | 2016 රු. 000 | 2015 රු. 000 |
|---|---|---|
| ප්‍රතිමිලදී ගැනුම් ගිවිසුම් මත විකුණුම් සුරැකුම්පත් වෙනුවෙන් දරණ ලද පොළී වියදම් | **345,835** | 4,067,059 |
| බැඳුම්කර ණයට ගැනීම වෙනුවෙන් ගෙවූ පොළී වියදම | - | 82,711 |
| නිත්‍ය තැන්පතු පහසුකම මත පොළී වියදම | **1,519,585** | 4,582,318 |
| **අඩු කළා :** | | |
| ප්‍රති විකුණුම් ගිවිසුම් මත මිලදී ගත් සුරැකුම්පත් වෙනුවෙන් ලද පොළී | **(2,471,022)** | (16,317) |
| ඇ.එ.ජ.ඩො./රුපියල් ව්‍යුත්පන්න මූල්‍ය උපකරණවල ලාභය | **(8,761,019)** | (4,361,415) |
| | **(9,366,621)** | 4,354,356 |

**34. අනෙකුත් ආදායම්**

| | 2016 රු. 000 | 2015 රු. 000 |
|---|---|---|
| ලාභාංශ ආදායම | | |
| - සම්බන්ධිත පාර්ශවයන් | **37,259** | 31,214 |
| - අනිකුත් | **1,818** | 1,050 |
| දේපළ, පිරියත සහ උපකරණ බැහැර කිරීමෙන් ලද ලාභය | **424** | 2 |
| විලම්භිත ප්‍රදානය ක්‍රමක්ෂය වීම | **34** | 409 |
| මූල්‍ය ආයතනයන්ට අදාල බලපත්‍ර ගාස්තු | **519,900** | 490,350 |
| කුලී ආදායම් | **455,514** | 381,491 |
| තත්කාලීන දළ පියවුම් පද්ධතියෙහි සහභාගීකරුවන්ගෙන් අයකරන ලද ගාස්තු | **112,863** | 128,768 |
| විවිධ ආදායම් | **380,449** | 544,158 |
| **මුළු අනිකුත් ආදායම්** | **1,508,261** | 1,577,442 |

ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව විසින් නිකුත් කරන ලද 2012 දෙසැම්බර් මස 3 දින ශ්‍රී.ලං.ම.බැ. ට ලැබුණු ණයකර මත වූ ක්‍රමක්ෂය ලාභය වන රු.මි. 1.40 (2015 රු.මි. 1.24) ක මුදල් සහ වි.ගැ.හි. 788,783 ක වටිනාකමින් යුත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි පවත්වාගෙන යන PRGF තැන්පතු මත වසර 2 ක ඉතිරි කාලය (සටහන 7) සඳහා වූ ක්‍රමක්ෂය ලාභය වන රු.මි. 6.17 ක් (2015 රු.මි. 5.73) විවිධ ආදායම් හි අන්තර්ගතව ඇත.

**35. සේවක මණ්ඩල වියදම්**

| | 2016 රු. 000 | 2015 රු. 000 |
|---|---|---|
| වේතන සහ වැටුප් | **4,258,884** | 4,201,583 |
| නිශ්චිත දායක ප්‍රතිලාභ සැලසුම් පිරිවැය | **629,786** | 629,357 |
| පශ්චාත් සේවක නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය | **1,479,963** | 1,329,578 |
| මුළු සේවක මණ්ඩල වියදම් | **6,368,633** | 6,160,518 |

**36. පරිපාලන හා අනිකුත් වියදම්**

| | 2016 රු. 000 | 2015 රු. 000 |
|---|---|---|
| අලුත්වැඩියා සහ නඩත්තු | **773,239** | 680,000 |
| රොයිටර්, බ්ලූම්බර්ග්, SWIFT ආදිය වෙනුවෙන් මෙහෙයුම් වියදම් | **134,648** | 154,937 |
| ගමනාගමන වියදම් | **116,658** | 97,552 |
| බදුකුලී වියදම් | **4,994** | 5,106 |
| මුද්‍රණ වියදම් | **27,468** | 26,476 |
| විගණන ගාස්තු | **7,846** | 7,768 |
| මුදල් මණ්ඩලයේ සාමාජිකයිනට පාරිශ්‍රමිකය | **3,605** | 1,084 |
| ශ්‍රී ලංකා මහ බැංකු අර්ථසාධක අරමුදල් පොළී සහනාධාර වියදම් | **47,877** | - |
| ප්‍රචාරණ වියදම් | **80,519** | 73,073 |
| උපදේශාත්මක, සන්නිවේදන සහ වෘත්තිමය ගාස්තු | **68,058** | 219,502 |
| විවිධ වියදම් | **203,097** | 346,038 |
| මුළු පරිපාලන හා අනිකුත් වියදම් | **1,468,009** | 1,611,537 |

**37. රඳවාගැනීම් මත බද්ද**

දේශීය ආදායම් (සංශෝධන) 2006 අංක 10 දරණ 7b (xvi) පණත අනුව ශ්‍රී ලංකා මහ බැංකුවට ආදායම් බදු ගෙවීම සඳහා වගකීමක් නොමැති අතර බැංකුව විසින් ගෙවනු ලබන රඳවාගැනීමේ බද්ද අවසාන බද්දක් ලෙස සැලකේ. 2013 වසරේ සිට ශ්‍රී ලංකා මහ බැංකුව ආර්ථික සේවා බද්දෙන් නිදහස් වී ඇත.

2007 අංක 10 ආදායම් බදු (සංශෝධිත) පනතට අනුව ලාභාංශ සහ පොළී ආදායම් ගෙවීමේ හෝ බැර කිරීමේ අවස්ථාවේ දී සියයට 10 ක රඳවා ගැනීමේ බද්දකට යටත් වේ. රජයේ සුරැකුම්පත් සඳහා වූ පොළී ආදායම මත වූ රඳවා ගැනීමේ බද්ද, කල්පිරීමට ඇති දින ගණනට ගැලපූ ආසන්නතම ප්‍රාථමික වෙන්දේසියේ සාමාන්‍ය බර තබන ලද ඵලදා අනුපාතය මත පදනම් වේ.

වර්ෂය තුළ දී රු.මි. 15,623.62 (2015 රු.මි. 8,859.71) ක පොළී ආදායම හා ලාභාංශ ආදායම වන රු.මි. 39.08 (2015 රු. මි. 6.21) ක ආදායම මත රඳවා ගැනීමේ බදු ලෙස රු. මි. 1,834.35 (2015 රු. මි. 1,788.16) ක වියදමක් දරා ඇත.

**38. මෙහෙයුම් ලාභය මෙහෙයුම් මුදල් ප්‍රවාහය සමග සැසඳීම**

| | 2016 රු. 000 | 2015 රු. 000 |
|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වාර්තා කෙරුණු ශුද්ධ ලාභය/(අලාභය) | **22,179,519** | (19,601,819) |
| **මුදල් නොවන අයිතමයන් එකතුකළා / (අඩුකළා)** | | |
| ක්ෂයවීම් හා ක්‍රමක්ෂය | **520,961** | 557,158 |
| ලැබුණු පොළිය - දේශීය මුදල් ආයෝජන කළඹ | **(20,333,567)** | (8,749,944) |
| උපලබ්ධි නොවූ දළ විදේශ විනිමය (ලාභය) / පාඩුව | **(12,107,722)** | (26,557,419) |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ලාභය | **(1,400)** | (1,236) |
| අනෙකුත් වෙන් කිරීම් | **2,713,774** | (89,185) |
| විලම්භිත ප්‍රදාන | **(27)** | (409) |
| ප්‍රත්‍යාගණන අලාභ | **378,907** | - |
| PRGF තැන්පතු ක්‍රමක්ෂය | **(6,165)** | (5,726) |
| ස්ථාවර ආදායම් සුරැකුම්පත් ක්‍රමක්ෂය වියදම් | **807,349** | 845,385 |
| **එකතුකළා / (අඩුකළා) අනෙකුත් කාරක ප්‍රාග්ධන අයිතමයන්ගේ වෙනස්වීම්** | | |
| තොගවල (වැඩිවීම)/අඩුවීම | **(2,694,897)** | 200,516 |
| ලැබිය යුතු පොළිය (වැඩිවීම)/අඩුවීම | **(4,576,657)** | 775,068 |
| විවිධ බැරකම්වල වැඩිවීම/(අඩුවීම) | **(723,637)** | (2,029,813) |
| ගෙවිය යුතු පොළිය වැඩිවීම/ (අඩුවීම) | **32,460** | (2,165,490) |
| අනෙකුත් ලැබීම් (වැඩිවීම)/ අඩුවීම | **(26,455)** | 59,130 |
| **එකතුකළා/(අඩුකළා) ආයෝජන සහ මූල්‍ය ක්‍රියාකාරකම්** | | |
| ශුද්ධ උපලබ්ධි නොවූ වෙළෙඳපොළ අගය වෙනස්වීම | **(9,857,403)** | 36,983,579 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(23,694,960)** | (19,780,205) |

**39. රජයේ ගනුදෙනු මත සංසරණ මුදල් ශුද්ධ නිකුතු / (ආපසු ගැනීම්)**

| | 2016 රු. 000 | 2015 රු. 000 |
|---|---|---|
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් මිලදී ගැනීම | **246,320,577** | (21,450,406) |
| ලැබුණු පොළිය - දේශීය මුදල් - ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | **(18,094,641)** | (8,876,023) |
| ශ්‍රී ලංකා රජයට දෙන ලද ණය සහ අත්තිකාරම් වැඩිවීම/(අඩුවීම) | **(67,824,900)** | 7,233,700 |
| රජය සහ රජයේ ආයතන සමග ශේෂ (වැඩිවීම)/අඩුවීම | **(22,741)** | (116,192) |
| | **160,378,295** | (23,208,921) |

**40. බැංකු සහ මූල්‍ය ආයතනයන්ගේ ගනුදෙනු මත සංසරණ මුදල් ශුද්ධ නිකුතු/(ආපසු ගැනීම්)**

| | 2016 රු. 000 | 2015 රු. 000 |
|---|---|---|
| බැංකු හා මූල්‍ය ආයතනයන්ගේ තැන්පතු (වැඩිවීම)/අඩුවීම | **(121,524,559)** | (20,944,825) |
| | **(121,524,559)** | (20,944,825) |

**41. අවසාන මුදල් සහ මුදල් සමානයන්**

| | 2016 රු. 000 | 2015 රු. 000 |
|---|---|---|
| විදේශීය මූල්‍ය වත්කම් | | |
| විදේශීය බැංකු සමග මුදල් ශේෂ | **423,783,737** | 557,474,685 |
| | **423,783,737** | 557,474,685 |

**42. අරමුදල්කරණයේ සංකේන්ද්‍රණය වීම**

වර්ෂ අවසානයට බැංකුවේ අරමුදල්කරණයේ සැලකිය යුතු සංකේන්ද්‍රණය වීම පහත සඳහන් පරිදි ය.

| | එකතුව | ශ්‍රී ලංකා රජය | ශ්‍රී ලංකා මහජනයා | ශ්‍රී ලංකා වාණිජ බැංකු | අධි ජාතික මූල්‍ය ආයතන | අනිකුත් |
|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| 2016 දෙසැම්බර් 31 දිනට | | | | | | |
| **විදේශීය මූල්‍ය බැරකම්** | | | | | | |
| බැංකු සහ මූල්‍ය ආයතනවලට ගෙවිය යුතු මුදල් | 45,566,681 | - | - | - | 180,696 | 45,385,985 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 14,573,675 | - | - | 14,573,664 | 11 | - |
| ආසියානු නිශ්කාෂණ සංගමය | 79,863,615 | - | - | - | 79,863,615 | - |
| ජා.මූ.අ. | 269,540,596 | - | - | - | 269,540,596 | - |
| අනිකුත් | 96,250,032 | 34,417,259 | - | 1,169,177 | 440,328 | 60,223,268 |
| **මුළු විදේශීය මූල්‍ය බැරකම්** | 505,794,599 | 34,417,259 | - | 15,742,841 | 350,025,246 | 105,609,253 |
| **දේශීය මූල්‍ය බැරකම්** | | | | | | |
| බැංකු සහ මූල්‍ය ආයතන විසින් තැන්පතු | 303,251,290 | - | - | 293,896,364 | - | 9,354,926 |
| රජය සහ රජයේ ආයතන විසින් තැන්පතු | 450,884 | 450,837 | 47 | - | - | - |
| ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කළ සුරැකුම්පත් | 70,054,436 | - | - | 67,552,907 | - | 2,501,529 |
| සේවක ප්‍රතිලාභ සැලසුම්වල ශේෂයන් | 51,744 | - | - | - | - | 51,744 |
| සංසරණයේ ඇති මුදල් | 552,777,865 | - | 552,777,865 | - | - | - |
| අනෙකුත් ගෙවිය යුතු දෑ | 8,563,548 | 46,218 | - | 182,000 | - | 8,335,330 |
| **මුළු දේශීය මූල්‍ය බැරකම්** | 935,149,767 | 497,055 | 552,777,912 | 361,631,271 | - | 20,243,529 |
| **මුළු මූල්‍ය බැරකම්** | 1,440,944,366 | 34,914,314 | 552,777,912 | 377,374,112 | 350,025,246 | 125,852,782 |
| **අනිකුත් බැරකම්** | | | | | | |
| විලම්භිත ප්‍රදානයන් | 80 | - | - | - | - | 80 |
| විශ්‍රාම වැටුප් සහ අනෙකුත් පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලසුම් | 2,429,153 | - | - | - | - | 2,429,153 |
| විවිධ බැරකම් සමග උපචිතයන් | 193,297 | 62,449 | - | - | - | 130,848 |
| **මුළු අනිකුත් බැරකම්** | 2,622,530 | 62,449 | - | - | - | 2,560,081 |
| **මුළු බැරකම්** | 1,443,566,896 | 34,976,763 | 552,777,912 | 377,374,112 | 350,025,246 | 128,412,863 |

2015 දෙසැම්බර් 31 දිනට සංසන්දනාත්මක සංඛ්‍යා පහත සඳහන් පරිදි වේ.

| | එකතුව | ශ්‍රී ලංකා රජය | ශ්‍රී ලංකා මහජනයා | ශ්‍රී ලංකා වාණිජ බැංකු | අධි ජාතික මූල්‍ය ආයතන | අනිකුත් |
|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| **2015 දෙසැම්බර් 31 දිනට** | | | | | | |
| **විදේශීය මූල්‍ය බැරකම්** | | | | | | |
| බැංකු සහ මූල්‍ය ආයතනවලට ගෙවිය යුතු මුදල් | 12,048,241 | - | - | - | 175,949 | 11,872,292 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 24,280,308 | - | - | 24,280,059 | - | 249 |
| ආසියානු නිශ්කාෂණ සංගමය | 68,887,459 | - | - | - | 68,887,459 | - |
| ජා.මූ.අ. | 251,644,344 | - | - | - | 251,644,344 | - |
| අනිකුත් | 217,924,142 | 49,479,048 | - | 1,124,395 | 643,303 | 166,677,396 |
| **මුළු විදේශීය මූල්‍ය බැරකම්** | 574,784,494 | 49,479,048 | - | 25,404,454 | 321,351,055 | 178,549,937 |
| **දේශීය මූල්‍ය බැරකම්** | | | | | | |
| බැංකු සහ මූල්‍ය ආයතන විසින් තැන්පතු | 181,726,732 | - | - | 181,720,741 | - | 5,991 |
| රජය සහ රජයේ ආයතන විසින් තැන්පතු | 428,142 | 428,041 | 101 | - | - | - |
| ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කළ සුරැකුම්පත් | 105,491,006 | - | - | 105,491,006 | - | - |
| සේවක ප්‍රතිලාභ සැලසුම්වල ශේෂයන් | 7,212 | - | - | - | - | 7,212 |
| සංසරණයේ ඇති මුදල් | 491,699,948 | - | 491,699,948 | - | - | - |
| අනෙකුත් ගෙවිය යුතු දෑ | 6,824,992 | 48,135 | - | 182,000 | - | 6,594,857 |
| **මුළු දේශීය මූල්‍ය බැරකම්** | 786,178,032 | 476,176 | 491,700,049 | 287,393,747 | - | 6,608,060 |
| **මුළු මූල්‍ය බැරකම්** | 1,360,962,526 | 49,955,224 | 491,700,049 | 312,798,201 | 321,351,055 | 185,157,997 |
| **අනිකුත් බැරකම්** | | | | | | |
| විලම්භිත ප්‍රදානයන් | 106 | - | - | - | - | 106 |
| විශ්‍රාම වැටුප් සහ අනෙකුත් පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලසුම් | 10,942,541 | - | - | - | - | 10,942,541 |
| විවිධ බැරකම් සමග උපචිතයන් | 199,325 | 26,364 | - | - | - | 172,961 |
| **මුළු අනිකුත් බැරකම්** | 11,141,972 | 26,364 | - | - | - | 11,115,608 |
| **මුළු බැරකම්** | 1,372,104,498 | 49,981,588 | 491,700,049 | 312,798,201 | 321,351, 055 | 196,273,605 |

## 43. අවදානම් කළමනාකරණය

ශ්‍රී ලංකා මහ බැංකුව එහි ව්‍යවස්ථාපිත අරමුණු දෙකක් වන මිල ස්ථායිතාවය හා මූල්‍ය පද්ධතියේ ස්ථායිතාවය වෙනුවෙන් කටයුතු කරනු ලබයි. එමෙන්ම, ආර්ථික හා මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කර එහි අරමුණු සුරක්ෂිත කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පුළුල් වූ ව්‍යවස්ථාපිත බලතල පැවරී ඇත. මූල්‍ය මණ්ඩලය, ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලන මණ්ඩලය වශයෙන් බැංකුවේ කළමණාකරණය, මෙහෙයුම් හා පරිපාලනය සම්බන්ධ සියළු ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට වගකියනු ලබයි. ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙහෙයුම් හා ප්‍රතිපත්ති, ලාභ ඉපැයීම කෙරෙහි අරමුණු ගත නොවේ. කෙසේ වෙතත්, බැංකුව තම කාර්යයන් පවත්වාගෙන යාමේදී විවිධ වූ අවදානම් තත්ත්වයන්ට නිරාවරණය වේ.

එබැවින් බැංකුවේ කළමනකාරිත්වය, ඇඩි හා ඵලදායි අවදානම් කළමනාකරණ හා පාලන ක්‍රමයන් තහවුරු කිරීමට කටයුතු කරනු ලබයි.

මේ සම්බන්ධයෙන් මුදල් මණ්ඩලය, අවදානම් පාලනය හා ඵලදායී කළමනාකරණය තහවුරු කිරීම සඳහා කමිටු කිහිපයකට සහ අංශ/දෙපාර්තමේන්තුවලට මෙම කටයුතු පවරා තිබේ.

එබැවින් අවදානම් කළමණාකරණය බැංකුවේ තීරණ ගැනීමට අදාල සියළු මට්ටම්වල වගකීමක් වේ. ශ්‍රී ලංකා මහ බැංකුව තුල අවදානම් කළමනාකරණ කාර්යය " තුන් පෙළ ආරක්ෂිත උපක්‍රම" ආකෘතිය යටතේ සිදුවේ.

ඒ අනුව "පළමු පෙළ ආරක්ෂිත උපක්‍රම" යන්ගේ වගකීම අදාල දෙපාර්තමේන්තු හා බැඳේ. "පළමු පෙළ ආරක්ෂිත උපක්‍රම" යටතට ගැනෙන අවදානම් තත්ත්වයන් මෙහෙයුම් ස්වභාවයක් ඇති තත්ත්වයන් වන බැවින් අදාල අවදානම් තත්ත්වයන් ඒවා හටගත් දෙපාර්තමේන්තු විසින්ම හසුරුවනු ලබයි.

ආරක්ෂිත උපක්‍රමයන්ගේ පළමු පෙළ, යෝග්‍ය අභ්‍යන්තර අවදානම් කළමණාකරණ පද්ධති සහ පාලන මාර්ගයන් නියමිත

පරිදි ඇති බවට තහවුරු කරයි. ආරක්ෂිත උපක්‍රමයන්ගේ දෙවන පෙළ වශයෙන් අවදානම් කළමණාකරණ දෙපාර්තමේන්තුව මූල්‍ය අවදානම් තත්ත්වයන් ඇගයීම, පාලනය හා අධීක්ෂණය කිරීමටත් ස්වාධීනව අධිපතිතුමාට වාර්තා කිරීමටත් වගකීම දරයි. ආරක්ෂිත උපක්‍රමයන්ගේ තුන්වන පෙළ ලෙස, අවදානම් රක්ෂණය කිරීමේ කාර්යයෙහි වගකීම අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවට පැවරී ඇත.

අවදානම් හි ප්‍රධාන මානයන් දෙක වනුයේ, මූල්‍ය හා මූල්‍ය නොවන අවදානම් ය. මූල්‍ය අවදානම තුල වෙළෙඳපොල අවදානම, (පොළී අනුපාත අවදානම හා විදේශ විනිමය අනුපාත අවදානම) ණය අවදානම හා ද්‍රවශීලතා අවදානම අන්තර්ගත වේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ සංචිත කළඹ හා බැඳුනු අවදානම් තක්සේරු කිරීම, අධීක්ෂණය කිරීම සහ වාර්තා කිරීම අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබන අතර ජාත්‍යන්තර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් විදේශ සංචිත කළඹ කළමනාකරණය කරනු ලබයි. මෙම සංචිත කළඹ කළමනාකරණය කිරීමේ දී, ජාත්‍යන්තර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් අවදානම් ආවරණය සඳහා වූ ප්‍රතිපත්ති ඇතුලත් විස්තීර්ණ මඟපෙන්වීම් අනුගමනය කරනු ලබන අතර, ජාත්‍යන්තර සංචිත ආශ්‍රිත මූල්‍ය අවදානම් තක්සේරු කිරීම් ස්වාධීනව අධිපති තුමා සහ මුදල් මණ්ඩලය වෙත වාර්තා කරනු ලබයි.

පොළී අනුපාත අවදානම හෙවත් පොළී අනුපාත චලනයන්ට බැංකුවේ විදේශ වත්කම් කළඹෙහි ආවරණයවීම්, ආයෝජන කළඹෙහි කාල පරාසය ගැලපීම මඟින් සහ දින 10ක කාලපරාසයකට සහ සියයට අනූනවයක විශ්වාසතා මට්ටමකට ඇති අවදානමෙහි වටිනාකම තක්සේරු කිරීම මගින් අධීක්ෂණය කෙරේ. විදේශ විනිමය අවදානම හෙවත් විදේශ විනිමය අනුපාතවල වෙනස්වීම් හේතුවෙන් සිදුවන ප්‍රාග්ධන පාඩු ප්‍රධාන වශයෙන් ආයෝජන විනිමයන් විවිධාංගිකරණය තුළින් පාලනය කරනු ලැබේ. ද්‍රවශීලතා අවදානම අවම කිරීම උදසො වත්කම් බෙදා වෙන්කිරීමේ ක්‍රියාවලියෙහි වත්කම් කාණ්ඩ සීමා කිරීමත්, සුරැකුම්පත් නිකුත් කරන්නන්ගෙන් මිලදී ගත හැකි මුළු අගයට උපරිම සීමාවන් පැනවීමත් සිදුකරනු ලබයි. විදේශ සංචිත කළමනාකරණයේ දී, විදේශ විනිමය අනුපාතය පාලනය කිරීමේ හැකියාවන් පවත්වාගැනීම සඳහා, ද්‍රවශීලතා අවදානම අවම කිරීම කෙරෙහි මූලික අවධානය යොමු කෙරේ. ණය අවදානම, පොළී අනුපාතය, විදේශ විනිමය හා ද්‍රවශීලතා අවදානම පාලනය කිරීම සඳහා වූ ප්‍රතිපත්ති පිළිවෙලින් 43.1, 43.2, 43.3 හා 43.4 යන සටහන් වලින් විස්තර කෙරේ.

ආයෝජනවල හා ප්‍රතිපාර්ශවයන්ගේ ණය වර්ගීකරණයන් පදනම් කරගත් විදේශ වත්කම් කළඹ සම්බන්ධ ණය අවදානම පාලනය කිරීම සඳහා ප්‍රතිපාර්ශවයන් සම්බන්ධ ණය අවදානම් කළමනාකරණ පද්ධතිය යොදා ගනු ලබයි. මීට අමතරව, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් මුදල් වෙළෙඳපොල ප්‍රතිපාර්ශවිය ණය පැහැරහැරීම් හුවමාරු/කොටස් මිල නිරන්තර අධීක්ෂණයට ලක් කරනු ලබයි.

අභ්‍යන්තර ආයෝජන අරමුදල්වලට අදාල මූල්‍ය අවදානම් තක්සේරු කිරීම, අධික්ෂණය කිරීම සහ වාර්තා කිරීම අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව මඟින් සිදු කෙරේ. මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුවේ ඉදිරි කාර්යාලය මඟින් ශ්‍රී ලංකා මහ බැංකුවේ අභ්‍යන්තර ආයෝජන අරමුදල පාලනය කෙරෙන අතර, අවදානම් කළමනාකරන දෙපාර්තමේන්තුව මඟින් එයට අදාල අවදානම් අඛණ්ඩව අධීක්ෂණය කරනු ලබයි. එමෙන්ම අඛණ්ඩව සකසන ලද තත්ත්ව වාර්තා අධිපතිවරයා වෙත ස්වාධීනව වාර්තා කිරීමත්, ප්‍රාග්ධන සංරක්ෂණය සහ ප්‍රමාණවත් ද්‍රවශීලීතාවයක් නිරතුරුව පවත්වා ගැනීම වෙනුවෙන් ආයෝජන ක්‍රියාවලිය සහ ආයෝජන ප්‍රතිපත්ති වැඩිදියුණු කිරීමට ඉවහල් වන අවදානම් සබැඳි යෙදවුම් මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව වෙත ලබාදීමත්, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව මඟින් සිදු කෙරේ.

මූල්‍ය නොවන අවදානම තුල, නීතිමය අවදානම, අනුකූලතා අවදානම, මානව සම්පත් අවදානම, වංචා අවදානම, උපාය මාර්ගික හා ප්‍රතිපත්ති අවදානම සහ අනෙකුත් මෙහෙයුම් අවදානම් ඇතුළත් වේ.

මූල්‍ය නොවන අවදානම් අධීක්ෂණය කිරීම, කාර්යය පිළවෙත්, නීති හා මාර්ග නිර්දේශයන් හා අනුකූල වීමේ අවදානම මෙන්ම බැංකුවට යෝග්‍ය අවදානම් පාලනය කිරීම ද තහවුරු කරයි. මේ අනුව මූල්‍ය නොවන අවදානම් කළමනාකරණ කමිටුව විසින් එහි කාර්තුමය රැස්වීම් හි දී බැංකුවෙහි මූල්‍ය නොවන අවදානම් අධීක්ෂණය කරනු ලබයි. අධිපතිතුමා විසින් මෙහි සභාපතීත්වය දරන අතර අවදානම් තත්ත්වයන්ට වැඩි නිරාවරණයක් ඇති තෝරාගත් ප්‍රධාන දෙපාර්තමේන්තු මෙහි සාමාජිකත්වය දරයි. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවෙහි අධ්‍යක්ෂකවරයා මෙහි නිරීක්ෂකයෙකු ලෙස කටයුතු කරනු ලබයි. මෙම කමිටුවේ ප්‍රධාන අරමුණ වනුයේ, බැංකුවෙහි කීර්තිය ආරක්ෂා කිරීමට හා සිදුවිය හැකි හානි හා අලාභ අවම කිරීම වෙනුවෙන් බැංකුවේ මූල්‍ය නොවන අවදානම් හඳුනා ගැනීමටත්, ඇගයීමටත්, ඇති විය හැකි බලපෑම සහ සම්භාවිතාවය අධීක්ෂණයටත් මුදල් මණ්ඩලයට පැවරී ඇති වගකීම සඳහා සහාය වීමයි. අවදානම් කළමණාකරණ සැලසුමේ හා අභ්‍යන්තර පාලන පිළිවෙත්හි ගුණාත්මකභාවය, සම්පූර්ණත්වය හා කාර්යක්ෂමතාවය සමාලෝචනය හා ඇගයීමද මෙම කමිටුව විසින් සිදු කරයි.

අභ්‍යන්තර පාලන සහ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය, බැංකුවේ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව විගණනය කෙරේ. මෙම දෙපාර්තමේන්තුව එම ක්‍රියාමාර්ගවල ප්‍රමාණාත්මතාවය හා එම ක්‍රියා මාර්ග කෙරෙහි බැංකුවේ අනුකූලතාවය පරීක්ෂා කරනු ලබයි. සෑම දෙපැර්තමේන්තුවක්ම කලින් කලට අභ්‍යන්තර විගණන විමර්ෂණයකට ලක් වේ. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව පරිපාලනමය වශයෙන්, මුදල් මණ්ඩලයෙහි සභාපතීත්වය දරන අධිපතිවරයා වෙත වාර්තා කරන අතර, ක්‍රියාකාරී ලෙස විගණන කමිටුව වෙත වාර්තා කරනු ලැබේ.

මුදල් මණ්ඩලයෙහි තෝරගත් සාමාජිකයෙකු විසින් උපදේශාත්මක විගණන කමිටුවෙහි මුලසුන දරන අතර, එම කමිටුව විසින් වාර්ෂික හා අනෙකුත් මූල්‍ය වාර්තාවල විනිවිදභාවය පිළිබඳවද, මූල්‍යමය කාර්යසාධනය පිළිබඳව වූ කාර්තුමය කළමනාකාරීත්ව ප්‍රකාශන හා අනෙකුත් නිල දැනුම් දීම් පිළිබඳවද, සැලකිය යුතු මූල්‍ය වාර්තාකරණ ගැටලු

හා විනිශ්චයන් සමාලෝචනය පිළිබඳවද, අභ්‍යන්තර පාලන හා අවදානම් කළමනාකාරීත්ව පද්ධති පිළිබඳවද, බැංකුවේ අනුකූලතා කාර්යයයෙහි ප්‍රමාණාත්මක හා සඵලදායී බව පිළිබඳවද, අභ්‍යන්තර විගණන කාර්යයන් හා එයට සම්බන්ධිත කාර්යයන් හා එයට සම්බන්ධිත කාර්යයන්වල සඵලදායීතාවය සහ බාහිර විගණන කටයුතු පිළිබඳවද, මුදල් මණ්ඩලය දැනුවත් කරනු ලබයි. උපදේශාත්මක විගණන කමිටුවෙහි නිර්දේශයන් සහ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවෙහි ප්‍රගතිය කාර්තුමය වශයෙන් මුදල් මණ්ඩල වෙත වාර්තා කරනු ලබයි.

මුදල් නීතී පනතේ 42 හා 43 වගන්ති ප්‍රකාරව, බැංකුව විගණකාධිපතිවරයා විසින් ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකිරීමේ ප්‍රමිතීන්ට අනුකූලව ජාත්‍යන්තර විගණන ප්‍රමිතීන් යටතේ විගණන කටයුතු කරගෙන යාම සඳහා වරළත් ගණකාධිකාරී සමාගමක් වන අර්නස්ට් සහ යංග්හි සහායද ලබාගෙන ඇත.

### 43.1 ණය අවදානම

**(අ) භූගෝලීය ප්‍රදේශ අනුව ණය සංකේන්ද්‍රණය**

බැංකුවේ වර්ෂය අවසානයේ දී සැලකිය යුතු ණය සංකේන්ද්‍රණයන් භූගෝලීය ප්‍රදේශ අනුව (ආයතනයේ අයිතිකාරත්ව රටවල් පදනම් කරගෙන) පහත දැක්වේ.

| | 2016<br>රු. 000 | 2015<br>රු. 000 |
|---|---|---|
| ශ්‍රී ලංකාව | **450,026,855** | 266,095,014 |
| ඇමෙරිකා එක්සත් ජනපදය | **238,171,318** | 314,591,946 |
| ජපානය | **42,458,692** | 47,722,367 |
| බ්‍රිතාන්‍යය | **53,470,592** | 170,829,879 |
| යුරෝපය | **130,405,122** | 101,096,757 |
| අධි ජාතික මූල්‍ය ආයතන | **373,327,138** | 336,791,479 |
| වෙනත් | **98,710,669** | 57,917,502 |
| **මුළු මූල්‍ය වත්කම්** | **1,386,570,386** | 1,295,044,944 |

**(ආ) ආයතනය අනුව ණය සංකේන්ද්‍රණය වීම**

බැංකුවේ වර්ෂය අවසානයට වන සැලකිය යුතු ණය සංකේන්ද්‍රණය වීම ආයතන වර්ගයන් අනුව පහත දැක්වේ.

| | 2016<br>රු. 000 | 2015<br>රු. 000 |
|---|---|---|
| රජයන් | **843,824,011** | 903,134,670 |
| අධි ජාතික මූල්‍ය ආයතන | **373,327,138** | 336,791,480 |
| විදේශීය බැංකු සහ මූල්‍ය ආයතන | **159,700,398** | 48,696,315 |
| ශ්‍රී ලංකා බැංකු හා මූල්‍ය ආයතන | **3,838,531** | 909,033 |
| අනිකුත් | **5,880,308** | 5,513,446 |
| **මුළු මූල්‍ය වත්කම්** | **1,386,570,386** | 1,295,044,944 |

**(ඇ) ණය ශ්‍රේණිගත කිරීම මගින් ණය අවදානම මැනීම**

ස්ටෑන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් සහ ෆිච් රේටින් සමාගමට අනුව ණය ශ්‍රේණිගත කිරීම සිදුකළ බැංකුවේ මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වත්කම් නිකුතුකරුවන් පහත වගුවෙන් දැක්වේ. ස්ටෑන්ඩර්ඩ් සහ පුවර්ස් සහ ෆිච් රේටින් සමාගමේ ශ්‍රේණිගත කිරීම් අනුව AAA සංකේතය ඉතා ඉහළම ශ්‍රේණිගත කිරීම හා අවම අපේක්ෂිත ණය අවදානම පෙන්නුම් කරන අතර, යම්කිසි ආයතනයකට පොළීය සහ මුල් මුදල් ගෙවීමට හැකි ශක්තිමත් තත්වයක් තිබෙන බව දක්වයි. AA සංකේතයෙන් ඉතා ඉහළ ශ්‍රේණිගත කිරීමක් හා ඉතා අඩු අපේක්ෂිත ණය අවදානමක් දැක්වෙන අතර, ශක්තිමත් තත්වයක් දක්වයි. A සංකේතයෙන් ඉහළ මධ්‍යම ශ්‍රේණියන් දක්වන අතර ශක්තිමත් තත්ත්වයක් හා ණය අවදානමේ පහළ තත්වයක් දක්වයි. BBB සංකේතයෙන් පහළ ම ආයෝජන ශ්‍රේණි කිරීමක් හා පහළ මට්ටමේ ණය අවදානමක් බවතින බව දක්වන අතර, ප්‍රමාණවත් ආරක්ෂක පරාමිති පෙන්නුම් කරයි. AAA සංකේතයට පහළ ශ්‍රේණි ප්‍රධාන ප්‍රභේදයන් අතර පවත්නා තත්ත්වය දැක්වීම පිණිස + හෝ - ලකුණු මගින් කාණ්ඩකරණය කළ හැකිය. ස්ටෑන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් හා ෆිච් රේටින්ග් සමාගම් විසින් ණය ශ්‍රේණිගත නොකළ බව NR සංකේතයෙන් දැක්වේ.

| ණය ශ්‍රේණිගත කිරීම මගින් ණය අවදානම මැනීම | ණය ශ්‍රේණිය | 2016 රු. 000 | % | 2015 රු. 000 | % |
|---|---|---|---|---|---|
| **මුදල් හා මුදල් සමානයන්** | | | | | |
| ෆෙඩරල් රිසව් බැන්ක් - ඇ.එ.ජ./ රිසව් බැන්ක් ඔෆ් ඕස්ට්‍රේලියා /බැන්ක් ෆෝ ඉන්ටර්නැෂනල් සෙට්ල්මන්ට්ස්/බැන්ක් ඔෆ් ජැපෑන්/ඩොයිෂ් බුන්ඩෙස් බැන්ක්/බැන්ක් ඔෆ් ඉන්ග්ලන්ඩ්/සෙවරීග්ස් රික්ස් බැන්ක්/බැන්ක් ඔෆ් කැනඩා/රිසව් බැන්ක් ඔෆ් නිව්සීලන්ඩ් | | **310,794,899** | **22.41%** | 553,410,725 | 42.73% |
| | AAA | **53,182,289** | **3.84%** | - | - |
| | AA | **7,536** | **0.00%** | 3,435 | 0.00% |
| | AA- | **50,185,913** | **3.62%** | - | - |
| | A+ | **8,002,830** | **0.58%** | 2,127,405 | 0.16% |
| | A | **946,070** | **0.07%** | 1,531,225 | 0.12% |
| | A- | **138,110** | **0.01%** | 1,734 | 0.00% |
| | BBB+ | **37** | **0.00%** | 202,837 | 0.02% |
| | BBB- | **29,187** | **0.00%** | 1,325 | 0.00% |
| | NR | **496,866** | **0.04%** | 195,999 | 0.02% |
| | | **423,783,737** | **30.56%** | 557,474,685 | 43.05% |
| **විදේශ විනිමය විකිණීම/විකිණීම සඳහා ඇති සුරැකුම්පත්** | | | | | |
| ෆෙඩරල් රිසව් බැන්ක් - ඇ. එ. ජ./රිසව් බැන්ක් ඔෆ් ඕස්ට්‍රේලියා/ බැන්ක් ෆෝ ඉන්ටර්නැෂනල් සෙට්ල්මන්ට්ස්/ බැන්ක් ඔෆ් ජැපෑන්/ ඩොයිෂ් බුන්ඩෙස් බැන්ක්/බැන්ක් ඔෆ් ඉන්ග්ලන්ඩ්/සෙවරීග්ස් රික්ස් බැන්ක්/බැන්ක් ඔෆ් කැනඩා/රිසව් බැන්ක් ඔෆ් නිව්සීලන්ඩ් | | **8,820,628** | **0.64%** | 11,714,884 | 0.90% |
| | AAA | **123,208,858** | **8.89%** | 180,207,061 | 13.92% |
| | AA+ | **185,264,513** | **13.36%** | 117,813,693 | 9.10% |
| | AA | **4,523,696** | **0.33%** | 922,677 | 0.07% |
| | AA- | **20,567,813** | **1.48%** | 15,356,209 | 1.19% |
| | A+ | **22,509,922** | **1.62%** | 22,574,134 | 1.74% |
| | A | **3,119,014** | **0.22%** | - | - |
| | A- | **(120,419)** | **-0.01%** | - | - |
| | BBB+ | **542,589** | **0.04%** | - | - |
| | NR | **9,990,623** | **0.72%** | 27,452,563 | 2.12% |
| | | **378,427,237** | **27.29%** | 376,041,221 | 29.04% |
| ලාභ හෝ අලාභ මත සාධාරණ මිලට ඇති සුරැකුම්පත් | A | **13,396,168** | **0.97%** | 11,792,926 | 0.91% |
| | | **13,396,168** | **0.97%** | 11,792,926 | 0.91% |
| **ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ** | | | | | |
| ෆෙඩරල් රිසව් බැන්ක්-ඇ.එ.ජ/.රිසව් බැන්ක් ඔෆ් ඕස්ට්‍රේලියා/ බැන්ක් ෆෝ ඉන්ටර්නැෂනල් සෙට්ල්මන්ට්ස්/බැන්ක් ඔෆ් ජැපෑන් /ඩොයිෂ් බුන්ඩෙස් බැන්ක්/බැන්ක් ඔෆ් ඉන්ග්ලන්ඩ්/සෙවරීග්ස් රික්ස් බැන්ක්/බැන්ක් ඔෆ් කැනඩා/රිසව් බැන්ක් ඔෆ් නිව්සීලන්ඩ් | | - | - | 99 | 0.00% |
| | A | - | - | 49 | 0.00% |
| දේශීය ශ්‍රේණිගත කිරීම | A- | - | - | 1,886 | 0.00% |
| | AA+ | **2,377** | **0.00%** | 1,652 | 0.00% |
| | AA | **156,660** | **0.01%** | 459 | 0.00% |
| | AA- | **39,843** | **0.00%** | - | 0.00% |
| | | **198,880** | **0.01%** | 4,145 | 0.00% |
| **ජා.මූ.අ. සම්බන්ධ වත්කම්** | AAA | **117,008,339** | **8.44%** | 83,636,350 | 6.46% |
| | | **117,008,339** | **8.44%** | 83,636,350 | 6.46% |

| | ණය ශ්‍රේණිය | 2016 රු. 000 | 0.00% | 2015 රු. 000 | % |
|---|---|---|---|---|---|
| අනෙකුත් ලැබිය යුතු දෑ | | | | | |
| | AAA | **532** | **0.00%** | 344 | 0.00% |
| | AA- | **2,299,102** | **0.17%** | - | - |
| | A+ | **224,742** | **0.02%** | - | - |
| | A | **127** | **0.00%** | 2,370 | 0.00% |
| | A- | **120,772** | **0.01%** | - | - |
| | BBB+ | **237,320** | **0.02%** | - | - |
| | BBB- | - | - | 4 | 0.00% |
| දේශීය ශ්‍රේණිගත කිරීම | AAA | **2,247,000** | **0.16%** | 2,357 | 0.00% |
| | NR | **1,045,455** | **0.08%** | - | - |
| | | **6,175,050** | **0.45%** | 5,075 | 0.00% |
| **මුළු විදේශීය මූල්‍ය වත්කම්** | | **938,989,411** | **67.72%** | 1,028,954,402 | 79.45% |
| **දේශීය මූල්‍ය වත්කම්** | | | | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | B+ | **351,426,470** | **25.35%** | 102,866,995 | 7.94% |
| රජයට දෙනු ලැබූ කාලීන අත්තිකාරම් | B+ | **83,306,771** | **6.01%** | 151,131,672 | 11.67% |
| බැංකුවලට දෙන ලද ණය | AA+ | **244,284** | **0.02%** | 503,989 | 0.04% |
| | AA | **4,040** | **0.00%** | 6,328 | 0.00% |
| | AA- | **7,902** | **0.00%** | 14,715 | 0.00% |
| | A+ | **17,775** | **0.00%** | 32,314 | 0.00% |
| | A- | **25,195** | **0.00%** | 33,101 | 0.00% |
| | BBB | **3,626** | **0.00%** | 6,835 | 0.00% |
| | BB+ | **62,341** | **0.00%** | 85,759 | 0.01% |
| | B+ | **515** | **0.00%** | 1,422 | 0.00% |
| | B | **3,500** | **0.00%** | 4,860 | 0.00% |
| | NR | **114,865** | **0.01%** | 197,034 | 0.02% |
| මූල්‍ය හා අනෙකුත් ආයතන වල හිමිකරු ප්‍රාග්ධන ආයෝජන | NR | **41,095** | **0.00%** | 41,095 | 0.00% |
| අනෙකුත් වත්කම් | AA+ | **533,300** | **0.04%** | - | - |
| | AA | **167,600** | **0.01%** | - | - |
| | A | **6,500** | **0.00%** | - | - |
| | A- | **56,400** | **0.00%** | - | - |
| | B+ | **5,697,917** | **0.41%** | 5,671,508 | 0.44% |
| | B | **10,000** | **0.00%** | 10,000 | 0.00% |
| | NR | **5,850,879** | **0.42%** | 5,482,915 | 0.42% |
| **මුළු දේශීය මූල්‍ය වත්කම්** | | **447,580,975** | **32.28%** | 266,090,542 | 20.55% |
| **මුළු මූල්‍ය වත්කම්** | | **1,386,570,386** | **100.00%** | 1,295,044,944 | 100.00% |
| **(ඇ) ප්‍රධාන ණය ශ්‍රේණිවල සාරාංශය** | | | | | |
| **විදේශීය මූල්‍ය වත්කම්** | | | | | |
| ෆෙඩරල් රිසව් බැන්ක් - ඇ.එ.ජ./රිසව් බැන්ක් ඔෆ් ඕස්ට්‍රේලියා/ බැන්ක් ෆෝ ඉන්ටර්නැෂනල් සෙට්ල්මන්ට්ස්/බැන්ක් ඔෆ් ජැපෑන්/ ඩොයිෂ් බුන්ඩෙස් බෑන්ක්/බැන්ක් ඔෆ් ඉංග්ලන්ඩ්/ සෙවරීග්ස් රික්ස් බෑන්ක්/බැන්ක් ඔෆ් කැනඩා/රිසව් බැන්ක් ඔෆ් නිව්සීලන්ඩ් | | **319,615,527** | **23.05%** | 565,125,708 | 43.64% |
| ජා.මූ.අ. සම්බන්ධ වත්කම් | | **117,008,871** | **8.44%** | 83,636,694 | 6.46% |
| | AAA | **176,391,148** | **12.72%** | 180,207,061 | 13.92% |
| | AA+/- | **262,848,573** | **18.96%** | 134,096,014 | 10.35% |
| | A+/- | **48,337,336** | **3.49%** | 38,031,730 | 2.94% |
| | BBB+/- | **809,132** | **0.06%** | 204,166 | 0.02% |
| | NR | **10,487,489** | **0.76%** | 27,648,561 | 2.13% |
| දේශීය ශ්‍රේණිගත කිරීම | AAA | **2,247,000** | **0.16%** | 2,357 | 0.00% |
| | AA+ | **2,377** | **0.00%** | 1,652 | 0.00% |
| | AA | **156,660** | **0.01%** | 459 | 0.00% |
| | AA- | **39,843** | **0.00%** | - | - |
| | NR | **1,045,455** | **0.08%** | - | - |
| **මුළු විදේශීය මූල්‍ය වත්කම්** | | 938,989,411 | 67.72% | 1,028,954,402 | 79.45% |

| | | | | | |
|---|---|---|---|---|---|
| දේශීය මූල්‍ය වත්කම් | AA+ | **777,584** | **0.06%** | 503,989 | 0.04% |
| | AA | **171,640** | **0.01%** | 6,328 | 0.00% |
| | AA- | **7,902** | **0.00%** | 14,715 | 0.00% |
| | A+ | **17,775** | **0.00%** | 32,314 | 0.00% |
| | A | **6,500** | **0.00%** | - | - |
| | A- | **81,595** | **0.01%** | 33,101 | 0.00% |
| | BBB | **3,626** | **0.00%** | 6,835 | 0.00% |
| | BB+ | **62,341** | **0.00%** | 85,759 | 0.01% |
| | B+ | **440,431,674** | **31.76%** | 259,671,597 | 20.05% |
| | B | **13,500** | **0.00%** | 14,860 | 0.00% |
| | NR | **6,006,838** | **0.43%** | 5,721,044 | 0.44% |
| මුළු දේශීය මූල්‍ය වත්කම් | | **447,580,975** | **32.28%** | 266,090,542 | 20.55% |
| මුළු මූල්‍ය වත්කම් | | **1,386,570,386** | **100.00%** | 1,295,044,944 | 100.00% |

**43.2 පොළී අනුපාතික අවදානම**

(අ) විදේශීය මුදල් පොළී අනුපාත සංවේදීතාවය

**පොළී අනුපාත අවදානම යනු පොළී අනුපාතයේ වෙනස්වීම නිසා ඇතිවන පාඩු විඳීමේ අවදානමයි.**

ස්ථාවර ආදායම් සුරැකුම්පත් ආයෝජන කළඹෙහි පොළී අනුපාත සංවේදීතාවය, සංචිත කළමනාකරණ සහ උපදේශක වැඩසටහනෙහි ආයෝජන (RAMP) හැර, පොළී අනුපාතය පදනම් අංක 10 කින් වැඩිවීම මගින් අදාළ ආයෝජන කළඹෙහි වියහැකි හානිය වන අතර මෙය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවදානම් තක්සේරු කිරීම සඳහා යොදා ගන්නා තවත් ක්‍රමයක් වේ.

බණ්ඩනය කරන ලද ස්ථාවර ආදායම් ආයෝජන කළඹෙහි අවදානම් නිවාරණ සංවේදීතාවය පහත දැක්වේ.

| බණ්ඩනය කරන ලද ස්ථාවර ආදායම් සුරැකුම්පත් කළඹ | විය හැකි පාඩුව (ඇ.එ.ජ. ඩොලර් මිලියන) | |
|---|---|---|
| | **2016** | **2015** |
| වෙළෙඳ හා විකිණීම සඳහා ඇති ආයෝජන | **5.16** | 8.35 |
| **RAMP** | **0.03** | - |

අවදානම් කළමණාකරණ දෙපාර්තමේන්තුව විසින් විදේශ වත්කම් ආයෝජන කළඹෙහි පොළී අනුපාත අවදානම කළමනාකරණය කිරීම සඳහා පහත දැක්වෙන උපාය මාර්ග යන් අනුගමනය කරනු ලැබේ.

**(i)** පොළී අනුපාත වෙනස්වීම මත විදේශ වත්කම් ආයෝජන කළඹට ඇතිවන බලපෑම පොළී අනුපාත සංවේදීතාවය මගින් මනිනු ලබන අතරම පොළී අනුපාතය මෙන්ම ආයෝජනයේ කාල සීමාව සැලකිල්ලට ගනු ලබන විකරිත සඵල කාලච්ඡේදය පොළී අනුපාත අවදානම මැනීම සඳහා බැංකුව විසින් යොදා ගනු ලැබේ. විකරිත සඵල කාලච්ඡේදය මගින් දෙනලද පොළී අනුපාත (එලදාව) වෙනස්වීම් මත සුරැකුම්පත්වල මිල වෙනස්වීම් මනිනු ලැබේ. ඉහළ විකරිත සඵල කාලච්ඡේදයක් මගින් ඉහළ අවදානමක් පෙන්නුම් කෙරේ. එමනිසා මූල්‍ය වෙළෙඳපොලවල් තුළ ඇති වන සංවර්ධනයන්, ආයෝජන කළඹේ ඇති සංලක්ෂණයන් හා බැඳුම්කර ආයෝජන කළඹේ ඇති අවදානම් අභිරුචිය යන කරුණු සලකා බැලීමෙන් අනතුරුව මහ බැංකුව විසින් උචිත විකරිත සඵල කාලච්ඡේදයන් කලින් කලට සකස් කරනු ලැබේ. විදේශ වත්කම් ආයෝජන කළඹේ විකරිත සඵල කාලච්ඡේදය පහත ආකාර වේ.

**විකරිත සඵල කාලච්ඡේදය**

| ආයෝජන බණ්ඩය | විකරිත සඵල කාලච්ඡේදය | |
|---|---|---|
| | **2016** | **2015** |
| ප්‍රාග්ධන වෙළෙඳපොළ (ස්ථාවර ආදායම් සුරැකුම්පත්) | **2.26** | 3.28 |
| **RAMP** | **1.42** | - |

**(ii)** විකරිත සඵල කාලච්ඡේදය මගින් විශාල වශයෙන් වන මිල වෙනස්වීම් ගණනය නොවන නිසා, විදේශ සංචිත ආයෝජන කළඹේ පොළී අනුපාත අවදානම මැනීම සඳහා භාවිතා කරන තවත් මිනුමක් ලෙස උත්තලතාවය (convexity) දැක්විය හැකිය. උත්තලතාවය මගින් බැඳුම්කර මිල එලදා වක්‍රයේ වෙනස්වීම කාල පරිච්ඡේදයට අනුව සරල රේඛාවක් මගින් මනිනු ලබයි. මෙමගින් ස්ථාවර සුරැකුම්පත් මිල, පොළී අනුපාතයට දක්වන සංවේදීතාවය තවදුරටත් නියමිත අගයට ආසන්න කිරීමට ඉඩකඩ ලබාදේ. කාලච්ඡේදයේ වෙනස සඳහා එලදා අනුපාතයේ වෙනස උත්තලතාවයයි. එය විකරිත සඵල කාලච්ඡේදයේ පුරෝකතනය කළ දෝෂය මනිනු ලබයි. වෙනත් වචනයෙන් කිවහොත් මෙය එලදා අනුපාතය සම්බන්ධයෙන් සුරැකුම්පත්වල මිලයන්හි දෙවන ව්‍යුත්පන්නයයි.

**බණ්ඩනය කරන ලද ස්ථාවර ආදායම් සුරැකුම්පත් ආයෝජන කළඹේ උත්තලතාවය**

| බණ්ඩනය කරන ලද ස්ථාවර ආදායම් සුරැකුම්පත් කළඹ | විය හැකි පාඩුව (ඇ.ඩොලර් මිලියන) | |
|---|---|---|
| | **2016** | **2015** |
| වෙළෙඳ හා විකිණීම සඳහා ඇති ආයෝජන | **0.99** | 0.19 |
| **RAMP** | **0.04** | - |

**(iii) අවදානම් වටිනාකම (Value at Risk)**

සාමාන්‍ය වෙළෙඳපොළ තත්ත්වයන් යටතේ මූල්‍ය වෙළෙඳපොළ චලනයන් මගින් ආයෝජන කළඹක අයහපත් දිසාවට අවදානම තනි අගයකට සාරාංශ කිරීමක් අවදානම් වටිනාකම මගින් සිදුකරයි. එම නිසා අවදානම් වටිනාකම ඉලක්ක කාල සීමාව පුරාවට වන උපරිම අලාභය වන අතර එහි දී සත්‍ය අලාභය ඉහළ වීමේ සම්භාවිතාව පහළ හා කලින් සඳහන් මට්ටමේ විය හැක. අවදානම් වටිනාකම මගින්, අවදානම සහ තත්ත්වය හරහා සමාහාරය කළ හැකි මුදලින් ප්‍රකාශ කරනු ලබන සංඛ්‍යාවක් ලබා දේ.

99% විශ්‍රම්භ ප්‍රාන්තරයක් යටතේ දින 10 ක කාල සීමාවක් සඳහා අවදානම් වටිනාකම් අගය ගණනය සඳහා බැංකුව ඓතිහාසික අනුරූපන (simulation) ක්‍රමය යොදාගනී. අවදානම් වටිනාකම් තක්සේරු කිරීම සඳහා වූ ඓතිහාසික ක්‍රමය විටෙක ඓතිහාසික අනුරූපන ක්‍රමය ලෙස දක්වයි. උදාහරණයක් වශයෙන් ඓතිහාසික ක්‍රමය භාවිතා කරමින් 5% දෛනික අවදානම් වටිනාකම ගණනය කිරීමේදී පසුගිය දෛනික ප්‍රතිලාභය සමුච්චිත කොට ප්‍රතිලාභයන් ඉහලම අගයේ සිට පහලම අගය දක්වා ශ්‍රේණි ගතකොට 5% අවම ප්‍රතිලාභය හඳුනා ගනී. මෙම 5% අවම ප්‍රතිලාභයන් අතුරින් ඉහලම අගය එක්දින 5% වටිනාකම් අවදානම ලෙස හඳුනාගනී.

| බණ්ඩනය කරන ලද ස්ථාවර ආදායම් සුරැකුම්පත් කළඹ | අවදානම් වටිනාකම (ඇ.එ. ජ.ඩොලර්.මිලියන) | |
|---|---|---|
| | **2016** | **2015** |
| වෙළෙඳ හා විකිණීම සඳහා ඇති ආයෝජන | **36.02** | 69.82 |
| **RAMP** | **0.65** | - |

**(iv) වෙළෙඳ හා විවෘත තත්ත්වයන් (Open Positions) හි සීමා**

ගණුදෙනු අධිකාරිය වශයෙන් බැංකුව විසින් අන්තර් දින කටයුතු සඳහා නිශ්චිත ගණුදෙනුකරු සීමා (Specific Dealer Limit) ද එක්දින තත්ත්ව සීමා (Overnight Position Limit) තනිපුද්ගල ගණුදෙනුකරුවන් සඳහා ද පනවනු ලබයි.

විදේශීය සංචිත කළමනාකරණ කමිටුවට අඛණ්ඩ ව වාර්තා කිරීම පිණිස පොළී අනුපාතික අවධානම, සංචිත කළමනාකරණය හා උපදේශක වැඩසටහනෙහි ආයෝජනවලට අදාළ ව මනිනු ලැබේ.

**(ආ) දේශීය මුදල් පොළී අනුපාත සංවේදීතාවය**

ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය තත්ව ප්‍රකාශයේ දක්වා ඇති දේශීය භාණ්ඩාගාර බිල්පත් කළඹ, ශ්‍රී ලංකා රජයට ලබාදුන් ණය ප්‍රමාණය නියෝජනය කරන නිසා එය ක්‍රමක්ෂය අගයට වාර්තා කරනු ලබයි. බැංකුව පොළී ආදායම ඉපැයීම අරමුණු කර නොගෙන භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම සිදු කරන හෙයින් භාණ්ඩාගාර බිල්පත් කළඹ, ආයෝජන කළඹක් ලෙස නොසැලකේ. බැංකුවේ මූලික අරමුණුවලින් එකක් වන, ආර්ථික හා මිල ස්ථායිතාවය රැකීම සම්බන්ධ මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දේශීය වෙළෙඳපොළට ද්‍රවශීලතාවය විදීමට හෝ දේශීය වෙළෙඳපොළින් ද්‍රවශීලතාවය උකහා ගැනීමට බැංකුව භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම හෝ විකිණීම සිදු කරනු ලබයි. එහෙයින් බැංකු ආයෝජන කළඹෙහි භාණ්ඩාගාර බිල්පත්වල ප්‍රමාණය, එහි මූල්‍ය ප්‍රතිපත්තිය විසින් තීරණය කරනු ලැබේ. ඊට අමතරව, රුපියල් වෙළෙඳපොළේ මූලික පොළී අනුපාත එනම්, ප්‍රතිමිලදී ගැනීමේ අනුපාතය හා ප්‍රතිවිකුණුම් අනුපාත, මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා බැංකුව විසින් තීරණය කරනු ලබයි. වැඩිදුරටත්, රුපියල් ද්‍රවශීලතාවය විදීම් හෝ වෙළෙඳපොළින් රුපියල් ද්‍රවශීලතාවය උකහා ගැනීම් සඳහා වූ බැංකුවේ ක්‍රියාමාර්ග පොදු රුපියල් වෙළෙඳපොළේ පොළී අනුපාතයන් කෙරෙහි බලපානු ලබයි. ඒ අනුව භාණ්ඩාගාර බිල්පත් කළඹ මගින් උද්ගත වන පොළී ආදායමේ වෙනස්වීම් කෙරෙහි ආයෝජන තීරණවලට වඩා බැංකුවෙහි භාණ්ඩාගාර බිල්පත් කළඹෙහි ප්‍රමාණය මෙන් ම මූලික වශයෙන් බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග බලපානු ලබයි. එම නිසා බැංකුව දේශීය මූල්‍ය වත්කම්වල පොළියේ වන සංවේදීතාවය ගැන නොසලකනු ලැබේ.

**(ඇ) වත්කම් සහ වගකීම් කල් පිරීම හෝ ප්‍රතිමිල කිරීම පහත සඳහන් කාලච්ඡේදවලදී සිදුවේ.**

| විදේශ මුදල් පොළී අනුපාත සංවේදීතා අන්තරයඃ | හරිත සාමාන්‍ය පොළී අනුපාතය | 2016 එකතුව | හය මසක් හෝ අඩු | මාස 6 සිට 12 දක්වා | වර්ෂ 1 සිට 2 දක්වා | වර්ෂ 2 සිට 5 දක්වා | වර්ෂ 5 ට වැඩි |
|---|---|---|---|---|---|---|---|
| | % | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| **පොළී සංවේදී විදේශීය මූල්‍ය වත්කම්** | | | | | | | |
| මුදල් හා මුදල් සමානයන් | 0.6352 | **423,783,737** | 423,783,737 | - | - | - | - |
| ලාභ/අලාභ මත සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත් හා අලෙවි කල හැකි සුරැකුම්පත් | 1.1792 | **378,427,237** | 82,598,844 | 37,282,832 | 100,641,826 | 117,752,141 | 40,151,594 |
| ජා. මූ. අ. සම්බන්ධ වත්කම් | 0.0228 | **9,940,219** | 9,940,219 | - | - | - | - |
| **මුළු පොළී සංවේදී විදේශීය මූල්‍ය වත්කම්** | | **812,151,193** | 516,322,800 | 37,282,832 | 100,641,826 | 117,752,141 | 40,151,594 |
| **පොළී සංවේදී නොවන විදේශීය මූල්‍ය වත්කම්** | | | | | | | |
| ජා.මූ.අ. සම්බන්ධ වත්කම් | | **107,068,121** | - | - | - | 145,906 | 106,922,215 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | | **198,880** | 198,880 | - | - | - | - |
| අනෙකුත් ලැබිය යුතු දෑ | | **6,175,049** | 6,175,049 | - | - | - | - |
| ලාභ/අලාභ මත සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත් | | **13,396,168** | 13,396,168 | - | - | - | - |
| **මුළු පොළී සංවේදි නොවන විදේශීය මූල්‍ය වත්කම්** | | **126,838,218** | 19,770,097 | - | - | 145,906 | 106,922,215 |
| **මුළු විදේශීය මූල්‍ය වත්කම්** | | **938,989,411** | 536,092,897 | 37,282,832 | 100,641,826 | 117,898,047 | 147,073,809 |
| **පොළී සංවේදී විදේශීය මූල්‍ය වගකීම්** | | | | | | | |
| ජා.මූ.අ. | 0.2440 | **82,976,654** | 27,750,312 | 6,937,578 | - | 18,108,285 | 30,180,479 |
| ආසියානු නිශ්කාෂණ සංගමය | 0.5100 | **79,863,615** | 79,863,615 | - | - | - | - |
| ඉන්දියානු මහ බැංකුව සමග විනිමය හුවමාරු | 2.9973 | **59,920,000** | 59,920,000 | - | - | - | - |
| **මුළු පොළී සංවේදී විදේශීය මූල්‍ය වගකීම්** | | **222,760,269** | 167,533,927 | 6,937,578 | - | 18,108,285 | 30,180,479 |
| **පොළී සංවේදී නොවන විදේශීය මූල්‍ය වගකීම්** | | | | | | | |
| බැංකු හා මූල්‍ය ආයතන | | **45,566,681** | 45,566,681 | - | - | - | - |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | | **14,573,675** | 5,088,148 | 3,564,938 | 3,931,574 | 1,989,015 | - |
| ජා.මූ.අ. | | **186,563,942** | - | - | - | - | 186,563,942 |
| විදේශීය මුදලින් ඇති වාණිජ බැංකුවල ප්‍රාග්ධනය | | **1,169,177** | - | - | - | - | 1,169,177 |
| අනෙකුත් විදේශ වගකීම | | **35,160,855** | 35,160,855 | - | - | - | - |
| **මුළු පොළී සංවේදී නොවන විදේශීය මූල්‍ය වගකීම්** | | **283,034,330** | 85,815,684 | 3,564,938 | 3,931,574 | 1,989,015 | 187,733,119 |
| **මුළු විදේශීය මූල්‍ය වගකීම්** | | **505,794,599** | 253,349,611 | 10,502,516 | 3,931,574 | 20,097,300 | 217,913,598 |
| **විදේශීය මුදල් පොළී අනුපාත සංවේදීතා අන්තරය** | | **589,390,924** | 348,788,873 | 30,345,254 | 100,641,826 | 99,643,856 | 9,971,115 |

| දේශීය මුදල් පොළී අනුපාත සංවේදීතා අන්තරයඃ | හරිත සාමාන්‍ය පොළී අනුපාතය | 2016 එකතුව | හය මසක් හෝ අඩු | මාස 6 සිට 12 දක්වා | වර්ෂ 1 සිට 2 දක්වා | වර්ෂ 2 සිට 5 දක්වා | වර්ෂ 5 ට වැඩි |
|---|---|---|---|---|---|---|---|
| **පොළී සංවේදී දේශීය මූල්‍ය වත්කම්** | % | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | 9.1639 | **320,605,082** | 233,255,698 | 87,349,384 | - | - | - |
| භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර ප්‍රතිමිළදී ගැනීම | 8.5000 | **30,821,388** | 30,821,388 | - | - | - | - |
| බැංකුවලට දෙන ලද ණය | 8.4016 | **484,043** | 182,396 | 107,091 | 125,390 | 61,511 | 7,655 |
| අනිකුත් වත්කම් - සේවක ණය | 3.5355 | **5,603,510** | 92,230 | 92,417 | 192,376 | 621,059 | 4,605,428 |
| - අනෙකුත් | 10.0070 | **5,081,970** | 653,033 | 179,925 | 818,650 | 2,066,410 | 1,363,952 |
| **මුළු පොළී සංවේදී දේශීය මූල්‍ය වත්කම්** | | **362,595,993** | 265,004,745 | 87,728,817 | 1,136,416 | 2,748,980 | 5,977,035 |

| දේශීය මුදල් පොළී අනුපාත සංවේදීතා අන්තරය: | හරිත සාමාන්‍ය පොළී අනුපාතය | 2016 එකතුව | හය මසක් හෝ අඩු | මාස 6 සිට 12 දක්වා | වර්ෂ 1 සිට 2 දක්වා | වර්ෂ 2 සිට 5 දක්වා | වර්ෂ 5 ට වැඩි |
|---|---|---|---|---|---|---|---|
| | % | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| **පොළී සංවේදී නොවන දේශීය මූල්‍ය වත්කම්** | | | | | | | |
| රජයට දෙන ලද කාලීන අත්තිකාරම් | | **83,306,771** | 83,306,771 | - | - | - | - |
| අනෙකුත් වත්කම් | | **1,637,116** | 1,637,116 | - | - | - | - |
| හිමිකරු ප්‍රාග්ධන ආයෝජන - විකිණීමට ඇති | | **41,095** | - | - | - | - | 41,095 |
| **මුළු පොළී සංවේදී නොවන දේශීය මූල්‍ය වත්කම්** | | **84,984,982** | 84,943,887 | - | - | - | 41,095 |
| **මුළු දේශීය මූල්‍ය වත්කම්** | | **447,580,975** | 349,948,632 | 87,728,817 | 1,136,416 | 2,748,980 | 6,018,130 |
| **පොළී සංවේදී දේශීය මූල්‍ය වගකීම්** | | | | | | | |
| ප්‍රතිමිලදී ගැනුම් ගිවිසුම් යටතේ විකුණන ලද සුරැකුම්පත් | 7.4282 | **21,383,724** | 21,383,724 | - | - | - | - |
| නිත්‍ය තැන්පතු පහසුකම | 7.0000 | **48,670,712** | 48,670,712 | - | - | - | - |
| **මුළු පොළී සංවේදී දේශීය මූල්‍ය වගකීම්** | | **70,054,436** | 70,054,436 | - | - | - | - |
| **පොළී සංවේදී නොවන දේශීය මූල්‍ය වගකීම්** | | | | | | | |
| බැංකු සහ මූල්‍ය ආයතන විසින් තැන්පතු | | **303,251,290** | 303,251,290 | - | - | - | - |
| රජය සහ රජයේ ආයතන විසින් තැන්පතු | | **450,884** | 450,884 | - | - | - | - |
| සේවක ප්‍රතිලාභ සැලසුම්වල ශේෂයන් | | **51,744** | 51,744 | - | - | - | - |
| සංසරණයේ පවතින මුදල් | | **552,777,865** | 552,777,865 | - | - | - | - |
| අනිකුත් ගෙවිය යුතු දෑ | | **8,563,548** | 8,563,548 | - | - | - | - |
| **මුළු පොළී සංවේදී නොවන දේශීය මූල්‍ය වගකීම්** | | **865,095,331** | 865,095,331 | - | - | - | - |
| **මුළු දේශීය මූල්‍ය වගකීම්** | | **935,149,767** | 935,149,767 | - | - | - | - |
| **දේශීය මුදල් පොළී අනුපාත සංවේදිතා අන්තරය** | | **292,541,557** | 194,950,309 | 87,728,817 | 1,136,416 | 2,748,980 | 5,977,035 |

2015 දෙසැම්බර් 31 දිනට සංසංදනාත්මක සංඛ්‍යා පහත පරිදි වේ.

| විදේශ මුදල් පොළී අනුපාත සංවේදීතා අන්තරය: | හරිත සාමාන්‍ය පොළී අනුපාතය | 2015 එකතුව | හය මසක් හෝ අඩු | මාස 6 සිට 12 දක්වා | වර්ෂ 1 සිට 2 දක්වා | වර්ෂ 2 සිට 5 දක්වා | වර්ෂ 5 ට වැඩි |
|---|---|---|---|---|---|---|---|
| | % | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| **පොළී සංවේදී විදේශීය මූල්‍ය වත්කම්** | | | | | | | |
| මුදල් හා මුදල් සමානයන් | 0.31 | 557,474,685 | 557,474,685 | - | - | - | - |
| ලාභ/අලාභ මත සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත් හා අලෙවිකල හැකි සුරැකුම්පත් | 1.54 | 376,041,221 | 51,900,181 | 50,000,041 | 51,436,286 | 138,190,639 | 84,514,074 |
| ජා.මූ.අ. සම්බන්ධ වත්කම් | 0.04 | 10,523,672 | 10,523,672 | - | - | - | - |
| **මුළු පොළී සංවේදී විදේශීය මූල්‍ය වත්කම්** | | 944,039,578 | 619,898,538 | 50,000,041 | 51,436,286 | 138,190,639 | 84,514,074 |
| **පොළී සංවේදී නොවන විදේශීය මූල්‍ය වත්කම්** | | | | | | | |
| ජා.මූ.අ. සම්බන්ධ වත්කම් | | 73,112,678 | - | - | - | 138,622 | 72,974,056 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | | 4,145 | 2,259 | - | 1,886 | - | - |
| අනෙකුත් ලැබිය යුතු දෑ | | 5,075 | 5,075 | - | - | - | - |
| ලාභ/අලාභ මත සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත් | | 11,792,926 | 11,792,926 | - | - | - | - |
| **මුළු පොළී සංවේදි නොවන විදේශීය මූල්‍ය වත්කම්** | | 84,914,824 | 11,800,260 | - | 1,886 | 138,622 | 72,974,056 |
| **මුළු විදේශීය මූල්‍ය වත්කම්** | | 1,028,954,402 | 631,698,798 | 50,000,041 | 51,438,172 | 138,329,261 | 157,488,130 |
| **පොළී සංවේදී විදේශීය මූල්‍ය වගකීම්** | | | | | | | |
| ජා.මූ.අ. | 0.00 | 99,720,675 | 37,825,083 | 27,509,152 | 34,386,440 | - | - |
| ආසියානු නිශ්කාෂණ සංගමය | 0.23 | 68,887,459 | 68,887,459 | - | - | - | - |
| ඉන්දියානු මහ බැංකුව සමඟ විනිමය හුවමාරුව | 2.45 | 158,766,606 | 158,766,606 | - | - | - | - |
| **මුළු පොළී සංවේදී විදේශීය මූල්‍ය වගකීම්** | | 327,374,740 | 265,479,148 | 27,509,152 | 34,386,440 | - | - |

| විදේශ මුදල් පොළී අනුපාත සංවේදීතා අන්තරයඃ | හරිත සාමාන්‍ය පොළී අනුපාතය | 2015 එකතුව | හය මසක් හෝ අඩු | මාස 6 සිට 12 දක්වා | වර්ෂ 1 සිට 2 දක්වා | වර්ෂ 2 සිට 5 දක්වා | වර්ෂ 5 ට වැඩි |
|---|---|---|---|---|---|---|---|
| | % | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| **පොළී සංවේදී නොවන විදේශීය මූල්‍ය වගකීම්** | | | | | | | |
| බැංකු සහ මූල්‍ය ආයතන | | 11,750,164 | 11,750,164 | - | - | - | - |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | | 24,280,307 | 9,568,328 | 6,609,542 | 1,610,234 | 5,831,868 | 660,335 |
| ජා.මූ.අ. | | 151,923,669 | - | - | - | - | 151,923,669 |
| විදේශීය මුදලින් ඇති වාණිජ බැංකුවල ප්‍රාග්ධනය | | 1,124,395 | - | - | - | - | 1,124,395 |
| අනෙකුත් විදේශීය වගකීම් | | 58,331,218 | 58,331,218 | - | - | - | - |
| **මුළු පොළී සංවේදී නොවන විදේශීය මූල්‍ය වගකීම්** | | 247,409,753 | 79,649,710 | 6,609,542 | 1,610,234 | 5,831,868 | 153,708,399 |
| **මුළු විදේශීය මූල්‍ය වගකීම්** | | 574,784,493 | 345,128,858 | 34,118,694 | 35,996,674 | 5,831,868 | 153,708,399 |
| **විදේශීය මුදල් පොළී අනුපාත සංවේදීතා අන්තරය** | | 616,664,838 | 354,419,390 | 22,490,889 | 17,049,846 | 138,190,639 | 84,514,074 |

| දේශීය මුදල් පොළී අනුපාත සංවේදීතා අන්තරයඃ | හරිත සාමාන්‍ය පොළී අනුපාතය | 2015 එකතුව | හය මසක් හෝ අඩු | මාස 6 සිට 12 දක්වා | වර්ෂ 1 සිට 2 දක්වා | වර්ෂ 2 සිට 5 දක්වා | වර්ෂ 5 ට වැඩි |
|---|---|---|---|---|---|---|---|
| | % | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| **පොළී සංවේදී දේශීය මූල්‍ය වත්කම්** | | | | | | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | 6.5802 | 102,731,967 | 58,490,040 | 44,241,927 | - | - | - |
| භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර ප්‍රතිමිළදී ගැනීම | 7.5000 | 135,028 | 135,028 | - | - | - | - |
| බැංකුවලට දෙන ලද ණය | 8.3863 | 886,357 | 215,559 | 190,756 | 285,486 | 183,562 | 10,994 |
| අනිකුත් වත්කම් - සේවක ණය | 3.6405 | 5,133,899 | 39,486 | 40,127 | 80,721 | 260,253 | 4,713,312 |
| - අනෙකුත් | 8.4145 | 4,313,154 | 760,877 | 338,215 | 360,205 | 2,327,611 | 526,246 |
| **මුළු පොළී සංවේදී දේශීය මූල්‍ය වත්කම්** | | 113,200,405 | 59,640,990 | 44,811,025 | 726,412 | 2,771,426 | 5,250,552 |
| **පොළී සංවේදී නොවන දේශීය මූල්‍ය වත්කම්** | | | | | | | |
| රජයට දෙන ලද කාලීන අත්තිකාරම් | | 151,131,671 | 151,131,671 | - | - | - | - |
| අනෙකුත් වත්කම් | | 1,717,370 | 1,717,370 | - | - | - | - |
| හිමිකරු ප්‍රාග්ධන අයෝජන - විකිණීමට ඇති | | 41,095 | - | - | - | - | 41,095 |
| **මුළු පොළී සංවේදී නොවන දේශීය මූල්‍ය වත්කම්** | | 152,890,136 | 152,849,041 | - | - | - | 41,095 |
| **මුළු දේශීය මූල්‍ය වත්කම්** | | 266,090,541 | 212,490,031 | 44,811,025 | 726,412 | 2,771,426 | 5,291,647 |
| **පොළී සංවේදී දේශීය මූල්‍ය වගකීම්** | | | | | | | |
| ප්‍රතිමිලදී ගැනුම් ගිවිසුම් යටතේ විකුණන ලද සුරැකුම්පත් | 6.4233 | 23,650,000 | 23,650,000 | - | - | - | - |
| නිත්‍ය තැන්පතු පහසුකම් | 6.0000 | 81,815,000 | 81,815,000 | - | - | - | - |
| **මුළු පොළී සංවේදී දේශීය මූල්‍ය වගකීම්** | | 105,465,000 | 105,465,000 | - | - | - | - |
| **පොළී සංවේදී නොවන දේශීය මූල්‍ය වගකීම්** | | | | | | | |
| බැංකු සහ මූල්‍ය ආයතන විසින් තැන්පතු | | 181,726,732 | 181,726,732 | - | - | - | - |
| රජය සහ රජයේ ආයතන විසින් තැන්පතු | | 428,142 | 428,142 | - | - | - | - |
| සේවක ප්‍රතිලාභ සැලසුම්වල ශේෂයන් | | 7,212 | 7,212 | - | - | - | - |
| සංසරණයෙහි පවතින මුදල් | | 491,699,948 | 491,699,948 | - | - | - | - |
| අනිකුත් ගෙවිය යුතු දෑ | | 6,850,998 | 6,850,998 | - | - | - | - |
| **මුළු පොළී සංවේදී නොවන දේශීය මූල්‍ය වගකීම්** | | 680,713,032 | 680,713,032 | - | - | - | - |
| **මුළු දේශීය මූල්‍ය වගකීම්** | | 786,178,032 | 786,178,032 | - | - | - | - |
| **දේශීය මුදල් පොළී අනුපාත සංවේදිතා අන්තරය** | | 7,735,405 | (45,824,010) | 44,811,025 | 726,412 | 2,771,426 | 5,250,552 |

### 43.3 විදේශීය මුදල් අවදානම

බැංකුවේ විදේශීය සංචිත කළමනාකරණ කාර්යය යටතේ දරන්නා වූ විදේශීය වත්කම් තුළින් බැංකුවෙහි විදේශ මුදල් කටයුතු නිරූපණය වේ. විදේශ විනිමය වෙළෙඳපොළේ වෙනස්වීම හේතුවෙන් බැංකුව, විනිමය අවදානමට විවෘත වේ. මුදල් මණ්ඩලය සහ විදේශ සංචිත කළමනාකරණ කමිටුව විසින් බැංකුවේ ජාත්‍යන්තර සංචිතයෙහි විවිධ මුදල් වර්ගවලින් දැරිය යුතු ප්‍රතිශත ප්‍රමාණයක් නියම කර තිබේ. මුදල් වෙන්කිරීම පිළිබඳව තීරණය කිරීමේ දී රාජ්‍ය ණය ආපසු ගෙවීමේ අවශ්‍යතාවයන් සැලකිල්ලට ගනු ලැබේ. එබැවින් බැංකුව විසින් ප්‍රධාන මුදල් වර්ග බොහොමයක්, එනම් ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර්, ස්ටර්ලිං පවුම්, ජපන් යෙන්, යුරෝ, ඕස්ට්‍රේලියන් ඩොලර් හා නවසීලන්ත ඩොලර් මගින් දරනු ලබයි. විදේශීය මුදල් තත්ත්වය මත පනවා ඇති සීමාවන්ට අනුකූලවීම සුපරීක්ෂණයට භාජනය වේ.

### විදේශ මුදල් සඳහා ශුද්ධ අවදානම් නිරාවරණය

2016 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන මුදල්වලට ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ අවදානම් නිරාවරණය පහත සඳහන් විය.

| | මුදල් වර්ගය | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2016 දෙසැම්බර් 31 දිනට | ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් | යුරෝ | ජපන් යෙන් | ස්ටර්ලිං පවුම් | විගැහි | ඕස්ට්‍රේලියානු ඩොලර් | කැනේඩියානු ඩොලර් | නවසීලන්ත ඩොලර් | අනිකුත් මුදල් | සියළුම මුදල් වර්ගවල එකතුව |
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| **විදේශීය මූල්‍ය වත්කම්** | | | | | | | | | | |
| මුදල් හා මුදල් සමානයන් | 60,672,511 | (52,620,544) | (44,196,304) | 92,331,449 | - | 134,790,117 | (9,651,058) | (5,876,338) | 248,333,904 | 423,783,737 |
| ලාභ/අලාභ මත සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත් හා අලෙවි කළ හැකි සුරැකුම්පත් | 243,152,847 | 44,267,349 | 21,813,382 | 11,527,275 | - | 21,471,379 | 9,797,465 | 9,687,691 | 30,106,017 | 391,823,405 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | - | - | - | - | - | - | - | - | 198,880 | 198,880 |
| ජා.මූ.අ. සම්බන්ධ වත්කම් | - | - | - | - | 117,008,340 | - | - | - | - | 117,008,340 |
| අනිකුත් ලැබිය යුතු දෑ | 6,053,745 | 120,772 | - | - | 532 | - | - | - | - | 6,175,049 |
| මුළු විදේශීය මූල්‍ය වත්කම් | 309,879,103 | (8,232,423) | (22,382,922) | 103,858,724 | 117,008,872 | 156,261,496 | 146,407 | 3,811,353 | 278,638,801 | 938,989,411 |
| සමානුපාතය | 33.00% | -0.88% | -2.38% | 11.06% | 12.46% | 16.64% | 0.02% | 0.41% | 29.67% | 100% |
| **විදේශීය මූල්‍ය බැරකම්** | | | | | | | | | | |
| බැංකු හා මූල්‍ය ආයතන | 45,566,531 | 10 | - | 139 | - | - | 1 | - | - | 45,566,681 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 11 | - | - | - | - | - | - | - | 14,573,664 | 14,573,675 |
| ආසියානු නිශ්කාෂණ සංගමය | 79,863,615 | - | - | - | - | - | - | - | - | 79,863,615 |
| ජා.මූ.අ. | - | - | - | - | 269,540,596 | - | - | - | - | 269,540,596 |
| අනෙකුත් | 95,804,614 | - | - | - | - | - | - | - | 445,418 | 96,250,032 |
| මුළු විදේශීය මූල්‍ය බැරකම් | 221,234,771 | 10 | - | 139 | 269,540,596 | - | 1 | - | 15,019,082 | 505,794,599 |
| සමානුපාතය | 43.74% | 0.00% | 0.00% | 0.00% | 53.29% | 0.00% | 0.00% | 0.00% | 2.97% | 100% |
| ශුද්ධ විදේශීය මුදල් නිරාවරණය | 88,644,332 | (8,232,433) | (22,382,922) | 103,858,585 | (152,531,724) | 156,261,496 | 146,406 | 3,811,353 | 263,619,719 | 433,194,812 |

වත්මන් මූල්‍ය වර්ෂයට අදාල වෙළෙඳ දිනයන් සහිත හා තක්සේරු දිනයන් මීලඟ මූල්‍ය වර්ෂයට අදාලව සිදුවීමට නියමිත විදේශ විනිමය ගණුදෙනු මුදල් හා මුදල් සමානයන් තුළ අඩංගු වේ. එම ගණුදෙනු පහත පරිදි වේ.

| 2016 දෙසැම්බර් 31 දිනට | ශ්‍රී ලංකා රුපියල් | එක්සත් ජනපද ඩොලර් | යුරෝ | ස්ටර්ලිං පවුම් | ජපන් යෙන් | ඕස්ට්‍රේලියානු ඩොලර් | ස්විඩන ක්‍රෝනය |
|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| මිලදී ගැනුම් | 399,872,823 | (15,716,215) | (985) | (62,622) | (4,876) | (6,352,618) | - |
| විකුණුම් | (26,858,576) | (377,765,524) | 5,375,438 | 19,321,868 | 4,876 | 30,444 | (960) |
| ඉදිරියෙහි වූ හුවමාරු ප්‍රතිගිණුම -ආසන්නම ගනුදෙනුව | (1,667) | - | - | - | - | - | - |
| ඉදිරි ප්‍රති ගිණුම | 2,158,595 | - | - | - | - | - | - |

2015 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන මුදල්වලට ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ අවදානම් නිරාවරණය පහත සඳහන් විය.

**මුදල් වර්ගය**

| 2015 දෙසැම්බර් 31 දිනට | ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් | යුරෝ | ජපන් යෙන් | ස්ටර්ලිං පවුම් | විගැහි | ඕස්ට්‍රේලියානු ඩොලර් | කැනේඩියානු ඩොලර් | නවසීලන්ත ඩොලර් | අනිකුත් මුදල් | සියළුම මුදල් වර්ගවල එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| **විදේශීය මූල්‍ය වත්කම්** | | | | | | | | | | |
| මුදල් හා මුදල් සමානයන් | 176,922,656 | (43,264,954) | (14,336,028) | 88,586,921 | - | 126,101,239 | (10,249,157) | (5,866,491) | 239,580,499 | 557,474,685 |
| ලාභ/අලාභ මත සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත් හා අලෙවි කළ හැකි සුරැකුම්පත් | 203,115,851 | 52,346,338 | 19,947,895 | 23,753,864 | - | 28,241,778 | 10,036,752 | 8,790,359 | 41,601,310 | 387,834,147 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 1,886 | - | 148 | - | - | - | - | - | 2,111 | 4,145 |
| ජා.මූ.අ. සම්බන්ධ වත්කම් | - | - | - | - | 83,636,350 | - | - | - | - | 83,636,350 |
| අනිකුත් ලැබිය යුතු දෑ | 2,374 | 2,357 | - | - | 344 | - | - | - | - | 5,075 |
| **මුළු විදේශීය මූල්‍ය වත්කම්** | 380,042,767 | 9,083,741 | 5,612,015 | 112,340,785 | 83,636,694 | 154,343,017 | (212,405) | 2,923,868 | 281,183,920 | 1,028,954,402 |
| සමානුපාතය | 36.93% | 0.88% | 0.55% | 10.92% | 8.13% | 15.00% | -0.02% | 0.28% | 27.33% | 100% |
| **විදේශීය මූල්‍ය බැරකම්** | | | | | | | | | | |
| බැංකු හා මූල්‍ය ආයතන | 12,046,056 | 376 | - | 1,766 | - | 43 | - | - | - | 12,048,241 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 249 | - | - | - | - | - | - | - | 24,280,059 | 24,280,308 |
| ආසියානු නිශ්කාෂණ සංගමය | 68,613,251 | 274,208 | - | - | - | - | - | - | - | 68,887,459 |
| ජා.මූ.අ. | - | - | - | - | 251,644,344 | - | - | - | - | 251,644,344 |
| අනෙකුත් | 209,792,285 | 7,483,464 | - | - | - | - | - | - | 648,393 | 217,924,142 |
| **මුළු විදේශීය මූල්‍ය බැරකම්** | 290,451,841 | 7,758,048 | - | 1,766 | 251,644,344 | 43 | - | - | 24,928,452 | 574,784,494 |
| සමානුපාතය | 50.53% | 1.35% | 0.00% | 0.00% | 43.78% | 0.00% | 0.00% | 0.00% | 4.27% | 100% |
| **ශුද්ධ විදේශීය මුදල් නිරාවරණය** | 89,590,926 | 1,325,693 | 5,612,015 | 112,339,019 | (168,007,650) | 154,342,974 | (212,405) | 2,923,868 | 256,255,469 | 454,169,908 |

වත්මන් මූල්‍ය වර්ෂයට අදාල වෙළෙඳ දිනයන් සහිත හා තක්සේරු දිනයන් මීලඟ මූල්‍ය වර්ෂයට අදාලව සිදුවීමට නියමිත විදේශ විනිමය ගණුදෙනු මුදල් හා මුදල් සමානයන් තුළ අඩංගු වේ. එම ගණුදෙනු පහත පරිදි වේ.

| 2015 දෙසැම්බර් 31 දිනට | ශ්‍රී ලංකා රුපියල් | ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් | යුරෝ | ස්ටර්ලිං පවුම් | ජපන් යෙන් | ඕස්ට්‍රේලියානු ඩොලර් |
|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| මිලදී ගැනුම් | 364,801,652 | 17,874,539 | (985) | (62,622) | 67,254 | (6,352,618) |
| විකුණුම් | (60,385,247) | (351,208,306) | 5,375,438 | 19,321,868 | (67,106) | 30,444 |
| ඉදිරියෙහි වූ හුවමාරු ප්‍රතිගිණුම - ආසන්නම ගනුදෙනුව | 7,732 | - | - | - | - | - |
| ඉදිරි ප්‍රති ගිණුම | 10,597,957 | - | - | - | - | - |
| | | | | | | - |

## 43.4 මූල්‍ය වත්කම් හා වගකීම් හි වට්ටම් නොකළ මුදල් ප්‍රවාහවල ගිවිසුම්ගත කල් පිරීම්

2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වත්කම් හා වගකීම්හි වට්ටම් නොකළ මුදල් ප්‍රවාහවල ගිවිසුම්ගත කල්පිරීම් පහත පරිදි වේ.

| | හය මසක් අඩු | මාස 6 සිට 12 දක්වා | වර්ෂ 1 සිට 2 දක්වා | වර්ෂ 2 සිට 5 දක්වා | වර්ෂ 5 ට වැඩි | එකතුව |
|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| 2016 දෙසැම්බර් 31 දිනට විදේශීය මූල්‍ය වත්කම් | | | | | | |
| මුදල් හා මුදල් සමානයන් | **423,783,737** | - | - | - | - | **423,783,737** |
| ලාභ/අලාභ මත සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත් | **18,588,564** | **5,033,982** | **12,151,636** | **8,087,248** | - | **43,861,430** |
| අලෙවි කළ හැකි සුරැකුම්පත් | **54,001,291** | **39,271,443** | **104,459,788** | **120,422,348** | **38,708,398** | **356,863,268** |
| ජා.මූ.අ. සම්බන්ධ වත්කම් | **9,940,219** | - | - | **145,906** | **106,922,214** | **117,008,339** |
| අනිකුත් ලැබිය යුතු දෑ | **6,175,049** | - | - | - | - | **6,175,049** |
| මුළු වට්ටම් නොකළ විදේශීය මූල්‍ය වත්කම් | **512,488,860** | **44,305,425** | **116,611,424** | **128,655,502** | **145,630,612** | **947,691,823** |
| දේශීය මුදල් මූල්‍ය වත්කම් | | | | | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | **267,791,962** | **94,425,980** | - | - | - | **362,217,942** |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| රජයට දෙන ලද කාලීන අත්තිකාරම් | **83,306,771** | **-** | **-** | **-** | **-** | **83,306,771** |
| බැංකු සඳහා දෙන ලද ණය | **194,137** | **114,307** | **132,090** | **64,456** | **8,108** | **513,098** |
| මූල්‍ය හා අනෙකුත් ආයතනයන්හි හිමිකරු ප්‍රාග්ධන ආයෝජන | **-** | **-** | **-** | **-** | **41,095** | **41,095** |
| අනෙකුත් වත්කම් | **16,201,304** | **645,307** | **1,684,900** | **4,588,533** | **6,697,731** | **29,817,775** |
| **මුළු වට්ටම් නොකළ දේශීය මූල්‍ය වත්කම්** | **367,494,174** | **95,185,594** | **1,816,990** | **4,652,989** | **6,746,934** | **475,896,681** |
| **මුළු වට්ටම් නොකළ මූල්‍ය වත්කම්** | **879,983,034** | **139,491,019** | **118,428,414** | **133,308,491** | **152,377,546** | **1,423,588,504** |
| **විදේශීය මූල්‍ය වගකීම්** | | | | | | |
| බැංකු සහ මූල්‍ය ආයතන | **44,456,357** | **418,671** | **793,905** | **2,337,833** | **3,461,514** | **51,468,280** |
| ආසියානු නිශ්කාශන සංගමය | **79,863,615** | **-** | **-** | **-** | **-** | **79,863,615** |
| ජා.මූ.අ. | **27,750,312** | **6,937,578** | **-** | **10,060,159** | **224,792,547** | **269,540,596** |
| අනෙකුත් | **95,125,637** | **-** | **-** | **-** | **1,124,395** | **96,250,032** |
| **මුළු වට්ටම් නොකළ විදේශීය මූල්‍ය වගකීම්** | **247,195,921** | **7,356,249** | **793,905** | **12,397,992** | **229,378,456** | **497,122,523** |
| **දේශීය මුදල් මූල්‍ය වගකීම්** | | | | | | |
| බැංකු හා මූල්‍ය ආයතන විසින් තැන්පතු | **303,251,290** | **-** | **-** | **-** | **-** | **303,251,290** |
| රජයේ හා රජයේ ආයතන විසින් තැන්පතු | **450,884** | **-** | **-** | **-** | **-** | **450,884** |
| ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කළ සුරැකුම්පත් | **70,081,240** | **-** | **-** | **-** | **-** | **70,081,240** |
| සේවක ප්‍රතිලාභ සැලසුම්වල ශේෂයන් | **51,744** | **-** | **-** | **-** | **-** | **51,744** |
| සංසරණයෙහි පවත්නා මුදල් | **552,777,865** | **-** | **-** | **-** | **-** | **552,777,865** |
| අනෙකුත් ගෙවිය යුතු දෑ | **8,563,548** | **-** | **-** | **-** | **-** | **8,563,548** |
| **මුළු වට්ටම් නොකළ දේශීය මූල්‍ය වගකීම්** | **935,176,571** | **-** | **-** | **-** | **-** | **935,176,571** |
| **මුළු වට්ටම් නොකළ මූල්‍ය වගකීම්** | **1,182,372,492** | **7,356,249** | **793,905** | **12,397,992** | **229,378,456** | **1,432,299,094** |
| **ශුද්ධ වට්ටම් නොකළ මූල්‍ය වත්කම් / (වගකීම්)** | **(302,389,458)** | **132,134,770** | **117,634,509** | **120,910,499** | **(77,000,910)** | **(8,710,590)** |

| | හය මසක් අඩු<br>රු. 000 | මාස 6 සිට 12 දක්වා<br>රු. 000 |
|---|---|---|
| **2016 දෙසැම්බර් 31 දිනට** | | |
| ව්‍යුත්පන්න මූල්‍ය වත්කම් | 279,092,132 | 93,922,515 |
| ව්‍යුත්පන්න මූල්‍ය වගකීම් | 279,934,575 | 92,340,465 |

**විදේශීය මුදල් පරිවර්තනය**

විදේශීය මූල්‍ය වත්කම් හා වගකීම්වලට සම්බන්ධ සියලුම අනාගත මූල්‍ය ප්‍රවාහ වාර්තාගත කරන මුදල් ඒකකයට පරිවර්තනය කර ඇත්තේ වාර්තාකරණ දිනයට අදාළ විනිමය අනුපාතිකයටයි.

2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වත්කම් හා වගකීම් හි වට්ටම් නොකළ මුදල් ප්‍රවාහවල ගිවිසුම්ගත කල් පිරීම් පහත පරිදි වේ.

| | හය මසක් අඩු | මාස 6 සිට 12 දක්වා | වර්ෂ 1 සිට 2 දක්වා | වර්ෂ 2 සිට 5 දක්වා | වර්ෂ 5 ට වැඩි | එකතුව |
|---|---|---|---|---|---|---|
| | **රු. 000** | **රු. 000** | **රු. 000** | **රු. 000** | **රු. 000** | **රු. 000** |
| **2015 දෙසැම්බර් 31 දිනට** | | | | | | |
| **විදේශීය මූල්‍ය වත්කම්** | | | | | | |
| මුදල් හා මුදල් සමානයන් | 557,474,685 | - | - | - | - | 557,474,685 |
| ලාභ/අලාභ මත සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත් | 43,171,272 | - | - | - | - | 43,171,272 |
| අලෙවි කළ හැකි සුරැකුම්පත් | 29,321,065 | 52,530,133 | 56,153,333 | 145,590,515 | 85,886,120 | 369,481,166 |
| ජා.මූ.අ. සම්බන්ධ වත්කම් | 10,523,672 | - | - | 138,622 | 72,974,056 | 83,636,350 |
| අනිකුත් ලැබිය යුතු දෑ | 5,075 | - | - | - | - | 5,075 |
| **මුළු වට්ටම් නොකළ විදේශීය මූල්‍ය වත්කම්** | 640,495,769 | 52,530,133 | 56,153,333 | 145,729,137 | 158,860,176 | 1,053,768,548 |
| **දේශීය මුදල් මූල්‍ය වත්කම්** | | | | | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | 104,889,169 | - | - | - | - | 104,889,169 |
| රජයට දෙන ලද කාලීන අත්තිකාරම් | 151,131,671 | - | - | - | - | 151,131,671 |
| බැංකු සඳහා දෙන ලද ණය | 237,733 | 207,777 | 304,647 | 194,165 | 11,852 | 956,174 |
| මූල්‍ය හා අනෙකුත් ආයතනයන්හි හිමිකරු ප්‍රාග්ධන ආයෝජන | - | - | - | - | 41,095 | 41,095 |
| අනෙකුත් වත්කම් | 2,675,835 | 524,731 | 709,055 | 3,125,543 | 5,270,055 | 12,305,219 |
| **මුළු වට්ටම් නොකළ දේශීය මූල්‍ය වත්කම්** | 258,934,408 | 732,508 | 1,013,702 | 3,319,708 | 5,323,002 | 269,323,328 |
| **මුළු වට්ටම් නොකළ මූල්‍ය වත්කම්** | 899,430,177 | 53,262,641 | 57,167,035 | 149,048,845 | 164,183,178 | 1,323,091,876 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **විදේශීය මූල්‍ය වගකීම්** | | | | | | |
| බැංකු සහ මූල්‍ය ආයතන | 13,012,853 | 294,833 | 186,752 | 121,023 | 413,161 | 14,028,622 |
| ආසියානු නිශ්කාශන සංගමය | 68,887,459 | - | - | - | - | 68,887,459 |
| ජා.මූ.අ. | 44,702,372 | 20,631,864 | 34,386,440 | - | 151,923,668 | 251,644,344 |
| අනෙකුත් | 216,799,748 | - | - | - | 1,124,394 | 217,924,142 |
| **මුළු වට්ටම් නොකළ විදේශීය මූල්‍ය වගකීම්** | 343,402,432 | 20,926,697 | 34,573,192 | 121,023 | 153,461,223 | 552,484,567 |
| **දේශීය මුදල් මූල්‍ය වගකීම්** | | | | | | |
| බැංකු හා මූල්‍ය ආයතන විසින් තැන්පතු | 181,726,732 | - | - | - | - | 181,726,732 |
| රජයේ හා රජයේ ආයතන විසින් තැන්පතු | 428,142 | - | - | - | - | 428,142 |
| ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කළ සුරැකුම්පත් | 105,607,860 | - | - | - | - | 105,607,860 |
| සේවක ප්‍රතිලාභ සැලසුම්වල ශේෂයන් | 7,212 | - | - | - | - | 7,212 |
| සංසරණයේ පවත්නා මුදල් | 491,699,948 | - | - | - | - | 491,699,948 |
| අනෙකුත් ගෙවිය යුතු දෑ | 6,910,166 | - | - | - | - | 6,910,166 |
| **මුළු වට්ටම් නොකළ දේශීය මූල්‍ය වගකීම්** | 786,380,060 | - | - | - | - | 786,380,060 |
| **මුළු වට්ටම් නොකළ මූල්‍ය වගකීම්** | 1,129,782,492 | 20,926,697 | 34,573,192 | 121,023 | 153,461,223 | 1,338,864,627 |
| **ශුද්ධ වට්ටම් නොකළ මූල්‍ය වත්කම්/(වගකීම්)** | (230,352,315) | 32,335,944 | 22,593,843 | 148,927,822 | 10,721,955 | (15,772,751) |

| | හය මසක් අඩු රු. 000 | මාස 6 සිට 12 දක්වා රු. 000 |
|---|---|---|
| **2015 දෙසැම්බර් 31 දිනට** | | |
| ව්‍යුත්පන්න මූල්‍ය වත්කම් | 181,916,705 | 122,504,814 |
| ව්‍යුත්පන්න මූල්‍ය වගකීම් | 189,611,926 | 122,520,743 |

### 43.5 ද්‍රවශීලතා අවදානම

මූල්‍ය ලියවිලි ආශ්‍රිත බැදීම් සපුරාලීමට අවශ්‍යවන අරමුදල් කෙටි දැනුම්දීමක දී සපයා ගැනීමේ දී ඒකකයක් විසින් මුහුණපානු ලබන දුෂ්කරතා ද්‍රවශීලතා අවදානම වේ. ඒකකයකට තම මූල්‍ය වත්කම් ඉක්මණින්, සාධාරණ අගයට වඩා ඉතා අඩු මිලකට විකිණීමට සිදුවීම ද ද්‍රවශීලතා අවදානමකි.

(අ) බැංකුවේ විදේශීය මුදල් වත්කම් සංයුතිය නිශ්චය කිරීමේදී ද ප්‍රධාන වශයෙන් සැලකිලිමත් වන්නේ ද්‍රවශීලතාවය සම්බන්ධයෙනි. අවශ්‍ය අවස්ථාවන්හි දී මැදිහත්වීමේ කාර්යයන් ද රාජ්‍ය ණය සහ ජා.මූ.අ. ණය ආපසු ගෙවීම වැනි වූ බැඳීම් බේරුම් කිරීම සඳහා ද විදේශීය සංචිත ඇවර කිරීමේ විභව අවශ්‍යතාවය මෙයින් ගම්‍ය වේ. අරමුදල්වලට ඉක්මණින් ප්‍රවේශවීම තහවුරු කර ගැනීම සඳහා බැංකුව පහත සඳහන් මිනුම් යොදා ගනී.

- රඳවාගෙන ඇති සුරැකුම්පත්වල ද්‍රවශීලතා ලක්ෂණයන් පදනම් කළ ද්‍රවශීලතා වත්කම් අනුපාත.
- එක් එක් මුදල් වර්ගයෙන් සහ එක් එක් ප්‍රතිපාර්ශ්වය සමග රඳවා ගත හැකි සංචිතවල උපරිම සංකලනය වන සීමාවන්.

(ආ) විශේෂයෙන් ම විවට වෙළෙඳ කටයුතු වැනි දේශීය මූල්‍ය ඒකකයන් භාවිතා කරමින් කරන කටයුතුවල දී වන ද්‍රවශීලතා අවදානම අඩු කිරීම සඳහා ඉතා ද්‍රවශීලී වෙළෙඳපොළ උපකරණ වන භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර සුරැකුමක් ලෙස භාවිතා කර ඇත. ඒ මඟින් බැංකු පද්ධතියේ දෛනික ද්‍රවශීලතා තත්ත්වය කළමණාකරණය කිරීම සඳහා, අරමුදල් යෙදවීම හා පාලනය කිරීමට භාණ්ඩාගාර බිල්පත් හා මහබැංකු සුරැකුම්පත් ප්‍රතිමිලදී ගැනීම්/විකිණීම් හා අමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මත ශ්‍රී ලංකා රුපියල් හුවමාරුකරණය යොදාගෙන ඇත.

### 44. වත්කම් හා බැරකම්හි පරිණත විශ්ලේෂණය

| 2016 දෙසැම්බර් 31 දිනට | මාස 12ට අඩු | මාස 12ට වැඩි | එකතුව |
|---|---|---|---|
| **වත්කම්** | රු.000 | රු.000 | රු.000 |
| මුදල් හා මුදල් සමානයන් | **423,783,737** | **-** | **423,783,737** |
| ලාභ/අලාභ මත සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත් | **9,948,121** | **33,330,634** | **43,278,755** |
| අලෙවි කල හැකි සුරැකුම්පත් | **88,536,415** | **260,008,235** | **348,544,650** |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | **198,880** | **-** | **198,880** |
| ජා.මූ.අ. සම්බන්ධ වත්කම් | **9,940,219** | **107,068,121** | **117,008,340** |
| අනෙකුත් ලැබිය යුතු දෑ - විදේශීය | **6,175,049** | **-** | **6,175,049** |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | **351,426,470** | **-** | **351,426,470** |
| රජයට දෙනු ලැබූ කාලීන අත්තිකාරම් | **83,306,771** | **-** | **83,306,771** |
| බැංකුවලට දෙනු ලැබූ ණය | **289,487** | **194,556** | **484,043** |
| අනෙකුත් වත්කම් | **2,781,887** | **9,540,709** | **12,322,596** |
| මූල්‍ය හා අනෙකුත් ආයතනයන්හි හිමිකරු ප්‍රාග්ධන ආයෝජන | **-** | **41,095** | **41,095** |
| රන් | **-** | **111,009,339** | **111,009,339** |

| | | | |
|---|---|---|---|
| තොගය | - | 6,114,861 | 6,114,861 |
| අනෙකුත් ලැබිය යුතු දෑ හා කලින් ගෙවීම් | 6,830,387 | 396,414 | 7,226,801 |
| දේපළ පිරියත සහ උපකරණ | - | 18,132,390 | 18,132,390 |
| අස්පෘශ්‍ය වත්කම් | - | 156,320 | 156,320 |
| **මුළු වත්කම්** | **983,217,423** | **545,992,674** | **1,529,210,097** |
| **බැරකම්** | | | |
| බැංකු හා මූල්‍ය ආයතන | 45,566,681 | - | 45,566,681 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 14,573,675 | - | 14,573,675 |
| ආසියානු නිශ්කාෂණ සංගමය | 79,863,615 | - | 79,863,615 |
| ජා.මූ.අ. | 34,687,890 | 234,852,706 | 269,540,596 |
| අනිකුත් | 95,125,637 | 1,124,395 | 96,250,032 |
| බැංකු හා මූල්‍ය ආයතන විසින් තැන්පතු | 303,251,290 | - | 303,251,290 |
| රජය සහ රජයේ ආයතන විසින් තැන්පතු | 450,884 | - | 450,884 |
| ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කල සුරැකුම්පත් | 70,054,436 | - | 70,054,436 |
| සේවක ප්‍රතිලාභ සැලසුම්වල ශේෂයන් | 51,744 | - | 51,744 |
| සංසරණයෙහි පවත්නා මුදල් | 552,777,865 | - | 552,777,865 |
| අනෙකුත් ගෙවිය යුතු දෑ | 8,563,548 | - | 8,563,548 |
| විලම්භිත ප්‍රදාන | 34 | 46 | 80 |
| විශ්‍රාම වැටුප් හා අනෙකුත් පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලසුම් | - | 2,429,153 | 2,429,153 |
| විවිධ බැරකම් සහ උපචිතයන් | 182,544 | 10,753 | 193,297 |
| **මුළු බැරකම්** | **1,205,149,843** | **238,417,053** | **1,443,566,896** |
| **ශුද්ධ වත්කම්/(බැරකම්) අගය** | **(221,932,420)** | **307,575,621** | **85,643,201** |

| 2015 දෙසැම්බර් 31 දිනට | මාස 12ට අඩු | මාස 12ට වැඩි | එකතුව |
|---|---|---|---|
| **වත්කම්** | රු.000 | රු.000 | රු.000 |
| මුදල් හා මුදල් සමානයන් | 557,474,685 | - | 557,474,685 |
| ලාභ/අලාභ මත සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත් | 35,779,665 | - | 35,779,665 |
| අලෙවි කල හැකි සුරැකුම්පත් | 77,913,482 | 274,141,000 | 352,054,482 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 2,259 | 1,886 | 4,145 |
| ජා.මූ.අ. සම්බන්ධ වත්කම් | 10,523,672 | 73,112,678 | 83,636,350 |
| අනෙකුත් ලැබිය යුතු දෑ - විදේශීය | 5,075 | - | 5,075 |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | 102,866,967 | - | 102,866,967 |
| රජයට දෙනු ලැබූ කාලීන අත්තිකාරම් | 151,131,671 | - | 151,131,671 |
| බැංකුවලට දෙනු ලැබූ ණය | 406,315 | 480,042 | 886,357 |
| අනෙකුත් වත්කම් | 2,896,103 | 8,268,349 | 11,164,452 |
| මූල්‍ය හා අනෙකුත් ආයතනයන්හි හිමිකරු ප්‍රාග්ධන ආයෝජන | - | 41,095 | 41,095 |
| රන් | 97,723,836 | - | 97,723,836 |
| තොගය | - | 3,419,964 | 3,419,964 |
| අනෙකුත් ලැබිය යුතු දෑ හා කලින් ගෙවීම් | 9,487,315 | 4,860,496 | 14,347,811 |
| දේපළ පිරියත සහ උපකරණ | - | 15,422,315 | 15,422,315 |
| අස්පෘශ්‍ය වත්කම් | - | 240,610 | 240,610 |
| **මුළු වත්කම්** | 1,046,211,045 | 379,988,435 | 1,426,199,480 |
| **බැරකම්** | | | |
| බැංකු හා මූල්‍ය ආයතන | 12,048,241 | - | 12,048,241 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 16,177,870 | 8,102,438 | 24,280,308 |
| ආසියානු නිශ්කාෂණ සංගමය | 68,887,459 | - | 68,887,459 |
| ජා.මූ.අ. | 65,334,235 | 186,310,109 | 251,644,344 |
| අනිකුත් | 217,924,142 | - | 217,924,142 |
| බැංකු හා මූල්‍ය ආයතන විසින් තැන්පතු | 181,726,732 | - | 181,726,732 |
| රජය සහ රජයේ ආයතන විසින් තැන්පතු | 428,142 | - | 428,142 |
| ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කල සුරැකුම්පත් | 105,465,000 | - | 105,465,000 |
| සේවක ප්‍රතිලාභ සැලසුම්වල ශේෂයන් | 7,212 | - | 7,212 |
| සංසරණයෙහි පවත්නා මුදල් | 491,699,948 | - | 491,699,948 |
| අනෙකුත් ගෙවිය යුතු දෑ | 6,850,998 | - | 6,850,998 |
| විලම්භිත ප්‍රදාන | 34 | 72 | 106 |
| විශ්‍රාම වැටුප් හා අනෙකුත් පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලසුම් | - | 10,942,541 | 10,942,541 |
| විවිධ බැරකම් සහ උපචිතයන් | 175,377 | 23,948 | 199,325 |
| **මුළු බැරකම්** | 1,166,725,390 | 205,379,108 | 1,372,104,498 |
| **ශුද්ධ වත්කම්/(බැරකම්) අගය** | (120,514,345) | 174,609,327 | 54,094,982 |

**45. විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම්**

සියළුම සුදුසුකම්ලත් සේවකයින් ආවරණයවන නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් හයක් බැංකුව විසින් මෙහෙයවනු ලැබේ. සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය (පැරණි) යටතේ, 1998 ජනවාරි 01 දිනට පෙර බැංකුවට බැඳුනු සේවකයින්, වර්ෂ 10 ක සේවා කාලයක් නිම කිරීමෙන් අනතුරුව එයට සුදුසුකම් ලබති. 1998 ජනවාරි 01 දිනට පසු බැංකු සේවයට එක්වී වසර 10 ක සේවා කාලය සම්පූර්ණ කල සේවකයන් නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා සුදුසුකම් ලබයි. සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය දායක මුදල් නොගෙවන විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් වන අතර, එහි ප්‍රතිලාභ පිරිවැය සම්පූර්ණයෙන්ම බැංකුව විසින් දරනු ලැබේ. පිරිමි සේවකයන් සඳහා වූ වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, කාන්තා සේවිකාවන් සඳහා වූ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය, 1998 ජනවාරි 01 දිනට පෙර බැංකුවේ සේවයට බැඳුනු සේවකයින්ට විවෘතය. මෙම සැලසුම්වලට 1994.08.01 දිනට පෙර බඳවා ගත් සේවකයින් මාසික මූලික වැටුපෙන් 5% ක ප්‍රමාණයකින් දායක වන අතර, 1994.08.01 දින හෝ ඊට පසු බඳවාගත් සේවකයින් මාසික මූලික වැටුපෙන් 10% කින් දායක වෙයි.

අවුරුදු 5 ක සේවා කාලයක් සම්පූර්ණ කළ සේවක වැටුප් විශ්‍රාම ක්‍රමය යටතේ විශ්‍රාම වැටුපකට හිමිකම් නොලබන සේවකයන් සඳහා පාරිතෝෂික ප්‍රතිලාභ ද බැංකුව විසින් සලසනු ලැබේ. මෙම බැරකම පියවීම සඳහා ආයුගණන අගය කිරීමට අනුකූලව ගණනය කළ බැරකමට සමාන ප්‍රතිපාදනයක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ඉදිරියට ගෙනයනු ලැබේ.

පශ්චාත් වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ විශ්‍රාමලත් බැංකු සේවකයන් හට තමා හා තම කාලත්‍රයන් සහ වැන්දඹුවන්/වැන්දඹු පුරුෂයන් විසින් දරන ලද ඇතැම් වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණය කරගත හැක.

සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, වෛද්‍ය ප්‍රතිලාභ යන යෝජනා ක්‍රමවල වර්ෂය තුළ නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් හා ප්‍රවර්ථන සේවා පිරිවැය නැවත තක්සේරු කිරීම සඳහා ස්වාධීන උපදේශකයකු හා ආයුගණකයෙකු වන කේ. ඒ. පණ්ඩිත් (මුම්බායි) මහතාගේ සේවය ලබාගෙන ඇත.

සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, වැන්දඹු හා අනත්දරු විශ්‍රම වැටුප් යෝජනා ක්‍රමය, වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයන්හි අරමුදල් වෙන්ව කළමනාකරණය කරන අතර, වෙන් වූ පොත් පවත්වාගෙන යනු ලබයි. කෙසේ හෝ පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සහ වෛද්‍ය ප්‍රතිලාභ යන යෝජනා ක්‍රම බැංකුවේ ගිණුම් පොත්වලින් වෙන්ව පවත්වාගෙන යනු නොලැබේ. තවදුරටත්, ආයෝජන හා ආයෝජන ආදායම්, බැංකු පොත්වල මෙම අරමුදල්වලට පරිබාහිරව වාර්තා කරනු ලැබේ. තවද, ආයෝජන ආදායම් නැවත මෙම අරමුදල්වලට මාරු කරන අතර බෙදාහැරීමකින් තොරව නැවත ආයෝජනය කරනු ලැබේ.

මුළු සැලසුම් වත්කම් හි සාධාරණ අගය රු.මි. 36,145.06 (2015 - රු.මි. 36,912.71) වන අතර එය ප්‍රතිලාභ බැරකමෙහි වර්තමාන අගය වන රු.මි. 36,065.09 (2015 - රු.මි. 45,682.71) ඉක්මවා රු.මි. 79.97 (2015 - හිඟය රු.මි. 8,770.00) ක අතිරික්තයක් අවසානයේ දී වාර්තා වේ.

| 2016<br>ප්‍රතිලාභ බැරකම/(වත්කම) | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව 2016 |
|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන වටිනාකම | 27,484,329 | 609,976 | 4,957,084 | 825,792 | 131,774 | 2,056,133 | 36,065,088 |
| සැලසුම් වත්කම්වල සාධාරණ වටිනාකම | (25,408,311) | (2,444,748) | (5,144,789) | (1,828,245) | (152,419) | (1,166,543) | (36,145,055) |
| **ප්‍රවර්තන නොවන ප්‍රතිලාභ බැරකම්/(වත්කම්)** | 2,076,018 | (1,834,772) | (187,705) | (1,002,453) | (20,645) | 889,590 | (79,967) |

**වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප්**

මූල්‍ය තත්ව ප්‍රකාශයේ විශ්‍රාම සේවක හා අනෙකුත් සේවක පශ්චාත් ප්‍රතිලාභ සැලසුම් යටතේ දක්වා ඇති බැරකම් ශේෂය ස්වාධීන ආයුගණනය කරන්නා විසින් දෙනු ලැබූ ශුද්ධ බැරකම් ශේෂයෙන් වෙනස් වීමට පහත හේතු බලපා ඇත.

(අ) වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප්, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම යටතේ ආයුගණනය කරන්නා විසින් දෙන ලද ශුද්ධ වත්කම් ප්‍රමාණය ගිණුම්ගත කොට නැත්තේ, එකී අරමුදල් වල ඉතිරි වන්නා වූ යම් ශේෂයක් වෙතොත් එය බැංකුවට ලබා ගැනීමට ඇති සම්භාවිතාව ඉතා අඩු බැවිනි.

(ආ) පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය හා වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ ගිණුම් ගත කොට ඇත්තේ, ආයුගණනය කරන්නාට අනුව ඇති ශුද්ධ බැරකම් ප්‍රමාණය නොව දළ බැරකම් ප්‍රමාණය වන අතර එයට හේතු වන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එකී යෝජනා ක්‍රමවලට අදාල වත්කම් අභ්‍යන්තරව කළමණාකරණය වන ස්වාධීන අරමුදලක් යටතේ පවත්වා නොගැනීමයි.

සේවක විශ්‍රාම වැටුප්, වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප්, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප්, පාරිතොෂික විශ්‍රාම වැටුප් හා වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යන අරමුදල් හි රු.මි. 445.53 ක අගයකින් යුතු සුරැකුම් රහිත ආයෝජන ඇතුලත් වන අතර ඒ වෙනුවෙන් 100% වෙන් කිරීම් කර ඇති හෙයින් සැලසුම් වත්කම් තුළ ඇතුලත් කර නොමැත. එවැනි ආයෝජනයන්හි අගයන් නොමැතිව පවා, ආයුගණන ඇගයීමට අනුව සේවක විශ්‍රාම වැටුප් බැරකමෙහි ශුද්ධ වත්කම් තත්ත්වයක් බැංකුව සතු වේ.

| ප්‍රතිලාභ බැරකම/(වත්කම) වෙනස් වීම | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව 2016 |
|---|---|---|---|---|---|---|---|
| | **රු. 000** | **රු. 000** | **රු. 000** | **රු. 000** | **රු. 000** | **රු. 000** | **රු. 000** |
| 2016 ජනවාරි 01 දිනට | 9,055,520 | (1,245,041) | 819,399 | (612,924) | (33,574) | 786,620 | 8,770,000 |
| ප්‍රතිලාභ වියදම් | 1,232,222 | (72,429) | 81,940 | (61,292) | 24,042 | 112,275 | 1,316,758 |
| අනෙකුත් විස්තීරණ ආදායම් හි හඳුනාගත් කොටස | (7,765,143) | (345,098) | (1,055,189) | (316,344) | (11,113) | 7,038 | (9,485,849) |
| දායක ගෙවීම් | (446,581) | (172,204) | (33,855) | (11,893) | - | (16,343) | (680,876) |
| **2016 දෙසැම්බර් 31 දිනට - ප්‍රවර්තන නොවන** | 2,076,018 | (1,834,772) | (187,705) | (1,002,453) | (20,645) | 889,590 | (79,967) |

| ප්‍රතිලාභ වියදම් | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව 2016 |
|---|---|---|---|---|---|---|---|
| | **රු. 000** | **රු. 000** | **රු. 000** | **රු. 000** | **රු. 000** | **රු. 000** | **රු. 000** |
| ප්‍රතිලාභ බැඳීම් මත පොළී පිරිවැය | 905,552 | (124,504) | 81,940 | (61,292) | (3,358) | 78,662 | 877,000 |
| අතීත සේවා පිරිවැය | 326,670 | 52,075 | - | - | 27,400 | 33,613 | 439,758 |
| **ප්‍රතිලාභ වියදම්** | 1,232,222 | (72,429) | 81,940 | (61,292) | 24,042 | 112,275 | 1,316,758 |
| **සැලසුම් වත්කම්වල සත්‍ය ප්‍රතිලාභය** | 877,139 | 12,576 | 268,269 | 89,924 | (6,438) | (37,029) | 1,204,441 |
| **සැලසුම් වත්කම්වල සත්‍ය ප්‍රතිලාභය සාමාන්‍ය ශේෂයේ ප්‍රතිශතයක් ලෙස** | 3.40% | 0.53% | 5.17% | 5.03% | -3.89% | -2.91% | 3.30% |
| **ගෙවූ ප්‍රතිලාභය ඉක්මවා ඉපැයූ අතිරික්ත පොලිය** | (1,158,329) | 12,576 | (114,825) | 69,041 | (25,769) | (231,229) | (1,448,535) |

| සැලසුම් වත්කම්වල සාධාරණ අගයෙහි වෙනස්වීම | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව 2016 |
|---|---|---|---|---|---|---|---|
| | **රු. 000** | **රු. 000** | **රු. 000** | **රු. 000** | **රු. 000** | **රු. 000** | **රු. 000** |
| වර්ෂ ආරම්භයේ දී සැලසුම් වත්කම්වල සාධාරණ අගය | 26,120,059 | 2,259,968 | 5,225,759 | 1,747,311 | 178,188 | 1,381,429 | 36,912,714 |
| සැලසුම් වත්කම්වල සත්‍ය ප්‍රතිලාභය | 877,139 | 12,576 | 268,269 | 89,924 | (6,438) | (37,029) | 1,204,441 |
| දායක ලැබීම් | 446,581 | 172,204 | 33,855 | 11,893 | - | 16,343 | 680,876 |
| ප්‍රතිලාභ ගෙවීම් | (2,035,468) | - | (383,094) | (20,883) | (19,331) | (194,200) | (2,652,976) |
| **වර්ෂ අවසානයේ දී සැලසුම් වත්කම්වල සාධාරණ අගය** | 25,408,311 | 2,444,748 | 5,144,789 | 1,828,245 | 152,419 | 1,166,543 | 36,145,055 |

| 2015 ප්‍රතිලාභ බැරකම/(වත්කම) | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව 2015 |
|---|---|---|---|---|---|---|---|
| | **රු. 000** | **රු. 000** | **රු. 000** | **රු. 000** | **රු. 000** | **රු. 000** | **රු. 000** |
| ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන වටිනාකම් | 35,175,579 | 1,014,927 | 6,045,158 | 1,134,387 | 144,614 | 2,168,049 | 45,682,714 |
| සැලසුම් වත්කම්වල සාධාරණ වටිනාකම | (26,120,059) | (2,259,968) | (5,225,759) | (1,747,311) | (178,188) | (1,381,429) | (36,912,714) |
| **ප්‍රවර්තන නොවන ප්‍රතිලාභ බැරකම** | 9,055,520 | (1,245,041) | 819,399 | (612,924) | (33,574) | 786,620 | 8,770,000 |

| ප්‍රතිලාභ බැරකම්වල/(වත්කම) වෙනස් වීම. | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව 2015 |
|---|---|---|---|---|---|---|---|
| | **රු. 000** | **රු. 000** | **රු. 000** | **රු. 000** | **රු. 000** | **රු. 000** | **රු. 000** |
| 2015 ජනවාරි 01 දිනට | 4,609,763 | - | (874,652) | (869,130) | 97,453 | 635,601 | 3,599,035 |
| ප්‍රතිලාභ වියදම් | 852,981 | 1,014,927 | (87,465) | (86,913) | (200,806) | 115,379 | 1,608,103 |
| අනෙකුත් විස්තීරණ ආදායම්තුල හඳුනාගත් කොටස | 4,922,631 | (103,601) | 1,815,056 | 356,027 | 105,625 | 161,340 | 7,257,078 |
| දායක ගෙවීම් | (1,329,855) | (2,156,367) | (33,540) | (12,908) | (35,846) | (125,700) | (3,694,216) |
| **2015 දෙසැම්බර් 31 දිනට - ප්‍රවර්තන නොවන** | 9,055,520 | (1,245,041) | 819,399 | (612,924) | (33,574) | 786,620 | 8,770,000 |

| **ප්‍රතිලාභ වියදම්** | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව 2015 |
|---|---|---|---|---|---|---|---|
| | **රු. 000** | **රු. 000** | **රු. 000** | **රු. 000** | **රු. 000** | **රු. 000** | **රු. 000** |
| ප්‍රතිලාභ බැඳීම් මත පොළී පිරිවැය | 460,977 | - | (87,465) | (86,913) | 9,746 | 63,561 | 359,906 |
| ප්‍රවර්තන සේවා පිරිවැය | 392,004 | - | - | - | 28,390 | 51,818 | 472,212 |
| අතීත සේවා පිරිවැය | - | 1,014,927 | - | - | - | - | 1,014,927 |
| ලුහුඬු කිරීම්. | - | - | - | - | (238,942) | - | (238,942) |
| **ප්‍රතිලාභ වියදම්** | 852,981 | 1,014,927 | (87,465) | (86,913) | (200,806) | 115,379 | 1,608,103 |
| **සැලසුම් වත්කම්වල සත්‍ය ප්‍රතිලාභය** | 2,116,753 | 103,601 | 431,654 | 156,161 | 18,660 | 125,149 | 2,951,978 |
| **සැලසුම් වත්කම්වල සත්‍ය ප්‍රතිලාභය සාමාන්‍ය ශේෂයේ ප්‍රතිශතයක් ලෙස** | 8.40% | 8.40% | 8.40% | 9.35% | 12.00% | 9.44% | 8.53% |
| **ගෙවූ ප්‍රතිලාභය ඉක්මවා ඉපැයූ අතිරික්ත පොළිය** | 516,650 | 516,650 | 137,995 | 140,097 | 9,609 | (13,165) | 894,787 |

| **සැලසුම් වත්කම්වල සාධාරණ අගයෙහි වෙනස්වීම** | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | එකතුව 2015 |
|---|---|---|---|---|---|---|---|
| | **රු. 000** | **රු. 000** | **රු. 000** | **රු. 000** | **රු. 000** | **රු. 000** | **රු. 000** |
| වර්ෂ ආරම්භයේ දී සැලසුම් වත්කම්වල සාධාරණ අගය | 24,273,554 | - | 5,054,224 | 1,594,306 | 132,733 | 1,268,894 | 32,323,711 |
| සැලසුම් වත්කම්වල සත්‍ය ප්‍රතිලාභය | 2,116,573 | 103,601 | 431,654 | 156,161 | 18,660 | 125,149 | 2,951,798 |
| දායක ලැබීම් | 1,329,855 | 2,156,367 | 33,540 | 12,908 | 35,846 | 125,700 | 3,694,216 |
| ප්‍රතිලාභ ගෙවීම් | (1,599,923) | - | (293,659) | (16,064) | (9,051) | (138,314) | (2,057,011) |
| **වර්ෂ අවසානයේ සැලසුම් වත්කම්වල සාධාරණ අගය** | 26,120,059 | 2,259,968 | 5,225,759 | 1,747,311 | 178,188 | 1,381,429 | 36,912,714 |

සියළුම සේවක ප්‍රතිලාභ බැඳීම් නිශ්චය කිරීමේ දී යොදාගන්නා ලද ප්‍රධාන උපකල්පනයන් පහත දැක්වේ.

| | 2016 | 2015 |
|---|---|---|
| වට්ටම් අනුපාතිකය | 13.00% | 10.00% |
| වත්කම් මත අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතිකය | 13.00% | 10.00% |
| අනාගත වැටුප් වැඩිවීම් | 8.50% | 8.50% |
| අනාගත වැටුප් වැඩිවීම් - (විශ්‍රාම) (නව) | 6.50% | 6.50% |
| අනාගත විශ්‍රාම වැටුප් වැඩිවීම | 7.50% | 7.50% |
| සේවය හැරයාමේ අනුපාතය | 2.00% | 2.00% |
| වෛද්‍ය පිරිවැයෙහි උද්ධමන අනුපාතය | 3.00% | 3.00% |
| ඉතිරි සාමාන්‍ය සේවා කාලය | | |
| ශ්‍රී ලං.ම.බැ. විශ්‍රාම වැටුප් | අවුරුදු 27 | අවුරුදු 27 |
| ශ්‍රී ලං.ම.බැ. විශ්‍රාම වැටුප් - නව | අවුරුදු 41 | අවුරුදු 41 |
| වැන්දඹු හා අනත්දරු | අවුරුදු 27 | අවුරුදු 27 |
| වැන්දඹු පුරුෂ හා අනත්දරු | අවුරුදු 27 | අවුරුදු 27 |
| පාරිතෝෂික විශ්‍රාම වැටුප් | අවුරුදු 20 | අවුරුදු 20 |
| වෛද්‍ය ප්‍රතිලාභ | අවුරුදු 32 | අවුරුදු 32 |
| විශ්‍රාමික වයස | අවුරුදු 60 | අවුරුදු 60 |

| 0.5% දී සංවේදීතා විශ්ලේෂණය (2016-12-31) | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය |
|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| පුරෝකථනය කරන ලද ප්‍රතිලාභ සඳහා වන බැඳීම් මත ඇති වත්මන් උපකල්පනයන් | **27,484,329** | **609,976** | **4,957,084** | **825,792** | **131,774** | **2,056,133** |
| "+" වට්ටම් අනුපාතිකය වෙනස්වීමේ බලපෑම | (1,120,339) | (63,235) | (223,313) | (46,688) | (4,572) | (66,121) |
| "-" වට්ටම් අනුපාතිකය වෙනස්වීමේ බලපෑම | 1,207,556 | 72,190 | 243,228 | 51,001 | 4,876 | 70,826 |
| "+" සේවය හැර යාමේ සීඝ්‍රතාවය වෙනස්වීමේ බලපෑම | - | - | - | - | 26,335 | 12,733 |
| "-" සේවය හැර යාමේ සීඝ්‍රතාවය වෙනස්වීමේ බලපෑම | - | - | - | - | (28,715) | (13,395) |
| "+" වැටුප් වැඩි වීමේ සීඝ්‍රතාවය වෙනස්වීමේ බලපෑම | 154,116 | 54,441 | 12,097 | 4,791 | 5,061 | - |
| "-" වැටුප් වැඩි වීමේ සීඝ්‍රතාවය වෙනස්වීමේ බලපෑම | (150,130) | (49,497) | (11,789) | (4,675) | (4,776) | - |
| "+" වෛද්‍ය පිරිවැයෙහි උද්ධමනය වෙනස්වීමේ බලපෑම | - | - | - | - | - | 71,939 |
| "-" වෛද්‍ය පිරිවැයෙහි උද්ධමනය වෙනස්වීමේ බලපෑම | - | - | - | - | - | (67,155) |
| "+" විශ්‍රාම වැටුප් ඉහළ යාමේ ප්‍රතිශතය වෙනස්වීමේ බලපෑම | 1,103,394 | - | 241,807 | 48,302 | - | - |
| "-" විශ්‍රාම වැටුප් ඉහළ යාමේ ප්‍රතිශතය වෙනස්වීමේ බලපෑම | (1,035,401) | - | (224,268) | (44,771) | - | - |

## 46. සාධාරණ වටිනාකම් පිළබඳ හෙළිදරව් කිරීම්

### අ) වත්කම් හා වගකීම්වල සාධාරණ වටිනාකම

වත්කම් හා වගකීම්වල සාධාරණ අගය වන්නේ යම් වත්කමක් විකිණීමට හෝ වගකීමක් පැවරීම සඳහා ක්‍රමවත් ගණුදෙනුවක දී වෙළඳපොල සහභාගීවන්නන් අතර මිණුම්කරණ දිනයේ දී ලැබිය යුතු හෝ ගෙවිය යුතු මුදලයි. මූල්‍ය ලියවිල්ලක් විකුණන්නාට එරෙහිව මිල චලනයක් සිදු නොවන පරිදි සැලකිය යුතු ගනුදෙනුවක්, ග්‍රහණය කරගත හැකි ලෙස සංවිධාන වූ සහ ද්‍රවශීලතාවය ඇති වෙළෙඳපොළක මූල්‍ය ලියවිල්ලක් විකිණීම කළ විට එහි ප්‍රකාශිත මිල සාධාරණ අගය වේ.

ඇගයුම් ක්‍රමයන්ට වන වත්කම් හා වගකීම්වල සාධාරණ අගය නිශ්චය කිරීමට සහ අනාවරණය කිරීමට බැංකුව විසින් පහත ධූරාවලිය උපයෝගී කරගනු ලැබේ.

**පළමුවන මට්ටම** : අනන්‍ය වත්කම හෝ වගකීම සඳහා ක්‍රියාකාරී වෙළඳපල තුළ හිමි ප්‍රකාශිත (නොසැකසූ) මිල ගණන්;

**දෙවන මට්ටම** : වාර්තා කරන ලද සාධාරණ අගය කෙරෙහි ප්‍රමාණාත්මක බලපෑමක් කළ හැකි සියළුම යෙදවුම් සඳහා සෘජුව හෝ වක්‍රාකාරයෙන් නිරීක්ෂණය කලහැකි යෙදවුම් භාවිතා කරන අනෙකුත් ක්‍රම;

**තෙවන මට්ටම** : නිරීක්ෂණය කළ හැකි වෙළඳපල දත්ත මත පදනම් නොවූ වාර්තා කරන ලද සාධාරණ අගය කෙරෙහි ප්‍රමාණාත්මක බලපෑමක් කළ හැකි යෙදවුම්, භාවිතා කරනු ලබන ක්‍රම;

පහත දැක්වෙන වගුව මගින් සාධාරණ අගය ධූරාවලිය අනුව වාර්තා කරන ලද වත්කම් හා වගකීම්වල විශ්ලේෂණයක් පෙන්නුම් කරයි.

| 2016 දෙසැම්බර් 31 දිනට | පළමුවන මට්ටම රු. 000 | දෙවන මට්ටම රු. 000 | තෙවන මට්ටම රු. 000 | එකතුව රු. 000 |
|---|---|---|---|---|
| **මූල්‍ය වත්කම්** | | | | |
| ලාභ හෝ අලාභ මත සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත් | 43,278,755 | - | - | 43,278,755 |
| විකුණුම් සඳහා වන ආයෝජන | 348,544,650 | - | - | 348,544,650 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | - | 198,880 | - | 198,880 |
| | 391,823,405 | 198,880 | - | 392,022,285 |
| **මූල්‍ය නොවන විදේශ විනිමය වත්කම්** | | | | |
| රන් | 111,009,339 | - | - | 111,009,339 |
| | 111,009,339 | - | - | 111,009,339 |
| **දේශීය මූල්‍ය වත්කම්** | | | | |
| ශ්‍රී ලංකා රජයේ සුරුකුම්පත් | - | 320,640,852 | - | 320,640,852 |
| | - | 320,640,852 | - | 320,640,852 |
| **අනෙකුත් මූල්‍ය නොවන වත්කම්** | | | | |
| ඉඩම් | - | - | 8,976,339 | 8,976,339 |
| ගොඩනැගිලි | - | - | 7,695,682 | 7,695,682 |
| | - | - | 16,672,021 | 16,672,021 |
| **මූල්‍ය වගකීම්** | | | | |
| අන්තර්ගත ව්‍යුත්පන්න මූල්‍ය - විනිමය විකල්ප | - | - | 5,911,812 | 5,911,812 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | - | 8,661,863 | - | 8,661,863 |
| | - | 8,661,863 | 5,911,812 | 14,573,675 |

| 2015 දෙසැම්බර් 31 දිනට | පළමුවන මට්ටම රු. 000 | දෙවන මට්ටම රු. 000 | තෙවන මට්ටම රු. 000 | එකතුව රු. 000 |
|---|---|---|---|---|
| **මූල්‍ය වත්කම්** | | | | |
| ලාභ හෝ අලාභ මත සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත් | 35,779,665 | - | - | 35,779,665 |
| විකුණුම් සඳහා වන ආයෝජන | 352,054,482 | - | - | 352,054,482 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | - | 4,145 | - | 4,145 |
| | 387,834,147 | 4,145 | - | 387,838,292 |
| **මූල්‍ය නොවන විදේශ විනිමය වත්කම්** | | | | |
| රන් | 97,723,836 | - | - | 97,723,836 |
| | 97,723,836 | - | - | 97,723,836 |
| **දේශීය මූල්‍ය වත්කම්** | | | | |
| ශ්‍රී ලංකා රජයේ සුරුකුම්පත් | - | 102,799,824 | - | 102,799,824 |
| | - | 102,799,824 | - | 102,799,824 |
| **අනෙකුත් මූල්‍ය නොවන වත්කම්** | | | | |
| ඉඩම් | - | - | 5,879,064 | 5,879,064 |
| ගොඩනැගිලි | - | - | 7,930,666 | 7,930,666 |
| | - | - | 13,809,730 | 13,809,730 |
| **මූල්‍ය වගකීම්** | | | | |
| අන්තර්ගත ව්‍යුත්පන්න මූල්‍ය - විනිමය විකල්ප | - | - | 10,290,162 | 10,290,162 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | - | 13,990,146 | - | 13,990,146 |
| | - | 13,990,146 | 10,290,162 | 24,280,308 |

### ඉඩම් හා ගොඩනැගිලි

**අගය කිරීමේ ක්‍රමය**

සෘජු සන්සන්දනාත්මක ක්‍රමය සමග වෙළඳපොල ප්‍රවේශය භාවිතා කරමින් ඉඩම් අගය කරනු ලබන අතර එහිදී වත්කම නුදුරේදී සිදුකරන ලද සමාන වත්කමක විකුණුම් අගය සමග සංසන්දනය කොට එකී අගයට එකතු කළ හෝ නාමිකව එකතු කළ වැඩිදියුණු අගයක් ගැලපුම් කිරීමකින් තොරව Points of Difference සඳහා පමණක් ගැලපුම් කිරීමෙන් සාධාරණ අගය ගණනය කරනු ලබයි.

පොදු මහජනතාවට සේවා සපයන රාජ්‍ය අංශ ඒකකයන් විසින් පාලනය කරනු ලබන වත්කම්, විවෘත ද්‍රවශීල වෙළඳපොලෙහි හුවමාරු නොවන බැවින් සෙන්ට්‍රල් පොයින්ට්, වයිට් අවේස්, ලොයිඩ්ස් ගොඩනැගිලි හැර අනෙකුත් සියළුම ගොඩනැගිලි ක්ෂය කරන ලද ප්‍රවර්තන ප්‍රතිස්ථාපන පිරිවැය (DRC) ක්‍රමයට තක්සේරු කර ඇත.

අනෙකුත් ගොඩනැගිලි අගය කිරීම සඳහා, තනි වර්තමාන අගයකට හැර වූ (වට්ටම් කල) ඇස්තමේන්තුගත අනාගත ආදායම, ලාභය හෝ මුදල් ප්‍රවාහයන් මත පදනම්ව දේපල අගය කරනු ලබන ආදායම් ප්‍රවේශය යොදා ගන්නා ලදී.

**ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ**

ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ අගය කිරීමේ ආකෘති සඳහා ඉදිරි මිල ගණන් (වෙළෙඳපොලහි ඇති ඉදිරි ලක්ෂ්‍ය බහිර් නිවේෂණය (extrapolation) කිරීමෙන් ගණනය කරයි.) සහ අගය කරන දිනට අදාල එක් එක් මුදල් වර්ගයන්හි ශුන්‍ය පොළී ඵලදා වක්‍ර මත පදනම් ව ගණනය කල වට්ටම් සාධක යොදා ගැනේ. අගය කරන ලද උපකරණයේ ආන්තිකයක් අඩංගු වේ නම්, ආන්තික අනුපාතයන් හි බලපෑම ඉදිරිපත් කිරීමටත් ඉදිරි මිල ගණන්වලට හා/හෝ පොළී අනුපාතයන්වලට ගැලපීම සිදුකරනු ලබයි.

**අන්තර්ගත ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ - මූල්‍ය විකල්පයන්**

අන්තර්ගත ව්‍යුත්පන්න මූල්‍ය උපකරණවල අගය බ්ලැක්ෂෝල්ස් ආදර්ශකය භාවිතා කරමින් ගනණය කර ඇත.

| | තෙවන මට්ටම් | |
|---|---|---|
| | 2016<br>රු. 000 | 2015<br>රු. 000 |
| ජනවාරි 1 දිනට ශේෂය | 10,290,162 | 16,350,511 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ වගකීම් | (4,378,349) | (6,060,349) |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | 5,911,813 | 10,290,162 |
| ඉපයීම්වල ඇතුළත් උපලබ්ධි නොවූ ඉපැයීම්වල එකතුව | 4,378,349 | 6,159,141 |

**භාවිතා කරන ලද නිරීක්ෂණය කල නොහැකි සුවිශේෂී යෙදවුම්**

| | |
|---|---|
| වට්ටම් සාධකය | 10% |
| උච්චාවචනය | 5% |

| **සංවේදීතා විශ්ලේෂකය** | **වට්ටම් සාධකය** | | **උච්චාවචනය** | |
|---|---|---|---|---|
| | 9% | 11% | 4% | 6% |
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| අන්තර්ගත ව්‍යුත්පන්න උපකරණ - මූල්‍ය විකල්පයන් | 6,016,743 | 5,811,071 | 5,910,742 | 5,940,987 |

| **අන්තර්ගත ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ මත විලම්භිත වත්කම්** | 2016<br>රු. 000 | 2015<br>රු. 000 |
|---|---|---|
| ජනවාරි 1 දිනට ශේෂය | 13,292,126 | 25,832,842 |
| වසර තුලදී ක්‍රමක්ෂය කරන ලද අධිමිල | (8,666,461) | (12,540,716) |
| දෙසැම්බර් 31 ට ශේෂය | 4,625,665 | 13,292,126 |

**ආ) ප්‍රතිමිලදී ගැනීම් සහ ප්‍රතිවිකුණුම් ගිවිසුම්**

ගිවිසුම්වල කෙටිකාලීන ස්වභාවය නිසා, ආසන්න සාධාරණ අගයක් ලබා ගැනීමට ප්‍රතිමිලදී ගැනීම් සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනුවල වාර්තා කළ අගය සලකා බලනු ලැබේ. 2016 දෙසැම්බර් 31 දිනට ප්‍රතිමිලදී ගැනීම් යටතේ පවතින ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්වල ධාරණ වටිනාකම රු.මි. 21,383.72 ක් විය. (2015 - රු.මි. 23,662.52) සහ නිත්‍ය තැන්පතු පහසුකම් රු.මි. 48,670.71 (2015 - රු.මි. 81,828.49). 2016 දෙසැම්බර් 31 දිනට ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ පවතින ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්වල ධාරණ වටිනාකම රු.මි. 30,821.39 (2015 දී එය රු.මි. 135.03) කි.

**ඇ) සංසරණයේ ඇති මුදල්**

සංසරණයේ ඇති මුදල්වල සාධාරණ අගය, ශේෂ පත්‍රයෙහි වාර්තාකර ඇති පරිදි ඒවායේ මුහුණත වටිනාකමය.

**ඈ) තැන්පතු වටිනාකම**

ඉල්ලු විටෙක දී ගෙවිය යුතු බැවින් තැන්පතුවල ධාරණ අගය ආසන්න සාධාරණ අගය ලෙස සලකනු ලැබේ.

**ඉ) සාධාරණ වටිනාකම තීරණය කිරීම හා සාධාරණ වටිනාකම් ධූරාවලිය**

පහත දැක්වෙන්නේ ධාරණ අගයන් සහ සාධාරණ අගයන් ආසන්න වශයෙන් සමාන නොවන බැංකුවේ වත්කම් හා වගකීම් හි පන්ති ලෙස ධාරණ අගයන් හා සාධාරණ අගයන් අතර සංසන්දනාත්මක තොරතුරු වේ.

| | ධාරණ වටිනාකම් | | සාධාරණ වටිනාකම් | |
|---|---|---|---|---|
| | 2016<br>රු. 000 | 2015<br>රු. 000 | 2016<br>රු. 000 | 2015<br>රු. 000 |
| **විදේශීය මූල්‍ය වත්කම්** | | | | |
| විදේශීය විනිමය විකුණුම් /විකිණීම සඳහා ඇති සුරැකුම්පත් | 391,823,405 | 387,834,147 | 391,823,405 | 387,834,147 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 198,880 | 4,145 | 198,880 | 4,145 |
| **දේශීය මූල්‍ය වත්කම්** | | | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | 351,426,470 | 102,866,967 | 320,640,852 | 102,799,824 |
| බැංකුවලට දෙනු ලැබූ ණය | 484,043 | 886,357 | 460,376 | 839,898 |
| අනිකුත් වත්කම් | 12,322,596 | 11,164,452 | 9,573,218 | 7,973,781 |
| **විදේශීය මූල්‍ය නොවන වත්කම්** | | | | |
| රන්වලින් කරන ලද ආයෝජන | 111,009,339 | 97,723,836 | 111,009,339 | 97,723,836 |
| **විදේශීය මූල්‍ය වගකීම්** | | | | |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 14,573,675 | 24,280,308 | 14,573,675 | 24,280,308 |

**47. සන්සන්දනාත්මක තොරතුරු**

| | 2015<br>රු. 000 |
|---|---|
| **පෙරාතුව ඉදිරිපත් කළ ආකාරයට:** | |
| **දේශීය මූල්‍ය වත්කම්** | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | 102,866,967 |
| අනෙකුත් වත්කම් | 11,164,452 |
| **දේශීය මූල්‍ය බැරකම්** | |
| ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කල සුරැකුම්පත් | 105,465,000 |
| අනෙකුත් ගෙවිය යුතු දෑ | 6,850,998 |

| | 2016<br>රු. 000 | 2015<br>රු. 000 |
|---|---|---|
| **වත්මන් ඉදිරිපත් කිරීම** | | |
| **දේශීය මූල්‍ය වත්කම්** | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | **351,426,470** | 102,866,995 |
| අනෙකුත් වත්කම් | **12,322,596** | 11,164,424 |
| **දේශීය මූල්‍ය බැරකම්** | | |
| ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කළ සුරැකුම්පත් | **70,054,436** | 105,491,006 |
| අනෙකුත් ගෙවිය යුතු දෑ | **8,563,548** | 6,824,992 |

2015 දී අනෙකුත් වත්කම් යටතේ දක්වා ඇති රු.මි 0.03ක් වූ ප්‍රතිවිකුණුම් මත වූ ලැබිය යුතු පොලී, වඩාත් නිවැරදි ඉදිරිපත් කිරීමක් සඳහා වර්තමානයේ ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් යටතේ දක්වා ඇත. එපරිද්දෙන් 2015 දී අනෙකුත් ගෙවිය යුතු දෑ යටතේ දක්වා ඇති රු. මි. 26.01ක් වූ ප්‍රතිමිලදීගැනීම් සහ නිත්‍ය තැන්පතු පහසුකම් මත වූ පොලී, වඩාත් නිවැරදි ඉදිරිපත් කිරීමක් සඳහා වර්තමානයේ ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කළ සුරැකුම්පත් යටතේ දක්වා ඇත.

**48. සම්බන්ධිත පාර්ශවයන්**

**48.1 රජය සහ රජය විසින් පාලනය කරනු ලබන ආයතන සමග ගනුදෙනු**

බැංකුව විසින් සාමාන්‍ය මෙහෙයුම් කටයුතු කරගෙන යාමේ දී සම්බන්ධිත පාර්ශවයන් සමග ගණුදෙනුවලට පිවිසෙනු ලැබේ. ශ්‍රී ලංකා රජය (ශ්‍රී.ලං.ම.බැ. පරම අයිතිකරු වශයෙන්) විවිධ රජයේ දෙපාර්තමේන්තු සහ රජය මඟින් පාලනය කෙරෙන ආයතන ද සම්බන්ධිත පාර්ශවයන්ට ඇතුළත් වේ. අන්තර්ජාතික ගිණුම්කරණ ප්‍රමිත 24 (සංශෝධිත) සම්බන්ධිත පාර්ශවයන් පිළිබඳ හෙළිදරව් කිරීමේ ගිණුම්කරණ ප්‍රමිතියට අනුව තනිව ගත් කළ සැළකිය යුතු මට්ටමේ වන හා අනෙකුත් ගණුදෙනුවලදී එකී ගණුදෙනු තනි වශයෙන් නොව සාමූහිකව සැළකිය යුතු මට්ටමේ වන රජය සහ රජය මඟින් පාලනය කෙරෙන ආයතන සමග එළැඹී ගණුදෙනු සහ විධිවිධානයන් පහත සඳහන් පරිදි වේ.

| ගනුදෙනු වල ස්වභාවය | 2016<br>රු. 000 | 2015<br>රු. 000 |
|---|---|---|
| **ගනුදෙනු:** | | |
| එක්වර මිලදී ගත් ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | 8,065,953 | - |
| එක්වර විකිණූ ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | 37,375,643 | 66,059,197 |
| ප්‍රති විකිණීමේ හා ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් යටතේ මිලදී ගත් හෝ විකුණූ ශ්‍රී.ලං.ම.බැ. සහ ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | 6,215,152,910 | 8,558,487,853 |
| දෙසැම්බර් 31 දිනට මුදල් නෝට්ටු මුද්‍රණය කිරීමේ පිරිවැය (ඇ) | 3,162,625 | 1,954,763 |
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා භාණ්ඩ හා සේවා සඳහා ගෙවූ ගාස්තු සහ බදු (ඇ) | 1,229,032 | 762,417 |
| වර්ෂය තුළ දී අතිරික්තය රජයට ගෙවීම (සටහන 30) | 5,000,000 | - |
| වර්ෂය තුළදී දළ විදේශ විනිමය ගනුදෙනු (ඊ) | | |
| - විකුණුම් | 55,884,998 | 234,753,399 |
| - මිලට ගැනීම් | 68,112,483 | - |
| - ඇ.එ.ජ. ඩොලර් / ශ්‍රී ලංකා රුපියල් ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 737,197,729 | 836,162,191 |
| වර්ෂය තුළදී අත්හළ දේපල වෙනුවෙන් ලද අරමුදල් | 275,236 | 114,971 |
| උපදේශනාත්මක, සන්නිවේදන හා වෘත්තීමය ගෙවීම් (උ) | 28,038 | 155,428 |
| **ශේෂයන් :** | | |
| ශ්‍රී ලං.ම.බැ. විසින් අයිතිකාරීත්වය දරන ලද ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් (ඌ) | 320,605,082 | 102,731,967 |
| රජයට දෙන ලද කාලීන අත්තිකාරම් (සටහන 9) | 83,306,771 | 151,131,671 |
| සුසහන අදියර I සහ II, පළාත් සංවර්ධන ණය ක්‍රමය, සෞභාග්‍ය ණය ක්‍රමය, පිබිදෙන උතුර ණය ක්‍රමය (අදියර II), නැගෙනහිර පළාත තුළ ආර්ථික කටයුතු ප්‍රතිශ්ඨාපනය කිරීමේ (අදියර II) සහ උතුරු නැගෙනහිර හානි වූ නිවාස ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන යටතේ දෙන ලද ණය | 112,652 | 352,864 |
| නිශ්චිත අරමුණු සඳහා මිලදීගත් රජයේ සුරැකුම්පත් | 5,208,837 | 4,292,385 |
| බැංකු හා මූල්‍ය ආයතනවල තත්කාලීන දළ පියවුම් පද්ධතියේ (RTGS) ශේෂයන් | 183,836,224 | 115,013,766 |
| ලංකා බැංකුවේ ලන්ඩන් ශාඛාවේ පවත්වාගෙන යනු ලබන නොස්ට්‍රෝ ගිණුමේ ශේෂය | 168,790 | 195,999 |
| භාණ්ඩාගාරයෙන් හා අනෙකුත් අමාත්‍යාංශ වලින් ලැබිය යුතු දෑ | 1,401,497 | 1,378,695 |
| භාණ්ඩාගාරය වෙත කළ යුතු ගෙවීම් (සටහන 20) | 291,768 | 8,203,776 |
| ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය වෙත ගෙවීම් (සටහන 20) | 32,222,139 | 49,479,048 |
| දෙසැම්බර් 31 දිනට රජයේ හා රජයේ ආයතන සමග ජංගම ගිණුම් ශේෂයන් | 198,936 | 176,637 |
| අනෙකුත් ගණුදෙනු හා ශේෂයන් (ඔ) | 1,121,491 | 1,124,350 |

අ) මුදල් නීති පනතේ 28-33 වගන්ති අනුව පැවරෙන ලද බලය ප්‍රකාර බැංකුවේ, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ බලපත්‍රලාභී බැංකුවල කටයුතු නියාමනය හා සුපරීක්ෂණය කරනු ලබයි. 2016 දෙසැම්බර් 31 දිනට රජය මඟින් අරමුදල් සැපයූ හෝ රජයේ සුවිශේෂ බලපෑමක් ඇති බලපත්‍රලාභී වාණිජ බැංකු 03 ක් සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු 04 ක් මෙම දෙපාර්තමේන්තුවේ සුපරීක්ෂණයට භාජනය කර ඇත.

බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ලියාපදිංචි බැංකු නොවන, මූල්‍ය සමාගම්වල නියාමනය සහ සුපරීක්ෂණය කරගෙන යනු ලබයි. ඒ අනුව, රජය විසින් පාලනය කරනු ලබන හෝ අරමුදල් සපයා ඇති බැංකුවලට සම්බන්ධිත ආයතන සහ බැංකු නොවන මූල්‍ය සමාගම් මෙම දෙපාර්තමේන්තුවේ සුපරීක්ෂණය යටතට පැවරේ.

ආ) මුදල් නීති පනතේ 113 වගන්තිය ප්‍රකාර රාජ්‍ය ණය කළමනාකරණය කිරීමේ ක්‍රියාපටිපාටිය, මුදල් මණ්ඩලය හා බැංකුව සතු වේ. ඒ අනුව, රජයේ නියෝජිතයා ලෙස, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් අයවැය අවශ්‍යතා සහ දේශීය හා විදේශීය ණය සේවා සපුරා ගැනීම සඳහා දේශීය වෙළෙඳපොළට සුරැකුම්පත් නිකුත් කිරීම කරනු ලැබේ. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය ණය කළමනාකරණය හා ණය වෙළෙඳපොළ සංවර්ධනය කිරීම කරනු ලබයි. රජයේ අවශ්‍යතා හා එහි පියවීම් බැරකම් සපුරාලීම සාක්ෂාත් කර ගැනීම සඳහා රාජ්‍ය ණය පරිපාලනය කිරීම මෙම දෙපාර්තමේන්තුව විසින් කරනු ලැබේ.

ඇ) මුදල් නීති පනතේ 49 වගන්තිය ප්‍රකාර, මුදල් නිකුත් කිරීමේ තනි අයිතිය හා බලතල බැංකුව සතු වේ. ඒ අනුව බැංකුවේ ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව, නෛතික ව්‍යවහාර මුදල් නිකුත් කිරීමේ තනි බලධාරියා ලෙස කටයුතු කරයි. මුදල් නෝට්ටු මුද්‍රණය කිරීමේ කාර්යය ඩී ලා රූ ලංකා කරන්සි ඇන්ඩ් සෙකියුරිටි ප්‍රින්ට් (පුද්) සමාගම විසින් කරගෙන යනු ලැබේ. මෙහි කොටස් හිමිකමෙන් 40% දරන්නේ රජයයි.

ඈ) බැංකුව සාමාන්‍යයෙන් මෙහෙයුම් කටයුතු කරගෙන යාමේ දී, විවිධ භාණ්ඩ හා සේවා ලබා ගැනීම සඳහා රාජ්‍ය ආයතන හෝ රජයේ සුවිශේෂ බලපෑමක් හෝ පාලනයක් ඇති ආයතන සමග ගනුදෙනුවලට එළඹෙනු ලැබේ.

ඉ) සටහන් අංක 50 හි පැහැදිලි කර ඇති පරිදි බැංකුව භාරකරු සහ අනෙකුත් විශ්වාසනා තත්ත්වයන්හි කටයුතු කිරීම මගින් රජය, භාරයන්, විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් සහ අනිකුත් ආයතන වෙනුවෙන් වත්කම් සහ බැරකම් දැරීම හෝ ස්ථාපනය කිරීම සාමාන්‍යයෙන් සිදුකරනු ලැබේ.

ඊ) මුදල් නීති පනතට යටත්ව බැංකුවේ ජාත්‍යන්තර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් දේශීය, විදේශීය විනිමය වෙළෙඳපොළෙහි සංවර්ධනය හා වාණිජ බැංකුවල එක් දින විවෘත විදේශ විනිමය තත්ත්වය සුපරීක්ෂණය කරනු ලැබේ. දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ සංවර්ධනය සුපරීක්ෂණයේ දී ශ්‍රී ලංකා රුපියලේ විනිමය අනුපාතය දැඩි ලෙස වෙනස්වීම ලිහිල් කිරීමේ අරමුණින් බැංකුව වෙළෙඳපොළෙහි මෙම අංශ දෙකෙහි ම නියැලෙන්නේය. විදේශ විනිමය මිලට ගැනීම් සහ විකුණුම් ප්‍රමාණයන් එම සුපරීක්ෂණයේ ප්‍රතිඵල නියෝජනය කෙරේ.

උ) එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් විමර්ශනය වෙනුවෙන් ගෙවූ උපදේශණාත්මක හා වෘත්තීමය ගාස්තු මෙමගින් නිරූපණය කරයි. මෙම ගෙවීම් පරිපාලන හා අනිකුත් වියදම් යටතේ වාර්තා කර ඇත.

ඌ) දේශීය මෙහෙයුම් දෙපාර්තමේන්තුව, 1949 අංක 58 දරණ මුදල් නීති සංශෝධිත පනතේ 90-92 වගන්ති ප්‍රකාර, බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමේ කාර්යයන් ලෙස විවෘත වෙළෙඳපොළ මෙහෙයුම් කටයුතුවල නියැලීම, මුදල් නීති පනතේ 93-98 වගන්ති ප්‍රකාර, නෛතික සංචිත පවත්වා ගැනීමේ අවශ්‍යතාව බලාත්මක කිරීම හා රජයේ කොටස් හිමිකම් ඇති වාණිජ බැංකුවල හා අනෙකුත් සමහරක් මූල්‍ය ආයතන හා රාජ්‍ය ආයතනවල බැංකුකරු ලෙස කටයුතු කරයි. 2016 දෙසැම්බර් 31 දිනට මෙම කාර්ය කිරීමේ දී උද්ගත වූ මුළු ශේෂය සටහන් 21 හා 22 හි දක්වා ඇත. රජයේ සුරැකුම්පත් මත උපයාගත් පොළිය 31 සටහනෙහි දැක්වේ.

එ) රජයේ පාලනයට යටත් එක් බැංකුවක භාරකාරත්ව විධිවිධානවල බැංකුව නියැලුන අතර ඒ සඳහා ගාස්තුවක් අය නොකෙරුණි.

ඒ) බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් නිකුත් කරන ලද චක්‍රලේඛයට අනුව, කෘෂිකර්මාන්තය සඳහා අවම අත්තිකාරම් සීමාව වූ 10% පවත්වාගෙන යනු නොලබන බැංකු විසින්, එම හිග මුදල ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක ප්‍රතිමූල්‍ය අරමුදලට ආයක කළ යුතුය. මේ යටතේ 2016 දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මහජන බැංකුව රු.මි. 25.57 (2015 - රු.මි. 99.42), ලංකා බැංකුව රු.මි. 7.71 (2015 - රු.මි. 21.21), ප්‍රාදේශීය සංවර්ධන බැංකුව රු.මි. 23.42 (2015 රු.මි. 64.63) හා ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව රු.මි. 7.78 (2015 රු.මි. 15.19) හරහා රු.මි. 64.48 ණය ප්‍රතිමූල්‍යනය කර ඇත. එමගින් රු.මි. 97.36 ක පොළියක් උපයා ඇත.

ඔ) තනි වශයෙන් ගත්කල සුවිශේෂී නොවන, රජය, රජයේ දෙපාර්තමේන්තු සහ රජය මගින් පාලනය වන ආයතන සමග බැංකුව විසින් සිදුකල ගනුදෙනුවල ශේෂයන්, අනෙකුත් ශේෂයන් හි ඇතුලත් වේ.

**48.2 ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය සමග ගනුදෙනු**

අධිපති ඇතුළු මුදල් මණ්ඩලයේ සාමාජිකයන් (මුදල් නීති පනතට අනුව මෙම සාමාජිකයින් හට වෙනත් කිසිදු බැංකු ආයතනයක අධ්‍යක්ෂකධුරයක්, නිලධාරී තනතුරක්, සේවකයෙක් හෝ කොටස් හිමියෙක් විය නොහැක.), නියෝජ්‍ය අධිපතිවරුන්, සහකාර අධිපතිවරුන් හා කළමනාකරණ විගණන අංශයේ අධ්‍යක්ෂක ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලයට ඇතුළත් වේ. ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය බැංකුව සමග සිදුකරන ලද ගනුදෙනු පහත පරිදි වේ.

**48.3 ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය වෙත කළ ගෙවීම් :**

| | 2016 | 2015 |
|---|---|---|
| | රු. 000 | රු. 000 |
| කෙටිකාලීන සේවක ප්‍රතිලාභ | 123,948 | 107,904 |

මෙයට අමතරව ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය සඳහා ඔවුන්ගේ සේවා ගිවිසුම්වලට යටත්ව මූල්‍ය නොවන ප්‍රතිලාභ ද සපයනු ලැබේ.

**48.4 ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලයේ සාමාජිකයන් සමග වූ වෙනත් ගණුදෙනු**

| | 2016 | 2015 |
|---|---|---|
| | රු. 000 | රු. 000 |
| කළමනාකරණ කාර්යය මණ්ඩලයේ සාමාජිකයන් හට දුන් ණය | 57,793 | 46,600 |

මෙම ණය සඳහා අදාළ වන පොළී අනුපාතයන් සියයට 2 සිට සියයට 7 දක්වා පරාසයන්හි වන අතර, මාසිකව ගෙවනු ලබන එම සියළු ණය ප්‍රමාණවත් පරිදි ආරක්ෂිත කොට ඇත.

**48.5 පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම් සමග ගනුදෙනු**

| | 2016 | 2015 |
|---|---|---|
| | රු. 000 | රු. 000 |
| ගෙවන ලද සහ ගෙවිය යුතු ආයකය | 69,511 | 68,382 |

සටහන් අංක 45 හි දක්වා ඇති පරිදි බැංකුව විසින් විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවා විශ්‍රාම සැලසුම් සඳහා විවිධ මුදල් ප්‍රමාණවලින් දායක වූ අතර රු.මි. 559.67 ක් (2015 - රු.මි. 559.38) සේවක අර්ථසාධක අරමුදලට ගෙවන ලදී.

සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලදී බැංකුව විසින් ස්වකීය පශ්චාත් සේවා සැළසුම් සඳහා බැංකු සහ මූල්‍ය සේවා සපයනු ලබයි. එවැනි සැළසුම් වල ශේෂයන් 24 සටහනෙහි දක්වා ඇත.

**49. අසම්භාව්‍ය වගකීම් සහ ප්‍රාග්ධන බැඳීම්**

**49.1 මූල්‍ය ඇප කොන්ත්‍රාත්**

රජයේ හෝ එහි නියෝජිතයන්ගේ සහ ආයතනවල නියෝජිත ලෙස ක්‍රියාකරමින්, මහා භාණ්ඩාගාරය විසින් බැංකුව වෙත නිකුත් කරනු ලබන ප්‍රති ඇප මත විවිධ පාර්ශ්වයන්ට ඇප සපයනු ලැබේ. 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ එවැනි ඇප කිසිවක් නොවීය.

**49.2 ණය ඇප**

බැංකුවෙහි ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ (ප්‍රා.සං.දෙ.) කාර්යයන් වන්නේ පිටස්තර ණය මාර්ග තුළින් ලැබෙන මුදල් සහභාගී මූල්‍ය ආයතන මගින් ප්‍රතිමූල්‍යකරණ ණය ලෙස සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට ලබාදීම, එම ව්‍යවසායකයින් සඳහා ණය ඇපවීම් නිකුත්කිරීම, ඇප වාරික රැස්කිරීම, ණය පැහැරහැරීම් මගහැරවීම සඳහා හා එම ණය නිසිපරිදි යෙදවෙන බවට සාක්ෂාත් කර ගැනීම සඳහා ණය ඇපකරු අරමුදල් පරිපාලනය සහ පශ්චාත් ණය සුපරීක්ෂණයයි. මෙම වැඩපිළිවෙල යටතේ ලබාදුන් ණය සම්බන්ධයෙන් සහභාගි මූල්‍ය ආයතනවලට සිදුවිය හැකි පාඩු ආවරණය සැපයීම සඳහා ප්‍රතිමූල්‍ය පහසුකම් සැපයීම ප්‍රා.සං.දෙ. විසින් සමාලෝචිත වර්ෂය තුළ දී අඛණ්ඩව සිදු කරන ලදී. මෙය ණය පැහැර හැරීමේ ප්‍රමාණය මත වන ආවරණයක් නොවන අතර සහභාගී වන මූල්‍ය ආයතන මගින් ණය ලබාදුන් පාර්ශවයන්ගෙන් ණය ආපසු අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ගැනීමෙන් පසු, ඉතිරිවන පාඩු සඳහා වන ආවරණයකි. ණය අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ගැනීමෙන් අනතුරුව සිදුවිය හැකි පාඩු පිළිබඳව සහභාගි මූල්‍ය ආයතන විසින් කරනු ලබන ඉල්ලීම් පමණක් සලකා බැලීම මෙහි අර්ථය වේ. මෙම වැඩපිළිවෙල මගින් උද්ගත වන අසම්භාව්‍ය බැරකම් පහත දැක්වේ.

**දේශීය වාණිජ බැංකු - ණය ඇප සඳහා :**

| | ණය ඇප සපයූ මුදල් වර්ගය | නොපියවා පැවැති ඇප ප්‍රමාණය 2016 රු. 000 | 2015 රු. 000 |
|---|---|---|---|
| **සම්බන්ධිත පාර්ශ්වයන්** | රුපියල් | | |
| බැංකුව විසින් අරමුදල් සැපයූ යෝජනා ක්‍රම | | 54,799 | 2,310,793 |
| රජය විසින් අරමුදල් සැපයූ යෝජනා ක්‍රම | | 1,878,523 | 3,978,055 |
| **අනිකුත්** | රුපියල් | | |
| බැංකුව විසින් අරමුදල් සැපයූ යෝජනා ක්‍රම | | 5,311 | 220,609 |
| රජය විසින් අරමුදල් සැපයූ යෝජනා ක්‍රම | | 213,748 | 315,680 |
| **මුළු ණය ඇප ප්‍රමාණය** | | 2,152,381 | 6,825,138 |

**49.3 විශ්වස්ත ක්‍රියාකාරකම්**

මුදල් නීති පනත අනුව බැංකුව විසින් විශ්වස්ත ක්‍රියාකාරකම් කරගෙන යනු ලබයි. ඒ අනුව ක්‍රියාකිරීමේ දී විවිධ පාර්ශ්වයන් සඳහා වත්කම් දැරීම හෝ ස්ථාපනය කිරීම ද කරනු ලැබේ. කෙසේ වුවද එසේ කිරීමෙන් කිසියම් බැරකමක් ඇතිවේ යැයි බැංකුව අපේක්ෂා කරනු නොලැබේ.

**49.4 නෛතික හිමිකම්**

අදාළ ආයතනයෙහි ඇල්මැති පාර්ශ්වයන් විසින් රු.මි. 35 ක් සඳහා හිමිකම්පාමින් ගොනු කර ඇති නඩුවක බැංකුව විත්තිකරු වේ. මෙම පැමිණිල්ලට එරෙහිව බැංකුව අභියෝග කරන බැවින් මූල්‍ය ප්‍රකාශනවල මේ සඳහා ප්‍රතිපාදන සලසා නොමැත.

බැංකුව, හානි රු.මි. 16.57 කට හිමිකම් පාමින් ගොනුකර ඇති නඩු 2 කට පැමිණිලිකරු වන අතර ඒ වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොමැත.

තවද, බැංකුවට එරෙහිව නීති කෘත්‍යන් ගණනාවක් 2016 දෙසැම්බර් 31 දිනට පරිශේෂව තිබුණි. මේ සම්බන්ධයෙන් සැලකිය යුතු පාඩුවක් බැංකුවට ඇති නොවේය යනු බැංකුවේ මතය බැවින් ඒ සඳහා ප්‍රතිපාදන සලසා නොමැත.

**49.5 බැඳීම්**

(අ) 2016 දෙසැම්බර් 31 දිනට දේපළ, පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම වෙනුවෙන් රු.මි. 148.30 (2015 රු.මි. 405.53) ප්‍රාග්ධන බැඳීමක් බැංකුව විසින් ඇති කර ගෙන තිබේ.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට ඉදිරි හුවමාරු ගණුදෙනු මෙසේය.

| | 2016 රු. 000 | 2015 රු. 000 |
|---|---|---|
| **ඉදිරි විනිමය කොන්ත්‍රාත්තු** | | |
| ඉදිරි විනිමය විකුණුම් | | |
| - ඇමරිකා එක්සත් ජනපද ඩොලර් | 2,501,145 | 2,416,415 |
| - ස්විඩන ක්‍රෝනය | 58 | - |
| ඉදිරි විනිමය මිලදී ගැනීම් | | |
| - ඇමරිකා එක්සත් ජනපද ඩොලර් | 15,998 | 249,810 |

**49.6 වත්කම් ඔඩපන කිරීම**

සුරැකුම්පත් බේරුම් ක්‍රියාවලිය පහසුකරලීම සඳහා බැංකුව ඕස්ට්‍රේලියානු ඩොලර් මිලියන 35 - ධාරණ අගය - ඕස්ට්‍රේලියානු ඩොලර් මිලියන 36.02 (2015 - ඕස්ට්‍රේලියානු ඩොලර් මිලියන 35 - ධාරණ අගය - ඕස්ට්‍රේලියානු ඩොලර් මිලියන 36.29) යූරෝ ක්ලියර් බැංකුවට ඔඩපන කොට ඇ.එ.ජ ඩොලර් මිලියන 30 (2015 - ඇ.එ.ජ. ඩොලර් මිලියන 30) ණය පහසුකම් ලබාගෙන ඇත. ඔඩපන කරන ලද සුරැකුම්පත් යූරෝ ක්ලියර් හි වෙනම ගිණුමක රඳවා ඇත.

එම සුරැකුම්පත් මූල්‍ය තත්ව ප්‍රකාශනය තුළ 'අලවි කළ හැකි සුරැකුම්පත්' ලෙස ඉදිරිපත් කර තිබේ. "Collateral Agreement Governing Secured Borrowings by participants in the Euroclear System" හා "General Conditions Governing Extensions of credit to participants in the Euroclear System" යන මාර්ග නිර්දේශයන් මත පදනම් වී එකී ගණුදෙනු බැංකුව විසින් හසුරවනු ලැබේ.

**50. භාර සහ භාරකාරත්ව ක්‍රියාකාරකම්**

බැංකුව, සාමාන්‍යයෙන් භාරකරුවකු ලෙස හා අනෙකුත් විශ්වාසනීය තත්ත්වයන්හි ක්‍රියාකිරීමේ ප්‍රතිඵලයක් ලෙස රජය, භාරයන්, විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් සහ අනිකුත් ආයතන වෙනුවෙන් වත්කම් සහ බැරකම් දැරීම හෝ ස්ථාපනය කිරීම සිදු කරනු ලැබේ. බැංකුව විසින් ඉටු කරනු ලබන සැලකිය යුතු භාර ක්‍රියාකාරකම් පහත සඳහන් පරිදි වේ.

අ) විවිධ විදේශීය ණය සහ විදේශ අරමුදල් යොදන සංවර්ධන ව්‍යාපෘති සහ ණය යෝජනා ක්‍රම සඳහා වන ප්‍රදානයන්හි ණය මුදාහැරීම සහ ආපසු ගෙවීම් බැංකුව විසින් ශ්‍රී ලංකා රජය (ශ්‍රී.ලං.ර) වෙනුවෙන් සිදු කිරීම කරනු ලැබේ. තවද ශ්‍රී ලංකා රජය වෙනුවෙන් විවිධ විදේශීය ණය සහ ප්‍රදානයන් යටතේ ප්‍රතිපාර්ශ්වීය අරමුදල් රැස්කර ප්‍රදානය කරන නියෝජිත ආයතනයන්ගේ ඉල්ලීම පරිදි එම අරමුදල් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කරනු ලැබේ.

ආ) බැංකුව සේවක අර්ථසාධක අරමුදලේ (සේ.අ.අ) භාරකාරත්වය උසුලයි. ඒ අනුව, පනතේ විධි විධාන ප්‍රකාර දායක මුදල් ලබා ගැනීම, අධිභාර ලබාගැනීම, ආයෝජනවලින් ආදායම ලබා ගැනීම, සේ.අ. අරමුදලේ ලියාපදිංචි සාමාජිකයන්ගේ ගිණුම් පවත්වාගෙන යාම, අතිරික්ත මුදල් ආයෝජනය සහ සාමාජිකයින්ට ප්‍රතිලාභ ගෙවීම මුදල් මණ්ඩලයේ කාර්යයන්ට ඇතුළත් වන්නේය.

ඇ) ශ්‍රී ලංකා මහ බැංකුවෙහි බලපත්‍රලාභී බැංකු ආයතන සහ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි, බැංකු ව්‍යාපාරයෙහි යෙදී සිටින සමුපකාර සමිති සඳහා විවෘතව ඇති ස්වේච්ඡා තැන්පත් රක්‍ෂණ යෝජනා ක්‍රමයක් වන "තැන්පතු රක්‍ෂණ යෝජනා ක්‍රමය" බැංකුව විසින් පරිපාලනය කර ඇත. 2010 ඔක්තෝබර් 01 දා සිට එම යෝජනා ක්‍රමයෙහි ඇති අරමුදල්, 2010 සැප්තැම්බර් 28 දා තම, ගැසට් අංක 1673/11 යටතේ පිහිට වූ "ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය" වෙත පවරා ඇත.

ඈ) 2010 සැප්තැම්බර් 28 දාතම වූ 1673/11 අංක දරණ ගැසට් පත්‍රය අනුව 2010 ඔක්තෝබර් 01 දා සිට බැංකුව විසින් "ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය" නමින් පාලිත තැන්පතු රක්ෂණ ක්‍රමයක් ජාතික අවශ්‍යතාවයක් ලෙස තැන්පත්කරුවන්ගේ අරමුදල් ආරක්ෂාව වෙනුවෙන් පිහිටුවා ඇත.

සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු හා ලියාපදිංචි මූල්‍ය සමාගම් මෙම යෝජනා ක්‍රමයේ සාමාජිකයන් වේ. ඒ අනුව, මෙහි සමස්ථ සාමාජිකයන් ගණන 77 කි. ගැසට් පත්‍රයේ 5.2 වගන්තියට අනුව විශේෂිත අතහැරීම් හා සියලුම ණය උපකරණ හැර සාමාජික ආයතනයන්හි ඉල්ලුම් තැන්පතු, කාලීන තැන්පතු සහ ඉතිරිකිරීමේ තැන්පතු වගකීම් රක්ෂණය කෙරේ.

රු.මි. 350.20 ක් වූ ස්වේච්ඡා තැන්පත් රක්ෂණ යෝජනා ක්‍රමයෙහි ආයෝජන හා රු.මි. 1,168.31 ක් වූ වාණිජ බැංකුවල අත්හල දේපළ තුළින් කරන ලද ආයෝජන පැවරීමෙන් මෙම තැන්පතු රක්ෂණ අරමුදල පිහිටුවා ඇත. 2016 දෙසැම්බර් 31 දිනට එම අරමුදලේ ප්‍රමාණය රු. බිලියන 34.30 ක් (තාවකාලික) වන අතර, දැනට මෙම අරමුදලෙන් තැන්පතු හිමියෙකුට ගෙවන වන්දි මුදල් ප්‍රමාණය එක් මූල්‍ය ආයතනයක් සඳහා රු.මි. 0.30 ක් හෝ විදේශ විනිමය තැන්පතු සඳහා ඊට සමාන මුදලකි.

වන්දි ගෙවීම බැංකුවේ හෝ මුදල් මණ්ඩලයේ වගකීමක් නොවන අතර තැන්පත් අරමුදල විසින් එසේ ගෙවිය යුතු මුළු වන්දි මුදල් ප්‍රමාණය තැන්පත් අරමුදලේ අවසරලත් ණය සහ එකතු වී ඇති වාරික මුදල් ද ඇතුළුව තැන්පතු රක්ෂණ අරමුදලෙහි රැස් වී ඇති, පවත්නා මුදල් ප්‍රමාණයට සීමා විය යුතුය. නැතහොත් අවසරලත් ණය ගැනීම් හා ලැබුණු දායක මුදල්වලින් තැන්පතු රක්ෂණ අරමුදල ඉහළ දැමිය හැකිය. අරමුදලේ බැරට ඇති මුදල් ප්‍රමාණය ඉක්මවා යන කිසිදු වගකීමකට මුදල් මණ්ඩලය හා බැංකුව වගකියනු නොලැබේ.

යෝජනා ක්‍රමයේ මෙහෙයුම් හා කළමනාකරණ කටයුතු බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ පිහිටුවා ඇති ඒකකය මගින් සිදුකරන අතර බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවලින් වෙන්වූ පොත් හා ගිණුම් පවත්වාගෙන යනු ලැබේ. විගණනය භාරව විගණකාධිපති කටයුතු කරයි.

මෙම යෝජනා ක්‍රමය සහ අරමුදල 2013 නොවැම්බර් 22 වන දින සිට පිළිවෙලින් "ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය" සහ "ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක අරමුදල" ලෙස නම් කරන ලදී.

ඉ) ලියාපදිංචි මූල්‍ය සමාගම් විධිමත් කිරීම හා සුපරීක්ෂණ කටයුතු, මුදල් මණ්ඩලය විසින් පවරා ඇති බලතල ප්‍රකාරව, බැංකුව විසින් සිදුකරයි. එසේ ක්‍රියාකිරීමේ දී ආරක්ෂිත ක්‍රියාමාර්ගයක් ලෙස එම ස්වශක්තිතාවයන් නොමැති හා බුන්වත් වූ මූල්‍ය සමාගම්වල වගකිවයුතු පුද්ගලයන් ගේ වත්කම් මුදල් මණ්ඩලය වෙත පවරාගැනීම ද කරනු ලබයි.

ඊ) බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් නිකුත් කරන ලද චක්‍රලේඛනය අනුව, කෘෂිකාර්මික කටයුතු සඳහා මුළු අත්තිකාරම්වලින් 10% ක අවමය පවත්වාගෙන නොමැති බැංකු එම හිඟ මුදල ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව (ප්‍රා.සං.දෙ.) විසින් පවත්වාගෙන යනු ලබන ප්‍රතිමූල්‍ය අරමුදලට දායක කළ යුතු වේ. ප්‍රා.සං.දෙ. එසේ එකතු කළ මුදල් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව, ලංකා බැංකුව සහ මහජන බැංකුව තුළින් කෘෂිකාර්මික කටයුතු සඳහා "විස්කම්" ප්‍රතිමූල්‍ය ක්‍රමය යටතේ ප්‍රතිමූල්‍ය පහසුකම් සපයනු ලැබේ. 2016 දෙසැම්බර් 31 දිනට එසේ රැස්කළ මුළු මුදල රු.මි. 554.26 (2015 - රු.මි. 40.11) කි. වර්ෂය අවසන් දින වන විට ප්‍රාදේශීය සංවර්ධන දෙපා. විසින් රු. මි. 64.48 (2015 රු.මි. 200.45) මුදලක ණය ලබා දී ඇති අතර එමගින් රු. මි. 97.36 පොළී ආදායමක් උපයන ලදී. තවද රු.මි. 193.86 (2015 රු.මි. 188.18) ක් එම ආයෝජනවල ආදායම ලෙස උපයා ඇත.

උ) බැංකුවේ මුදල් මණ්ඩලය වෙනුවෙන්, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව, විදේශීය දායකයන්ගේ හා ශ්‍රී ලංකා රජය අරමුදල් සපයන ව්‍යාපෘති සඳහා ශ්‍රී ලංකා රජයේ විශේෂිත නියෝජිතයෙකු ලෙස කටයුතු කරයි. තව ද ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අරමුදල් සපයන ව්‍යාපෘතිද ක්‍රියාවට නැංවීම ඉටු කරයි.

## නිමකර අවසන් ව්‍යාපෘති

| ව්‍යාපෘතියේ නම | මුළු අරමුදල් වෙන් කිරීම (මිලියන) | | ණය මුදලේ අරමුණ | සහභාගිත්ව මූල්‍ය ආයතන සඳහා ප්‍රතිමූල්‍ය ප්‍රතිපාදන (රුපියල් මිලියන) | වැදගත් ලක්ෂණ | වගකීම් හා සහතික වීම් | පොදු කොන්දේසි | විශේෂ කොන්දේසි |
|---|---|---|---|---|---|---|---|---|
| තේ සංවර්ධන ව්‍යාපෘතිය | ඇ. ඩොලර් | 24.50 | කුඩා පරිමාණ තේ වතු හිමියන්ගේ ආදායම වැඩිකිරීම හා ව්‍යාපෘති කලාපවල ස්වභාවික පරිසරය සංවර්ධනය | 2,550.90 | නියමිත දිනට සහභාගීත්ව මූල්‍ය ආයතනවලින් ප්‍රතිමූල්‍ය එක්රැස් කිරීම සහ අවසානයේදී නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම් වෙත මාරු කිරීම | | | |
| දෙවන බහුවාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය | වි. ගැ. හි. | 11.56 | බහු වාර්ෂික භෝග අංශය වාණිජ්‍යකරණය, නිෂ්පාදන වැඩි දියුණු කිරීම, තවාන් සංවර්ධනය, පසු අස්වනු පාලනය, සැකසීම හා අලෙවිකරණය | 1,453.11 | | | | |
| වැවිලි අංශය ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය | ඇ. ඩොලර් | 40.00 | ශ්‍රී ලංකාවේ භෝග කර්මාන්තයේ භෝග අනු අංශ වල ප්‍රතිපත්ති හා ආයතනමය ප්‍රතිසංස්කරණ වලට සහාය දීම, නිෂ්පාදනය හා ලාභදායිත්වය වැඩිදියුණු කිරීම, තරඟකාරී වාසිය පවත්වා ගැනීම | 5,200.00 | | | | |
| සුසහන මූල්‍ය හා කල්බදු සමාගම | රුපියල් | 352.69 | සුනාමියෙන් බලපෑමට ලක්වූ ව්‍යාපාරයන් නැවත නගා සිටුවීම | 351.06 | | | | |
| කුඩා ව්‍යාපාර නගා සිටුවීමේ වැඩසටහන | රුපියල් | 2,656.00 | සුනාමියෙන් බලපෑමට ලක්වූ කුඩා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන් නැවත නගා සිටුවීම සඳහා ණය පහසුකම් ලබා දීම | 2,663.40 | | | | |
| කුඩා ව්‍යාපාර නගා සිටුවීමේ වැඩසටහන - චක්‍රිය අරමුදල | රුපියල් | 150.00 | සුනාමිය මගින් බලපෑමට ලක්වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන් නැවත ආරම්භ කිරීම සඳහා ණය පහසුකම් ලබා දීම | 122.72 | | | | |
| හැකියා සංවර්ධන ව්‍යාපෘතිය | රුපියල් | 94.31 | ගුණාත්වයෙන් අනූන ශ්‍රම බලකායක් බිහි කිරීම සඳහා අවශ්‍ය හැකියා පුහුණු වැඩසටහන් වල අදාලත්වය සහ ගුණත්වය වැඩිදියුණු කිරීම හා හැකියා නොගැලපීම් ආමන්ත්‍රණය කිරීම | 94.59 | | | | |
| නාගරික පාරිසරික යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය | ඇ.ඩොලර් | 4.00 | නාගරික හා අර්ධ නාගරික ප්‍රදේශවල ජීවත් වන ජනතාවගේ පාරිසරික සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් වර්ධනය කිරීම | 369.15 | | | | |
| අඩු ආදායම් නිවාස සෙවණ ණය ඇපකර ව්‍යාපෘතිය | ඇ. ඩොලර් | 25.00 | රටේ අඩු ආදායම්ලාභී ජනතාවට නිවාස ගොඩනැගීම අළුත්වැඩියාව සහ ඔවුන්ගේ වාසස්ථාන ව්‍යාප්ත කිරීමට ආධාර කිරීම. | 1,362.00 | | | | |
| නාගරික සංවර්ධන අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය | වි.ගැ.හි | 15.10 | අඩු ආදායම් කුටුම්භ වල නිවාස සංවර්ධනයට ආධාර කිරීමක් වශයෙන් ප්‍රාග්ධනය සපයා දීම | 1,915.76 | | | | |
| වයඹ පලාත් ජලසම්පත් සංවර්ධන ව්‍යාපෘතිය | ඇ. ඩොලර් | 1.80 | ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන ප්‍රදේශවල මිනිසුන්ගේ ආර්ථික, සමාජීය හා පෝෂණ ශුභ සාධනය වැඩි දියුණු කිරීම. | 102.76 | | | | |
| මාතලේ ප්‍රාදේශීය ආර්ථිකය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | වි.ගැ.හි | 2.00 | කුඩා ව්‍යවසායකයින්ගේ ආදායම් වර්ධනය හා ස්ථිර කිරීම | 249.06 | | | | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| රට මැද බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය | වි. ගැ. හි. | 11.56 | රට මැද බහුවාර්ෂික භෝග නිෂ්පාදනය නගා සිටුවීමට ණය පහසුකම් සැලසීම | 642.00 | | | | |
| කෘෂිකාර්මික පුනරුත්ථාපන ව්‍යාපෘතිය. | වි. ගැ. හි. | 17.05 | සිවිල් අර්බුද වල බලපෑමට ලක්වූ උතුරු නැගෙනහිර පළාත් හා මායිම් දිස්ත්‍රික්ක පහ තුළ පවතින මිනිස් ජීවිත හා දේපල නැවත නගා සිටුවීම | 843.00 | | | | |
| කුඩා තේ වතු හිමියන් සංවර්ධන ව්‍යාපෘති | ඇ. ඩොලර් | 12.60 | කුඩා තේ වතු හිමියන් සංවර්ධනය කිරීම හා තේ වතු පහසුකම් පුනරුත්ථාපනය කිරීම | 645.93 | | | | |
| දිළිඳු බව පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘතිය | ජපන් යෙන් | 1,368.00 | ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සඳහා විධිමත් ලෙස ණය යොමු කිරීමට ඵලදායී ණය බෙදාහැරීමේ යාන්ත්‍රණයක් ඇති කිරීම | 1,402.45 | | | | |
| ඉඩම් අහිමි කුඩා පරිමාණ ගොවි ණය ව්‍යාපෘතිය | ඇ. ඩොලර් | 17.40 | අඩු ආදායම් ලබන්නන් සඳහා රැකියා උත්පාදනය කිරීමටත්, ඉතිරිකිරීමේ පුරුදු වර්ධනයටත් පිරිවැය ඵලදායී සහ ශක්තිමත් ක්ෂුද්‍ර ණය බෙදැහැරීමේ ක්‍රමයක් ස්ථාපිත කිරීම | 345.69 | | | | |
| කෑගල්ල සමෝධාන ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය | වි. ගැ. හි. | 1.50 | ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සඳහා අනුග්‍රහය ලබාදීම මගින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක ප්‍රදේශ වල මිනිසුන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම | 148.00 | | | | |
| දකුණු පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය | වි. ගැ. හි. | 27.90 | දකුණු පළාත් මිනිසුන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම | 564.00 | | | | |
| EIB ගිවිසුම් B | යූරෝ | 10.00 | සුනාමි මගින් සෘජු බලපෑමට ලක්වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් නැවත නගා සිටුවීම | 1,553.27 | | | | |
| සුසහන ණය යෝජනා ක්‍රමය | රුපියල් | 3,000.00 | සුනාමියෙන් හානි වූ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ණය පහසුකම් ප්‍රතිපාදනය | 2,750.00 | සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් නැවත අයකරගත් අරමුදල් නියමිත දිනට මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුවට මාරු කළ යුතුය. | | | |
| සුසහන අදියර II | රුපියල් | 500.00 | සුනාමියෙන් හානි වූ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා ණය පහසුකම් ප්‍රතිපාදනය | 105.54 | | | | |
| පිබිදෙන උතුර | රුපියල් | 2.000.00 | උතුරු පළාත තුළ කෘෂිකාර්මික, පශු සම්පත්, ක්ෂුද්‍ර හා කුඩා ව්‍යාපාර සඳහා ණය පහසුකම් දීර්ඝ කිරීම | 2.000.00 | සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් නැවත අයකරගත් අරමුදල් නියමිත දිනට ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අදාල ගිණුම්වලට මාරු කිරීම් | | | |
| නැගෙනහිර පළාත තුළ ආර්ථික කටයුතු පුනරාරම්භය | රුපියල් | 1,000.00 | නැගෙනහිර පළාත තුල වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ණය පහ-සුකම් ප්‍රදානය කිරීම | 1,000.00 | | | | |
| පිබිදෙන උතුර අදියර II | රුපියල් | 2,154.25 | උතුරු පළාත තුළ කෘෂිකාර්මික, පශු සම්පත්, ක්ෂුද්‍ර හා කුඩා ව්‍යාපාර සඳහා ණය පහසුකම් දීර්ඝ කිරීම | 2,361.00 | | | | |
| දෙවන බහුවාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘති - චක්‍රීය අරමුදල | රුපියල් | 1,200.00 | රට තුළ බහුවාර්ෂික භෝග අංශයට ණය පහසුකම් සපයා දීම | 1,199.82 | | | | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| මාතලේ ප්‍රාදේශීය ආර්ථිකය වැඩිදියුණු කිරීමේ - චක්‍රීය අරමුදල | රුපියල් | 77.00 | ග්‍රාමීය ගොවි පවුල්වල ආදායම් වර්ධනය, ගොවි නොවන ව්‍යවසාය සංවර්ධනය සඳහා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව අරමුදල් සම්පාදනය හා එම දිස්ත්‍රික්කයේ පවත්නා ව්‍යාපෘති ප්‍රසාරණය | 77.00 | | | | |
| සබරගමු පළාත් ග්‍රාමීය සාමෝධානික සංවර්ධන ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල | රුපියල් | 100.00 | සබරගමු පළාතේ නව ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් ආරම්භ කිරීම හා වැඩි දියුණු කිරීම | 100.00 | | | | |
| ඉදිකිරීම් අංශය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | යූරෝ | 9.00 | පසු සුනාමි ප්‍රතිසංස්කරණ කටයුතු යටතේ ඉදිකිරීමේ හා මහජන කටයුතුවලට සක්‍රීයව සහභාගී වීම සඳහා දේශීය පෞද්. ව්‍යාපාරවල මූල්‍ය හා තාක්ෂණික ශක්‍යතා ශක්තිමත් කිරීම. | 1,399.73 | | | | |
| සබරගමු පළාත් ග්‍රාමීය සමෝධානික සංවර්ධන ව්‍යාපෘතිය (අදියර II) | රුපියල් | 70.00 | සබරගමු පළාතේ නව ආදායම් ක්‍රියාකාරකම් ආරම්භ කිරීම හා වැඩි දියුණු කිරීම | 70.00 | | | | |
| පසු සුනාමි වෙරළබඩ පුනරුත්ථාපන සම්පත් කළමණාකරණ ව්‍යාපෘතිය | වි.ගැ.හි | 2.09 | සුනාමියේ බලපෑමට ලක් වූ ජනතාවගේ වත්කම් නැවත ගොඩනංවා ගැනීම, ඔවුන්ගේ දෛනික ආර්ථික කටයුතු සඳහා පදනම දැමීම හා ආදායම උත්පාදන මාර්ග විවිධාංගීකරණය කිරීම සඳහා සහාය දීම. | 190.77 | | | | |
| දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘතිය II (ප්‍රබෝධිනී) | ජපන් යෙන් | 2,381.00 | ව්‍යාපෘති ප්‍රදේශයේ සිටින මාසික ආදායම රුපියල් 15,000 ට වඩා අඩු පවුල්වල ජීවන තත්ත්වය වර්ධනය කිරීම. | 3,213.20 | | | | |
| ස්වයං රැකියා ප්‍රවර්ධන මූලික ණය යෝජනා ක්‍රමය | රුපියල් | 250.00 | රටතුළ පිළිගත් වෘත්තීය පුහුණු ආයතනවලින් සමත් පුහුණු තරුණ තරුණියන්ට ස්වයං රැකියා ව්‍යාපෘති ගොඩනගා ගැනීමට මූල්‍ය සහනාධාර සැපයීම. | 232.39 | | | | |
| විස්කම් (කෘෂිකාර්මික අංශය සංවර්ධනය සඳහා වූ විශේෂ ණය යෝජනා ක්‍රමය) | රුපියල් | 1,325.60 | ආයෝජන සඳහා ණය ලබා ගැනීමේ හැකියාව තහවුරු කර ගැනීම, විවිධාංගීකරණය සහ වාණිජ කෘෂි ව්‍යාපාර ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම | 881.00 | සහභාගීත්ව බැංකු විසින් අනිවාර්ය අවශ්‍යතා සම්පූර්ණ කළ පසු අරමුදල් නැවත ලබාදීම සිදුකරයි. | | | |
| පළාත්බද සංවර්ධන ණය යෝජනා ක්‍රමය | රුපියල් | 2,900.00 | රට තුළ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශයේ මධ්‍ය හා දිගුකාලීන ව්‍යාපෘති සඳහා ණය පහසුකම් සැලසීම | 2,900.00 | සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් නැවත අයකරගත් අරමුදල් නියමිත දිනට මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව වෙත මාරු කල යුතුය. | | | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| වියළි කලාපීය ජීවනෝපාය හා හවුල්වීමේ ණය සහන වැඩසටහන | රුපියල් | 252.95 | අනුරාධපුර, මොණරාගල, කුරුණෑගල හා බදුල්ල දිස්ත්‍රික්කවල ආදායම ජනනය වන ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැපයීම | 252.95 | | | | |
| නැගෙනහිර පළාත තුළ ආර්ථික කටයුතු පුනරාරම්භය - අදියර II | රුපියල් | 1,078.27 | නැගෙනහිර පළාත තුළ කෘෂිකාර්මික හා පශු සම්පත් ක්ෂුද්‍ර ව්‍යාපාර හා කුඩා ව්‍යාපාර සඳහා ණය පහසුකම් දීර්ඝ කිරීම. | 1,000.00 | සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් නැවත අයකරගත් අරමුදල් නියමිත දිනට මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව වෙත මාරු කළ යුතුය. | | | |
| නැගෙනහිර පළාත තුළ ආර්ථික කටයුතු පුනරාරම්භය - අදියර III | රුපියල් | 1,000.00 | නැගෙනහිර පළාත තුළ කෘෂිකාර්මික පශු සම්පත් ක්ෂුද්‍ර ව්‍යාපාර හා කුඩා ව්‍යාපාර යන අංශ සඳහා ණය පහසුකම් දීර්ඝ කිරීම. | 1,428.47 | | | | |
| උතුරු හා නැගෙනහිර හානි වූ නිවාස ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන | රුපියල් | 600.00 | ගැටුම් පැවති කාල සීමා තුළ නැගෙනහිර හා උතුරු පළාත්වල හානියට පත් වූ නිවාස ප්‍රතිසංස්කරණය සඳහා ණය පහසුකම් සැපයීම | 600.00 | | | | |
| ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන | ඇ. ඩොලර් | 32.90 | වෙළෙඳපොළ වටිනාකම්දාම තුළ සිට ප්‍රයෝජනලාභීන්ගේ ආදායම් ඉහළ නැංවීම මගින් සුළු ඉඩම් හිමි නිෂ්පාදකයින් හා ඉඩම් අහිමි වූවන්, විශේෂයෙන් යෞවනයන්ට අරමුදල් සපයාදීම හා ආදායම් ඉහළ නැංවීම | 113.13 | | | | |

**ඉදිරියට යන ව්‍යාපෘති**

| ව්‍යාපෘතියේ නම | මුළු අරමුදල් වෙන් කිරීම (මිලියන) | | ණය මුදලේ අරමුණ | සහභාගිත්ව මූල්‍ය ආයතන සඳහා ප්‍රතිමූල්‍ය ප්‍රතිපාදන (රුපියල් මිලියන) | වැදගත් ලක්ෂණ | වගකීම් හා සහතික වීම් | පොදු කොන්දේසි | විශේෂ කොන්දේසි |
|---|---|---|---|---|---|---|---|---|
| තේ සංවර්ධන ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල | රුපියල් | 1,100.00 | තේ අංශය සංවර්ධනය සඳහා ණය පහසුකම් සපයාදීම. | 964.87 | | වගකීම් හා සහතිකවීම් නැත | මූල්‍ය ප්‍රකාශන බාහිර විගණකයින් විගණනය කළ යුතුය. | අදාල සියලුම පාර්ශ්වයන්ගේ එකඟතාවය නොමැතිව ගිවිසුම්වල අයිතිවාසිකම් හා බැඳීම්, පැවරීම් හෝ සංශෝධනය හෝ අහෝසි කිරීම හෝ අතහැර දැමීම සිදුකරනු නොලැබේ. |
| කුඩා පරිමාණ වැවිලි ව්‍යවසායකයින් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | වි.ගැ.හි | 2.60 | නුවර එළිය, මහනුවර, කෑගල්ල, මොණරාගල දිස්ත්‍රිකවල අඩු ආදයම් ලාභීන්ගේ ජීවන තත්වය උසස් කිරීම. | 487.66 | | | | |
| දිළිදුකම පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘතිය II චක්‍රීය අරමුදල (ප්‍රබෝධිනී) | රුපියල් | 2,764.84 | ව්‍යාපෘති ප්‍රදේශයේ සිටින මාසික ආදායම රු. 15,000 ට වඩා අඩු පවුල්වල ජීවන තත්වය වර්ධනය කිරීම. | 5,646.90 | | | | |
| ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන (NADeP) | රුපියල් | 743.00 | තෝරාගත් ව්‍යාපෘති ප්‍රදේශවල දිළිඳු ජනතාවගේ ආදායම් සහ සමාජ තත්ත්වය වර්ධනය කිරීම. | 730.70 | සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් නැවත අයකරගත් අරමුදල් නියමිත දිනට ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අදාල ගිණුම්වලට මාරු කිරීම් | | | |
| NADeP හි කොන්ත්‍රාත් ගොවීන්ගේ ණය යෝජනා ක්‍රමය යටතේ ඇති අගය දාම සංවර්ධන ප්‍රාග්ධන කෘෂිකාර්මික ණය යෝජනා ක්‍රමය | රුපියල් | 469.00 | කෘෂි නිෂ්පාදනයේ නිෂ්පාදනය, ඵලදායීතාවය, ගුණත්වය සහ අගය එකතු කිරීම් වැඩි කිරීම. | - | | | | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| NADeP හි කොන්ත්‍රාත් ගොවීන්ගේ ණය යෝජනා ක්‍රමය යටතේ ඇති අගය දාම සංවර්ධන ඍතුමය කෘෂිකාර්මික ණය යෝජනා ක්‍රමය | රුපියල් | 154.10 | කෘෂි නිෂ්පාදනයේ නිෂ්පාදනය, ඵලදායීතාවය, ගුණත්වය සහ අගය එකතු කිරීම් වැඩි කිරීම. | - | සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් නැවත අයකරගත් අරමුදල් නියමිත දිනට ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අදාල ගිණුම්වලට මාරු කිරීම් | වගකීම් හා සහතිකවීම් නැත | මූල්‍ය ප්‍රකාශන බාහිර විගණකයින් විගණනය කළ යුතුය. | අදාල සියලුම පාර්ශ්වයන්ගේ එකඟතාවය නොමැතිව ගිවිසුම්වල අයිතිවාසිකම් හා බැඳීම්, පැවරීම් හෝ සංශෝධනය හෝ අහෝසි කිරීම හෝ අතහැර දැමීම සිදුකරනු නොලැබේ. |
| තරුණ දිරිය NADeP | රුපියල් | 225.00 | කුඩා ව්‍යාපාර සහ අනෙකුත් ආකාරයේ ව්‍යවසායකත්ව ස්වයං රැකියා ව්‍යාපෘති සඳහා ණය පහසුකම් සැපයීම තුළින් ග්‍රාමීයමට්ටමේ දිලිඳු යෞවනයන්ගේ ජීවනෝපාය වර්ධනය කිරීම සඳහා උපකාරී වීම. | 19.60 | | | | |
| සුළු ගොවියන් හා ඉඩම් අහිමි වූවන් සඳහා වන ණය ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල | රුපියල් | 345.69 | සුළු පරිමාණ ගොවීන්ගේ කෘෂිකාර්මික නිෂ්පාදන වේගය වැඩිදියුණු කිරීම සහ සුළු පරිමාණ වගා නොවන ග්‍රාමීය ව්‍යවසායන් ස්ථාපනය කිරීම. | 1,542.69 | | | | |
| වියලි කලාපීය ජීවනෝපාය සහායවීමේ හා හවුල්වීමේ ණය වැඩසටහන - චක්‍රීය අරමුදල | රුපියල් | 252.90 | අනුරාධපුර, මොණරාගල, කුරුණෑගල සහ බදුල්ල දිස්ත්‍රික්කයන්හි ආදායම් ජනනය කරනු ලබන ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැපයීම. | 252.49 | | | | |
| දිළිඳුකම පිටුදැකීමේ ක්‍ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල | රුපියල් | 1,031.28 | අඩු ආදායම්ලාභී පවුල්වල ආර්ථික තත්වය ශක්තිමත් කිරීම. | 3,752.96 | | | | |
| සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය | රුපියල් | 18,890.89 | ක්ෂුද්‍ර කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් හා හානි වූ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් යන අංශ සදහා ණය පහසුකම් දීර්ඝ කිරීම. | 18,890.89 | | | | |
| ස්වයං රැකියා උත්පාදන මූලාරම්භක ණය අදියර II | රුපියල් | 75.00 | National Vocational Qualification (NVQ) හි සහතිකපත්‍ර හෝ ඩිප්ලෝමා පාඨමාලාවන් සම්පූර්ණ කරන ලද පුහුණු තරුණ තරුණියන්ට ස්වයං රැකියා ව්‍යාපෘති ගොඩනගා ගැනීමට මූල්‍ය සහනාධාර සැපයීම. | 74.90 | | | | |

### 51. අනෙකුත් ආයතන වෙත ඇති බැඳියාව

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරනු ලබන සුසහන, සුසහන අදියර II, පළාත් සංවර්ධන ණය ක්‍රමය, සෞභාග්‍යා ණය ක්‍රමය, පිබිදෙන උතුර ණය ක්‍රමය (අදියර II), නැගෙනහිර පළාත තුළ ආර්ථික කටයුතු ප්‍රතිශ්ඨාපනය කිරීමේ අදියර II සහ උතුරු හා නැගෙනහිර හානි වූ නිවාස ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසහටන සඳහා බැංකුව විසින් අරමුදල් සපයා ඇති අතර එහි ප්‍රාග්ධන ශේෂය හා හිඟ පොලී බැංකුවේ වත්කම් ලෙස වාර්තා කර ඇති අතර ආදායම බැංකුවේ ආදායම ලෙස සලකා ඇත.

තවද, ශ්‍රී ලංකා රජය විසින් අරමුදල් සපයන, ප්‍රදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවන ඇතැම් ව්‍යාපෘතිවල පරිපාලන වියදම් ආවරණය වෙනුවෙන් බැංකුව විසින් ප්‍රකාශිත ප්‍රතිශතයක් ලබා ගනී.

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘති සඳහා වූ බැංකුව විසින් නිකුත් කරන ලද ණය ඇපකර මත හටගත් අසම්භාව්‍ය වගකීම් සටහන් අංක 49.2 හි හෙළිදරව් කර ඇත.

### 52. ශේෂ පත්‍ර දිනට පසු ඇති වූ සිදුවීම්

මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීමක් හෝ හෙළිදරව් කිරීමක් අවශ්‍ය වන කිසිදු ප්‍රමාණාත්මක සිදුවීමක් ශේෂ පත්‍ර දිනට පසු ඇති නොවීය.

## 2. බැංකු අධීක්ෂණ

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව බැංකුවල අඛණ්ඩ අධීක්ෂණ සහ කාලීන පරීක්ෂණ කටයුතු සිදුකිරීම සඳහා විශේෂ බලතල සහ කාර්යයන් සහිතව, මුදල් නීති පනතෙහි 28 වැනි වගන්තිය යටතේ පිහිටුවනු ලැබිණි. මෙයට අමතරව, බැංකු නියාමනය සහ අධීක්ෂණය, 1988 අංක 30 දරන සංශෝධිත බැංකු පනතෙහි විධිවිධාන මගින් ද පාලනය වේ. තවද, බැංකු පද්ධතියේ ශක්තිමත්භාවය තහවුරු කිරීම සඳහා බලපත්‍රලාභී බැංකුවල ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් විචක්ෂණශීලී විධාන නිකුත් කිරීමට මුදල් මණ්ඩලයට බලතල පැවරී ඇත. සියලුම බලපත්‍රලාභී බැංකු මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන මෙම විචක්ෂණශීලී විධාන සහ මාර්ගෝපදේශ සමග අනුකූලවීම අනිවාර්යය වේ.

විචක්ෂණශීලී විධානයන් සහ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන අනුමැතීන් කෙටුම්පත් කිරීම සහ නිකුත් කිරීම, අඛණ්ඩ අධීක්ෂණ කටයුතු සහ කාලීන පරීක්ෂා සිදුකිරීම සහ ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයෙහි පරිපාලන කටයුතු සිදුකිරීම බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවෙහි මූලික කාර්යයන් වේ. මෙයට අමතරව, බැංකු අංශයට සම්බන්ධ දැනුවත් කිරීම් සහ බැංකු අංශයේ ශක්‍යතා වර්ධනය කිරීම සඳහා වන ක්‍රියාකාරකම් කිහිපයක ද බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව නිරත විය. මුදල් නීති පනතෙහි සහ බැංකු පනතෙහි නියාමනයට සහ අධීක්ෂණයට යටත් බලපත්‍රලාභී වාණිජ බැංකු 25 ක් සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු 7 ක් 2016 වසර අවසන් වනවිට පැවතුණි. මෙම බැංකුවල නාම ලේඛනයක් II-1 ඇමුණුමෙහි අන්තර්ගත වේ.

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් 2016 වසර තුළදී සිදුකළ ප්‍රධාන කාර්යයන් සහ ක්‍රියාකාරකම්වල සාරාංශයක් පහත දක්වා ඇත.

### 2.1 විචක්ෂණශීලී විධාන නිකුත් කිරීම

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද විචක්ෂණශීලී විධානයන් මෙම වාර්තාවේ III කොටසෙහි දක්වා ඇත. ඒ අතරින් ප්‍රධාන විචක්ෂණශීලී විධානයන් පිළිබඳ සාරාංශයක් පහත දක්වා ඇත.

**(අ) සයිබර් ආරක්ෂණ අවදානම් අවස්ථා පිළිබඳව වාර්තා කිරීම**

2016 ජනවාරි මස සිට ක්‍රියාත්මක වන පරිදි, සියලුම බලපත්‍රලාභී බැංකුවල සිදුවන සයිබර් ආරක්ෂණ අවදානම් අවස්ථාවන් හඳුනා ගැනීමෙන් පසු දිනක් තුළ දී සහ කාර්තුමය වශයෙන් එම අවදානම් අවස්ථාවන් බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවට වාර්තා කළ යුතු වේ.

**(ආ) පොලී අනුපාතික, විනිමය අනුපාතික, සේවා ගාස්තු, අයකිරීම් සහ කොමිස් මුදල් ප්‍රදර්ශනය කිරීම**

සියලුම බලපත්‍රලාභී බැංකු විසින් ''ලංකා සෙට්ල්'' (LankaSettle) පද්ධතිය, ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය (SLIPS) සහ විද්‍යුත් අරමුදල් පැවරීමේ පොදු යාන්ත්‍රණය (CEFTs) හරහා සිදුකෙරෙන අරමුදල් හුවමාරු කිරීම් සඳහා පාරිභෝගිකයන්ගෙන් අයකර ගන්නා සේවා ගාස්තු, සියලුම බැංකු ශාඛා සහ වෙබ් අඩවිවල ප්‍රදර්ශනය කළ යුතුය. මෙම අවශ්‍යතාවය සියලුම බැංකු විසින් තම තැන්පතු හා ණය දීමේ පොලී අනුපාතික, විනිමය අනුපාතික හා අනෙකුත් සේවා ගාස්තු, කොමිස් ආදිය ද ප්‍රදර්ශනය කළ යුතු බවට මීට පෙර නිකුත් කළ චක්‍රලේඛයට අමතරව නිකුත් කරන ලදී.

**(ඇ) වාර්ෂික බලපත්‍ර ගාස්තු**

බලපත්‍රලාභී බැංකු විසින් සම්මත වර්ෂ 2017 සඳහා ගෙවිය යුතු වාර්ෂික බලපත්‍ර ගාස්තු, 2016 වර්ෂය අවසානයේදී ඒ ඒ බැංකුවල පැවති මුළු වත්කම් ප්‍රමාණ පදනම් කොට නිර්ණය කරන ලදී.

**(ඈ) ද්විතීයික වෙළෙඳපොළ තුළ රජයේ සුරැකුම්පත් වෙළෙඳාම සහ වාර්තාකරණය**

බලපත්‍රලාභී බැංකු විසින් ද්විතීයික වෙළෙඳපොළ තුළ රජයේ සුරැකුම්පත් වෙළෙඳාම සිදුකිරීමේදී ශ්‍රී ලංකාව සඳහා නිර්මාණය කළ බ්ලූම්බර්ග් (Bloomberg Trading Platform) ගනුදෙනු පද්ධතිය යොදාගත යුතු බව නියම කෙරිණි. රජයේ සුරැකුම්පත් ද්විතීයික වෙළෙඳපොළ වෙළෙඳාම් වීම ප්‍රචලිත කිරීම සඳහා මෙම චක්‍රලේඛය රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව සමග ඒකාබද්ධව නිකුත් කරන ලදී.

**(ඉ) බාසල් III යටතේ ප්‍රාග්ධන අවශ්‍යතා**

2017 ජූලි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි සෑම බලපත්‍රලාභී බැංකුවක් විසින්ම, වඩා ශක්තිමත් බැංකු සහ බැංකු පද්ධතියක් සඳහා වන බාසල් III ගෝලීය නියාමන රාමුවට අනුකූලව අවදානම් අනුව බර තබන ලද, මුළු වත්කම් මත අවම ප්‍රාග්ධන අනුපාත පවත්වාගත යුතුය.

මේ අනුව රුපියල් බිලියන 500 ට වැඩි වත්කම් සහිත බැංකු සඳහා අවම ප්‍රාග්ධන අනුපාතය සියයට 11.75 සිට සියයට 14 දක්වාත්, රුපියල් බිලියන 500 ට අඩු වත්කම් සහිත බැංකු සඳහා අවම ප්‍රාග්ධන අනුපාතය සියයට 11.25 සිට සියයට 12.50 දක්වාත්, 2019 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉහළ නැංවේ.

### 2.2 මුදල් මණ්ඩලය විසින් දෙන ලද අනුමැතීන්

**(අ) බැංකු ශාඛා සහ අනෙකුත් බැංකු ඒකක**

වසර තුළ දී නව බැංකු ශාඛා 67 ක්, සිසු ඉතුරුම් ඒකක 51 ක් සහ ජංගම බැංකු ඒකක 3 ක් විවෘත කිරීම, බැංකු ශාඛා 97 ක් ප්‍රතිස්ථාපනය සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 146 ක් ස්ථාපනය කිරීම සඳහා අනුමැතිය ලබාදී ඇත. කාර්යක්ෂම බැංකු සේවාවක් ලබාදීම සඳහා 2016 වසර අවසානය වනවිට බැංකු අංශය, බැංකු ශාඛා 3,614 කින්, සිසු ඉතුරුම් ඒකක 3,045 කින් සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 3,843 කින් ද සමන්විත විය. එමෙන්ම වසර තුළ දී, එක් බලපත්‍රලාභී වාණිජ බැංකුවක පරිපාලිත සමාගමක් මාලදිවයින් ජනරජයෙහි ස්ථාපිත කිරීමට ද, තවත් බලපත්‍රලාභී වාණිජ බැංකුවක ශාඛාවක් බංග්ලාදේශයෙහි ස්ථාපිත කිරීමට සහ ක්ෂුද්‍ර මූල්‍ය කටයුතු සඳහා බැංකු පරිපාලිත සමාගමක් මියන්මාරයෙහි ස්ථාපිත කිරීමට අනුමැතිය ලබාදෙන ලදී.

(ආ) වෙනත් නියාමන අනුමැතීන්

අවම ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා දෙවැනි ස්ථර ප්‍රාග්ධන සංයුතිය ගණනය කිරීමේදී ණයකර ඇතුළත් කිරීමට බැංකු 7 ක් සඳහා අනුමැතිය ලබාදුන් අතර, බැංකු 6 ක් සඳහා විදේශ ණය ලබාගැනීමේදී නියාමන සීමාවන් ඉක්මවා යාමට අනුමැතිය ලබාදෙන ලදී. එමෙන්ම, බැංකු 3 ක් සඳහා කොටස් හිමිකම් ප්‍රමාණාත්මක අයිතිය සඳහාත්, බැංකු 4 ක් සඳහා උපරිම ණය සීමාව සඳහාත් නියාමන සීමාවන් ඉක්මවා යාමට අනුමැතිය ලබාදෙන ලදී.

## 2.3 නිරන්තර සුපරීක්ෂණ සිදු කිරීම

(අ) නිරන්තර සුපරීක්ෂණය යනු සමස්ත බැංකු පද්ධතියෙහි මෙහෙයුම් කාර්යක්ෂමතාවය හා දිගුකාලීන ස්ථායීතාවය නිර්ණය කිරීමෙහිලා කල්ඇතිව අනතුරු ඇඟවීමේ ක්‍රමවේදයක් ලෙස සේවය සපයන්නා වූ සහ අවශ්‍ය අවස්ථාවන්හිදී නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමෙහි හැකියාව ඇති බැංකුවල වැඩකටයුතු පිළිබඳ නිරීක්ෂණය කිරීම සඳහා පවත්නා ක්‍රමවේදය වේ.

(ආ) විශේෂිත වත්කම් හෝ වගකීම් බුබුළු (bubbles) හා බැංකු පද්ධතියෙහි හෝ එක් බැංකුවක සිදුවන්නා වූ ණය සංකේන්ද්‍රණයන් කල්ඇතිව අනාවරණය කර ගැනීම සඳහා, ඉහළම සාංගමික ගනුදෙනුකරුවන් 20 දෙනා වෙත නිරාවරණය වී ඇති ප්‍රමාණය, නියෝජිත ආයතන, ආශ්‍රිත සමාගම්, අනෙකුත් ආයෝජිත ඒකකයන්, ඉහළම සමූහ ගනුදෙනුකරුවන් 20 දෙනා සඳහා සහ ඉදිකිරීම් අංශය සඳහා නිරාවරණය වී ඇති ප්‍රමාණය යන අංශයන් යටතේ නිරන්තර නිරීක්ෂණයන් සිදුකිරීම හා වාර්තා පිළියෙල කිරීම වර්ෂය තුළ දී සිදුකරන ලදී.

(ඇ) වෙබ් අඩවි පාදක කරගත් (web-based) ෆින්නෙට් පද්ධතිය හරහා බැංකු විසින් කලින් කලට ඉදිරිපත් කළ මූල්‍ය සහ කාර්යසාධන තොරතුරු පදනම් කර ගනිමින් අඛණ්ඩ අධීක්ෂණ කටයුතු සිදුකෙරිණි. ආසන්න වශයෙන් එක් බැංකුවක් සඳහා මූල්‍ය සහ විචක්ෂණශීලී තොරතුරු ඇතුළත්, ව්‍යවස්ථාපිත වාර්තා 30 ක් පමණ මාසිකව/කාර්තුමය වශයෙන් මෙම ෆින්නෙට් පද්ධතිය වෙත සපයනු ලැබේ. මෙම වර්ෂය තුළදී එක් එක් බැංකු ශාඛා ව්‍යාප්තිය හා කාර්යසාධනය වාර්තා කිරීමට සංශෝධිත ෆින්නෙට් වාර්තාවක් හඳුන්වාදෙන ලදී. වඩා යහපත් වාර්තා ජනනය කිරීම සඳහා පහසුකම් සැපයීමට තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ උපදෙස් ලබාගනිමින් බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ දත්ත සමූහය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා මූලික පියවර ගන්නා ලදී. මීට අමතරව, ව්‍යවස්ථාපිත පරීක්ෂණ වලදී හඳුනාගත් දුර්වලතාවයන් නියමිත කාලසීමාවන් තුළදී නිවැරදි කිරීම සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග යන්හි ප්‍රගතිය කාර්තුමය පදනම මත අධීක්ෂණය කරන ලදී.

(ඈ) 2014 වසරේ සිට 2016 වසර දක්වා බැංකු අංශයෙහි කාර්යසාධන සාරාංශය පහත වගුවෙහි දක්වා ඇත. මූල්‍ය අංශයෙහි ක්‍රියාකාරිත්වය හා පද්ධති ස්ථායීතාව සම්බන්ධයෙන් වන සවිස්තරාත්මක ඇගයීමක් 8 වැනි පරිච්ඡේදයේ දක්වා ඇත.

**II-1 සංඛ්‍යා සටහන**

**බැංකු අංශයෙහි ප්‍රවණතා**

| | 2014 | 2015 (අ) | 2016 (ආ) |
|---|---|---|---|
| බැංකු අංශයෙහි දර්ශක (රු. බිලියන) | | | |
| මුළු වත්කම් | 6,972 | 8,077 | 9,047 |
| මුළු ණය හා අත්තිකාරම් | 3,895 | 4,715 | 5,541 |
| මුළු ආයෝජන | 1,953 | 2,368 | 2,291 |
| මුළු තැන්පතු | 4,686 | 5,403 | 6,296 |
| මුළු ණය ගැනීම් | 1,448 | 1,758 | 1,696 |
| ප්‍රාග්ධන අරමුදල් | 568 | 637 | 707 |
| ශුද්ධ ලාභය (බදු පසු) | 88 | 97 | 116 |
| බැංකු ශාඛා සංඛ්‍යාව | 3,546 | 3,549 | 3,614 |
| ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාව | 3,276 | 3,477 | 3,843 |
| **විචක්ෂණ අනුපාත (ප්‍රතිශතයක් ලෙස)** | | | |
| මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය | 16.6 | 15.4 | 14.3 |
| ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය | 39.5 | 33.9 | 30.0 |
| අක්‍රීය ණය අනුපාතය (දළ) | 4.2 | 3.2 | 2.6 |
| හිමිකම් මත ප්‍රතිලාභ (බදු පසු) | 16.6 | 16.2 | 17.3 |
| වත්කම් මත ප්‍රතිලාභ (බදු පසු) | 1.4 | 1.3 | 1.4 |

(අ) සංශෝධිත (ආ) තාවකාලික

## 2.4 කාලීන පරීක්ෂණ සිදු කිරීම

(අ) පසුගිය වසරේ සිට ඉදිරියට ගෙන ආ පරීක්ෂණ 12 ක් ද ඇතුළුව, 2016 වසරේදී බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂණ 44 ක් සිදුකරන ලදී. 2016 වසර තුළ දී, අදාළ බැංකුවල කළමනාකාරිත්වය සමඟ විධිමත් සාකච්ඡාවන්හි නිරත වීමෙන් සහ මුදල් මණ්ඩලය වෙත අදාළ වාර්තා යොමු කිරීමෙන් අනතුරුව, බැංකුවල ව්‍යවස්ථාපිත පරීක්ෂණ 38 ක් අවසන් කෙරුනු අතර, පරීක්ෂණ 06 ක කටයුතු අවසන් වෙමින් පැවතුණි. මෙම පරීක්ෂණවලදී හඳුනාගත් ප්‍රධාන කරුණු ලෙස අඩු කාර්යක්ෂමතාව, ආයතනික යහපාලනය පිළිබඳ දුර්වලතාවයන්, පද්ධති සහ පාලන දුර්වලතාවයන්, අක්‍රීය ණය හඳුනාගැනීම්, බොල් හා අඩමාණ ණය වෙන්කිරීමේ සහ අනාගත ණය නොපියවීමේ අවදානම් අඩුවෙන් තක්සේරු කිරීම යන දුර්වලතාවයන් ඇතුළත් විය.

මෙයට අමතරව, විචක්ෂණ ස්වභාවයේ විශේෂ කරුණු සඳහා සීමිත විෂය පථයකින් යුතු පරීක්ෂණ කිහිපයක්, ලියකියවිලි සත්‍යාපනය, රාජ්‍ය සුරැකුම්පත්වල ආයෝජනය, ආයතනික යහපාලනය, ගනුදෙනුකරුවන්ගේ පැමිණිලි හා විදේශ විනිමය ගනුදෙනු යන අංශ සඳහා සිදුකරන ලදී.

(ආ) බැංකුවල තිරසාරත්වය ඇගයීම කෙරෙහි අවධානය යොමු කරනු ලබන අධීක්ෂණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කරන ලද අතර එය බැංකුවල මූල්‍ය කාර්යක්ෂමතාවය, ව්‍යාපාර කළමනාකරණය, අවදානම් දර්ශක සහ අවදානම් කළමනාකරණ පද්ධතිවල ප්‍රමාණාත්මක භාවයට අදාලව සොයාගන්නා ලද කරුණු මත පදනම් විය. අධීක්ෂණ ගැටලු, අදාළ අධ්‍යක්ෂ මණ්ඩල

උප කමිටුවලට සන්නිවේදනය කළ අතර, අදාළ ගැටලු නිරාකරණය කිරීම සඳහා නිසි පියවර ගැනීම අධ්‍යක්ෂ මණ්ඩලයේ සමස්ත වගකීමක් බවට පත්කරනු ලැබීය. තවද, කාලීන පරීක්ෂණයන්හි විශේෂිත සොයාගැනීම් සාකච්ඡා කිරීමට සහ නිසි අධීක්ෂණයක් හා නිවැරදි ක්‍රියාමාර්ග කාලෝචිතව ක්‍රියාත්මක කිරීමේ තහවුරුවක් ලබාගැනීම සඳහා බැංකු අධ්‍යක්ෂ මණ්ඩල සමඟ රැස්වීම් කිහිපයක් පවත්වනු ලැබීය.

## 2.5 ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය පරිපාලනය කිරීම

(අ) 2016 දෙසැම්බර් මස 31 දිනට, සමස්ත අරමුදලෙහි වටිනාකම ආසන්න වශයෙන් රුපියල් බිලියන 34 ක් (විගණනය නොකළ) පමණ වූ මෙම යෝජනා ක්‍රමය සාමාජික ආයතන 77 කින් සමන්විත විය. අරමුදල විසින් සිදුකරන ලද රජයේ සුරැකුම්පත්වල ආයෝජනයන්හි හා ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා සාමාජික ආයතනයක් වෙත 2014 වර්ෂයේදී සැපයූ ද්‍රවශීලතා ආධාරක පහසුකමෙහි පොත් අගය, 2016 දෙසැම්බර් මස 31 දිනට, පිළිවෙළින් රුපියල් බිලියන 26 ක් හා රුපියල් බිලියන 6 ක් වේ.

(ආ) ආසන්නතම පූර්ව මූල්‍ය වර්ෂය අවසානයේදී, සියයට 14 ක් හෝ ඊට වැඩි ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතයක් පවත්වාගනු ලැබූ බලපත්‍රලාභී බැංකු විසින්, සුදුසුකම් ලැබූ තැන්පතු ප්‍රමාණය මත වසරකට සියයට 0.1 ක් සහ අනෙකුත් සියලුම බැංකු විසින් වසරකට සියයට 0.125 ක් අරමුදල සඳහා වාරික වශයෙන් ගෙවිය යුතු විය. බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සඳහා අදාළ වාරික මුදල වසරකට සියයට 0.15 ක් විය. වසර තුළදී, රුපියල් බිලියන 6.9 ක මුදලක් සාමාජික ආයතනවලින් වාරික සහ දඩ මුදල් වශයෙන් රැස්කර ගන්නා ලදී.

(ඇ) 2015 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි, තැන්පතු රක්ෂණ ආවරණය එක් ආයතනයක එක් තැන්පතුකරුවකු සඳහා රුපියල් 300,000 කි.

**II-2 සංඛ්‍යා සටහන**

**ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයෙහි ප්‍රධාන මූල්‍ය තොරතුරු**

| අයිතමය | රුපියල් මිලියන | |
|---|---|---|
| | 2015.12.31 දිනට | 2016.12.31 දිනට * |
| අරමුදලේ ප්‍රමාණය | 25,418 | 34,257 |
| මුළු ආදායම | 7,373 | 9,593 |
| මුළු වියදම | 504 | 753 |
| වර්ෂය සඳහා ලාභය (බදු පෙර) | 6,869 | 8,840 |
| රජයේ සුරැකුම්පත්වල ආයෝජන | 18,123 | 25,700 |
| ණය සහ ලැබිය යුතු දෑ | 6,227 | 6,179 |
| වෙළෙඳාම පිණිස පවතින වත්කම් සඳහා ඇති සංචිත | 259 | (665) |

* තාවකාලික

## 2.6 බැංකු අංශයේ දැනුම්වත්භාවය සහ ශක්‍යතා වැඩි දියුණු කිරීම

(අ) ශක්‍යතා වැඩි දියුණු කිරීම

ආයතනික යහපාලනය, අවදානම් කළමනාකරණය, බැංකු පරීක්ෂණ, බැංකු ව්‍යාපාර හා ව්‍යුහය සහ බැංකු සහ මූල්‍ය අංශයට අදාළ නීති රෙගුලාසි හා ව්‍යවස්ථාවන් වැනි ක්ෂේත්‍රයන්හි දැනුම ඉහළ නැංවීම සඳහා බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව, බැංකු අංශයේ ශක්‍යතා වර්ධනයට අඛණ්ඩව දායක විය. 2016 වර්ෂය තුළදී ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු විද්‍යාපීඨයෙහි සහ අනෙකුත් දේශීය හා විදේශීය බාහිර ආයතනවල සම්පත් දායකයන් වශයෙන් බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සම්බන්ධ විය.

(ආ) බැංකුවල කළමනාකාරිත්වය සමඟ පැවති රැස්වීම්

ශ්‍රී ලංකා ආර්ථිකයේ මෙන්ම බැංකු අංශයේ වර්ධනයන් සහ නියාමන හා අධීක්ෂණ වැඩි දියුණුවීම් පිළිබඳව අදහස් හුවමාරු කර ගැනීමේ හමුවක් ලෙස ක්‍රියාත්මක වූ, බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන් සමඟින් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති විසින් පැවැත්වූ රැස්වීම් සඳහා අදාළ ලේකම් කටයුතු බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලදී. බැංකු පද්ධතියේ කාර්යසාධනය සහ වර්ධනයන් සඳහා දේශීය සහ විදේශීයව නිකුත් කරන ලද නව රෙගුලාසි පිළිබඳව දැනුවත් කිරීම සඳහා බලපත්‍රලාභී බැංකුවල සභාපතිවරුන් සමඟ ද රැස්වීම් පවත්වන ලදී. බැංකු පද්ධතියේ අධීක්ෂණය රාමුව සහ ස්ථාවරත්වය ශක්තිමත් කිරීම සඳහා නියෝජ්‍ය අධිපති සහ බැංකුවල අධ්‍යක්ෂ මණ්ඩල කමිටු සභාපතිවරුන් සමඟ රැස්වීම් පවත්වන ලදී. මීට අමතරව බැංකුවලට විශේෂිත වූ කරුණු සාකච්ඡා කිරීමට සහ නිසි අධීක්ෂණය සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග කාලීනව ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීමට බැංකුවල ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සමඟ නිරන්තර රැස්වීම් සහ සාකච්ඡා පවත්වන ලදී.

(ඇ) මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන්

2016 වසර තුළදී බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ එක්ව, මහජනතාවගෙන් තැන්පතු භාර ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවසර ලබාදී ඇති මූල්‍ය ආයතන සහ නීති විරෝධී යෝජනා ක්‍රමවලට සම්බන්ධවීමේ අවදානම පිළිබඳව, වැඩමුළු 47 ක් 5600 දෙනෙක් ඉක්මවූ මුළු සහභාගිත්වයකින් පවත්වන ලදී. මීට අමතරව, මහජන දැනුවීමක් භාෂා ත්‍රිත්වයෙන්ම පුවත්පත් 16 ක පළ කරන ලද අතර, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ගුවන්විදුලි වැඩසටහනකට ද සම්පත් දායකත්වය ලබාදෙන ලදී.

**ඇමුණුම II-1**
**බලපත්‍රලාභී බැංකුවල නාමලේඛනය**

| | |
|---|---|
| **බලපත්‍රලාභී වාණිජ බැංකු** | |
| 1. | අමානා බැන්ක් පී.එල්.සී. |
| 2. | ඇක්සිස් බැන්ක් ලිමිටඩ් |
| 3. | ලංකා බැංකුව |
| 4. | කාර්ගිල්ස් බැන්ක් ලිමිටඩ් |
| 5. | සිටි බැන්ක් එන්.ඒ. |
| 6. | කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. |
| 7. | ඩොයිෂ් බැන්ක් ඒ.ජී. |
| 8. | ඩී.එෆ්.සී.සී. බැන්ක් පී.එල්.සී. |
| 9. | හබීබ් බැන්ක් ලිමිටඩ් |
| 10. | හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. |
| 11. | අයි.සී.අයි.සී.අයි. බැන්ක් ලිමිටඩ් |
| 12. | ඉන්දියන් බැන්ක් |
| 13. | ඉන්දියන් ඕවර්සීස් බැන්ක් |
| 14. | එම්සීබී බැන්ක් ලිමිටඩ් |
| 15. | නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පී.එල්.සී. |
| 16. | නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී. |
| 17. | පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පී.එල්.සී. |
| 18. | මහජන බැංකුව |
| 19. | පබ්ලික් බැන්ක් බර්හාඩ් |
| 20. | සම්පත් බැන්ක් පී.එල්.සී. |
| 21. | සෙලාන් බැන්ක් පී.එල්.සී. |
| 22. | ස්ටෑන්ඩර්ඩ් චාර්ටර්ඩ් බැන්ක් |
| 23. | ස්ටේට් බැන්ක් ඔෆ් ඉන්දියා |
| 24. | ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැන්කින් කෝපරේෂන් ලිමිටඩ් |
| 25. | යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පී.එල්.සී. |
| **බලපත්‍රලාභී විශේෂිත බැංකු** | |
| 26. | ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව |
| 27. | ලංකාපුත්‍ර ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ් |
| 28. | ජාතික ඉතිරි කිරීමේ බැංකුව |
| 29. | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව |
| 30. | සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී.එල්.සී. |
| 31. | ශ්‍රී ලංකා සේවින්ස් බැන්ක් ලිමිටඩ් |
| 32. | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව |

# 3. බැංකු විදු පියෙස

බැංකු විදු පියෙස, ශ්‍රී ලංකා මහ බැංකුවෙහි පුහුණු සහ මානව සම්පත් සංවර්ධන හස්තය වශයෙන්, 2016 වසරේ දී දේශීය මෙන්ම දකුණු ආසියානු කලාපයේ සිටින මූල්‍ය අංශයේ වෘත්තිකයන්ගේ ආර්ථික විද්‍යා, බැංකු හා මූල්‍ය අංශයන්හි දැනුම වර්ධනය කිරීම අරමුණු කරගෙන පුහුණු පාඨමාලා, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පවත්වන ලදී. දේශීය සහ කලාපීය යන දෙඅංශයෙහිම අවශ්‍යතාවයන් පාදක කර ගනිමින්, ජාත්‍යන්තර මූල්‍ය මෙහෙයුම් ඇතුළත්ව මූල්‍ය අංශයේ මෙහෙයුම්, ආයෝජන හා භාණ්ඩාගාර කළමනාකරණය, අවදානම් කළමනාකරණය, මූල්‍ය කළමනාකරණයෙහි නීති හා නියාමනයන්, තාක්ෂණික හා භෞතික නිපුණතා සහ මානව සම්පත් කළමනාකරණය යන අංශයන් ආවරණය වන පරිදි 2016 වසරේ දී පුහුණු පාඨමාලා පවත්වන ලදී. දීර්ඝ කාලීන පළපුරුද්ද සහ නිපුණතාවය සහිත ශාස්ත්‍රීය සහ වෘත්තීය මට්ටමේ සුදුසුකම්ලත් විශේෂඥ මඩුල්ලක් විසින් පාඨමාලා සැලසුම් කිරීම සහ යාවත්කාලීන කිරීම සිදු කරනු ලබයි. ඊට අමතරව, දකුණු හා අග්නිදිග ආසියානු මහ බැංකු ආයතනය (SEACEN) ඉන්දියානු මහ බැංකුව, ජර්මන් මහ බැංකුව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඇතුළත්ව ජාත්‍යන්තරව පිළිගත් මූල්‍ය පුහුණු ආයතන හා විශ්වවිද්‍යාල කිහිපයක් සමඟ සහයෝගීතාවයෙන් යුතුව බැංකු විදු පියෙස විසින් පාඨමාලා බොහෝ ප්‍රමාණයක් සැලසුම් කිරීම හා පිරිනැමීම සිදු කරන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකු උපායමාර්ගික සැලැස්මෙහි ශක්‍යතා වර්ධනය සහ උපකාරක සේවා අරමුණු හා සමගාමීව යමින්, බැංකු විදු පියෙස විසින් ඉතා පුළුල් වූ මූල්‍ය අංශයට අයත් මාතෘකා ආවරණය වන පරිදි උචිත හා කාලෝචිත පාඨමාලා ගණනාවක් 2016 වසර තුළ දී සිදු කරන ලදී. බැංකු විදු පියෙස විසින් සිදු කරනු ලැබූ පාඨමාලා ශ්‍රී ලංකා මහ බැංකුවට පමණක් සීමා නොවූ අතර, බොහෝ පාඨමාලා, සම්මන්ත්‍රණ සහ වැඩමුළු මහ බැංකුවට පරිබාහිර උනන්දුවක් දක්වන විවිධ අංශයන්හි ශක්‍යතාවයන් වර්ධනය කිරීමට පවත්වන ලදී. පාඨමාලාවන් ලබා දීමට පමණක් සීමා නොවී, පවත්වනු ලැබූ පාඨමාලා සඳහා ඉතා පුළුල් හා ගැඹුරු ඇගයීමක් කිරීම තුළින් පාඨමාලාවල ගුණත්වය ඉහළ නැංවීමෙහි ඇති වැදගත්කම හඳුනාගත් අතර, ලබා දෙන සේවාවන්හි ගුණාත්මකභාවය වර්ධනය කර ගැනීමෙහිලා සුදුසු මිනුම්දඬු හඳුන්වා දීමද සිදුකර ඇත. ඒ අනුව, 2016 වසර තුළ දී බැංකු විදු පියෙස විසින් පුහුණු පාඨමාලාවන්හි ගුණාත්මකභාවයෙහි සහ යටිතල පහසුකම් යන දෙඅංශයෙහිම ඇගයීම් ප්‍රතිඵල අවම අගය 75% දක්වා ඉහළ නැංවීම පිළිබඳ අවධානය යොමු කළේය. බහුතරයක් වූ පුහුණුවන්නන්ගේ ප්‍රතිචාර මගින් බැංකු විදු පියෙසට මෙම මට්ටම කරා ළඟා වීමට හැකි වූ අතර, ඒ තුළින් පුහුණුවන්නන්ට හා ඔවුන් නියෝජනය කළ ආයතන මගින් වැය කළ මුදලට සහ කාලයට බැංකු විදු පියෙස මගින් ලබාදුන් පුහුණු පාඨමාලා ප්‍රතිලාභ උදා කරදුන් බව තහවුරු කර ඇත.

2016 වසර බැංකු විදු පියෙසට ඉතා සුවිශේෂී වසරක් වූයේ, ප්‍රකාශයට පත් කරන ලද පාඨමාලා 46 ක් ද, හඳුනාගත් දැනුම් පරතරයක් පියවීම සඳහා පාඨමාලා 49 ක් ද, සහතිකපත්‍ර පාඨමාලා 4 ක් ද, ජාත්‍යන්තර පාඨමාලා 2 ක් ද ඇතුළත්ව පාඨමාලා 101 ක් පැවැත්වීමට හැකි වීමෙනි. තවද, සාමාන්‍ය මහජනතාවගේ මූල්‍ය සාක්ෂරතාවය වර්ධනය කිරීමෙහි සහ දැනුම සහිත ආර්ථිකයක් ගොඩනැගීමෙහිලා රජයෙහි අරමුණට සහයෝගය ලබාදීමේ අරමුණෙන්බැංකුවිදුපියෙසමගින්මහජනතාවවෙනුවෙන්විවෘත වූ ප්‍රසිද්ධ දේශන 5 ක් ද, විශ්වවිද්‍යාල සිසුන් උදෙසා වැඩසටහන් 3 ක් ද, පාසල් සිසුන් සඳහා වැඩසටහන් 4 ක් ද වසර තුළ දී සිදු කරන ලදී. මේ තුළින් දේශීයව 5,000 කට අධික පුහුණුවන්නන් පිරිසක් ද, නේපාලය, බංගලාදේශය, සීෂෙල්ස්, පකිස්ථානය, මාලදිවයින හා පැපුවා නිව්ගිනියා ආදී රටවලින් 150 කට

අධික පුහුණුවන්නන් පිරිසක් ද පුහුණුව ලබා ඇත. එමෙන්ම, අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ හදාරන සිසුන් සඳහා සැලසුම් කළ තක්ෂිලාව (Thakshilawa) හා අරිවුට්රූ (Ariwootroo) යන රූපවාහිනී වැඩසටහන් විකාශනය කිරීම බැංකු විද්‍යා පියෙස මගින් සම්බන්ධීකරණය කරන ලදී. ජාතියේ තීරණාත්මක අවශ්‍යතාවයක් වන ග්‍රාමීය සංවර්ධනය සලකා බලා බැංකු විද්‍යා පියෙස විසින් පළාත් කාර්යාල මෙහෙයුම් දෙපාර්තමේන්තුව සහ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධව ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමෙහි අරමුණෙන් පාඨමාලා 14 ක් වසර තුළ දී පවත්වන ලදී.

වෘත්තීයවේදීන්ගේ, විශේෂයෙන්ම මූල්‍ය අංශයන්හි වෘත්තීයවල නිරතවන්නන්ගේ දැනුම හා කුසලතා, තම වෘත්තීය කටයුතුවල දී කාර්යක්ෂමව හා ඵලදායීව යොදා ගැනීම සඳහා අවශ්‍ය වර්තමාන හා අනාගත පුහුණු අවශ්‍යතාවන් සුපරීක්ෂාකාරී ලෙස අධීක්ෂණයෙන් පසුව, බැංකු විද්‍යා පියෙස විසින් 2017 වසර සඳහා වූ වැඩසටහන් පෙළගැස්ම ප්‍රකාශයට පත් කරන ලදී. බැංකු විද්‍යා පියෙස, එහි වැඩසටහන්වලට සහභාගීවන්නන් හා සහභාගී වන ආයතනයන් විසින් අපේක්ෂා කරන උසස් මට්ටමකින් පිළිගන්නා වූ වැඩසටහන් පවත්වන අතරම වසර තුළ දී ලබාගත් ආදායම් මට්ටම ඉහළ නංවා ගැනීමට ද සමත් විය.

## 4. සන්නිවේදන

2016 වර්ෂය තුළ දී සන්නිවේදන දෙපාර්තමේන්තුවේ කාර්යභාරය තවත් ශක්තිමත් වීම හරහා මහ බැංකු අරමුණු වන ආර්ථික හා මිල ස්ථායිතාව පවත්වා ගැනීම හා මූල්‍ය පද්ධති ස්ථායිතාව පවත්වා ගැනීම තුළින් තිරසාර වර්ධන ඉලක්කයන් සපුරා ගැනීමට පාර්ශ්වකරුවන් වෙත තොරතුරු බෙදාහැරීම, බාහිර සන්නිවේදන ප්‍රවිෂ්ටයන් උපයෝගී කරගැනීම, මහජන දැනුම්වත් කිරීම්, විද්‍යුත් මාධ්‍ය මගින් දැනුම මිනුම වැඩසටහන් පැවැත්වීම හා පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථානය හරහා සන්නිවේදන දෙපර්තමේන්තුව සිය දායකත්වය ලබා දුන්නේය.

### බාහිර සන්නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව ශ්‍රී ලංකා මහ බැංකුවේ නිල වෙබ් අඩවිය ප්‍රතිනිර්මාණය කර නව මුහුණුවරකින් ඉදිරිපත් කිරීමේ කාර්යය ආරම්භ කරන ලදී. මෙම කාර්යය සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් වසර තුළ දී මුහුණ දුන් ප්‍රධානතම අභියෝග අතුරින් එකක් ලෙස දැක්විය හැක. මේ සඳහා සන්නිවේදන දෙපාර්තමේන්තුව භාර නියෝජ්‍ය අධිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් යුතු කාර්යසාධක බලකායක් ස්ථාපනය කර සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව හා එක්ව සාකච්ඡා වට කිහිපයක් හා අදාළ දෙපාර්තමේන්තු සමඟ රැස්වීම් පවත්වා වෙබ් අඩවියේ අන්තර්ගතය සකස් කිරීම සිදු කරන ලදී. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන් ම සමන්විත මෙම වෙබ් අඩවිය 2017 වසරේ දී එළිදැක්වීමට නියමිත ය.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන සන්නිවේදන මාධ්‍යය හා පර්ශ්වකරුවන් සඳහා පවතින ප්‍රමුඛතම තොරතුරු මූලාශ්‍ය වශයෙන් සැලකිය හැකි දැනට පවතින www.cbsl.gov.lk වෙබ් අඩවිය බෙහෙවින් ජනප්‍රිය අතර මෙයට නිදසුනක් ලෙස 2015 වසරට සාපේක්ෂව 2016 වසරේ දී වෙබ් අඩවිය වෙත පිවිසීමේ ප්‍රතිශතය සියයට 3.3කින් වැඩි වීම ගෙනහැර දැක්විය හැක. විද්‍යුත් තැපැල හා කෙටි පණිවුඩ සේවාව මගින් දැනුම්දීම් සඳහා ඉල්ලුම් කළ ග්‍රාහකයන් ප්‍රමාණයද වැඩි විය.

**II-3 සංඛ්‍යා සටහන**

**බාහිර සන්නිවේදනය පිළිබඳ විස්තර**

| මාධ්‍ය වර්ග | 2015 | 2016 |
|---|---|---|
| මහ බැංකු වෙබ් අඩවිය වෙත පිවිසීම් (මිලියන) | 145 | 150 |
| යූටියුබ් (මහ බැංකු වීඩියෝ උඩුගත කිරීම්) | 33 | 54 |
| විද්‍යුත් තැපැල මගින් දැනුම්දීම් සඳහා ඉල්ලුම් කළ ග්‍රාහකයන් (වසර අවසානය වන විට) | 2,392 | 2,406 |
| කෙටි පණිවුඩ සේවාව මගින් දැනුම්දීම් සඳහා ඉල්ලුම් කළ ග්‍රාහකයන් | 1,073 | 1,003 |

2016 වසර තුළ පුවත්පත් නිවේදන 1,185ක් (මුදල් ප්‍රතිපත්ති විවරණ, විදේශ අංශයේ ක්‍රියාකාරීත්වය, උද්ධමනය ආදී ප්‍රධානතම නිවේදන 264ක්), ගැසට් නිවේදන 14ක්, මාධ්‍ය නිවේදන 169ක් (දැන්වීම් ඇතුළුව) සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇත.

මීට අමතරව බැංකුවට අදාළ විවිධ මාතෘකා ඔස්සේ මාධ්‍ය දැනුම්වත් කිරීම් 20ක් ද 2016 වසර තුළ පැවැත්විය. තවද, මහ බැංකු බෝම්බ ප්‍රහාරයෙන් විපතට පත්වූවන්ගේ 20 වන ගුණානුස්මරණ උළෙල, 2015 වාර්ෂික වාර්තාව එළිදැක්වීම, “Financial Sector Reforms in India” මාතෘකාව යටතේ ඉන්දියානු රාජ්‍ය බැංකුවේ සභාපතිනිය වන අරුන්දතී භට්ටාචාර්ය මහත්මිය පැවැත්වූ ශ්‍රී ලංකා මහ බැංකුවේ 66 වැනි සංවත්සරික දේශනය ආදී වැඩසටහන් රාශියක් සංවිධානය කිරීම සඳහා සන්නිවේදන දෙපාර්තමේන්තුව සිය දායකත්වය සැපයී ය.

තවද බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ 2016.09.16 සිට 2016.09.25 දක්වා පැවති කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනය සඳහා ද සන්නිවේදන දෙපාර්තමේන්තුව සහභාගී වූ අතර මෙහි අරමුණ වූයේ ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රතිපත්ති, ක්‍රියාකාරකම් හා ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන් සහ වෙනත් කාර්යයන් සම්බන්ධව මහජන දැනුම්වත්භාවය වැඩිදියුණු කිරීමයි.

### අභ්‍යන්තර සන්නිවේදනය

ශ්‍රී ලංකා මහ බැංකුවට අදාළ තොරතුරු, ආර්ථික හා මූල්‍ය අංශවලට අදාළ කාලීන පුවත් පිළිබඳව ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයට පැහැදිලි අවබෝධයක් ලබාදීම උදෙසා සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් පුවත්පත්වල පළ වූ වාර්තා, ලිපි හා මහජන මතයන් 9,311ක් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි ජාතික පුවත්පත් 15 කින් ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයට ලබාදෙන ලදී.

නිල අභ්‍යන්තර පුවත් ලිපිය වන කවුළුවේ කලාප දෙකක් ද සන්නිවේදන දෙපාර්තමේන්තුව වසර තුළ පළ කළේ ය.

## මහජන දැනුම්වත් කිරීම්

සන්නිවේදන දෙපාර්තමේන්තුව සංවිධානය කරන රූපවාහිනී මාධ්‍ය ඔස්සේ විකාශය වන දැනුම මිනුම තරගාවලියක් වන "Econ Icon Season III" වැඩසටහනෙහි මූලික වටය වන ලිඛිත පරීක්ෂණ සාර්ථකව නිම කළ අතර මේ සඳහා දිවයිනේ සියලු ම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි සිංහල මාධ්‍ය පාසල් 420ක් සහ දෙමළ මාධ්‍ය පාසල් 204ක් සහභාගී විය. ප්‍රසිද්ධ රූපවාහිනී නාලිකාවක් ඔස්සේ විකාශය වූ මෙම අන්තර්-පාසල් තරගාවලිය සඳහා සිංහල හා දෙමළ මාධ්‍ය පාසල් 16 බැගින් සහභාගි විය. ප්‍රථම, දෙවන හා අවසන් පූර්ව වටයන්හි රූපවාහිනී පටිගත කිරීම් අවසන් කර විකාශය කිරීම 2016 ඔක්තෝබර් මාසයේ සිට ආරම්භ විය. 2017 වසර මුල අවසන් මහ තරගය පැවැත්වීමට නියමිතව තිබුණි.

තවද මහ බැංකු අරමුණු, කාර්යයන් හා ශ්‍රී ලංකා ආර්ථිකය ආදී විවිධ වූ මාතෘකා ආවරණය වන පරිදි අධ්‍යාපනික හා දැනුම්වත් කිරීමේ වැඩසටහන් 128ක් පැවැත්වූ අතර 7,216ක පිරිසක් මෙම වැඩසටහන් සඳහා සහභාගී විය. මින් වැඩසටහන් 18ක් ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රධාන කාර්යාලයෙන් පිටත පවත්වන ලදී.

**II-4 සංඛ්‍යා සටහන**

**2016 දී පැවැත්වූ මහජන දැනුම්වත් කිරීමේ වැඩසටහන් පිළිබඳ විස්තර**

| ආයතනය | වැඩසටහන් ගණන | සහභාගීවූවන් ගණන |
|---|---|---|
| පාසල් | 91 | 5,909 |
| විශ්වවිද්‍යාල | 7 | 383 |
| ශ්‍රී ලංකා ත්‍රිවිධ හමුදාව සහ ආරක්ෂක විශ්වවිද්‍යාලය | 6 | 190 |
| විදෙස් ආරක්ෂක විශ්වවිද්‍යාල නියෝජිත පිරිස් | 3 | 58 |
| තනාපති නිලධාරීන් ලෙස නම් කෙරුන හා විදෙස් සේවයට සම්බන්ධ නිලධාරීන් | 3 | 51 |
| පාසල් ගුරු භවතුන් | 18 | 625 |
| මුළු ගණන | 128 | 7,216 |

බැංකු අධ්‍යයන කේන්ද්‍රය මගින් දෙමළ භාෂාවෙන් පවත්වන ලද රූපවාහිනී වැඩසටහනක් වූ ඇරිවුත්‍රා (දැනුමේ උල්පත යන අර්ථය ඇති) වැඩසටහනට සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් සම්පත් දායකත්වය ලබාදෙන ලදී. තවද ප්‍රාදේශීය කාර්යාල (උතුරු හා නැගෙනහිර) විසින් සංවිධානය කළ දැනුම්වත් කිරීමේ වැඩසටහන් 04ක් සඳහා ද සම්පත් දායකත්වය සමගින් මහ බැංකු ප්‍රකාශන ද ලබාදීමෙන් සිය දායකත්වය සපයන ලදී.

ආර්ථික ඉතිහාස කෞතුකාගාරයේ ප්‍රකාශන අලෙවි කවුළුව, රාජගිරියේ බැංකු අධ්‍යයන කේන්ද්‍ර පුස්තකාලය, මහ බැංකු ප්‍රාදේශීය කාර්යාල හා කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනය හරහා රු. මිලියන 6.07ක මුළු වටිනාකමක් සහිත මහ බැංකු ප්‍රකාශන ප්‍රමාණයක් විකිණීමට සන්නිවේදන දෙපාර්තමේන්තුව සමත් විය. එමෙන්ම සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් විවිධ මහ බැංකු ප්‍රකාශන 11,591ක් දිවයින පුරා පාසල් පුස්තකාල හා මහජන පුස්තකාල වෙත නොමිලයේ බෙදාහැර ඇත.

## දෙමළ භාෂා පරිවර්තන සේවා

ශ්‍රී ලංකා මහ බැංකුවේ සියලු ම ප්‍රකාශන දෙමළ භාෂාවෙන් ප්‍රකාශයට පත් කිරීම සඳහා උර දෙමින් භාෂාත්‍රයෙන් ම තොරතුරු සැපයීමේ කටයුත්තට දෙමළ භාෂා පරිවර්තන ඒකකය තම දායකත්වය සපයන ලදී.

## බැංකුවේ වැදගත් අවස්ථා ඡායාරූපගත කිරීම

නිශ්චල ඡායාරූප හා වීඩියෝ යන දෘශ්‍ය මාධ්‍ය ඔස්සේ සිය සේවය සැපයූ ඡායාරූප ඒකකය, අදාළ කාලය තුළ බැංකුවේ සිදු වූ වැදගත් සිදුවීම් 379 ක් ආවරණය කළ අතර ඡායාරූප සංස්කරණය, මුද්‍රණය, රාමුගත කිරීම සහ ඇල්බම් සැකසීම, වීඩියෝ සංස්කරණය සහ සංගත තැටි සැකසීම වැනි ඒ හා සම්බන්ධ සියලු ම සේවා වෘත්තීය මට්ටමේ ඉහළ ප්‍රමිතියකින් යුතු ව සිදුකරන ලදී.

## මුද්‍රණාලය

උසස් නිමාවකින් යුතුව මහ බැංකු මුද්‍රණ අවශ්‍යතා ඉටුකර දීම සඳහා රූ රටා සැලසුම් කිරීම, වර්ණයෝජනය හා මුද්‍රණ කටයුතු සිදුකිරීම ඔස්සේ මුද්‍රණාලය සිය දායකත්වය ලබාදුන් අතර 2016 වසර තුළ මහ බැංකු මුද්‍රණ කාර්යයන් 214ක් නිම කරන ලදී. මෙම කාර්යයන් අතර සටහන (වෙළුම් 04ක්), News Survey (වෙළුම් 03ක්), කුරිප්පේඩු (වෙළුම් 02ක්) යන වාර ප්‍රකාශන, මාසික විවරණිකාවන් (වෙබ් අඩවියේ ප්‍රකාශයට පත්කිරීම සඳහා වර්ණයෝජනය පමණක්), සැදෑව, නියෝජ්‍ය අධිපති පී. සමරසිරි මහතා විසින් රචිත ආර්ථික විද්‍යා මූලධර්ම සහ ප්‍රතිපත්ති ග්‍රන්ථය (නැවත මුද්‍රණය), සහකාර අධිපති සී.පී.ඒ. කරුණාතිලක මහතා විසින් රචිත ආර්ථික විද්‍යා මූලධර්ම හැඳින්වීමක් ග්‍රන්ථයේ සිංහල සහ දෙමළ මුද්‍රණ, ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික දත්ත, ශ්‍රී ලංකාවේ ව්‍යාපාරයක් පවත්වාගෙන යෑමට පියවරෙන් පියවර මාර්ගෝපදේශනය (නැවත මුද්‍රණය), 66 වැනි සාංවත්සරික සැමරුම් දේශනය ඇතුළත් පොත් පිංච හා ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංඛ්‍යාන යන ප්‍රකාශන ඇතුළත් ය. තවද විවිධ ආකෘති පත්‍ර මුද්‍රණය කිරීම හා සපයා දීම, මහ බැංකු නිලධාරීන්ගේ නාම පත්‍ර මුද්‍රණය සහ ලිපි ද්‍රව්‍ය මුද්‍රණය කිරීම ද මුද්‍රණාලය විසින් සිදුකරන ලදී.

## පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය

පුස්තකාලයේ සහ තොරතුරු මධ්‍යස්ථානයේ සේවාවන් බැංකුවේ කාර්ය මණ්ඩලයට මෙන් ම විශ්වවිද්‍යාල සිසුන් සහ පර්යේෂකයින් වැනි අවසරලත් බාහිර පරිශීලකයින්ට ද සපයනු ලැබේ. එමගින් වසර තුළ එකතු වූ නව ග්‍රන්ථ 570 ක්, වාර්තා 100 ක්, සංයුක්ත තැටි 60 ක් ද ඇතුළුව ග්‍රන්ථ 30,000 ක්, වාර්තා 19,000 ක් සහ සංයුක්ත තැටි 1,935 ක එකතුවක් මෙන් ම 45,000 කට වඩා වැඩි සඟරා එකතුවක් තුළින් සේවාව ලබා දෙයි. එමෙන්ම, පුස්තකාලය හා තොරතුරු මධ්‍යස්ථානය 'Science Direct' සහ 'Econlit' වැනි මංගත පරිගණක දත්ත ගබඩා සඳහා ද දායකත්වය ලබා ඇති අතර එමගින් අති විශාල ආර්ථික, කළමනාකරණ සහ මූල්‍ය තොරතුරු සඳහා ප්‍රවේශය සපයයි. එයට අමතරව පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය, මහ බැංකු ක්‍රියාකාරකම්වලට අදාළ තවත් මංගත සම්පත් කීපයක ම දායකත්වය ලබා ඇත. ඒ අතරින්

මේ වන විටත් www.centralbanking.com සඳහා ප්‍රවේශය ලබාදී ඇති අතර 2016 වසරේ දී www.risk.net සහ www.ft.com සඳහා ද අන්තර්ජාල සබඳතා ඇති කාර්යමණ්ඩලයේ සියලු දෙනාට ප්‍රවේශය ලබා දී ඇත.

පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය මගින් දායකත්වය ලබා ඇති දේශීය සහ විදේශීය සඟරාවල (journals) මුළු එකතුව පිළිවෙළින් 88 ක් සහ 16 ක් වේ. පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය මගින් නව එකතු කිරීමේ (Recent additions - උදා. පොත්), වත්මන් අන්තර්ගතයන් (Current contents) ජාත්‍යන්තර පුවත්පත් නිවේදන (International News Alert), දේශීය පුවත් (Local Press) සහ ආර්ථික, බැංකු හා මූල්‍ය වාර්තාවන් සම්බන්ධිත සටහන් විවරණිකාවන් ලෙස විද්‍යුත් මාධ්‍ය හරහා රැස් කර තබා ගැනීම ද, ආයතන අභ්‍යන්තර ජාලය වන "Mansala" හරහා ඒවා බෙදා හැරීම ද සිදු කෙරේ. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය සමඟ අනුකූල වීම සඳහා හැකි සෑම අවස්ථාවකදී ම ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ මාධ්‍යයෙන් ජාතික පුවත් ආවරණය වන පරිදි කටයුතු කෙරේ. එමෙන්ම බැංකුවේ අදාළ නිලධාරීන් සඳහා තෝරා ගත් තොරතුරු බෙදාහැරීමේ ක්‍රමවේදයක් ද යොදා ගැනේ.

ප්‍රයෝජනවත් තොරතුරු විද්‍යුත් තැපැල හරහා සහ අන්තර් පුස්තකාල පිරුළු සේවාව හරහා ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල සහ අනෙකුත් විශේෂිත පුස්තකාල වෙත සපයමින් පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය තම සේවාවන් ඉදිරියට ක්‍රියාත්මක කරමින් යයි. එමෙන්ම, පුස්තකාල සහ තොරතුරු මධ්‍යස්ථානය, ගෝලීය වශයෙන් මහ බැංකු සහ අනෙකුත් අන්තර්ජාතික මූල්‍ය ආයතන හරහා තොරතුරු සම්පත් සහ අත්දැකීම් බෙදාගන්නා ගෝලීය මහ බැංකු සහ මූල්‍ය ආයතනවල පුස්තකාල සහ තොරතුරු වෘත්තිකයන්ගේ ජාලයේ ක්‍රියාකාරී සාමාජිකයෙක් ද විය. පුස්තකාලයේ අභ්‍යන්තර වෙබ් අඩවිය තුළින් බැංකුවේ කාර්යමණ්ඩලයට ඩිජිටල් පුස්තකාල සේවාව ලබාදීමට ද කටයුතු කරයි.

## 5. ව්‍යවහාර මුදල්

1949 අංක 58 දරන මුදල් නීති පනත මගින් ශ්‍රී ලංකාව තුළ නෛතික ගෙවීම් මාධ්‍ය වශයෙන් ව්‍යවහාර මුදල් නිකුත් කිරීමේ පරම අයිතිය සහ අධිකාරී බලය මුදල් මණ්ඩලය වෙත පවරා ඇත. මුදල් මණ්ඩලය සතු මෙම ව්‍යවස්ථාපිත වගකීම් සම්බන්ධ කාර්යයන් ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් ඉටුකරනු ලබයි. ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව එහි ප්‍රධාන කාර්යයන් ලෙස, ව්‍යවහාර මුදල් නෝට්ටු මුද්‍රණය, කාසි ටංකනය, මහජන ඉල්ලුම් සපුරාලීම සඳහා මුදල් නෝට්ටු හා කාසි නිකුත් කිරීම, බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතින් ලැබෙන ව්‍යවහාර මුදල් තැන්පතු බාර ගැනීම, සේවා අනිසි නෝට්ටු හා කාසි සංසරණයෙන් ඉවත් කිරීම, ව්‍යවහාර මුදල් සම්බන්ධව මුදල් නීති පනතේ සඳහන් විධිවිධාන උල්ලංඝනය කිරීමේ අවස්ථා පිළිබඳව කටයුතු කිරීමට නීති ක්‍රියාත්මක කරන බලධාරීන්ට සහයෝගය ලබා දීම සහ ව්‍යවහාර මුදල් නිසි ලෙස භාවිතය මගින් එහි ගුණාත්මක තත්ත්වය පවත්වා ගැනීම පිළිබඳව මහජනයා දැනුම්වත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලැබේ.

### 5.1 ව්‍යවහාර මුදල් නිකුතුව (කළමනාකරණය)

#### අ) සංසරණයේ පවතින ව්‍යවහාර මුදල්

මුදල් භාවිතයෙන් තොරව තාක්ෂණික ක්‍රම මගින් සිදු කරනු ලබන ගනුදෙනු දිරිමත් කිරීම සඳහා පහසුකම් සැපයීම අඛණ්ඩව සිදු කරමින් තිබියදීත් 2016 වර්ෂය තුළ දී, ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි සඳහා වන ඉල්ලුම, ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය සහ උද්ධමනය අනුව ඉහළ ගොස් ඇත. ඒ අනුව, අංක II-5 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇති පරිදි, 2016.12.31 දිනට සංසරණයේ පැවති මුළු ව්‍යවහාර මුදල් නෝට්ටු හා කාසිවල වටිනාකම රුපියල් බිලියන 552.2 ක් වූ අතර එය පෙර වර්ෂයේ පැවති තත්ත්වයට සාපේක්ෂව සියයට 12.4 ක වර්ධනයකි.

**II-5 සංඛ්‍යා සටහන**

**සංසරණයෙහි පැවති ව්‍යවහාර මුදල් (වර්ෂය අවසානය වන විට)**


| අයිතමය | වටිනාකම (රුපියල් බිලියන) | | | | | වෙනස ප්‍රතිශතයක් ලෙස | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
| නෝට්ටු | 311.2 | 332.4 | 408.8 | 482.0 | 541.5 | 8.4 | 6.8 | 23.0 | 17.9 | 12.3 |
| කාසි* | 6.3 | 6.8 | 7.5 | 9.1 | 10.7 | 13.5 | 7.5 | 10.7 | 21.3 | 17.3 |
| එකතුව | 317.5 | 339.2 | 416.3 | 491.1 | 552.2 | 8.5 | 6.8 | 22.7 | 18.0 | 12.4 |

*සමරු කාසි ඇතුළත් නොවේ.

ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල් සංසරණයේ ප්‍රධාන වශයෙන් (සියයට 98 ක්) නියෝජනය වන්නා වූ ව්‍යවහාර මුදල් නෝට්ටුවල වටිනාකම 2016 වර්ෂය තුළ දී රුපියල් බිලියන 541.5 දක්වා සියයට 12.3 කින් වැඩිවී ඇත. අංක II-1 රූප සටහනෙහි දක්වා ඇති පරිදි ව්‍යවහාර මුදල් නෝට්ටු අතරින් රු.5,000 සහ රු.1,000 මුදල් නෝට්ටුවල වටිනාකම එක්ව ගත්කළ එම ප්‍රතිශතය ආසන්න වශයෙන් 2016.12.31 දිනට සංසරණයේ පැවති මුළු ව්‍යවහාර මුදල් නෝට්ටුවල වටිනාකමින් සියයට 84 කි. 2010 වර්ෂයේ දී මහජනයා සතු ව්‍යවහාර මුදල් ප්‍රමාණය (සංසරණය තුළ) දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතිකය ලෙස සියයට 4 ක් වූ අතර එය 2016 වර්ෂය අවසානයේ දී සියයට 4.6 දක්වා ඉහළ යෑම තුළින්, රට තුළ තවදුරටත් වැදගත් ගෙවීම් මාධ්‍යයක් ලෙස ව්‍යවහාර මුදල් සඳහා වැඩි වෙමින් පවතින ඉල්ලුමක් පවත්නා බව තහවුරු කරයි.


**II-1 රූප සටහන**

**සංසරණයේ පවතින මුදල් නෝට්ටුවල වටිනාකම**




**II-2 රූප සටහන**

**සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් / දළ දේශීය නිෂ්පාදිතය**




**II-3 රූප සටහන**

**ව්‍යවහාර මුදල් නිකුතුව - ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි සංඛ්‍යාව**




### (ආ) ව්‍යවහාර මුදල් නිකුතු

රට තුළ ව්‍යවහාර මුදල් සඳහා වන ඉල්ලුම සපුරාලීම සඳහා ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව අඛණ්ඩව හා විධිමත්ව ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි සැපයීම තහවුරු කිරීම සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු හා ලංකා බැංකුවේ පිටකොටුව ශාඛාවෙහි පිහිටුවා ඇති විශේෂ මහජන මුදල් කවුළුව හරහා මුදල් නිකුත් කිරීම නොකඩවා සිදු කෙරිණි. රටෙහි සංසරණය සඳහා ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් 2016 වර්ෂය තුළ දී නිකුත් කර ඇති ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවල වටිනාකම පිළිවෙළින් රුපියල් බිලියන 594.0 ක් සහ රුපියල් බිලියන 1.6 ක් වේ ( II-6 සංඛ්‍යා සටහන).

**II-6 සංඛ්‍යා සටහන**

**බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත නිකුත් කරන ලද ව්‍යවහාර මුදල් නෝට්ටු හා කාසි**

| අයිතමය | වටිනාකම (රුපියල් බිලියන) | | | වෙනස ප්‍රතිශතයක් ලෙස | | |
|---|---|---|---|---|---|---|
| | 2014 | 2015 | 2016 | 2014 | 2015 | 2016 |
| නෝට්ටු | 431.8 | 503.4 | 594.0 | 7.4 | 16.6 | 18 |
| කාසි | 0.8 | 1.6 | 1.6 | 41.1 | 112.8 | 0 |
| එකතුව | 432.6 | 505.0 | 595.6 | 7.5 | 16.7 | 17.9 |

2015 වර්ෂයේ සිට සැලකිය යුතු කාසි ප්‍රමාණයක් අඛණ්ඩව නිකුත් කිරීම මගින් රට තුළ පවත්නා කාසි ඉල්ලුම හිඟ යකින් තොරව සපුරාලීමට 2016 වර්ෂය තුළ දී ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවට හැකියාවක් ලැබුණි (II-3 රූප සටහන). ලංකා බැංකුවේ පිටකොටුව ශාඛාවෙහි පිහිටුවා ඇති විශේෂ මහජන මුදල් කවුළුව හරහා කාසි නිකුත් කිරීමේ කටයුතු ද ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරනු ලැබීය.

### (ඇ) බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතින් ව්‍යවහාර මුදල් තැන්පතු භාර ගැනීම.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකුවලට පනවන ලද ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවය පවත්වාගෙන යෑම සඳහා මූලික වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් කරනු ලබන තැන්පතු, ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් භාර ගැනීම ව්‍යවහාර මුදල් මෙහෙයුම් කටයුතු වලදී සිදු කරන ලදී. 3 වන සංඛ්‍යා සටහනෙහි දක්වා ඇති පරිදි, ප්‍රධාන වශයෙන් මෙම තැන්පතු, සේවා නිසි (භාවිතයට සුදුසු) සහ සේවා අනිසි (භාවිතයට නුසුදුසු) නෝට්ටු ලෙස දෙයාකාරයකි. පසුගිය වසර හා සසඳන විට 2016 වර්ෂයේ දී බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සිදු කළ එවැනි මුදල් තැන්පතු ප්‍රමාණය සියයට 24.2 කින් වැඩි වී ඇත.

**II-7 සංඛ්‍යා සටහන**

**බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සිදු කළ ව්‍යවහාර මුදල් තැන්පතු (වර්ෂය තුළදී)**

| අයිතමය | වටිනාකම (රුපියල් බිලියන) | | | වෙනස ප්‍රතිශතයක් ලෙස | | |
|---|---|---|---|---|---|---|
| | 2014 | 2015 | 2016 | 2014 | 2015 | 2016 |
| නෝට්ටු | 354.7 | 429.6 | 534.5 | (6.9) | 21.1 | 24.2 |

සටහන: බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ශ්‍රී ලංකා මහ බැංකුවෙහි තැන්පත් කරන කාසිවල වටිනාකම සැලකිය යුතු ප්‍රමාණයක් නොවේ.

### (ඈ) පවිත්‍ර මුදල් නෝට්ටු ප්‍රතිපත්තිය

සේවා නිසි (භාවිතයට සුදුසු) ව්‍යවහාර මුදල් නෝට්ටු විධිමත් ලෙස සැපයීම තහවුරු කිරීම සහ සේවා අනිසි (භාවිතයට නුසුදුසු) ව්‍යවහාර මුදල් නෝට්ටු විනාශ කිරීම සඳහා වූ කටයුතු ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් නොකඩවා සිදු කරනු ලැබීය. 2016 වර්ෂය තුළ දී, බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් තැන්පත් කරන ලද මුහුණත වටිනාකම රුපියල් බිලියන 57.4 ක් වූ සේවා අනිසි මුදල් නෝට්ටු මිලියන 179.2 ක් ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් විනාශ කරන ලද අතර, මුහුණත වටිනාකම රුපියල් බිලියන 455.6 ක් වූ සේවා නිසි ව්‍යවහාර මුදල් නෝට්ටු මිලියන 279.4 ක් නැවත සංසරණයට නිකුත් කරන ලදී.

බලපත්‍රලාභී වාණිජ බැංකු අතර කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස මුදල් කළමනාකරණය හා මෙහෙයුම් වර්ධනයට සහ ව්‍යවහාර මුදල් නෝට්ටුවල ඵලදායී ආයු කාලය වර්ධනයට හේතුවන මුදල් නෝට්ටු තේරීමේ හා මුදල් පරිහරණයේ ක්‍රියාපටිපාටි සම්බන්ධයෙන් පවතින ගැටලු හා බාධක පිළිබඳව සාකච්ඡා කිරීමට ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකුවල මුදල් කළමනාකරුවන් සමඟ රැස්වීම් පවත්වන ලදී. තවදුරටත් මුදල් නෝට්ටු හානි කිරීම, වෙනස් කිරීම සහ විකෘති කිරීමට එරෙහිව බලාත්මක කර ඇති දැඩි නීති සම්බන්ධයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත දැනුම් දුන් අතර හිතාමතා හානි කරන ලද, වෙනස් කරන ලද හෝ විකෘති කරන ලද මුදල් නෝට්ටු හඳුනාගැනීම පිළිබඳ ඔවුන්ගේ සේවක මණ්ඩලය දැනුම්වත් කරන ලෙසද හිතාමතා හානි කිරීම, වෙනස් කිරීම සහ විකෘති කිරීම්වලින් වළකින ලෙස මහජනතාව ද දැනුම්වත් කරන ලෙස දැනුම් දෙන ලදී.

#### (ඉ) සමරු කාසි නිකුත් කිරීම සහ සමරු අයිතම විකිණීම

2016 වර්ෂය තුළ දී, ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව වෙත සමරු කාසි නිකුත් කිරීම සඳහා ඉල්ලීම් 5 ක් ලැබිණි. මෙම ඉල්ලීම් වලින් ඉල්ලීම් හතරක් පිළිගත හැකි ලෙස සලකන ලද අතර 2017 වර්ෂයේ දී එම සමරු කාසි 2 ක් නිකුත් කිරීම සිදු කෙරෙනු ඇත. තවද, සමරු අයිතම අලෙවි කිරීම කොළඹ කොටුවෙහි පිහිටි ආර්ථික ඉතිහාස කෞතුකාගාරය සහ ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රාදේශීය කාර්යාල හරහා සිදු කෙරිණි.

### 5.2 මුදල් නෝට්ටු මුද්‍රණය සහ කාසි ටංකනය කිරීම

ආර්ථිකය තුළ ව්‍යවහාර මුදල් සඳහා ඇති ඉල්ලුම සපුරාලීම, උසස් තත්ත්වයේ මුදල් නෝට්ටු සංසරණයේ යෙදවීම තහවුරු කිරීම සහ ප්‍රමාණවත් ආරක්ෂිත මුදල් සංචිත පවත්වා ගෙන යෑම සඳහා 2016 වර්ෂය තුළ දී ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් මුදල් නෝට්ටු මිලියන 775 ක් මුද්‍රණය කිරීමට සහ කාසි මිලියන 575 ක් ටංකනය කිරීමට අවශ්‍ය කටයුතු යොදන ලදී.

කාසි ටංකනය කිරීමේ පිරිවැය අවම කිරීමේ පියවරක් ලෙස ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් රුපියල සහ රුපියල් 5 කාසි (2005 වර්ෂයට පසු ටංකනය කරන ලද) ටංකනය කිරීමට යොදා ගත් පිත්තල ආලේපිත වානේ ලෝහය වෙනුවට මල නොබඳින වානේ ලෝහය යොදා ගැනීමට කටයතු කරන ලදී. තවදුරටත් ටංකන පිරිවැය අවම කිරීමත්, භාවිතයේ පහසුව සඳහාත් රුපියල, රුපියල් 2, රුපියල් 5 සහ රුපියල් 10 යන කාසි මල නොබඳින වානේ යොදා ගනිමින් හා එම කාසි ප්‍රමාණයෙන් කුඩා කරමින් සංසරණය සඳහා නව කාසි කාණ්ඩයක් නිර්මාණය කිරීමටත් පියවර ගනු ලැබිණි.

### 5.3 මෙහෙයුම් පද්ධති වැඩිදියුණු කිරීම

2016 වර්ෂය තුළ දී සේවා අනිසි (භාවිතයට නුසුදුසු) මුදල් නෝට්ටු ස්වයංක්‍රීයව විනාශ කිරීම සඳහා යන්ත්‍රයක් මිලදී ගෙන ස්ථාපිත කරන ලදී. මෙම නව යන්ත්‍රය මගින් වඩාත් ආරක්ෂාකාරී හා පරිසර හිතකාමී ලෙස එකවර සේවා අනිසි (භාවිතයට නුසුදුසු) හා හානි වූ මුදල් නෝට්ටු විශාල ප්‍රමාණයක් විනාශ කළ හැකිය.

ව්‍යවහාර මුදල් මෙහෙයුම් කටයුතු ස්වයංක්‍රීය කිරීමේ ක්‍රියාවලිය තවදුරටත් වැඩි දියුණු කරමින් ආරක්ෂිතව හා අවම මානව මැදිහත්වීමකින් මුදල් නෝට්ටු ඇසිරීම සඳහා ස්වයංක්‍රීයව මුදල් නෝට්ටු ගණනය කිරීමේ යන්ත්‍ර දෙකට ස්වයංක්‍රීය මුදල් නෝට්ටු මිටි ඇසිරීමේ යන්ත්‍රයක් ස්ථාපිත කරන ලදී.

### 5.4 නීති ක්‍රියාත්මක කිරීමේ බලධාරීන්ට සහාය ලබාදීම

ව්‍යවහාර මුදල් සම්බන්ධ මුදල් නීති පනතේ විධිවිධාන උල්ලංඝනය කරමින් ව්‍යවහාර මුදල් ව්‍යාජ ලෙස ප්‍රතිනිර්මාණය කිරීම සම්බන්ධව නීති ක්‍රියාත්මක කරන බලධාරීන්ට සහාය දීම සඳහා ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව 2016 වර්ෂය තුළ දී පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කරන ලදී.

(අ) ව්‍යාජ මුදල් සැකසීමේ ප්‍රයත්නයන්ට අදාළව ශ්‍රී ලංකා පොලිස් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ව්‍යාජ මුදල් විමර්ෂණ කාර්යාංශයට හා නීති ක්‍රියාත්මක කරන බලධාරීන්ට අවශ්‍ය සහයෝගය ලබාදීම. 2016 වර්ෂය තුළ දී හඳුනාගත් ව්‍යාජ මුදල් නෝට්ටු සංඛ්‍යාව 2,612 කි.

(ආ) ව්‍යාජ මුදල් නෝට්ටු සකස් කිරීම් පිළිබඳව පැවති නඩු විභාගවලට අවශ්‍ය කටයුතු සඳහා අභියෝග කළ නොහැකි සාක්ෂියක් වශයෙන් අදාළ උසාවිවලට අධිපතිතුමාගේ අත්සන සහිත සහතික 162 ක් නිකුත් කිරීම.

(ඇ) ව්‍යාජ මුදල් සැකසීම පිළිබඳව අධිකරණ නඩු විභාගවල සාක්ෂිකරුවන් වශයෙන් නඩු විභාග 12 කට පෙනී සිටීම.

### 5.5 මහජනතාව දැනුම්වත් කිරීම

මුදල් පිළිබඳ මහජන අවබෝධය වැඩිදියුණු කිරීමේ අරමුණින් සාමාන්‍ය මහජනතාව, පොලිස් නිලධාරීන්, බලපත්‍රලාභී වාණිජ බැංකු, අනෙකුත් මූල්‍ය ආයතනවල නිලධාරීන්, ගුරුවරුන්, ශිෂ්‍යයන් සහ රාජ්‍ය නිලධාරීන් සඳහා විවිධ මට්ටමේ දැනුම්වත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ ව්‍යවහාර මුදල් කෞතුකාගාර ප්‍රදර්ශනය කිරීම පහත අයුරින් සිදු කරන ලදී.

(අ) පවිත්‍ර මුදල් නෝට්ටු ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම, ව්‍යවහාර මුදල් නෝට්ටුවල අන්තර්ගත ආරක්ෂණ සලකුණු, ව්‍යාජ මුදල් නෝට්ටු හඳුනාගැනීම සහ මුදල් නෝට්ටු හා කාසි භාවිතයේ යහපත් පරිචයන් පිළිබඳව සම්මන්ත්‍රණ/වැඩමුළු 42 ක් බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රයේ, විවිධ බලපත්‍රලාභී වාණිජ බැංකුවල, පොලිස් ස්ථානයන්හි සහ ජාතික පාසැල් තුළ දී පැවැත්වීම.

(ආ) කොළඹ 02, කළුතර සහ ගාල්ල යන ප්‍රදේශවල පැවති ප්‍රදර්ශන 3 ක දී ජංගම මුදල් කෞතුකාගාරය ප්‍රදර්ශනය කිරීම.

(ඇ) ශ්‍රී ලංකා මහ බැංකුවට අයත් මුදල් කෞතුකාගාර තුන නැරඹීමට පැමිණි පාසැල් සිසුන්, විදේශික සංචාරකයන් සහ සාමාන්‍ය මහජනතාව ඇතුළුව 9,470 ක පමණ පිරිසකට පහසුකම් සැලසීම. පවිත්‍ර මුදල් නෝට්ටු භාවිතය සහ ව්‍යාජ මුදල් නෝට්ටු නිෂ්පාදනය කිරීමේ අනිසි ප්‍රතිඵල සම්බන්ධයෙන් මහජනතාව දැනුම්වත් කිරීමේ අත්පත්‍රිකා සහ තොරතුරු පත්‍රිකා බෙදා හැරීම.

### 5.6 ව්‍යවහාර මුදල් ප්‍රතිනිර්මාණය කිරීම සඳහා අවසර ලබාදීම

2016 වර්ෂයේ දී දැන්වීම් සඳහා මුදල් නෝට්ටු ප්‍රතිනිර්මාණය කිරීමේ අවස්ථාවන් 4 ක් සඳහා එවැනි ප්‍රතිනිර්මාණ සම්බන්ධයෙන් මුදල් මණ්ඩලයේ අනුමත ප්‍රතිපත්තියට අනුකූලව අනුමැතිය ලබා දෙන ලදී.

## 6. දේශීය කටයුතු

### 6.1 දේශීය කටයුතු දෙපාර්තමේන්තුවේ කාර්යයන්

මුදල් නීති පනත යටතේ පැවරී ඇති විධිවිධාන අනුව දේශීය කටයුතු දෙපාර්තමේන්තුවට කාර්යයන් කිහිපයක් පැවරී ඇත. ඒවා නම්, (අ) විවට වෙළෙඳ කටයුතු පවත්වාගෙන යෑම, (ආ) වාණිජ බැංකුවල සංචිත නියාමනය, (ඇ) රජයට, රාජ්‍ය නියෝජිත ආයතන සහ රජය වෙනුවෙන් කටයුතු කරන අනෙකුත් ආයතන සඳහා බැංකුකරු සහ රාජ්‍ය තැන්පතුව ලෙස ක්‍රියාකාරීම, (ඈ) රජය සඳහා තාවකාලික අත්තිකාරම් සැපයීම, (ඉ) සෘජු වෙළෙඳුන් සහ සෘජු සහභාගිත්ව ආයතන සඳහා ගිණුම් පවත්වාගෙන යෑම, (ඊ) සහභාගිත්ව ආයතන සඳහා එක්දින ණය ලබාදීම, සහ (උ) අවශ්‍ය අවස්ථාවලදී බැංකු ආයතන සමඟ ණය කටයුතුවල යෙදීමය.

### 6.2 මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

කෙටිකාලීන පොලී අනුපාතික ශ්‍රී ලංකා මහ බැංකුව අනුගමනය කරන මුදල් ප්‍රතිපත්තියට ගැලපෙන පරිදි පවත්වාගෙන යාමේ අරමුණින් දෙපාර්තමේන්තුව විසින් තවදුරටත් මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකවලින් සැකසුණු නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝව තුළ බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය විචල්‍යතාවය අවම වන පරිදි අපේක්ෂිත මට්ටමේ පවත්වා ගැනුණු නමුත් 2016 වසරේ සමහරක් දිනවල දී එය නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝවේ ඉහළ සීමාව ඉක්මවීය.

බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය, අපේක්ෂිත මට්ටමට ගෙන ඒමට දේශීය කටයුතු දෙපාර්තමේන්තුව ප්‍රධාන මුදල් ප්‍රතිපත්ති උපකරණය ලෙස විවට වෙළෙඳ කටයුතු යොදා ගන්නා ලද අතර නිත්‍ය පහසුකම් ද සහභාගිත්ව ආයතන වෙත ලබාදෙන ලදී. මීට අමතරව වෙළඳපොළෙහි ද්‍රවශීලතා මට්ටමෙහි ස්ථිර වෙනස්කම් සිදුකිරීමට ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව ද වැදගත් කාර්යභාරයක් ඉටුකරන ලදී. සති දෙකක සංචිත ගණනය කිරීමේ සහ පවත්වා ගෙන යෑමේ කාලය හමුවේ 2016 වසරේ දී ඒක්ෂණ වෙළඳපොළේ පොලී අනුපාතිකයේ විචල්‍යතාවයන් අවම වන පරිදි වාණිජ බැංකු සිය ද්‍රවශීල අවශ්‍යතාව සඵලදායී ලෙස කළමනාකරණය කරන ලදී.

### 6.3 කෙටිකාලීන පොලී අනුපාතිකවල හැසිරීම

ශ්‍රී ලංකා මහ බැංකුව භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම හේතුකොටගෙන වසර ආරම්භයේ දී අන්තර් බැංකු මුදල් වෙළඳපොළ ඉහළ අතිරික්ත ද්‍රවශීලතා මට්ටමක් පැවැතුණි. මෙම අතිරික්ත ද්‍රවශීලතාව කෙටිකාලීන හා දිගුකාලීන ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි හරහා තාවකාලික පදනමින් ද භාණ්ඩාගාර බිල්පත් ස්ථාවර පදනම මත විකිණීම හරහා ස්ථාවර පදනමින් ද අවශෝෂණය කර ගන්නා ලදී. මීට අමතරව, 2016 ජනවාරි 16 වන දින සිට බලපැවැත්වෙන පරිදි මහ බැංකුව විසින් වාණිජ බැංකුවල සියලුම රුපියල් තැන්පතු වගකීම් සඳහා වන ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය ප්‍රතිශතාංක 1.50 කින් සියයට 7.50 දක්වා ඉහළ දැමීම හරහා රුපියල් බිලියන 52 ක් අවශෝෂණය කරගන්නා ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විදේශ විනිමය ආශ්‍රිත ගනුදෙනු මගින් ද රුපියල් ද්‍රවශීලතාව අවශෝෂණය කර ගන්නා ලදී. එබැවින්, දේශීය මුදල් වෙළඳපොළෙහි අතිරික්ත රුපියල් ද්‍රවශීලතාව ක්‍රමයෙන් අඩු වූ අතර 2016 මාර්තු අවසානය වනවිට වෙළෙඳපොළ ද්‍රවශීලතාව සමස්ත හිඟයක් බවට පත්විය. මෙම වෙළෙඳපොළ ද්‍රවශීලතා හිඟය දෙසැම්බර් අග භාගය දක්වා පැවැතුණි. මෙම කාලසීමාව තුළ දී, බොහෝ දිනවල දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතිවිකිණුම් වෙන්දේසි පවත්වන ලදී. විදේශ විනිමය ආශ්‍රිත ගනුදෙනු සහ විදේශීය ණය ලබාගැනීම් ප්‍රධාන වශයෙන් හේතුකොටගෙන මුදල් වෙළෙඳපොළ ද්‍රවශීලතාව දෙසැම්බර් අග භාගයේ දී නැවත අතිරික්තයක් බවට පරිවර්තනය වූ අතර 2015 දෙසැම්බර් අවසානයේ පැවති ද්‍රවශීලතාවය වූ රුපියල් බිලියන 81.7 සමඟ සැසඳීමේ දී 2016 අවසානයේ දී එය රුපියල් බිලියන 39.2 ක අතිරික්ත ද්‍රවශීලතාවක් බවට පත් විය.


ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික වන නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පිළිවෙළින් පදනම් අංක 50 බැගින් 2016 පෙබරවාරි මස 19 වන දින සහ 2016 ජූලි මස 28 වන දින ඉහළ නැංවීමෙන් අනතුරුව සියයට 7.00 සහ සියයට 8.50 දක්වා ඉහළ ගියේය. 2015 වසර අග දී සියයට 6.40 ක පැවති බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය 2016 මුල් කාලපරිච්ඡේදයේ දී ඉහළ යාමේ ප්‍රවණතාවක් පෙන්වන ලදී. වසරේ ප්‍රථම ප්‍රතිපත්ති පොලී අනුපාතික සංශෝධනයට පසු බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝවේ ඉහළ සීමාව දක්වා ශීඝ්‍රයෙන් ඉහළ යන ලදී. මාර්තු මස අග වනවිට ද්‍රවශීලතාව තවදුරටත් පහළ යාමත් සමඟ රජයේ සුරැකුම්පත් ද්විතීයික වෙළෙඳපොළේ ගනුදෙනුවලින් ලැබෙන පොලී ආදායමට අදාළව සිදු කරන ලද බදු ගැලපීමේ ප්‍රතිඵලයක් ලෙස බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝවේ ඉහළ සීමාවෙන් පිටතට ගමන් කළ අතර, ජූලි මාසයේ නැවතත් ප්‍රතිපත්ති පොලී අනුපාතික සංශෝධනය කරන තුරු සියයට 8.20 ආසන්නයේ පැවතුණි. පළමු ප්‍රතිපත්ති පොලී අනුපාතික සංශෝධනයේ දී වෙළෙඳපොළ පොලී අනුපාතික විශාල වශයෙන් වෙනස් වූ හෙයින් දෙවන ප්‍රතිපත්ති පොලී අනුපාතික සංශෝධනයේ දී බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය සුළු වශයෙන් ඉහළ ගොස් ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝව තුළ රඳා පැවතුණි. 2016 වසර අවසානයේ බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය සියයට 8.42 ක් විය. 2016 වසරේ දෛනික සාමාන්‍ය ඒක්ෂණ මුදල් වෙළෙඳපොළ පරිමාව රුපියල් බිලියන 14.5 ක් වූ අතර, එය රුපියල් බිලියන 2.99 ක සහ රුපියල් බිලියන 25.05 ක පරාසයක පැවතුණි. බැංකු කිහිපයක් ඒක්ෂණ මුදල්

වෙළෙඳපොළින් නිරන්තරයෙන් ණය ගැනීම සිදු කරන ලදී. ඒක්ෂණ මුදල් වෙළෙඳපොළින් ණය ගැනීම සලකා බැලූ විට මුළු ණය ගැනීම් වලින් සියයට 77 ක් සිදු කර තිබුණේ බැංකු 4 ක් විසිනි.

බරිත සාමාන්‍ය වෙළෙඳපොළ ප්‍රතිමිලදීගැනුම් අනුපාතිකය බොහෝ සෙයින් බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකයට සමාන හැසිරීමක් පෙන්නුම් කරන ලදී. එය 2016 පළමු කාර්තුවේදී ක්‍රමයෙන් ඉහළ ගොස් ජූලි මාසයේ ප්‍රතිපත්ති පොලී අනුපාතික නැවත ඉහළ නංවන තෙක් සියයට 8.00 ආසන්නයේ පැවතුණි. දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට ප්‍රතිචාර ලෙස ඉහළ යමින් වාර්තා කළ ඉහළම අගය වූ සියයට 9.15 ඔක්තෝබර් මස මැද වනවිට පෙන්නුම් කරන ලදී. වෙළෙඳපොළ ද්‍රවශීලතා මට්ටම අනුව වෙනස් වෙමින් 2016 අග වනවිට එය සියයට 8.62 ක් විය. එක් ප්‍රාථමික වෙළෙන්දකුගේ ගනුදෙනු ඉවත් කර (ණය ගෙවීමේ නොහැකි තත්ත්වයට පත්වීම නිසා වෙළෙඳපොළ පොලී අනුපාතික වලට ඉහළින් ගනුදෙනු සිදු කරන) බරිත සාමාන්‍ය වෙළෙඳපොළ ප්‍රතිමිලදීගැනුම් අනුපාතිකය 2016 දෙසැම්බර් මස අග වනවිට ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝවේ ඉහළ සීමාවට ආසන්නව සියයට 8.50 ක පැවතුණි.

2017 ජාතික අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීමත් සමඟ ප්‍රතිමිලදීගැනුම් ගනුදෙනු මත බදු ගැලපීම හේතුවෙන් කෙටිකාලීන පොලී අනුපාතික සඳහා ඇති වී තිබෙන ගැටලු, 2017 අප්‍රේල් මස 01 වන දින සිට බදු සංශෝධනයත් සමඟ පහ වී යනු ඇත. එවිට බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝව තුළ සීමාවනු ඇත.

**II-4 රූප සටහන**
**සමස්ත ද්‍රවශීලතාව සහ නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝව**




### 6.3.1 විවට වෙළෙඳ කටයුතු

#### (අ) ද්‍රවශීලතා පුරෝකථනය

දේශීය කටයුතු දෙපාර්තමේන්තුව විසින් වෙළෙඳපොළෙහි එදිනෙදා මැදිහත්වීම නිර්ණය කිරීම සඳහා දෛනිකව වෙළෙඳපොළ ද්‍රවශීලතාව පුරෝකථනය කරනු ලබයි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රජය සහ බලපත්‍රලාභී වාණිජ බැංකු සමඟ කරන ලද ගනුදෙනු, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හසුරුවන ලද රජයේ විදේශ ණය ලැබීම් සහ ගෙවීම්, රජය විසින් විදේශීයව සහ දේශීයව නිකුත් කරන විදේශ විනිමය බැඳුම්කර, බලපත්‍රලාභී වාණිජ බැංකුවල මුදල් තැන්පතු සහ ආපසු ගැනීම්, ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණයෙහි සිදුවන වෙනස්වීම් සහ විදේශ මුදල් වෙළෙඳපොළෙහි ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරන මැදිහත්වීම් යනාදී සාධක මත ද්‍රවශීලතා පුරෝකථනය පාදක වේ.

#### (ආ) දෛනික වෙන්දේසි

**(i) ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි**

2016 වසරේ දී ඒක්ෂණ ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි අවස්ථා 11 කදී පවත්වන ලද අතර එහි දී ඉදිරිපත් කරන ලද වටිනාකම රුපියල් බිලියන 272 ක් විය. වෙන්දේසි දෙකක සියලු ලංසු ප්‍රතික්ෂේප කරන ලද අතර වටිනාකම රුපියල් බිලියන 151.82 ක් වූ වෙන්දේසි 9 ක් පිළිගන්නා ලද අතර එහි බරිත සාමාන්‍ය එළඹ අනුපාතිකය සියයට 7.42 ක් සහ සියයට 7.50 පරාසය තුළ පැවතුණි.

**(ii) ප්‍රතිවිකුණුම් වෙන්දේසි**

2016 වසරේ බොහෝ දිනයන්හි ඒක්ෂණ ප්‍රතිවිකුණුම් වෙන්දේසි පවත්වන ලදී. දේශීය කටයුතු දෙපාර්තමේන්තුව රුපියල් බිලියන 4,252 ක වටිනාකමින් යුතු ප්‍රතිවිකුණුම් වෙන්දේසි 136 ක් පවත්වන ලද අතර එයින් රුපියල් බිලියන 3,949.72 ක වටිනාකමකින් යුක්ත වෙන්දේසි 134 ක් පිළිගන්නා ලද අතර එහි බරිත සාමාන්‍ය එළඹ අනුපාතිකය සියයට 6.59 සහ සියයට 8.50 පරාසය තුළ පැවතුණි. කෙසේ වෙතත්, සහභාගිත්ව ආයතන විසින් ඉහළ පොලී අනුපාතිකයන් ඉදිරිපත් කිරීම හේතුකොට ගෙන ප්‍රතිවිකුණුම් වෙන්දේසි 2ක සියලු ලංසු ප්‍රතික්ෂේප කරන ලදී.

#### (ඇ) කෙටිකාලීන වෙන්දේසි

**(i) ප්‍රතිමිලදී ගැනුම් වෙන්දේසි**

එදිනම පියවීමේ පදනම මත සතියක් දක්වා කාල සීමාවකට ද්‍රවශීලතාව අවශෝෂණය කර ගැනීමේ උපායක් ලෙස කෙටිකාලීන වෙන්දේසි පවත්වයි. 2016 වසරේ දී දේශීය කටයුතු දෙපාර්තමේන්තුව කෙටිකාලීන ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි 3 ක් පවත්වන ලදී. එයින් රුපියල් බිලියන 80 ක් පිරිනැමූ අතර, රුපියල් බිලියන 47 ක ප්‍රමාණයක් අවශෝෂණය කර ගැනුණි. එහි බර තබන ලද සාමාන්‍ය එළඹ අනුපාතිකය සියයට 6.29 ත් සියයට 6.50 ත් අතර පැවතුණි.

**(ii) ප්‍රතිවිකුණුම් වෙන්දේසි**

2016 වසරේ දී දේශීය කටයුතු දෙපාර්තමේන්තුව කෙටිකාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි නොපවත්වන ලදී.

(ඇ) දිගුකාලීන වෙන්දේසි

(i) ප්‍රතිමිලදී ගැනුම් වෙන්දේසි

2016 ජනවාරි මාසයේදී පමණක් දිගුකාලීන ප්‍රතිමිලදී ගැනුම් වෙන්දේසි පවත්වන ලදී. දිගුකාලීන ප්‍රතිමිලදී ගැනුම් වෙන්දේසි 14 ක් පවත්වන ලද අතර, රුපියල් බිලියන 165 ක් පිරිනමන ලදී. එයින් රුපියල් බිලියන 53.10 ක් වෙන්දේසි 9 ක් ඔස්සේ අවශෝෂණය කරගන්නා ලද අතර එහි බර තබන ලද සාමාන්‍ය ඵලදා අනුපාතිකය සියයට 6.37 ත් සියයට 6.55 ත් අතර පැවතුණි. දිගුකාලීන ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසිවල කාල සීමාව දින 11 ත් දින 28 ත් අතර පැවතුණි.

(ii) ප්‍රතිවිකුණුම් වෙන්දේසි

2016 වසරේ දී දේශීය කටයුතු දෙපාර්තමේන්තුව කිසිදු දිගුකාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසියක් නොපවත්වන ලදී.

(ඉ) ස්ථිර පදනම මත වූ ගනුදෙනු

දේශීය කටයුතු දෙපාර්තමේන්තුව විසින් අතිරික්ත ද්‍රවශීලතාව අවශෝෂණය කරගැනීම සඳහා භාණ්ඩාගාර බිල්පත් ස්ථිර පදනම මත අලෙවි කිරීමට 2016 පළමු මාස දෙක තුළ දී වෙන්දේසි පවත්වන ලදී. දේශීය කටයුතු දෙපාර්තමේන්තුව ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් අලෙවි කිරීමේ වෙන්දේසි 9 ක් පවත්වන ලදී. එයින් රුපියල් බිලියන 60 ක ප්‍රමාණයක් පිරිනමන ලද අතර, රුපියල් බිලියන 39.60 ක ප්‍රමාණයක් වෙන්දේසි 6 ක් ඔස්සේ අවශෝෂණය කර ගන්නා ලදී. එහි බර තබන ලද සාමාන්‍ය ඵලදා අනුපාතිකය සියයට 6.47 ත් සියයට 6.77 ත් අතර පැවතුණි. සහභාගිත්ව ආයතන විසින් ඉදිරිපත් කරන ලද පහළ අනුපාතික හේතුවෙන් වෙන්දේසි 3 ක සියලුම ලංසු ප්‍රතික්ෂේප කරන ලදී.

වෙළෙඳපොළෙහි පැවති ද්‍රවශීලතා හිඟතාව නිසා 2016 නොවැම්බර් මස අග කාල සීමාවේ දී, වෙළෙඳපොළට ස්ථිර පදනම මත මුදල් ලබාදීම සඳහා භාණ්ඩාගාර බිල්පත් ස්ථිර පදනම මත මිලට ගැනීම සිදු කරන ලදී. දේශීය කටයුතු දෙපාර්තමේන්තුව ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් මිලට ගැනීමේ වෙන්දේසි 78 ක් පවත්වන ලදී. එමගින් රුපියල් බිලියන 165 ක ප්‍රමාණයක් පිරිනමන ලද අතර, රුපියල් බිලියන 15.8 ක ප්‍රමාණයක් වෙන්දේසි 15 ක් ඔස්සේ පිළිගන්නා ලදී. එහි බර තබන ලද සාමාන්‍ය ඵලදා අනුපාතිකය සියයට 8.65 ත් සියයට 9.95 ත් අතර පැවතුණි. සහභාගිත්ව ආයතන විසින් ඉදිරිපත් කරන ලද ඉහළ අනුපාතිකයන් හේතුවෙන් මෙම වෙන්දේසි 16 සියලුම ලංසු ප්‍රතික්ෂේප කරන ලදී. ඉතිරි වෙන්දේසි සඳහා වෙළෙඳපොළෙන් ප්‍රතිචාරයක් නොතිබුණි.

### 6.3.2 නිත්‍ය පහසුකම

අන්තර් බැංකු මුදල් වෙළෙඳපොළෙන් සහ විවට වෙළෙඳ කටයුතු වෙන්දේසි තුළින් තම ද්‍රවශීලතා අවශ්‍යතාවන් සම්පූර්ණයෙන් සපුරා ගැනීමට නොහැකි වූ සහභාගිත්ව ආයතන සඳහා නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය හා නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය යටතේ නිත්‍ය පහසුකම් සැපයීම වසර පුරා ම සිදු කරන ලදී. නිත්‍ය තැන්පතු පහසුකම්වල මුළු වටිනාකම රුපියල් බිලියන 5,572.7 ක් වූ අතර එහි දෛනික සාමාන්‍ය රුපියල් බිලියන 23.1 ක් විය. නිත්‍ය ණය පහසුකම්වල මුළු වටිනාකම රුපියල් බිලියන 3,208.3 ක් වූ අතර එහි දෛනික සාමාන්‍ය රුපියල් බිලියන 15.8 ක් විය.

### 6.3.3 ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව

ශ්‍රී ලංකා මහ බැංකුවේ විධිවිධානවලට අනුකූලව සෑම වාණිජ බැංකුවක් විසින් ම සිය මුළු රුපියල් තැන්පතු වගකීම පදනම් කරගෙන මහ බැංකුවෙහි පවත්වාගෙන යන ජංගම ගිණුමේ අනිවාර්යයෙන් දිනපතා පවත්වාගෙන යා යුතු අවම සංචිත ප්‍රමාණය ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව ලෙස හඳුන්වනු ලැබේ. ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව පවත්වාගෙන යෑම පාලනය කිරීම සහ වාණිජ බැංකු විසින් දක්වන අනුකූලතාව අධීක්ෂණය කිරීම දේශීය කටයුතු දෙපාර්තමේන්තුවේ වගකීමකි. ආර්ථිකයේ ඉදිරි උද්ධමන තත්ත්වයන් උග්‍රවීමට තුඩුදිය හැකි මුදල් සමස්තයන්ගේ අතිසි ප්‍රසාරණය වැළැක්වීමේ අරමුණින් ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා අනුපාතය සියයට 7.50 ක් දක්වා ප්‍රතිශතාංක 1.50 කින් 2016 ජනවාරි 16 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ඉහළ නැංවීමට 2015 දෙසැම්බර් මස දී තීරණය කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් 2016 වසර ආරම්භයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රුපියල් බිලියන 52.0 ක අතිරික්ත ද්‍රවශීලතා ප්‍රමාණයක් මුදල් වෙළෙඳපොළෙන් අවශෝෂණය කරගන්නා ලදී.

### 6.3.4 බැංකු අනුපාතිකය

මුදල් නීති පනතේ 87 වන වගන්තිය යටතේ බලපත්‍රලාභී වාණිජ බැංකුවලට සපයනු ලබන කෙටිකාලීන අත්තිකාරම් මත වූ මහ බැංකු පොලී අනුපාතිකය සියයට 15 ක් ලෙස නොවෙනස්ව පැවතුණි. කෙසේ වුවද, මෙම පොලී අනුපාතිකය යටතේ වාණිජ බැංකුවලට මහ බැංකුවෙන් ණය ලබා ගැනීමේ අවශ්‍යතාවක් මෙම වසර තුළ දී ඇති නොවීය.

## 6.4 රජයේ සහ වාණිජ බැංකුවල බැංකුකරු වශයෙන් මහ බැංකුවේ කාර්යභාරය

### 6.4.1 මූල්‍ය ආයතනවල ගිණුම්

වාණිජ බැංකුවල බැංකුකරු වශයෙන් මහ බැංකුවේ කාර්යභාරය ඉටු කරමින්, කාර්යක්ෂම අන්තර් බැංකු ගෙවීම් සහ පියවීම් පද්ධතියක් සහතික කරනු පිණිස දේශීය කටයුතු දෙපාර්තමේන්තුව විසින් වාණිජ බැංකු සහ ප්‍රාථමික වෙළෙඳුන් හට ජංගම ගිණුම් පහසුකම් සැපයීම අඛණ්ඩව සිදු කරන ලදී. 2016 වසර අවසානය වන විට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වාණිජ බැංකු සහ ප්‍රාථමික වෙළඳුන් සඳහා ගිණුම් 25 ක් පවත්වා ගෙන යන ලදී. මෙම ගිණුම් තත්කාලීන දළ පියවුම් පදනම මත ක්‍රියාත්මක විය.

### 6.4.2 රජයේ ගිණුම්

2016 වසර අවසානය වන විට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වාගෙන යනු ලැබූ එවැනි මුළු ගිණුම් සංඛ්‍යාව 61 කි.

ඒ අනුව, දේශීය කටයුතු දෙපාර්තමේන්තුව රජය වෙනුවෙන් රුපියල් බිලියන 14,963.3 ක් වටිනා ගනුදෙනු 22,730 ක් සිදු කරන ලදී. එම ගනුදෙනු සංඛ්‍යාවෙන් සියයට 90 කට වැඩි ප්‍රතිශතයක් නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම් ගිණුම, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ ජංගම ගිණුම, දේශීය ආදායම් කොමසාරිස්ගේ එකතු කළ අගය මත බදු ආපසු ගෙවීමේ ගිණුම සහ ජනාධිපති අරමුදල් ගිණුම යන ගිණුම්වලට අයත් විය.


මුදල් නීති පනතේ 89 වැනි වගන්තිය ප්‍රකාරව රජයේ ඉදිරි වසරේ දී ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 10 උපරිමයකට යටත්ව මහ බැංකුව විසින් රජයට පොලී රහිත තාවකාලික අත්තිකාරම් ලබා දීමට කටයුතු කරනු ලැබේ. 2015 වසරේ දී රජයට ලබා දුන් තාවකාලික අත්තිකාරම් මුදල රුපියල් බිලියන 153.2 සමග සැසඳීමේ දී, 2016 ආරම්භය වන විට රජයට ලබාදෙන තාවකාලික අත්තිකාරම් මුදල් රුපියල් බිලියන 185.1 දක්වා රුපියල් බිලියන 31.9 කින් වැඩි විය.

### 6.5 එක්දින ද්‍රවශීලතා පහසුකම සැපයීම

තත්කාලීන දළ පියවුම් පද්ධතිය තුළ මෙහෙයුම් කටයුතු සුමටව හා කාර්යක්ෂමව සිදු කිරීම සහතික කිරීමට දේශීය කටයුතු දෙපාර්තමේන්තුව විසින් සහභාගිත්ව ආයතන වෙත දිනය තුළ ද්‍රවශීලතා පහසුකම් සපයන ලදී. භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර සුරැකුම් ලෙස තබා ගනිමින් ලබා දෙන මෙම පහසුකම් සැපයීම, ගාස්තුවකින් තොරව සිදු කළ අතර, සුරැකුම්පත්වල වර්තමාන මිල ගණන් අනුව මිල උච්ඡාවචනයන් ආවරණය කරගත හැකි පරිදි ප්‍රමාණවත් ගැලපීමක් එහි දී සිදු කරන ලදී.

**II-5 රූප සටහන**

**2016 තුළ ලබාගත් එක් දින ද්‍රවශීලතා පහසුකම**




මෙම වසර තුළ දී ලබාගත් මුළු එක්දින ද්‍රවශීලතා පහසුකම් ප්‍රමාණය සහ දෛනික සාමාන්‍යය, පිළිවෙළින් රුපියල් බිලියන 9,351 සහ රුපියල් බිලියන 38.8 ක් විය. මෙය පෙර වසරේ පැවති මෙම අගයන් වන රුපියල් බිලියන 5,594 සහ රුපියල් බිලියන 23.3 සමග සැසඳීමේ දී ඉහළ යාමක් වාර්තා කරන ලදී.

### 6.6 මුදල් තැරැව්කරුවන් අධීක්ෂණය

මුදල් වෙළෙඳපොළෙහි (මුදල්, විදේශ විනිමය සහ රජයේ සුරැකුම්පත්) මිල ගවේෂණ ක්‍රියාවලියේ දී මුදල් තැරැව්කරුවන්ගේ කාර්යයෙහි වැදගත්කම සලකා බලමින් මුදල් නීති පනතේ අංක 10 (ඇ) වගන්තිය යටතේ 2013 පෙබරවාරි 15 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි 2013 අංක 01 දරන මුදල් තැරැව්කාර නියාමනය නිකුත් කරන ලදී. මුදල් තැරැව්කරුවන්ගේ සමාගම් 9 ක් සඳහා 'බලය පැවරීමේ සහතික' මෙම නියාමනය අනුව නිකුත් කරන ලද අතර, ඒවා 'බලයලත් මුදල් තැරැව්කරුවෝ' ලෙස නම් කරන ලදී. 2016 අංක 01 දරන මුදල් තැරැව්කාර පනතෙහි 20 වැනි නියාමනය අනුව, මුදල් වෙළෙඳපොළ කටයුතු අධීක්‍ෂණය වැඩි දියුණු කිරීම සඳහා දේශීය කටයුතු දෙපාර්තමේන්තුව මගින් මුදල් තැරැව්කරුවන්ට ඔවුන් විසින් හසුරවන ලද ගණුදෙනු හා සම්බන්ධ සියලුම දත්ත වාර්තා කිරීම සඳහා මංගත පද්ධතියක් හඳුන්වා දෙන ලදී. ඒ අනුව මුදල් තැරැව්කරුවන් හරහා සිදුවන සියලුම ගනුදෙනු අදාළ පාර්ශ්වයන්ගේ නම් සමගින් ලංසු තැබීමේ තොරතුරු යාවත්කාලීන කිරීම අවශ්‍ය වේ. දේශීය කටයුතු දෙපාර්තමේන්තුව වසර තුළ දී බලයලත් මුදල් තැරැව්කාර සමාගම් 9 ක එතැන් පරීක්ෂණ පවත්වන ලද අතර, එම සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩල සමග රැස්වීම් 6 ක් පවත්වන ලදී. 2016 වසර තුළ බලයලත් මුදල් තැරැව්කාර ආයතන සංඛ්‍යාව නොවෙනස්ව පැවතුණි.

**මුදල් තැරැව්කාර සමාගම් ලැයිස්තුව**

1. බාට්ලීට් මැක්ලේයි ඇන්ඩ් රෝයි (ප්‍රයිවට්) ලිමිටඩ්
2. ඊස්ට් එලායන්ස් මනි බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
3. ජෝර්ජ් ස්ටුවර්ට් ඉන්වෙස්ට්මන්ට්ස් (පීවීටී) ලිමිටඩ්
4. එම් වී එස් මනි බ්‍රෝකර්ස් ලිමිටඩ්
5. නවාරා ෆොරෙක්ස් ඇන්ඩ් මනි බ්‍රෝකර්ස් ලිමිටඩ්
6. පිගට් චැප්මන් ඇන්ඩ් කම්පැනි (පීවීටී) ලිමිටඩ්
7. එස් එම් බී මනි බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
8. ටැප්‍රොබේන් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
9. විෂ්වින් මනි ඇන්ඩ් එක්ස්චේන්ජ් බ්‍රෝකර්ස් ලිමිටඩ්

## 7. ආර්ථික පර්යේෂණ

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව, 1949 මුදල් නීති පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව ස්ථාපිත කරන ලද අවස්ථාවේ දී පිහිටුවන ලද ප්‍රධානතම දෙපාර්තමේන්තු අතුරින් එක් දෙපාර්තමේන්තුවකි. මුදල් හා බැංකු සහ අනෙකුත් පොදු ආර්ථික විෂය කරුණු සම්බන්ධයෙන් ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් මණ්ඩලයට හා අධිපතිවරයාට උපකාරී වීම පිණිස සහ මහජනතාවට තොරතුරු ලබාදීම සඳහා දත්ත සකස් කිරීම මෙන්ම ආර්ථික පර්යේෂණ සිදු කිරීම, මුදල් නීති පනතේ 25 වන වගන්තිය අනුව ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවට පැවරී ඇති ප්‍රධාන කාර්යභාරයන් වේ. ආර්ථික හා මිල ස්ථායීතාව පවත්වා

ගැනීම සඳහා වන මහ බැංකුවේ අරමුණ ළඟාකර ගැනීම සඳහා මුදල් හා විදේශ අංශයේ ප්‍රතිපත්ති මෙන්ම රජයේ ආර්ථික උපදේශක ලෙස කටයුතු කිරීම සඳහා සහාය වෙමින් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව සිය කාර්යභාරය ඉටු කළේය. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් කාලීන විෂයයන් සම්බන්ධයෙන් පර්යේෂණ සිදු කිරීම ද, මහ බැංකුවෙහි ව්‍යවස්ථාපිත ප්‍රකාශන ප්‍රකාශයට පත්කිරීම ද, මහජනතාව ඇතුළු ආර්ථිකයේ සියලු පාර්ශ්වකරුවන් වෙත දත්ත සහ තොරතුරු බෙදාහැරීම ද, රජය වෙනුවෙන් ජාත්‍යන්තර සංවිධාන සමඟ සමීප සබඳතා පැවැත්වීම ද අඛණ්ඩව සිදු කරන ලදී.

## 7.1 ආර්ථික හා මිල ස්ථායීතාව පවත්වා ගැනීම

ආර්ථික හා මිල ස්ථායීතාව පවත්වා ගැනීමේ ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණ සපුරාලීමෙහිලා, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් දේශීය ආර්ථිකයේ විදේශ, රාජ්‍ය මූල්‍ය, මුදල් සහ මූර්ත යන සියලුම අංශවල මෙන්ම ගෝලීය ආර්ථිකයේ ප්‍රවණතා සහ වෙනස්වීම් සමීපව අධීක්ෂණය කරන ලදී. ඒ අනුව, අඩු උද්ධමනකාරී තත්ත්වයක් තුළ හිතකර ආර්ථික වර්ධනයක් ඇති කිරීම සඳහා අවශ්‍ය වන මුදල් ප්‍රතිපත්තියෙහි දිශානතිය පිළිබඳ මුදල් මණ්ඩලය වෙත ඉදිරි දැක්මකින් යුතුව නිර්දේශ ලබාදීම සඳහා මුදල් ප්‍රතිපත්ති කමිටුවට හැකිවන පරිදි ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව නිරීක්ෂණ සිදු කරන අතර, සාර්ව ආර්ථික සංඛ්‍යාන සහ සාර්ව ආර්ථිකමිතික පුරෝකථන පාදක කොටගෙන සිදු කරනු ලබන පුළුල් විශ්ලේෂණ මෙන්ම නිසි ප්‍රතිපත්ති නිර්දේශ ද මුදල් ප්‍රතිපත්ති කමිටුවට ඉදිරිපත් කරන ලදී. මෙම තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා අවශ්‍ය වන ප්‍රධාන යෙදවුම් වන මතුපිට සහ මූලික උද්ධමන පුරෝකථන, ආර්ථිකයේ ප්‍රශස්ත නිමැවුම් හැකියාව සහ නිමැවුම් පරතරය පිළිබඳ ඇස්තමේන්තු සහ මුදල් හා ණය සමස්තවල හැසිරීම පිළිබඳ දත්ත, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සම්පාදනය කරන ලදී. ප්‍රධාන සාර්ව ආර්ථික විචල්‍යවල අපේක්ෂිත ක්‍රියාකාරිත්වයට බලපෑ හැකි දේශීය සහ ජාත්‍යන්තර ආර්ථික විචලනයන්ගෙන් පැනනගින අවදානම් පිළිබඳව ද මුදල් මණ්ඩලය දැනුම්වත් කිරීම මෙන්ම, සුදුසු ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග යෝජනා කිරීම ද ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. 2015 වාර්ෂික වාර්තාව මගින් සඳහන් කළ අන්දමට, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුගමනය කෙරෙන වැඩිදියුණු කළ මුදල් ප්‍රතිපත්ති රාමුව යටතේ මැදිකාලීන වශයෙන් නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවක් කරා යොමුවීම සඳහා යෝජිත සංක්‍රාන්ති සැලැස්මට අදාළව ප්‍රධාන ආර්ථික පාර්ශ්වකරුවන් පිළිබඳ විධිමත් ඇගයීමක් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. මෙහි මූලික පියවරක් ලෙස, පුරෝකථන සහ ප්‍රතිපත්ති විශ්ලේෂණ පද්ධතියක් (Forcasting and Policy Analysis System, FPAS) ස්ථාපනය කිරීම සඳහා 2016 වසරේ දී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ තාක්ෂණික කණ්ඩායමක් සමඟ එක්ව කටයුතු කරන ලදී. ඒ අනුව, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් තාක්ෂණික සහාය සහාය සඳහා වන දූත මෙහෙවර කණ්ඩායම් තුනක් සම්බන්ධීකරණය කරන ලද අතර, එයට ශ්‍රී ලංකා මහ බැංකුවේ ආර්ථික ප්‍රතිපත්ති උපදේශන පර්ෂදය තුළින් තෝරාගත් කාර්යමණ්ඩල සාමාජිකයෝ ද සහභාගි වූහ. සාර්ව ආර්ථික ආකෘති නිර්මාණය සහ පුරෝකථනයට අදාළව මහ බැංකු කාර්ය මණ්ඩලයේ තාක්ෂණික කුසලතා වැඩිදියුණු කිරීම මෙහි අරමුණ විය. ඒ අනුව, මෙම පද්ධතිය පියවර වශයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා 2016 වසරේ මැයි මාසයේ දී, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය වෙත ප්‍රධාන වගකීම් පවරමින් අන්තර් දෙපාර්තමේන්තු ආකෘති සහ පුරෝකථන ඒකකයක් පිහිටුවන ලදී. පුරෝකථන සහ ප්‍රතිපත්ති විශ්ලේෂණ පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ වැදගත් අංගයක් ලෙස, ආකෘති හා පුරෝකථන ඒකකය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කණ්ඩායම සමඟ එක්ව මැදිකාලීන පුරෝකථන සිදුකර එහි ප්‍රතිඵල සහ ප්‍රතිපත්තිමය නිර්දේශ මුදල් ප්‍රතිපත්ති කමිටුවෙහි විශේෂ රැස්වීමක් සඳහා ඉදිරිපත් කරන ලදී. මෙම ක්‍රියාදාමය ඉදිරියට සිදුකර ගෙන යෑමේ ආයතනික කැපවීමේ අවශ්‍යතාව හඳුනා ගනිමින්, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව තුළ ආකෘතිකරණ සහ පුරෝකථන අංශයක් ස්ථිර වශයෙන් ස්ථාපනය කරන ලදී. ඒ අනුව, පුරෝකථන සහ ප්‍රතිපත්ති විශ්ලේෂණ පද්ධතිය වැඩිදියුණු කිරීම හා ක්‍රියාත්මක කිරීම ශ්‍රී ලංකාව සඳහා මූල්‍ය වැඩසටහනක් සකස් කිරීම, ආකෘති පදනම් කරගත් ප්‍රතිපත්ති විශ්ලේෂණ සිදු කිරීම සහ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අනෙකුත් අංශ සමඟ එක්ව පර්යේෂණ සිදු කිරීම යන වගකීම් ආකෘතිකරණ සහ පුරෝකථන අංශයට පවරා ඇත. මෙම වසර තුළ දී, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ මුදල් සහ මූල්‍ය සංඛ්‍යාන පිළියෙල කිරීම පිළිබඳ නවතම අත්පොතට අනුකූලව මුදල් සංඛ්‍යාන යාවත්කාලීන කිරීම ආරම්භ කරන ලදී. ඒ අනුව, 2016 ජූලි මාසයේදී තාක්ෂණික සහාය ලබා ගැනීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි කණ්ඩායමක උපකාර සහිතව මහ බැංකුව සහ අනෙකුත් තැන්පතු ආයතන සඳහා සම්මත වාර්තාකරණ ආකෘති හඳුන්වා දීමට ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව කටයුතු කළ අතර, මහ බැංකුවේ විශ්ලේෂණ අවශ්‍යතා සපුරාලිය හැකි ඒකාබද්ධ මුදල් දත්ත පදනමක් නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය සඳහා කාර්ය මණ්ඩලය යොමු කරන ලදී. මෙම තාක්ෂණික සහාය ලබා ගැනීමෙන් පසුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි සම්මත වාර්තාකරණ ආකෘතිවලට අනුකූලව දත්ත වාර්තා කිරීම ආරම්භ කරන ලදී.

## 7.2 විදේශීය අංශයේ ස්ථායීතාව පවත්වා ගැනීම

ආර්ථිකයෙහි විදේශීය අංශයෙහි ස්ථායීතාව පවත්වා ගැනීමට සහාය වීම පිණිස ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ජාත්‍යන්තර මූල්‍ය සහ වෙළඳාමට අදාළ ආර්ථික සංඛ්‍යා දත්ත රැස් කිරීම, සම්පාදනය කිරීම සහ විශ්ලේෂණය කිරීමෙහි අඛණ්ඩව නිරත වූ අතර, දේශීය හා ගෝලීය ආර්ථිකයේ වෙනස්වීම් පිළිබඳව පුළුල් ඇගයීම් සිදු කරමින් සුදුසු ප්‍රතිපත්ති නිර්දේශ ලබා දීම සිදු කරන ලදී. ආර්ථිකයේ අනෙකුත් අංශවල වෙනස්වීම් හා සමගාමීව විදේශීය අංශයෙහි සංඛ්‍යා දත්ත සහ නාමික හා මූර්ත විනිමය අනුපාතික මගින් පිළිබිඹු වන විදේශීය අංශයෙහි වෙනස්වීම්, මුදල් ප්‍රතිපත්ති කමිටුව සහ මුදල් මණ්ඩලය වෙත මාසිකව වාර්තා කරන ලදී.

විදේශීය අංශයට අදාළ විවිධ කරුණු සම්බන්ධයෙන් විශ්ලේෂණය කිරීම සහ නිරීක්ෂණ ලබා දීමට අමතරව, මුදල් නීති පනතෙහි විධිවිධානවලට අනුව, රජය විසින් විදේශීය ණය ගැනීමේ දී ඉන් මුදල් ප්‍රතිපත්තියට ඇති වන බලපෑම ඇගයීම ද ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරන ලදී.

මීට අමතරව, නිරන්තර සහ කාලීන මුදල් මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කිරීම තුළින් විදේශීය අංශයේ ඇති විය හැකි අවදානම් පිළිබඳව මුදල් මණ්ඩලය දැනුම්වත් කිරීම සඳහා ද ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව වැදගත් කාර්යභාරයක් ඉටු කළේය. 2016 ජූනි මාසයේ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙතින් වි.ගැ.හි. බිලියන 1.1 (ආසන්න වශයෙන් එ.ජ. ඩොලර් බිලියන 1.5) ක් වටිනා තුන් අවුරුදු විස්තීර්ණ ණය පහසුකම ලබා ගැනීම සඳහා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් තාක්ෂණික සහාය සැපයූ අතර, එම වැඩසටහන යටතේ එකඟ වූ කාර්යසාධන නිර්ණායක, අතරමැදි ඉලක්ක සහ ව්‍යුහාත්මක මිනුම්දඬුවල ප්‍රගතිය පිළිබඳව විධිමත් ලෙස මුදල් මණ්ඩලය දැනුම්වත් කරන ලදී.

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් විදේශීය අංශයේ සංඛ්‍යා දත්ත සම්පාදනය සහ ප්‍රකාශනය වැඩිදියුණු කිරීම සඳහා පෙර වසරවල දී ගන්නා ලද ක්‍රියාමාර්ග මෙම වසරේ දීද අඛණ්ඩව පවත්වාගෙන යන ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ගෙවුම් තුලන අත්පොතෙහි හයවෙනි සංස්කරණයට අනුව (BPM6) කාර්තුමය පදනම මත වන ගෙවුම් තුලන සංඛ්‍යා දත්ත සහ ජාත්‍යන්තර ආයෝජන තත්ත්වය පිළිබඳ සංඛ්‍යා දත්ත ප්‍රකාශයට පත් කිරීම සහ විදේශීය ණය පිළිබඳ සංඛ්‍යා දත්ත නිතිපතා ලෝක බැංකුව වෙත වාර්තා කිරීම, සෘජු ආයෝජන දත්ත වාර්ෂික පදනම මත විදේශීය ආයෝජන පිළිබඳ ඒකාබද්ධ සමීක්ෂණයට (CDIS) ඉදිරිපත් කිරීම සහ ජාත්‍යන්තර සංචිත දත්ත සටහන (RDT) ප්‍රකාශයට පත් කිරීම අඛණ්ඩව සිදු කරන ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විශේෂිත දත්ත ප්‍රකාශන සම්මතයට (SDDS) අදාළ මූලික අවශ්‍යතාව අනුව පූර්ව නිවේදිත දින දර්ශනයකට අනුව දත්ත ප්‍රකාශයට පත් කරන ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් දත්තවල නිරවද්‍යභාවය සහ කාලීන බව සහතික කිරීම උදෙසා, ජාත්‍යන්තර ආයෝජන පිළිබඳ වාර්ෂික සමීක්ෂණය යටතේ විවිධ සමීක්ෂණ කිහිපයක් සිදු කරනු ලැබූ අතර, 2016 වසරේදී එමගින් ආවරණය වන සමාගම් ගණන 1,600 ක් දක්වා ඉහළ නංවන ලදී. මෙම සමීක්ෂණ මගින් පෞද්ගලික අංශයෙහි විදේශීය වත්කම් සහ වගකීම් පිළිබඳ තොරතුරු සහ සේවා අංශයෙහි සංඛ්‍යා දත්ත රැස් කරන ලදී. තව ද, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් පිළිබඳ වූ මාසික සමීක්ෂණය ද අඛණ්ඩව සිදු කරන ලදී.

### 7.3 දූරදර්ශී ප්‍රතිපත්තිමය උපදේශන ලබා දීම

2016 වසර තුළ දී ද මුදල් ප්‍රතිපත්තිය, විනිමය අනුපාතික ප්‍රතිපත්තිය සහ රාජ්‍ය මූල්‍ය අංශයට අදාළ ගැටලු සම්බන්ධව ඉදිරි කාලීන දැක්මකින් යුතු ප්‍රතිපත්තිමය උපදෙස්, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මහ බැංකුවේ ඉහළ කළමනාකාරිත්වය සහ රජය වෙත අඛණ්ඩව ලබා දෙන ලදී. පෙර වසරවල දී මෙන්ම, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මුදල් නීති පනතේ අංක 116 (1) වගන්තියට අනුකූලව "සැප්තැම්බර් 15 වාර්තාව" මුදල් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලදී. අයවැය ලේඛනය සකස් කිරීම සඳහා ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශයක් ලෙස ඉදිරිපත් කරනු ලබන මෙම රහස්‍ය වාර්තාව මගින්, වසරේ මුල් මාස නවයට අදාළව ආර්ථිකයේ සිදුවූ වර්ධනයන් සාකච්ඡා කරන අතර, ආර්ථිකයේ පවතින ගැටලු සහ ඒවා විසඳීම සඳහා යොදා ගත හැකි ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ද ඉදිරිපත් කරනු ලැබේ. මීට අමතරව, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මුදල් නීති පනතේ විවිධ වගන්තිවල සඳහන් කර ඇති පරිදි, ප්‍රතිපත්තිමය ඇගයීම් සහ උපදෙස් ඇතුළත් වාර්තා ද මුදල් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලදී.

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීහු බාහිර ආයතනවල කමිටු සහ මණ්ඩල සඳහා සිය දායකත්වය අඛණ්ඩව ලබාදුන්හ. හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීම් ආයතනය, ජාතික විද්‍යා පදනම, ලංකා විදුලිබල මණ්ඩලය, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතු සහ විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම් ලබා ගැනීමට අදාළ ටෙන්ඩර් මණ්ඩල සහ තාක්ෂණික ඇගයීම් කමිටු, රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාන සම්බන්ධීකරණ කමිටුව, සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ගාස්තු පිළිබඳ කමිටුව, ජල සම්පාදන සහ සනීපාරක්ෂක සේවා සැපයුම් කමිටුව සහ ග්‍රාමීය සමූපකාර බැංකු අධ්‍යයනය සඳහා වන කණ්ඩායම ආදිය මෙයට ඇතුළත් වේ.

තව ද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සම්බන්ධීකරණය කරන මුදල් ප්‍රතිපත්ති කමිටු රැස්වීම් සඳහා සහභාගි වීමට අමතරව, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීහු, වෙළඳපොළ මෙහෙයුම් කමිටුව, දේශීය ණය කළමනාකරණ කමිටුව, ආයෝජන සුපරීක්ෂණ කමිටුව/ආයෝජන කමිටුව, ජාත්‍යන්තර සංචිත කළමනාකරණ කමිටුව, පුස්තකාල උපදේශාත්මක කමිටුව සහ පර්යේෂණ ප්‍රකාශන කමිටුව වැනි මහ බැංකුවේ විවිධ අභ්‍යන්තර කමිටු සඳහා ද සිය දායකත්වය ලබාදුන්හ. අන්තර් දෙපාර්තමේන්තු කමිටු කිහිපයක් සඳහා තාක්ෂණික දැනුම සහ අත්දැකීම් සපයමින් ද සිය දායකත්වය ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව ලබාදෙන ලදී.

### 7.4. ව්‍යවස්ථාපිත ප්‍රකාශන සහ දත්ත හා තොරතුරු බෙදාහැරීම

ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යවස්ථාපිත ප්‍රකාශන නිකුත් කිරීමේ මූලික වගකීම ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවට පැවරී ඇත. ඒ අනුව, අනෙකුත් දෙපාර්තමේන්තුවල දායකත්වය හා සහාය ඇතිව ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන වාර්ෂික ප්‍රකාශන දෙකක් නිකුත් කරන ලදී. මුදල් නීති පනතේ 35 වන වගන්තියට අදාළ අවශ්‍යතාව සපුරාලමින්, ආර්ථිකයේ සියලු අංශ ආවරණය වන පරිදි ආර්ථික ප්‍රවණතා පිළිබඳ සවිස්තරාත්මක විශ්ලේෂණ, ගැටලු හා අභියෝග සහ ප්‍රතිපත්ති ප්‍රමුඛතා මෙන්ම, ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් හා කටයුතු, මුදල් මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ප්‍රධාන පරිපාලන විධිවිධාන හා මහ බැංකු කටයුතුවලට අදාළව සම්මත කරන ලද ප්‍රධාන නීති අණපනත් සහ සංඛ්‍යාලේඛන පරිශිෂ්ට ඇතුළත්ව, 2015 වාර්ෂික වාර්තාව නියමිත කාල

වකවානුව තුළදී භාෂා ත්‍රිත්වයෙන්ම ප්‍රකාශයට පත් කරන ලදී. ආර්ථිකය පිළිබඳ අන්තර්කාලීන සමාලෝචන වාර්තාව වන "මෑතකාලීන ආර්ථික ප්‍රවණතා: 2016 සුවිශේෂී සිදුවීම් සහ 2017 අපේක්ෂාවන්" ප්‍රකාශනයද 2016 නොවැම්බර් මාසයේදී භාෂා ත්‍රිත්වයෙන්ම ප්‍රකාශයට පත් කෙරිණි. 2017 වසර ආරම්භයේ දී නිවේදනය කරන ලද "2017 වසර හා ඉදිරිය සඳහා මුදල් හා මූල්‍ය අංශය සඳහා වූ ප්‍රතිපත්ති පෙරදැක්ම" 2016 දෙසැම්බර් මාසයේ දී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලදී.

මේ අතර, ආර්ථිකයේ සියලු පාර්ශ්වකරුවන්ගේ ප්‍රයෝජනය පිණිස, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් දත්ත හා තොරතුරු සමුදායක් සකස් කිරීම හා ප්‍රකාශයට පත් කිරීම අඛණ්ඩවම සිදු කරන ලදී. මහ බැංකු වෙබ් අඩවිය තුළ නිරතුරුව යාවත්කාලීන කරනු ලබන දත්තවලට අමතරව, ආර්ථිකයේ සියලු අංශ ආවරණය වන දත්ත ඇතුළත් වන මාසික විවරණිකා, සතිපතා සහ මාසිකව පිළියෙල කරනු ලබන ආර්ථික දර්ශක සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්තිය සහ විදේශීය අංශයේ ප්‍රවණතා පිළිබඳව වන මාසික පුවත්පත් නිවේදන ඒ අතර වේ. මෙයට අමතරව, පොදු මහජනතාවගේ අවධානයට ලක්වූ ආර්ථිකයේ විවිධ ප්‍රවණතා පිළිබඳව ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් පුවත්පත් නිවේදන නිකුත් කරන ලදී.

### 7.5 ප්‍රතිපත්තිමය පර්යේෂණවල නිරත වීම සහ දැනුම බෙදාහැරීම

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ආර්ථික පර්යේෂණ ආයතනයක් ලෙස ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව, මුදල් ප්‍රතිපත්ති කමිටුවෙහි හා මුදල් මණ්ඩලයෙහි අවධානය යොමු කරවීම පිණිස වත්මන් ආර්ථික ගැටලු හා ප්‍රතිපත්ති පිළිබඳ නොයෙකුත් ප්‍රතිපත්තිමය පර්යේෂණ කටයුතුවල නිතර විය. තොරතුරු දැනුම් දීමේ මුදල් මණ්ඩල පත්‍රිකා, මුදල් ප්‍රතිපත්තිය පිළිබඳ මුදල් මණ්ඩල පත්‍රිකා, නිරීක්ෂණ වාර්තා සහ ඉදිරිපත් කිරීම් යනාදිය මගින් ආර්ථිකයෙහි තත්ත්වය, ගැටලු, අභියෝග සහ අවදානම් තත්ත්ව මෙන්ම සුදුසු ප්‍රතිපත්ති දිශාව පිළිබඳව ඉහළ කළමනාකාරිත්වය නිතිපතා දැනුම්වත් කිරීමේ කටයුතු ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලැබීය.

පර්යේෂණ කටයුතුවලට අදාළ අභ්‍යන්තර කමිටුවක් වන "පර්යේෂණ උපදේශක මණ්ඩලය" විසින් සමස්තයක් වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව තුළ මෙන්ම දෙපාර්තමේන්තව තුළද පර්යේෂණ සිදු කිරීමේ නැඹුරුව වැඩිදියුණු කිරීම සඳහා පහසුකම් සැලසීම අඛණ්ඩව සිදු කරනු ලැබීය. දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ මෙන්ම අනෙකුත් දෙපාර්තමේන්තුවල නිලධාරීන්ගේ පර්යේෂණ ප්‍රතිඵල ඇතුළත් ශ්‍රී ලංකා මහ බැංකුවේ නිල පර්යේෂණ ප්‍රකාශනය වන "මාණ්ඩලික පත්‍රිකා" ප්‍රකාශයට පත්කිරීම වැනි කටයුතු ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදුකරන ලදී. මීට අමතරව, ආර්ථික ක්ෂේත්‍රයේ තාක්ෂණික සහ කාලීන දැනුම හුවමාරු කර ගැනීම දිරිගන්වනු පිණිස විවිධ ක්ෂේත්‍රවල විශේෂඥයෝ දෙපාර්තමේන්තුව තුළ සම්මන්ත්‍රණ ගණනාවක් පැවැත්වූහ. තවද, වසරේ අවසාන භාගයේ දී විවිධ උසස් අධ්‍යාපනික ආයතන වෙතින් පැමිණෙන ආධුනික පුහුණුවන්නන්ගෙන් සමන්විත කණ්ඩායම් හයක් වෙනුවෙන් ආර්ථික විද්‍යාව සහ මහ බැංකුකරණය පිළිබඳ ප්‍රායෝගික අධ්‍යාපනික දැනුම ලබාදීම සඳහා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ සියලු අංශ එක්ව ක්‍රියා කළේය. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව, මානව සම්පත් දෙපාර්තමේන්තුව සහ පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව සමඟ එක්ව මහ බැංකුවේ නිලධාරීන් සහ මහජනතාව වෙනුවෙන් විවිධ මාතෘකා සම්බන්ධව ආර්ථික සම්මන්ත්‍රණ මාලාවක් මෙන්ම, ප්‍රසිද්ධ දේශන සංවිධානය කරන ලද අතර, ව්‍යුහාත්මක සහ ඉහළ ගුණාත්මකභාවයකින් යුතු උසස් පුහුණු වැඩසටහන් යළි ආරම්භ කිරීමට ද පහසුකම් සලසා දෙනු ලැබීය.

පර්යේෂණ උපදේශක මණ්ඩලය විසින් විවිධ පර්යේෂකයන්ට සහ ශාස්ත්‍රඥයන්ට කාලීන සාර්ව ආර්ථික ගැටලු පිළිබඳ සිය පර්යේෂණ ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාවක් සපයමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව 9 වෙනි වරටත් සාර්ථකව සංවිධානය කරන ලදී. 2016 වසරේ දී මෙම සමුළුව "අභියෝගාත්මක ගෝලීය සහ දේශීය පරිසරයක් තුළ තිරසාර සංවර්ධනය සහ සාර්ව ආර්ථික ප්‍රතිපත්ති" යන තේමාව යටතේ පවත්වන ලදී. ඉන්දීය ජනරජයේ ක්‍රමසම්පාදන කොමිසමේ හිටපු උප සභාපති ආචාර්ය මොන්ටෙක් සිංග් අලුවාලියා මහතා විසින් මෙහි ප්‍රධාන දේශනය පවත්වන ලදී. පෙර වසරවල මෙන්ම, 2016 සමුළුව සඳහා සංවර්ධිත සහ නැගී එන වෙළඳපොළ ආර්ථිකවල සහ ශ්‍රී ලංකාවේ විද්‍යාස්ථාන සහ ප්‍රතිපත්ති සම්පාදන ආයතන විසින් උසස් ගණයේ පර්යේෂණ පත්‍රිකා විශාල ප්‍රමාණයක් ඉදිරිපත් කර තිබිණි. තීව්‍ර විමර්ශන ක්‍රියාවලියකින් පසුව, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ පර්යේෂණ පත්‍රිකා දෙකක් ද ඇතුළුව, පර්යේෂණ පත්‍රිකා අටක් මෙවර සමුළුවේ දී ඉදිරිපත් කිරීමට තෝරා ගන්නා ලදී. මෙම සමුළුවේ සුවිශේෂී අංගයක් ලෙස "ශ්‍රී ලංකා මූල්‍ය වෙළඳපොළ සඳහා කෙටුම්පතක්" යන තේමාව යටතේ මහාචාර්ය ලලිත් සමරකෝන් මහතා විසින් ආරාධිත දේශනයක් ඉදිරිපත් කරන ලදී. 2016 වසරේ දී හොඳම පර්යේෂණ පත්‍රිකාව සඳහා වන ආචාර්ය ඩී.එස්.විජේසිංහ අනුස්මරණ ප්‍රදානය, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරිනියක් වන ආචාර්ය සුජීතා ජෙගජීවන් මහත්මිය වෙත පිරිනමන ලදී. තවද, මෙම සමුළුවේ දී, 2015 වසරේ පවත්වන ලද ජාත්‍යන්තර පර්යේෂණ සමුළුවෙහි පර්යේෂණ පත්‍රිකා කෘතියක් ලෙස ප්‍රකාශයට පත් කර ලදී.

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් අඛණ්ඩව ස්වකීය පර්යේෂණ දේශීය හා ජාත්‍යන්තර ප්‍රකාශනවල පළ කරන ලදී. Springer International Publishing ආයතන විසින් පළ කරන ලද නම් Causal Inference in Econometrics කෘතියේ Autoregressive conditionl duration model with an extended distribution යන පරිච්ඡේදය සඳහා ආචාර්ය රසිකා යටිගම්මන මහත්මිය විසින් සම කර්තෘත්වය දරන ලද අතර, Journal of International Financial Markets, Institutions and Money නම් සඟරාවේ පළවූ "Determinants of commercial bank retail interest rate adjustments: evidence from a panel data model" නම් වූ පර්යේෂණ පත්‍රිකාවේ සම කර්තෘත්වය ආචාර්ය ආර්.ඒ. අනිල් පෙරේරා මහතා විසින් දරන ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, අතිරේක අධ්‍යක්ෂවරුන් ඇතුළු නිලධාරීන් විසින් පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කරන්නන් හා විවරණය කරන්නන් ලෙස විවිධ සමුළු

නියෝජනය කරන ලදී. මාලදිවයිනේ පැවති "ව්‍යවහාරික ආර්ථිකමිතිය පිළිබඳ වැඩසටහන" හා තායිලන්තයේ පැවති "ඍජු ආයෝජන ගිණුම් සම්පාදනය" පිළිබඳ වැඩමුළුව ඇතුළු විවිධ දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් සඳහා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් සම්පත් දායකත්වය ලබා දෙන ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දෙදෙනෙකු මුදල් ප්‍රතිපත්තිය හා සාර්ව ආර්ථික ආකෘතිකරණය පිළිබඳව සිය පර්යේෂණ පත්‍රිකා අග්නිදිග ආසියානු මහ බැංකු ආයතනය (SEACEN Centre) මගින් මුල්වරට සංවිධානය කරන ලද පර්යේෂණ සතියේ දී ඉදිරිපත් කළ අතර, අග්නිදිග ආසියානු මහ බැංකු ආයතනය හා දකුණු ආසියානු කලාපීය සහයෝගීතා මූල්‍ය සංවිධානය (SAARCFINANCE) විසින් සම්පාදනය කරනු ලැබූ ඒකාබද්ධ පර්යේෂණ ප්‍රකාශන සඳහා නිලධාරීහු සිය දායකත්වය ලබා දුන්හ.

ගෙවුම් තුලන අත්පොතෙහි 6 වන සංස්කරණයට අනුරූපව සිදුවූ වෙනස්කම් සම්බන්ධයෙන් සියලු පාර්ශ්වකරුවන් අතර දැනුම්වත්භාවය ඉහළ නැංවීම සඳහා වසර තුළ දී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ගෙවුම් තුලන අත්පොතෙහි 6 වන සංස්කරණය පදනම් කර ගනිමින් සිදු කරනු ලබන වෙනස්කම් හා අනෙකුත් විදේශ අංශයේ විශේෂ සංඛ්‍යාන සටහන් විස්තර කරමින් ග්‍රන්ථයක් සකස් කරන ලදී. එම කෘතිය 2017 වසරේදී ප්‍රකාශයට පත් කිරීමට නියමිතය. තව ද, ශ්‍රී ලංකාවේ විදේශ අංශයෙහි සංඛ්‍යාන සම්පාදනය පිළිබඳ ඇති පුළුල් අත්දැකීම් සැලකිල්ලට ගනිමින් අනෙකුත් මහ බැංකු සඳහා කෙටිකාලීන පුහුණු සැසි පැවැත්වීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ගෙවුම් තුලන විශේෂඥවරයෙකු ලෙස ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරී අමිල විජේවර්ධන මහතා තෝරා ගන්නා ලදී.

විනිමය අනුපාතික නිර්ණය කිරීමේ මූලිකාංග සහ වෙළඳපොළ පදනම් කරගත් විනිමය අනුපාතික නිර්ණය කිරීම පිළිබඳ මහජනතාව දැනුම්වත් කිරීම සඳහා, "විනිමය අනුපාතික හා අවප්‍රමාණයේ ආර්ථික ප්‍රතිවිපාක" නමින් තොරතුරු පත්‍රිකාවක් භාෂා ත්‍රිත්වයෙන්ම පළ කිරීමට ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව කටයුතු කළේය.

මේ අතර, සන්නිවේදන දෙපාර්තමේන්තුව, බැංකු විදු පියෙස සහ ප්‍රාදේශීය කාර්යාල සමඟ ඒකාබද්ධව විශ්වවිද්‍යාල සිසුන්, පාසල් ගුරුභවතුන් හා පාසල් සිසුන් සහ අනෙකුත් රාජ්‍ය සහ පෞද්ගලික ආයතනවල නිලධාරීන්ගේ දැනුම ප්‍රවර්ධනය කිරීම සඳහා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව සක්‍රියව මැදිහත් විය. 2015 වසරේ වාර්ෂික වාර්තාව පිළිබඳ දේශන ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් භාෂා ත්‍රිත්වයෙන්ම පවත්වන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු හා කාර්යභාරය, මුදල් ප්‍රතිපත්තිය, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය, විදේශ අංශයේ ප්‍රතිපත්ති සහ මෑතකාලීන ආර්ථික ප්‍රවණතා යන විෂය යටතේ ඉතා විශාල ප්‍රමාණයක අධ්‍යාපනික වැඩසටහන් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් පවත්වනු ලැබීය. එසේම, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ ආචාර්ය උපාධි සහ ශාස්ත්‍රපති උපාධි අධ්‍යාපන සුදුසුකම් සහිත අත්දැකීම් බහුල නිලධාරීන් විසින් මහ බැංකුවේ අභ්‍යන්තර පශ්චාත් උපාධි අපේක්ෂකයන්ගේ පර්යේෂණ කුසලතා වැඩිදියුණු කිරීම සඳහා උසස් තත්ත්වයේ පර්යේෂණ පත්‍රිකා සකස් කිරීමට අවශ්‍ය කරනු ලබන උපදේශකත්වය සපයන ලද අතර, පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව ක්‍රමයේ අවශ්‍යතා සපුරාලීම පිණිස සාර්ව ආර්ථික විද්‍යාව, සූක්ෂම ආර්ථික විද්‍යාව සහ ගණිතය වැනි විෂයානුබද්ධ කෙටිකාලීන පාඨමාලා පවත්වන ලදී. පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි, අග්නිදිග ආසියානු මහ බැංකු ආයතනය විසින් ඉදිරිපත් කෙරුණු පර්යේෂණ පත්‍රිකාවලට අමතරව, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් මහ බැංකු නිලධාරීන්ගේ පර්යේෂණ යෝජනා පත්‍රිකා 17 ක් සහ සම්පූර්ණ කරන ලද පර්යේෂණ පත්‍රිකා 11 ක් අධීක්ෂණය කරන ලදී. එමෙන්ම, දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් 2016 වසරේ ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව සඳහා ඉදිරිපත් කරන ලද පර්යේෂණ යෝජනා පත්‍රිකා 80 ක් ද විවරණය කරන ලදී.

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් කිහිප දෙනෙක් සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද සිංහල සහ දෙමළ මාධ්‍යයෙන් විකාශනය වූ "තක්ෂිලාව" සහ "අරිවුට්රූ" (Arivootru) රූපවාහිනී අධ්‍යාපනික වැඩසටහන්වලට සිය සම්පත් දායකත්වය ලබාදෙන දුන්හ. තවද, දෙපාර්තමේන්තුවේ නිලධාරීන් "ඉකෝන් අයිකන්" (Econ Icon) නම් සිංහල සහ දෙමළ භාෂාවලින් පැවැත්වූ අන්තර් පාඨශාලයීය ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන සංවිධානය කිරීම සඳහා සන්නිවේදන දෙපාර්තමේන්තුවට සහයෝගය ලබාදෙන ලදී. මීට අමතරව, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය මගින් පවත්වනු ලැබූ "අන්තර් බැංකු ප්‍රශ්න විචාරාත්මක තරගාවලිය" සංවිධානය කිරීම සඳහා ද ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව ක්‍රියාකාරීව සහභාගී විය.

## 7.6 ජාත්‍යන්තර සම්බන්ධතා පවත්වාගෙන යෑම

ශ්‍රී ලංකා මහ බැංකුව සහ ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව සබඳතා කේන්ද්‍රස්ථානයක් ලෙස කටයුතු කරමින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, අග්නිදිග ආසියානු මහ බැංකු ආයතනය (SEACEN), අග්නිදිග ආසියානු, නවසීලන්තය සහ ඕස්ට්‍රේලියානු බැංකු සංගමය (SEANZA), සහ දකුණු ආසියානු කලාපීය සහයෝගීතා මූල්‍ය සංවිධානය (SAARCFINANCE), වැනි ජාත්‍යන්තර බහුපාර්ශ්වීය මූල්‍ය සංවිධාන සමඟ අඛණ්ඩව සබඳතා පවත්වා ගනු ලැබූ අතර, ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව හා අනෙකුත් ජාත්‍යන්තර ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම සඳහා රජයට අවශ්‍ය සහයෝගය ලබා දෙන ලදී.

මේ අතර, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම පිළිබඳව වැඩසටහන සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ IV වන වගන්තිය යටතේ වන විශේෂ මෙහෙයුම් වැඩසටහනක් සඳහා වන දූත කණ්ඩායම් දෙකක සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී. සාර්ක් මූල්‍ය ජාලයේ කටයුතු රැසකදී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩලය, කලාපයේ අනෙකුත් මහ බැංකුවල සම්බන්ධීකාරකවරුන් සමඟ එක්ව කටයුතු කරන ලදී. 2015 වසරේ පේරු රාජ්‍යයේදී පැවති 31 වැනි සාර්ක් මූල්‍ය ජාලයේ කණ්ඩායම් රැස්වීමේදී සාර්ක් මූල්‍ය ජාලයේ සභාපතිත්වය ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා වෙත පැවරීමත් සමඟ 23 වැනි සාර්ක් මූල්‍ය ජාලයේ සම්බන්ධීකාරකවරුන්ගේ රැස්වීම සහ 2016 වසරේ අප්‍රේල් මාසයේදී පැවති සාර්ක් මූල්‍ය ජාලයේ සහයෝගීතා පර්යේෂණ අධ්‍යයන යටතේවූ පර්යේෂකයන්ගේ

රැස්වීම මෙන්ම, 2016 සැප්තැම්බර් මාසයේ දී පැවති සාර්ක් මූල්‍ය ජාලයේ 24 වැනි සම්බන්ධීකාරකවරුන්ගේ රැස්වීම, ශ්‍රී ලංකා මහ බැංකුවේ සත්කාරකත්වයෙන් යුතුව පැවැති අතර, එහි සංවිධාන කටයුතු සිදු කරනු ලැබුවේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසිනි. මෙම රැස්වීම් සාර්ක් මූල්‍ය ජාලයේ සම්බන්ධීකාරකවරුන්ගේ, පර්යේෂකයන්ගේ සහ වෙනත් සාමාජික රටවල මහ බැංකුවල හා මුදල් අමාත්‍යාංශවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් යුතුව පැවැත්විණි. 2016 වසරේ මැයි මස ඉන්දියානු සංචිත බැංකුවේදී පැවැති සාර්ක් මූල්‍ය ජාලයේ මහ බැංකු අධිපතිවරුන්ගේ සැසිවාරයේ දී සාර්ක් මූල්‍ය දත්ත ගබඩාව එළි දැක්වීම සඳහා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් පහසුකම් සැපයූ අතර, ඉන් අනතුරුව සාර්ක් කලාපීය ආර්ථිකයන් පිළිබඳව පර්යේෂණ කිරීම ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව එම දත්ත ගබඩාව පුළුල් කිරීමේ හැකියාව සහ තාක්ෂණ සහයෝගීතාව අධ්‍යයනය කිරීම යනාදිය සඳහා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් තිදෙනෙකු ද ඇතුළත් වූ කමිටුවක් පිහිටුවන ලදී. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව සහ ජාත්‍යන්තර ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීමේ ආයතන වැනි ජාත්‍යන්තර සංවිධානවලට මෙන්ම, ජාත්‍යන්තර ආයෝජකයන් වෙත නවතම ආර්ථික තොරතුරු සැපයීම හා සාර්ව ආර්ථික සංඛ්‍යාලේඛන සැපයීම ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරන ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් විවිධ ආයෝජකයන් සඳහා මෑතකාලීන ආර්ථික ප්‍රවණතා, ප්‍රධාන සාර්ව ආර්ථික විචල්‍යයන්ගේ ප්‍රවණතා සහ හැසිරීම් සහ ආර්ථික දැක්ම ඉස්මතු කරමින් විවිධ ප්‍රදර්ශක සකස් කිරීම ද සම්බන්ධීකරණය කරන ලදී.

# 8. සේවක අර්ථසාධක අරමුදල

සේවක අර්ථසාධක අරමුදල (සේ.අ.අ.) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ ස්ථාපිත කර ඇත. අරමුදලෙහි සියලුම පරිපාලන බලතල හා කාර්යයන් කම්කරු කොමසාරිස්වරයා සතුවන අතර, අරමුදල් කළමනාකරණයට අදාළ බලතල, කාර්යයන් හා වගකීම් පනතේ ප්‍රතිපාදන අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයට පැවරී ඇත. ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය තමන් වෙත පැවරී ඇති කාර්යභාරයන් ක්‍රියාත්මක කිරීමේ මෙහෙයුම් යාන්ත්‍රණය ලෙස සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව බල ගන්වා ඇත.

## 8.1 දෙපාර්තමේන්තුවේ කාර්යයන්

සාමාජික දායක මුදල් සහ අධිභාර රැස්කිරීම, පොදු ගිණුම් සහ සාමාජික ගිණුම් පවත්වා ගෙන යෑම, සාමාජික ගිණුම්වලට පොලිය බැර කිරීම, සාමාජිකයන්ට හා ඔවුන්ගේ නීතිමය හිමිකරුවන්ට ප්‍රතිලාභ ආපසු ගෙවීම, අතිරික්ත මුදල් ආයෝජනය කිරීම හා පනත මඟින් මුදල් මණ්ඩලය හා කම්කරු කොමසාරිස්වරයා වෙත පවරා ඇති කාර්යභාරයන් ඉටු කිරීමේ දී දරන පිරිවැය අරමුදලේ ආදායමෙන් අයකර ගැනීම යන කාර්යභාරයන් සේ.අ.අ. දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත. 2016 වසරේ දී එම කාර්යයන් ඉටු කිරීමේ දී සේ.අ.අ. දෙපාර්තමේන්තුව මුදල් මණ්ඩලයේ අනුමත ප්‍රතිපත්ති හා නිර්දේශයන්ට අනුව කටයුතු කළ අතර කම්කරු කොමසාරිස්වරයා සමඟ සමීප සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යන ලදී.

## 8.2 කාර්යයන්හි කාර්යසාධනය

### (අ) අරමුදලේ වටිනාකම, සාමාජික ගිණුම් ශේෂ හා ප්‍රතිලාභ ගෙවීම්

2016 වසර අවසානයේ දී, අරමුදලේ මුළු වටිනාකම 2015 වසර අවසානයේ වූ රුපියල් බිලියන 1,664.9 සිට සියයට 10.6 කින් වර්ධනය වී රුපියල් බිලියන 1,841.5 ක් විය. ආයෝජන තුළින් ඉපැයූ ආදායම් හා සාමාජික ශුද්ධ දායක මුදල් (දායක මුදල් ලැබීම් වලින් ප්‍රතිලාභ ගෙවීම් අඩු කළ පසු) ලැබීම් අරමුදලේ මෙම වර්ධනයට හේතු විය. 2015 වසරේ දී සාමාජික පොලිය ද ඇතුළුව රුපියල් බිලියන 1,625.5 ක්ව පැවති අරමුදලේ සාමාජිකයන්ගේ මුළු වගකීම 2016 වසර අවසන් වන විට රුපියල් බිලියන 1,810.6 දක්වා සියයට 11.4 කින් වර්ධනය විය (සංඛ්‍යා සටහන II-8). පසුගිය වසරේ වාර්තා වූ දායක මුදල් ලැබීම් රුපියල් බිලියන 102.5 සිට 2016 වසරේ දී රුපියල් බිලියන 118.3 දක්වා සියයට 15.4 කින් වර්ධනයක් විය. 2016 තුළ දී අරමුදලේ සාමාජිකයන් හා ඔවුන්ගේ නෛතික උරුමකරුවන් වෙත ප්‍රතිලාභ ලෙස රුපියල් බිලියන 108.4 ක් ගෙවන ලද අතර එය 2015 වසරට සාපේක්ෂව 39.3 ක වර්ධනයකි. මෙම වර්ධනය සඳහා නිවාස ණය සහ වෛද්‍ය ප්‍රතිකාර සඳහා සියයට 30 ශේෂය ආපසු ගැනීමේ පහසුකම යටතේ ප්‍රතිලාභ ගෙවීම් බලපාන ලදී. ඒ අනුව, ශුද්ධ දායකත්වය 2015 වසරේ පැවති රුපියල් බිලියන 24.7 හා සැසඳීමේදී රුපියල් බිලියන 9.9 ක් දක්වා අඩු විය. අරමුදලේ ශුද්ධ ආදායම 2015 වසරේ පැවති රුපියල් බිලියන 156.9 හා සසඳන විට 2016 වසරේ දී රුපියල් බිලියන 175.9 ක් දක්වා සියයට 12.1 කින් වර්ධනය විය.

**II - 8 සංඛ්‍යා සටහන**

**අරමුදල පිළිබඳ ප්‍රධාන දත්ත**

| අයිතමය | 2015 | 2016 (අ) | වෙනස (%) |
|---|---|---|---|
| අරමුදලේ සමස්ත වටිනාකම (රුපියල් බිලියන) | 1,664.9 | 1,841.5 | 10.6 |
| සාමාජිකයන් වෙත වූ සමස්ත වගකීම (රුපියල් බිලියන) | 1,625.5 | 1,810.6 | 11.4 |
| මුළු සාමාජික ගිණුම් සංඛ්‍යාව (මිලියන) | 16.9 | 17.1 | 1.2 |
| දායක මුදල් එවනු ලබන ගිණුම් (මිලියන) | 2.6 | 2.4 | (7.7) |
| දායක මුදල් එවනු නොලබන ගිණුම් (මිලියන) | 14.3 | 14.7 | 2.8 |
| මුළු දායක මුදල් ලැබීම් (රුපියල් බිලියන) | 102.5 | 118.3 | 15.4 |
| මුළු ප්‍රතිලාභ ගෙවීම් (රුපියල් බිලියන) | 77.8 | 108.4 | 39.3 |
| ශුද්ධ දායක මුදල් (රුපියල් බිලියන) | 24.7 | 9.9 | (59.9) |
| ප්‍රතිලාභ ගෙවීම් සංඛ්‍යාව | 136,815 | 187,147 | 36.8 |
| ශුද්ධ ආදායම (රුපියල් බිලියන) | 156.9 | 175.9 | 12.1 |

අ) තාවකාලික

මූලය: සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

### (ආ) අරමුදල් ආයෝජනය හා ප්‍රතිලාභ

**(i) ආයෝජන කළඹ :**

සමස්ත ආයෝජන කළඹෙහි වටිනාකම (පොත් අගය) 2015 වසරේ පැවති රුපියල් බිලියන 1,604.2 සිට 2016 වසර අවසානය වන විට රුපියල් බිලියන 1,772.2 දක්වා සියයට 10.5 කින් වර්ධනය විය (සංඛ්‍යා සටහන II-9). අරමුදලේ

සුරක්ෂිතභාවය ආරක්ෂා කර ගනිමින්, ප්‍රතිලාභ ගෙවීම් සිදු කිරීමට හා අනෙකුත් වියදම් සපුරා ගැනීමට ප්‍රමාණවත් පරිදි ද්‍රවශීලතාවයක් පවත්වා ගනිමින්, අරමුදලේ සාමාජිකයන් වෙත දිගුකාලීන ධන මූර්ත ප්‍රතිලාභයක් ලබා දීම ඉලක්ක කොටගත් අරමුදලේ ආයෝජන ප්‍රතිපත්තිය අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.

අරමුදලේ සමස්ත ආයෝජනයන්ගෙන් සියයට 93.1 ක් රජයේ සුරැකුම්පත්හි ආයෝජනය කර තිබූ අතර, ව්‍යාපාර කොටස්වල සියයට 4.6 ක් සහ සාංගමික ණයකර සහ භාරකාර සහතිකපත්වල සියයට 2.1 ක් ආයෝජනය කර තිබුණි. ඉතිරි සියයට 0.2 අරමුදලේ දෛනික ද්‍රවශීලතා අවශ්‍යතාවයන් කළමනාකරණය කර ගැනීම සඳහා රජයේ සුරැකුම්පත් වලින් ආවරණය වන ප්‍රතිවිකුණුම් ගිවිසුම් සහ නිත්‍ය තැන්පතු පහසුකම් වැනි ඉහළ ද්‍රවශීලතාවයන් සහිත වත්කම්වල ආයෝජනය කර තිබුණි. රාජ්‍ය සුරැකුම් ආයෝජනයන්ගේ කල්පිරීමේ ව්‍යුහය සහ ඵලදා අනුපාත සංඛ්‍යා සටහන II-10 හි දක්වා ඇත.

**II - 9 සංඛ්‍යා සටහන**

**ආයෝජන කළඹ**

| ආයෝජන වර්ගය | 2015 | | 2016 (අ) | |
|---|---|---|---|---|
| | වටිනාකම (රු.බිලියන) | දායකත්වය (%) | වටිනාකම (රු.බිලියන) | දායකත්වය (%) |
| භාණ්ඩාගාර බැඳුම්කර හා බිල්පත් | 1,487.0 | 92.7 | 1,650.4 | 93.1 |
| සමාගම් කොටස් | 87.6 | 5.5 | 80.9 | 4.6 |
| සාංගමික ණය උපකරණ | 25.5 | 1.6 | 38.1 | 2.1 |
| ප්‍රතිවිකුණුම් ගිවිසුම් | 4.1 | 0.2 | 2.8 | 0.2 |
| **එකතුව** | **1,604.2** | **100.0** | **1,772.2** | **100.0** |

අ) තාවකාලික මූලය: සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**II - 10 සංඛ්‍යා සටහන**

**2016 අවසානයේ දී රාජ්‍ය සුරැකුම්පත් කළඹේ කල්පිරීමේ ව්‍යුහය**

| කල්පිරීම | පරිණත වටිනාකම (රු. මිලියන) (අ) | දායකත්වය (%) | බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (%) |
|---|---|---|---|
| වසරකට වඩා අඩු | 99,049.7 | 5.57 | 9.78 |
| වසර 1 - 2 | 195,613.1 | 11.00 | 10.71 |
| වසර 3 - 4 | 136,011.2 | 7.65 | 10.58 |
| වසර 5 ට වැඩි | 1,347,602.0 | 75.78 | 11.46 |
| **එකතුව** | **1,778,276.0** | **100.00** | **11.22** |

(අ) තාවකාලික මූලය: සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**(ii) ආයෝජන ආදායම:**

අරමුදලේ සමස්ත ආයෝජන ආදායම 2016 වසරේ දී රුපියල් බිලියන 192.9 ක් ලෙස සටහන් වූ අතර, එය 2015 වසරේ උපයන ලද සමස්ත ආයෝජන ආදායම හා සැසඳීමේ දී සියයට 12.5 ක වැඩිවීමක් වාර්තා කරන ලදී (සංඛ්‍යා සටහන II-11). පොලී ආදායම අරමුදලේ ප්‍රධාන ආදායම් ප්‍රභවය (එය ආදායමෙන් සියයට 85.8 කි) වූ අතර එය 2015 වසරේ පැවති රුපියල් බිලියන 143.1 සිට 2016 වසරේ දී රුපියල් බිලියන 165.5 දක්වා සියයට 15.7 කින් වර්ධනය විය. වට්ටම් කළ භාණ්ඩාගාර බැඳුම්කර තුළින් 2016 වසර තුළ ලද ක්‍රමක්ෂය ලාභ රුපියල් බිලියන 28.2 ක් වූ අතර, එය 2015 වසර තුළ ලද රුපියල් බිලියන 26.6 හා සැසඳීමේ දී සියයට 5.9 ක වර්ධනයකි. තවද, ව්‍යාපාර කොටස්වල ආයෝජනය කිරීම තුළින් උපයන ලද ආදායම (ප්‍රාග්ධන ලාභ සහ ලාභාංශ වලින්) 2015 වසරේ දී පැවති රුපියල් මිලියන 4,065.2 සමඟ සැසඳීමේ දී 2016 වසර තුළ දී රුපියල් මිලියන 4,714.6 ක් දක්වා සියයට 16.0 කින් වර්ධනය විය. කෙසේ වුවත්, අහිතකර වෙළඳපොළ තත්ත්වයන් සහ ද්විතීයික වෙළඳපොළේ ආයෝජනයන් සම්බන්ධයෙන් පැවති සීමාවන්ගේ ප්‍රතිඵලයක් ලෙස භාණ්ඩාගාර බැඳුම්කර මඟින් උපයන ලද ප්‍රාග්ධන ලාභ 2015 වසර හා සැසඳීමේ දී 2016 වසර තුළ රුපියල් මිලියන 611.8 දක්වා සියයට 47.8 කින් අඩු විය. කොටස් ආයෝජනයන්ගේ හානිකරණය 2016 වසරේ දී, රුපියල් මිලියන 5,231.6 දක්වා සියයට 76.9 කින් වර්ධනය විය. සමස්තයක් ලෙස, අරමුදලේ ආයෝජන මත ප්‍රතිලාභවල වර්ධනය 2015 වසරේ දී පැවති 11.3 සමඟ සසඳන විට එය 2016 වසරේ දී සියයට 11.4 කි.

**II - 11 සංඛ්‍යා සටහන**

**ආයෝජන මඟින් ලද ආදායම්**

| ආදායම් මූලාශ්‍රය | 2015 | | 2016 (අ) | |
|---|---|---|---|---|
| | වටිනාකම (රු.මිලියන) | දායකත්වය (%) | වටිනාකම (රු.මිලියන) | දායකත්වය (%) |
| පොලී | 143,055.1 | 83.4 | 165,485.4 | 85.8 |
| ක්‍රමක්ෂය ලාභ | 26,590.8 | 15.5 | 28,170.9 | 14.6 |
| ප්‍රාග්ධන ලාභ - රජයේ සුරැකුම්පත් | 1,171.4 | 0.7 | 611.8 | 0.3 |
| වෙළෙඳපොළ මිලට අගය කිරීමෙන් ලාභ/(පාඩු) | (394.0) | (0.2) | (842.0) | (0.4) |
| ප්‍රාග්ධන ලාභ ව්‍යාපාර කොටස් | 552.8 | 0.3 | 452.0 | 0.2 |
| ලාභාංශ | 3,512.4 | 2.0 | 4,262.6 | 2.2 |
| මූල්‍ය වත්කම් හානිකරණය | (2,956.6) | (1.7) | (5,231.6) | (2.7) |
| **එකතුව** | **171,531.9** | **100.0** | **192,909.1** | **100.0** |

අ) තාවකාලික මූලය: සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**(iii) වියදම:**

2016 වසරේ අරමුදලේ සමස්ත මෙහෙයුම් වියදම රුපියල් මිලියන 1,487.2 ක් වූ අතර, එය 2015 වසරේ සමස්ත වියදම වූ රුපියල් මිලියන 1,190.6 හා සසඳන විට සියයට 24.9 ක වැඩිවීමකි. අරමුදලේ දළ ආදායමේ ප්‍රතිශතයක් ලෙස සමස්ත මෙහෙයුම් වියදම 2015 වසරේ දී පැවති සියයට 0.69 සමඟ සසඳන විට 2016 වසරේ දී සියයට 0.77 ක් විය (සංඛ්‍යා සටහන II-12). වසර ගණනාවක් පුරාම අරමුදලේ සමස්ත මෙහෙයුම් වියදම එහි දළ ආදායමින් සියයට 1 කට වඩා පහළ මට්ටමක පවත්වා ගැනීමට අරමුදලට හැකි විය.

**II - 12 සංඛ්‍යා සටහන**

**මෙහෙයුම් වියදම්**

| අයිතමය | වටිනාකම (රු. මිලියන) | | ප්‍රතිශත වෙනස (%) |
|---|---|---|---|
| | 2015 | 2016 (අ) | |
| සේවක පිරිවැය | 748.5 | 861.1 | 15.0 |
| පරිපාලන වියදම් | 397.2 | 402.8 | 1.4 |
| වෙනත් වියදම් | 44.9 | 223.3 | 397.3 |
| **එකතුව** | **1,190.6** | **1,487.2** | **24.9** |
| **මුළු පිරිවැය දළ ආදායමේ ප්‍රතිශතයක් ලෙස** | **0.69** | **0.77** | |

අ) තාවකාලික මූලය: සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**(ඇ) සාමාජික ශේෂ සඳහා පොලී ගෙවීම්**

පසුගිය වසර 10 පුරා, සේ.අ.අ. අරමුදලට, එහි සාමාජිකයන් වෙත සියයට 2.5 ක් වන ව්‍යවස්ථාපිත අවම අනුපාතය ඉක්මවන ඉහළ පොලියක් අඛණ්ඩව ගෙවීමට හැකි විය (සංඛ්‍යා සටහන II - 10). අරමුදලේ සාමාජිකයන් වෙත බෙදා හැරීමට ඇති ශුද්ධ ආදායම 2015 වසරේ පැවති රුපියල් බිලියන 154.4 සමඟ සැසඳීමේ දී 2016 වසර අවසානයේ දී රුපියල් බිලියන 171.5 ක් විය (සංඛ්‍යා සටහන II - 13). සේ.අ.අ.ට එහි 2016 වසරේ අයවැයගත පොලී අනුපාතය වූ සියයට 10.0 ඉක්මවා සියයට 10.5 ක පොලී අනුපාතයක් සාමාජික ශේෂ සඳහා ගෙවීමට හැකි විය.

**II - 13 සංඛ්‍යා සටහන**

**සාමාජිකයන්ට ගෙවන ලද පොලිය**

| අයිතමය | වටිනාකම (රු. මිලියන) | | ප්‍රතිශත වෙනස (%) |
|---|---|---|---|
| | 2015 | 2016 (අ) | |
| දළ ආදායම | 171,855.3 | 193,071.4 | 12.3 |
| මුළු මෙහෙයුම් වියදම | (1,190.6) | (1,487.2) | 24.9 |
| ආදායම් බදු | (13,727.4) | (15,657.2) | 14.1 |
| වසරේ ශුද්ධ ආදායම | 156,937.3 | 175,927.0 | 12.1 |
| පෙර වසරේ රඳවාගත් ලාභ | 311.3 | 215.6 | (30.7) |
| වසර තුළ සිදු කළ ප්‍රතිලාභ ගෙවීම් මත ගෙවන ලද පොලිය | (2,833.0) | (4,645.8) | 64.0 |
| සාමාජිකයන් වෙත බෙදා හැරීමට ඇති ශුද්ධ ආදායම (වසර තුළ දී ප්‍රතිලාභ ගෙවීම් මත ගෙවන ලද පොලිය අඩු කළ පසු) | 154,415.6 | 171,496.8 | 11.1 |
| සංචිත වලින්/(සංචිත වලට) මාරු කිරීම | - | 250.0 | 100.0 |
| සංචිත වලින්/(සංචිත වලට) මාරු කිරීමෙන් පසු සාමාජිකයන්ට බෙදා හැරීමට ඇති ශුද්ධ ආදායම | 154,415.6 | 171,746.8 | 11.2 |
| සාමාජික ශේෂ සඳහා පොලිය | (154,200.0) | (171,557.4) | 11.3 |
| රඳවාගත් ශුද්ධ ආදායම | 215.6 | 189.4 | (12.2) |
| සාමාජික ශේෂ සඳහා ගෙවන ලද පොලී අනුපාතය (%) | **10.5** | **10.5** | |

අ) තාවකාලික මූලය: සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**II - 14 සංඛ්‍යා සටහන**

**සාමාජික ගිණුම් ශේෂ මත ගෙවන ලද පොලී අනුපාතය**

| වසර | ගෙවන ලද පොලී අනුපාතය (%) | සඵල පොලී අනුපාතය (%) |
|---|---|---|
| 2006 | 10.10 | 10.30 |
| 2007 | 11.20 | 11.40 |
| 2008 | 13.20 | 13.44 |
| 2009 | 13.75 | 13.92 |
| 2010 | 12.50 | 12.65 |
| 2011 | 11.50 | 11.58 |
| 2012 | 11.50 | 11.62 |
| 2013 | 11.00 | 11.14 |
| 2014 | 10.50 | 10.60 |
| 2015 | 10.50 | 10.57 |
| 2016 (අ) | 10.50 | 10.51 |

අ) තාවකාලික මූලය: සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

සඵල පොලී අනුපාතය = (සාමාජිකයන්ට ගෙවන ලද පොලිය) / [(ආරම්භක සාමාජික ශේෂය + වසර අවසානයේ පොලී ගෙවීම්වලට පෙර සාමාජික ශේෂය )/2]

## 8.3 සාමාජික සේවාවන්

**(අ) සාමාජික ගිණුම් ප්‍රකාශන**

2015 වසරේ පළමු හා දෙවන අර්ධ වාර්ෂික සාමාජික ගිණුම් ප්‍රකාශන සේවායෝජකයින් හට 2016 වසර තුළ දී නිකුත් කරන ලදී. සේ.අ. අරමුදලේ ක්‍රියාකාරී සාමාජිකයින් සඳහා 2016 වසරේ පළමු අර්ධ වර්ෂය සඳහා සාමාජික ගිණුම් ප්‍රකාශන, ඔවුන්ගේ සේවායෝජකයින් හරහා නිකුත් කිරීම 2017 වසරේ මාර්තු මස ආරම්භ විය.

**II - 15 සංඛ්‍යා සටහන**

**නිකුත් කළ සාමාජික ගිණුම් ප්‍රකාශන**

| කාලච්ඡේදය | සේවායෝජකයින් සංඛ්‍යාව | ප්‍රකාශන සංඛ්‍යාව (ක්‍රියාකාරී සාමාජිකයින්) |
|---|---|---|
| 2015 පළමු අර්ධ වර්ෂය | 67,821 | 2,052,866 |
| 2015 දෙවන අර්ධ වර්ෂය | 72,144 | 2,518,454 |

(අ) තාවකාලික මූලය: සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**(ආ) සාමාජිකයින් සඳහා වූ නිවාස ණය පහසුකම**

අරමුදලේ සාමාජිකයන් හට සිය සේ.අ.අ. ගිණුමේ ශේෂය ඇපයට තබා නිවාස ණය ලබා ගැනීමේ යෝජනා ක්‍රමය 1988 වසරේ දී හඳුන්වා දුන් අතර, එම ණය, ලංකා බැංකුව, මහජන බැංකුව, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, නිවාස සංවර්ධන හා මූල්‍ය සංස්ථා බැංකුව හා සමූපකාර ග්‍රාමීය බැංකුව යන සහභාගිත්ව ණය දෙන ආයතන මඟින් 2016 වසර තුළ දී ද ලබා ගැනීමට හැකි විය. වසර තුළ දී මෙම ව්‍යාපෘතිය යටතේ ශේෂ සහතික 12,780 ක් අදාළ ආයතන වෙත නිකුත් කරන ලද අතර අනුමත කරන ලද සමස්ත නිවාස ණය ප්‍රමාණය රුපියල් මිලියන 5,414 කි (සංඛ්‍යා සටහන II-16).

තවද, 2015 වසරේ දී පැහැර හරින ලද ණය වෙනුවෙන්, අරමුදල විසින් රුපියල් මිලියන 2,541 කට ආසන්න මුදල් ප්‍රමාණයක් සාමාජික ගිණුම්වලින් අඩුකර සහභාගිත්ව ණය දෙන ආයතන වෙත 2016 වසර තුළ දී ප්‍රේෂණය කරන ලදී.

**II - 16 සංඛ්‍යා සටහන**
**නිවාස ණය පහසුකම**

| වසර | නිකුත් කළ සහතිකපත් සංඛ්‍යාව | අනුමත කළ ණය ප්‍රමාණය (රු.මිලියන) | අනුමත ණය දෙන ආයතන වෙත මුදාහළ මුදල (රු.මිලියන) |
|---|---|---|---|
| 2006 | 15,136 | 3,049 | 1,078 |
| 2007 | 12,969 | 2,872 | 1,240 |
| 2008 | 12,519 | 3,008 | 1,192 |
| 2009 | 10,383 | 2,680 | 1,552 |
| 2010 | 13,848 | 4,512 | 2,093 |
| 2011 | 20,041 | 6,355 | 1,896 |
| 2012 | 11,234 | 3,973 | 2,019 |
| 2013 | 16,268 | 6,914 | 2,178 |
| 2014 | 17,786 | 8,021 | 2,394 |
| 2015 | 13,132 | 5,489 | 2,522 |
| 2016 (අ) | 12,780 | 5,414 | 2,541 |

අ) තාවකාලික

මූලය: සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**ඇ) පූර්ව විශ්‍රාමික ප්‍රතිලාභ ගෙවීමේ ක්‍රමය**

2012 අංක 02 දරන සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධිත) පනතට සහ පසුකාලීනව පාර්ලිමේන්තුව මඟින් සම්මත කරන ලද ක්‍රියාපටිපාටියන්ට අනුව, සියයට 30 පූර්ව විශ්‍රාමික ප්‍රතිලාභ ගෙවීමේ ක්‍රමය යටතේ කරන ගෙවීම්, 2015 ජූලි 01 වන දින සිට ක්‍රියාත්මක විය. මෙම ක්‍රමය සඳහා ප්‍රතිලාභ ලබන්නන්ගේ ඉහළ ඉල්ලුමක් තිබූ අතර, 70,000 ඉක්මවූ ප්‍රතිලාභීන්ට රුපියල් බිලියන 41 ක ප්‍රතිලාභ 2016 අග වන විට ගෙවා ඇත. 2016 වසර තුළ දී රුපියල් බිලියන 33.7 ක් ප්‍රතිලාභීන් 60,021 ක් වෙත නිකුත් කොට ඇත.

**(ඈ) ඡායාස්ථගත කිරීමේ ව්‍යාපෘතිය**

කාර්යක්ෂම හා ඵලදායි සේවාවක් සැලසීමේ උපාය මාර්ගික අරමුණ සපුරාලනු පිණිස සේ.අ.අ. දෙපාර්තමේන්තුවෙහි ලේඛනගත මෙහෙයුම් පරිසරය අවම ලේඛන සහිත විද්‍යුත් මාධ්‍යයට පරිවර්තනය කිරීම උදෙසා ලේඛන පිළිබිඹු ඡායාස්ථගත කිරීමේ ව්‍යාපෘතිය (ISP) ආරම්භ කරන ලදී. 2013 වසරේ ආරම්භ කරන ලද එම පළමු අදියරේ ව්‍යාපෘතිය 2015 වසරේ දී සාර්ථකව සම්පූර්ණ කරන ලදී. පළමු අදියරේ දී ප්‍රධාන ලේඛන වන ප්‍රධාන ලිපගොනු, “ඩී” පෝරම, නැවත ලියාපදිංචි කිරීමේ ලේඛන සහ 2013 වසරේ ප්‍රතිලාභ ගෙවීමේ වාර්තා සටහන් විද්‍යුත් මාධ්‍යයට පරිවර්තනය කරන ලදී. පළමු අදියර සම්පූර්ණ කිරීමෙන් පසු, අරමුදලට පහත සඳහන් කාර්යයන් සඳහා වඩා හොඳ පසුබිමක් සැකසී ඇත.

- ලිපිගොනු වෙත පිවිසීමේ හැකියාව ඉහළ යෑම
- සේ.අ.අ. සාමාජිකයන්ගේ තොරතුරු සංශෝධනය කිරීම විමධ්‍යගත කිරීම
- ගබඩා කිරීමේ ඉඩකඩ අවම වීම
- මානව සම්පත්, ලිපි ද්‍රව්‍ය, කුළී සඳහා වැය වන පිරිවැය අවම වීම

සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව විසින්, වැදගත් සහ නිතර භාවිතා වන ලිපි ලේඛන විද්‍යුත් මාධ්‍යයට පරිවර්තනය කිරීම සඳහා ඡායාස්ථගත කිරීමේ දෙවන අදියර ආරම්භ කරන ලද අතර එය 2017 වසරේ දී සම්පූර්ණ කිරීමට අපේක්ෂා කෙරේ. කඩදාසි ලිපි ලේඛන, දෙපාර්තමේන්තුවට ලැබෙන අවස්ථාවේදීම විද්‍යුත් මාධ්‍යයට පරිවර්තනය කිරීම සඳහා තත්කාලීන පරිලෝකනය කිරීමේ ක්‍රමය 2017 වසරේ දෙවන කාර්තුවේ දී ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ.

**(ඉ) මහජන දැනුම්වත්භාවය**

සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙහි කටයුතු ඒකාබද්ධ ආකෘතියකට පරිවර්තනය කිරීමට පහසුකම් සැලසීම සඳහා සේ.අ.අ. කටයුතු පිළිබඳව දැනුම්වත්භාවය ඉහළ නැංවීම දෙපාර්තමේන්තුවේ එක් ප්‍රධාන අරමුණක් වේ. ඒ අනුව, ඉහත අරමුණ ඉටු කර ගැනීමේ ප්‍රධාන උපක්‍රමයක් ලෙස සේ.අ.අ. දෙපාර්තමේන්තුව මඟින් 2016 වසරේ දී බදුල්ල, මිරිස්ස, කහවත්ත සහ පොළොන්නරුව ඇතුළු ප්‍රදේශ 10 ක දී ජංගම සේවාවන් පවත්වන ලදී. මෙම දැනුම්වත් කිරීමේ වැඩසටහන් කම්කරු දෙපාර්තමේන්තුව, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, පොලිස් දෙපාර්තමේන්තුව සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල වැනි අනෙකුත් රාජ්‍ය ආයතනයන්හි ද සහභාගිත්වය ඇතුළුව පවත්වන ලදී. තවද, ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය මඟින් කොළඹ දිස්ත්‍රික්කය ආවරණය කරමින් ප්‍රදේශ 08 ක සංවිධානය කරන ලද ජංගම සේවාවන් සඳහා සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව වසර තුළදී සහභාගී විය.

මෙම ජංගම සේවා වැඩසටහන් මඟින් ප්‍රධාන කාර්යාලයෙන් සපයනු ලබන සේවාවන් රැසක් එනම් සාමාජිකයන් සඳහා ශේෂ වාර්තා නිකුත් කිරීම, සාමාජික තොරතුරු සහ ගිණුම් නිවැරදිව සකස් කිරීම, සාමාජිකයන් නැවත ලියාපදිංචි කිරීම, මාර්ගගත ක්‍රමය ඔස්සේ සාමාජික ශේෂ විමසීම, විද්‍යුත් දායක මුදල් සේවය සහ සේ.අ.අ. ක්‍රියාපටිපාටි පිළිබඳ උපදෙස් සාමාජිකයන් සහ පොදු ජනතාව සඳහා සැපයීම සිදු කරනු ලැබේ.

පෙර වසර වලදී මෙන්ම, ජංගම සේවාවන්වල කාර්යක්ෂමතාවය වැඩි කිරීම සඳහා අවශ්‍යතා හඳුනාගැනීමට අදාළ සේවායෝජකයන්, කළමනාකරුවන් සහ සේවායෝජකයන්ගේ පරිපාලන නිලධාරීන් සඳහා විශේෂ වැඩ සටහනක් පත්වන ලදී. ඊට අමතරව, සේවායෝජකයන්, සේවාදායකයන් සහ අනෙකුත් උනන්දුවක් දක්වන පාර්ශවයන් ඉලක්ක කර ගනිමින් ජංගම සේවාවන් සහ සමගාමීව පෝස්ටර්, දැන්වීම් පත්‍රිකා, වීඩියෝ සහ ඉදිරිපත් කිරීම් වැනි විවිධ සන්නිවේදන මාධ්‍ය යොදා ගනිමින් දැනුම්වත් කිරීමේ කටයුතු සිදු කරන ලදී.

**(ඊ) විද්‍යුත් දත්ත භාවිතයෙන් සේ.අ.අ. දායක මුදල් රැස්කිරීමේ ක්‍රමය**

සේ.අ.අ. විසින් සිය සාමාජිකයන් සඳහා වඩා කාර්යක්ෂම සේවාවක් ලබාදීමේ අරමුණින්, මුළුමනින්ම කඩදාසි භාවිතයෙන් තොර, සාමාජික ගිණුම් යාවත්කාලීන කිරීමේ කාර්යක්ෂමතාවය ඉහළ නංවන, පිරිවැය අඩු, ප්‍රමාදවීම් අවම වන ක්‍රමවේදයක් වන විද්‍යුත් දත්ත භාවිතයෙන් සේ.අ.අ. දායක මුදල් රැස් කිරීමේ ක්‍රමය හඳුන්වා දී ඇත. මේ අනුව, 2016 වසර තුළ ඉලක්කගත සේවායෝජකයන් වන, සිය ආයතනයන්හි සේවකයන් 50 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් සේවා නියුක්තව සිටින සේවායෝජකයන් මෙම ක්‍රියාදාමයට අන්තර් ග්‍රහණය කර ගැනීම සඳහා තවදුරටත් විද්‍යුත් දත්ත රැස් කිරීමේ ක්‍රමය සවිබල ගැන්වීම වෙනුවෙන් සේ.අ.අ. විසින් විවිධ ක්‍රියාදාමයන් අනුගමනය කරන ලදී. මෙය, ව්‍යාපාරයක් පවත්වාගෙන යෑමේ පහසුව ශ්‍රේණිගත කිරීමේ දර්ශකයේ වර්ධනයක් ළඟා කර ගැනීම සඳහා වන අවශ්‍යතාවයන් සමඟ අනුගත වන අතර එය විදේශීය ආයෝජනයන් රට තුළට ආකර්ෂණය කර ගැනීම සඳහා ද පිටුවහලක් වේ.

2016 වසර ආරම්භයේ දී විද්‍යුත් දත්ත රැස්කිරීමේ ක්‍රමවේදයේ නව ප්‍රවණතාවයක් වන මංගත දත්ත සත්‍යාපනය සහිත ගෙවීම් ක්‍රමයක් හඳුන්වා දෙමින් ජාතික සංවර්ධන බැංකුව මංගත ක්‍රමය යටතේ දායක මුදල් රැස් කරන නියෝජිත වාණිජ බැංකු අතරට එක් විය. මෙහි දී විද්‍යුත් දත්ත ගොනුවල අඩංගු සාමාජික දත්ත මංගතව සත්‍යාපනය කිරීම සිදුවන අතර ඒ තුළින් දත්ත සැකසීම සඳහා වන මානව මැදිහත්වීම් සිදු නොවන බැවින් සාමාජික ගිණුම් යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලිය වඩාත් වේගවත් වනු ඇත. තවද, දැනටමත් සේ.අ.අ. දායක මුදල් රැස් කිරීමේ නියෝජිත බැංකුවක් ලෙස ක්‍රියාකරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී ද සිය සේ.අ.අ. දායක මුදල් ගෙවීම් සඳහා වන මංගත ක්‍රමය වැඩිදියුණු කරමින් මෙම මංගත දත්ත සත්‍යාපනය සහිත ගෙවීම් ක්‍රමය 2016 මැද භාගය වන විට හඳුන්වා දෙන ලදී.

එසේම, විද්‍යුත් රැස් කිරීමේ ක්‍රමය තවදුරටත් සේවායෝජකයන් අතර ප්‍රචලිත කිරීමේ අරමුණින් ලිපි යැවීම හා දැනුම්වත් කිරීමේ වැඩසටහන් සේ.අ.අ. වසර පුරා ක්‍රියාත්මක විණි. එහි ප්‍රතිඵලයක් ලෙස, 2015 වසර අවසානය වන විට මෙම ව්‍යාපෘතිය යටතේ ලියාපදිංචිව සිටි 6,093 ක් වූ සේවායෝජකයන් සංඛ්‍යාව 2016 වසර අවසානය වන විට 6,955 දක්වා වර්ධනය වූ අතර සමස්ථයක් ලෙස ගත් කළ විද්‍යුත් දත්ත රැස්කිරීමේ ක්‍රමය හරහා මිලියන 2.4 ක් වන සක්‍රීය සාමාජිකයන් අතරින් සියයට 76 ක පමණ ප්‍රමාණයක් ආවරණය විය.

**(උ) සේ.අ.අ. සාමාජිකයන් නැවත ලියාපදිංචි කිරීම**

සේ.අ.අ. සාමාජිකයන් සඳහා කාර්යක්ෂම සේවයක් ලබාදීමේ අරමුණ ඇතිව සේ.අ.අ. දෙපාර්තමේන්තුව හා කම්කරු දෙපාර්තමේන්තුව සම්බන්ධ වී දියත් කළ විශේෂ ව්‍යාපෘතිය මගින් සේ.අ.අ. සාමාජිකයන් ඔවුන්ගේ ජාතික හැඳුනුම්පතෙහි (ජා.හැ.ප.) නම සඳහන්ව ඇති ආකාරයට සාමාජික ගිණුම් නැවත ලියාපදිංචි කරන අතර, ජාතික හැඳුනුම්පත් අංකය සාමාජිකයාගේ ඒකීය හඳුනා ගැනීමේ අංකය ලෙස (UID) භාවිතා කිරීම සිදු කරනු ඇත. එමගින් කම්කරු දෙපාර්තමේන්තුවට මෙන්ම සේ.අ.අ. දෙපාර්තමේන්තුවට පොදු සාමාජික මූල දත්ත පද්ධතියක් භාවිතා කිරීමට හැකිවේ.

2016 වසර අවසාන වනවිට මිලියන 1.8 කට ආසන්න සක්‍රීය සාමාජිකයන්ගේ (දායක මුදල් එවන සාමාජිකයන්) ජාතික හැඳුනුම්පත් තොරතුරු ප්‍රමාණයක් රැස්කර ගැනීමට හැකිවිය. ඒ අතුරින් සියයට 82 (ගිණුම් මිලියන 1.4) ක් පමණ වූ සාමාජික සංඛ්‍යාවකට ඒකීය හඳුනා ගැනීමේ අංක ලබා දී ඇති අතර, ඉදිරිපත් කර ඇති තොරතුරුවල පවතින යම් යම් ගැටලු නිසා රැස් කරන ලද ඉතිරි තොරතුරු අදාළ සේවායෝජකයන් මගින් නැවත තහවුරු කිරීම ලබා ගැනීමෙන් පසු ලියාපදිංචිය සඳහා යොමු කරනු ලැබේ. සේ.අ.අ. ලියාපදිංචි වන නව සාමාජිකයින් ජාතික හැඳුනුම්පත් අංකය යටතේම තත්කාලීනව ලියාපදිංචි කිරීම 2010 නොවැම්බර් මස සිට ආරම්භ කර ඇත. ඒ අනුව, පළමු වරට දායක මුදල් ලැබෙන සාමාජිකයන්ගේ ජාතික හැඳුනුම්පත් තොරතුරු මාසිකව රැස් කර ගැනීම සඳහා මෙහෙයුම් ක්‍රියාවලියක් ද පවත්වාගෙන යනු ලැබේ. නව සාමාජිකයන් සහ වර්තමාන සාමාජිකයන් 69,326 ක් ලියාපදිංචි වී ඇති අතර සාමාජික මූල දත්ත පද්ධතිය වෙත ලියාපදිංචි කිරීම් 76,386 ක් 2016 වසර තුළ දී මාරු කරන ලදී.

## 9. විනිමය පාලනය

1953 අංක 24 දරන විනිමය පාලන පනතේ 2 වන වගන්තිය ප්‍රකාරව, රජයේ නියෝජිතයා වශයෙන් එම පනතේ ප්‍රතිපාදනයන් ක්‍රියාත්මක කිරීමේ වගකීම ශ්‍රී ලංකා මහ බැංකුවට පැවරී ඇත. තවද, විනිමය පාලන පනතේ ප්‍රතිපාදනයන් ක්‍රියාත්මක කිරීම උදෙසා විනිමය පාලන දෙපාර්තමේන්තුව පිහිටුවීම පනතේ 2 වගන්තිය යටතේ මුදල් මණ්ඩලය වෙත පැවරී ඇත. විනිමය පාලන පනතේ ඕනෑම ප්‍රතිපාදනයක් මගින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම අවශ්‍ය යැයි නියම කෙරෙන්නා වූ හෝ අධිකාරිය ලබා දෙනු ලැබූ ඕනෑම බලයන්, රාජකාරීන් සහ කාර්යයන්, අධිපතිගේ විධානයන් හා පාලනයට යටත්ව ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම සඳහා විනිමය පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වශයෙන් විනිමය පාලකට හෝ ඔහු වෙනුවෙන් වෙනත් බලයලත් නිලධාරියෙකු හට, විනිමය පාලන පනතේ 3 වන වගන්තිය මගින් බලය පැවරේ. අදාළ විධානයන් නිකුත් කිරීම හරහා එවැනි අවසරයන් ලබාදීමේ වගකීම බලයලත් වෙළඳුන් හට පැවරීම සඳහා 3 වන වගන්තිය මගින් තවදුරටත් විනිමය පාලක හට බලය ලබා දේ. ඕනෑම වාණිජ බැංකුවක් බලයලත් වෙළෙන්දෙකු ලෙස කටයුතු කිරීම සඳහා මුදල් අමාත්‍ය විසින් බලය ලබා දියහැක.

ඒ අනුව, විනිමය පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් වනුයේ රාජ්‍ය ප්‍රතිපත්ති හා සාර්ව ආර්ථික අරමුණු ක්‍රියාත්මක කිරීම උදෙසා විදේශ විනිමය ගනුදෙනු සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සම්පාදනය කිරීම, විදේශ විනිමය ගනුදෙනු සඳහා පොදු අවසරයන් ලබා දීම පිණිස බලයලත් වෙළෙඳුන් හට විධානයන් හා මහජනතාව වෙත ගැසට් නිවේදන නිකුත් කිරීම, විශේෂිත විදේශ විනිමය ගනුදෙනු සඳහා අනුමැතීන් ප්‍රදානය කිරීම, මුදල් මාරු කිරීමේ කාර්යයන් සඳහා බලපත්‍ර

නිකුත් කිරීම, විදේශ විනිමය ගනුදෙනු සුපරීක්ෂණය සහ විනිමය පාලන පනතේ ප්‍රතිපාදනයන් උල්ලංඝනය කිරීම පිළිබඳ විමර්ශනයන් පැවැත්වීම යනාදියයි. 2016 වර්ෂය තුළදී විනිමය පාලන දෙපාර්තමේන්තුව විසින් ඉටු කරන ලද ප්‍රධාන කාර්යයන් හා කටයුතු පහත සාරාංශ ගත කෙරේ.

## 9.1 විදේශ විනිමය ගනුදෙනු සඳහා පොදු අවසරයන් ප්‍රදානය කිරීම

කිසිදු සීමා කිරීමකට යටත් නොවී ජංගම ගිණුම් ගනුදෙනු සඳහා විදේශ විනිමය නිකුත් කිරීම පිණිස 1994 දී බලයලත් වෙළෙඳුන් හට අවසර ලබාදීමෙන් පසු, ජාත්‍යන්තර මූල්‍ය ගනුදෙනු සිදු කිරීමේදී මනා කාර්යක්ෂමතාවයක් ළඟා කර ගැනීමේ අරමුණින් යුතුව ප්‍රාග්ධන ගිණුම් ගනුදෙනුද ශ්‍රී ලංකා මහ බැංකුව ක්‍රමිකව ලිහිල් කර ඇත. ආයෝජකයන්ගේ විශ්වාසය ඉහළ නැංවීම, ශ්‍රී ලංකාවේ විදේශ විනිමය සංචිත ශක්තිමත් කිරීම හා විදේශ විනිමය වෙළෙඳපොළ ස්ථායී කිරීම අරමුණු කර ගනිමින් ගෝලීය ව්‍යාපාරික ක්‍රියාකාරකම්වල දී ශ්‍රී ලංකාවට හිමි තරගකාරීත්ව වාසි ප්‍රවර්ධනය කිරීම උදෙසා, පවත්නා සාර්ව ආර්ථික ප්‍රතිපත්තිවලට අනුකූලව විනිමය පාලන දෙපාර්තමේන්තුව විසින් 2016 වර්ෂයේදී ද ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග කිහිපයක්ම දියත් කරන ලදී.

### 9.1.1 බලයලත් වෙළෙඳුන් වෙත විධානයන් නිකුත් කිරීම

2016 වර්ෂය තුළදී බලයලත් වෙළෙඳුන් හට නිකුත් කරන ලද විධානයන් මෙම වාර්තාවේ III කොටසේ දක්වා ඇති අතර එහි සාරාංශයක් පහත දැක්වේ.

(අ) අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (NRFC), නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (RFC), නේවාසික විජාතික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (RNNFC) හා විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම් (FEEA) වල පවත්නා අරමුදල් නිදහසේ ශ්‍රී ලංකාවෙන් පිටතට ප්‍රේෂණය කිරීමට සහ ඕනෑම අරමුණක් වෙනුවෙන් ඇ.එ.ජ. ඩොලර් 10,000 ක් හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන ප්‍රමාණයක් ආපසු ලබා ගැනීම පිණිස එම ගිණුම් හිමියන් හට අවසර ලබා දෙන ලදී. (2016 අංක 01, 02, 03 හා 04 දරන විධානයන්)

(ආ) අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්, නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්, නේවාසික විජාතික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හා විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම්වල පවත්නා අරමුදල් ශ්‍රී ලංකාව තුළ විදේශ ව්‍යවහාර මුදලින් කරනු ලබන අනුමත ආයෝජනයන් සඳහා භාවිතා කිරීමටත්, එවැනි ආයෝජනයන්ගෙන් ලද ප්‍රාග්ධනය, ප්‍රාග්ධන ලාභ, භාවිතයට නොගත් විදේශ ව්‍යවහාර මුදල් ඇතුළු අනෙකුත් ලැබීම් එම ගිණුම්වලට බැර කිරීම සඳහාත් එකී ගිණුම් හිමියන් හට තවදුරටත් අවසර ලබා දෙන ලදී. (2016 අංක 05, 06, 07 හා 08 දරන විධානයන්)

(ඇ) ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර අත්පත් කර ගැනීම, දැරීම හා පැවරීම සහ සුදුසුකම්ලත් ආයෝජකයන් විසින් බලයලත් වෙළෙන්දෙකුගෙන් ඇ.එ.ජ. ඩොලර් මිලදී ගැනීම වෙනුවෙන් 'ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ආයෝජන ගිණුම' සහ 'බැඳුම්කර ආයෝජනය සඳහා වන ඩොලර් ගිණුම' නමින් විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් විවෘත කිරීමට බලයලත් වෙළෙඳුන් හට සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සඳහා බලයලත් නියෝජිතයන් ලෙස පත් කරන ලද ප්‍රාථමික වෙළෙඳුන් හට අවසර ලබා දෙන ලදී. (2016 අංක 09 දරන විධානය)

(ඈ) රාජ්‍ය දූත කාර්යාල විසින් රැස් කරන වීසා ගාස්තු සහ රාජ්‍ය දූත සේවයේ නියුතු පුද්ගලයින් සතුව පැවති වාහන විකිණීමෙන් ලද මුදල් රාජ්‍ය දූත රුපියල් ගිණුම් හරහා ප්‍රේෂණය කිරීමට බලයලත් වෙළෙඳුන් හට අවසර ලබා දෙන ලදී. තවද, රාජ්‍ය දූත විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හා රාජ්‍ය දූත රුපියල් ගිණුම්වල පවත්නා අරමුදල්, සුරැකුම්පත් ආයෝජන ගිණුම් හරහා ශ්‍රී ලංකාව තුළ ආයෝජනය කිරීමට අවසර ලබා දෙන ලදී. (2016 අංක 10 දරන විධානය)

(ඉ) 2013.06.12 දිනට පසු ශ්‍රී ලංකාව තුළදී ලද වර්තන ආදායම් හා පාරිතෝෂික ප්‍රතිලාභ සුදුසුකම්ලත් සංක්‍රමණික දීමනාවෙන් අඩු කිරීමකින් තොරව, අනේවාසික ආවෘත ගිණුම් හරහා ප්‍රේෂණය කිරීමට 2013.06.12 දිනට පෙර ස්ථිර නේවාසික වීසා මත සංක්‍රමණය වූ ශ්‍රී ලාංකිකයන් හට අවසර ලබා දෙන ලදී. (2016 අංක 11 හා 12 දරන විධානයන්)

(ඊ) සුදුසුකම්ලත් සංක්‍රමණික දීමනාව ශ්‍රී ලංකාව තුළ ආයෝජනය කිරීම පිණිස සුරැකුම්පත් ආයෝජන ගිණුම්වලට මාරු කිරීම සඳහා 2013.06.12 දිනට පසුව වෙනත් රටක ස්ථිර නේවාසිකත්වය ලබාගත් ශ්‍රී ලාංකිකයන්ට අවසර ලබා දෙන ලදී. (2016 අංක 13 දරන විධානය)

(උ) විදේශ මූලාශ්‍රයන්ගෙන් ණය ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගම්වලට හඳුන්වා දුන් නව විදේශීය වාණිජ ණය ගැනීමේ යෝජනා ක්‍රමයට සමගාමීව, සුදුසුකම්ලත් ණය ගැනුම්කරුවන්ගේ නමින් 'විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුම්' විවෘත කිරීමට හා පවත්වාගෙන යාමට බලයලත් වෙළෙඳුන් වෙත අවසර ලබා දෙන ලදී. (2016 අංක 14 දරන විධානය)

### 9.1.2 ගැසට් නිවේදන නිකුත් කිරීම

2016 වර්ෂය තුළදී, පහත සාරාංශගත කර ඇති ආකාරයට විනිමය පාලන දෙපාර්තමේන්තුව ගැසට් නිවේදනයන් කිහිපයක්ම නිකුත් කරන ලදී. මෙම ගැසට් නිවේදනයන් මෙම වාර්තාවේ III කොටසේ පළ කෙරේ.

(අ) ශ්‍රී ලංකාවේ නේවාසික ඕනෑම පුද්ගලයෙකුට ඇ.එ.ජ. ඩොලර් 10,000 ක් හෝ වෙනත් ඕනෑම විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන වන ප්‍රමාණයක් දක්වා විදේශ ව්‍යවහාර මුදල් තමා සන්තකයේ රඳවා ගැනීමට අවසර ලබා දෙන ලදී. කෙසේ වෙතත්, මෙම විදේශ ව්‍යවහාර මුදල් අදාළ ගැසට් නිවේදනයේ සඳහන් කර ඇති

ආකාරයන්ගෙන් පමණක් අත්පත් කරගත් විදේශ මුදල් විය යුතුය. (2016.01.20 දිනැති ගැසට් පත්‍ර අංක 1950/29)

(ආ) අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්, නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්, නේවාසික විජාතික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්, විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම්වල පවත්නා අරමුදල් භාවිතා කිරීම සම්බන්ධයෙන් හඳුන්වා දුන් ලිහිල්කරණයන් හා සමගාමීව, විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පත් භාවිතයෙන් ශ්‍රී ලංකාවෙන් පිටත වාසික පුද්ගලයෙකුට ඕනෑම ගෙවීමක් සිදු කිරීමට එම ගිණුම් හිමියන්ට අවසර ලබා දෙන ලදී. (2016.01.20 දිනැති ගැසට් පත්‍ර අංක 1950/40)

(ඇ) ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරනු ලබන ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජනය කිරීම සඳහා අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්, නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්, නේවාසික විජාතික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හා විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම් හිමියන්, බලයලත් වෙළෙඳුන්, බලපත්‍රලාභී විශේෂිත බැංකු, විදේශ ව්‍යවහාර මුදලින් තැන්පතු භාර ගැනීමට අවසර ලබා දී ඇති බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සහ ද්විත්ව පුරවැසිභාවයක් ඇති ශ්‍රී ලාංකික පුරවැසියන් හට අවසර ලබා දෙන ලදී. (2016.03.11 දිනැති ගැසට් පත්‍ර අංක 1957/23)

(ඈ) අපනයන ඉපැයීම් ලංකාවෙන් පිටත රඳවා ගැනීම පිණිස 1993 දී ලබා දී තිබූ නිදහස් කිරීම අවලංගු කරන ලද අතර, භාණ්ඩ අපනයනය කිරීමේ දින සිට දින 90 ක් ඇතුළත අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට රැගෙන ආ යුතු බවට භාණ්ඩ අපනයනකරුවන් හට නියම කරන ලදී. තවද, දැනටමත් පිටරට රඳවාගෙන ඇති එවැනි ඉපැයීම් 2016.05.01 දිනට පෙර ශ්‍රී ලංකාවට රැගෙන ආ යුතු බවට අපනයනකරුවන් හට නියම කරන ලදී. පසුව, 2016.08.01 දින සිට බලපැවැත්වෙන පරිදි මෙම කාලය දින 120 දක්වා දීර්ඝ කරන ලද අතර, නියෝගයන් උල්ලංඝනය කිරීමක් සම්බන්ධ ක්‍රියාමාර්ග ආරම්භ කිරීමට ප්‍රථමයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දින 30 ක සහන කාලයක් ලබා දිය හැක. (2016.04.01 දිනැති ගැසට් පත්‍ර අංක 1960/66, 2016.09.29 දිනැති ගැසට් පත්‍ර අංක 1986/42, සහ 2016.09.29 දිනැති ගැසට් පත්‍ර අංක 1986/43)

(ඉ) 2016 අයවැය නිවේදනයට අනුගාමීව, බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, බලපත්‍රලාභී මූල්‍ය සමාගම්, විශේෂිත කල්බදු සමාගම්, ඇපයෙන් සීමිත සමාගම් සහ විදේශීය සමාගම් හැර ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගම් හට විදේශීය මූලාශ්‍රයන්ගෙන් ණය ලබා ගැනීම සඳහා නව විදේශීය වාණිජ ණය ගැනීමේ යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. (2016.06.07 දිනැති ගැසට් පත්‍ර අංක 1970/8)

(ඊ) මුදල් ණයට දීම සහ ආරක්ෂක කළමනාකරණය, තක්සේරුකරණය හා තනි පුද්ගලයන්ට හෝ පෞද්ගලික ආයතනයන්ට උපදේශන සැපයීම ඇතුළු ආරක්ෂක සේවා සැපයීම යන ක්ෂේත්‍රයන්හි විදේශීය ආයෝජන සිදු කිරීමට අදාළව පැවති සීමාවන් ඉවත් කරන ලදී. (2016.06.10 දිනැති ගැසට් පත්‍ර අංක 1970/49 සහ 2016.06.10 දිනැති ගැසට් පත්‍ර අංක 1970/50)

### 9.2 විදේශ විනිමය ගනුදෙනු සඳහා විශේෂ අනුමැතීන් ප්‍රදානය කිරීම

(අ) ඇ.එ.ජ. ඩොලර් මිලියන 37.48 ක් පිටරට ආයෝජනය කිරීමට සමාගම් 5 කට අවසර ලබා දෙන ලදී.

(ආ) ඇ.එ.ජ. ඩොලර් මිලියන 204.3 ක මුදලක් විදේශයන්ගෙන් ණයට ගැනීම සඳහා සමාගම් 21 කට අවසර ලබා දෙන ලදී.

(ඇ) අනේවාසිකයන් සතුව ශ්‍රී ලංකාව තුළ ඇති කොටස් නිකුත් කිරීම/ලියාපදිංචි කිරීම/පැවරීම හා සම්බන්ධයෙන් සමාගම්/පුද්ගලයින් වෙත අනුමැතීන් 100 ක් ප්‍රදානය කරන ලදී.

(ඈ) බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරන ලද විධානයන්/මෙහෙයුම් උපදෙස් යටතේ ආවරණය නොවෙන විදේශ විනිමය ගනුදෙනු සිදු කිරීම සඳහා බලයලත් වෙළෙඳුන් වෙත අනුමැතීන් 237 ක් ප්‍රදානය කරන ලදී.

(ඉ) දැනටමත් හඳුන්වාදී ඇති විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් යටතේ සිදු කරගෙන යා නොහැකි ගනුදෙනු ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් ආරම්භ කිරීම හා පවත්වාගෙන යාම සඳහා අනුමැතීන් 33 ක් ප්‍රදානය කරන ලදී.

(ඊ) බැංකු/සංස්ථාපිත ඇපකර නිකුත් කිරීම සඳහා නේවාසික සමාගම් 11කටද, බැංකු ඇපකර නිකුත් කිරීම හා අළුත් කිරීම සඳහා නැව් සේවා හා ගුවන් සේවා නියෝජිතයන් සම්බන්ධයෙන් අනුමැතීන් 6 ක් ද ප්‍රදානය කරන ලදී.

(උ) මුදල් මාරු කිරීමේ ව්‍යාපාරයේ නියැලීම සඳහා බලපත්‍ර නිකුත් කිරීම.

- සීමිත සමාගම් 2ක්, බලපත්‍රලාභී මුදල් සමාගම් 2ක් හා එක් හෝටලයක් සඳහා නව මුදල් මාරු කිරීමේ බලපත්‍ර 5 ක් 2016 වර්ෂය තුළදී නිකුත් කරන ලදී.

- වර්ෂය තුළදී, බලපත්‍රයේ සඳහන් කර ඇති වාර්ෂික පිරිවැටුම් අවශ්‍යතාවයන්වලට අනුගත නොවීම හේතුවෙන් සීමිත සමාගම් 6කට නිකුත් කර තිබූ බලපත්‍ර අවලංගු කරන ලදී. තවද, 2016 වර්ෂය තුළදී එක් සීමිත මුදල් මාරු කිරීමේ සමාගමක් හා සුපරි වෙළෙඳසැලක් ඔවුන්ගේ මුදල් මාරු කිරීමේ ව්‍යාපාර අත්හිටුවන ලදී.

- ඒ අනුව, 2016 දෙසැම්බර් 31 දින වන විට, බලපත්‍රලාභී මුදල් සමාගම් 8 කින්, බලපත්‍රලාභී විශේෂිත බැංකු 2 කින් සංචාරක හෝටල් 2 කින් සහ අනෙකුත් සීමිත මුදල් මාරු කිරීමේ සමාගම්

63 කින් සමන්විත වන පරිදි සමස්ත මුදල් මාරු කරන්නන්ගේ සංඛ්‍යාව 75 ක් විය. 2016.12.31 දිනට බලයලත් මුදල් මාරු කරන්නන්ගේ ලැයිස්තුව ඇමුණුම 1 හි දක්වා ඇත.

- 2016 වර්ෂය තුළදී බලපත්‍රලාභී මූල්‍ය සමාගම් 2 කට විදේශ ව්‍යවහාර මුදල් විකිණීම සඳහා නව බලපත්‍ර 2 ක් නිකුත් කරන ලදී. තවද, විදේශ විනිමය විකිණීම සඳහා සුදුසුකම් ලැබීම පිණිස බලපත්‍රයේ සඳහන් කර ඇති වාර්ෂික පිරිවැටුම් අවශ්‍යතාවයන්ට අනුගත නොවීම හේතුවෙන් එක් සීමිත සමාගමකට නිකුත් කර තිබූ විදේශ ව්‍යවහාර මුදල් විකිණීම සඳහා වන බලපත්‍රය අවලංගු කරන ලද අතර, එක් සුපිරි වෙළෙඳසැලක් සිය ව්‍යාපාරික කටයුතු අත්හිටුවන ලදී.

- ඒ අනුව, 2016 වර්ෂය අවසාන වන විට, බලපත්‍රලාභී මුදල් මාරු කරන්නන් 61 කට විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම සඳහා පමණක් අවසර ලබාදී තිබූ අතර, බලපත්‍රලාභී මූල්‍ය සමාගම් 8 කින්, බලපත්‍රලාභී විශේෂිත බැංකු 2 කින් හා සීමිත සමාගම් 4 කින් සමන්විත වන ආකාරයට බලපත්‍රලාභී මුදල් මාරුකරන්නන් 14 ක් වෙත විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීමට සහ විකිණීමට අවසර ලබා දී තිබිණි.

(ඍ) සංක්‍රමණිකයන්ගේ අරමුදල් ප්‍රේෂණය කිරීම

2013 ජූනි 12 දිනට පසුව වෙනත් රටක ස්ථිර නේවාසිකත්වය ලබාගත් ශ්‍රී ලාංකිකයින්ට හිමි සංක්‍රමණික දීමනාව නිදහස් කිරීම සඳහා සංක්‍රමණික ආවෘත ගිණුම් 221 ක් විවෘත කිරීම සඳහා බලයලත් වෙළෙඳුන්ට අවසර ලබා දෙන ලදී. තවද, 2013 ජූනි 12 දින හෝ ඊට පෙර වෙනත් රටක ස්ථිර නේවාසිකත්වය ලබාගෙන ඇති ශ්‍රී ලාංකික සංක්‍රමණිකයන් 377 දෙනෙකුට අනේවාසික ආවෘත ගිණුම් හරහා ශ්‍රී ලංකාවෙන් පිටතට අරමුදල් ප්‍රේෂණය කිරීමට අවසර ලබා දෙන ලදී.

## 9.3 අධීක්ෂණය සහ සුපරීක්ෂණය/විදේශ විනිමය ගනුදෙනු විමර්ශනය

(අ) එතැන් පරීක්ෂණ

- විදේශ විනිමය විකිණීම හා මිලදී ගැනීම සහ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් ආරම්භ කිරීම හා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් වන විධානයන් හා විනිමය පාලක විසින් සඳහන් කර ඇති අනෙකුත් අවශ්‍යතාවයන් කෙරෙහි බලයලත් වෙළෙඳුන්ගේ අනුකූලතාවය සනාථ කර ගැනීම පිණිස එතැන් පරීක්ෂණ 34 ක් සිදු කරන ලදී.

- බලයලත් මුදල් මාරු කරන්නන්ට නිකුත් කර ඇති බලපත්‍රයන්හි සඳහන් කොන්දේසි හා නියමයන්වලට ඔවුන් දක්වන අනුකූලතාවය තහවුරු කර ගැනීම පිණිස එතැන් පරීක්ෂණයන් 19 ක් සිදු කරන ලදී.

- තවද, අනවසර මුදල් මාරු කරන්නන් හඳුනා ගැනීම පිණිස ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව අනාවරණය කර ගැනීම් 15 ක් සිදු කළ අතර ඔවුන්ට අධිකරණය හමුවේ චෝදනා ගොනු කරන ලදී.

(ආ) විමර්ශනයන්

- 2016 වර්ෂය තුළදී විමර්ශනයන් 200 ක් සිදු කරන ලද අතර විමර්ශනයන් 91 ක් අවසාන කිරීමෙන් අනතුරුව දඩ මුදල් වශයෙන් අය කර ගනු ලැබූ රු. මිලියන 62.45 ක මුදලක් ඒකාබද්ධ අරමුදලට මාරු කරන ලදී. මෙම විමර්ශනවලින් බහුතරයක්ම නේවාසිකයන් විසින් අනේවාසිකයන්ට කරන ලද අනවසර ගෙවීම්, විනිමය පාලක විසින් බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරන ලද විධානයන්/මෙහෙයුම් උපදෙස්වලට අනුකූල නොවීම්, බලයලත් මුදල් මාරු කරන්නන්ට නිකුත් කරන ලද බලපත්‍රයන්හි සඳහන් කොන්දේසි උල්ලංඝනය කිරීම්, විදේශ මුදල් අනවසරයෙන් ළඟ තබා ගැනීම සහ පොදු අවසරයන්හි දක්වා ඇති ක්‍රියාපටිපාටිය උල්ලංඝනය කරමින් සුරැකුම්පත් නිකුත් කිරීම හා පැවරීම පිළිබඳව වේ.

(ඇ) මීට අමතර, විනිමය පාලන දෙපාර්තමේන්තුව නඩු හා අධිකරණමය ක්‍රියාපටිපාටීන්හිදී විශේෂඥ සාක්ෂි/වාචික සාක්ෂි ලබාදීම හරහා අවශ්‍ය අවස්ථාවන්හිදී නීති බලාත්මක කිරීමේ අධිකාරීන්වලට සහයෝගය දක්වන ලදී.

## 9.4 විනිමය පාලන රෙගුලාසි පිළිබඳ දැනුම්වත්භාවය ඉහළ නැංවීම

(අ) විදේශ විනිමය සම්බන්ධ ගනුදෙනුවලට අදාළ ගැටලු සාකච්ඡා කිරීම හා නව රෙගුලාසි පිළිබඳ දැනුම යාවත්කාලීන කිරීම පිණිස, විනිමය පාලන රෙගුලාසි සමග අනුකූලවීම තහවුරු කරනු පිණිස පත් කරනු ලැබූ බලපත්‍රලාභී වාණිජ බැංකුවල අනුකූලතා නිලධාරීන්, බැංකුවල නියෝජිතයන් සහ බලයලත් මුදල් මාරු කරන්නන් සමග රැස්වීම් කිහිපයක්ම පවත්වන ලදී.

(ආ) දෛනික විදේශ විනිමය මෙහෙයුම් ක්‍රියාකාරකම් හා ගනුදෙනුවල කාර්යක්ෂමව හා සඵලදායීව නියැළීම පිණිස හැකියාව ලබා දෙමින් විනිමය පාලන රෙගුලාසි පිළිබඳ බැංකු නිලධාරීන්ගේ දැනුම වැඩිදියුණු කිරීම පිණිස ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධ්‍යයන කේන්ද්‍රයේ හා ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සහයෝගය ඇතිව බලයලත් වෙළෙඳුන් වෙනුවෙන්, පවත්නා විනිමය පාලන රෙගුලාසි පිළිබඳව දැනුම්වත් කිරීමේ වැඩ සටහන් 5 ක් පවත්වන ලදී.

(ඈ) මැතකාලීන ප්‍රාග්ධන ගිණුම් ගනුදෙනු ලිහිල්කරණයන් පිළිබඳව දැනුම්වත්භාවය වැඩිදියුණු කිරීමේ අරමුණින් යුතුව මහජනතාව සහ අනෙකුත් උනන්දුවක් දක්වන පාර්ශ්වයන් ඉලක්ක කරමින් බැංකු අධ්‍යයන කේන්ද්‍රයේදී වැඩසටහන් 3 ක් දියත් කරන ලදී.

(ඇ) විනිමය පාලන රෙගුලාසි පිළිබඳව මහජනතාවගේ දැනුම්වත්භාවය ඉහළ නැංවීම පිණිස විනිමය පාලන දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය නිසි පරිදි යාවත්කාලීන කළ අතර විද්‍යුත් තැපැල, දුරකථන ඇමතුම් හරහා සහ දෙපාර්තමේන්තුවට පැමිණ ඉදිරිපත් කරනු ලබන ගැටළුවලට අඛණ්ඩව පිළිතුරු සහ පැහැදිලි කිරීම් ලබා දෙන ලදී.

## 9.5 නව විදේශ විනිමය කළමනාකරණ රාමුව ක්‍රියාත්මක කිරීම පිණිස පහසුකම් සැපයීම

2016 අයවැයෙන් අනුමත කළ පරිදි, නව විදේශ විනිමය කළමනාකරණ රාමුවක් ක්‍රියාත්මක කිරීම පිණිස මූලික කටයුතු 2016 වර්ෂය තුළදී ආරම්භ කරන ලදී. යෝජිත කෙටුම්පත පිළිබඳ විනිමය පාලන දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණයන් ඉදිරිපත් කරන ලද අතර යෝජිත පනත නීතිගත කිරීමේ කටයුතු සම්පූර්ණ කිරීම පිණිස අවශ්‍ය පහසුකම් සැලසීම අඛණ්ඩව සිදු කෙරෙනු ඇත.

**ඇමුණුම II-2**
**2016.12.31 දිනට බලයලත් මුදල් මාරුකරන්නන්ගේ ලැයිස්තුව**

| | |
|---|---|
| 1 | පුෂ්පා මනි චේන්ජර්ස් (පුද්.) සමාගම |
| 2 | ෂිෆාස් මනි චේන්ජර්ස් (පුද්.) සමාගම |
| 3 | රෆීක්ස් ජෙම්ස් (පුද්.) සමාගම |
| 4 | කුවුන් මනි චේන්ජර්ස් (පුද්.) සමාගම |
| 5 | දයා ඕතරයිස්ඩ් මනි චේන්ජර් (පුද්.) සමාගම |
| 6 | සලාකා ට්‍රස්ට් ඉන්වෙස්ට්මන්ට් (පුද්.) සමාගම |
| 7 | සලාකා ට්‍රස්ට් ඉන්වෙස්ට්මන්ට් (පුද්.) සමාගම - ශාඛාව |
| 8 | ඩේටා එක්ස්චේන්ජ් ඉන්ටර්නැෂනල් (පුද්.) සමාගම |
| 9 | රෝයල් මනි මාර්ට් (පුද්.) සමාගම |
| 10 | ප්‍රසන්න මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 11 | ප්‍රසන්න මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම - ශාඛාව |
| 12 | ස්විස් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 13 | ස්විස් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම - ශාඛාව |
| 14 | ගෝල්ඩන් මනි චේන්ජර්ස් (පුද්.) සමාගම |
| 15 | රෝයල් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 16 | රෝයල් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම - ශාඛාව |
| 17 | මිඩ්නා මිනි මාර්කට් (පුද්.) සමාගම |
| 18 | මයුරි මනි චේන්ජර්ස් (පුද්.) සමාගම |
| 19 | ආබ්දීන් මනි චේන්ජර්ස් (පුද්.) සමාගම |
| 20 | ජුවෙල් ලංකා මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 21 | දැඩිගම ශෘප් (පුද්.) සමාගම |
| 22 | මොන්ට්කාලෝ එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 23 | කලම්බු මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 24 | නිව් රීගල්ස් මනි චේන්ජර් (පුද්.) සමාගම |
| 25 | දේවි ෆොරෙක්ස් (පුද්.) සමාගම |
| 26 | සිටි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 27 | ඒ ඕ ලක්ෂ්මි ජුවෙල්ස් (පුද්.) සමාගම |
| 28 | තෝමස් කුක් ලංකා (පුද්.) සමාගම |
| 29 | රවී ෆොරෙක්ස් (පුද්.) සමාගම |
| 30 | ඉන්ටර්නැෂනල් එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 31 | අරියවංශ එන්ටර්ප්‍රයිසස් (පුද්.) සමාගම |
| 32 | එම් පී මනි චේන්ජර්ස් (පුද්.) සමාගම |
| 33 | වින්ඩ්සර් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 34 | මරුති මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 35 | පර්ල් එක්සි (පුද්.) සමාගම |
| 36 | කැපිටල් එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 37 | කමල් එන්ටර්ප්‍රයිසස් (පුද්.) සමාගම |
| 38 | වසන්තාස් ඉන්ටර්නැෂනල් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 39 | රිම්හා ජුවෙලර්ස් (පුද්.) සමාගම |
| 40 | නිව් නටාෂා (පුද්.) සමාගම |
| 41 | මෙට්රෝ ෆොරෙක්ස් (පුද්.) සමාගම |
| 42 | කේසර් එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 43 | අරුජිනා ජුවලරි (පුද්.) සමාගම |
| 44 | යුනික් ෆොරෙක්ස් (පුද්.) සමාගම |
| 45 | රෙඩ් රූබි ජුවෙලර්ස් (පුද්.) සමාගම |
| 46 | බුලියන් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 47 | ජෝර්ජ් මයිකල් හෝල්ඩිංස් (පුද්.) සමාගම |
| 48 | සිටි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 49 | අරුණ ෆොරෙක්ස් (පුද්.) සමාගම |
| 50 | අස්වින් එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 51 | නර්මදා ගෝල්ඩ්සෙන්ටර් (පුද්.) සමාගම |
| 52 | ශාරංගා මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 53 | ඩෙල්ටා සරත් හෝල්ඩිංස් (පුද්.) සමාගම |
| 54 | මිලානෝ මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 55 | මැජෙස්ටික් ජුවලරි (පුද්.) සමාගම |
| 56 | ග්ලෝබල් විලේජ් එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 57 | තෝමස් කුක් ලංකා (පුද්.) සමාගම - ශාඛා අංක 2 |
| 58 | කුඩාමඩු මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 59 | රිවිඳු එන්ටර්ප්‍රයිසස් (පුද්.) සමාගම |
| 60 | තෝමස් කුක් ලංකා (පුද්.) සමාගම - ශාඛා අංක 3 |
| 61 | වෙස්ටර්න් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| 62 | ජයෙස් ඉන්වෙස්ට්මන්ට් (පුද්.) සමාගම |
| 63 | ඒෂියන් මනි එක්ස්චේන්ජ් (පුද්.) සමාගම |
| **බලපත්‍රලාභී මූල්‍ය සමාගම්** | |
| 64 | ලංකා ඔරික්ස් ෆිනෑන්ස් සමාගම |
| 65 | සිටිසන්ස් ඩිවලොප්මන්ට් බිස්නස් ෆිනෑන්ස් සමාගම |
| 66 | සෙංකඩගල ෆිනෑන්ස් සමාගම |
| 67 | බිම්පුත් ෆිනෑන්ස් සමාගම |

| | |
|---|---|
| 68 | සිංහපුත්‍ර ෆිනෑන්ස් සමාගම |
| 69 | සිංගර් ෆිනෑන්ස් (ලංකා) සමාගම |
| 70 | ඒෂියා ඇසෙට් ෆිනෑන්ස් සමාගම |
| 71 | එල් බී ෆිනෑන්ස් සමාගම |
| බලපත්‍රලාභී විශේෂිත බැංකු | |
| 72 | ජාතික ඉතිරිකිරීමේ බැංකුව |
| 73 | සණස සංවර්ධන බැංකුව |
| හෝටල් | |
| 74 | පර්ල් සිටි හොටෙල් (පුද්.) සමාගම |
| 75 | ෂැංග්‍රිලාස් හම්බන්තොට රිසෝට්ස් ඇන්ඩ් ස්පා |

## 10. පහසුකම් කළමනාකරණ

රාජකාරී කටයුතු සඳහා උචිත පරිසරයක් ගොඩනැගීම තුළින් සේවක කාර්යක්ෂමතාවය වර්ධනය කිරීමේ අරමුණින් සහ බැංකු කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යෑමේ අරමුණින් යුතුව, පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් 2016 වසරේදී ද බැංකු පරිශ්‍රයන්හි සංවර්ධන කටයුතු සහ නඩත්තු කටයුතු නොකඩවා සිදු කරන ලදී. එමෙන්ම බැංකු කාර්ය මණ්ඩලයේත්, බැංකුව සතු රථ වාහනවලත් සහ බාහිර පාර්ශ්වයන්හිත් සුරක්ෂිතබව රැකෙන පරිදි, මහ බැංකුවේ රථ වාහන සංචිතයේ ධාවන කාර්යක්ෂමතාවය පවත්වාගෙන යෑමට ද කටයුතු කරන ලදී.

පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් 2016 වසරේදී ද විදුලිය, වායු සමීකරණ, ජල සම්පාදන සහ ප්‍රවාහන ආදී ඉතා වැදගත් සේවා පහසුකම් ඉහළ විශ්වසනීය මට්ටමකින් පවත්වා ගෙන යෑමට කටයුතු කරන ලදී. පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුවට මෙම පහසුකම් ඉතා උසස් මට්ටමකින් යුතුව සැපයීමට හැකි වූ අතර එමගින් මහ බැංකුවේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යෑමට පුළුල් දායකත්වයක් සැපයීමට හැකි විය.

වෘත්තීයවේදීන්ගෙන් සමන්විත ප්‍රවීන නිලධාරී මඩුල්ලක් විසින් ව්‍යාපෘති ඇගයීම සහ කළමනාකරණ කටයුතු කිරීම හේතුවෙන් වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සඳහා වැය කළ පිරිවැයෙන් උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමට හැකි වූ අතර, පිළිගත් කොන්ත්‍රාත්කරුවන් වෙත ව්‍යාපෘති පිරිනැමීම සහ මෙම ව්‍යාපෘති සමීප අධීක්ෂණයකට ලක් කිරීම හේතුවෙන් නියමිත කාලසීමාවන් තුළ අපේක්ෂිත ප්‍රමිතීන්ට අනුව මෙම ව්‍යාපෘති නිම කිරීමට හැකි විය.

වයිට්වේස් (Whiteaways) ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම මෙම වසර තුළ දී නිම කිරීමට හැකි විය. එසේම, 2016 නොවැම්බර් 18 වැනි දින කතරගම නිවාඩු නිකේතනය සඳහා තනා නිම කළ අතිරේක ඒකක නවයක් සහිත ගොඩනැගිලි තුනක් විවෘත කරන ලදී. මහ බැංකුවේ ප්‍රධාන කාර්යාලයේ රථගාලේ 10 වන මහලේ අලුතින් ඉදිකරන ලද නව ශරීර සුවතා මධ්‍යස්ථානය 2016 ජුනි 28 දින විවෘත කරන ලදී. 2016 අගෝස්තු මස 19 වන දින රාජගිරියේ බැංකු අධ්‍යයන කේන්ද්‍රයේ නව ගොඩනැගිල්ල විවෘත කරන ලදී. මීට අමතරව කිලිනොච්චි උතුරු ප්‍රාදේශීය කාර්යාල ගොඩනැගිලි සංකීර්ණයේ දෙවන අදියරෙහි ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට ද පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුවට හැකි විය.

තවද, ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රධාන කාර්යාලයේ ව්‍යුහාත්මක ශක්තිමත් බව ආරක්ෂා කිරීම සඳහා සහ ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රධාන කාර්යාලයේ යන්ත්‍රෝපකරණවල විශ්වාසනීයත්වය හා මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් පුළුල් නව උපාංග සවිකිරීමේ විස්තරාත්මක ව්‍යාපෘතියක් (Retrofit) සැලසුම් කරන ලදී.

2016 දී, පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන කාර්යාලයේ ආපන ශාලාව ඇතුළු, අනුරාධපුර හා මාතර ප්‍රාදේශීය කාර්යාලවල සහ බැංකු අධ්‍යයන කේන්ද්‍රයේ ප්‍රතිසංස්කරණ හා අලුත්වැඩියා කටයුතු සිදු කළ අතර, ප්‍රධාන කාර්යාලයේ යම් යම් හදිසි නඩත්තු කටයුතු ද සිදු කරන ලදී. නුවරඑළිය ප්‍රාදේශීය කාර්යාලයේ ගෙවතු හා භූමි නිර්මාණය ද නිම කරන ලදී.

මීට අමතරව, පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රධාන කාර්යාලයේ ආරක්ෂාව හා නිසි ක්‍රියාකාරීත්වය සඳහා ව්‍යුහාත්මක ශක්තිමත් බව ඇගයීමකට ලක්කරන ලද අතර ශ්‍රී ලංකා මහ බැංකු පරිශ්‍රයේ බලශක්ති භාවිතයෙන් උපරිම ඵල ලබා ගැනීම සඳහා ද පියවර ගන්නා ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුවේ සාමාන්‍ය ප්‍රවාහන කාර්යයන්ට අමතරව 2016 වසරේ දී මහ බැංකුව විසින් සංවිධානය කරන ලද ජාත්‍යන්තර සමුළු ගණනාවක් සහ වෙනත් උත්සව සඳහා බාධාවකින් තොරව ප්‍රවාහන පහසුකම් ලබා දීමට ද පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුවට හැකි විය.

## 11. මූල්‍ය කටයුතු

ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිතීන්, ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් සහ මුදල් නීති පනතේ අදාළ විධිවිධාන යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය වාර්තාකරණ කාර්යය මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ. මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුවේ කාර්යයන්ට, ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම, මහ බැංකුවේ වාර්ෂික අයවැය ලේඛනය පිළියෙල කිරීම හා නිරීක්ෂණය කිරීම, මහ බැංකුවේ අභ්‍යන්තර හා බාහිර මූල්‍ය ගනුදෙනු සඳහා ගෙවීමේ පද්ධතියක් පවත්වාගෙන යෑම, මූල්‍ය ගනුදෙනු අභ්‍යන්තර වාර්තාකරණය සඳහා පද්ධති පවත්වා ගෙන යෑම, අභ්‍යන්තර අරමුදල් 16 ක් කළමනාකරණය කිරීම, ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන යෑම සහ සේවක ණය දත්ත සංචිතය පවත්වාගෙන යෑම ඇතුළත් වේ.

### 11.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම

(අ) **මාසික ශේෂ පත්‍රය:** මුදල් නීති පනතේ විධිවිධාන ප්‍රකාරව, 2015 වසරේ දෙසැම්බර් මාසය හා 2016 වසරේ ජනවාරි මස සිට නොවැම්බර් මස දක්වා වූ මාසික ශේෂ පත්‍රයන් පිළියෙළ කරන ලදී.

(ආ) **කාර්තුමය වාර්තා:** කාර්තුමය මූල්‍ය ප්‍රගති/කාර්ය ඵල සහ තත්ත්වයන් 2016 වසරේ දී මුදල් මණ්ඩලය වෙත වාර්තා කිරීම සිදු කරන ලදී.

(ඇ) **වාර්ෂික මූල්‍ය ප්‍රකාශන:** 2002 වර්ෂයේ සිට මෙම කාර්යය සඳහා ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිතීන් සහ ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් අදාළ කර ගන්නා ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන මහ බැංකු වාර්ෂික වාර්තාවේ ප්‍රකාශයට පත් කරනු ලැබේ. 2016 වර්ෂය තුළ දීත් මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩ පදනමකින් අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් හා අවශ්‍යතාවයන් මත අනුකූලවීම සඳහා ගිණුම්කරණ පද්ධතීන් හා කාර්ය පටිපාටිය යාවත්කාලීන කරන ලදී. 2016 වර්ෂය සඳහා වූ මහ බැංකුවේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන වාර්ෂික වාර්තාවේ II වන කොටස ආරම්භයේ දී ඉදිරිපත් කර ඇත.

**II-17 සංඛ්‍යා සටහන**

**ප්‍රධාන මූල්‍ය තොරතුරු (රු.බි.)**

| | 2016 | 2015 |
|---|---|---|
| මුළු වත්කම් | 1,529.2 | 1,426.2 |
| විදේශීය වත්කම් (මූල්‍ය නොවන වත්කමක් වන රන්) | 1,050.0 | 1,126.7 |
| දේශීය වත්කම් | 479.2 | 299.5 |
| විදේශීය වගකීම් | 505.8 | 574.8 |
| දේශීය වගකීම් | 937.8 | 797.3 |
| හිමිකම | 85.6 | 54.1 |
| මුළු ආදායම | 42.1 | 6.4 |
| පොලී ආදායම | 35.9 | 22.4 |
| විනිමය වාසිය / (පාඩුව) | -6.8 | 10.6 |
| වෙළඳපොළ මිල මත ඇගයීමේ ලාභය/(පාඩුව) - විදේශීය | 9.7 | -34.9 |
| අනෙකුත් ආදායම් | 3.3 | 8.3 |
| මුළු වියදම | 19.9 | 26.0 |
| පොලී වියදම | 6.1 | 12.6 |
| මෙහෙයුම් වියදම | 12.0 | 11.6 |
| රඳවා ගැනීම් මත බද්ද | 1.8 | 1.8 |
| ශුද්ධ ලාභය/(පාඩුව) | 22.2 | -19.6 |
| දේශීය වත්කම්වලට හිමිකම් අනුපාතය (%) | 17.9 | 18.1 |

2016 දී දේශීය හා විදේශීය වත්කම් අතර ඇති වත්කම් සංකලනයෙහි වෙනසක් පෙන්නුම් කරන ලදී. දේශීය වත්කම්හි වැඩි වීම සඳහා 2016 අග භාගයේ දී පැවති මූල්‍ය වෙළඳපොළ ද්‍රවශීලතා තත්ත්වයෙහි වූ හිඟය ප්‍රධාන වශයෙන් හේතු විය. රටෙහි ගෙවුම් ශේෂ තත්ත්වයන් නිසා ඇති වූ විදේශ සංචිත අඩුවීම, විදේශීය වත්කම්වල අඩුවීම තුළින් පිළිබිඹු විය. එපරිද්දෙන්, බැරකම් අංශයෙහි, 2016 ජනවාරි මස දී ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවය (SRR) සියයට 1.5 කින් වැඩිවීමත් සමඟ වාණිජ බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතනයන්හ ශේෂයන් වැඩි වීම හේතුවෙන් දේශීය වගකීම්වල සැලකිය යුතු වර්ධනයක් ඇති විය. රන් සඳහා වන වෙළඳපොළ මිලෙහි ඉහළයාම තුළින් ලැබූ වෙළඳපොළ වාසිය සහ විවෘත වෙළඳපොළ කටයුතු සඳහා පවත්වා ගෙන යන භාණ්ඩාගාර බිල්පත්වලින් ලද ඉහළ පොලී ආදායම, 2016 වසරේ ශුද්ධ ලාභය වර්ධනයවීමට හේතු විය. ප්‍රධාන වශයෙන් 2016 මැද භාගය තුළ දී විදේශ සංචිතයෙන් ආසන්න වශයෙන් සියයට 8 පමණ වන එක්සත් රාජධානි පවුම්වලින් නියෝජනය වන විදේශීය වත්කම් වලට එරෙහිව රුපියලෙහි වූ අධිප්‍රමාණය සහ 2016 දී එ.ජ.ඩොලරයට එරෙහිව රුපියලෙහි අවප්‍රමාණ අනුපාතය අඩුවීම විනිමය පාඩුවට හේතුවිය. මුදල් නීති සහ අනෙකුත් ව්‍යවස්ථා යටතේ, පොදු යහපත සලකා බැංකුවේ මුදල් සහ මූල්‍ය ප්‍රතිපත්තීන් විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රතිඵලය තීරණය කරනු ලැබේ. එබැවින් ශ්‍රී.ලං.ම.බැ.වේ මෙහෙයුම් කටයුතු වාණිජමය පදනමක් මත වූ මූල්‍ය ප්‍රතිඵලයක් වෙනුවෙන් මෙහෙයවනු නොලබන අතර මූල්‍ය කළමනාකරණයෙහි මූලික අවධානය පිරිවැය කාර්යක්ෂමතාවය කෙරෙහි යොමු කර ඇත.

මුදල් නීති පනතේ සහ මුදල් මණ්ඩල අනුමත ප්‍රතිපත්තීන් හි වෙන් කිරීම් ප්‍රකාරව ශ්‍රී.ලං.ම.බැ.වේ ලාභය බෙදා හරිනු ලැබේ.

## II.2 වාර්ෂික අයවැය ලේඛනය පිළියෙල කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුවේ 2017 වසර සඳහා වූ වාර්ෂික ආදායම් හා වියදම් අයවැය හා ප්‍රාග්ධන අයවැය මහ බැංකුවේ සියලුම දෙපාර්තමේන්තුවල උපායමාර්ගික සැලසුම් යටතේ ඇති කාර්යය සැලසුම්වලට අනුකූලව පිළියෙළ කරන ලදී. මෙම ක්‍රියාවලිය 2016 අගෝස්තු මස ආරම්භ කරන ලද අතර, 2016 නොවැම්බර් මස අවසන් විය. වාර්ෂික අයවැය සඳහා මුදල් මණ්ඩලයේ අනුමැතිය 2016 නොවැම්බර් මස ලබා ගන්නා ලද අතර, අයවැය 2017 වසරේ මුල් දින සිටම සියලුම දෙපාර්තමේන්තුවලට ලබාදෙන ලදී. 2016 වසර සඳහා වූ අයවැයෙහි ප්‍රගතිය දැක්වෙන කාර්තුමය වාර්තා ඵලදායි අයවැය පාලනය සඳහා මුදල් මණ්ඩලය වෙත යොමු කරන ලදී.

## II.3 අභ්‍යන්තර හා බාහිර මූල්‍ය ගනුදෙනු සඳහා ගෙවීමේ පද්ධතිය

(අ) 2016 වසර තුළ දී නියමිත කාලසීමාවන් ඇතුළත සියලු අභ්‍යන්තර ගෙවීම් එනම් සේවක වේතන, සේවක ණය හා මෙහෙයුම් වියදම් යනාදිය ගෙවන ලදී.

(ආ) මහ බැංකුවේ ස්ථාවර නියෝග යටතේ ඇති ක්‍රියාපටිපාටි වලට යටත්ව දේශීය හා විදේශීය සැපයුම්කරුවන්ට ගෙවිය යුතු සියලුම බාහිර ගෙවීම් සිදු කර ඇත. 2016 වර්ෂය ඇතුළත මුළු ගෙවීම් 4,457 ක් සිදු කරන ලද අතර, ඉන් 4,186 ක් දේශීය සැපයුම්කරුවන් සඳහාත් 271 ක් විදේශීය සැපයුම්කරුවන් සඳහාත් විය.

(ඇ) 2016 වසර තුළ දී මහා භාණ්ඩාගාරයට සහ අදාළ ව්‍යාපෘතීන් සඳහා රු.බිලියන 692.8 ක වටිනාකමකින් යුත් ණය අරමුදල් නිදහස් කිරීම් 2,752 ක් සහ රු.බිලියන 688.8 ක වටිනාකමකින් යුත් විදේශීය ණය වාරික ආපසු ගෙවීම් 619 ක් ආසන්න වශයෙන් සිදු කර ඇත. මීට අමතරව ව්‍යාපෘති සඳහා විදේශ බැංකුවක් සමඟ බැංකු එකඟතාවන් 4 ක් අත්සන් කරන ලදී.

## 11.4 අභ්‍යන්තර අරමුදල් කළමනාකරණය

i. මුදල් මණ්ඩල තීරණයකට අනුව මහ බැංකුවේ අභ්‍යන්තර අරමුදල් (සේවක අර්ථසාධක අරමුදල හැර) මධ්‍යගත ලෙස කළමනාකරණය කිරීම සඳහා මූල්‍ය දෙපාර්තමේන්තුව යටතේ නව ඒකකයක් ස්ථාපිත කළ අතර එහි මෙහෙයුම් කටයුතු 2016 මාර්තු මස සිට ආරම්භ විය. ඒ අනුව, සියලු අරමුදල් පොදු ආයෝජන ප්‍රතිපත්තියක් යටතේ මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් ආයෝජනය කෙරෙන අතර අදාළ අරමුදල් හිමිකාර දෙපාර්තමේන්තු ඒවායේ පරිපාලක ලෙස කටයුතු කරයි. අරමුදල් කළමනාකරණ පාලන පද්ධතිය ස්වාධීනව කටයුතු කරන ඉදිරි කාර්යාලය, මැද කාර්යාලය හා පසු කාර්යාලයකින් සමන්විත වන අතර නියෝජ්‍ය අධිපතිවරයෙකුගේ ප්‍රධානත්වයෙන් යුත් ආයෝජන කමිටුව විසින් තීරණය ගැනීම සිදු කෙරේ. ආයෝජන කමිටුව විසින් අරමුදල් ආයෝජන උපදෙස් දීම සඳහා 2016 වසර තුළ 12 වතාවක් රැස් වූ අතර ආයෝජන අපරානුමත කිරීම සඳහා මාසිකව මුදල් මණ්ඩලයට වාර්තා කර ඇත. ඒ අනුව, මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් පාලනය කරන විශ්‍රාම ප්‍රතිලාභ අරමුදල් 7 ක් හා වෙනත් අරමුදල් 4 ක්, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පාලනය කරන ශ්‍රී ලංකා තැන්පතු හා ද්‍රවශීලතා ආධාරක අරමුදල, කාර්ය මණ්ඩල කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් පාලනය කරන අරමුදල් 3 ක් හා ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව පාලනය කරන ව්‍යාපෘති අරමුදල් වලින් සමන්විත අරමුදල් 16 ක් මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් කළමනාකරණය කරයි.

ii. මෙම අරමුදල් ප්‍රධාන වශයෙන් රජයේ සුරැකුම්පත්වල, රාජ්‍ය බැංකු (මහජන බැංකුව, ලංකා බැංකුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව) ස්ථාවර තැන්පතුවල, ඉහළ ශ්‍රේණිගත සංස්ථාපිත ණයකරවල හා කෙටිකාලීන ප්‍රතිවිකුණුම්වල ආයෝජනය කෙරේ. මෙම අරමුදල්වල 2016 වසර සඳහා වූ විගණනය කරන ලද මූල්‍ය වාර්තා එම අරමුදල්වල නීති රීතිවලට අනුව මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති අතර, මුළු අරමුදල රු.බිලියන 79.26 දක්වා වර්ධනය විය.

**II-18 සංඛ්‍යා සටහන**

**අරමුදල් කළමනාකරණ කාර්ය සාධනය - 2016 (රු.බිලියන)**

| දෙපාර්තමේන්තුව | 2016 දෙසැම්බර් 31 දිනට ආයෝජන කළඹෙහි වටිනාකම (ආයෝජිත අගය) | 2015 දෙසැම්බර් 31 දිනට ආයෝජන කළඹෙහි වටිනාකම (ආයෝජිත අගය) |
|---|---|---|
| මූල්‍ය | 48.90 | 45.80 |
| බැංකු අධීක්ෂණ | 27.21 | 16.99 |
| ප්‍රාදේශීය සංවර්ධන | 3.09 | 3.04 |
| කාර්ය මණ්ඩල කළමනාකරණ | 0.06 | 0.06 |
| එකතුව | 79.26 | 65.89 |

## 11.5 ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන යෑම

මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව විසින් පොදු ලෙජරයේ ස්ථාවර වත්කම් ඒකකය යටතේ ස්ථාවර වත්කම් ලේඛනය තුළ මහ බැංකුවේ සියලුම ස්ථාවර වත්කම් පිළිබඳ වාර්තාවන් පවත්වා ගෙන යනු ලබයි. සියලුම වෙනස්කම් එනම් නව මිලදී ගැනීම් හා ඒවායේ ස්ථානගත කිරීම, ස්ථානගත කිරීම්වල සිදු වූ වෙනස්කම්, ප්‍රත්‍යාගණනයන්, ක්ෂයවීම් සහ ඉවත් කිරීම් 2016 වසර තුළ දී මෙම ලේඛනයේ වාර්තා ගත කර ඇත. අයිතමයන් අත්පත් කර ගැනීම් 1,187 ක් සහ ඉවත් කිරීම් 253 ක් සමගින් 2016 වසර තුළ දී මෙම ලේඛනය යාවත්කාලීන කරන ලදී.

## 11.6 කාර්යමණ්ඩල ණය පිළිබඳ දත්ත සංචිතය පවත්වාගෙන යෑම

මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව, තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව මහ බැංකු කාර්ය මණ්ඩල ණය පිළිබඳ දත්ත සංචිතය අඛණ්ඩව පවත්වාගෙන යන අතර, එමගින් ණය අයකර ගැනීම් වාර්තා කිරීමේ ක්‍රියාවලිය සඳහා සහ සේවකයන්ට සහ කළමනාකරණය වෙත ණය තොරතුරු සැපයීමේ කටයුතු සඳහා 2016 වසර තුළ දී පහසුකම් සපයන ලදී. 2016 වසර තුළ දී රු.බිලියන 1.69 ක වටිනාකමකින් යුත් 2,173 ක ණය සංඛ්‍යාවක් සේවකයන් සඳහා පිරිනමා ඇත.

## 11.7 අනෙකුත් කාර්යයන්

**මිලදී ගැනීම් ක්‍රියාවලිය:**

ශ්‍රී ලංකා මහ බැංකුවේ නීතිරීතිවලට අනුව, මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සියලුම තාක්ෂණික ඇගයීම් කමිටුවලට සහ භාණ්ඩ හා සේවා ලබා ගැනීම සඳහා වන ටෙන්ඩර් මණ්ඩලවලට සහ සමීක්ෂණ මණ්ඩලවලට සහභාගි විය යුතුය. 2016 වසර තුළ දී ආසන්න වශයෙන් එවැනි ටෙන්ඩර් මණ්ඩල 259 ක් සහ එවැනි මිලදී ගැනීම් හා සම්බන්ධ තාක්ෂණික ඇගයීම් කමිටු 57 කට සහභාගි වී ඇත.

# 12. මූල්‍ය බුද්ධි ඒකකය

මූල්‍ය බුද්ධි ඒකකය, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතට අනුව ස්වාධීන ව්‍යවස්ථාපිත අධිකාරියක් ලෙසින් 2006 වසරේ දී පිහිටුවන ලදී. මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත යටතේ මුදල් අමාත්‍යාංශය මගින් නිකුත් කරන ලද නියෝගයකට අනුව 2007 වර්ෂයේ මාර්තු මස සිට මූල්‍ය බුද්ධි ඒකකය පරිපාලනමය වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ දෙපාර්තමේන්තුවක් ලෙස ක්‍රියාත්මක වෙයි. මූල්‍ය බුද්ධි ඒකකයෙහි ප්‍රධාන කාර්යයන් අතරට මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම සහ මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ දක්වා ඇති නීත්‍යානුකූල නොවන අනෙකුත් ක්‍රියාවන්ට අදාළ විය හැකි සම්බන්ධතාවයන් අනාවරණය කර ගැනීම පිණිස මුදල් ගනුදෙනු පිළිබඳ තොරතුරු එක්රැස් කිරීම හා තොරතුරු ලබා ගැනීම, සැක කටයුතු ගනුදෙනු පිළිබඳ විශ්ලේෂණය කිරීම සහ වැඩිදුර විමර්ශන සඳහා නීතිය ක්‍රියාත්මක කරන ආයතන වෙත එම විශ්ලේෂණයන්ට අදාළ

විස්තර හා තොරතුරු ලබාදීම ඇතුළත් වේ. තවද, 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත සහ 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත යටතේ ද මූල්‍ය බුද්ධි ඒකකය සිය කටයුතු ක්‍රියාත්මක කරනු ලබයි.

## 12.1 තොරතුරු එක්රැස් කිරීම, විශ්ලේෂණය කිරීම සහ තොරතුරු බෙදා හැරීම

මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම පිළිබඳව මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කිරීම පහසු කිරීම පිණිස විශේෂයෙන් හඳුන්වා දී ඇති "ලංකාෆින්" (LankaFIN) මාර්ගගත දත්ත පද්ධතිය හරහා මූල්‍ය ආයතන මගින් සැක කටයුතු ගනුදෙනු වාර්තා සහ මුදල් ගනුදෙනු පිළිබඳ තොරතුරු මූල්‍ය බුද්ධි ඒකකය වෙත ලැබේ. බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, බලපත්‍රලාභී මූල්‍ය සමාගම්, කොටස් තැරැව්කරුවන්, මුදල් හෝ මූල්‍ය වටිනාකම් හුවමාරු කිරීමේ සේවා සපයන ආයතන සහ රක්ෂණ සමාගම් විසින් රුපියල් මිලියනයක් හා ඊට වැඩි මුදල් ගනුදෙනු සහ විද්‍යුත් මුදල් ප්‍රේෂණ ගනුදෙනු හෝ ඒ හා සමාන අගයකින් යුතු විදේශීය ව්‍යවහාර මුදල් ගනුදෙනු (දේශීය සහ විදේශීය) මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කිරීම නොකඩවා සිදු කරගෙන යන ලදී. මීට අමතරව මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතෙහි 7 වන වගන්තියට අනුව සැක කටයුතු ගනුදෙනු වාර්තාවන් ද මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කරන ලදී. ඒ අනුව, 2016 වසර තුළ දී මිලියන 9.07 කට වඩා වැඩි මුදල් ගනුදෙනු සහ මුදල් ප්‍රේෂණ සංඛ්‍යාවක් ද, සැක කටයුතු ගනුදෙනු 759 ක් ද වාර්තා කර ඇත. තවද, බලයලත් විදේශ මුදල් හුවමාරුකරන්නන් ද එම ක්ෂේත්‍රය අධීක්ෂණය සහ නියාමනය කරනු ලබන විනිමය පාලකවරයා හරහා රුපියල් මිලියනයක් සහ ඊට වැඩි වන අගයකින් යුතු මුදල් ගනුදෙනු මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කරන ලදී. මූල්‍ය බුද්ධි ඒකකය, 2016 වසර තුළ දී නීතිය ක්‍රියාත්මක කරන ආයතන සහ නියාමන අධිකාරීන් වෙත සැක කටයුතු ගනුදෙනු වාර්තා 436 ක් යොමු කරන ලදී.

## 12.2 වාර්තාකරණ ආයතන නියාමනය කිරීම

2016 අංක 01 දරන මූල්‍ය ආයතන ගනුදෙනුකරුවන් පිළිබඳව නිසි උද්යෝගයෙන් කටයුතු කිරීමේ රීතීන් 2016 ජනවාරි 27 වන දින නිකුත් කිරීමත් සමඟ සෑම මූල්‍ය ආයතනයක්ම එහි ගනුදෙනුකරුවන්, මූල්‍ය ආයතනයන්හි මූල්‍යමය සැපයුම් හා සේවාවන් සහ ඒවා සැපයීමේ ක්‍රම ආදියට අදාළව මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම පිළිබඳව අවදානම හඳුනා ගැනීමට, තක්සේරු කිරීමට සහ කළමනාකරණය කිරීමට සුදුසු පියවර ගත යුතු අතර අවදානම් පදනම් කරගත් ප්‍රවේශයට අනුව ගනුදෙනුකරු පිළිබඳව නිසි උද්යෝගයෙන් කටයුතු කළ යුතු වේ. 2016 වසරේ දී මූල්‍ය බුද්ධි ඒකකය විසින් අවදානම් පදනම් කරගත් ප්‍රවේශයට අනුව මූල්‍ය ආයතනයන් මූලික ඇගයීමකට ලක් කළ අතර, මෙහිදී එක් එක් ආයතනයට අනන්‍ය වූ අවදානම් සහ අවදානම් අවම කිරීමේ ක්‍රියාවලීන් සැලකිල්ලට ගැනිණි. මෙම ඇගයීමේ දී හඳුනාගත් අවදානම් මට්ටම පදනම් කරගනිමින් මූල්‍ය ආයතන කාණ්ඩ තුනකට වර්ගීකරණය කළ අතර, 2016 වසර තුළ දී අවදානම් පදනම් කරගත් ප්‍රවේශයට අනුව විමර්ශන 13 ක් පවත්වන ලදී.

## 12.3 දේශීය සහ විදේශීය සහයෝගීතාවය

### අවබෝධතා ගිවිසුම්

2016 වර්ෂය තුළ දී විමර්ශනයන් සඳහා තොරතුරු හුවමාරු කර ගැනීමේ/ලබා ගැනීමේ අරමුණ ඇතිව දේශීය වශයෙන් අවබෝධතා ගිවිසුම් දෙකක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සහ ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සමඟ අත්සන් කළ අතර, විදේශීය වශයෙන් අවබෝධතා ගිවිසුම් 4 ක් පැනමා රාජ්‍යය, යුක්රේනය, ඊශ්‍රායලය සහ සිංගප්පූරුව යන රටවල මූල්‍ය බුද්ධි ඒකකයන් සමඟ අත්සන් කරන ලදී. ඒ අනුව, 2016 වර්ෂය අවසන් වන විට දී මූල්‍ය බුද්ධි ඒකකය සිය විදේශීය පාර්ශවයන් සහ දේශීය නියෝජිත ආයතන සමඟ අත්සන් තබා ඇති මුළු අවබෝධතා ගිවිසුම් සංඛ්‍යාව පිළිවෙළින් 32 ක් හා 3 ක් වේ.

### එග්මොන්ට් කණ්ඩායම (EGMONT Group)

විමර්ශන පවත්වාගෙන යෑමේ දී අවශ්‍ය තොරතුරු හුවමාරු කර ගැනීම පිණිස මූල්‍ය බුද්ධි ඒකක 152 කින් සමන්විතව පිහිටුවා ඇති එග්මොන්ට් කණ්ඩායමේ සහාය මූල්‍ය බුද්ධි ඒකකය විසින් ලබා ගන්නා ලද අතර සාමාජික රටවල විමර්ශන කටයුතු සඳහා බුද්ධිමය තොරතුරු එක්රැස් කිරීමට ද සහාය දෙන ලදී. 2016 වසර තුළ දී මූල්‍ය බුද්ධි ඒකකය විසින් අවස්ථා 62 ක දී විදේශීය මූල්‍ය බුද්ධි ඒකක සමඟ තොරතුරු හුවමාරු කරගෙන ඇත. තවද, පෙබරවාරි මාසයේ මොනාකෝහි දී පවත්වන ලද එග්මොන්ට් කණ්ඩායම් රැස්වීමට සහ සැප්තැම්බර් මාසයේ දී කටාර්හි දී පවත්වන ලද එග්මොන්ට් කණ්ඩායමේ ප්‍රතිපත්ති සහ කාර්ය පටිපාටි පිළිබඳ ක්‍රියාකාරකම් කණ්ඩායම් කමිටු රැස්වීම් සඳහා මූල්‍ය බුද්ධි ඒකකයේ නිලධාරීන් සහභාගි විය.

### මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායම (Asia Pacific Group on Money Laundering)

ශ්‍රී ලංකාව, මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායමේ (APG) ආරම්භක සාමාජිකයෙකි. ශ්‍රී ලංකාව නියෝජනය කරමින් මූල්‍ය බුද්ධි ඒකකය සහ අදාළ තවත් පාර්ශව 2016 සැප්තැම්බර් මස ඇමරිකා එක්සත් ජනපදයේ සැන්ඩියාගෝ (San Diego) හි පැවති 19 වන වාර්ෂික රැස්වීමට සහ 2016 නොවැම්බර් මස සවුදි අරාබියේ ජෙඩා නුවර දී (Jeddah) පැවති මුදල් විශුද්ධිකරණ උපාය මාර්ග පිළිබඳ 19 වන වැඩමුළුවට ද සහභාගී වූහ.

### බහු ආංශික තාක්ෂණික සහ ආර්ථික සහයෝගීතාවය උදෙසා වන බෙංගාල බොක්කේ රටවල මූලිකත්වය (BIMSTEC)

බහු ආංශික තාක්ෂණික සහ ආර්ථික සහයෝගීතාවය උදෙසා වන බෙංගාල බොක්කේ රටවල මූලිකත්වය (BIMSTEC) සංවිධානයේ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ අනු කාරක සභාවේ 8 වන උප කණ්ඩායම් සැසි වාරය

2016 මාර්තු 16-17 යන දෙදින තුළ මූල්‍ය බුද්ධි ඒකකයේ අනුග්‍රාහකත්වයෙන් කොළඹ දී පවත්වන්නට යෙදුණු අතර එහි සම සභාපතීත්වය ද මූල්‍ය බුද්ධි ඒකකය විසින් දරන ලදී. BIMSTEC රටවල් නියෝජනය කරමින් නියෝජිතයන් 35 දෙනෙක් මෙම සමුළුවට සහභාගි විය.

### 12.4 ආයතනික හැකියාවන් ප්‍රවර්ධනය කිරීම සහ දැනුම්වත් කිරීමේ වැඩසටහන්

මුදල් විශුද්ධිකරණයට සහ ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීමේ කටයුතුවලට අදාළ ගනුදෙනු හඳුනා ගැනීම, විශ්ලේෂණය කිරීම සහ වාර්තා කිරීම සම්බන්ධයෙන් ඇති දැනුම්වත්භාවය ඉහළ නැංවීමේ අරමුණින් බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, බලපත්‍රලාභී මුදල් සමාගම් සහ මුදල් හෝ මූල්‍ය වටිනාකම් හුවමාරු කිරීමේ සේවා සපයන ආයතන නියෝජනය කරන නිලධාරීන් 1,600 කට දැනුම්වත් කිරීමේ වැඩසටහන්/පුහුණු වැඩමුළු 28 ක් මෙම වසර තුළ දී පවත්වන ලදී. තවද, වෘත්තීමය වශයෙන් හැකියාවන් වර්ධනය කිරීමට සහ වර්තමානයේ මෙන්ම ඉදිරියේ දී ඇති විය හැකි නියාමන ගැටලු හා මූල්‍ය බුද්ධි තොරතුරු සම්බන්ධ ගැටලු පිළිබඳව දැනුම හුවමාරු කර ගැනීම සඳහා බංග්ලාදේශය සහ මාලදිවයින් නිලධාරීන් සඳහා විශේෂිත අධ්‍යයන වැඩසටහන් දෙකක් ද 2016 වසරේ දී මූල්‍ය බුද්ධි ඒකකය විසින් පවත්වන ලදී. මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීම සඳහා වාර්ෂික සමුළුව, බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම්වල අනුකූලතා කටයුතුවලට අදාළ නිලධාරීන් 123 ක් සඳහා දේශීය මෙන්ම විදේශීය සම්පත් දායකයන්ගේ සහයෝගය ඇතිව 2016 දෙසැම්බර් මාසයේ දී පවත්වන ලදී.

### 12.5 අන්‍යෝන්‍ය ඇගයීම සහ පසු විපරම් ක්‍රියාවලිය

මූල්‍ය කාර්ය සාධක බලකායේ (FATF) සංශෝධිත නිර්දේශයන්ට අනුව මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායම (APG) විසින් 2014/15 කාලපරිච්ඡේදය තුළ දී ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් තුන්වන වටයේ අන්‍යෝන්‍ය ඇගයීම පවත්වන ලදී. ජාත්‍යන්තර වශයෙන් පිළිගත් මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීමේ සම්මතයන්ට ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීමේ සම්මතයන් කොතරම් දුරට අනුකූල වේදැයි තහවුරු කිරීම මෙහි අරමුණයි. මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායම (APG) විසින් 2015 සැප්තැම්බර් මාසයේ දී නිකුත් කළ අන්‍යෝන්‍ය ඇගයීම් වාර්තාවට අනුව "කඩිනම් සහ පුළුල් පසු විපරම් ක්‍රියාවලිය" (Expedite Enhanced Follow-Up) යටතේ පියවර රැසක් ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකාවට නිර්දේශ කර ඇත. අන්‍යෝන්‍ය ඇගයීම් වාර්තාව මගින් හඳුනාගත් අඩුපාඩු මගහරවා ගැනීම සඳහා පහත සඳහන් ප්‍රධාන පියවරයන් මූල්‍ය බුද්ධි ඒකකය විසින් හඳුන්වා දී ඇත.

(අ) 2015-2020 සඳහා වන මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීම සඳහා වන ජාතික ප්‍රතිපත්තිය අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සහිතව ක්‍රියාවට නැංවීම.

(ආ) අන්‍යෝන්‍ය ඇගයීම් පදනම් කරගෙන අදාළ ආයතනවල අදහස් විමසීමකින් පසුව එක් එක් ආයතනන සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම සහ එය ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම.

(ඇ) මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත සහ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත්වලට අදාළ සංශෝධනයන් නිර්දේශ කිරීම සඳහා නීති සමාලෝචන කමිටුව නැවත පිහිටුවීම.

(ඈ) 2006 අංක 06 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනතින් අර්ථ දැක්වෙන පරිදි, මූල්‍ය ව්‍යාපාරවල යෙදෙන සියලුම ආයතනයන් ආවරණය වන ලෙස 2016 අංක 01 දරන ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් කටයුතු කිරීමේ රීති නිකුත් කිරීම.

(ඉ) මූල්‍ය ක්ෂේත්‍රය සහ නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීමය ක්ෂේත්‍රයන් සඳහා ගනුදෙනුකරු පිළිබඳව සුපරීක්ෂාකාරී වීමට අදාළ රීතීන් සම්පාදනය කිරීම.

(ඊ) මූල්‍ය අංශය සඳහා වූ අවදානම ඇගයීම සහ අවදානම මත පදනම් වූ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීමේ අධීක්ෂණ ක්‍රමවේදය හඳුන්වා දීම.

## 13. මානව සම්පත්


2016 වසර තුළ දී, මානව සම්පත් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු ඉටු කර ගැනීම උදෙසා දායක විය හැකි ඉහළ ඵලදායීතාවයකින් යුත්, අභිප්‍රේරිත හා කාර්යශූර සේවක පිරිසක් මහ බැංකුව තුළ බිහි කිරීම අරමුණු කොට ගෙන, සේවක අභිප්‍රේරණය, නව සේවකයන් බඳවා ගැනීම, කාර්යසාධන කළමනාකරණය, උසස්වීම් ලබා දීම, සේවකයන් දෙපාර්තමේන්තු අතර ස්ථානගත කිරීම සහ සේවක ගැටලු කළමනාකරණය වැනි කටයුතුවල අඛණ්ඩව නියැළිණි. තවද, මහ බැංකුව තුළ කාර්මික සාමය පවත්වා ගැනීම සහ බැංකුවේ සමස්ත ඵලදායිතාවය ඉහළ නංවා ගැනීම උදෙසා මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් මහ බැංකු කළමනාකාරිත්වය, කාර්ය මණ්ඩල සහ වෘත්තීය සමිති සමග සුහද සබඳතා පවත්වා ගැනීමට කටයුතු කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ මානව සම්පත් ව්‍යුහය සහ 2016 වසර තුළ දී මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද කාර්යයන් පිළිබඳ සාරාංශයක් පහත පහත දැක්වේ.

### 13.1 මානව සම්පත් ව්‍යුහය


(අ) 2016 දෙසැම්බර් මස අවසානය වන විට ශ්‍රී ලංකා මහ බැංකුවේ සමස්ත සේවක සංඛ්‍යාව 1,471 ක් වූ අතර, එය මාණ්ඩලික පන්තියේ නිලධාරීන් 671 කින්, මාණ්ඩලික නොවන පන්තියේ නිලධාරීන් 640 කින් හා සුළු සේවක කාර්ය මණ්ඩලය 160 කින් සමන්විත විය. කාර්ය මණ්ඩලයේ සංයුතිය පන්ති අනුව, ස්ත්‍රී-පුරුෂ භාවය අනුව සහ වයස අනුව පහත රූප සටහන් මගින් දක්වා ඇත.

**II-6 රූප සටහන**
**2016 දෙසැම්බර් 31 දිනට සේවක සංයුතිය**


(අ) සේවක සංයුතිය: පන්ති අනුව




(ආ) සේවක සංයුතිය: ස්ත්‍රී/පුරුෂ භාවය අනුව




(ඇ) වයස අනුව සේවක සංයුතිය




## 13.2 සේවා නියුක්තිකයන්ගේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්

2016 වසරේ දී, මාණ්ඩලික පන්තියේ හා මාණ්ඩලික නොවන පන්තියේ කාර්ය මණ්ඩල විවිධ හැකියාවන්ගෙන් යුක්ත වූ සේවා නියුක්තිකයින් පිරිසකගෙන් සමන්විත වන ලෙස පවත්වා ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුවට හැකි වී ඇත. 2016 වසර අවසානය වන විට ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවා නියුක්තිකයන්ගේ අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් පිළිබඳ තොරතුරු පහත සංඛ්‍යා සටහන II-19 හි දැක්වේ.

## 13.3 මානව සම්පත් කළමනාකරණය

(අ) බඳවා ගැනීම

මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් මෙම වසර තුළ දී ආරක්ෂක දෙපාර්තමේන්තුවට කොන්ත්‍රාත් පදනම මත අධ්‍යක්ෂවරයෙක්, බැංකු සහායකයින් (පුහුණු) 79 ක් හා කළමනාකරණ අභ්‍යාසලාභීන් 53 ක් බඳවා ගන්නා ලදී. කළමනාකරණ අභ්‍යාසලාභීන් 53 දෙනා අතරින් 42 ක් බාහිර අයදුම්කරුවන් වූ අතර, 11 දෙනෙකු අභ්‍යන්තර අයදුම්කරුවන් විය.

(ආ) කාර්යසාධන කළමනාකරණය

ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යසාධන කළමනාකරණ ක්‍රියාවලිය ප්‍රධාන පියවර 4 කින් සමන්විත වේ. එනම්, සේවකයන්ගේ රැකියා පිරිවිතර සකස් කිරීම හා සමාලෝචනය කිරීම, එක් එක් සේවකයාගේ රැකියා ඉලක්ක පිහිටුවීම, සේවකයන්ගේ කාර්යසාධන නිරීක්ෂණය හා කාර්යසාධනය ඇගැයීමයි. කාර්යසාධනය ඇගැයීම් ක්‍රියාවලිය යටතේ එක් එක් සේවකයාගේ කාර්යසාධන මට්ටම, කාර්යසාධන ඇගැයීම් ආකෘතියේ දක්වා ඇති පරිදි සාමාන්‍ය හා තාක්ෂණික නිපුණතා මට්ටම්වලට සුදුසු අගයන් ලබා දෙමින් අගයනු ලැබේ. අවසාන කාර්යසාධන මට්ටම්, සේවක උසස්වීම් පටිපාටියේ එක් සංරචකයක් ලෙස යොදා ගැනේ.

මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් සේවක කාර්යසාධන ඇගයීම් සැලසුම් කළ පරිදි, වර්ෂය තුළ දී ක්‍රියාත්මක කරන ලදී. තවද, මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් මධ්‍ය වාර්ෂික කාර්යසාධන සමාලෝචන ක්‍රියාවලිය හා 2016 වර්ෂය සඳහා සේවකයන්ගේ රැකියා ඉලක්ක ලබා ගැනීම ද සිදු කරන ලදී.

(ඇ) උසස්වීම්

2016 වසර තුළ දී එක් සහකාර අධිපතිවරයෙකු නියෝජ්‍ය අධිපතිවරයෙකු ලෙසටත්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් 5 දෙනෙකු සහකාර අධිපතිවරුන් ලෙසටත්, නියෝජ්‍ය දෙපාර්තමේන්තු ප්‍රධානීන් 20 දෙනෙකු අතිරේක දෙපාර්තමේන්තු ප්‍රධානීන් ලෙසටත් උසස්වීම් ලබා දෙන ලදී. ශ්‍රී ලංකා මහ බැංකු උසස් කිරීම් පටිපාටිය යටතේ සේවකයන් 50 දෙනෙකුට ශ්‍රේණි උසස්වීම් ලබාදීමට 2016 වසර තුළ දී කටයුතු කරන ලදී. ඒ අනුව, මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන් 19 දෙනෙකු හා මාණ්ඩලික නොවන ශ්‍රේණියේ නිලධාරීන් 31 දෙනෙකු සඳහා අදාළ උසස්වීම් පටිපාටියට අනුගතව උසස්වීම් ලබා දෙන ලදී. තවද, මෙම වර්ෂය තුළ දී මාණ්ඩලික නොවන පන්තියේ නිලධාරීන් 32 ක් මාණ්ඩලික පන්තියට උසස් කරන ලදී.

(ඈ) සේවකයන් දෙපාර්තමේන්තු අතර ස්ථානගත කිරීම

මහ බැංකුවේ විවිධ ක්ෂේත්‍රයන්හි අත්දැකීම් ලබා ගැනීමට අවස්ථාව සලසා දීමේ අරමුණින් යුක්තව, ශ්‍රී ලංකා මහ බැංකුව සිය සේවකයන් දෙපාර්තමේන්තු අතර ස්ථානගත කිරීමේ ක්‍රියාවලියක් වාර්ෂිකව ක්‍රියාත්මක කරනු ලබයි. ඒ යටතේ, 2016 වසරේ දී මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් මාණ්ඩලික නිලධාරීන් 19 ක් හා මාණ්ඩලික නොවන නිලධාරීන් 31 ක් 2017 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි දෙපාර්තමේන්තු අතර ස්ථානගත කිරීමට කටයුතු කරන ලදී.

**II-19 සංඛ්‍යා සටහන**

**2016.12.31 දිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවා නියුක්තිකයන්ගේ අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම්**

| කාණ්ඩ | අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් | | | | | |
|---|---|---|---|---|---|---|
| | පශ්චාත් උපාධි, ප්‍රථම උපාධි හා වෘත්තීය සුදුසුකම් | පශ්චාත් උපාධි හා ප්‍රථම උපාධි | පශ්චාත් උපාධි හා වෘත්තීය සුදුසුකම් | ප්‍රථම උපාධි හා වෘත්තීය සුදුසුකම් | ප්‍රථම උපාධි | වෘත්තීය සුදුසුකම් |
| මාණ්ඩලික පන්තිය | *123 | **135 | 14 | 127 | 122 | 75 |
| මාණ්ඩලික නොවන පන්තිය | 15 | 8 | 11 | 33 | 33 | 78 |
| **එකතුව** | **138** | **143** | **25** | **160** | **155** | **153** |

* ආචාර්ය උපාධිධාරීන් 5 දෙනා මෙහි ඇතුළත් වේ.

** ආචාර්ය උපාධිධාරීන් 8 දෙනා මෙහි ඇතුළත් වේ.

**(ඉ) සේවා සේවක සබඳතා**

කාර්මික සාමය ආරක්ෂා කර ගැනීම සඳහා පහසුකම් සලසන්නාගේ කාර්යභාරය සාර්ථක ලෙස අඛණ්ඩව පවත්වා ගෙන යමින්, මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින්, 2016 දී කළමනාකාරිත්වය සහ වෘත්තීය සමිති අතර සාකච්ඡා වට කිහිපයක් පවත්වන ලදී.

**(ඊ) සේවක ගැටලු කළමනාකරණය**

2016 වසරේ දී මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් මහ බැංකු සේවකයන්ගේ සහ විශ්‍රාමිකයන්ගේ ගැටලු සඳහා සහන ලබා දීමට සුදුසු ක්‍රියාමාර්ග ගන්නා ලදී.

## 13.4 නව දෙපාර්තමේන්තු/ප්‍රාදේශීය කාර්යාල පිහිටුවීම

(අ) සේවක අර්ථසාධක අරමුදල් කටයුතු සඳහා පහසුකම් සැලසීම සහ ප්‍රදේශයේ ප්‍රාදේශීය සංවර්ධන කටයුතු වැඩි දියුණු කිරීමේ අරමුණින් නව ප්‍රාදේශීය කාර්යාලයක් නුවරඑළිය ප්‍රදේශයේ පිහිටුවන ලදී.

(ආ) බස්නාහිර, දකුණ, උඩරට, උතුරු මැද හා වයඹ සහ උතුරු හා නැගෙනහිර යන ප්‍රාදේශීය මට්ටමේ දෙපාර්තමේන්තු 5 ක් ඒකාබද්ධ කරමින් බැංකුවේ විවිධ දෙපාර්තමේන්තු, රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සමග ප්‍රාදේශීය කාර්යාලවල සම්බන්ධීකරණය ශක්තිමත් කරන අතරතුර ප්‍රාදේශීය කාර්යාලවල කළමනකරණ හා අධීක්ෂණ කටයුතු මගින් ප්‍රාදේශීය මට්ටමේ ආර්ථික වර්ධනය කඩිනම් කිරීම සඳහා 2016 නොවම්බර් 21 දින සිට බලපැවැත්වෙන පරිදි ප්‍රාදේශීය කාර්යාල කළමනාකරණ දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී.

## 13.5 දෙපාර්තමේන්තු නැවත නම් කිරීම

2016 ඔක්තෝබර් 14 වන දින සිට මූල්‍ය අංශ පර්යේෂණ දෙපාර්තමේන්තුව, සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව ලෙස නම් කරන ලදී.

## 13.6 2016 වසර තුළ අධිපතිවරයා විසින් විදේශයන්හි සහභාගි වූ රුස්වීම්

**ලක්ෂ්මන් අර්ජුන මහේන්ද්‍රන් මහතා (2016 ජනවාරි 01 සිට ජුනි 30 දක්වා)**

1. ගරු අගමැතිතුමාගේ නියෝජිත මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස සහභාගි වූ, 2016 ජනවාරි මාසයේ ස්විස්ටර්ලන්තයේ, දාවෝස් හි දී පැවති ලෝක ආර්ථික සමුළුවේ 46 වන වාර්ෂික රුස්වීම.
2. 2016 පෙබරවාරි මාසයේ දී ප්‍රංශයේ පැරිස් හි දී ආර්ථික සහයෝගිතාව හා සංවර්ධනය සඳහා වූ සංවිධානයේ (OECD) මහ ලේකම් ඒන්ජල් ගුරියා මහතා සමග පැවති රුස්වීම.
3. 2016 පෙබරවාරි මාසයේ දී, චීන මහජන බැංකුවේ හා චීන මහජන සමූහාණ්ඩුවේ මූල්‍ය ආයතයන්හි නිලධාරීන් සමග පැවති රුස්වීම් හා සාකච්ඡා සඳහා ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ප්‍රධාන විධායක නිලධාරීන්ගේ නියෝජිත මණ්ඩලයේ ප්‍රධානත්වය දැරීම හා ඇගයීම් උපදේශකවරුන් සමග සිංගප්පූරුවේ දී පැවති රුස්වීම්.
4. 2016 මාර්තු මාසයේ දී, දිල්ලිහි දී පැවති ආසියාවේ ප්‍රගමනය උදෙසා වන ඉහළ මට්ටමේ සමුළුව (High-Level Conference Advancing Asia) සහ සිංගප්පූරුවේ දී පැවති ශ්‍රී ලංකා ආයෝජක සමුළුව (Sri Lanka Investment Summit, Finance Asia)
5. 2016 අප්‍රේල් මාසයේ දී ගරු අග්‍රාමාත්‍යතුමාගේ නියෝජිත මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස සහභාගි වූ චීන මහජන සමූහාණ්ඩුවේ දී පැවති රුස්වීම්.
6. 2016 අප්‍රේල් මාසයේ දී, වොෂින්ටන්හි දී පැවති ජාත්‍යන්තර මූල්‍ය අරමුදල/ලෝක බැංකුවේ වසන්ත සෘතු රුස්වීම් සහ නිව්යෝර්ක්, බෝස්ටන්, සැන් ෆ්‍රැන්සිස්කෝ සහ ලොස් ඇන්ජලීස්හි දී ආයෝජකයන් සමග පවත්වන ලද රුස්වීම්.
7. 2016 අප්‍රේල් සහ මැයි මාසවල දී හොංකොං සහ සිංගප්පූරුවේ ආයෝජකයන් සමග පැවති රුස්වීම්.
8. 2016 අප්‍රේල් සහ මැයි මාසවල දී සිංගප්පූරුවේ ආයෝජකයන් සමග පැවති රුස්වීම්.

9. 2016 මැයි මාසයේ දී, මුම්බායි නුවර පැවති SAARCFINANCE අධිපතිවරුන්ගේ 32 වන රැස්වීම සහ SAARCFINANCE අධිපතිවරුන්ගේ සම්මේලනය.

**ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතා (2016 ජූලි 03 සිට දෙසැම්බර් 31 දක්වා)**

1. 2016 අගෝස්තු මාසයේ පාකිස්ථානයේ ඉස්ලාමාබාද් නුවර දී පැවති SAARCFINANCE අමාත්‍යවරුන්ගේ 8 වන රැස්වීම.
2. 2016 ඔක්තෝබර් මාසයේ වොෂින්ටන්හි දී පැවති ජාත්‍යන්තර මූල්‍ය අරමුදල/ලෝක බැංකුවේ වාර්ෂික රැස්වීම.

## 13.7 උසස් කිරීම් / පත්කිරීම්

1. සහකාර අධිපති, එස්. ලංකාතිලක මහතා නියෝජ්‍ය අධිපතිවරයෙකු ලෙස 2016 ජනවාරි 24 දින සිට පත් කරන ලදී.
2. මාණ්ඩලික පන්තියේ විශේෂ ශ්‍රේණිය සඳහා උසස් කිරීම් හා පත් කිරීම් පහත පරිදි සිදු කරන ලදී.
   - i. කේ. සරවනමුත්තු මෙනවිය 2016 අප්‍රේල් 05 දින සිට සහකාර අධිපතිවරයෙකු වශයෙන් පත් කරන ලදී.
   - ii. ඊ. ඒ. හෙට්ටිආරච්චි මහතා 2016 අප්‍රේල් 05 දින සිට සහකාර අධිපතිවරයෙකු වශයෙන් පත් කරන ලදී.
   - iii. ආර්. ඒ. ඒ. ජයලත් මහතා 2016 අප්‍රේල් 16 දින සිට සහකාර අධිපතිවරයෙකු වශයෙන් පත් කරන ලදී.
   - iv. කේ. එම්. එම්. සිරිවර්ධන මහතා 2016 ජුනි 12 දින සිට සහකාර අධිපතිවරයෙකු වශයෙන් පත් කරන ලදී.
   - v. එස්. ජේ. ඒ. හඳගම මහතා මහතා 2016 ජුනි 18 දින සිට සහකාර අධිපතිවරයෙකු වශයෙන් පත් කරන ලදී.
3. 2016 සැප්තැම්බර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් නිලධාරීන් මාණ්ඩලික පන්තියේ IV වන ශ්‍රේණියට උසස් කිරීම් හා පත්කිරීම් සිදු කරන ලදී.
   - i. එස්. ආර්. සුමනසේකර මහතා ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.
   - ii. එම්. විතාන මහතා සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක අධිකාරී ලෙස පත් කරන ලදී.
   - iii. යූ. එල්. තිලකරත්න මහතා ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේනතුවේ වැඩ බලන අතිරේක අධ්‍යක්‍ෂ ලෙස පත් කරන ලදී.
   - iv. ඒ. ඒ. චන්ද්‍රසේන මහතා අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.
   - v. එම්. ආර්. එම්. අබේරත්න මහතා බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.
   - vi. සී. ඒ. අබේසිංහ මහතා දේශීය මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.
   - vii. ඩී. එම්. ඩී. බී. දිසානායක මහතා බැංකු විදු පියසෙහි වැඩ බලන අතිරේක අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.
   - viii. ආර්. ඩී. ඩබ්. පල්ලේගම මහතා බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.
   - ix. ඩබ්. රණවීර මහතා බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.
   - x. කේ. ජී. ආර්. කේ. ධීරසිංහ මෙනවිය කාර්ය මණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.
   - xi. ජේ. පී. ගමලත් මහතා ජාත්‍යන්තර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.
   - xii. සී. පී. එස්. බණ්ඩාර මහතා රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක අධිකාරී ලෙස පත් කරන ලදී.
   - xiii. ඒ. එම්. ගුණතිලක මහතා සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක අධිකාරී ලෙස පත් කරන ලදී.
   - xiv. ඩබ්. ඒ. දිල්රුක්ෂිනී මහත්මිය ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.
   - xv. මුදල් අමාත්‍යාංශය වෙත මුදා හැර සිටි ඩී. එස්. ඩබ්. සමරතුංග මහත්මිය වැඩ බලන අතිරේක අධ්‍යක්ෂවරියක ලෙස පත් කරන ලදී.
   - xvi. ජේ. ඩී. එස්. ජේ. නානායක්කාර මහතා සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක අධිකාරී ලෙස පත් කරන ලදී.
   - xvii. ආර්. ඩී. ටී. ගුණසේකර මහත්මිය රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක අධිකාරී ලෙස පත් කරන ලදී.

xviii. කේ. ජී. පී. සිරිකුමාර මහතා නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

xix. ආචාර්ය සී. අමරසේකර මහතා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

xx. මුදල් අමාත්‍යාංශය වෙත මුදා හැර සිටි ආචාර්ය පී. කේ. ජී. හරිස්චන්ද්‍ර මහතා වැඩ බලන අතිරේක අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කරන ලදී.

4. සන්නිවේදන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, ඒ. ඒ. එම්. තාසීම් පහතා 2016 ජනවාරි 05 දින සිට බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

5. බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ වැඩ බලන එස්. එච්. ගුණවර්ධන මෙනවිය 2016 ජනවාරි 05 දින සිට සන්නිවේදන දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

6. පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, ඊ. ඒ. හෙට්ටිආරච්චි මහතා 2016 පෙබරවාරි 03 දින සිට පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ රාජකාරි වලට අමතරව ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ ලෙස ද පත් කරන ලදී.

7. නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, පී. වී. එල්. නන්දසිරි මහතා 2016 අප්‍රේල් 12 දින සිට නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුවේ රාජකාරිවලට අමතරව ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ ලෙස ද පත් කරන ලදී.

8. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ඩී. කුමාරතුංග මහතා 2016 අප්‍රේල් 12 දින සිට ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

9. මූල්‍ය අංශ පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, එන්. ඩබ්. ජී. ආර්. ඩී. නානායක්කාර මහතා 2016 අප්‍රේල් 19 දින සිට මූල්‍ය අංශ පර්යේෂණ දෙපාර්තමේන්තුවේ රාජකාරිවලට අමතරව ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ ලෙස ද පත් කරන ලදී.

10. දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ එච්. බී. ඩී. කරුණාරත්න මහතා 2016 අප්‍රේල් 19 දින සිට පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

11. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ කේ. එන්. එන්. එම්. බණ්ඩාර මහත්මිය 2016 අප්‍රේල් 27 දින සිට සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධිකාරී ලෙස පත් කරන ලදී.

12. මානව සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, ඒ. එම්. එන්. ගුණවර්ධන මහතා 2016 ජූනි 23 දින සිට ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

13. පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, කේ. එම්. අබේකෝන් මහතා 2016 ජූනි 23 දින සිට මානව සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

14. ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ඩී. වී. එස්. දයාවංශ මහත්මිය 2016 ජූනි 23 දින සිට එම දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

15. බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ එස්. කේ. රණසිංහ මහතා 2016 ජූනි 23 දින සිට පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

16. මුදල් මණ්ඩලයේ නියෝජ්‍ය ලේකම් කේ. එම්. ඒ. එන්. දවුලගල මහත්මිය 2016 ජූනි 28 දින සිට දෙපාර්තමේන්තු මට්ටමේ ප්‍රාදේශීය කාර්යාලය - උතුරු මැද හා වයඹ පළාත් අධ්‍යක්ෂ ලෙසද, අනතුරුව 2016 ජූලි 07 දින සිට නැවතත් මුදල් මණ්ඩලයේ නියෝජ්‍ය ලේකම් ලෙසද පත් කරන ලදී.

17. දෙපාර්තමේන්තු මට්ටමේ ප්‍රාදේශීය කාර්යාලය - උඩරට හි අධ්‍යක්ෂ ඩී. එම්. රූපසිංහ මහතා එහි රාජකාරිවලට අමතරව 2016 ජූලි 07 දින සිට දෙපාර්තමේන්තු මට්ටමේ ප්‍රාදේශීය කාර්යාලය - උතුරු මැද හා වයඹ පළාත් වැඩ බලන අධ්‍යක්ෂ ලෙසද, අනතුරුව 2016 අගෝස්තු 05 දින සිට දෙපාර්තමේන්තු මට්ටමේ ප්‍රාදේශීය කාර්යාලය - දකුණු පළාත බැඩ බලන අධ්‍යක්ෂ ලෙස ද 2016 සැප්තැම්බර් 15 දින සිට දෙපාර්තමේන්තු මට්ටමේ ප්‍රාදේශීය කාර්යාලය - උතුරු හා නැගෙනහිර පළාත්හි වැඩ බලන අධ්‍යක්ෂ ලෙස ද පත් කරන ලදී.

18. දෙපාර්තමේන්තු මට්ටමේ ප්‍රාදේශීය කාර්යාලය - උතුරු හා නැගෙනහිර පළාත් හි අධ්‍යක්ෂ එම්. අයි. සුෆියාන් මහතා 2016 සැප්තැම්බර් 15 දින සිට මූල්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී ලෙස පත් කරන ලදී.

19. කාර්යමණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, බී. ඩබ්. ජිනසේන මහතා 2016 ඔක්තෝබර් 12 දින සිට කාර්යමණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුවේ රාජකාරිවලට අමතරව ලේකම් දෙපාර්තමේන්තුවේ බැඩ බලන ලේකම් ලෙස ද පත් කරන ලදී.

### 13.8 මුදා හරිනු ලැබ සිටි නිලධාරීන්

1. සහකාර අධිපති, එස්. ආර්. ආටිගල මහතා, නියෝජ්‍ය ලේකම් ලෙස මුදල් අමාත්‍යාංශය වෙත.

2. මාණ්ඩලික පංතියේ IV ශ්‍රේණියේ, එස්. ගුණරත්න මහත්මිය, විකල්ප විධායක අධ්‍යක්ෂ ලෙස ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත.

3. මාණ්ඩලික පංතියේ IV ශ්‍රේණියේ, ආචාර්ය ආර්. ඒ. පෙරේරා මහත්මිය, රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය වෙත.

4. මාණ්ඩලික පංතියේ IV ශ්‍රේණියේ, ඩී. එස්. ඩබ්. සමරතුංග මහත්මිය, මුදල් අමාත්‍යාංශය වෙත.
5. මාණ්ඩලික පංතියේ IV ශ්‍රේණියේ, ආචාර්ය පී. කේ. ජී. හරිස්චන්ද්‍ර මහතා, මුදල් අමාත්‍යාංශය වෙත.
6. මාණ්ඩලික පංතියේ III (1) ශ්‍රේණියේ, යූ. හෙට්ටිආරච්චි මහතා, නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත
7. මාණ්ඩලික පංතියේ II ශ්‍රේණියේ, ඒ. එදිරිසිංහ මහත්මිය මුදල් අමාත්‍යාංශය වෙත.
8. මාණ්ඩලික පංතියේ II ශ්‍රේණියේ, එස්. රත්නායක මහත්මිය, පරිපාලන සහකාර ලෙස ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත.
9. මාණ්ඩලික පංතියේ I ශ්‍රේණියේ, එන්. බී. ජනගන් මහතා, මුදල් අමාත්‍යාංශය වෙත.
10. රියදුරු, එස්. එන්. ඩබ්. කරුණාදාස මහතා, විදුලිබල හා පුනර්ජනනීය අමාත්‍යාංශය වෙත.

### 13.9 විශ්‍රාම ගැනීම්

1. නියෝජ්‍ය අධිපති, බී. ඩී. ඩබ්. ඒ. සිල්වා මහතා, 2016 ජනවාරි 24 දින සිට මහ බැංකු සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.
2. සහකාර අධිපති, සී. පී. ඒ. කරුණාතිලක මහතා 2016 අප්‍රේල් 16 දින සිට මහ බැංකු සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.
3. සහකාර අධිපති, ඊ. ඒ. හෙට්ටිආරච්චි මහතා 2016 මැයි 26 දින සිට මහ බැංකු සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.
4. සහකාර අධිපති, ආර්. ධීරසිංහ මහත්මිය 2016 ජුනි 12 දින සිට මහ බැංකු සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.
5. සහකාර අධිපති, ඩී. වසන්ත මහතා 2016 ජුනි 18 දින සිට මහ බැංකු සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.
6. ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, එච්. එම්. ඒකනායක මහතා 2016 මැයි 01 දින සිට මහ බැංකු සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.
7. ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, ආර්. ඒ. එස්. එම්. දයාරත්න මහත්මිය 2016 ජූලි 11 දින සිට මහ බැංකු සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.
8. දෙපාර්තමේන්තු මට්ටමේ ප්‍රාදේශීය කාර්යාලය - දකුණු පළාත හි අධ්‍යක්ෂ, එම්. ජේ. එස්. අබේසිංහ මහතා 2016 නොවැම්බර් 02 දින සිට මහ බැංකු සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.
9. මූල්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී, පී. ඒ. විජේරත්න මහතා 2016 දෙසැම්බර් 15 දින සිට මහ බැංකු සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.
10. සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක අධිකාරී, එම්. විතාන මහතා 2016 ඔක්තෝබර් 19 දින සිට මහ බැංකු සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.

## 14. තොරතුරු තාක්ෂණ

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා උසස් ප්‍රමිතියෙන් යුතු ඒකාබද්ධ මෘදුකාංග සපයමින් තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව එහි ක්‍රියාකාරී කාර්යභාරය අඛණ්ඩව සිදු කරන ලදී.

පසුගිය වසර තුළ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව ප්‍රධාන අංශ පහක් යටතේ සිය දායකත්වය සපයන ලදී.

(අ) පිරිවැය-ඵලදායී ව්‍යාපාර විසඳුම් ඉදිරිපත් කිරීම.

(ආ) තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් අඛණ්ඩව වැඩි දියුණු කිරීම.

(ඇ) ජාතික ගෙවීම් පද්ධතියේ යටිතල පහසුකම් වර්ධනය සඳහා දායකත්වය ලබා දීම.

(ඈ) තොරතුරු තාක්ෂණ ආරක්ෂාව හා ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම.

(ඉ) කාර්ය මණ්ඩලය අතර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිපුණතා සංවර්ධනය කිරීම.

**(අ) පිරිවැය ඵලදායී ව්‍යාපාර විසඳුම් ඉදිරිපත් කිරීම**

මහ බැංකුවේ ව්‍යාපාර ක්‍රියාවලි වැඩි දියුණු කිරීම සඳහා තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති 25 ක් තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නිම කළ අතර දැනට පවතින සියලු මෘදුකාංග නඩත්තු කිරීම සඳහා සහයෝගය ලබා දෙන ලදී. මෙහිදී, ව්‍යාපෘති 6 ක් ආර්ථික ප්‍රතිපත්ති උපදේශන ක්ෂේත්‍රයේ කාර්යයන් සඳහාත්, ව්‍යාපෘති 12 ක් මූල්‍ය අංශ නියාමන හා අධීක්ෂණ ක්ෂේත්‍රයේ කාර්යයන් සඳහාත්, ව්‍යාපෘති 7 ක් ශක්‍යතා දියුණු කිරීම් සහ පහසුකම් සැපයීම් ක්ෂේත්‍රයේ කාර්යයන් සඳහාත් සිදුකරන ලදී.

වර්ෂය තුළ දී සම්පූර්ණ කරන ලද ප්‍රධාන මෘදුකාංග පද්ධති පහත දැක්වේ.

i. අභ්‍යන්තර හා බාහිර පර්යේෂකයන්ගේ අවශ්‍යතා සඳහා පහසුකම් සැලසීමට පුළුල් පරාසයකින් යුතුව විවිධ දෙපාර්තමේන්තු මගින් නිකුත් කරන සමාජ හා ආර්ථික දත්ත, පොදු ආකෘතියකින් ලබා ගැනීමට හැකිවනසේ පොදු විද්‍යුත් පර්යේෂණ දත්ත ගබඩාවක් (Common Electronic Research Database ) නිර්මාණය කිරීම.

ii. වාණිජ බැංකු හා මුදල් ප්‍රවාහනය කිරීමේ සමාගම් සම්බන්ධ මුදල් තැන්පත් කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා තීරු කේත (Bar code) සහිත නව පද්ධතියක් ව්‍යවහාර මුදල් කළමනාකරණ දෙපාර්තමේන්තුවට හඳුන්වා දීම.

iii. සේවක නිවාඩු දත්ත ක්‍රමානුකූල සේ සකස් කිරීමට හා නිවාඩු අයදුම් කිරීමේ ක්‍රියාවලිය සරල කිරීමට ඉලෙක්ට්‍රොනික නිවාඩු කළමනාකරණ පද්ධතිය හඳුන්වා දීම.

iv. සේවක අර්ථසාධක අරමුදල් පද්ධතියේ ස්වයංක්‍රීය දායක මුදල් එකතු කිරීමේ අන්තර්ජාල විසඳුම වැඩිදියුණු කිරීම හරහා එම මොහොතේම ගෙවීම් සම්බන්ධ දත්ත වලංගු කිරීම මගින් දායක මුදල් එදිනම සාමාජික ගිණුමට බැර කිරීමට පහසුකම් සැපයීම.

v. මූල්‍ය දෙපාර්තමේන්තුවට සහ ලේකම් දෙපාර්තමේන්තුවට ගනුදෙනු කිරීමට හා අවශ්‍ය වාර්තා සැකසීමට හැකි පරිදි මහ බැංකු අර්ථ සාධක අරමුදල් පද්ධතිය සහ මහ බැංකු සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් පද්ධතිය නවීකරණය කිරීම.

**(ආ) තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් අඛණ්ඩව වැඩි දියුණු කිරීම**

මේ සම්බන්ධව පසුගිය වසර තුළ කරන ලද ක්‍රියාකාරකම් පහත දැක්වේ.

i. පෞද්ගලික පරිගණකවල ආරක්ෂාව සම්බන්ධ සැක සහිත සිදුවීම් හඳුනා ගැනීමට මයික්‍රොසොෆ්ට් සංකීර්ණ තර්ජන විශ්ලේෂණ මෘදුකාංගය (The Microsoft Advanced Threat Analytics Feature) ස්ථාපනය කිරීම.

ii. මහ බැංකු සේවකයන්ගේ රාජකාරි ලේඛනවල පිටපත් තබා ගැනීම සඳහා මධ්‍යගත ඩිජිටල් දත්ත සංචිත සැපයීම.

iii. දිගු කාලයක් ඊ-මේල් පණිවුඩ රඳවා ගැනීමට හා මධ්‍යගතව ඊ-මේල් පණිවුඩ සංරක්ෂණය කිරීම සඳහා ඊමේල් සේවා දායකය Microsoft Exchange 2016 දක්වා සංක්‍රමණය කිරීම.

iv. සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යාලයේ නැවත පිහිටුවීම සඳහා පහසුකම් සැලසීමට පරිගණක ජාලය ප්‍රතිව්‍යුහගත කිරීම.

**(ඇ) ජාතික ගෙවීම් පද්ධතියේ යටිතල පහසුකම් වර්ධනය සඳහා දායකත්වය ලබා දීම**

තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ජාතික වශයෙන් වැදගත්කමක් ඇති පහත දැක්වෙන ව්‍යාපෘති සඳහා අවශ්‍ය වන උපදේශනය සහ තාක්ෂණ දැනුම අඛණ්ඩව සපයන ලදී.

i. LankaSettle/LankaSecure මෘදුකාංග පද්ධතිය නවීකරණය (සංස්කරණ 3.7 සිට 3.8 දක්වා) මගින් වැඩි දියුණු කළ ව්‍යාපාර අංගයන් ඇතුළත් කිරීම සහ නව ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.

ii. මධ්‍යම ප්‍රතිපාර්ශව පද්ධතිය (Central Counter party Solution) සම්බන්ධ ඊ-වෙළෙඳ වේදිකාව (e-Trading platform) සහ බැඳුම්කර නිශ්කාශන ආයතනය ස්ථාපිත කිරීම සඳහා වන තාක්ෂණික ඇගයීම් කමිටුවල සේවය කිරීම.

iii. ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද ඊසි කෑෂ් (eZ Cash), එම් කෑෂ් (m cash) හා ගමනාගමන අරමුණු සඳහා පමණක් භාවිතා කළ හැකි මිල නියම කළ කාඩ්පත් පද්ධති (single purpose stored value travel card systems) අධීක්ෂණ සඳහා සහභාගී වීම.

**(ඈ) තොරතුරු තාක්ෂණ ආරක්ෂාව හා ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම**

තොරතුරුවල සුරක්ෂිතභාවය වැඩි දියුණු කොට, සිදු විය හැකි තර්ජන අවම කර ගැනීම සඳහා තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පසුගිය වසර තුළද පහත දැක්වෙන ක්‍රියාමාර්ග ගන්නා ලදී.

i. මෙහෙයුම් දෙපාර්තමේන්තුවල අඛණ්ඩ ව්‍යාපාර මෙහෙයුම් සඳහා පහසුකම් සැලසීමට නව ආපදා ප්‍රතිසාධන මධ්‍යස්ථානයක් (Disaster Recovery Site) ස්ථාපිත කිරීම.

ii. තොරතුරු ආරක්ෂණ පරීක්ෂණ කිරීම සඳහා විද්‍යාගාරයක් පිහිටුවීම.

iii. මහ බැංකුවේ තොරතුරුවල රහස්‍යභාවය සහතික කිරීමට තොරතුරු වර්ගීකරණ සහ ඩිජිටල් තොරතුරු හිමිකම් කළමනාකරණ මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීම. මෙහි මෙහෙයුම් 2017 දෙවන කාර්තුවේදී ආරම්භ වේ.

මීට අමතරව තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව මහ බැංකුවේ උපාය මාර්ගික ලෙස වැදගත් තොරතුරු පද්ධතිවල ආරක්ෂාව ඇගයීම සඳහා පහත දැක්වෙන ක්‍රියාමාර්ග ගන්නා ලදී.

i. අවදානම ඇගයීම (vulnerability assessments) සහ අවබෝධ පරීක්ෂණ (penetration tests) මගින් හඳුනාගත් අනාරක්ෂිත තත්ත්ව සඳහා ආරක්ෂණ ක්‍රමවේද යෙදීම.

ii. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව සහ බාහිර විගණකයන් කරන ලද ඉල්ලීම් මත තොරතුරු පද්ධති විගණනය සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.

**(ඉ) කාර්ය මණ්ඩලය අතර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිපුණතා සංවර්ධනය කිරීම.**

i. තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ දැනුම හා කුසලතා වැඩිදියුණු කිරීම පිණිස, එම නිලධාරීන්ට දේශීය හා විදේශ පුහුණු අවස්ථා ලබා දෙන ලදී. ඒ අනුව තොරතුරු, සයිබර් සහ පරිගණක ජාල ආරක්ෂාව, ගෙවීම් සහ පියවීම් පද්ධති, පාලනය සහ නායකත්වය සහ වින්ඩෝස් සර්වර් මානකරණය සහ පරිපාලනය (Windows Server Configuration Administration) යන මාතෘකා යටතේ නිලධාරීන් 47 දෙනෙක් දේශීය වශයෙන්ද, නිලධාරීන් 14 දෙනෙක් විදේශයන්හි ද කෙටි කාලීන පුහුණු වැඩසටහන් සඳහා සහභාගි වූහ.

ii. මහ බැංකුවේ සියලු සේවකයන්ගේ තොරතුරු තාක්ෂණ දැනුම වර්ධනය කිරීම සඳහා තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව ඊ-මේල් හා අභ්‍යන්තර වෙබ් අඩවිය මගින් දැනුවත් කිරීම් සහ අනතුරු ඇඟවීම් ප්‍රකාශයට පත් කරන ලදී.

# 15. අභ්‍යන්තර විගණන

ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙහෙයුම් සහ පාලන පරිසරය සහ සම්බන්ධිත කටයුතු පිළිබඳව ස්වාධීන සහ විෂය මූලික තහවුරු ලබාදීම මගින් සහ එම කටයුතු වැඩි දියුණු කර ගැනීම සඳහා නිර්දේශයන් ලබාදීමේ පරමාර්ථයෙන් අභ්‍යන්තර විගණන කටයුතු 1951 වසරේ සිට ක්‍රියාත්මක වේ. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ සහ කාර්ය මණ්ඩලයේ මෙහෙවර, කාර්ය වපසරිය, වගවීම, ස්වාධීනත්වය, වගකීම සහ අධිකාරී බලය 2016 වසරේ අවසන් වරට සංශෝධිත අභ්‍යන්තර විගණන අධිකාරි පත්‍රයේ අන්තර්ගතව ඇත. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව, ගෝලීය ප්‍රමිතීන් සහ ක්ෂේත්‍රයේ විශිෂ්ට පරිචයන්ට අනුකූලව විගණන කටයුතු සිදු කරන ලදී. 2016 වසර තුළ දී දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද කාර්යයන්හි සාරාංශයක් පහත දැක්වේ.

## 15.1 විගණන පැවරුම් ක්‍රියාත්මක කිරීම

(අ) 2016 වර්ෂය සඳහා වූ වාර්ෂික විගණන සැලැස්ම

වාර්ෂික විගණන සැලැස්ම සකස් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ යාවත්කාලීන කරන ලද විගණනයට භාජනය වියයුතු ක්‍රියාකාරකම් සමුදාය (Audit Universe) සැලකිල්ලට ගනු ලැබීය. මේ සඳහා යාවත්කාලීන කරන ලද දෙපාර්තමේන්තු මෙහෙයුම් අත්පොත්වල අන්තර්ගත ක්‍රියාකාරකම් ලැයිස්තුගත කර ඒවායේ අවදානම තක්සේරු කිරීමෙන් අවදානම් අධික කාර්යයන් ඇතුළත් වන සේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූලික පරමාර්ථ සහ ඊට අනුයාත පරමාර්ථයන්ට අදාළ කාර්යයන් සඳහා ප්‍රමුඛත්වය දෙමින්, නියෝජිත කාර්යයන් සහ වෙනත් කාර්යයන් ද ඇතුළත් වන පරිදි වාර්ෂික විගණන සැලැස්ම සකස් කරන ලදී. තවද, තොරතුරු පද්ධති විගණනයන් ද එකී සැලැස්මට ඇතුළත් විය. මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේ නිර්දේශ සහ මුදල් මණ්ඩලයේ අනුමැතිය සහිතව වාර්ෂික විගණන සැලැස්ම ක්‍රියාවට නංවන ලදී. මීට අමතරව, සුරක්ෂිතතාව තහවුරු කිරීම පිළිබඳ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ දූත මණ්ඩලය මගින් නිර්දේශිත තුන් අවුරුදු උපාය මාර්ගික විගණන සැලැස්ම සැකසීම සඳහා ද අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව අවශ්‍ය කටයුතු කරමින් 2018 - 2020 කාල පරිච්ඡේදය සඳහා වූ උපාය මාර්ගික විගණන සැලැස්ම මෙම වසරේදී පිළියෙල කරන ලදී.

(ආ) අභ්‍යන්තර විගණන ක්‍රියාපටිපාටිය

සෑම විගණන පැවරුමක්ම සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, සන්නිවේදනය කිරීම සහ නිරාකරණයට අදාළ කටයුතු කිරීම යන අදියර හතරකින් සිදු කරන ලදී. ක්‍රියාත්මක කිරීමේ අදියරේ දී විගණන තොරතුරු එක්රැස් කිරීම සහ ලේඛනගත කිරීම සිදු කරනු ලැබිණි. ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව විගණන ප්‍රතිඵල සන්නිවේදනය කිරීමේ දී පියවර හතරක් අනුගමනය කරන ලදී. එනම් විගණන නිරීක්ෂණ තහවුරු කර ගැනීම සඳහා නිමකිරීම් රැස්වීම් පැවැත්වීම, විගණන නිරීක්ෂණ ලිඛිතව දැනුම්දීම, විගණන කෙටුම්පත් වාර්තාව නිකුත් කිරීම සහ අවසන් විගණන වාර්තාව නිකුත් කිරීම වේ. තවද, දෙපාර්තමේන්තුවල ක්‍රියාවලි හිමිකරුවන් (Process Owners) විසින් එකඟ වූ විගණන නිර්දේශ ක්‍රියාත්මක කිරීම තහවුරු කර ගැනීම සඳහා පසු විපරම් විගණනයන් ද නියමිත කාල පරාසයන් තුළ දී සිදු කරන ලදී. සියලුම විගණන පැවරුම් අභ්‍යන්තර විගණකවරුන්ගේ ආයතනයේ (IIA) අන්තර්ජාතික වෘත්තීමය පරිචය රාමුවෙහි (IPPF) ප්‍රමිතීන්ට සහ තොරතුරු පද්ධති විගණන සහ පාලන ආයතනයේ (ISACA) මාර්ගෝපදේශයන්ට අනුකූලව සිදු කරනු ලැබීය.

අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් අනෙකුත් දෙපාර්තමේන්තු භාවිතා කරන පද්ධතීන් (තොරතුරු පද්ධති ඇතුළත්ව) සහ ඒවායේ අභ්‍යන්තර පාලනයන්ද, එක් එක් දෙපාර්තමේන්තු එහි අත්පොත්, ප්‍රතිපත්ති සහ පටිපාටිවලට දක්වන අනුකූලතාවයද විමර්ශනය කරන ලදී. ඒ හැරුණු කොට මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේ උපදෙස් පරිදි දෙපාර්තමේන්තු ගණනාවක ස්ථානීය විගණනයන් රැසක් ද අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. ඒ අනුව, දෙපාර්තමේන්තු රාශියක අභ්‍යන්තර පාලන දුර්වලතාවයන් සහ පද්ධතිවල අඩුලුහුඩුකම් පෙන්වා දෙමින් එම නිරීක්ෂණයන් සහ බැඳුණු අවදානම අවම කර ගැනීමට ගතයුතු ක්‍රියාමාර්ගයන් ද නිර්දේශ කරන ලදී. දෙපාර්තමේන්තුවල කාර්යයන්හි කාර්යක්ෂමතාව ඉහළ නංවාලීමටත් බැංකුව තුළ සිදුවිය හැකි වංචා, අපතේ යෑම් සහ සැළකිය යුතු මට්ටමේ අලාභ සිදුවීමේ අවදානම අවම කර ගැනීමටත් එකී නිර්දේශ ඉවහල් විය.

(ඇ) විශේෂ පැවරුම්

ශ්‍රී ලංකා මහ බැංකු අධිපතිගේ, මුදල් මණ්ඩලයේ සහ මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේ ඉල්ලීම පරිදි ශ්‍රී ලංකා මහ බැංකුවේ විවිධ දෙපාර්තමේන්තු මගින් සිදුකරනු ලැබූ ආයෝජන පටිපාටි, අරමුදල් කළමනාකරණ කටයුතු, ආරක්ෂක ක්‍රියාමාර්ග, වෙනත් අභ්‍යන්තර පාලනයන් සහ අත්පොත්වලට, ප්‍රතිපත්තීන්ට හා ක්‍රියා පටිපාටිවලට අනුකූලවීම ඉලක්ක කරගත් විශේෂ විමර්ශනයන් සිදු කරන ලද අතර එම විමර්ශන මගින් දෙපාර්තමේන්තු කිහිපයකම ක්‍රියාවලීන් ආවරණය කරන ලදී. එම විමර්ශන මගින් සොයා ගත් කරුණුවලට අදාළව අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ දෙපාර්තමේන්තු විසින් මේ වන විටත් කටයුතු ආරම්භ කර ඇත.

(ඈ) විගණන කටයුතුවල ප්‍රගතිය වාර්තා කිරීම

විගණන පැවරුම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මුදල් මණ්ඩලයට සහ මුදල් මණ්ඩල උපදේශන කමිටුවට කාර්තුමය වශයෙන් වාර්තා කරන ලදී. එමෙන්ම විගණකාධිපති වෙත විගණන කටයුතු පිළිබඳ අර්ධ වාර්ෂික වාර්තා සපයන ලදී.

### 15.2 දැනුම්වත් කිරීමේ වැඩසටහන් සහ පුහුණු කිරීම්

අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් එහි කාර්ය මණ්ඩලය සඳහා ක්ෂේත්‍රයේ ප්‍රවීණයෙකුගේ සහාය ඇතිව තොරතුරු පද්ධති විගණනය පිළිබඳව දේශනයක් 2016 වසර තුළ සිදු කරන ලදී. තවද, අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සිය දැනුම බෙදා ගැනීම සහ වර්ධනය කර ගැනීම සඳහා අභ්‍යන්තර සැසි පවත්වන ලදී. මානව සම්පත් දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි උපාධිධාරීන්, උපාධි අපේක්ෂකයන් සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ශිෂ්‍යයන් සඳහා අභ්‍යන්තර විගණනය සහ ඊට අදාළ විෂයයන් පිළිබඳව පුහුණු කිරීමේ කටයුතු ද අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් 2016 වසර තුළදීත් අඛණ්ඩව සිදු කරනු ලැබීය.

### 15.3 මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුව

මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුව යනු මුදල් මණ්ඩලයේ අනු-කමිටුවක් වන අතර විගණන කටයුතුවලට අදාළ ප්‍රතිපත්ති සහ අනෙකුත් කරුණු පිළිබඳව මුදල් මණ්ඩලයට උපදෙස් දීම සිදු කරයි. වාර්ෂික විගණන සැලැස්ම සහ එහි අතුරු සංශෝධනයන්, බාහිර විගණකවරුන් නිකුත් කරන කළමනාකාරීත්ව ලිපි සඳහා කළමනාකරණයේ ප්‍රතිචාර ආදී කරුණු එහිදී සලකා බැලෙයි. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේ සහකාර ලේකම් ලෙස කටයුතු කරන අතර අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් කමිටුවේ ලේකම් කටයුතු සඳහා පහසුකම් සැලසීම වසර පුරා අඛණ්ඩව සිදු කරන ලදී.

### 15.4 බාහිර විගණන කටයුතු සඳහා පහසුකම් සැලසීම

විගණකාධිපති විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ බාහිර විගණනය සිදු කරනු ලබන අතර, මුදල් මණ්ඩලයේ ලේකම් මගින් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව බාහිර විගණනය සඳහා පහසුකම් සපයන්නෙකු ලෙස කටයුතු කරයි. අන්තර් ජාතික මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකාධිපති විසින් අර්න්ස්ට් ඇන්ඩ් යන්ග් (Ernst & Young) වරලත් ගණකාධිකාරීවරුන් පත්කර ඇත. ඒ අනුව, අදාළ කටයුතු සිදු කිරීමට අවශ්‍ය තොරතුරු රැස් කිරීම, විශ්ලේෂණය සහ සන්නිවේදනය කිරීම සඳහා මුදල් මණ්ඩලයේ ලේකම් වෙත තාක්ෂණික සහය සැපයීම ද අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව මගින් සිදු කරන ලදී.

### 15.5 බාහිර තත්ත්ව ආරක්ෂණ සමාලෝචනය

අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ කටයුතු අභ්‍යන්තර විගණකවරුන්ගේ ආයතනයේ අන්තර්ජාතික වෘත්තීය පරිචය රාමුවෙහි සම්මතයන්ට අනුකූලතාවය දක්වන්නේදැයි තහවුරු කරගැනීම සඳහා දෙවෙනි වරටත් බාහිර තත්ත්ව ආරක්ෂණ සමාලෝචනයක් පිළිගත් දේශීය විගණන ආයතනයක් මගින් සිදුකරන ලදී. අන්තර් ජාතික මූල්‍ය අරමුදලේ සුරක්ෂිතතා දූත මණ්ඩලය මගින් 2016 මැයි මස දී සිදු කෙරුණු ශ්‍රී ලංකා සංචාරයේ දී ද එවැනි සමාලෝචනයක් පැවැත්වීමට නිර්දේශ කරන ලදී. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවෙහි කටයුතු අභ්‍යන්තර විගණකවරුන්ගේ ආයතනයේ ප්‍රමිතීන්ට අර්ධ වශයෙන් අනුකූලතාවය දක්වන බව එම සමාලෝචනය මගින් තහවුරු කරන ලදී.

## 16. ජාත්‍යන්තර මෙහෙයුම්

මුදල් නීති පනත අනුව, ශ්‍රී ලංකාවේ නිල විදේශ සංචිත කළමනාකරණය පිළිබඳ වගකීම ශ්‍රී ලංකා මහ බැංකුව සතු වේ. ඒ අනුව ජාත්‍යන්තර සංචිත කළමනාකරණය සහ දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ අධීක්ෂණය පිළිබඳ වගකීම් මුදල් මණ්ඩලය විසින් ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව වෙත පවරනු ලැබ ඇත.

මුදල් නීති පනත මගින් ජාත්‍යන්තර සංචිතයන්හි සංයුතිය සහ එය පවත්වාගෙන යාම, රුපියලෙහි බාහිර ස්ථායීතාව ආරක්ෂා කරගැනීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම, ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය මෙහෙයුම් කටයුතු, ජාත්‍යන්තර සංචිත කළමනාකරණ කටයුතු වලට අදාළව මුදල් මණ්ඩලය සතු බලතල හා වගකීම් සහ ජාත්‍යන්තර සංචිත කළමනාකරණය සඳහා අවශ්‍ය නීතිමය රාමුව සපයනු ලබයි. ඒ අනුව මුදල් නීති පනතේ 67 වන වගන්තියෙහි වත්කම් වර්ග, ප්‍රතිපාර්ශ්වයන් (counterparties), මූල්‍ය උපකරණ හා ඒවා නිකුත් කරන්නන්ට අදාළ පරාමිතීන් සම්බන්ධව කරුණු දක්වා ඇත. තවද, සංචිතවල ආරක්ෂාව, ද්‍රවශීලතාව සහ ප්‍රතිලාභ යන සංචිත කළමනාකරණ අරමුණු නගාසිටුවීම සඳහා අදාළ නිර්ණායක, මුදල් මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබේ.

### 16.1 ජාත්‍යන්තර සංචිත කළමනාකරණය

ජාත්‍යන්තර සංචිත සම්බන්ධ ආයෝජන කටයුතු, මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද විදේශ සංචිත කළමනාකරණ මාර්ගෝපදේශවලට අනුව සහ විදේශ සංචිත කළමනාකරණ කමිටුවේ (Foreign Reserve Management Committee) අධීක්ෂණය යටතේ, සංචිතවල ආරක්ෂාව, ද්‍රවශීලතාවය සහ ප්‍රතිලාභ යන අරමුණු සලකා බලමින් සිදු කරනු ලබයි. ජාත්‍යන්තර සංචිත ප්‍රධාන මුදල් වර්ග කිහිපයකින් දක්වා ඇති අතර ප්‍රධාන වශයෙන් ස්ථිර ආදායම් සුරැකුම්, මුදල් වෙළෙඳපොළ උපකරණ සහ රන් සංචිතවල ආයෝජනය කර ඇත. මෙම ස්ථිර ආදායම් සුරැකුම් කළඹ, ඉහළ ශ්‍රේණිගත කිරීමක් සහිත රාජ්‍ය සුරැකුම්පත්, රාජ්‍ය වගකීම සහිත සුරැකුම්පත්, රාජ්‍ය නියෝජිත ආයතන සහ අධිජාතික ආයතන (Supra-National Institutions) මගින් නිකුත් කරන ලද සුරැකුම්පත්වලින් සමන්විත වේ. ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් සංචිත කළමනාකරණය සඳහා කරනු ලබන ගනුදෙනු සිදු කරනු ලබන්නේ ඒ ඒ ප්‍රතිපාර්ශ්වයන්ගේ ස්ථාවරභාවය සහ ණය ලබා දීමට ඇති යෝග්‍යතාවය පිළිබඳව දැඩිව සලකා බලමින්, කළමනාකරණය විසින් අනුමත කරන ලද මහ බැංකු, ඉහළ ශ්‍රේණිගත කිරීමක් සහිත වාණිජ බැංකු සහ ආයෝජන ආයතන (Investment Houses) සමගිනි. විදේශ සංචිත කළඹ සමන්විත වන වත්කම් සහ මුදල් සංයුතීන් තීරණය කිරීමේ දී ද්‍රවශීල අවශ්‍යතා, ණය සේවා ගෙවීම්, අවදානම් කළමනාකරණ පරාමිතීන්, ආදායම් උත්පාදන හැකියාවන් සහ මුදල් මණ්ඩලයේ විශේෂිත නියෝග යන ප්‍රධාන සාධක සලකා බැලේ.

2016 වසර තුළ දී ශ්‍රී ලංකා මහ බැංකුව සංචිත කළමනාකරණයට අදාළ විශේෂඥ දැනුම වැඩි දියුණු කර ගැනීමේ අරමුණින් ලෝක බැංකුවේ සංචිත උපදේශක සහ කළමනාකරණ වැඩසටහන (Reserve Advisory and

Management Programme – RAMP) හා සම්බන්ධ විය. ලෝක බැංකු භාණ්ඩාගාරය විසින් මෙහෙයවනු ලබන මෙම වැඩසටහන මගින්, විදේශ විනිමය සංචිත සහ අනෙකුත් ආයෝජන කළඹ කාර්යක්ෂමව කළමනාකරණයට අවකාශය ලබා දෙමින් උපදේශක සේවා සහ රාජ්‍ය අංශයේ (State Sector) ආයෝජන කළමනාකරුවන්ට පුහුණුව සැපයීම සිදු කරනු ලබයි. මෙම වැඩසටහනේ මූලික අරමුණ වන්නේ ලෝක බැංකුවේ සාමාජික ආයතනයන් හට වත්කම් කළමනාකරණ හැකියාව, මෙහෙයුම් යටිතල පහසුකම් සහ මානව සම්පත් ධාරිතාව ඉහළ නැංවීම සඳහා අවශ්‍ය සහය ලබාදීමයි.

සංචිත උපදේශක සහ කළමනාකරණ වැඩසටහන (RAMP) යටතේ ලෝක බැංකුවේ මගපෙන්වීම සහිතව වගකීම්වලට අනුව වත්කම් උපායමාර්ගික ලෙස යෙදවීමට ඉඩ සලසන විද්‍යාත්මක ප්‍රවේශයක් යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව සිය විදේශ සංචිත කළමනාකරණය සිදු කරනු ලබයි. මෙම ක්‍රියාවලිය උපායමාර්ගික වත්කම් වෙන් කිරීමේ ක්‍රමය (Strategic Asset Allocation – SAA) ලෙස හඳුන්වන අතර එමගින් ශ්‍රී ලංකා මහ බැංකුවට සිය දීර්ඝකාලීන ආයෝජන අරමුණු වෙත ළඟාවීමට අවශ්‍ය පරිදි වත්කම් වෙන් කිරීම පිළිබඳ තීරණය කිරීමට අවකාශ සලසයි. උපායමාර්ගික වත්කම් වෙන් කිරීමේ ක්‍රමයෙහි අරමුණු දීර්ඝකාලීන වන අතර අනාගත ණය සේවාකරණ ගෙවීම්, ප්‍රාග්ධන සංරක්ෂණය සහ වර්ධනය මෙම අරමුණු අතර වේ.

ඇමෙරිකා එක්සත් ජනපදය සිය පොලී අනුපාතිකය ඉහළ දැමීමත් සමග ආයෝජකයන් විසින් සිය ආයෝජන නැගී එන වෙළෙඳපොළවල සිට සාපේක්ෂව ඉහළ ප්‍රතිලාභ සහිත සංවර්ධිත වෙළෙඳපොළවල් වෙත යොමු කරන ලදී. කෙසේ වෙතත්, බ්‍රිතාන්‍ය යුරෝපා හවුලෙන් ඉවත්වීමේ තීරණයෙන් පසුව ඇති වූ අහිතකර බලපෑම් ව්‍යාප්තවීමේ අවදානම සහ ඇමෙරිකා එක්සත් ජනපද නව නායකත්වය මගින් යෝජිත ජාත්‍යන්තර වෙළෙඳ හා රාජ්‍ය මූල්‍ය අංශයන් සඳහා වන ප්‍රතිපත්තිමය වෙනස්කම් හේතුවෙන් ජාත්‍යන්තර මූල්‍ය වෙළෙඳපොළ තුළ හටගත් විචලතාවයන් හේතු කොටගෙන ආයෝජකයන්ගේ අවධානය වැඩි වශයෙන් ආරක්ෂිත වත්කම් (Safe Haven Assets) වෙත යොමු වූ අතර එමගින් ආසියානු ආර්ථිකයන්ගෙන් ප්‍රාග්ධන අවප්‍රවාහයක් සිදු විය. මෙවැනි අභියෝගාත්මක ගෝලීය වාතාවරණයක් තුළ, ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් 2016 වසර තුළ දී විදේශ විනිමය ගනුදෙනු, මුදල් වෙළෙඳපොළ (Money Market) ආයෝජන සහ ප්‍රාග්ධන ඉපැයුම් හා ස්ථිර ආදායම් සුරැකුම් මත වන කූපන් ආදායම් මගින් එක්සත් ජනපද ඩොලර් මිලියන 53 ක උපලබ්ධි ආදායමක් (Realised Return) උපයන ලදී.

2015 වසර තුළ, ශ්‍රී ලංකා මහ බැංකුවට එක්සත් ජනපද ඩොලර් මිලියන 1,500 ක මුදලක් ලබාගත හැකි වන පරිදි ශ්‍රී ලංකා මහ බැංකුව සහ ඉන්දියානු සංචිත බැංකුව (Reserve Bank of India) අතර මුදල් හුවමාරු ගිවිසුම් සඳහා අත්සන් තබන ලදී. මෙම ගිවිසුම් යටතේ, එක්සත් ජනපද ඩොලර් මිලියන 700 ක මුදලක් 2016 මාර්තු මස සිට තෙමසක් සඳහා, විශේෂ මුදල් හුවමාරු ගිවිසුම මගින් ලැබුණි. තවද, 2015 වසර අප්‍රේල් මස, ඉහත හුවමාරු ගිවිසුම යටතේ, එක්සත් ජනපද ඩොලර් මිලියන 400 ක මුදල ශ්‍රී ලංකා මහ බැංකුවට හිමි වූ අතර, මෙම මුදල, කලාපීය සහයෝගීතාවය පිළිබඳ දකුණු ආසියානු සංවිධානයේ (SAARC) සාමාජික රාජ්‍යයන්හි මහ බැංකු සඳහා වන මූල්‍ය පහසුකම යටතේ, 2016 වසර තුළ සිව් වතාවක් නැවත අලුත් කිරීම (rolled over) සිදු කරන ලදී. මෙය මූල්‍ය වෙළෙඳපොළ තුළ ශ්‍රී ලංකා මහ බැංකුව සිය තත්ත්වය තවදුරටත් ශක්තිමත් කිරීම මෙන් ම සාර්ව ආර්ථික මූලධර්ම සහ ප්‍රමුඛ වෙළෙඳ හවුල්කරුවන්ට අදාළ මුදල් ඒකක විචලනයන්ට සමගාමීව විනිමය අනුපාතිකයේ ස්ථාවරභාවය ශක්තිමත්ව පවත්වාගෙන යෑම සඳහා උපකාරී විය.

## 16.2 ආයෝජන ක්‍රියාකාරකම් විශ්ලේෂණය හා පහසුකම් සැලසීම

ආයෝජන ක්‍රියාකාරකම් විශ්ලේෂණය හා පහසුකම් සැලසීම යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ සංචිත කළමනාකරණය හා සම්බන්ධ පහත සඳහන් ප්‍රධාන කාර්යයන් සිදු කෙරේ.

**(අ) කාර්ය සාධන ඇගයීම**

ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව, එහි සංචිත කළමනාකරණ ක්‍රියාකාරකම්වල කාර්ය සාධන ඇගයීම් කටයුතු එහි සමස්ත ප්‍රතිලාභ ප්‍රමාණය, වත්කම් සහ මුදල් ඒකක ව්‍යාප්තිය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් විදේශ සංචිත මට්ටම සහ එහි ප්‍රවණතා පිළිබඳ විශ්ලේෂණයක් ද සහිතව මාසික, කාර්තුමය සහ වාර්ෂික පදනම් යටතේ විදේශ සංචිත කළමනාකරණ කමිටුවට සහ මුදල් මණ්ඩලයට ඉදිරිපත් කරයි. තවද, ස්ථාවර ආදායම් සුරැකුම්පත්වල ආයෝජනයන් හරහා ඉපැයෙන ප්‍රතිලාභ, මුදල් මණ්ඩලය අනුමත කළ උපායමාර්ගික වත්කම් වෙන් කිරීමේ ක්‍රමයට අනුව බර තබන ලද අක්‍රිය කළඹකට සාපේක්ෂව ඇගයීමට ලක් කරයි. මෙම ඇගයීම් ක්‍රමය, ආදායම් සංසන්දනයට අමතරව ඉදිරි කාර්යාලයේ අලෙවිකරුවන් විසින් ගනු ලබන අමතර අවදානම, ලැබෙන අමතර ප්‍රතිලාභ මගින් ප්‍රමාණවත් ලෙස ආවරණය වන්නේ ද යන්න පෙන්නුම් කිරීමෙන් සක්‍රිය කළමනාකරණ උපායමාර්ග යේ කාර්යක්ෂමතාව තීරණය කිරීමට උපකාරී වේ.

**(ආ) සංචිත කළමනාකරණ පද්ධතිය (TMS) පාලනය කිරීම**

ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව, සංචිත කළමනාකරණ පද්ධතියේ ප්‍රධාන පරිශීලකයා වන්නා සේ ම, එහි පරිපාලන කටයුතුවල භාරකාරත්වය ද උසුලන අතර, අනෙක් පරිශීලන දෙපාර්තමේන්තු, එම පද්ධතියේ **(TMS)** විදේශ විකුණුම්කරු සහ දේශීය හවුල්කරු අතර නිසි සම්බන්ධීකරණය පවත්වා ගැනීම සම්බන්ධයෙන් ද වගකීම දරයි. තවද, සංචිත කළමනාකරණ පද්ධතියේ කාර්යක්ෂම ක්‍රියාකාරීත්වය සහතික කරනු වස් ස්විෆ්ට් (SWIFT), තත්කාලීන මුදල් පියවීමේ පද්ධතිය (RTGS) සහ පොදු ලෙජරය (GL) වැනි අභ්‍යන්තර පද්ධති සමග මෙන් ම බ්ලූම්බර්ග් (Bloomberg) සහ රොයිටර්ස් (Reuters) වැනි බාහිර පද්ධතින සමග ද එහි පූර්ණ සහ අඛණ්ඩ සම්බන්ධතාවය සහතික කිරීමේ වගකීම ද ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව සතු වේ.

**(ඇ) මූල්‍යමය නොවන අවදානම් අධීක්ෂණය සහ අනුකූලතා ඇගයීම**

සංචිත කළමනාකරණ කටයුතුවලට අදාළ මූල්‍ය-නොවන අවදානම් තත්ත්වය සහ ඒ හා සබැඳි අවදානම් ප්‍රතිකර්ම සැකසීම සහ අධීක්ෂණය ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව මගින් කරනු ලබන අතර එම වාර්තා මූල්‍ය-නොවන අවදානම් කළමනාකරණ කමිටුව වෙත සෑම කාර්තුවක දී ම ඉදිරිපත් කරයි.

**(ඉ) මූල්‍ය විශුද්ධිකරණයට හා ත්‍රස්තවාදී කටයුතු සඳහා අරමුදල් සැපයීම වැළැක්වීම සම්බන්ධයෙන් ගනුදෙනු පාර්ශ්වයන්ගේ ඇති බැඳීම/අනුකූලවීම පිළිබඳ වාර්ෂික සමාලෝචනය**

වසර 2016 දී ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් "ඔබේ ගනුදෙනුකරු හඳුනා ගැනීම (KYC) / ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්‍යෝග යෙන් ක්‍රියා කිරීම (CDD) සම්බන්ධ ශ්‍රී ලංකා මහ බැංකුවේ ගනුදෙනු පාර්ශ්ව වෙත බලපවත්වන රීති" නම් වූ නව මාර්ගෝපදේශ පද්ධතියක් සකස් කරන ලදී. මෙහි මුඛ්‍ය අරමුණ වන්නේ සියලුම විදේශ විනිමය ගනුදෙනු සම්බන්ධයෙන් සියලුම ගනුදෙනු පාර්ශව විසින් මූල්‍ය විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම වැළැක්වීම පිළිබඳ පිළිගත් ජාත්‍යන්තර පරිචයන් සම්බන්ධයෙන් වූ නීති හා රෙගුලාසි පිළිබඳ අනුකූලතාවය සහතික කිරීමයි.

## 16.3 දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ

2016 වසරේ දී, විනිමය අනුපාතිකයේ අධික විචලනයන් පාලනය කිරීමේ අරමුණින්, ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්මේන්තුව අඛණ්ඩ අධීක්ෂණය තුළින්, දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ කටයුතු සුමටව පවත්වාගෙන යන ලදී. පසුගිය වසර තුළ මහා බ්‍රිතාන්‍යය, යුරෝපා සංගමයෙන් ඉවත්වීම සහ ඇමෙරිකානු එක්සත් ජනපද ෆෙඩරල් සංචිත බැංකුව මගින් පොලී අනුපාතික ඉහළ යෑමේ සම්භාවිතාවක් ඇති බවට අපේක්ෂා කිරීම නිසා ඇති වූ අවිනිශ්චිතභාවයන් හේතුවෙන් ඇමෙරිකානු ඩොලරය අධිප්‍රමාණය වීමේ ප්‍රතිඵලයක් ලෙස ප්‍රාග්ධන ගලායාම් ඉහළ යෑම සහ භාණ්ඩාගාර සුරැකුම්පත්වල ආයෝජනය කර තිබූ විදේශීය ආයෝජන නැවත මවු රටවල් කරා යෑම මගින් ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම සඳහා පීඩනයක් එල්ල විය. 2015 වසරේ දී ඇමෙරිකානු ඩොලර් බිලියන 13.6 ක් වූ අන්තර් බැංකු ගනුදෙනු පරිමාව, 2016 වසරේ දී ඇමෙරිකානු ඩොලර් බිලියන 14.8 දක්වා වැඩි විය (II-20 වන සංඛ්‍යා සටහන). පසුගිය වසර හා සැසඳීමේ දී, පසුදින (Tom), එදින (Cash) සහ ඉදිරි (Forward) පදනම යටතේ වූ විනිමය ගනුදෙනුවල අඩුවීමක් පෙන්නුම් කළ අතර එතැන් (Spot) පදනම යටතේ සිදුවූ විනිමය ගනුදෙනුවල සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කෙරිණි. 2016 වර්ෂය තුළ දී, ශ්‍රී ලංකා මහ බැංකුව මගින් බලපත්‍රලාභී වාණිජ බැංකුවලට පවත්වාගෙන යා හැකි ශුද්ධ විදේශ විනිමය ප්‍රමාණය මත පනවන ලද සමස්ත සීමාව ඇමෙරිකානු ඩොලර් මිලියන 197 මට්ටම දක්වා වැඩි කරන ලදී. ඒ අතර, ජාතික ඉතිරිකිරීමේ බැංකුව සඳහා ද 2016 දෙසැම්බර් 05 වැනිදා සිට ක්‍රියාත්මක වන පරිදි පවත්වාගෙන යා හැකි ශුද්ධ විදේශ විනිමය ප්‍රමාණය සඳහා වන සීමාවක් ලබාදෙන ලදී. තවද, 2015 වසරේ ශුද්ධ විදේශ විනිමය විකුණුම් ප්‍රමාණය වන ඇමෙරිකානු ඩොලර් මිලියන 3,249.53 හා සැසඳීමේ දී, 2016 වසරේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරන ලද ශුද්ධ විදේශ විනිමය විකුණුම් ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් මිලියන 768.16 ක් විය (II-21 වන සංඛ්‍යා සටහන).

**II-20 සංඛ්‍යා සටහන**

**අන්තර් බැංකු විදේශ විනිමය ගනුදෙනු පරිමාව - 2016**

(එ.ජ.ඩො. මිලියන)

| මාසය | එතැන් | පසුදින | එදින | ඉදිරි | එකතුව |
|---|---|---|---|---|---|
| ජනවාරි | 393.00 | 101.00 | 80.90 | 575.76 | 1,150.66 |
| පෙබරවාරි | 301.13 | 101.50 | 76.40 | 696.16 | 1,175.19 |
| මාර්තු | 226.00 | 239.20 | 143.35 | 829.63 | 1,438.18 |
| අප්‍රේල් | 138.80 | 149.50 | 188.50 | 701.41 | 1,178.21 |
| මැයි | 98.75 | 98.75 | 153.95 | 781.83 | 1,133.28 |
| ජුනි | 316.45 | 150.55 | 142.75 | 794.22 | 1,403.97 |
| ජූලි | 144.75 | 108.50 | 73.20 | 794.88 | 1,121.33 |
| අගෝස්තු | 112.75 | 199.85 | 261.55 | 614.79 | 1,188.94 |
| සැප්තැම්බර් | 234.75 | 185.70 | 357.70 | 661.45 | 1,439.60 |
| ඔක්තෝබර් | 210.90 | 220.60 | 165.95 | 709.03 | 1,306.48 |
| නොවැම්බර් | 102.00 | 91.00 | 87.40 | 716.21 | 996.61 |
| දෙසැම්බර් | 177.22 | 78.50 | 159.68 | 821.63 | 1,237.03 |
| එකතුව | 2,456.50 | 1,724.65 | 1,891.33 | 8,696.04 | 14,769.50 |

මූලාශ්‍රය: ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**II-21 සංඛ්‍යා සටහන**

**ශ්‍රී ලංකා මහ බැංකුව මගින් සිදුකරන ලද විදේශ විනිමය ගැනුම් සහ විකුණුම් - 2016**

(එ.ජ.ඩො. මිලියන)

| මාසය | ගැනුම් | විකුණුම් | ශුද්ධ විදේශ විනිමය ගැනුම්/(විකුණුම්) |
|---|---|---|---|
| ජනවාරි | - | 303.50 | (303.50) |
| පෙබරවාරි | - | 189.05 | (189.05) |
| මාර්තු | 10.95 | 432.06 | (421.11) |
| අප්‍රේල් | 14.94 | 266.45 | (251.51) |
| මැයි | 123.83 | 36.20 | 87.63 |
| ජුනි | 178.78 | 194.02 | (15.24) |
| ජූලි | 204.55 | 53.90 | 150.65 |
| අගෝස්තු | 190.77 | 57.58 | 133.19 |
| සැප්තැම්බර් | 131.29 | 15.20 | 116.09 |
| ඔක්තෝබර් | 88.33 | 163.78 | (75.45) |
| නොවැම්බර් | 9.45 | 116.91 | (107.46) |
| දෙසැම්බර් | 179.31 | 71.73 | 107.58 |
| එකතුව | 1,132.22 | 1,900.38 | (768.16) |

මූලාශ්‍රය: ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## 17. නීති සහ අනුකූලතා කටයුතු

ශ්‍රී ලංකා මහ බැංකුවේ මූලික අරමුණු සාක්ෂාත් කර ගැනීමෙහිලා නීති සහ අනුකූලතා දෙපාර්තමේන්තුවෙහි දායකත්වය මෑත සමයේ දී එහි උපාය මාර්ගික සැලසුම්වල ප්‍රධාන ස්ථානයක් ලබා ගෙන ඇත. නීති සහ අනුකූලතා දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ නෛතික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමත්, නීති සහ නියාමන පද්ධතියේ කාලානුරූපී බව තහවුරු කිරීමත් යන සිය ප්‍රධාන ඉලක්ක කරා ළඟා වෙමින් ජාතික වැදගත්කමක් ඇති කරුණු සම්බන්ධ ප්‍රතිපත්ති සැකසීමේ අදියරේ දී නීතිමය සහාය ද සපයමින් වැදගත් කාර්ය භාරයක් ඉටු කරයි. 2015 ජූනි මාසයේ දී පිහිට වූ නීති සහ අනුකූලතා දෙපාර්තමේන්තුවට, රජයේ දෙපාර්තමේන්තු, වෙනත් නියාමන අධිකාරීන් සහ මහ බැංකුවේ අනෙකුත් දෙපාර්තමේන්තු ද සමඟ සහයෝගයෙන් කටයුතු කරමින්, මහ බැංකුව තුළ සියලුම නීතිමය සහ පටිපාටික අංශ ආශ්‍රිතව, මූල්‍ය පද්ධති ස්ථායීතාව, ගෙවීම් පද්ධතිය සහ රටේ මූල්‍ය පද්ධතියට අදාළව පැන නගින නීතිමය සහ ප්‍රතිස්ථාපන ගැටලු අවබෝධ කර ගැනීමේ නිසි පරිපූර්ණ බවක් තහවුරු කර දීමට හැකි වී ඇත.

මහ බැංකුව විසින් ක්‍රියාවෙහි යොදවනු ලබන නීති සහ නියාමන පද්ධතිය ජාත්‍යන්තර පිළිගැනීම් හා විශිෂ්ට භාවිතාවන් හා අනුකූල වන බවට තහවුරු කරන අතර මහ බැංකුවේ නෛතික අවදානම හා කීර්තිය පළුදු වීම පිළිබඳ අවදානම අවම කිරීම සම්බන්ධයෙන් ද නීති සහ අනුකූලතා දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන කාර්ය භාරයක් ඉටු කරන ලදී.

නීති සහ අනුකූලතා දෙපාර්තමේන්තුව ස්ථාපිත කිරීම හේතුවෙන් මහ බැංකුවට අදාළ සියලුම නඩු කටයුතු සහ වෙනත් නීතිමය ගැටලු සම්බන්ධයෙන් නිසි කලට කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස කටයුතු කිරීමට හැකියාව ලැබිණි. මෙහිදී දෙපාර්තමේන්තුව විසින් අනෙකුත් සියලු දෙපාර්තමේන්තු මුහුණ දෙන නීතිමය ප්‍රශ්න විසඳා ගැනීමේ දී ද සිය අඛණ්ඩ සහයෝගය ලබා දෙන ලදී. එම දෙපාර්තමේන්තු විසින් ක්‍රියාත්මක කරන ලද සියලුම ගිවිසුම්, එකඟතාවන් සහ වෙනත් ප්‍රධාන නීතිමය බැඳීම් හා සම්බන්ධ ලේඛන ද කෙටුම්පත් කිරීම හා/හෝ සමාලෝචනය කිරීම නීති සහ අනුකූලතා දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. සියලුම නොතාරිස් කටයුතු, විශේෂයෙන් මහ බැංකු කාර්ය මණ්ඩල (උකස්) ණය යෝජනා ක්‍රමය හා සම්බන්ධ කටයුතු ද කාර්යක්ෂම ලෙස ඉටු කරන ලදී.

විශේෂයෙන්ම මූල්‍ය පද්ධති අංශයේ අධීක්ෂණ දෙපාර්තමේන්තුවල නියාමනයට යටත් ආයතන විසින් කරනු ලබන නියෝග කඩකිරීම්වලදී අවශ්‍ය පරිදි සුදුසු නියාමන කටයුතු සහ පැනවීම් සිදුකිරීම සඳහා එම දෙපාර්තමේන්තුවලට නිරීක්ෂණ, නිර්දේශ සහ උපදෙස් ලබා දීම ද නීති සහ අනුකූලතා දෙපාර්තමේන්තුවේ වැදගත් කාර්යයකි. තවද, පිහිටුවීමෙන් පසු ගෙවීගිය කෙටි කාලය තුළ දෙපාර්තමේන්තුව විසින් මුදල් මණ්ඩලයේ තීරණවලින් ඇති විය හැකි නීතිමය සහ වෙනත් අවදානම් අවම කිරීම උදෙසා, කලින් කළ අවශ්‍ය පරිදි මුදල් මණ්ඩලය වෙත උපදෙස්, නීතිමය පැහැදිලි කිරීම් සහ නිර්දේශයන් ද සපයන ලදී.

නීති සහ අනුකූලතා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් අධිකරණ, විනිශ්චය සභා, කොමිෂන් සභා යනාදී විවිධ නෛතික අධිකාරයන් ඉදිරියේ මහ බැංකුව නියෝජනය කරන ලද අතර නඩු කටයුතුවලට අදාළව නීතිපති දෙපාර්තමේන්තුව සමඟ කටයුතු කිරීමේ දී සම්බන්ධීකරණ කාර්යයන් ද ඉටු කරන ලදී. එසේම නීති විරෝධී මූල්‍ය යෝජනා ක්‍රම සහ අනවසර මූල්‍ය ව්‍යාපාර ආදිය පිළිබඳව මහජනතාවගේ දැනුම වර්ධනය කිරීම අරමුණු කරගත් දැනුවත් කිරීමේ වැඩසටහන් රාශියකට ද සම්පත් දායකයන් වශයෙන් දෙපාර්තමේන්තු නිලධාරීහු සහභාගි වූහ.

මේ ආකාරයෙන් මහ බැංකුවේ කාර්යයන් සහ වගකීම් අදාළ නීති ප්‍රතිපාදන, රීති සහ රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගැනීම විෂයයෙහි නීති සහ අනුකූලතා දෙපාර්තමේන්තුව සුවිශේෂී දායකත්වයක් සපයනු ලබයි. මහ බැංකුව විසින් ක්‍රියාවේ යොදවනු ලබන පනත් සඳහා යෝග්‍ය සංශෝධන හඳුන්වා දීම පසුගිය වසරේ දී දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කරන ලදී. එම පනත් ගෝලීය නියාමන ප්‍රමිතීන්ට සහ විශිෂ්ට භාවිතයන්ට අනුගත වීම තහවුරු කරමින් මෙම කාර්යය අඛණ්ඩව සිදු කෙරේ. මෙකී අරමුණට අදාළව ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධති ස්ථායීතාව සාක්ෂාත් කිරීම උදෙසා, මනා නියාමන ප්‍රවේශයක් වර්ධනය කර ගැනීමේ අරමුණින් නීති සහ අනුකූලතා දෙපාර්තමේන්තුව වෙනත් නියාමන සහ අධීක්ෂණ අධිකාරීන් සමඟ නිරන්තර අදහස් හුවමාරුවක් පවත්වා ගනී.

## 18. සාර්ව විචක්ෂණතා අධ්‍යයන

මූල්‍ය පද්ධති ස්ථායීතා දෙපාර්තමේන්තුව නමින් 2007 වසරේ දී ආරම්භ කරන ලද මෙම දෙපාර්තමේන්තුවේ නම, 2011 වසරේ දී මූල්‍ය ස්ථායීතා අධ්‍යයන දෙපාර්තමේන්තුව ලෙසත්, 2014 වසරේ දී මූල්‍ය අංශ පර්යේෂණ දෙපාර්තමේන්තුව ලෙසත්, ඉන් අනතුරුව 2016 වසරේ නොවැම්බර් මාසයේ දී සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව ලෙසත් වෙනස් කරන ලදී. ඉටුවිය යුතු කාර්යයන් සලකා බැලීමේ දී අවශ්‍ය තාක්ෂණික කුසලතා සහ මානව සම්පත් අතින් දෙපාර්තමේන්තුව තවමත් මූලික අදියරවල පවතී.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණුවලින් එකක් වන මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව පවත්වාගෙන යෑම සාක්ෂාත් කර ගැනීම සඳහා මූල්‍ය අංශයේ පද්ධතිමය අවදානම ස්වාධීනව ඇගයීම සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුවේ මූලික අරමුණ වේ. සාර්ව විචක්ෂණ අවේක්ෂණය, මූල්‍ය ස්ථායීතාවට බලපෑම් කළ හැකි ප්‍රධාන විචල්‍යයන් ඇතුළත් දත්ත නිතිපතා රැස්කිරීම හා පවත්වා ගෙන යෑම, වාර්ෂික මූල්‍ය පද්ධති ස්ථායීතා විවරණ වාර්තාව පිළියෙළ කිරීම සහ ව්‍යවස්ථාපිත සහ අනෙකුත් කාලීන වාර්තාවලට දායකත්වය ලබා දීම දෙපාර්තමේන්තුවේ මූලික කාර්යයන්ට ඇතුළත් වේ. ඒ අනුව, දෙපාර්තමේන්තුව විසින් 2016 වසර තුළ දී එහි සාර්ව විචක්ෂණ අවේක්ෂණ රාමුව තවදුරටත් වැඩිදියුණු කළ අතර, මූල්‍ය පද්ධති ස්ථායීතාව වර්ධනය හා ශක්තිමත් කිරීම සම්බන්ධ මාතෘකා පිළිබඳව අධ්‍යයනය කිරීම සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යවස්ථාපිත වාර්තා සහ අනෙකුත් දෙපාර්තමේන්තු මගින් පිළියෙළ කරන ප්‍රකාශනයන් සඳහා

දායකත්වය ලබාදීම ද සිදු කෙරිණි. මෙම කාර්යභාරයන් පහත සැකෙවින් දක්වා ඇත.

**(අ) සාර්ව විචක්ෂණ අවේක්ෂණය**

දෙපාර්තමේන්තුවට පැවරී ඇති කාර්යභාරයට අනුගත වෙමින් මහ බැංකුවේ අනෙකුත් දෙපාර්තමේන්තුවලින් සහ බාහිර ආයතනවලින් සපයාගනු ලැබූ දත්ත පදනම් කොට ගෙන මූල්‍ය ආයතන, මූල්‍ය වෙළඳපොළවල්, සාංගමික අංශය සහ සාර්ව ආර්ථිකය යන අංශයන්හි මූල්‍ය ශක්තිමත්භාවය පිළිබිඹු කෙරෙන දර්ශක පෙළක් කාර්තුමය සහ මාසික පදනමක් යටතේ අඛණ්ඩව සකස් කරන ලදී. මෙවැනි ඇගයීම් හරහා ඉහත සඳහන් කළ මූල්‍ය අංශයේ උප අංශවල ස්ථායීතාව ඇගයීම සහ එකී අංශවල ඇති විය හැකි අවදානම් කරනකොටගෙන සමස්ත මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවයට අහිතකර බලපෑමක් ඇති වීමට යම් ප්‍රවණතා පවතී නම් එකී මූලික තත්ත්ව හඳුනා ගැනීමත් සිදු කෙරිණි. තව ද, මූල්‍ය වෙළඳපොළවල්, බලපත්‍රලාභී බැංකු හා බැංකු නොවන මූල්‍ය ආයතන, සාංගමික අංශය සහ සාර්ව ආර්ථිකය ආවරණය වන පරිදි සාර්ව විචක්ෂණ දර්ශක කිහිපයක් දෙපාර්තමේන්තුව විසින් සකස් කළ අතර විනිමය අනුපාතිකයේ හැසිරීම, සාංගමික අංශයේ ණය ලබා ගැනීමේ හැකියාව සහ මූල්‍ය අංශයේ ණය ගලා යෑම් ආශ්‍රිතව සමස්ත මූල්‍ය පද්ධතියට ඇති විය හැකි අවදානම් කල්තබා හඳුනා ගැනීමේ අරමුණෙන් එකී අංශ ආශ්‍රිත පූර්ව දැනුම්දීමේ දර්ශක තවදුරටත් වැඩිදියුණු කරන ලදී. ඉහත සඳහන් කළ සාර්ව විචක්ෂණ අවේක්ෂණයන්ගෙන් අනාවරණය වන මූල්‍ය අංශයේ ප්‍රවණතා සහ සංවර්ධනයන් මතුකර දක්වමින් මාසික මූල්‍ය අංශ අවදානම් ඇගයීමේ වාර්තා මූල්‍ය ප්‍රතිපත්ති කමිටුව වෙත අඛණ්ඩව ඉදිරිපත් කරන ලදී.

**(ආ) මූල්‍ය අංශයේ විශේෂිත විෂය ක්ෂේත්‍ර ආවරණය වන පරිදි පර්යේෂණ සිදු කිරීම**

දෙපාර්තමේන්තුව විසින් 2016 වසර තුළ දී මූල්‍ය අංශයේ විශේෂිත විෂය ක්ෂේත්‍ර හතරක් යටතේ පර්යේෂණ සිදු කරන ලදී. මෙම පර්යේෂණයන් තුළින් බැංකු නොවන මූල්‍ය ආයතනවල ණය දීමේ කටයුතු විවිධාංගීකරණය සඳහා පවත්නා සීමාවන් හඳුනා ගැනීම, මූල්‍ය ආයතන සතු ලැබිය යුතු ණය ශේෂයන් ප්‍රතිමූල්‍යකරණය, හිඟහිටි හෝ අකර්මන්‍ය ණය ද ඇතුළත්ව දුර්වල මූල්‍ය ආයතන ක්‍රමිකව ප්‍රතිව්‍යුහගත කිරීම සහ කලාපීය මහ බැංකුවල මූල්‍ය පද්ධති අංශයේ දෙපාර්තමේන්තුවල සංවිධාන ව්‍යුහය අධ්‍යයනය කිරීම සිදු කෙරිණි.

**(ඇ) ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යවස්ථාපිත සහ අනෙකුත් ප්‍රකාශන සඳහා දායක වීම**

සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ 2015 වසරේ වාර්ෂික වාර්තාවෙහි "මූල්‍ය අංශයේ ක්‍රියාකාරීත්වය සහ පද්ධති ස්ථායීතාව" සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන ලද මෑතකාලීන ආර්ථික ප්‍රවණතා - 2016 හි "මූල්‍ය අංශයේ ප්‍රවණතා සහ ස්ථායීතාව" යන පරිච්ඡේද සැකසීම සඳහා දායකත්වය සහ අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී. තවද, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2016 සැප්තැම්බර් මස මුදල් අමාත්‍යවරයාට පිළිගන්වන ලද සැප්තැම්බර් 15 වාර්තාවේ "මූල්‍ය අංශයේ ප්‍රවණතා සහ ස්ථායීතාව" පරිච්ඡේදය බාහිර ආයතන සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ අදාළ දෙපාර්තමේන්තු විසින් සපයන ලද වාර්තා එක්රැස් කිරීම සහ අවශ්‍ය දායකත්වය ලබා දීම තුළින් නිම කරන ලදී. මෙම වාර්තා මගින් කාර්යසාධනය, අවදානම් සහ අවදානම් කළමනාකරණය, සම්පත් උපයෝජනය යන අංශ සම්බන්ධ විශේෂ අවධානය යොමු කරමින් රටෙහි මූල්‍ය ආයතන, මූල්‍ය වෙළඳපොළ සහ මූල්‍ය පද්ධතිය පිළිබඳ පුළුල් විශ්ලේෂණයක් සිදු කරන අතර, රටෙහි මූල්‍ය අංශයේ සමස්ත ස්ථායීතාවය කෙරෙහි මෙම එක් එක් අංශයන්ගෙන් සිදු වූ හා ඉදිරියේ දී විය හැකි බලපෑම් ඇගයීම හා එම අංශයන්ට අදාළ නියාමනයන්හි තවදුරටත් සිදු වූ වර්ධනයන් පිළිබඳ විස්තර ඇතුළත් වේ. එමෙන්ම දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ අනෙකුත් දෙපාර්තමේන්තුවලට මූල්‍ය අංශයේ දත්ත සම්පාදනය, අඛණ්ඩ වාර්තා ඉදිරිපත් කිරීම් සහ ප්‍රකාශන සඳහා දායකත්වය ලබාදීම ද සිදු කෙරිණි.

**(ඈ) අනෙකුත් ක්‍රියාකාරකම්**

සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව, අන්තර්ජාතික මූල්‍ය අරමුදල සහ ලෝක බැංකුවේ තාක්ෂණ නිලධාරීන් සමග එක්ව ගැටලුකාරී වත්කම් යථාතත්ත්වයට පත්කිරීම, මූල්‍ය අංශයේ නියාමනයන්ට අදාළ නියාමන ක්‍රමවේදයන් හා නීති යාවත්කාලීන කිරීම හරහා මූල්‍ය අංශයේ අඛණ්ඩ වර්ධනයන් සිදු කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ අදාළ දෙපාර්තමේන්තුවලට අවශ්‍ය තාක්ෂණික සහාය ලබාදීම සඳහා අවශ්‍ය මූලික සම්බන්ධීකරණ කටයුතු ද 2016 වසර තුළ දී සිදු කරන ලදී.

## 19. ගෙවීම් සහ පියවීම්

මුදල් නීති පනතේ 62 අ වගන්තිය මගින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත අරමුදල් මාරු කිරීම සඳහා පද්ධති පිහිටුවීම සහ මෙහෙයවීම, ගෙවීම් බැරකම් පියවීම සහ සහභාගිත්ව ආයතනවලට පද්ධති නීතිරීති නිකුත් කිරීම සඳහා බලය පවරා ඇත. මේ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවට පැවරී ඇති වගකීම ඉටු කිරීම සඳහා ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව 2002 දී ස්ථාපනය කරන ලදී. තවද, 2005 අංක 28 දරන ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනත බලාත්මක කිරීමත් සමග ශ්‍රී ලංකා මහ බැංකුවට එම පනත යටතේ පැවරී ඇති වගකීම් ඉටු කිරීම ද ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවට පවරන ලදී. තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි මෙහෙයුම් සිදු කිරීම, මූල්‍ය ගනුදෙනු සඳහා පසු මෙහෙයුම් කාර්යාල පහසුකම් සැලසීම, ස්විෆ්ට් (SWIFT) සන්නිවේදන කටයුතු කළමනාකරණය කිරීම, ආසියානු නිෂ්කාශන සංගමයේ රටවල් අතර ගනුදෙනු සඳහා පහසුකම් සැලසීම, ජාතික ගෙවීම් යාන්ත්‍රණය ගොඩනැගීම සඳහා පහසුකම් සැලසීම මෙන්ම රටතුළ ගෙවීම් සහ පියවීම් පද්ධති නියාමන සහ අවේක්ෂණ කටයුතු සිදු කිරීම යන කාර්යයන් ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවෙහි ප්‍රධාන කටයුතු වේ. ඒ අනුව, 2016 වසර තුළ ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවෙහි ප්‍රධාන කටයුතුවලට අදාළ ක්‍රියාකාරිත්වය පහත දැක්වෙන අතර ගෙවීම් හා පියවීම් පද්ධති පිළිබඳ විස්තරාත්මක විග්‍රහයක් 8 වන පරිච්ඡේදයෙහි දැක්වේ.

## 19.1 තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි (RTGS) මෙහෙයුම් කටයුතු

ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් සහභාගිත්ව ආයතන අතර කාල සංවේදී විශාල වටිනාකම් සහිත ගෙවීම් තත්කාලීන දළ පියවීම් පදනම මත පියවීම් සිදු කරන තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි මෙහෙයුම් කටයුතු සිදු කරන ලද අතර, එම පද්ධතියෙහි සුමට ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා සහභාගිත්ව ආයතන වෙත එක් දින ද්‍රවශීලතා පහසුකම ලබා දීම ද සිදු කරන ලදී. තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි සහභාගිත්ව ආයතන වනුයේ ශ්‍රී ලංකා මහ බැංකුව, බලපත්‍රලාභී වාණිජ බැංකු, බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන්, සේවක අර්ථසාධක අරමුදල සහ කොළඹ කොටස් හුවමාරුවෙහි මධ්‍යම තැන්පතු පද්ධතියයි.

තත්කාලීන දළ පියවීම් පද්ධතිය හා ලංකාසෙක්‍යු පද්ධතිය යන පද්ධති දෙකකින් සමන්විත ලංකාසෙට්ල් පද්ධතිය, 2016 දෙසැම්බර් මාසයේ දී සංස්කරණ 3.7 සිට සංස්කරණ 3.8 දක්වා වැඩි දියුණු කරන ලද අතර එම නව සංස්කරණ යටතේ සජීවී මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලදී.

2016 වසර අවසානයේ දී සහභාගිත්ව ආයතන සංඛ්‍යාව 36 ක් විය. වසර තුළ දී තත්කාලීන දළ පියවීම් පද්ධතිය මගින් රුපියල් බිලියන 93,378 ක වටිනාකමින් යුත් ගනුදෙනු 365,991 ක ප්‍රමාණයක පියවීම් කටයුතු සිදු කරන ලදී. තත්කාලීන දළ පියවීම් පද්ධතිය මගින් පියවන ලද දෛනික සාමාන්‍ය ගනුදෙනු ප්‍රමාණය 1,519 ක් වූ අතර එහි ගනුදෙනුවල සාමාන්‍ය වටිනාකම රුපියල් බිලියන 387 ක් විය. සහභාගිත්ව ආයතන වෙත දෛනිකව ලබා දෙන ලද එක් දින ද්‍රවශීලතා පහසුකමෙහි සාමාන්‍යය රුපියල් බිලියන 38.8 ක් විය. ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කරමින් තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි උපයෝගීතාව 2016 වසරේ දී සියයට 99.90 ලෙස පවත්වාගෙන යන ලදී.

## 19.2 ශ්‍රී ලංකා මහ බැංකුවෙහි මූල්‍ය ගනුදෙනු සඳහා පසු මෙහෙයුම් කාර්යාල සේවා සැපයීම

### (අ) විදේශ විනිමය ගනුදෙනු සඳහා පසු මෙහෙයුම් කාර්යාල සේවා

2016 වසරේ දී, ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිත කළමනාකරණ කටයුතු සම්බන්ධයෙන් සපයන ලද පසු මෙහෙයුම් කාර්යාල සේවා පහත දැක්වේ.

(i) 2016 වසරේ දී, විදේශ විනිමය අලෙවි සහ මූල්‍යන, මුදල් වෙළඳපොළ, ස්ථාවර ආදායම් සුරැකුම්පත්, රන් වෙළඳපොළ ආශ්‍රිත කටයුතු, ආසියානු නිෂ්කාශන සංගමයේ ගනුදෙනු සහ ප්‍රතිමිලදී ගැනීම්/ප්‍රතිවිකුණුම් ගනුදෙනු 12,621 කට අදාළ පියවීම් සිදු කළ අතර, එහි වටිනාකම එක්සත් ජනපද ඩොලර් බිලියන 343.4 ක් විය.

(ii) ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව මගින් යොමු කරන ගනුදෙනු පියවීමට පහසුකම් සැලසීම උදෙසා සේවා මුර ක්‍රමය 2016 පළමු සත් මාසය තුළ දී තවදුරටත් ක්‍රියාත්මක කරන ලදී. කෙසේ වුව ද, වාණිජමය පදනම මත වූ (Proprietary) විදේශ විනිමය ගනුදෙනු අත්හිටුවීමත් සමඟ සේවා මුර ක්‍රමය ද 2016 අගෝස්තු මාසයේ 10 වන දා සිට අත්හිටුවන ලදී.

### (ආ) විවෘත වෙළඳපොළ කටයුතු සඳහා පසු මෙහෙයුම් කාර්යාල සේවා

බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ප්‍රාථමික අලෙවිකරුවන් සමඟ සිදු කළ විවෘත වෙළඳපොළ කටයුතු සඳහා පසු මෙහෙයුම් කාර්යාල පහසුකම් සලසා දෙමින් විවෘත වෙළඳපොළ සහභාගිත්ව ආයතනවල ද්‍රවශීල අවශ්‍යතා කළමනාකරණය සඳහා පහසුකම් සලසන ලදී. ඒ අනුව, 2016 වසර තුළ දී ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් රුපියල් බිලියන 252 ක් වටිනා ප්‍රතිමිලදී ගැනීම් ගනුදෙනු 120 ක් ද, වටිනාකම රුපියල් බිලියන 5,573 ක් වූ නිත්‍ය තැන්පතු පහසුකම් ගනුදෙනු 3,813 ක් ද, රුපියල් බිලියන 3,208 ක් වූ නිත්‍ය ණය පහසුකම් 2,555 ක් ද, රුපියල් බිලියන 3,938 ක් වූ ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනු 4,119 ක් ද, රුපියල් බිලියන 39.60 ක් වූ ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් විකුණුම් ගනුදෙනු 22 ක් ද, රුපියල් බිලියන 15.77 ක් වූ ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම් ගනුදෙනු 21 ක් ද සිදු කිරීමට සහ පහසුකම් සැලසීමට දායක විය.

## 19.3 ස්විෆ්ට් (SWIFT) මූල්‍ය සන්නිවේදන පද්ධතිය කළමනාකරණය

ලෝක ව්‍යාප්ත අන්තර්බැංකු මූල්‍ය සන්නිවේදන සංගමය (ස්විෆ්ට්) යනු සුරක්ෂිත හා ආරක්ෂාකාරී පරිසරයක් තුළ මූල්‍ය ගනුදෙනුවල ගෙවීම් උපදෙස් සහ වෙනත් අදාළ තොරතුරු හුවමාරු කිරීමේ සන්නිවේදන මාර්ගයක් වේ. මෘදුකාංග හා දෘඩාංග, ක්‍රියාදාමයන්, ක්‍රියාපටිපාටීන් සහ අවදානම් කළමනාකරණ පාලනයන් සම්බන්ධයෙන් ස්විෆ්ට් ප්‍රධාන මූලස්ථානය මගින් නියම කරන ලද ප්‍රමිතීන්ට අනුකූල වෙමින් අනෙකුත් දේශීය හා අන්තර්ජාතික මූල්‍ය ආයතන සමඟ ශ්‍රී ලංකා මහ බැංකුවේ සියලුම ස්විෆ්ට් සන්නිවේදන කටයුතු ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව මගින් පවත්වාගෙන යනු ලබයි.

2016 වසර තුළ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ දේශීය සහ විදේශීය විනිමය ගනුදෙනු සඳහා පහසුකම් සලසමින් යවන ලද සහ ලැබුණු මුළු ස්විෆ්ට් පණිවුඩ සංඛ්‍යාව, පිළිවෙළින් 1,649,068 සහ 876,294 ක් විය. තම සේවා දායකයන් වෙත වැඩිදියුණු කරන ලද පහසුකම් සහිත වඩා කාර්යක්ෂම සේවාවක් ලබා දීම සඳහා සේවා සැපයුම්කරු විසින් ස්විෆ්ට් පද්ධතිය නව සංස්කරණ 7.1.21 දක්වා වැඩිදියුණු කරන ලදී. ඒ අනුව, ස්විෆ්ට් විසින් හඳුන්වා දුන් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව ද මෙම නව සංස්කරණය සාර්ථකව ස්ථාපනය කරන ලදී.

## 19.4 ආසියානු නිෂ්කාශන සංගමය යටතේ සිදු කරන ගනුදෙනු සඳහා පහසුකම් සැලසීම

2016 වසරේ දී ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් ආසියානු නිෂ්කාශන සංගමයෙහි සාමාජික රටවල් 9 අතර සිදුවන ජාත්‍යන්තර වෙළඳ ගනුදෙනු පියවීම සඳහා පහසුකම්

සැලසීම අඛණ්ඩව සිදු කරන ලදී. ආසියානු නිෂ්කාශන සංගම් යාන්ත්‍රණය හරහා ශ්‍රී ලංකාව, රුපියල් බිලියන 478.1 ක වටිනාකමකින් යුත් ගනුදෙනු 6,510 ක් සිදු කරන ලදී. එම යාන්ත්‍රණය යටතේ සිදු කරන ලද ශුද්ධ පියවීම්වල වටිනාකම රුපියල් බිලියන 409.4 ක් විය.

ආසියානු නිෂ්කාශන සංගමයේ 45 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම 2016 වසරේ ජූනි මාසයේ මියන්මාරයේ දී පැවැත්වූ අතර ශ්‍රී ලංකා මහ බැංකුවෙහි නියෝජ්‍ය අධිපති, ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවේ, අධ්‍යක්ෂක සහ ආසියානු නිෂ්කාශන අංශයේ අංශ ප්‍රධානි එම රැස්වීමට සහභාගි විය.

## 19.5 ජාතික ගෙවීම් යාන්ත්‍රණය ගොඩනැගීම සඳහා පහසුකම් සැලසීම

ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, "ලංකාපේ" (LankaPay) සන්නාමය යටතේ ලංකාක්ලියර් (පෞද්ගලික) සමාගම මගින් මෙහෙයවනු ලබන කාඩ්පත් සහ අනෙකුත් ගෙවීම් ආශ්‍රිත පොදු ගෙවීම් යාන්ත්‍රණයෙහි ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම අඛණ්ඩව සිදු කරන ලදී. රටෙහි ජාතික ගෙවීම් යාන්ත්‍රණය ලෙස නම් කරන ලද කාඩ්පත් සහ අනෙකුත් ගෙවීම් ආශ්‍රිත පොදු ගෙවීම් යාන්ත්‍රණය පද්ධති 5 කින් සමන්විත වේ. එනම්, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සඳහා වූ පොදු ගෙවීම් යාන්ත්‍රණය (CAS), විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණය (CEFTS), ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සඳහා ස්වකීය යාන්ත්‍රණයක් නොමැති අය වෙනුවෙන් වූ හවුල් සේවා යාන්ත්‍රණය (SAS), විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර ආශ්‍රිත පොදු යාන්ත්‍රණය (CPS) සහ ජංගම දුරකථන ආශ්‍රිත ගෙවීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය (CMobS) වේ. කාඩ්පත් සහ අනෙකුත් ගෙවීම් ආශ්‍රිත පොදු යාන්ත්‍රණයේ ජාතික වැදගත්කම සැලකිල්ලට ගෙන ඒ සඳහා පහසුකම් සැපයීම සඳහා ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව, කාඩ්පත් සහ අනෙකුත් ගෙවීම් ආශ්‍රිත පොදු ගෙවීම් යාන්ත්‍රණ කටයුතුවල ක්‍රියාකාරිත්වය සහ 2015 අංක 07 දරන ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛය මගින් කාඩ්පත් සහ අනෙකුත් ගෙවීම් ආශ්‍රිත පොදු ගෙවීම් යාන්ත්‍රණය සමඟ සම්බන්ධ වීමට අදාළව නියම කරන ලද කාලසීමාවන් නිරීක්ෂණය කිරීම සිදු කරන ලදී. 2016 වසර අවසාන වන විට කාඩ්පත් සහ අනෙකුත් ගෙවීම් ආශ්‍රිත පොදු ගෙවීම් යාන්ත්‍රණයේ ප්‍රගතිය පහත දැක්වේ.

(අ) කාඩ්පත් සහ අනෙකුත් ගෙවීම් ආශ්‍රිත පොදු ගෙවීම් යාන්ත්‍රණයේ ප්‍රථම පද්ධතිය ලෙස, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සඳහා වූ පොදු ගෙවීම් යාන්ත්‍රණය 2013 ජූලි මාසයේ දී මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලදී. 2016 අවසාන වන විට ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සඳහා වූ පොදු ගෙවීම් යාන්ත්‍රණයේ සාමාජික සංඛ්‍යාව 23 ක් වූ අතර ඊට සම්බන්ධ වී තිබූ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාව 3,800 ඉක්මවන ලදී. මෙම යාන්ත්‍රණය මගින් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර හරහා මුදල් ගැනීමේ හා ශේෂය පරීක්ෂා කිරීමේ පහසුකම් සපයනු ලබයි. 2016 වසරේ දී ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සඳහා වූ පොදු ගෙවීම් යාන්ත්‍රණය හරහා රුපියල් බිලියන 174 ක වටිනාකමකින් යුත් ගනුදෙනු මිලියන 31.3 ක් සිදු කරන ලදී.

(ආ) කාඩ්පත් සහ අනෙකුත් ගෙවීම් ආශ්‍රිත පොදු ගෙවීම් යාන්ත්‍රණයෙහි දෙවන උප පද්ධතිය වන විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණය 2015 අගෝස්තු මාසයේ දී ආරම්භ කරන ලදී. විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණය ගනුදෙනුකරුවන්ට අන්තර්ජාලය පදනම් කරගත් බැංකු කටයුතු, ජංගම දුරකථන පදනම් කරගත් බැංකු කටයුතු මගින්, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර, කියොස්ක් යන්ත්‍ර සහ බැංකු කවුළුව වෙතින් යන විවිධ ක්‍රම හරහා තත්කාලීනව අරමුදල් යැවීමට පහසුකම් සලසයි.

2016 අවසන් වන විට විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයට මූල්‍ය ආයතන 22 ක් සම්බන්ධ වී සිටි අතර එමගින් වටිනාකම රුපියල් බිලියන 69.4 ක් වූ ගනුදෙනු 894,674 ක් සඳහා පහසුකම් සපයන ලදී.

(ඇ) ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සඳහා වූ හවුල් සේවා යාන්ත්‍රණය 2015 අගෝස්තු මාසයේ දී එක් සාමාජික ආයතනයක් සහිතව ආරම්භ කළ අතර මේ මගින් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සේවාව සැපයීම සඳහා ස්වකීය ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර යාන්ත්‍රණයන් නොමැති මූල්‍ය ආයතන සඳහා පහසුකම් සපයයි.

## 19.6 ගෙවීම් සහ පියවීම් පද්ධති නියාමනය සහ අවේක්ෂණය

විද්‍යුත් ගෙවීම් පද්ධතිවල සුරක්ෂිතභාවය සහ කාර්යක්ෂමතාව තහවුරු කිරීම සඳහා ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව එහි නියාමන සහ අවේක්ෂණ කටයුතු තවදුරටත් සිදු කරන ලදී. ඒ අනුව, 2016 වසර තුළ දී ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව පහත දැක්වෙන ප්‍රධාන කාර්යයන් සිදු කරන ලදී.

(අ) 2013 අංක 1 දරන ගෙවීම් කාඩ්පත් සහ ජංගම දුරකථන ආශ්‍රිත ගෙවීම් පද්ධති සඳහා වන නියෝග යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව 2016 වසරේ දී බලපත්‍ර දෙකක් නිකුත් කරන ලද අතර එක් මූල්‍ය ආයතනයකට ගෙවීම් කාඩ්පත් නිකුත් කරන්නෙකු ලෙස ද, අනෙක් මූල්‍ය ආයතනයට ගෙවීම් කාඩ්පත් නිකුත් කරන්නෙකු සහ ගනුදෙනුකරුවන්ගේ ගිණුම් පදනම් කරගත් ජංගම දුරකථන ආශ්‍රිත ගෙවීම් පද්ධතියක ක්‍රියාකරුවෙක් ලෙස කටයුතු කිරීමට ද බලපත්‍ර ලබා දෙන ලදී. ඒ අනුව, 2016 වසර අවසානයේ දී, බලපත්‍රලාභී සේවා සැපයුම්කරුවන් සංඛ්‍යාව 35 දක්වා වැඩි විය.

(ආ) ජංගම දුරකථන පදනම් කරගත් විද්‍යුත් මුදල් පද්ධතිවල පවතින අවදානම් සැලකිල්ලට ගනිමින්, ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව ජංගම දුරකථන පදනම් කරගත් විද්‍යුත් මුදල් පද්ධති මෙහෙයවීම සඳහා

බලපත්‍රලාභී සේවා සැපයුම්කරුවන්ගේ විද්‍යුත් මුදල් පද්ධතිවල කටයුතු පරීක්ෂා කිරීමට එතැන් පරීක්ෂණ කටයුතු සිදු කිරීමත් එම පද්ධතිවල විශ්වසනීයත්වය සහ සුමට ක්‍රියාකාරිත්වය තහවුරු කිරීම සඳහා අදාළ සේවා සැපයුම්කරුවන්ට නිර්දේශ නියම කිරීමත් සිදුකරන ලදී.

(ඇ) දෛනික සුළු පරිමාණ ගෙවීම් කටයුතු සිදු කිරීම සඳහා සුරක්ෂිත සහ විශ්වාසදායී ගෙවීම් පද්ධතීන් පවත්වාගෙන යෑම සහතික කිරීම සඳහා ණය කාඩ්පත් සහ ජංගම දුරකථන ආශ්‍රිත ගෙවීම් පද්ධති සඳහා වන මාර්ගෝපදේශයන්ට සහ අනෙකුත් රෙගුලාසිවලට සේවා සැපයුම්කරුවන්ගේ අනුකූලතාව පරීක්ෂා කිරීමට දුරස්ථ අවේක්ෂණ කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී.

(ඈ) හදිසි අවස්ථාවක දී තම ව්‍යාපාර මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා වන සූදානම තහවුරු කර ගැනීම සඳහා ලංකාසෙටල් පද්ධතියෙහි සහභාගිත්ව ආයතන සහ ලංකාක්ලියර් (පෞද්ගලික) සමාගමෙහි ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් ඇගයීමට ලක් කරන ලදී.

### 19.7 ජාතික ගෙවීම් කවුන්සිලය

2005 අංක 28 දරන ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනතේ විධිවිධාන යටතේ ගෙවීම් පද්ධති පිළිබඳ උපදේශන සහ නිරීක්ෂණ කමිටුව ලෙස 2006 දී පිහිටුවන ලද ජාතික ගෙවීම් කවුන්සිලයේ ප්‍රතිපත්ති ක්‍රියාවෙහි යොදවන්නා ලෙස ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී.

ජාතික ගෙවීම් සභාව ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ඊට අදාළ දෙපාර්තමේන්තු, බලපත්‍රලාභී බැංකු, මූල්‍ය ක්ෂේත්‍රයේ ආයතන හා සංගම් සහ ජංගම දුරකථන පදනම් කරගත් සේවා සපයන්නන්ගෙන් සමන්විත වේ.

වසර තුළ දී ජාතික ගෙවීම් කවුන්සිලයේ රැස්වීම් 3 ක් පැවැත්වූ අතර නව තාක්ෂණය යොදා ගැනීම, නව ගෙවීම් ක්‍රමවේද සහ ස්ථායීතාව සහ ගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීම කෙරෙහි යොමු වූ නියාමනය ඇතුළත් වන පරිදි ගෙවීම් පද්ධතිවල මැදිකාලීන සංවර්ධනය සඳහා ප්‍රතිපත්ති පෙර දැක්ම සෑදීමට අවශ්‍ය සාමූහික උපදේශන ක්‍රියාවලිය ජාතික ගෙවීම් කවුන්සිලය විසින් අඛණ්ඩව සිදු කරගෙන යන ලදී.

### 19.8 මහජනතාව දැනුම්වත් කිරීම

ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් රටෙහි ක්‍රියාත්මක ගෙවීම් සහ පියවීම් පද්ධති පිළිබඳ තොරතුරු සහ සංඛ්‍යාලේඛන ප්‍රචාරය කිරීම සඳහා නිකුත් කරනු ලබන කාර්තුමය විවරණිකාව (Payments Bulletin) ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවියෙහි අඛණ්ඩව ප්‍රකාශයට පත් කරන ලදී. තවද, අවශ්‍යතාව මත පදනම්ව, ගෙවීම් පද්ධති සහ වෙනත් සම්බන්ධිත කරුණු පිළිබඳව සාමාන්‍ය ජනතාව සහ බැංකු කාර්යමණ්ඩල දැනුවත් කිරීමේ අරමුණින් වැඩසටහන් 11 ක් ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලදී. විද්‍යුත් ගෙවීම් පිළිබඳව පොදු මහජනතාව උනන්දු කිරීම සඳහා එදිනෙදා ගනුදෙනු කර ගැනීම සඳහා තිබෙන සුළු පරිමාණ ගෙවීම් පද්ධති පිළිබඳ පොදු මහජනතාව දැනුම්වත් කිරීමට ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් ගෙවීම් උපකරණ පිළිබඳ පුවත්පත් දැන්වීම් පළ කරන ලදී.

## 20. ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ

ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුවට ශ්‍රී ලංකා මහ බැංකුවේ උපායමාර්ගික සැලසුම පිළියෙළ කිරීමේ කටයුතු සම්බන්ධීකරණය සහ එහි ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය නිරීක්ෂණය කර කළමනාකාරිත්වය වෙත කාලීනව වාර්තා කිරීමේ වගකීම පැවරී ඇත. දෙපාර්තමේන්තුවේ 2016 තුළ දී ඉටු කළ ක්‍රියාකාරකම් පහත සාරාංශගත කර ඇත.

### 20.1 උපායමාර්ගික සැලසුම පිළියෙළ කිරීම, ප්‍රගතිය නිරීක්ෂණය කිරීම හා කළමනාකාරිත්වයට වාර්තා කිරීම.

"මානව ප්‍රාග්ධන වර්ධනය සහ ශක්‍යතා සංවර්ධනය" යන තේමාව යටතේ පිළියෙළ කරන ලද 2016-2018 සඳහා වන ශ්‍රී ලංකා මහ බැංකුවේ උපායමාර්ගික සැලසුම 2016 ජනවාරි මස 01 වන දින පැවැත්වූ අලුත් අවුරුදු වැඩ ඇරඹීමේ උත්සවයේ දී ඉදිරිපත් කරන ලදී. ඉන්පසුව එක් එක් දෙපාර්තමේන්තුවල අරමුණු සහ ප්‍රතිපත්ති පිළිබඳවද, එම අරමුණු කරා ළඟා වීමට අනුගමනය කළ යුතු උපක්‍රමයන් සහ ප්‍රගති සමාලෝචනයට යොදා ගන්නා මූලික කාර්යසාධන දර්ශක පිළිබඳවද මහ බැංකු කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම සඳහා 2016-2018 උපායමාර්ගික සැලසුම් ප්‍රකාශනයේ පිටපත් බෙදා දෙන ලදී. ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් උපායමාර්ගික සැලසුම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා සියලු දෙපාර්තමේන්තු සමඟ ප්‍රගති සමාලෝචන රැස්වීම් කාලීන වශයෙන් පවත්වන ලද අතර කළමනාකාරිත්වය වෙත එම ප්‍රගතිය වාර්තා කරන ලදී.

2016 වර්ෂයේ දෙවන අර්ධය තුළ දී 2017-2021 කාලපරිච්ඡේදය සඳහා වූ උපායමාර්ගික සැලැස්ම පිළියෙළ කිරීමේ කටයුතු ආරම්භ කෙරිණි. නව උපායමාර්ගික සැලැස්ම සාකච්ඡාවට ලක් කෙරෙන කළමනාකාරිත්ව සංසදය වන උපායමාර්ගික කතිකාවත 2016 වසරේ නොවැම්බර් මස අධිපති, මුදල් මණ්ඩලයේ සාමාජිකයින්, මුදල් මණ්ඩල උපදේශක විගණන කමිටුවේ සාමාජිකයින්, ආයතනික කළමනාකරණ කණ්ඩායම, දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ අනෙකුත් අදාළ නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් පවත්වන ලදී. වර්තමානයෙහි රටෙහි පවතින රාජ්‍ය මූල්‍ය සහ ණය ගතිකත්වයන් මගහැරීම පිණිස ප්‍රතිපත්තිමය පියවර ගැනීමේ අවශ්‍යතාව ඉස්මතු කිරීම සඳහා 2017-2021 උපාය මාර්ගික සැලැස්ම "විෂම චක්‍රය බිඳ දැමීම" යන තේමාව යටතේ පිළියෙළ කරන ලදී.

විෂම චක්‍රය බිඳ දැමීම පිණිස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරනු ලබන නව වැඩසටහන්, ව්‍යාපෘති සහ ක්‍රියාකාරකම් උපායමාර්ගික සැලැස්ම තුළ ඇතුළත් කර ඇති අතර 2017-2021 සැලසුම ද කාර්ය මණ්ඩලයට ලබා දී ඇත.

### 20.2 ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශයට වාර්තා ඉදිරිපත් කිරීම.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ක්‍රියාකාරකම් පිළිබඳව අදාළ දෙපාර්තමේන්තුවලින් ලබා ගන්නා උපායමාර්ගික සැලසුම් සහ ප්‍රගති වාර්තා ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ඉල්ලීම් අනුව ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලදී.

## 21. රාජ්‍ය ණය

රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව මුදල් නීති පනතේ 113 වගන්තියට අනුව රජයේ නියෝජිත වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැවරී ඇති රාජ්‍ය ණය කළමනාකරණය කිරීමේ ව්‍යවස්ථාපිත වගකීම් ඉටු කරයි. එම වගකීම් ඉටුකිරීම සඳහා රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව 1950 අගෝස්තු මස 28 වන දින ශ්‍රී ලංකා මහ බැංකුවේ ආරම්භයත් සමඟ පිහිටුවන ලදී. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් වනුයේ, විසර්ජන පනතෙහි සඳහන් දළ ණය ගැනීම් අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා අරමුදල් රැස් කිරීම, නියමිත කාලය තුළ රජයේ ණය සේවාකරණ ගෙවීම් සිදු කිරීම, රාජ්‍ය සුරැකුම්පත් ගනුදෙනු පියවීමේ පහසුකම් සුමටව සිදු කිරීම සඳහා ලංකාසෙකියු (LankaSecure) පද්ධතිය මගින් පහසුකම් සැලසීම සහ මධ්‍යම තැන්පතු පද්ධතියේ (CDS) රාජ්‍ය සුරැකුම්පත් ලේඛනය පවත්වාගෙන යෑම වේ. මීට අමතරව, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව ණය වෙළඳපොළ දියුණු කිරීමෙහිලා කටයුතු කරයි.

### 21.1 විසර්ජන පනතට අනුව රජයේ දළ ණය ගැනීම් සඳහා අරමුදල් රැස් කිරීම.

(අ) 2016 වසරේ දී, රජයේ දළ අරමුදල් අවශ්‍යතාවය මූල්‍යනය කිරීම සඳහා ප්‍රධාන වශයෙන් භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර, ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර හා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතු මගින් දේශීය හා විදේශීය මූලාශ්‍රයන්ගෙන් අරමුදල් රැස් කිරීම සිදු විය.

(ආ) ඉහත සඳහන් කළ ණය උපකරණ මගින් සිදු කරනු ලැබූ මූල්‍යන කටයුතු පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

**II-22 සංඛ්‍යා සටහන**

**2015 සහ 2016 වර්ෂයේ කල්පිරීම් හා වෙන්දේසි කාර්යසාධනය**

| උපකරණය | 2015 | | 2016 | |
|---|---|---|---|---|
| | නිකුත් කිරීම් රු.බිලියන | වෙන්දේසි ගණන | නිකුත් කිරීම් රු.බිලියන | වෙන්දේසි ගණන |
| භාණ්ඩාගාර බිල්පත් | 1,589.5 | 52 | 1,635.4 | 52 |
| භාණ්ඩාගාර බැඳුම්කර | 869.9 | 36 | 663.6 | 23 |
| | නිකුත් කිරීම් ඇ.එ.ජ. ඩොලර් මිලියන | වෙන්දේසි ගණන | නිකුත් කිරීම් ඇ.එ.ජ. ඩොලර් මිලියන | වෙන්දේසි ගණන |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර (SLDB) | 2,491.4 | 5 | 1,365.9 | 6 |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර (ISB) | 2,150.0 | 2 | 1,500.0 | 1 |

(ඇ) භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කරවලින් සමස්ත ශුද්ධ විදේශ ගලා යෑම් ඇ.එ.ජ. ඩොලර් මිලියන 324.3 ක් වූ අතර එය වසර තුළ භාණ්ඩාගාර බිල්පත්වලින් විදේශීය ගලා ඒම් ඇ.එ.ජ.ඩොලර් මිලියන 45.3 කින් හා භාණ්ඩාගාර බැඳුම්කරවලින් විදේශීය ගලායෑම් ඇ.එ.ජ.ඩොලර් මිලියන 369.6 කින් සමන්විත විය.

(ඈ) ශ්‍රී ලංකා මහ බැංකුවේ දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය හා ඇමරිකා එක්සත් ජනපද ප්‍රතිපත්ති පොලී අනුපාතිකයේ වැඩිවීම 2016 වසර තුළ දේශීය හා විදේශීය වෙළෙඳපොළවල පොලී අනුපාතික ඉහළ යෑමට දායක විය. මෙම පරිසරය තුළ, 2015 වසරේ දිගුකාලීන නිකුතුවලට සාපේක්ෂව 2016 වසරේ දී වැඩි වශයෙන් කෙරෙන්නට යෙදුණු කෙටි හා මධ්‍යකාලීන රාජ්‍ය සුරැකුම්පත් නිකුත් කිරීම් හේතුකොට එතෙක් නොපියවූ දේශීය ණය ප්‍රමාණයේ පරිණතියට ඇති සාමාන්‍ය කාලය 2015 වසර අග දී තිබූ වසර 6.28, 2016 වසර අග දී වසර 5.98 දක්වා පහළ වැටිණි. මේ අතර, 2016 දී වෙළෙඳපොළේ සියලු ම රාජ්‍ය සුරැකුම්පත් නිකුතු, වෙන්දේසි පදනම මත සිදු විය.

### 21.2 රජයේ ණය සේවාකරණ

වසර තුළ දී සිදු කරන ලද සමස්ත රාජ්‍ය ණය ගෙවීම් රුපියල් බිලියන 1,334.73 ක් වූ අතර, එය දේශීය ණය සේවාකරණ ගෙවීම් රුපියල් බිලියන 1,042.72 කින් සහ විදේශ ණය සේවාකරණ ගෙවීම් රුපියල් බිලියන 292.01 කින් සමන්විත විය.

### 21.3 රාජ්‍ය සුරැකුම්පත් පියවීමේ පහසුකම් සැලසීම

රාජ්‍ය සුරැකුම්පත්වල ප්‍රාථමික හා ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු පියවීමේ පහසුකම් සැලසීම සඳහා ලංකාසෙකියු (LankaSecure) පද්ධතිය භාවිතා කරන ලදී. මෙම පද්ධතිය ඔවුන් වෙනුවෙන් සහ ඔවුන්ගේ ගනුදෙනුකරුවන් වන අනෙකුත් ආයෝජකයන් වෙනුවෙන් ගිණුම් පවත්වාගෙන යනු ලබන සෘජු අලෙවි සහභාගිකරුවන් 33 දෙනෙකුගෙන් (බලපත්‍රලාභී වාණිජ බැංකු 25 ක් සහ ප්‍රාථමික අලෙවි සමාගම් 8 ක්) සහ ඔවුන් වෙනුවෙන් පමණක් ගිණුම් පවත්වාගෙන යනු ලබන සෘජු සහභාගිකරුවන් 3 දෙනෙකුගෙන් (සේවක අර්ථසාධක අරමුදලද ඇතුළුව) සමන්විත වේ. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව ලංකාසෙකියු පද්ධතියෙහි අඛණ්ඩව හා තත්කාලීනව මෙහෙයුම් සිදුවන බව සහතික කරමින් පියවීමේ කටයුතුවලට අදාළ පහසුකම් සැපයීම සඳහා ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු ලබයි. 2016 දෙසැම්බර් මස අවසාන වන විට සමස්ත නිර්ලේඛිත සුරැකුම්පත්වල මුහුණත වටිනාකම රුපියල් බිලියන 4,846.0 ක් වූ අතර එය

රුපියල් බිලියන 792.4 ක් වූ භාණ්ඩාගාර බිල්පත් සහ රුපියල් බිලියන 4,053.6 ක් වූ භාණ්ඩාගාර බැඳුම්කරවලින් සමන්විත විය.

## 21.4 රාජ්‍ය සුරැකුම්පත් ලේඛනය පවත්වාගෙන යෑම

රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් මධ්‍යම තැන්පතු පද්ධතියේ (CDS) රාජ්‍ය සුරැකුම්පත් හිමිකාරිත්වයේ සිදුවන වෙනස්කම් යාවත්කාලීනව පවත්වාගෙන යෑම, ද්විතීයික වෙළඳපොළ සුමට ලෙස පවත්වාගෙන යෑමට උපකාරී විය. 2013 අගෝස්තු 01 වන දින නිකුත් කරන ලද ලංකාසෙට්ල් (LankaSettle) පද්ධති නීති (2.1 අනුවාදය) සංශෝධනයන්ට අනුකූල වන පරිදි රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් නිර්ලේඛිත සුරැකුම්පත් පියවීමේ පද්ධතිය (SSSS) සඳහා නව ගිණුම් වර්ගයන් හඳුන්වා දෙන ලදී. මේ අතර මධ්‍යම තැන්පතු පද්ධතියේ (CDS) ගිණුම් හිමියන්ට කාලීන හිමිකම්, ගනුදෙනු සහ ගෙවීම් ප්‍රකාශයන් යැවීමේ කාර්යය වසර පුරා අඛණ්ඩව සිදු විය. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව මගින් 2016 වසර තුළ විද්‍යුත් තැපෑල මගින් විද්‍යුත් ප්‍රකාශනයන් 1,506 ක් සහ සාමාන්‍ය තැපෑල මගින් අර්ධ වාර්ෂික හිමිකම් ප්‍රකාශන 23,161 ක්, මාසික ගනුදෙනු ප්‍රකාශන 63,177 ක් සහ ගෙවීම් ප්‍රකාශන 40,065 ක් මධ්‍යම තැන්පතු පද්ධතියේ (CDS) ගිණුම් හිමියන් වෙත යවන ලදී. තවද, මධ්‍යම තැන්පතු පද්ධතියේ (CDS) ගිණුම් හිමියන්ට තම යාවත්කාලීන ගිණුම් තොරතුරු අන්තර්ජාල ගිණුමක් හරහා පරීක්ෂා කිරීමේ පහසුකම ලබා දෙන ලදී. 2016 දෙසැම්බර් මස අග වන විට මධ්‍යම තැන්පතු පද්ධතියේ (CDS) මුළු ලියාපදිංචි ගිණුම් හිමියන් සංඛ්‍යාව 92,065 ක් විය.

## 21.5 පද්ධති ප්‍රතිසංස්කරණ

රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව මගින් ප්‍රශස්ත වූ සේවාවක් ලබාදීම සඳහා පහත සඳහන් පද්ධති ප්‍රතිසංස්කරණයන් 2016 වසර තුළ දී සිදු කරන්නට යෙදුණි.

(අ) රාජ්‍ය සුරැකුම්පත් ආයෝජකයන්ගේ සුරක්ෂිතභාවය සහ ප්‍රාථමික අලෙවිකරු පද්ධතියේ ස්ථාවරත්වය සහතික කිරීම සඳහා දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනත සහ ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥා පනත යටතේ නිකුත් කරන ලද රෙගුලාසි අනුව ප්‍රාථමික අලෙවිකරුවන් මෙහෙයවීම සහ සුපරීක්ෂණය, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පවරන ලදී.

(ආ) වෙළෙඳපොළ තොරතුරුවල ඒකීයභාවය සමඟ වෙළෙඳපොළ විනිවිදභාවය වැඩිදියුණු කිරීමේ අපේක්ෂාවෙන් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව සියලුම ප්‍රාථමික අලෙවිකරුවන්ගේ සහභාගීත්වයෙන් 2016 ජූලි මස සිට ඉදිරි වෙන්දේසි සඳහා පූර්ව ලංසු රැස්වීම් මෙහෙයවීම ආරම්භ කරන ලදී. ඒ අනුව විනිවිදභාවය තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා වසරේ අවසාන භාගයේ සිට භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර එක් එක් වෙන්දේසි තුළින් පිළිගත් සමස්ත ලංසු වටිනාකම වෙන්දේසි සඳහා ඉදිරිපත් කළ සමස්ත වටිනාකමට සීමා කරන ලදී.

(ඇ) ඒ හා සමගාමීව විනිවිදභාවය ඉහළ නැංවීම සඳහා, 2016 වසරේ අගෝස්තු මස සිට මහා භාණ්ඩාගාරයේ නිලධාරීන් දෙදෙනෙකු භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර හා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ටෙන්ඩර් කමිටු සාමාජිකයන් ලෙස පත්කර ඇත.

(ඈ) රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් වෙන්දේසි දිනය සහ පරිණත කාලය හා තවත් තොරතුරු ඇතුළත් කොට වෙන්දේසි දින දර්ශනය ඉදිරිපත් කොට ඇත. මෙය මුදල් අමාත්‍යාංශයේ එකඟතාව සහිතව ප්‍රකාශනයට පත් කෙරෙන අතර, එමගින් ප්‍රාථමික වෙන්දේසි ක්‍රියාවලිය පුරෝකථනය පහසු කිරීම සහ ඉදිරි වෙන්දේසි පිළිබඳ තොරතුරු කල්වේලා ඇතුව ලබාදීම තහවුරු කර ඇත.

(ඉ) තවද රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවට, රාජ්‍ය ණය කළමනාකරණ ක්‍රමෝපායන් වර්ධනය සඳහා එක්සත් ජනපද භාණ්ඩාගාර උපදේශක තාක්ෂණික සහාය ද ලැබී ඇත.

## 21.6 ණය වෙළෙඳපොළ ප්‍රවර්ධනයන්

රාජ්‍ය ණය කළමනාකරණයේ අරමුණු වන්නේ අදාළ අවදානම් තත්ත්වයන් විචක්ෂණශීලී මට්ටමක පවත්වා ගනිමින් ලබාගත හැකි අවම පිරිවැයක් යටතේ රාජ්‍ය මූල්‍ය අවශ්‍යතාවන් සපුරා ගැනීමයි. ඒ සඳහා රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් විනිවිදභාවය තවදුරටත් වර්ධනය කිරීම මගින්, රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළ තුළ ඇති තරගකාරීත්වය වැඩි කිරීම හා එමගින් වෙළෙඳපොළ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම පිණිස, ණය වෙළෙඳපොළේ පහත සඳහන් මෑත කාලීන සංවර්ධනයන් සිදුකරන ලදී.

(අ) රජයේ සුරැකුම්පත් වෙළෙඳාම සඳහා බ්ලූම්බර්ග් (Bloomberg) ගනුදෙනු පද්ධතියක් හඳුන්වාදීම තුළින් වඩා හොඳ මිලක් අනාවරණය කරගැනීම, ඉහළ විනිවිදභාවය සහ ද්විතීයික වෙළෙඳපොළ තුළ වෙළෙඳපොළ පරිමාව සැලකිය යුතු මට්ටමකින් ඉහළ යෑම තුළින් පිළිබිඹු වන පරිදි විශ්වාසනීයත්වය වැඩි වීම ආදිය දැකිය හැක (වෙළෙඳපොළ පරිමාව - රුපියල් බිලියන 690.77, ගනුදෙනු සංඛ්‍යාව - 4,681). තවද, බ්ලූම්බර්ග් ඉලෙක්ට්‍රොනික් වෙළෙඳ පද්ධතිය ප්‍රතිමිලදී ගැනීම් ගනුදෙනු සඳහා පුළුල් කිරීමටත් මිලදී ගැනීමේ හා විකිණීමේ අපේක්ෂිත මිල ගණන් (Two-way Quotes) එම පද්ධතිය හරහා ප්‍රකාශයට පත් කිරීම අනිවාර්ය කිරීමටත් අපේක්ෂා කෙරේ.

(ආ) විදේශ ආයෝජකයන්ගේ සුරැකුම්පත් පියවීම් හා නිෂ්කාශන ක්‍රියාවලිය වඩාත් වැඩිදියුණු කිරීමේ අටියෙන්, රාජ්‍ය සුරැකුම්පත් සඳහා යුරෝනිෂ්කාශන හැකියාව (Euroclearability) ලබා ගැනීම පිණිස රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරමින් සිටී. එමගින් විදේශීය ආයෝජන පදනම විවිධාංගීකරණය වන අතරම සහ විදේශ ආයෝජකයන් හට රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළට ප්‍රවේශ වීමේ පහසුව වැඩිදියුණු වනු ඇත.

(ඇ) තවද, අවශ්‍ය නීතිමය රාමුව ඇති කිරීම සමගින් රජයේ සුරැකුම්පත් සඳහා විද්‍යුත් වෙළෙඳ පහසුකම් සහ මධ්‍යම ප්‍රතිපාර්ශ්ව නිෂ්කාශනාගාරයක් (CCP) පිහිටුවීමේ ක්‍රියාවලිය, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් එක්සත් ජනපද භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවේ තාක්ෂණික සහාය සමගින් සිදු කරමින් සිටී.

(ඈ) තවදුරටත් ශ්‍රී ලංකා මහ බැංකුවේ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව, භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර සඳහා අන්තර්ජාලය පදනම් කරගත් වෙන්දේසි පද්ධතිය යාවත්කාලීන කර ඇත. ස්වාධීන විගණනය අවසන් වූ පසුව මෙම වැඩිදියුණු කළ පද්ධතිය ක්‍රියාත්මක කරනු ඇත. වෙන්දේසි ක්‍රියාවලියේ විනිවිදභාවය තවදුරටත් වර්ධනය කරගැනීම සඳහා රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් සකස් කර ඇති වෙන්දේසි නීති, 2017 වසරේ දී ප්‍රකාශයට පත් කරනු ඇත. තවද, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව එක්සත් ජනපද භාණ්ඩාගාරයේ උපකාර සහිතව මිල සොයා ගැනීමේ යාන්ත්‍රණය සහ විනිවිදභාවය වැඩිදියුණු කිරීම අරමුණු කොට ගෙන පවතින වෙන්දේසි ක්‍රමවේදය තවදුරටත් සමාලෝචනය කරමින් සිටී.

### 21.7 ජාත්‍යන්තර ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීමේ කටයුතු සම්බන්ධීකරණය

රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාව සඳහා ජාත්‍යන්තර ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම් ලබාගැනීම තහවුරු කිරීමේ අරමුණින් අන්තර්ජාතික ශ්‍රේණිගත කිරීමේ ආයතන (ෆිච් රේටින්ග්ස් ලිමිටඩ්, මූඩීස් ඉන්වෙස්ටර් සර්විසස්, ස්ටෑන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස්) සමඟ ඔවුන්ගේ 2016 වාර්ෂික ශ්‍රේණිගත කිරීමේ සමාලෝචන සඳහා පහසුකම් සපයන ලද අතර ඔවුන්ගේ ශ්‍රේණිගත කිරීමේ සේවාවන් ද ඇගයීම් කරන ලදී.

## 22. ප්‍රාදේශීය සංවර්ධන

තුලිත හා සහභාගිත්ව ආර්ථික වර්ධනයක් ළඟා කර ගැනීමට සහායවීම සහ රට තුළ මූල්‍ය අන්තර්ගතභාවය ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම, පොලී සහනාධාර සහ ණය ඇප ආවරණ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය කිරීම හා පහසුකම් සැලසීම මෙන්ම ණය පරිපූරක සේවා සැපයීම ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2016 වසරේ දී අඛණ්ඩව සිදු කරන ලදී. මෙම ණය යෝජනා ක්‍රම ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා රජය, දායක අරමුදල් සපයන ආයතන සහ සහභාගිත්ව මූල්‍ය ආයතන මගින් මූල්‍යයනය කරනු ලබයි.

ඒ අනුව ණය යෝජනා ක්‍රමයන්හි ප්‍රතිලාභීන්ගේ මූල්‍ය අවශ්‍යතාවයන් සපුරා ගැනීමට හැකි ආකාරයට සහ දැරිය හැකි පිරිවැයකට කෘෂිකාර්මික, සත්ත්ව පාලන, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය යන අංශයන්හි මූල්‍ය අවශ්‍යතා ඇති පුද්ගලයන් සහ ව්‍යාපාර සඳහා සහනදායී ණය හා ණය ඇප ආවරණ යෝජනා ක්‍රම මගින් මූල්‍ය පහසුකම් ලබා දීම ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් සිදු කරන ලදී. තවද, විධිමත් මූල්‍ය අංශයෙන් බැහැරව සිටින පුද්ගලයන් ඉලක්ක කර ගනිමින් දැනුම්වත් කිරීමේ හා නිපුණතා සංවර්ධනය කිරීමේ වැඩසටහන් මාලාවක් වසර පුරා පැවැත්වීම සහ විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය යොදාගනිමින් දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරන විවිධ ණය යෝජනා ක්‍රම පිළිබඳව මහජනයා දැනුම්වත් කිරීම ද සිදු කරන ලදී.

ප්‍රතිපත්තිමය වශයෙන් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය තවදුරටත් සංවර්ධනය කිරීම ඉලක්ක කරගනිමින්, ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ක්‍රියාත්මක කරන ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම ප්‍රචලිත කිරීම සඳහා 2016 වසර තුළදී විවිධ ප්‍රතිපත්තිමය යෝජනා ක්‍රියාත්මක කරන ලදී. මෙම ක්‍රියාමාර්ග වලින් කිහිපයක් ලෙස, මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමයෙහි ණය ආපසු ගෙවීමේ කාලය ඉහළ නැංවීම සහ ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහනෙහි අවම ණය සීමාව වෙනස් කිරීම ආදිය දැක්විය හැකියි.

### 22.1 ණය/ණය ඇප ආවරණ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම

2016 වසරේ දී ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව ණය හා ණය ඇප ආවරණ යෝජනා ක්‍රම 13 ක් ක්‍රියාත්මක කිරීම මගින් අඛණ්ඩව මූල්‍ය සේවාවන්ගේ පරාසය වඩාත් පුළුල් කිරීම සඳහා කටයුතු කරන ලදී. (සංඛ්‍යා සටහන II-23) මෙම යෝජනා ක්‍රම අතර, ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යයනය කරනු ලබන ස්වයං රැකියා ප්‍රවර්ධක මූලාරම්භ ණය යෝජනා ක්‍රමය අදියර - II සහ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල මගින් මූල්‍යයනය කරනු ලබන ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන යෝජනා ක්‍රම දෙකක් ද ඇතුළත් වේ.

සමස්තයක් ලෙස ගත් විට, 2016 වසර තුළදී ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සහභාගිත්ව මූල්‍ය ආයතන මගින් ණය ප්‍රතිලාභීන් 136,503 ක් සඳහා රුපියල් මිලියන 20,809.1 ක ණය මුදල් ප්‍රමාණයක් මුදාහැර ඇත. මෙම ණය මුදල් ප්‍රමාණයෙන් සියයට 63.3 ක් පොලී සහනාධාර ණය යෝජනා ක්‍රම යටතේ ලබා දී ඇති අතර, සියයට 36.7 ක් ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම යටතේ ලබා දී තිබේ. 2016 වසර තුළදී මුදා හැර ඇති මුළු ණය මුදල් ප්‍රමාණයෙන් සියයට 46.4 ක් කෘෂිකාර්මික හා සත්ත්ව පාලන අංශය සඳහා ලබා දී ඇති අතර, පිළිවෙලින් සියයට 40.6 ක් සහ සියයට 13.0 ක් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සහ ක්ෂුද්‍ර මූල්‍ය අංශය සඳහා ලබා දී ඇත.

2016 වසර තුළදී ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද ණය යෝජනා ක්‍රම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

### 22.2 කෘෂිකාර්මික හා සත්ත්ව පාලන අංශය

ආර්ථික වර්ධනය සඳහා කෘෂිකාර්මික හා සත්ත්ව පාලන අංශයෙහි දායකත්වය හඳුනා ගනිමින් 2016 වසර තුළදී ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සහනදායී ණය හා ණය ඇප ආවරණ යෝජනා ක්‍රම තුනක් මගින් මෙම අංශයට ණය ලබා දීම අඛණ්ඩව සිදු කරන ලදී. මෙම අංශය සඳහා

**II-23 සංඛ්‍යා සටහන**

**2016 වසර තුළ දී ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලැබූ ණය යෝජනා ක්‍රම**

| | ණය යෝජනා ක්‍රමයේ නම | අරමුදල් සපයන ලද ආයතන | ණය යෝජනා ක්‍රමයෙහි අරමුණ | යෙදවීමට අපේක්ෂිත මුළු අරමුදල් ප්‍රමාණය (රු.මිලියන) | 2016 වසරේ මුදාහළ අරමුදල් ප්‍රමාණය (රු.මිලියන) | මුදාහැරීමට ඇති ඉතිරි අරමුදල් ප්‍රමාණය (රු.මිලියන) | ණයකරුවන් ගෙවිය යුතු වාර්ෂික පොලී අනුපාතිකය (වසර අවසානයේදී) |
|---|---|---|---|---|---|---|---|
| 1. | කෘෂිකාර්මික හා සත්ත්ව පාලන අංශය | | | | | | |
| 1.1 | තේ සංවර්ධන චක්‍රීය අරමුදල් ණය ව්‍යාපෘතිය (TDP - RF) | ශ්‍රී ලංකා රජය | කුඩා තේ වතු හිමියන්ගේ ආදායම තිරසාර ලෙස ඉහළ දැමීම සහ අපනයන වෙළඳපොළ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම මගින් HACCP* සහතිකය ලබා ගැනීම සඳහා තේ කර්මාන්තශාලා නවීකරණය කිරීමට අවශ්‍ය මූල්‍ය පහසුකම් සැපයීම | 1,100 | 17.82 | 135.13 | 9% |
| 1.2 | නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය (NCRCS) | සහභාගීත්ව මූල්‍ය ආයතන සතු අරමුදල් සහ ශ්‍රී ලංකා රජයේ පොලී සහනාධාර | වී සහ කෙටි කාලීන භෝග වගාවන්හි නියුතු ක්ෂුද්‍ර හා සුළු පරිමාණ ගොවීන්ගේ සමාජ ආර්ථික තත්ත්වයන් ඉහළ නැංවීම | අරමුදල් සඳහා වන ඉල්ලුම මත | 8,009.21 | අදාළ නොවේ | 7% |
| 1.3 | මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමය (CSDDLS) | සහභාගිත්ව මූල්‍ය ආයතන සතු අරමුදල් සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ පොලී සහනාධාර පහසුකම් | වාණිජ මට්ටමේ කිරි ගොවිපළවල් පිහිටුවීම තුළින් කිරි සහ කිරි නිෂ්පාදනවලින් ස්වයංපෝෂිතභාවය ළඟාකර ගැනීමට සහාය වීම | අරමුදල් සඳහා වන ඉල්ලුම මත | 1,633.49 | අදාළ නොවේ | 6% |
| 2. | ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායික අංශය | | | | | | |
| 2.1 | ස්වයං රැකියා ප්‍රවර්ධන මූලාරම්භක ණය යෝජනා ක්‍රමය (SEPI) | ශ්‍රී ලංකා රජය | පිළිගත් වෘත්තීය පුහුණු ආයතනවලින් පුහුණුව ලැබූ තරුණ පිරිස් සඳහා මූල්‍ය සහාය සැපයීම | 75 | 74.90 | - | 7% |
| 2.2 | සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය | ශ්‍රී ලංකා මහ බැංකුව | ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘති හෝ වෙනත් ව්‍යසනයක බලපෑමකට ලක් වූ එවැනි ව්‍යාපෘති ඇරඹීමට හෝ පවතින ව්‍යාපාර වැඩිදියුණු කිරීම | 4,767.12 | 4,767.12 | - | 8% |
| 2.3 | කුඩා වතු ව්‍යවසාය සංවර්ධන වැඩසටහන (SPEnDP) | කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (IFAD) | මැදරට ප්‍රදේශයේ තේ සහ බහු වාර්ෂික භෝග වගා කරන කුඩා වතු හිමියන්ගේ සහ මොණරාගල දිස්ත්‍රික්කයේ අන්තර් කලාපීය ප්‍රදේශයන්හි උස්බිම්වල ආහාර භෝග වගා කරන රබර් වගාව සඳහා යොමු වීමට කැමති ගොවීන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම | 63.18 | 63.18 | අවසන් කර ඇත | 7% |
| 2.4 | වියළි කලාපීය ජීවනෝපායයන් සඳහා සහාය වීමේ හා හවුල්වීමේ වැඩසටහන-චක්‍රීය අරමුදල | කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (IFAD) | උතුරු හා නැගෙනහිර පළාත්වල ගැටුම්වලින් හානියට පත් නිවාස අලුත්වැඩියා කිරීම සඳහා ණය පහසුකම් සැපයීම | 252.9 | 21.5 | 0.4 | 10% |
| 2.5 | තේ කර්මාන්තශාලා සඳහා කාරක ප්‍රාග්ධන ණය යෝජනා ක්‍රමය (WCLSTF) | සහභාගිත්ව මූල්‍ය ආයතන සතු අරමුදල් සහ ශ්‍රී ලංකා රජයේ පොලී සහනාධාර | ලියාපදිංචි කරන ලද තේ කර්මාන්ත සඳහා අවශ්‍ය කාරක ප්‍රාග්ධනය සපයා ගැනීමට සහායවීම | පොලී සහනාධාර සඳහා අනුමත අරමුදල් සඳහා වන ඉල්ලුම මත | 3,539.83 | අදාළ නොවේ | (හරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතය +1.0% - 2.0%) |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 3. | ක්ෂුද්‍ර මූල්‍ය හා වෙනත් අංශ | | | | | | |
| 3.1 | ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන (NADeP) | | | | | | |
| 3.1.1 | ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රමය | කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (IFAD) | ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන තෝරාගත් ප්‍රදේශවල දුප්පත් ජන කොටස්වල ආදායම් මට්ටම සහ සමාජ තත්ත්වය දියුණු කිරීම. | 743 | 730.70 | 12.2 | 6.5% |
| 3.1.2 | තරුණ දිරිය ණය යෝජනා ක්‍රමය | කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (IFAD) | සුළු පරිමාණ ව්‍යාපාර සහ ස්වයං රැකියා ව්‍යාපති සඳහා ණය පහසුකම් ලබාදීම මගින් ග්‍රාමීය දිළිඳු තරුණ ප්‍රජාවගේ ජීවන තත්ත්වය දියුණු කිරීම සහ ඔවුන් ව්‍යවසායකයින් බවට පත් කිරීම. | 225 | 19.70 | 205.30 | 6.5% |
| 3.2 | සුළු ගොවීන් හා ඉඩම් නොමැති අය සඳහා වන ණය ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල (SFLCP-RF) | ශ්‍රී ලංකා රජය | ප්‍රතිලාභ ලබන්නන්ගේ සුභසාධනය සහ ආර්ථික තත්ත්වය වැඩිදියුණු කිරීම පිණිස ග්‍රාමීය දිළිඳු ජනතාවගේ ආදායම් ඉපැයීමේ කටයුතු වෙනුවෙන් විධිමත් ණය සැපයීම | 346 | 67.34 | ආපසු අයකර ගැනීම් නැවත අරමුදලට යෙද වේ | 12% |
| 3.3 | දිළිඳුකම පිටු දැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය ණය ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල (PAMP-RF) | ශ්‍රී ලංකා රජය | ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය සහ සංවිධිත බැංකු අංශය හා සම්බන්ධ වීම සඳහා අඩු ආදායම්ලාභී කණ්ඩායම් සංවිධානය කිරීම මගින් දිළිඳුබව පිටු දැකීම | 1,031 | 316.74 | ආපසු අයකර ගැනීම් නැවත අරමුදලට යෙදවේ. | 12% |
| 3.4 | දිළිඳුකම පිටු දැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය ණය ව්‍යාපෘතිය අදියර II - චක්‍රීය අරමුදල (PAMP II - RF) | ශ්‍රී ලංකා රජය | | 2,764 | 1,566.96 | ආපසු අයකර ගැනීම් නැවත අරමුදලට යෙදවේ. | සහභාගිත්ව මූල්‍ය ආයතන 10% |

* HACCP - උපද්‍රව්‍ය විශ්ලේෂණ අති අවදානම් පාලන ස්ථාන

ලබා දුන් රුපියල් මිලියන 9,660.5 ක ණය මුදල් ප්‍රමාණය ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වසර තුළදී සියලුම අංශ සඳහා ලබා දුන් මුළු ණය ප්‍රමාණයෙන් සියයට 46.4 ක් ලෙස සටහන් වේ.

කෙටිකාලීන භෝග 33 ක් සඳහා සුළු පරිමාණ ගොවීන්ට සහභාගිත්ව මූල්‍ය ආයතන ලබාදෙන ණය සඳහා පොලී සහනාධාර සහ ණය ඇප ආවරණ ලබාදෙන නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය "සරුසාර", මෙම අංශයට ණය ලබා දෙන ප්‍රධානම යෝජනා ක්‍රමය ලෙස ක්‍රියාත්මක විය.

නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය මගින් රුපියල් මිලියන 8,009.2 ක ණය අරමුදල් ලබා දී ඇති අතර, එය කෘෂිකාර්මික හා සත්ත්ව පාලන අංශය සඳහා මුදාහැර ඇති මුළු ණය ප්‍රමාණයෙන් සියයට 82.9 ක් වේ. ප්‍රධාන වගා ප්‍රදේශවල පැවැති අයහපත් කාලගුණික තත්ත්වය මධ්‍යයේ වුවද, මෙම ණය යෝජනා ක්‍රමය හරහා ලබා දී ඇති ණය ප්‍රමාණය 2015 වසරට සාපේක්ෂව රුපියල් මිලියන 871.2 කින් එනම් සියයට 12.2 කින් වර්ධනය වී තිබේ.

තවද, ප්‍රතිපත්තියමය වශයෙන් උක් ගොවීන් විසින් කරන ලද ඉල්ලීම් සැලකිල්ලට ගනිමින් 2016 සැප්තැම්බර් මස සිට නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමයට අයත් භෝගයක් ලෙස 'උක්' භෝගය ඇතුළත් කරන ලදී.

- 2016 වසර තුළ දී අනුරාධපුර දිස්ත්‍රික්කය නව දුරටත් නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ මුදා හරින ලද ණය ප්‍රමාණයේ ඉහළම කොටසක් වාර්තා කළ අතර (මුළු ණය ප්‍රමාණයෙන් සියයට 17ක්) පිළිවෙළින්, පොළොන්නරුව දිස්ත්‍රික්කය (සියයට 12.9) සහ අම්පාර දිස්ත්‍රික්කය (සියයට 10.3) ක් වශයෙන් "සරුසාර" ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබා ගෙන ඇත. පළාත් වශයෙන් ගත් කළ, උතුරු මැද පළාත (සියයට 29.9) ඉහළම ණය ප්‍රමාණයක් ලබා ගෙන ඇත.
- පොලී සහනාධාර ණය යෝජනා ක්‍රමයක් ලෙස ක්‍රියාත්මක වන මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමය මගින් මුදාහරින ලද ණය ප්‍රමාණය, 2016 වසර තුළදී සියයට 2.2 ක් ලෙස වර්ධනය වී තිබේ. මෙම යෝජනා ක්‍රමය මගින් ණය ප්‍රතිලාභීන් 2,667 දෙනකු අතර රුපියල් මිලියන 1,633.5 ක ණය මුදල් ප්‍රමාණයක් මුදා හැර ඇති අතර, එය මුදාහරින ලද මුළු ණය ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස ගත් විට 2015 වසරේ සටහන් වූ සියයට 14.7 ට සාපේක්ෂව සියයට 16.7 ක් ලෙස දැක්විය හැකිය.
- 2016 ජනවාරි මස තුළදී, කිරි ගොවීන්ගේ/ ව්‍යවසායකයන්ගේ ආදායම් ඉපැයීමේ රටාව සැලකිල්ලට ගනිමින්, ව්‍යාපෘතියේ අවශ්‍යතාව පදනම්ව මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමයේ සහන කාලය මාස 6 සිට මාස 12 ක් දක්වා ඉහළ නංවන ලදී. මීට අමතරව, සුළු පරිමාණ කිරි ගොවීන් වාණිජ මට්ටමට ළඟා වීමට ගතවන ඉහළ කාලසීමාව, කිරි අස්වැන්න ලබාගැනීමට ගත වන කාලසීමාව සහ කිරි ගොවීන්ගේ

ඉල්ලීම් සැලකිල්ලට ගනිමින්, 2017 පෙබරවාරි මස සිට මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමයේ ණය ආපසු ගෙවීමේ කාලය, සහන කාලය ද ඇතුළත්ව වසර 5 සිට වසර 6 ක් දක්වා ඉහළ නංවන ලදී.

## 22.3 ක්ෂුද්‍ර/සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය

ජාතික නිෂ්පාදනය, රැකියා උත්පාදනය සහ නවෝත්පාදන සඳහා ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයෙහි දායකත්වය හඳුනා ගනිමින්, මෙම අංශයෙහි කටයුතු කරන ව්‍යවසායකයන් සහ ව්‍යාපාරික විභවතාවයක් සහිත ව්‍යවසායකයන් ඉහළ ප්‍රාග්ධන පිරිවැයෙන් පීඩාවට පත්වීම වැළැක්වීම සඳහා 2016 වසර තුළදී ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සහනදායී පොලී අනුපාතික යටතේ ණය ලබා දීම අඛණ්ඩව සිදු කරන ලදී. මේ අනුව, 2016 වසරේ දී කෘෂිකර්ම, නිෂ්පාදන හා සේවා සම්බන්ධ කටයුතුවල යෙදෙන ව්‍යවසායකයන් 13,810 කට රුපියල් මිලියන 8,447.2 ක ණය මුදල් ප්‍රමාණයක් ලබා දෙන ලදී.

ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය වෙත ණය මුදල් මුදාහැරීම සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය, ස්වයං රැකියා ප්‍රවර්ධන මූලාරම්භක ණය යෝජනා ක්‍රමය අදියර II, කුඩා වතු වැවිලි ව්‍යවසාය සංවර්ධන වැඩසටහන, තේ කර්මාන්තශාලා සඳහා වන කාරක ප්‍රාග්ධන ණය යෝජනා ක්‍රමය සහ වියලි කලාපීය ජීවනෝපායයන් සඳහා සහාය වීමේ හා හවුල් වීමේ චක්‍රීය ණය වැඩසටහන යන ණය යෝජනා ක්‍රම යටතේ සිදුකරන ලදී.

- ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ ප්‍රමුඛතම ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රමය ලෙස සැලකෙන "සෞභාග්‍යා" ණය යෝජනා ක්‍රමය මගින්, මෙම අංශය වෙත මුදාහරින ලද මුළු ණය ප්‍රමාණයෙන් සියයට 56.4 ක් එනම්, රුපියල් මිලියන 4,767.1 ක් ව්‍යවසායකයන් 13,018 ක් අතරේ මුදාහරින ලදී.
- ලියාපදිංචි තේ කර්මාන්තශාලා හිමියන්ගේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරා ගැනීමට සහය දැක්වීම සඳහා 2015 වසරේදී හඳුන්වා දෙන ලද, ශ්‍රී ලංකා රජය මගින් මූල්‍යනය කරන තේ කර්මාන්තශාලා සඳහා වන කාරක ප්‍රාග්ධන ණය යෝජනා ක්‍රමය මගින් 2016 වසර තුළදී ව්‍යවසායකයන් 115 කට රුපියල් මිලියන 3,539.8 ක ණය ප්‍රමාණයක් ලබා දෙන ලදී. මෙම ණය ප්‍රමාණය ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය වෙත මුදා හරින ලද මුළු ණය ප්‍රමාණයෙන් සියයට 41.9 ක් වේ.
- 2016 අප්‍රේල් මස තුළදී, පුහුණු තරුණ පිරිස් වෙත ඔවුන්ගේ ස්වයං රැකියා ව්‍යාපෘති ආරම්භ කර ගැනීම සඳහා මූල්‍ය සහාය ලබාදීමේ අරමුණින්, ස්වයං රැකියා ප්‍රවර්ධන මූලාරම්භක කිරීමේ ණය යෝජනා ක්‍රමය අදියර - II ආරම්භ කරන ලදී. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ, පිළිගත් තාක්ෂණික පුහුණු ආයතනයන්හි වෘත්තීය පුහුණු සුදුසුකම් ලබා ඇති තරුණ පිරිස් සඳහා සුළු පරිමාණ ව්‍යාපාර ආරම්භ කිරීමට රුපියල් මිලියන 74.9 ක ණය මුදලක් මුදාහරින ලදී. අනෙකුත් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ණය යෝජනා ක්‍රම වන කුඩා වතු වැවිලි ව්‍යවසාය සංවර්ධන වැඩසටහන සහ වියලි කලාපීය ජීවනෝපායයන් සඳහා සහාය වීමේ චක්‍රීය ණය වැඩසටහන මගින් රුපියල් මිලියන 65.3 ක ණය මුදලක් ණය ප්‍රතිලාභීන් 505 දෙනකු වෙත ලබා දෙන ලදී.
- ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය සමග එක්ව ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ සංවර්ධනය සහ රැකියා උත්පාදන අරමුණු කර ගනිමින් "ස්වශක්ති" රැකියා දශ ලක්ෂයක් කරා, යන නමින් ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. ශ්‍රී ලංකා රජය මගින් මූල්‍යනය කරනු ලබන මෙම ණය යෝජනා ක්‍රමය හරහා ග්‍රාමීය මට්ටමින් කෘෂිකාර්මික හා සත්ත්වපාලන, කර්මාන්ත සහ සේවා අංශ යටතේ ආදායම් උත්පාදනය කිරීමට බලාපොරොත්තු වන නව ව්‍යවසායකයන්ට මෙන්ම දැනට ව්‍යාපාරයක් හිමි ව්‍යවසායකයන්ට ද මූල්‍යමය සහාය සපයනු ලැබේ. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ණය සැපයීමට අමතරව ඒ හා සම්බන්ධ අනෙකුත් සේවාවන් සැපයීම ද දීප ව්‍යාප්තව සිදුකරනු ලබයි. ග්‍රාමීය ප්‍රදේශවල පවතින සම්පත් සහ විභවතාවයක් සහිත ව්‍යවසායකයන් තුළ පවත්නා දක්ෂතා සහ හැකියාවන් හඳුනා ගනිමින් ඔවුන්ට ස්වශක්තියෙන් ක්ෂුද්‍ර ව්‍යවසායකයන් ලෙස නැගී සිටීමට අවශ්‍ය පුහුණුව, තාක්ෂණික සහ අලෙවිකරණ සහාය ලබාදීම මෙම යෝජනා ක්‍රමය මගින් සිදු වේ. සහභාගිත්ව මූල්‍ය ආයතන මගින් සියයට 5.5 ක පොලී අනුපාතිකයක් යටතේ ලබා දෙන ණය මුදලට අමතරව, නව ව්‍යවසායකයන්ට දැරීමට සිදුවන මූලික වියදම් පියවා ගැනීම සඳහා විශේෂිත ප්‍රදානයක් ලබා දීම මෙම ණය යෝජනා ක්‍රමයේ සුවිශේෂී ලක්ෂණය වේ.

## 22.4 ක්ෂුද්‍ර මූල්‍ය අංශය

අඩු ආදායම්ලාභීන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් ඔවුන්ගේ ආදායම් උත්පාදන මාර්ගයන් ආරම්භ කිරීම සඳහා ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රම තවදුරටත් ක්‍රියාත්මක කෙරිණි. විධිමත් මූල්‍ය අංශයෙන් බැහැරව සිටින පුද්ගලයන් ඉලක්ක කර ගනිමින් මෙම ණය යෝජනා ක්‍රම, ක්‍රියාත්මක කරන ලදී. ආර්ථික සංවර්ධනය උදෙසා මූල්‍ය කළමනාකරණයේ ඇති වැදගත්කම සැලකිල්ලට ගනිමින්, එම සමාජ ස්ථරයෙහි පුද්ගලයන්ගේ මූල්‍ය සාක්ෂරතාවය ඉහළ නැංවීම කෙරෙහි මෙම ණය යෝජනා ක්‍රමය විශේෂ අවධානයක් යොමු කරන ලදී. දිළිඳුකම පිටුදැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය චක්‍රීය ණය ව්‍යාපෘතිය - අදියර II, සුළු ගොවීන් හා ඉඩම් නොමැති අය සඳහා වන චක්‍රීය ණය ව්‍යාපෘතිය සහ ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන යන ක්‍රම වලින් මෙම අංශය සමන්විත වී ඇත. 2016 වසර තුළදී, මෙම ණය යෝජනා ක්‍රම මගින් ණය ප්‍රතිලාභීන් 32,963 ක් අතරේ රුපියල් මිලියන 2,701.4 ක ණය මුදලක් මුදා හරින ලදී.

දිළිඳුකම පිටුදැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය චක්‍රීය ණය ව්‍යාපෘතිය - අදියර II හරහා ක්ෂුද්‍ර මූල්‍ය අංශය මගින් මුදා හරින ලද මුළු ණය ප්‍රමාණයෙන් සියයට 58.0 ක්, ණය ප්‍රතිලාභීන් 19,268 දෙනෙකු සඳහා ලබා දෙන ලදී. 2015 වසර සමඟ සංසන්දනාත්මකව ගත්විට මෙම ප්‍රමාණය සියයට 64.9 ක් ලෙස සටහන් වුණි. අලුතින් හඳුන්වා දුන් ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන ව්‍යාපෘතියෙහි ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන යටතේ ක්ෂුද්‍ර මූල්‍ය අංශය වෙත මුළු ණය ප්‍රමාණයෙන් සියයට

27 ක් මුදාහැරීම හේතුවෙන් 2015 වසර ට සාපේක්ෂව 2016 වසරේදී දිළිඳුකම පිටුදැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය චක්‍රීය ණය ව්‍යාපෘතිය - අදියර II හි පහළ යාමක් පෙන්නුම් කරන ලදී. දිළිඳුකම පිටු දැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය චක්‍රීය ණය ව්‍යාපෘතිය - අදියර II, 2016 වසර තුළදී සියයට 17.7 කින් වර්ධනය වී ඇත.

- දිළිඳු ජන කොටස්වල ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා කාන්තාවන්, ඉඩම් අහිමි පුද්ගලයන් හා අනෙකුත් අඩු ආදායම්ලාභීන් ඉලක්ක කර ගනිමින් කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල මගින් මූල්‍යයනය කරනු ලබන ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහනෙහි ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රමය 2016 ජනවාරි මස ආරම්භ කරන ලදී. මෙම වැඩසටහන මගින් කෘෂි ව්‍යාපාර, කෘෂිකර්මය, ධීවර කර්මාන්තය, සත්ත්වපාලනය, වෙළෙඳ හා සේවා කටයුතු සහ කුඩා ව්‍යාපාර අංශයන්හි ස්වයං රැකියා වැනි ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සඳහා ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම් ලබා දෙනු ඇත. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ 2016 වසරේදී ණය ප්‍රතිලාභීන් 5,839 ක් සඳහා රුපියල් මිලියන 730.7 ක ණය මුදලක් ලබා දෙන ලදී.
- ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහනෙහි ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රමයෙහි අවම ණය සීමාව අඩු කිරීම සඳහා ණය ප්‍රතිලාභීන් විසින් කරන ලද ඉල්ලීම් සැලකිල්ලට ගනිමින්, මූල්‍ය සේවාවන්ගේ ව්‍යාප්තිය ඉහළ නැංවීම සඳහා 2016 අප්‍රේල් මස සිට එකී අවම ණය සීමාව රුපියල් 30,000 සිට රුපියල් 10,000 දක්වා පහත දමන ලදී. ඒ අනුව, මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ණය ප්‍රතිලාභීන්ට රුපියල් 10,000 සිට රුපියල් 300,000 ක් දක්වා ණය මුදල් ලබා ගැනීමට හැකිය.
- සංවර්ධන ක්‍රියාවලියට තරුණයන් සහභාගි කර ගැනීම සහ තරුණයින් සවිබල ගැන්වීම අරමුණු කර ගනිමින්, රුපියල් මිලියන 225 ක අරමුදල් වෙන් කිරීමක් සහිතව ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහනෙහි තාරුණ්‍ය සවිබල ගැන්වීම සහ රැකියා ව්‍යාපෘතිය (තරුණ දිරිය) ආරම්භ කරන ලදී. කුඩා ව්‍යාපාර සහ වෙනත් ස්වයං රැකියා ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා ණය පහසුකම් ලබා දීම මගින් ගම් මට්ටමේ තරුණ පිරිස්වල ජීවන තත්ත්වය නගා සිටුවීම මෙම ණය යෝජනා ක්‍රමයේ මූලික අරමුණ වේ. 2016 අගෝස්තු සිට දෙසැම්බර් දක්වා කාලය තුළ, මෙම ණය යෝජනා ක්‍රමය මගින් තරුණ තරුණියන් 170 දෙනෙකු සඳහා රුපියල් මිලියන 19.7 ක ණය මුදල් ප්‍රමාණයක් ලබා දී තිබේ.
- 2016 ඔක්තෝබර් මස තුළදී, ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහනෙහි පිටත වගාකරුවන් (කොන්ත්‍රාත් ගොවීන්) සඳහා වූ ණය යෝජනා ක්‍රමය යටතේ, "අගයදාම සංවර්ධන ප්‍රාග්ධන කෘෂිකාර්මික ණය යෝජනා ක්‍රමය" සහ "අගයදාම සංවර්ධන ප්‍රාග්ධන කෘෂිකාර්මික ණය යෝජනා ක්‍රමය" ආරම්භ කරන ලදී. කෘෂි නිෂ්පාදනයන්හි ඵලදායිතාව, ගුණාත්මක තත්ත්වය සහ එකතු කළ වටිනාකම වැඩිකිරීමේ අරමුණින් ක්‍රියාත්මක කරන මෙම ණය යෝජනා ක්‍රමය සඳහා කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල විසින් රුපියල් මිලියන 623.2 ක මුදලක් වෙන් කර තිබේ.

## 22.5 අනෙකුත්

**(අ) මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ සමීක්ෂණයක් පැවැත්වීම**

මූල්‍ය නිෂ්පාදන සහ සේවාවන් සඳහා පහසු ප්‍රවේශ මාර්ගයන් ඇති කිරීමේ අදහසින්, 2016 වසරේදී ශ්‍රී ලංකාවේ ප්‍රථම දීප ව්‍යාප්ත මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ සමීක්ෂණය පවත්වනු ලැබිණි. සමීක්ෂණයෙන් ලබාගත් ප්‍රතිඵල සහ අනෙකුත් සහයෝගි රටවල මූල්‍ය අන්තර්ගතභාවය සම්බන්ධයෙන් පවතින නූතන උපායමාර්ග සැලකිල්ලට ගනිමින් 2017 වසරේදී මූල්‍ය අන්තර්ගතභාවය සඳහා වන ජාතික උපායමාර්ගික කෙටුම්පතක් සකස් කරනු ඇත. තවද ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය සංවර්ධනය සඳහා වන ජාතික ප්‍රතිපත්ති රාමුව යටතේ මූල්‍ය ප්‍රවේශය සඳහා වන ජාතික ප්‍රතිපත්තිමය උපාය මාර්ග සඳහා ද යොමු වනු ඇත.

**(ආ) ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ කෘෂි ව්‍යාපාරවල මූල්‍ය ප්‍රවේශය ඉහළ නැංවීම.**

කාබනික කෘෂිකර්මය පිළිබඳව පොදු මහජනතාවගේ සහ රජයේ මේ පිළිබඳව, ඉහළ යන අවධානය සැලකිල්ලට ගනිමින්, විධිමත් කෘෂි සංවිධාන සහ බහු පාර්ශවීය ව්‍යාපාර හරහා වාණිජ මට්ටමේ කාබනික කෘෂි කර්මාන්තය සහ කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා පදනම සකස් කරන ලදී. මෙම ක්‍රියාවලියේ දී මූල්‍ය සේවා මෙන්ම ණය පරිපූරක සේවා ලබා දීමට අපේක්ෂිත අතර, ගොවීන් සහ ව්‍යවසායකයින් සඳහා අලෙවි සබඳතා ගොඩනැංවීම සහ හඳුනාගත් ගොවියන් ඉහළ ආර්ථික මට්ටමකට ගෙන ඒම සඳහා අවශ්‍ය වන මූල්‍ය සහ තාක්ෂණික සහාය ලබාදීම ද සිදු කරනු ඇත.

**(ඉ) සූර්ය බලයෙන් විදුලි උත්පාදනය කිරීම සඳහා ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම පිළිබඳව සාකච්ඡා ආරම්භ කිරීම.**

රට තුළ ගෘහාශ්‍රිත සූර්යබල උත්පාදනය ඉහළ නැංවීම සඳහා ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය, විදුලිබල සහ පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය සහ අනෙකුත් පාර්ශ්වකරුවන් සමග එක්ව ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යයනය කරනු ලබන ණය යෝජනා ක්‍රමයක් හඳුන්වාදීම පිළිබඳව සාකච්ඡා ආරම්භ කරනු ලැබිණි. මෙම ණය යෝජනා ක්‍රමයේ ප්‍රධාන අරමුණ වන්නේ වසර 2020 වන විට සූර්ය බලයෙන් කිලෝ වොට් 200 ක් උත්පාදනය කිරීම සඳහා වන රජයේ ප්‍රතිපත්තියට සහාය දැක්වීමයි.

**(ඊ) කෘෂි අංශය නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ ණය මුදලින් කොටසක් ආවරණය කිරීම සඳහා වන ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම.**

මූල්‍ය අතරමැදි සේවා සපයන්නන්ගේ අවශ්‍යතාවයන්හි ගතික ස්වභාවය හඳුනා ගනිමින් එම අවශ්‍යතා සපුරාලීමේ අරමුණින්, ලෝක බැංකුව විසින් මූල්‍යයනය

කරනු ලබන යෝජිත කෘෂි අංශය නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ ණය මුදලින් කොටසක් ආවරණය කිරීම සඳහා වන ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයක් හඳුන්වා දීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කටයුතු ආරම්භ කරන ලදී. කෘෂිකාර්මික නිෂ්පාදනයන්හි කාර්යක්ෂමතාව සහ ඵලදායීතාව, වෙළෙඳපොළ පිවිසුම වැඩිදියුණු කිරීම සහ අගය එකතු කිරීම මූලික අරමුණ කර ගනිමින් කෘෂි අංශය නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ අවදානම් බෙදා හැරීමේ උපකරණයක් ලෙස මෙම ණය ඇප ආවරණ ක්‍රමය හඳුන්වා දී ඇත. තවද, මෙම ව්‍යාපෘතිය මගින් සලකා බලන ව්‍යාපෘතියෙහි මුළු පිරිවැයෙන් සියයට 50 ක ප්‍රදානයක් ලබාදෙනු ලැබේ. ඒ හේතුවෙන් මූල්‍ය ප්‍රවේශය තවදුරටත් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

### 22.6 කුසලතා සංවර්ධනය හා ශක්‍යතා ගොඩනැංවීම

පුළුල් අන්තර්ගතභාවයක් සඳහා වන ගතික සංරචකයන් ලෙස මූල්‍ය සාක්ෂරතාවයෙහි සහ දැනුම්වත් කිරීමෙහි ඇති වැදගත්කම වටහා ගනිමින්, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2016 වසර තුළදී ප්‍රතිලාභීන් හා අනෙකුත් පාර්ශවකරුවන් දැනුම්වත් කිරීමේ අරමුණින් මූල්‍ය සාක්ෂරතාවය, ව්‍යවසායකත්ව සංවර්ධනය, කුසලතා සංවර්ධනය සහ පුහුණුකරුවන් පුහුණු කිරීම සඳහා වැඩසටහන් 172 ක් පවත්වා ඇත.

මූල්‍ය අංශයෙන් බැහැර වීම නිසා අහිමි වී ඇති ප්‍රතිලාභ පිළිබඳව මෙන්ම විධිමත් මූල්‍ය අංශයට ප්‍රවිෂ්ට වීම තුළින් ලැබිය හැකි ප්‍රතිලාභ පිළිබඳව ද දැනුම්වත් කිරීමේ අරමුණින් මූල්‍ය සාක්ෂරතා වැඩසටහන් පවත්වනු ලැබිණි. යහපත් බැංකු පුරුදු, මූල්‍ය විනය සහ නව මූල්‍ය උපකරණ හා සේවා පිළිබඳව ද දැනුම්වත් කරන ලදී. ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව ස්වයං ආධාරක කණ්ඩායම් ගොඩනැංවීම හරහා මෙම අධ්‍යාපනික වැඩසටහන තවදුරටත් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම තුළින් මූල්‍ය කළමනාකරණය සහ යහපත් මූල්‍ය පුරුදු ප්‍රවර්ධනය කිරීමට ද කටයුතු කරන ලදී.

ප්‍රාදේශීය සංවර්ධන දෙපාරේතමේන්තුව මගින් පවත්වන ලද වැඩසටහන්වල තොරතුරු පහත සංඛ්‍යා සටහනෙහි දැක්වේ.

**II-24 සංඛ්‍යා සටහන**

**2016 වසර තුළ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලද වැඩසටහන්**

| වැඩසටහන | වැඩසටහන් සංඛ්‍යාව |
|---|---|
| මූල්‍ය සාක්ෂරතාව | 82 |
| කුසලතා සංවර්ධනය | 60 |
| ශක්‍යතා ගොඩනැංවීම | 26 |
| මාධ්‍ය වැඩසටහන් | 04 |
| මුළු සංඛ්‍යාව | 172 |

## 23. ප්‍රාදේශීය කාර්යාල කළමනාකරණ

2015 සැප්තැම්බර් මස ස්ථාපිත කරන ලද දෙපාර්තමේන්තු මට්ටමේ ප්‍රාදේශීය කාර්යාල 05 ඒකාබද්ධ කරමින් 2016 නොවැම්බර් මස දී ප්‍රාදේශීය කාර්යාල කළමනාකරණ දෙපාර්තමේන්තුව ස්ථාපනය කරන ලදී. ඒ අනුව දිවයිනේ සියලුම පළාත් ආවරණය වන පරිදි ව්‍යාප්තව ඇති ප්‍රාදේශීය කාර්යාල කළමනාකරණය හා අධීක්ෂණය කිරීම මෙම දෙපාර්තමේන්තුවේ මූලික පරමාර්ථය වේ.

මුදල් නීති පනතේ 07 වන වගන්තියට අනුව නුවරඑළිය හා බදුල්ල දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය සංවර්ධනය පුළුල් කිරීමේ අරමුණින්, 2016 ජනවාරි මාසයේදී නුවරඑළියේ නව ප්‍රාදේශීය කාර්යාලයක් විවෘත කරන ලදී. මෙම ප්‍රාදේශීය කාර්යාලය ස්ථානගත කිරීමේදී නුවරඑළිය හා බදුල්ල දිස්ත්‍රික්කවල වැවිලි අංශයේ සේවක සංකේන්ද්‍රනය සැලකිල්ලට ගනිමින් ඔවුන්ගේ අර්ථසාධක හා සම්බන්ධ කටයුතුවලට පහසුකම් සැපයීම කෙරෙහි විශේෂ අවධානයක් යොමුකරන ලදී. ඉහත කී ප්‍රාදේශීය කාර්යාලය ද සමග ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල ගණන 07 ක් වූ අතර එම කාර්යාල මාතර, අනුරාධපුර, මාතලේ, යාපනය, ත්‍රිකුණාමලය, කිලිනොච්චිය හා නුවරඑළිය නගරවල පිහිටුවා ඇත.

### 23.1 සංවර්ධන කාර්යයන්

2016 වර්ෂයේදී සියලුම ප්‍රාදේශීය කාර්යාල ඒවායේ පරිපාලනයට යටත්වන ප්‍රදේශවල සංවර්ධන කටයුතුවල නිරත වූ අතර එහිදී විශේෂ අවධානය යොමුකරන ලද්දේ ණය ප්‍රදානය කිරීමේ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සහ එමගින් ණය පහසුකම් නිසි වෙලාවට බාධාවකින් තොරව සැපයීම තුළින් කෘෂිකර්මාන්තය, සත්ත්ව පාලනය සහ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයන් ප්‍රවර්ධනය කිරීමය. වාණිජ සහ සංවර්ධන බැංකු, ලියාපදිංචි මුදල් සමාගම් සහ අනෙකුත් රාජ්‍ය නියෝජිත ආයතන සම්බන්ධීකරණය කිරීම මගින් සංවර්ධන ව්‍යාපෘති සඳහා ණයලාභීන්ගේ සහ ණය අපේක්ෂිත පුද්ගලයන්ගේ අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාදේශීය කාර්යාල සහය විය. ඒ අනුව 2016 වසර තුළදී ණය කඳවුරු 66 ක් පවත්වා ව්‍යවසායකයන් 7,327 කට විවිධ සේවා ලබාදෙන ලද අතර ඒ තුළින් ණය සම්බන්ධතාවයන් 3,121 ගොඩනගන ලදී.

තවද, විවිධ පුහුණු වැඩසටහන් හා වෙනත් වැඩමුළු පැවැත්වීම මගින් ණයලාභීන්ට හා ග්‍රාමීය ප්‍රජා මූල සංවිධානවල සාමාජිකයන්ට මූල්‍ය සාක්ෂරතාවය, ව්‍යවසාය සංවර්ධනය, තාක්ෂණික දියුණුව හා විශිෂ්ට පරිචයන් පිළබඳ දැනුම ලබාදෙන ලදී. එහිදී වැඩසටහන් 145 ක් පවත්වා පුද්ගලයින් 13,570 කට මූල්‍ය සාක්ෂරතාවය පිළිබඳ දැනුම බෙදාදෙන ලදී. තාක්ෂණික දියුණුව හා කළමනාකරණ සංවර්ධනය යන අංශ වලට අදාලව පිළිවෙළින් පුද්ගලයින් 4,806, 1,292 හා 1,971 ක් වෙනුවෙන් ව්‍යවසාය සංවර්ධන වැඩසටහන් 55 ක්, ක්ෂේත්‍ර චාරිකා/තාක්ෂණ හුවමාරු වැඩසටහන් 34 ක් හා විශිෂ්ට පරිචයන් පිළිබඳ වැඩසටහන් 44 ක් පවත්වන ලදී. මෙම වැඩසටහන්වල දී මූලිකවම කෘෂිකර්මාන්තය, ධීවර

කර්මාන්තය, උද්‍යාන විද්‍යාව ආදි ආර්ථික ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරන ලද අතර ආලෝක විමෝචන ඩයෝඩය (LED), දෙමුහුම් හා ෆයිබර් තාක්ෂණය (Fiber Technology) ආදි ආර්ථික ක්ෂේත්‍ර කෙරෙහි ද අවධානය යොමු කරන ලදී. තවද කාබනික කෘෂිකර්මාන්තය හා වැඩි අස්වැන්නක් ලබාදෙන හා දෙමුහුම් බීජ පිළිබඳ ගොවීන් දැනුවත්කිරීමට දැනුවත්කිරීමේ වැඩසටහන් 12 ක් පවත්වන ලද අතර ඒවාට පුද්ගලයින් 597 ක් සහභාගි විය. තවද ණය ගෙවීමේදී විවිධ දුෂ්කරතාවයන්ට මුහුණ දුන් ණයලාභීන් අරභයා ණය උපදේශණ සේවාවන්ද පවත්වන ලද අතර ඒ තුළින් පුද්ගලයින් 1,763 ක් ප්‍රතිලාභ ලැබීය. එමෙන්ම ණයලාභීන්ගේ අලෙවිකරණය පහසු කිරීම සඳහා වෙළඳපොළ සම්බන්ධතා ඇති කිරීම, ගැනුම්කරුවන්ගේ හා විකිණුම්කරුවන්ගේ සංවාද/රැස්වීම් පැවැත්වීම සහ උත්සවකාලවලදී වෙළඳ සල්පිල් පැවැත්වීම ද ප්‍රාදේශීය කාර්යාල විසින් සිදු කරන ලදී.

දකුණු හා බස්නාහිර පළාත් ආණ්ඩුකාරවරුන්, ජ්‍යෙෂ්ඨ රාජ්‍ය හා පළාත් සභා නිලධාරීන් සහ අදාළ ප්‍රදේශවල මූල්‍ය ආයතනවල නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් රැස්වීම් දෙකක් ගාල්ල හා කොළඹ නගරවල පවත්වන ලදී. මෙම රැස්වීම් වල අරමුණ වූයේ එම පළාත් සංවර්ධනය සඳහා මූල්‍ය සහ බැංකු පහසුකම් සැපයීම, මූල්‍ය ප්‍රවේශය ප්‍රවර්ධනය කිරීම සහ මූල්‍ය අන්තර්ගතභාවය වැඩිදියුණු කිරීම පිළිබඳව වූ ගැටලු හඳුනාගැනීම හා ඒවා පිළිබඳ සාකච්ඡා කිරීමයි.

### 23.2 ප්‍රාදේශීය කටයුතු සඳහා මහ බැංකුව නියෝජනය කිරීම

2016 වසර තුළදී ද ප්‍රාදේශීය කාර්යාල විසින් අදාළ පළාත්වල මහ බැංකුවේ විවිධ වැඩසටහන් පැවැත්වීම මගින් ප්‍රාදේශීය වශයෙන් මහ බැංකුව නියෝජනය කිරීම ද සිදු කරන ලදී. ඒ අනුව පිරිසිදු මුදල් ප්‍රතිපත්තිය, ව්‍යාජ නෝට්ටු හඳුනාගැනීම, නීත්‍යානුකූල නොවන මූල්‍ය ආයතන, තහනම් ණය යෝජනා ක්‍රම, විනිමය පාලන රෙගුලාසි ආදිය පිළිබඳ දැනුම්වත්කිරීමේ වැඩසටහන් සහ සිසුන් හා ගුරුවරුන් වෙනුවෙන් අධ්‍යාපනික වැඩසටහන් 107 ක් පවත්වන ලද අතර ඒ සඳහා පුද්ගලයින් 9,347 ක් සහභාගි විය. මේ අතරින් වැඩසටහන් 39 ක් පිරිසිදු නෝට්ටු ප්‍රතිපත්තිය හා ව්‍යාජ නෝට්ටු හඳුනාගැනීම පිළිබඳව ද, වැඩසටහන් 50 ක් නීත්‍යානුකූල නොවන මූල්‍ය ආයතන හා තහනම් ණය යෝජනා ක්‍රම පිළිබඳව වූ අතර අධ්‍යාපනික වැඩසටහන් 08 ක් ද ඒ අතර විය. තව ද වැවිලි අංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 95 ක් ඉලක්ක කරගනිමින් සේවක අර්ථසාධක අරමුදල පිළිබඳව දැනුවත්කිරීමේ වැඩසටහනක් ද පැවැත්විණි. අර්ථසාධක අරමුදලේ සාමාජිකයන් ට අවශ්‍ය සේවාවන් සැපයීම කෙරෙහි ද විශේෂ අවධානයක් යොමුකරන ලද අතර ඒ අනුව අර්ථසාධක අරමුදලේ සාමාජිකයන් 49,495 කට අවශ්‍ය සේවාවන් සැපයීමට ද හැකි විය. තව ද ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය (බැංකු විදු පියස) මගින් පළාත් මට්ටමින් මෙහෙයවන ලද පුහුණු වැඩසටහන් 09 ක් ද පවත්වන ලද අතර ඒ තුළින් බස්නාහිර පළාතෙන් පිටත පිහිටුවා ඇති බැංකු හා මූල්‍ය ආයතන ශාඛා වල නිලධාරීහු 671 ක් ප්‍රතිලාභ ලැබීය.

## 24. අවදානම් කළමනාකරණ

ශ්‍රී ලංකා මහ බැංකුවේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය මනා අවදානම් කළමනාකරණ යහපාලන රාමුවක් ඔස්සේ ශක්තිමත් කිරීමේ අරමුණින් 1949 අංක 58 දරන මුදල් නීති පනතේ 33 වගන්තිය යටතේ, 2015 පෙබරවාරි 09 වන දින අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව පිහිටුවනු ලැබීය. ශ්‍රී ලංකා මහ බැංකුව අනුගමනය කරන තෙවැදෑරුම් ආරක්ෂක ක්‍රමවේදය යටතේ, දෙවන පෙළ ආරක්ෂක ක්‍රමය හා සම්බන්ධ කාර්යභාරය අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවට පැවරී ඇති අතර ඒ තුළින් ස්වාධීන හා මධ්‍යගත අවදානම් කළමනාකරණ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමට කටයුතු කරනු ලබයි. අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවට පවරන ලද කාර්යභාරය පියවරෙන් පියවරට ඉටුකිරීම උදෙසා අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව කටයුතු කරන ලද අතර, වර්ෂය තුළ දී ජාත්‍යන්තර සංචිත ආයෝජන සම්බන්ධයෙන් හා මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් කළමනාකරණය සිදු කරන අභ්‍යන්තර අරමුදල් විසින් කරනු ලබන ආයෝජන සම්බන්ධයෙන් වන මූල්‍ය අවදානම් හඳුනා ගැනීම, ඇස්තමේන්තු කිරීම, අධීක්ෂණය කිරීම හා වාර්තා කිරීම් සිදුකරන ලදී.

2016 වර්ෂය තුළ දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලද ප්‍රධාන කාර්යයන්හි සාරාංශගත අන්තර්ගතය පහත සඳහන් වේ.

1. ජාත්‍යන්තර සංචිත කළමනාකරණය සම්බන්ධයෙන් මූල්‍ය අවදානම්

   අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ජාත්‍යන්තර සංචිත සම්බන්ධ මූල්‍ය අවදානම තක්සේරු කිරීමේ දී වෙළඳපොළ අවදානම (පොලී අනුපාතික අවදානම හා විදේශීය විනිමය අවදානම) හා ණය අවදානම කෙරෙහි අවධානය යොමු කරන ලදී.

### වෙළඳපොළ අවදානම

වෙළඳපොළ සාධකයන්හි උච්චාවචන තුළින් ඇති විය හැකි අලාභයන් වෙළඳපොළ අවදානම ලෙස හැඳින්විය හැකිය. විකරණය කළ පැවතුම් කාලය (Modified Duration), පොලී අනුපාතික සංවේදීතාව (Interest Rate Sensitivity) හා අවදානමට ලක් කළ වටිනාකම (Value - at - Risk) යන මිනුම් ක්‍රම තුළින් වෙළඳපොළ අවදානම තක්සේරු කරනු ලැබේ. ඵලදායිතා අනුපාතිකයෙහි වෙනස් වීමට ප්‍රතිචාර ලෙස සුරැකුම්පත් මිලෙහි ඇතිවන වෙනස්වීමේ ප්‍රතිශතය විකරණය කළ පැවතුම් කාලය (Modified Duration) තුළින් ද, වෙළඳපොළ පොලී අනුපාතිකයෙහි ඇති විය හැකි උච්චාවචනයන්ට අනුව ආයෝජන කළඹෙහි ඇති වන වෙනස්වීම පොලී අනුපාතික සංවේදීතාව තුළින් ද මනිනු ලැබේ. දෙන ලද විශ්වාසදායී මට්ටමක් හා කාලපරාසයක් තුළ ආයෝජන කළඹ තුළ ඇති විය හැකි අලාභය මැනීම සඳහා අවදානමට ලක් කළ වටිනාකම (Value at Risk) යොදාගනු ලැබේ.

**ණය අවදානම**

එකඟවන ලද කොන්දේසිවලට අනුකූලව ණයකරුවෙකු හෝ සම්බන්ධිත පාර්ශ්වයන් විසින් සිය ණය වගකීම් ඉටුකිරීමට අපොහොසත් වීමේ අවදානම ණය අවදානම ලෙස හැඳින්විය හැකිය. ණයකරුවන් සම්බන්ධ ණය අවදානම් කළමනාකරණ මාර්ගෝපදේශයට (CCRMG) අනුව ණය අවදානම තක්සේරු කිරීම, අධීක්ෂණය කිරීම, වාර්තා කිරීම හා කළමනාකරණය කිරීම සිදු කරන ලද අතර, සියලුම ගනුදෙනු නියම කරන ලද සීමාවන් තුළ සිදු කරනු ලැබ ඇත්දැයි සහතික කරගනු ලැබීය. අනාගත පාර්ශ්වකරුවෙකුගේ ණය අවදානම කොපමණදැයි ගණනය කිරීමට ඔවුනගේ මූල්‍ය වාර්තාවල තොරතුරු, ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනවලින් ප්‍රකාශ කරන ශ්‍රේණිගත කිරීම් හා එම පාර්ශ්වය සම්බන්ධ වෙළඳපොළ තත්ත්වයන් සැලකිල්ලට ගන්නා අතර වර්තමාන පාර්ශ්වකරුවන් ඔවුන්ගේ ණය ශ්‍රේණිගත කිරීම් ආශ්‍රයෙන් දෛනිකව ඇගයීම හා අධීක්ෂණය කරනු ලබයි. වර්ෂය තුළ දී Fitch Ratings, Standard & Poor's සහ Moody's Analytics ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන ත්‍රිත්වය හරහා නිකුත් කරන ලද ශ්‍රේණිගත කිරීම්වල වෙනස්කම්වලට අනුව පාර්ශ්වකරුවන් කීප දෙනෙකුගේ ආයෝජන උපකරණ සහ අයෝජන සීමාවන් සංශෝධනය කරන ලදී. එම වෙනස්කම් භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතිය (TMS) වෙත ඇතුළත් කරන ලද අතර එම සීමාවන්ට යටත්ව ගනුදෙනු කිරීම සඳහා මෙම තොරතුරු ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව වෙත සන්නිවේදනය කරන ලදී. ඊට අමතරව, මුදල් වෙළඳපොළ පාර්ශ්වකරුවන් සිදුකරන ගනුදෙනුවල ණය පැහැර හැරීමේ අවදානම, ස්ථාවර ප්‍රතිලාභ හිමි සුරැකුම්පත්වල ගනුදෙනු කරන පාර්ශ්වකරුවන්ගේ ණය පැහැර හැරීමේ අවදානමට වඩා වැඩි නිසා, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව ණය පැහැර හැරීම හුවමාරුවේ අන්තරයේ (Credit- Default-swap; CDS) සහ කොටස් මිල ගණන්වල උච්චාවචනය දෛනිකව අධීක්ෂණය කරනු ලබන අතර ජාත්‍යන්තර මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුවට, මුදල් වෙළෙඳපොළ පාර්ශ්වකරුවන්ගේ විය හැකි මූල්‍ය දුර්වලතා (අධික උච්චාවචනයන් සහ පිළිගත හැකි මට්ටමට වඩා සිදුවිය හැකි පැතිර යාම්) පිළිබඳ අවදානම් වාර්තාවක් දෛනිකව ඉදිරිපත් කරයි. ඒ තුළින් තමන් ශක්තිමත් මූල්‍ය තත්ත්වයක් ඇති වෙළඳපොළ පාර්ශ්වකරුවන් සමඟ ගනුදෙනුවලට එළැඹී ඇති බවට ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවට තහවුරු කරගත හැකිය.

2. සංචිත උපදේශන හා කළමනාකරණ වැඩසටහන (RAMP) යටතේ ලෝක බැංකුව වෙතින් තාක්ෂණික සහායන් ලබාගැනීම.

අවදානම් කළමනාකරණ හා වාර්තා කිරීමේ ක්‍රමවේදය ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව දෙපාර්තමේන්තු කාර්යමණ්ඩලයේ දැනුම හා හැකියාවන් ඉහළ නැංවීම සඳහා ජාත්‍යන්තර සංචිත ආයෝජන ක්‍රියාවලියට සම්බන්ධ අවදානම් කළමනාකරණය සඳහා අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව ලෝක බැංකුවේ සංචිත උපදේශන හා කළමනාකරණ වැඩසටහන තුළින් තාක්ෂණික සහායන් ලබාගැනීමට කටයුතු කරන ලදී.

3. උපායමාර්ගික වත්කම් බෙදාහැරීම (Strategic Asset Allocation (SAA)

තම කාර්යභාරය තවදුරටත් ක්‍රියාත්මක කරමින් දිගුකාලීන ආයෝජන කළඹ අවදානම් හා ප්‍රතිලාභ සමබර මට්ටමකින් පවත්වා ගැනීම සඳහා වත්කම් හා වගකීම් කළමනාකරණ ක්‍රියාපිළිවෙතක් සනිටුහන් කරමින් ජාත්‍යන්තර සංචිත කළමනාකරණය සඳහා උපායමාර්ගික වත්කම් බෙදාහැරීමේ ක්‍රමවේදයක් හඳුන්වාදීමට ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව හා එක්ව අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව පියවර ගන්නා ලදී. මෙම ක්‍රමවේදය තුළ විවිධ කාලපරාසයන් ඔස්සේ වෙනස්වන ද්‍රවශීල අවශ්‍යතා හඳුනා ගනිමින් සංචිත කළමනාකරණය පහසුවෙන් හා ඉහළ කාර්යක්ෂමතාවකින් සිදු කළ හැකිය. මෙම කාර්යයේ දී අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව වර්තමාන ජාත්‍යන්තර සංචිත කළමනාකරණ මගපෙන්වීම් (Foreign Reserve Management Guidelines; FRMG) සංශෝධනයට ලක්කරනු ලබන අතර, ඒ වෙනුවට ජාත්‍යන්තර ප්‍රමිතීන් හා ගැළපෙන ලෙස නව ප්‍රතිපත්ති ලේඛන කට්ටල දෙකක් පිළියෙළ කරන ලදී. ඒවා ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශනය (Investment Policy Statement; IPS) හා ආයෝජන මගපෙන්වීම් (Investment Guidelines;IG) ලෙස හඳුන්වනු ලබයි. මේ අනුව, ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශනය හා අයෝජන මගපෙන්වීම් හඳුන්වා දීම සඳහා පසුබිම් වූ ඉතා වැදගත්ම සාධකය ලෙස උපායමාර්ගික වත්කම් බෙදාහැරීම සඳහන් කළ හැකිය.

4. ගෝලීය වෙළඳපොළ තත්ත්වයන් පිළිබඳව අධීක්ෂණය කිරීම

ගෝලීය වෙළඳපොළ තත්ත්වයේ සිදු විය හැකි වෙනස්වීම් හා ගෝලීය සංසිද්ධීන් පිළිබඳව අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව ඉහළ අවධානයක් යොමු කළ අතර, ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිත කෙරෙහි එම සාධකවල බලපෑම පිළිබඳව අවදානම් කළමනාකරණ දෘෂ්ටි කෝණයකින් අවධානය යොමු කරන ලදී. මේ සම්බන්ධ අවදානම් ඇතුළත් වාර්තා අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ඉහළ කළමනාකරණය වෙත ඉදිරිපත් කළ අතර, බැංකුවේ ගෙවීම් හා පියවීම් පද්ධතියට සම්බන්ධව පවතින පාලන ක්‍රමවේදයන්හි ප්‍රමාණවත් බව, මහා බ්‍රිතාන්‍යය, යුරෝපා සංගමයෙන් වෙන්වීම තුළින් ජාත්‍යන්තර සංචිත කළමනාකරණයට ඇතිවන බලපෑම හා මහ බැංකුවේ ආයෝජන පාර්ශ්වයන් හා බැඳී ඇති බැංකුවල සිදුවිය හැකි බිඳවැටීම් හා සම්බන්ධ ණය අවදානම් පිළිබඳ දැනුවත් කිරීම් යනාදිය මෙම වාර්තාවලින් කිහිපයකි.

5. ජාත්‍යන්තර සංචිත කළමනාකරණ කමිටුව (FRMC) සඳහා කරන ලැබූ දායකත්වය

ජාත්‍යන්තර සංචිත කළමනාකරණ කමිටුවේ නිරීක්ෂකයෙකු ලෙස අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව කටයුතු කරන අතර ජාත්‍යන්තර සංචිත ආයෝජන කටයුතු හා සම්බන්ධ වෙළඳපොළ

අවදානම හා ණය අවදානම පිළිබඳ වූ මාසික ඉදිරිපත් කිරීම් කමිටුව වෙත සිදු කරන ලදී. එයට අමතරව සංචිත ආයෝජන පිළිබඳ වූ යෝජනා ඇති විට ඒවා ඇගයීම් සිදු කිරීම, ලෝක වෙළඳපොළ තත්ත්වයන්හි වෙනස්වීම තුළින් නිල සංචිතවලට කෙරෙන බලපෑම යනාදිය ඇතුළත් තොරතුරු ජාත්‍යන්තර සංචිත කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.

6. දෛනික වෙළඳ තොරතුරු විශ්ලේෂණය කිරීම

දෛනික වර්තමාන වෙළඳපොළ දත්ත හා තොරතුරු පිළිබඳව විග්‍රහයක් කොට අධිපතිවරයා වෙත එම තොරතුරු සන්නිවේදනය කිරීම අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. මෙම තොරතුරු තුළ වෙළඳපොළ ද්‍රවශීලතාව, කෙටිකාලීන පොලී අනුපාතිකයේ හැසිරීම, ජාත්‍යන්තර සංචිත ආයෝජන පිළිබඳ විස්තර සහ රජයේ සුරැකුම්පත් හා භාණ්ඩාගාර අරමුදල් අවශ්‍යතා සහ ඵලදා වක්‍රයේ හැසිරීම යනාදිය අඩංගු විය.

7. අභ්‍යන්තර අරමුදල් ආයෝජන කටයුතු සම්බන්ධ අවදානම් කළමනාකරණය

අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් ගන්නා ලද තවත් වැදගත් පියවරක් ලෙස අභ්‍යන්තර අරමුදල් ආයෝජන සම්බන්ධ අවදානම් කළමනාකරණය මධ්‍යගත කරමින් එම අංශයේ අවදානම් කළමනාකරණය, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙත පැවරීම දැක්විය හැකිය. මූල්‍ය දෙපාර්තමේන්තුවේ ස්ථාපිත කරන ලද විශේෂ ඒකකයක් හරහා අභ්‍යන්තර අරමුදල් ආයෝජන කළමනාකරණය සිදුකරන අතර තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක අරමුදල, ශ්‍රී ලංකා මහ බැංකුවේ විශ්‍රාමික අරමුදල, ශ්‍රී ලංකා මහ බැංකුවේ අර්ථසාධක අරමුදල යන අරමුදල් ද ඇතළත්ව බැංකු අධීක්ෂණ, මූල්‍ය, කාර්ය මණ්ඩල සේවා කළමනාකරණ හා ප්‍රාදේශීය සංවර්ධන යන දෙපාර්තමේන්තු විසින් පවත්වාගෙන යන අරමුදල් වලින් සමන්විත වේ. මෙම සියලු අරමුදල් හා සම්බන්ධ අවදානම ඒ ඒ දෙපාර්තමේන්තු විසින් මීට පෙර කළමනාකරණය කළ ද, මෙම වසරේ සිට එම සියලු අරමුදල් හා සම්බන්ධ අවදානම අධීක්ෂණය කිරීම හා පාලනය කිරීම අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙත පවරන ලදී. අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශය පිළියෙළ කිරීම සඳහා යෝජනා මූල්‍ය දෙපාර්තමේන්තුව වෙත ලබාදීම, ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අරමුණුවලට අනුව ආයෝජන කළඹ සඳහා මිනුම් ලකුණු (benchmark) සැකසීම හා පාර්ශ්වකරුවන්ගේ ණය අවදානම ප්‍රසිද්ධ කරන ලද ණය ශ්‍රේණි ගත කිරීම මත අධීක්ෂණය කිරීමත් සිදු කරන ලදී. අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ආයෝජනයන්ට අදාළ අවදානම සම්බන්ධ දෘෂ්ටි කෝණයකින්, මුදල් මණ්ඩලය අනුමත කරන ලද ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අඩංගු කරුණු හා ආයෝජන සම්බන්ධ අවදානම් සාධක යන කරුණු පදනම් කර ගනිමින් මාසික අවදානම් විග්‍රහයක් සිදු කරන ලදී.

8. මූල්‍ය නොවන අවදානම් කළමනාකරණ කමිටුව (NFRMC) වෙත කරන ලද දායකත්වය

අධිපතිවරයාගේ මූලිකත්වයෙන් කාර්තුමය වශයෙන් පවත්වනු ලබන මූල්‍ය නොවන අවදානම් කළමනාකරණ කමිටුව වෙත අවශ්‍ය කරන සහායන් අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් සපයනු ලැබීය. සාපේක්ෂ වශයෙන් ඉහළ මූල්‍ය නොවන අවදානම් ඇති දෙපාර්තමේන්තු ඉලක්ක කරගනිමින් එම අවදානම් කළමනාකරණය පිළිබඳව සොයා බැලීමට මූල්‍ය නොවන අවදානම් කළමනාකරණ කමිටුව පිහිටුවන ලදී. එහි රැස්වීම් සංවිධානය කිරීම, ඒ ඒ දෙපාර්තමේන්තුවලින් මූල්‍ය නොවන අවදානම් සඳහා අවදානම් ආකෘති එක්රැස් කොට මූල්‍ය නොවන අවදානම් ආකෘතිය පිළියෙළ කිරීම හා ඒවා කමිටුව වෙත ඉදිරිපත් කිරීම යන කාර්යභාරයන් ඉටු කරමින් අවදානම් කළමනාකරණ අධ්‍යක්ෂ මෙම කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරනු ලබයි.

## 25. ලේකම් දෙපාර්තමේන්තුව

ලේකම් දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා මහ බැංකුව ආරම්භයේදීම ප්‍රතිෂ්ඨාපිත දෙපාර්තමේන්තු අතරින් එකකි. එමගින් සිදු කෙරෙන කාර්යයන් අතරින් භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය කිරීම, විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ක්‍රියාත්මක කිරීම, නිවාඩු රීති ක්‍රියාත්මක කිරීම, පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු, විදේශ පුහුණු හා විදේශ සංචාර සම්බන්ධ වන ගෙවීම් කටයුතු සිදු කිරීම, උත්සව සංවිධානය කිරීම, අභාවිත සහ යල් පිනූ භාණ්ඩ පිළිබඳ සමීක්ෂණ මණ්ඩල කටයුතු හා තැපැල් කාමර සේවාව ආදී පොදු සේවා සැපයීම සහ අධිපතිවරයාට අවශ්‍ය ලේකම් හා සන්ධාන සේවා සපයා දීම ප්‍රධාන වේ. මෙම කාර්යයන් ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙහෙයුම් කටයුතු සාර්ථකව කරගෙන යෑම සඳහා විශාල දායකත්වයක් සපයයි. 2016 වසර අවසන් වන විට අනූ එක් දෙනෙකුගෙන් සැදුම් ලත් කාර්ය මණ්ඩලයක් ලේකම් දෙපාර්තමේන්තුවේ සේවය කළේය.

**(අ) භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය කිරීම :**

2016 වර්ෂය තුළ දෙපාර්තමේන්තුව ප්‍රධාන වශයෙන්ම ටෙන්ඩර් පටිපාටිය මූලික කර ගනිමින් රුපියල් මිලියන 233.2 ක වටිනාකමින් යුත් ප්‍රාග්ධන හා ප්‍රාග්ධන නොවන භාණ්ඩ හා සේවා සැලසුම් කළ කාලය තුළ දී ප්‍රසම්පාදනය කරන ලදී. මහ බැංකුව සඳහා කලට වේලාවට භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය කිරීම සහතික කරනු පිණිස 2016 වර්ෂයේ දී ප්‍රසම්පාදන සැලසුම් සකස් කරන ලද අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් 2016 වර්ෂය සඳහා සැලසුම් කළ මහ බැංකුවේ සමස්ත ප්‍රසම්පාදන අවශ්‍යතාවලින් සියයට 86 ක ප්‍රමාණයක් ඉතා සාර්ථක ලෙස අවසන් කිරීමට ලේකම් දෙපාර්තමේන්තුවට හැකි විය. තවද, පොදු වගකීම් රක්ෂණ ආවරණය ද ඇතුළු බැංකුවේ සියලුම දේපළ සඳහා සඵල විස්තීර්ණ රක්ෂණ ආවරණයක් ලබා ගන්නා ලදී.

**(ආ) විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ක්‍රමය ක්‍රියාත්මක කිරීම :**

දෙදහසකට ආසන්න ප්‍රතිලාභීන් සංඛ්‍යාවක් වෙනුවෙන් මහ බැංකු විශ්‍රාම වැටුප් ක්‍රමය, වැන්දඹු හා අනත්දරු

අරමුදල, වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදල සහ මහ බැංකු අර්ථසාධක අරමුදල යටතේ අදාළ ගෙවීම් කටයුතු සහ ඊට අදාළ ලිපි ලේඛන කටයුතු ලේකම් දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව කරන ලදී.

**(ඈ) නිවාඩු රීති ක්‍රියාත්මක කිරීම අනෙකුත් පොදු පරිපාලන කටයුතු සිදු කිරීම :**

ලේකම් දෙපාර්තමේන්තුව විසින් සේවා නියුක්තයන්ගේ විදේශ සංචාර සඳහා පෞද්ගලික හා රාජකාරී නිවාඩු අනුමැති 429 ක් ලබා දීමට කටයුතු කරන ලදී. මහ බැංකු සේවා නියුක්තිකයන්ගේ වෘත්තීය සංගම් හා වෙනත් සමිති සංවිධානවලට සපයනු ලබන සේවාවලට අදාළ ලිපිලේඛන කටයුතු සිදු කළ අතර, නිවාඩු රීති සහ වෙනත් පරිපාලන රීති සම්බන්ධයෙන් කරන ඉල්ලීම් සඳහා වඩා විධිමත් ප්‍රතිචාර ලබා දීමට පියවර ගන්නා ලදී.

**(ඇ) පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු, විදේශ පුහුණු හා විදේශ සංචාර සම්බන්ධයෙන් වන ගෙවීම් කටයුතු සිදු කිරීම :**

සේවා නියුක්තයන් 37 දෙනෙකුගේ පශ්චාත් උපාධි කටයුතු සඳහා සහ සේවා නියුක්තයන්ගේ කෙටි කාලීන විදේශ පුහුණු සංචාර 431 ක් සඳහා ලේකම් දෙපාර්තමේන්තුව විසින් ගෙවීම් කරන ලදී.

**(ඉ) අභාවිත සහ යල්පිනූ භාණ්ඩ පිළිබඳ සමීක්ෂණ මණ්ඩල කටයුතු, උත්සව සංවිධානය කිරීම සහ තැපැල් කාමර සේවාව :**

2016 වර්ෂය තුළ දී අභාවිත යල්පිනූ කාර්යාලයීය උපකරණ ඉවත් කිරීම උදෙසා මහ බැංකු අත්පොතෙහි දැක්වෙන ක්‍රමවේදයට අනුකූලව මහ බැංකු ප්‍රධාන කාර්යාලයේ දී සමීක්ෂණ මණ්ඩලයක කටයුතු සම්පූර්ණ කරන ලදී. 2016 වර්ෂය තුළ දී දෙපාර්තමේන්තුව විසින් අලුත් අවුරුදු වැඩ ඇරඹීමේ උත්සවය හා ඊට සමගාමීව දීර්ඝ සේවා තිළිණ ප්‍රදාන උත්සවය, 1996 බෝම්බයෙන් විපතට පත් වූවන් සැමරීමේ වැඩසටහන සහ ශ්‍රී ලංකා මහ බැංකුව පිහිටුවීමේ 66 වැනි සංවත්සරික දේශනය ඇතුළු විවිධ සැමරුම් උත්සව සම්බන්ධීකරණය සහ සංවිධානය කරනු ලැබීය. ලේකම් දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන තැපැල් කාමර සේවාව මගින් 2016 වර්ෂයේ දී දේශීය සහ විදේශීය වශයෙන් ලිපි 67,590 ක් ද කුරියර් සේවා ලිපි 10,981 ක් ද යැවීම සඳහා පහසුකම් සලසන ලදී.

**(ඊ) අධිපතිවරයාට අවශ්‍ය ලේකම් හා සන්ධාන සේවා සපයාදීම :**

2016 වර්ෂය තුළ මහ බැංකු අධිපතිගේ නිල කාර්යයන් සිදු කිරීම සඳහා අවශ්‍ය ලේකම් හා සන්ධාන කටයුතු සැපයීම ද ලේකම් දෙපාර්තමේන්තුව විසින් කරගෙන යන ලදී. ඒ අනුව, අධිපතිගේ හමුවීම් හා රැස්වීම් සංවිධානය, දේශන හා ලිපි සඳහා අවශ්‍ය කෙටුම්පත් සකස් කිරීම, මූල්‍ය වෙළඳපොළ පිළිබඳ තොරතුරු සැපයීම සිදු කරන ලදී. අධිපතිගේ දේශීය හා විදේශීය නිල සංචාර හා අධිපති සහ නියෝජ්‍ය අධිපතිවරුන්ගේ නිල උත්සව සඳහා අදාළ කටයුතු සංවිධානය කිරීම ද අධිපති ලේකම් අංශය මගින් ඉටු කරන ලදී. මීට අමතරව, මහ බැංකුවේ හා අධිපතිගේ විශේෂිත ආරාධිත අමුත්තන්ට අවශ්‍ය පහසුකම් සැපයීම ද සිදු කෙරුණි.

## 26. ආරක්ෂක සේවා

අදාළ වර්ෂය තුළ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ ආරක්ෂාව තවදුරටත් ශක්තිමත් කරමින් එහි සේවකයන්ට, ගොඩනැගිලිවලට, අනෙකුත් දේපළවලට සහ මුදල් ප්‍රවාහනය සඳහා ආරක්ෂාව සපයන අතරතුර ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා මහ බැංකුවේ ඇතැම් අවේක්ෂණ යාන්ත්‍රණයන් අනුකූලනය කරන ලදී. මහ බැංකුවේ ආරක්ෂක සේවාව ශක්තිමත් කිරීම පහතින් සාරාංශගත ආකාරයට මූලික වශයෙන් ආරක්ෂක පද්ධතිය වැඩිදියුණු කිරීම සහ සේවක පුහුණුවීම් වශයෙන් අංශ දෙකකින් සමන්විත විය.

### 26.1 ආරක්ෂක පද්ධති වැඩිදියුණු කිරීම්

**(අ) ගිනි අනතුරු මැඩපැවැත්වීමේ පද්ධතිය**

මෙම වර්ෂය තුළ දී, ශ්‍රී ලංකා මහ බැංකුවේ 'සවරින්' අධ්‍යයන මධ්‍යස්ථානය සඳහා ගිනි අනතුරු මැඩපැවැත්වීමේ පද්ධතියක් ස්ථාපිත කරන ලදී. අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාල ගොඩනැගිල්ල සඳහා නව ගිනි අනතුරු නිවාරණ සහ ආරක්ෂක පද්ධතියක් ප්‍රතිස්ථාපනය කිරීමේ කටයුතු නිම කෙරිණි. මීට අමතරව මහ බැංකු මූලස්ථානයේ හා අනෙකුත් සියලු පිටස්තර පරිශ්‍ර තුළ ස්ථාපිත කර තිබූ සියලු ගිනි නිවීම් උපකරණ විධිමත් පදනමක් මත පරීක්ෂා කිරීම, අවශ්‍ය අලුත්වැඩියාවන් සිදු කිරීම සහ ප්‍රතිස්ථාපනය කිරීම සිදු කරන ලදී.

**(ආ) සී සී ටී වී නිරීක්ෂණ පද්ධතිය**

රාජගිරියේ ශ්‍රී ලංකා මහ බැංකු 'සවරින්' අධ්‍යයන මධ්‍යස්ථානය, මහ බැංකු මූලස්ථානයේ පිහිටි රථ ගාල, සියලුම ප්‍රාදේශීය කාර්යාල සහ නිවාඩු නිකේතන සඳහා සී සී ටී වී නිරීක්ෂණ පද්ධති ස්ථාපිත කර, ඒවා මහ බැංකු මූලස්ථානයේ වැඩිදියුණු කිරීමට නියමිත පද්ධතියට සම්බන්ධ කර සියලුම සංචලනයන් දුරස්ථව නිරීක්ෂණය කිරීම සඳහා මුල් පියවර තබන ලදී.

**(ඇ) හදිසි අවස්ථාවන්හි දී රාජකාරි අඛණ්ඩව පවත්වාගෙන යාමේ සැලැස්ම**

ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව සහ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පැවැත්වූ හදිසි අවස්ථාවන්හි දී රාජකාරි අඛණ්ඩව පවත්වාගෙන යාමේ පුහුණු කටයුතු සඳහා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සක්‍රීයව සහභාගි විය.

### 26.2 පුහුණුවීම්

(අ) ගිනි අනතුරු වැළැක්වීම, ගිනි නිවීම සහ ප්‍රථමාධාර වැඩසටහන්

මහ බැංකුවේ සියලුම දෙපාර්තමේන්තුවලින් තෝරා ගන්නා ලද සියලුම ගිනි අනතුරු ආරක්ෂණ නිලධාරීන් සඳහා කොළඹ මහ නගර සභාවේ ගිනි නිවීම් දෙපාර්තමේන්තුව, ශාන්ත ජෝන් ගිලන් රථ සේවාව සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සහයෝගය ඇතිව ගිනි වැළැක්වීම, ගිනි නිවීම, ප්‍රථමාධාර සහ ආපදා කළමනාකරණ පිළිබඳව දින දෙකක පෘථුල වැඩසටහනක් පවත්වන ලදී. මීට අමතරව මාර්තු මස දී ශ්‍රී ලංකා ගුවන් හමුදාව සහ කොළඹ ගිනි නිවීම් ඒකකය සමගින් ශ්‍රී ලංකා මහ බැංකු මූලස්ථානයේ සමස්ත සේවා නියුක්තිකයින් උදෙසා ගිනි නිවීමේ සහ ගිනි අනතුරු සරඹ පෙරහුරුවක් ද පවත්වන ලදී.

(ආ) කුසලතා හා දක්ෂතා ඔප්නැංවීම

ආරක්ෂක නිලධාරීන්ගේ කුසලතා හා දක්ෂතා ඔප්නැංවීම සඳහා වැදගත් ස්ථානවල ආරක්ෂාව සැපයීම, ප්‍රභූ ආරක්ෂාව සැපයීම, ආරක්ෂක පරිවාර රාජකාරී සහ මහජන සම්බන්ධතා යන විෂයයන් ඇතුළත් දින දෙකක නේවාසික වැඩමුළුවක් ජාතික වැවිලි කළමනාකාරිත්ව ආයතනයේ දී ආරක්ෂක නිලධාරීන් 29 දෙනෙකු සඳහා පවත්වන ලදී. ආරක්ෂක නිලධාරීන්ගේ කුසලතාවය වැඩිදියුණු කිරීම සඳහා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් අධ්‍යාපනික වැඩසටහන් කිහිපයක් ද පිළියෙල කරන ලදී. මෙම අධ්‍යයන වැඩසටහන් ආරක්ෂක, තොරතුරු තාක්ෂණය, අභිප්‍රේරණ ආකල්ප පරිවර්තන පැතිකඩ, පාරිභෝගික සම්බන්ධතා සහ නායකත්ව පුහුණුව ආදී ප්‍රධාන අංශ ආවරණය කරන ලදී.

(ඇ) අවි පරිහරණය සහ ජීව වෙඩි පුහුණුව

ශ්‍රී ලංකා යුධ හමුදාවේ සහයෝගය ඇතිව සියලුම ආරක්ෂක නිලධාරීන් සඳහා අවි පරිහරණය සහ ජීව වෙඩි තැබීමේ පුහුණුවක් වර්ෂයේ අවසාන කාර්තුවේ දී ලබා දෙන ලදී.

## 27. කාර්ය මණ්ඩල සේවා කළමනාකරණ

කාර්යමණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුව (කා.සේ.ක) සුහසාධන පහසුකම් කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස ප්‍රතිලාභීන් වෙත ලබා දීමට 2016 වසර තුළ දී ද පියවර ගන්නා ලදී. කාර්යමණ්ඩල නිවාස (උකස්) ණය සැපයීම, අර්ථසාධක අරමුදල් ණය ක්‍රමය සහ කාර්ය මණ්ඩල සුහසාධන ණය ක්‍රමය යටතේ ණය ලබා දීම, සේව්‍ය ආයක වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය යටතේ වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය කිරීම, වෛද්‍ය මධ්‍යස්ථාන පහසුකම් සහ ආපනශාලා පහසුකම් සැපයීම මෙම සේවාවන්වලට අයත් විය. 2016 වසර අවසාන වන විට සේවා නියුක්තයන්, විශ්‍රාමිකයන්, වැන්දඹුවන්, වැන්දඹු පුරුෂයන් හා ලියාදිංචි යැපෙන්නන්ගෙන් සමන්විත වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය යටතේ ලියාපදිංචි මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව 10,000 ක් පමණ විය.

2016 වසර තුළ දී, කා.සේ.ක. දෙපාර්තමේන්තුව විසින් අර්ථසාධක අරමුදල් සහ කාර්යමණ්ඩල සුහසාධන ණය ක්‍රමයන් යටතේ වාහන ණය, පරිගණක ණය, වෙනත් ණය සහ නිවාස ණය ඇතුළු මුළු ණය 2,188 ක් ප්‍රදානය කරන ලදී. අයදුම්කරු විසින් අදාළ සියලුම ලියකියවිලි සහිතව ඉදිරිපත් කරනු ලැබූ අයදුම්පත් සඳහා නියමිත දින ගණන ඇතුළත ණය නිකුත් කිරීමට දෙපාර්තමේන්තුව පියවර ගෙන ඇත. කා.සේ.ක. දෙපාර්තමේන්තුව මගින් හඳුන්වා දෙනු ලැබූ ණය අධීක්ෂණ ක්‍රමය මගින් වඩාත් කාර්යක්ෂමව සේවා නියුක්තයන්ට ණය ලබා දීම අධීක්ෂණය කිරීමට හැකි විය. තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව අර්ථසාධක අරමුදල් ණය, SLIPS ක්‍රමය මගින් අයදුම්කරුගේ බැංකු ගිණුමට බැර කිරීම ආරම්භ කරන ලදී.

මහ බැංකු ආපනශාලාව මගින් බැංකු කාර්ය මණ්ඩලයට ආහාර සැපයීමේ කාර්යය තවදුරටත් කාර්යක්ෂම කිරීමට පියවර ගන්නා ලදී. තවද, දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලද සමීක්ෂණයෙන් ලද ප්‍රතිඵල අනුව, ආපනශාලා මගින් ගුණාත්මක ආහාර ලබා දීම සහ තේ සැපයීම සේවා නියුක්තයන් විසින් ඉහළින් අගය කොට ඇත. 2016 වසර තුළ දී ආපනශාලා පහසුකම් මෙන්ම ආපනශාලා තුළ පරිසරය තවත් වැඩිදියුණු කිරීමට අවශ්‍ය සියලු මූලික විධිවිධාන සකස් කරන ලදී.

සියලුම ලියාපදිංචි ප්‍රතිලාභීන් සඳහා වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය යටතේ වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය කා.සේ.ක. දෙපාර්තමේන්තුව විසින් නොකඩවා ක්‍රියාත්මක කරන ලදී. පසුගිය වසරට සාපේක්ෂව 2016 වර්ෂයේ දී ප්‍රතිපූරණය කරන ලද මුළු වෛද්‍ය වියදම් ප්‍රමාණය සියයට තිස් හතරකින් (සියයට 34) ඉහළ ගොස් ඇත. මුදල් මණ්ඩලයේ අනුමැතිය මත වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමයේ හිමිකම් සීමාවන් 2016.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි වැඩි කරන ලදී. වෛද්‍ය මධ්‍යස්ථානය මගින් සපයනු ලබන වෛද්‍ය පහසුකම්, පිළිගත් පෞද්ගලික ආරෝග්‍ය ශාලාවක් මගින් තවදුරටත් මහ බැංකු සේවා නියුක්තයන් වෙත කාර්යාල වේලාවන් තුළ දී සපයන ලදී. තවද, සාධාරණ මිල ගණන් යටතේ වෛද්‍ය පරීක්ෂණ සහ රසායනාගාර සේවා පහසුකම් ද වෛද්‍ය මධ්‍යස්ථානය තුළින් සිදු කිරීමට ද පියවර ගන්නා ලදී. සෞඛ්‍ය සේවාවන් සම්බන්ධව සේවා නියුක්තයන් දැනුම්වත් කිරීමේ වැඩසටහන් තුනක් (03) සලකා බලන වර්ෂය තුළ දී කා.සේ.ක. දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කරන ලදී. 2016 ජූනි මස සේවා නියුක්තයන් සඳහා සෞඛ්‍ය කඳවුරක් සාර්ථක ලෙස පවත්වන ලදී.

## 28. සංඛ්‍යාන

2016 වසරේදී ද සංඛ්‍යාන දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා මහ බැංකුවේ මූලික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ආර්ථික හා මිල ස්ථායිතාව පවත්වා ගැනීමේ පර්ෂදය තුළ එහි කාර්යයන් ඵලදායීව ඉටු කරමින් අඛණ්ඩව දායක විය. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාර්යයන් වශයෙන්, ආකෘති හා ආකෘති නොවන ක්‍රමවේද භාවිතයෙන් කෙටිකාලීන ප්‍රධාන සාර්ව ආර්ථික විචල්‍යයන් ඇස්තමේන්තු කිරීම හා පුරෝකථනය කිරීම; අනෙකුත් දෙපාර්තමේන්තු හා එක්ව පුරෝකථන හා ප්‍රතිපත්ති විශ්ලේෂණ පද්ධතිය (Forecasting and Policy Analysis System- FPAS), බේසියානු දෛශික ස්වප්‍රතිපායනය (Bayesian Vector Autoregression - BVAR) සහ සාධක පදනම් කරගත් දෛශික ස්වප්‍රතිපායනය (Factor Augmented Vector Autoregression - FAVAR) වැනි වඩා දියුණු ශිල්ප ක්‍රම උපයෝගී කර ගනිමින් සාර්ව ආර්ථික ආකෘති නිර්මාණය කිරීම; මිල හා වේතන දර්ශක, ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය හා පළාත් මට්ටමින් දළ දේශීය නිෂ්පාදිතය සම්පාදනය කිරීම; දීපව්‍යාප්ත දත්ත එක්රැස් කිරීමේ වැඩ සටහන වැනි ප්‍රාථමික දත්ත මූලාශ්‍ර හා අනෙකුත් ද්විතීයික දත්ත මූලාශ්‍ර හරහා දත්ත එකතු කිරීම හා සැකසීම; සමීක්ෂණ පැවැත්වීම සහ එසේ එක්රැස් කරන ලද දත්ත භාවිතයෙන් මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලියට දායක වීම සඳහා ආර්ථිකමය වශයෙන් වැදගත් ඉදිරි දැක්මකින් යුක්ත දර්ශක සැකසීම; ප්‍රකාශන හා පුවත්පත් නිවේදන මගින් සංඛ්‍යාංක හා තොරතුරු කාලීනව නිකුත් කිරීම; ප්‍රථමයෙන් අභ්‍යන්තරව පවත්වාගෙන යනු ලැබූ නමුත් ඉන් අනතුරුව පොදු ජනතාවට නිකුත් කළ දත්ත සංචිතය කළමනාකරණය සහ පවත්වාගෙන යෑම; සහ ප්‍රධාන ගෝලීය ශ්‍රේණිගත කිරීම්හි ශ්‍රී ලංකාවේ ස්ථානය ඉහළ නැංවීම සඳහා දායක වීම ආදිය සැලකිය හැකිය. මීට අමතරව අදාළ වර්ෂය තුළ දී සංඛ්‍යාන දෙපාර්තමේන්තුව, දේශීය හා ජාත්‍යන්තර ආයතනයන්හි ධාරිතා වර්ධන වැඩසටහන් සඳහා සම්පත් දායකත්වය ද සපයන ලදී.

### 28.1 ප්‍රධාන සාර්ව ආර්ථික විචල්‍ය පුරෝකථනය කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුවේ මූලික අරමුණක් වන ආර්ථික හා මිල ස්ථායිතාව පවත්වා ගැනීම වෙනුවෙන් සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් පාරිභෝගික මිල උද්ධමනය හා ආර්ථික වර්ධනය පිළිබඳ කෙටිකාලීන පුරෝකථන සිදු කෙරිණි. රටෙහි මුදල් ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සඳහා, මෙම පුරෝකථන මුදල් ප්‍රතිපත්ති කමිටුවට සහ මුදල් මණ්ඩලයට යොමුකරන ලදී. තවදුරටත්, පාරිභෝගික මිල ගණන්වල විචලන මත පදනම් වූ, උද්ධමනය කෙරෙහි බලපාන විචල්‍යයන්හි සත්‍යය සහ ප්‍රත්‍යක්ෂ වෙනස්වීම් අනුව සහ දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරන සමීක්ෂණ හරහා සොයාගන්නා යෙදවුම් සහ නිමැවුම්වල මිල වර්ධන අනුව උද්ධමනය පිළිබඳ පුරෝකථන නිරතුරු යාවත්කාලීන කරනු ලැබේ.

පුරෝකථන කාලරාමුව මත පදනම්ව, උද්ධමනය පුරෝකථන කිරීමේ ක්‍රම ගණනාවක් භාවිතා කෙරේ. කෙටිකාලීන පුරෝකථන සඳහා මූලික වශයෙන්, මෑතකාලීන මිල ප්‍රවණතා සහ වෙළඳපොළ වර්ධන ආශ්‍රිත කෙටිකාලීන මිල ගණන්වල අපේක්ෂිත විචලන පදනම් කර ගැනේ. මැදි හා දිගුකාලීන පුරෝකථන සඳහා ආර්ථිකමිතික ක්‍රමවේද පදනම් කර ගැනෙන අතර, සැපයුම් සහ ඉල්ලුම් යන දෙපාර්ශවයෙන්ම උද්ධමනයට බලපාන බව පෙන්නුම් කරන නව විචල්‍යය පිළිබඳ නිරන්තරයෙන් අධ්‍යයනය කරනු ලැබේ. මෙහි දී ශ්‍රී ලංකා මහ බැංකුවේ පුරෝකථන සහ ප්‍රතිපත්ති විශ්ලේෂණ පද්ධතිය සඳහා පුරෝකථන ආකෘති කිහිපයක් ගොඩනැගීම සඳහා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව සමග එක්ව සංඛ්‍යාන දෙපාර්තමේන්තුවේ දායකත්වය ලබාදෙන ලදී.

වෙනස්වන වියදම් රටාවට ගැළපෙන පරිදි සහ වෙළඳපොළේ පවතින භාණ්ඩ හා සේවාවල වෙනස්වීම් නියෝජනය කිරීම සඳහා, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ පදනම් වර්ෂය 2006/07 සිට 2013 දක්වා යාවත්කාලීන කරන ලදී. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව නව පදනම් වර්ෂය යටතේ සකස් කළ කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2013=100) 2017 වසරේ ජනවාරි මස දී නිකුත් කරන ලදී. සංඛ්‍යාන දෙපාර්තමේන්තුව නව දර්ශකයට ගැළපෙන පරිදි පුරෝකථන ක්‍රම නැවත සකස් කරන ලදී. ඒ අතර, ප්‍රතිපත්ති සැකසුම් අවශ්‍යතා සඳහා ජාතික පාරිභෝගික මිල දර්ශකය සහ කොළඹ පාරිභෝගික මිල දර්ශක දෙකෙහිම මිල ප්‍රවණතා සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව නිරීක්ෂණය කරනු ලැබේ.

එක් එක් උප ක්‍රියාකාරකම්වලට අදාළ ප්‍රාථමික හා ද්විතීයික දත්ත භාවිතා කරමින් දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.) කාර්තුමය වශයෙන් පුරෝකථනය කරනු ලැබීය. ආර්ථික දර්ශක පදනම් කරගත් පුරෝකථන සඳහා ආර්ථිකයේ උප ක්‍රියාකාරකම්වලට අදාළ ප්‍රමුඛ ආර්ථික දර්ශක, සමීක්ෂණ තුළින් ලබාගත් තොරතුරු සහ අනෙකුත් ආර්ථික තොරතුරු පදනම් කරගනු ලබන අතර පුරෝකථනයන්හි නිරවද්‍යතාවය වැඩි දියුණු කිරීම පිණිස යොදාගන්නා ආකෘතීන් මත පදනම් වූ අදාළ සංඛ්‍යානමය ක්‍රමවේදයන් ද පුරෝකථන සඳහා උපයෝගී කර ගනු ලැබේ. තවද, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2010 වර්ෂය පදනම් කර ජාතික ගිණුම් සම්පාදනය කිරීමත් සමගම හඳුන්වා දෙන ලද ආර්ථික කටයුතු වර්ගීකරණයට අනුකූලව සංඛ්‍යාන දෙපාර්තමේන්තුවේ ආර්ථික දර්ශක පදනම් කරගත් පුරෝකථන ක්‍රියාවලිය ද යාවත්කාලීන කරන ලදී. ඒ අනුව සමීක්ෂණවලින් සහ බාහිර ආයතනවලින් ලබාගත් තොරතුරු මත පදනම්ව සකසාගත් නව දර්ශක, පුරෝකථන ක්‍රියාවලිය සඳහා ඇතුළත් කරගන්නා ලදී.

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් සිය දෙපාර්තමේන්තුව තුළ සිදු කරනු ලබන පුරෝකථන ක්‍රියාවලියට අමතරව, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව සමග එක්ව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ තාක්ෂණික සහාය සහිතව ශ්‍රී ලංකා මහ බැංකුවේ පුරෝකථන හා ප්‍රතිපත්ති විශ්ලේෂණ පද්ධතිය (FPAS) ස්ථාපනය කිරීම සඳහා සම්බන්ධ විය. මෙම රාමුව තුළ ද.දේ.නි. සහ උද්ධමනය ඇතුළත් සාර්ව ආර්ථික විචලනවල මධ්‍යකාලීන පුරෝකථන සඳහා නව කේන්සියානු විවෘත ආර්ථික ආකෘතියක් සකස් කරන ලදී. අදාළ ඇගයීම් කටයුතුවලින් අනතුරුව මෙම ආකෘතිය මුදල් ප්‍රතිපත්ති විශ්ලේෂණය සඳහා යොදාගැනෙනු ඇත. මීට අමතරව ද.දේ.නි. හා උද්ධමනය සඳහා කෙටිකාලීන පුරෝකථනයන් සිදු කිරීමට, සාධක පදනම් කරගත් දෛශික ස්වප්‍රතිපායන ආකෘතියක් (FAVAR) සහ බේසියානු දෛශික ස්වප්‍රතිපායන ආකෘතියක් (BVAR) නිර්මාණය කරන ලදී.

## 28.2 මිල හා වැටුප් දර්ශක ගණනය කිරීම

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව මගින් අර්ධ වාර්ෂිකව ඉඩම් මිල දර්ශකය ගණනය කිරීම නොකඩවා සිදු කළ අතර ඒ සඳහා කොළඹ, දෙහිවල, හෝමාගම, කඩුවෙල සහ කැස්බෑව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට අයත් උප කොට්ඨාස 51ක් සඳහා වන තක්සේරු දත්ත, තක්සේරු දෙපාර්තමේන්තුව මගින් ලබා ගැනේ. නේවාසික, වාණිජ සහ කාර්මික යන අංශ ආවරණය කරමින් දර්ශක තුනක් සම්පාදනය කරනු ලබන අතර එම දර්ශක තුනෙහි සරල සාමාන්‍යය තුළින් සමස්ත ඉඩම් මිල දර්ශකය ගණනය කරනු ලබයි. මීට අමතරව දේපළ මිල දර්ශකයන්හි ආවරණ පථය වැඩි දියුණු කිරීම සඳහා දැනට පවත්නා දර්ශක, භූගෝලීය වශයෙන් සහ ක්‍රමවේදී වශයෙන් යන දෙයාකාරයෙන්ම වැඩි දියුණු කිරීම සහ නේවාසික දේපළ වෙළඳපොළෙහි වර්ධනයන් ග්‍රහණය කර ගැනීම සඳහා නව දර්ශක හඳුන්වා දීම සඳහා සංඛ්‍යාන දෙපාර්තමේන්තුව මූලික පියවර කිහිපයක් තබා ඇත. මේ අනුව කළමනාකාරිත්වය දැනුවත් කිරීම පිණිස සහාධිපත්‍ය දේපළ වෙළඳපොළෙහි මිල විචලනයන් අධීක්ෂණය කිරීම සඳහා 2016 වසරේ දී කොළඹ දිස්ත්‍රික්කය ආවරණය කරමින් මිල දර්ශකයක් සම්පාදනය කරන ලදී.

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් ආර්ථිකයේ වැටුප් සහ වේතනවල විචලන මැනීම සඳහා වැටුප් ප්‍රමාණ දර්ශක ගණනය කරනු ලැබේ. දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය අංශයේ සේවකයන්ගේ නාමික සහ මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශක ගණනය කරනු ලබයි. කම්කරු දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලබන, පඩි පාලක සභාවල සේවකයන්ගේ නාමික වැටුප් ප්‍රමාණ දර්ශකය පදනම්ව විධිමත් පෞද්ගලික අංශයේ මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශක ගණනය කරනු ලබයි. දීප ව්‍යාප්ත දත්ත රැස්කිරීමේ වැඩපිළිවෙළ මගින් රැස්කරනු ලබන දත්ත පදනම් කරගෙන සකසනු ලබන අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශක මගින්, අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් විචලන විශ්ලේෂණය කරනු ලැබේ. විධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වැටුප් ප්‍රවණතා නිරූපණය කිරීම සඳහා නව දර්ශක සම්පාදනය කිරීමේ කාර්යයට සංඛ්‍යාන දෙපාර්තමේන්තුව මුලපුරා ඇත.

## 28.3 ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය ගණනය කිරීම

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව 2015 වසර සඳහා ද සමස්ත රටෙහි මෙන්ම එක් එක් පළාත් වශයෙන් සෞභාග්‍ය තත්ත්වය මැන බැලීමේ සහ සංසන්දනය කිරීමේ සංයුක්ත දර්ශකයක් වන ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය සම්පාදනය කරන ලදී. මෙම දර්ශකය, පළාත් මට්ටමින් ආර්ථික හා සමාජීය ප්‍රගමනය නිරූපණය කරන විචල්‍යයන් 42ක් යොදා ගනිමින් ගණනය කරනු ලබන්නා වූ ආර්ථික හා ව්‍යාපාර පරිසරය, ජන ජීවිතයේ යහ පැවැත්ම සහ සමාජ ආර්ථික යටිතල පහසුකම් යන උපදර්ශක තුනකින් සමන්විත වෙයි. 2014 වසරේ සිට ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය සැකසීමේ දී, ලෙගටම් සෞභාග්‍ය දර්ශකය ගණනය කිරීමේ ක්‍රමවේදය සමීපව අනුගමනය කරනු ලබන නව ක්‍රමවේදයක් භාවිතා කරන අතර එහි දී දත්ත සාමාන්‍යකරණය වෙනුවට සියලුම විචල්‍යයන් එකකින් අනිකෙහි අනුපාතයක් ලෙස ගැනීම සඳහා සම්මතකරණය කරනු ලබයි. රටෙහි සමස්ත සෞභාග්‍යය නිරූපණය කරන මෙම දර්ශකයෙහි නිරූප්‍යතාවය වැඩි කිරීමේ අරමුණ සහිතව, යොදාගන්නා විචල්‍යයන් සහ ක්‍රමවේදය වැඩි දියුණු කිරීම පිළිබඳව සංඛ්‍යාන දෙපාර්තමේන්තුව, නිරන්තර විමසිල්ලෙන් පසු වෙයි. ඒ අනුව 2016 වසර තුළ දී දර්ශකයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කරමින්, විධිමත් අංශයේ සේවා නියුක්තිකයන් සමස්ත සේවා නියුක්තිකයන්ගේ ප්‍රතිශතයක් ලෙස ගණනය කිරීම සඳහා නව විචල්‍යයක් ආර්ථික හා ව්‍යාපාර පරිසරය උපදර්ශකය සැකසීමේ දී උපයෝගී කර ගන්නා ලදී.

## 28.4 පළාත් දළ දේශීය නිෂ්පාදනය ගණනය කිරීම

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ඇස්තමේන්තු කරන ලද දළ දේශීය නිෂ්පාදිතය පළාත් අනුව විභේදනය මගින් 2015 වසර සඳහා වූ නාමික පළාත් දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීම හා ප්‍රකාශයට පත් කිරීම සිදු කරන ලදී. මෙහිදී පළාත් මට්ටමට අදාළ දර්ශක භාවිතා කරමින් දළ දේශීය නිෂ්පාදිතයේ සෑම අයිතමයකම අගයන් බෙදා වෙන් කරනු ලබයි. 2015 වසර සඳහා වූ සංඛ්‍යාංක සහ 2014 වසර සඳහා වූ සංශෝධිත ඇස්තමේන්තු අගය, 2016 වසරේ අගෝස්තු මස ප්‍රකාශයට පත් කරන ලදී. සංඛ්‍යාන දෙපාර්තමේන්තුව, ඇස්තමේන්තු අගයන්හි විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීම සඳහා, පළාත් මට්ටමින් ජාතික දත්ත බෙදා වෙන් කළ හැකි යෝග්‍ය දර්ශක පිළිබඳව නිරන්තර අධ්‍යයනයක යෙදෙමින් සිටියි. මීට අනුරූපව 2016 වසරේ දී දර්ශකයන්හි ගුණාත්මකභාවය තවදුරටත් වැඩි කරමින්, සත්ත්ව නිෂ්පාදන ක්‍රියාකාරකම්හි නොනිමි වැඩ කෘෂිකාර්මික අංශය සඳහා එකතු කිරීම; භාණ්ඩ සහ මගීන් ප්‍රවාහනයේ දී සමස්ත සිවිල් ගුවන් සේවා සහ භාණ්ඩ හැසිරවීම් සඳහා ගබඩා පහසුකම් ද ඇතුළත් වන පරිදි සේවා අංශය පුළුල් කිරීම; සහ කර්මාන්ත අංශයේ ඉදිකිරීම් සඳහා වඩාත්ම යෝග්‍ය විචල්‍යයන් අදාළ වර්ෂය තුළ දී උපයෝගී කර ගැනීම සිදු කරන ලදී.

### 28.5 සංඛ්‍යාන සමීක්ෂණ සිදු කිරීම

වර්තමාන ආර්ථික තත්ත්වයන් සහ කෙටිකාලීන වෙළඳපොළ ප්‍රවණතා ආවරණය කිරීම සඳහා ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය 2016 වසර තුළ දී ද අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. මෙම සමීක්ෂණය ආර්ථිකයේ ඉදිරි ප්‍රවණතා පිළිබඳව පූර්ව දැනුම්දීමේ දර්ශකයක් ලෙස ක්‍රියා කරයි. ආර්ථිකයේ ප්‍රධාන ක්‍රියාකාරකම් (කෘෂිකාර්මික, කාර්මික හා සේවා) නියෝජනය කරන මහා පරිමාණ ව්‍යාපාර ඒකක මෙම සමීක්ෂණයේ ඉලක්කගත සංගහනය වේ. මෙම සමීක්ෂණය, වසර තුළ සිව් වතාවක් කාර්තුමය වශයෙන් පවත්වන ලද අතර එහි ප්‍රතිඵල මත පදනම්ව ව්‍යාපාර තත්ත්වය, ලාභදායීත්වය, පුහුණු ශ්‍රමය උපයෝජ්‍යතාවය, විකුණුම්, ඉල්ලුම හා ධාරිතා උපයෝජ්‍යතාවය යන ව්‍යාපාර මතය පිළිබඳ වූ දර්ශක ගණනය කරන ලදී. අදාළ සමීක්ෂණ ප්‍රතිඵල මුදල් ප්‍රතිපත්ති කමිටුවට ඉදිරිපත් කරන අතර සාමාන්‍ය මහජනතාවගේ දැනුම්වත් වීම පිණිස සාරාංශගත ප්‍රතිඵල කාර්තුමය වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියේ පළ කරන ලදී.

ණය වෙළඳපොළේ ඉල්ලුම සහ සැපයුම පිළිබඳ ප්‍රවණතා අධ්‍යයනය කිරීමේ අරමුණින් ණය තත්ත්වය පිළිබඳ අර්ධ වාර්ෂික සමීක්ෂණය 2016 වසර තුළ දී ද අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. ණය ඉල්ලුම පිළිබඳ ප්‍රවණතා හඳුනාගැනීමට ණය ඉල්ලුම පිළිබඳ සමීක්ෂණය ද, ණය සැපයුම පිළිබඳ ප්‍රවණතා හඳුනාගැනීමට ණය සැපයුම පිළිබඳ සමීක්ෂණය ද, වශයෙන් මෙම සමීක්ෂණය කොටස් දෙකකින් සමන්විත වේ. ණය සැපයුම පිළිබඳ සමීක්ෂණය සියලු බලපත්‍රලාභී වාණිජ බැංකු සහ විශේෂිත බලපත්‍රලාභී බැංකු ආවරණය කරනු ලබයි. ආර්ථිකයේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ඒකක ණය ඉල්ලුම පිළිබඳ සමීක්ෂණයේ ඉලක්කගත සංගහනය වේ. මෙම සමීක්ෂණය බස්නාහිර පළාත තුළ මෙන්ම ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාලවලින් ආවරණය වන පළාත් තුළ ද ක්‍රියාත්මකව පවතී. මෙම සමීක්ෂණයේ ප්‍රතිඵල අර්ධ වාර්ෂික පදනමින් ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා කළමනාකාරිත්වය වෙත වාර්තා කරනු ලැබීය.

නිෂ්පාදන හා සේවා කටයුතුවලට අදාළව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය මාසිකව සම්පාදනය කරනු ලැබූ අතර එමගින් වෘත්තීය ගැනුම්කරුවන්, ව්‍යාපාර පිළිබඳව තීරණ ගන්නන් හා ආර්ථික විශ්ලේෂකයන්ට කර්මාන්ත කටයුතුවල පවත්නා තත්ත්වය පිළිබඳව මනා අවබෝධයක් ලබා ගැනීමට උපකාරී වන, සහ නිෂ්පාදන සහ සේවා කටයුතුවල ක්‍රියාකාරිත්වය පිළිබඳව පූර්ව දැනුම්දීමේ දර්ශකයක් ලෙස භාවිතා කළ හැකි අතිරේක හා කාලීන දත්ත ලබා දීම අරමුණු කෙරේ. මෙම සමීක්ෂණයේ දී නිෂ්පාදන කර්මාන්ත කටයුතුවලට අදාළව ගැනුම් කළමනාකරණ දර්ශක සමීක්ෂණයෙහි ඉලක්කගත සංගහනය ලෙස ප්‍රධාන වශයෙන් බස්නාහිර පළාතේ ස්ථානගත වී ඇති නිෂ්පාදන කර්මාන්තයන්හි ගැනුම් කළමනාකරුවන් ඇතුළත් වන අතර ආයතන 100 ක නියැදියක් ඉලක්ක කර ගනිමින් සෑම මසකම අවසාන සතිය තුළ දී මෙම සමීක්ෂණය සිදු කරනු ලබයි. සමීක්ෂණයේ නිෂ්පාදන කර්මාන්ත කටයුතු සඳහා උපදර්ශක ලෙස නව ඇණවුම්, නිෂ්පාදිතය, සේවා නියුක්තිය, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගත වන කාලය සහ ගැනුම් තොගද, සේවා කටයුතු සඳහා උප දර්ශක ලෙස නව ව්‍යාපාර කටයුතු, ව්‍යාපාර ක්‍රියාකාරකම්, සේවා නියුක්තිය, නිම කිරීමට නියමිත කාර්යයන් සහ ව්‍යාපාර ක්‍රියාකාරකම් සම්බන්ධ ඉදිරි අපේක්ෂාවන් ද ඇතුළත් වන පරිදි පෙර මාසයට අනුරූපව මාසික ප්‍රවණතාවයන් නිරූපණය වන දර්ශකයන් ගණනය කරනු ලැබූ අතර, අදාළ ප්‍රතිඵල ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේ ක්‍රියාවලියට දායක කර ගැනීම සඳහා ඉහළ කළමනාකාරිත්වයට සහ මුදල් ප්‍රතිපත්ති කමිටුවට වාර්තා කරන ලදී. නිෂ්පාදන මිල ප්‍රවණතා හඳුනා ගැනීමේ අරමුණෙන්, 2016 ජූලි මස සිට ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයේ නිෂ්පාදන කර්මාන්ත කටයුතු සඳහා නව උපදර්ශකයක් ලෙස "විකුණුම් මිල" ඇතුළත් කරන ලදී. ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සාමාන්‍ය මහජනතාවගේ දැනුම්වත් වීම පිණිස 2016 ජුනි මස සිට මාසිකව ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවියේ පළ කරන ලදී.

උද්ධමන අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය, 2006 වසරේ සිට සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් මාසිකව පවත්වන ලදී. වර්තමානයේ දී, මෙම සමීක්ෂණය සඳහා ව්‍යාපාරික සහ ගෘහස්ථ යන දෙඅංශයේ ප්‍රතිචාර දක්වන්නන් අන්තර්ගත වේ. 2016 වසරේ දී සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් මෙම සමීක්ෂණයට අදාළ නියැදි යාවත්කාලීන කිරීමට කටයුතු කරන ලදී. ප්‍රතිචාර දක්වන්නන් විසින් වර්තමාන උද්ධමන තත්ත්වය මෙන්ම ඉදිරි මාස 12 ක කාලය තුළ දී අපේක්ෂිත උද්ධමනය පිළිබඳ ප්‍රමාණාත්මක හා ගුණාත්මක තොරතුරු සපයනු ලැබේ. සමීක්ෂණයේ ප්‍රතිඵල මුදල් ප්‍රතිපත්ති කමිටුවට සහ මුදල් මණ්ඩලයට මාසිකව වාර්තා කරන ලදී.

රටෙහි රාජ්‍ය අංශයේ සේවා නියුක්තියෙහි ප්‍රවණතා නිර්ණය කිරීම සඳහා, රාජ්‍ය අංශයේ සියලුම ආයතන ආවරණය වන පරිදි රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ සමීක්ෂණය අර්ධ වාර්ෂිකව පවත්වන ලදී. තවද, ශ්‍රම බලකාය හා ශ්‍රම වෙළඳපොළ පිළිබඳව එක්රැස් කළ තොරතුරු රටෙහි සේවා නියුක්තිය, සේවා වියුක්තිය, විදේශ සේවා නියුක්තිය, කම්කරු සබඳතා, ශ්‍රම වෙළඳපොළ ප්‍රතිසංස්කරණ සහ ශ්‍රම ඵලදායිතාව යන කාණ්ඩ යටතේ විශ්ලේෂණය කරන ලදී. අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීමක් ලෙස, ජාතික සහ අන්තර්ජාතික ආයතන සමග අන්‍යෝන්‍ය වශයෙන් දත්ත හුවමාරු කර ගැනීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක විය.

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින්, ශ්‍රී ලංකා මහ බැංකුවේ අනෙකුත් දෙපාර්තමේන්තු සහ වෙනත් බාහිර පාර්ශව කිහිපයක් ද සමග ඒකාබද්ධව, 2017 වසර සඳහා වූ ලෝක බැංකු ගෝලීය මූල්‍ය අන්තර්ගතභාවය සහ පාරිභෝගික ආරක්ෂණ සමීක්ෂණය (Financial Inclusion and Consumer Protection - FICP) නිම කිරීම සඳහා දායක වීම සිදුකරන ලදී.

පෞද්ගලික අංශයේ සෞඛ්‍ය සේවා කටයුතුවල ප්‍රවණතාවයන් හඳුනා ගැනීමේ අරමුණෙන් දර්ශකයක් ගොඩනැගීම සඳහා සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් මෙම වසර තුළ දී පෞද්ගලික අංශයෙහි සෞඛ්‍ය සේවා කටයුතු පිළිබඳ සමීක්ෂණයක් ආරම්භ කරන ලදී. මෙහිදී පෞද්ගලික අංශයේ

සෞඛ්‍යය සේවා කටයුතු නියෝජනය සඳහා සුදුසු නියැදියක් හඳුනා ගැනීමේ අරමුණෙන් 2016 වසරේ සිව්වන කාර්තුවේ දී සංගණනයක් මගින් පෞද්ගලික රෝහල් සහ වෛද්‍ය මධ්‍යස්ථානවලින් ප්‍රතිකාර ලබාගත් රෝගීන් සංඛ්‍යාව පිළිබඳව දත්ත රැස්කරන ලදී. ඒ අනුව පෞද්ගලික රෝහල් සහ වෛද්‍ය මධ්‍යස්ථානවලින් මාසිකව ප්‍රතිකාර ලබා ගන්නා ලද බාහිර රෝගීන් ගණන හා නේවාසික රෝගීන් ගණන කාර්තුමය වශයෙන් මෙම සමීක්ෂණය මගින් එක්රැස් කර අදාළ දර්ශකය සකස් කිරීමට සැලසුම් කර ඇත.

## 28.6 දීප ව්‍යාප්ත දත්ත රැස්කිරීමේ වැඩ පිළිවෙළ පරිපාලනය කිරීම

1978 වසරේ දී ආරම්භ කරන ලද දීප ව්‍යාප්ත දත්ත රැස්කිරීමේ වැඩ පිළිවෙළ 2016 වසරේ දීත් අඛණ්ඩව ක්‍රියාත්මක වූ අතර ඒ හරහා පාරිභෝගික භාණ්ඩවල මිල ගණන්, කෘෂිකාර්මික හා මත්ස්‍ය නිෂ්පාදනවල නිෂ්පාදක මිල ගණන්, අවිධිමත් පෞද්ගලික අංශයේ දෛනික වැටුප් සහ කෘෂිකාර්මික හා මත්ස්‍ය නිෂ්පාදනවල අපේක්ෂිත අනාගත නිෂ්පාදන මට්ටම් යන තොරතුරු සතිපතා, මාස්පතා හා කාර්තුමය වශයෙන් ක්‍රමිකව රැස්කරනු ලබයි. දිවයින පුරා මධ්‍යස්ථාන 106ක් සඳහා දත්ත සමීක්ෂකවරු ලෙස කටයුතු කරන රජයේ පාසල්වල ගුරුවරුන් හරහා දත්ත රැස්කිරීමේ ක්‍රියාවලිය සිදු කරනු ලබයි. මීට අමතරව, පිටකොටුව වෙළඳපොළ, මරඳගහමුල සහල් වෙළඳපොළ, දඹුල්ල සහ නාරාහේන්පිට විශේෂ ආර්ථික මධ්‍යස්ථාන සහ මීගමුව හා පැලියගොඩ මාළු වෙළඳපොළ යන ස්ථානවලින් තොග සහ සිල්ලර මිල ගණන් දෛනිකව හා සතිපතා රැස්කිරීම සඳහා දත්ත සමීක්ෂකවරුන් 6 දෙනෙකුගේ සේවය ද මෙම වැඩ පිළිවෙළ සඳහා යොදා ගැනේ. තවද කළමනාකරණ තොරතුරු පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා දෙපාර්තමේන්තුව මගින් තෝරාගත් වෙළඳපොළවලින් ආහාර ද්‍රව්‍යය කිහිපයක තොග සහ සිල්ලර මිල ගණන් දෛනිකව රැස් කිරීම සිදු කෙරේ.

මෙම වැඩපිළිවෙළ යටතේ එක් රැස් කරනු ලබන මිල හා වැටුප් සම්බන්ධ දත්තවල සෘතුමය විචලනයන් සහ ප්‍රාදේශීය වෙනස්කම් විශ්ලේෂණ කිරීම; මිල දර්ශක, පළාත් දළ දේශීය නිෂ්පාදිතය සහ ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය සම්පාදනය කිරීම; මිල විචලන පුරෝකථනය කිරීම; ආර්ථික ප්‍රතිපත්තිවල වෙනස්කම් මගින් මිල මත ඇති කරන බලපෑම ඇගයීම; ජාතික ආදායම හා වියදම ඇස්තමේන්තු කිරීම සහ මිල හා වැටුප් දත්ත පොදු ජනතාව වෙත බෙදාහැරීම වැනි අරමුණු සඳහා පුළුල් වශයෙන් යොදා ගනු ලබයි.

දත්ත සමීක්ෂකවරුන් විසින් වාර්තා කරනු ලබන දත්තවල නිරවද්‍ය බව හා කාලීන බව පවත්වා ගැනීම සඳහා විධිමත් ස්ථානීය සහ විතැන් පරීක්ෂණ සිදු කරන ලදී. සංඛ්‍යාන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් කොළඹ දිස්ත්‍රික්කයේ තෝරාගන්නා ලද වෙළඳපොළවලින් සෘජුවම රැස් කරනු ලබන මිල ගණන් මගින් මෙම දත්තවල නිරවද්‍යතාවය තවදුරටත් තහවුරු කර ගන්නා ලදී.

සාමාන්‍ය පරිචය අනුව යමින් 2016 වසරේ දී ද දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙළ යටතේ, අත්දැකීම් බෙදා හදා ගැනීමට, හඳුනාගත් ප්‍රදේශවල මිල වර්ධනයන්ගේ වෙනස්කම් පිළිබඳ ප්‍රතිචාර ලබා ගැනීමට සහ වැඩපිළිවෙළට අදාළ මෙහෙයුම් ගැටලු සාකච්ඡා කිරීමට කොළඹ, මාතර, අනුරාධපුර, මහනුවර සහ යාපනය යන ප්‍රදේශවල ප්‍රාදේශීය සම්මන්ත්‍රණ 5ක් පවත්වන ලදී. එසේම දත්ත සමීක්ෂකයන්ගේ හැකියාව ඉහළ නැංවීම ද මෙම සම්මන්ත්‍රණ මාලාවේ අරමුණක් විය.

පෙර වසරවල දී මෙන්ම දත්ත රැස්කිරීමේ ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම සඳහා මෑතකාලීන වෙළඳපොළ වර්ධනයන් හා ආර්ථික ක්‍රියාකාරකම්වලට අනුරූපව යාවත්කාලීන කළ දත්ත රැස්කිරීමේ ආකෘතීන් හඳුන්වා දෙන ලදී. "පෙර විමසුම් වැඩසටහන" සඳහා යොදා ගනු ලබන දත්ත ආකෘතිය ද මෙම වසර තුළ දී වඩා සවිස්තරාත්මක වන පරිදි සහ භාවිතයට පහසු වන අයුරින් සංශෝධනය කරන ලදී. තවද, දත්ත රැස් කිරීම සහ සම්පාදනය කිරීම කඩිනම් කරවීමේ දැක්මක් සහිතව දත්ත සමීක්ෂකවරුන් විසින් ඉලෙක්ට්‍රොනිකව දත්ත වාර්තා කිරීමේ ක්‍රියාවලිය ධෛර්යමත් කරන ලද අතර මුළු දත්ත සමීක්ෂකවරුන් අතුරින් 1/4 ක පමණ පිරිසක් 2016 වසර තුළ දී මෙම ක්‍රියාවලිය සඳහා අනුගත විය. තව දුරටත් සංඛ්‍යාන දෙපාර්තමේන්තුව නව තාක්ෂණය උපයෝගී කර ගනිමින් දත්ත කඩිනමින් රැස්කිරීම සහ කාර්යක්ෂමව සකස් කිරීම ඉලක්ක කොට ගෙන, පවත්නා දීප දත්ත වැඩපිළිවෙළ ප්‍රතිසංශෝධනය කිරීමට දැනටමත් පියවර ගෙන ඇත.

## 28.7 ගෝලීය ශ්‍රේණිගත කිරීමේ දර්ශක අතර ශ්‍රී ලංකාව ඉහළ ස්ථානයක පවත්වා ගැනීම

### "ව්‍යාපාර පවත්වාගෙන යෑමේ පහසුව" පිළිබඳ වන ශ්‍රේණිගත කිරීම

පසුගිය වසර කිහිපය මෙන්ම, සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් "ව්‍යාපාර පවත්වාගෙන යෑමේ පහසුව" පිළිබඳ වන ශ්‍රේණිගත කිරීම තුළ ශ්‍රී ලංකාව ඉහළ ස්ථානයක පිහිටුවීම සඳහා දායකත්වයක් දක්වන තම ප්‍රයත්නයන් තව දුරටත් ඉටු කරන ලදී. ආයෝජන පරිසරය වැඩි දියුණු කිරීමේ සමස්ත අරමුණට අදාළව ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීම සඳහා 2016 වසරේ සිට ලෝක බැංකුවෙහි තාක්ෂණික සහාය ලබා ගන්නා වූ නව කාර්යය පිළිවෙළක්, සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය යටතේ පිහිටුවන ලදී. ඒ අනුව 2016 වසරේ දී සංඛ්‍යාන දෙපාර්තමේන්තුව, සිදු කෙරෙන ප්‍රතිසංස්කරණවල ප්‍රගතිය පිළිබඳ සොයා බැලීමට අදාළ රජයේ ආයතන සමග නිරන්තර සාකච්ඡා පැවැත්වීම; මෑතකාලීන ප්‍රවණතා පිළිබඳව දැනුම්වත් කිරීමට තොරතුරු සපයන්නන් සඳහා රැස්වීම් සංවිධානය කිරීම; ශ්‍රේණිගත කිරීමට අදාළ ක්ෂේත්‍රවල නියුතු රාජ්‍ය හා පෞද්ගලික අංශවල නිලධාරීන් සමග සාකච්ඡා කිරීමට ලෝක බැංකු දූත මණ්ඩල සඳහා පහසුකම් සැලසීම; ශ්‍රේණිගත කිරීම් තුළ රටෙහි ස්ථානය වැඩි දියුණු කර ගැනීම හා සම්බන්ධ වන ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සඳහා ශ්‍රී ලාංකික සහභාගිත්වයට අදාළ කටයුතු සම්බන්ධීකරණය කිරීම සහ ඉතාම වැදගත් වශයෙන් මෙම ශ්‍රේණිගත කිරීම සඳහා සලකා බැලෙන විචල්‍යයන්ට බලපාන

ලෙස ක්‍රියාත්මක වූ සංශෝධන පිළිබඳ තොරතුරු නියමිත වේලාවට ලෝක බැංකුව වෙත ලබා දීම යනාදිය සිදු කරනු ලැබිණි.

**අනෙකුත් ගෝලීය ශ්‍රේණිගත කිරීම්**

ගෝලීය දර්ශක වන ලෝකව්‍යාප්ත පාලන දර්ශක (Worldwide Governance Indicators), ගෝලීය තරගකාරිත්ව දර්ශකය (Global Competitiveness Index), ආර්ථික ස්වාධීනතා දර්ශකය (Index of Economic Freedom), මානව සංවර්ධන දර්ශකය (Human Development Index), ලෝක ආර්ථික ස්වාධීන දර්ශකය (Economic Freedom of the World Index), දූෂණ පිළිබඳ සංජානන දර්ශකය (Corruption Perceptions Index), වෙළඳ කටයුතු ශක්තිමත් කිරීමේ දර්ශකය (Enabling Trade Index) සහ ආර්ථික සහයෝගීතාවය සහ සංවර්ධනය සඳහා වූ සංවිධානය (Organization for Economic Co-operation and Development) මගින් සිදුකරන හවුල්කාර රටවල අවදානම් වර්ගීකරණය පිළිබඳ ඇගයීම් අඛණ්ඩව අධීක්ෂණය කරමින් මෙම ශ්‍රේණිගත කිරීම් අනුව ශ්‍රී ලංකාවට ලැබී ඇති ස්ථානය සහ ශ්‍රේණිගත කිරීම්වල වර්ධනයක් ඇති කර ගැනීම සඳහා යොදා ගත හැකි උපාය මාර්ග පිළිබඳ වාර්තා කළමනාකාරිත්වයට සහ අනෙකුත් ඉහළ අධිකාරීන් වෙත අවශ්‍ය පරිදි දැනුම් දෙන ලදී. එසේම ඉහත සඳහන් දර්ශක සම්පාදනය කරනු ලබන ආයතන වෙත ශ්‍රී ලංකාව පිළිබඳ සාර්ව ආර්ථික තොරතුරු සතිපතා මෙන්ම මාසිකව සැපයීමට කටයුතු කරන ලදී.

### 28.8 සංඛ්‍යාන තොරතුරු බෙදාහැරීම

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව වාර්ෂිකව ප්‍රතිපත්ති සම්පාදකයන්, පර්යේෂකයන්, ශාස්ත්‍රඥයන්, වෘත්තිකයන්, ශිෂ්‍යයන් හා මහජනතාව වෙත කාලීන වැදගත්කමක් ඇති සමාජ ආර්ථික දත්ත පුළුල් පරාසයකින් බෙදා හරිනු ලබයි. මෙම වසර තුළ දී දෙපාර්තමේන්තුව, "ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංඛ්‍යාන 2016 - XXXVIII වෙළුම" අගෝස්තු මාසයේ දී ද "ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික දත්ත 2016 - XXXIII වෙළුම" සැප්තැම්බර් මාසයේ දී ද භාෂා ත්‍රිත්වයෙන්ම සහ ඉලෙක්ට්‍රොනික මාධ්‍යයෙන් ප්‍රකාශයට පත් කරන ලදී. මීට අමතරව මාස්පතා සහ සතිපතා ආර්ථික දර්ශක ප්‍රකාශයට පත් කිරීම අඛණ්ඩව සිදු කරන අතරම රටෙහි පොදු මිල මට්ටම කෙරෙහි සැලකිය යුතු බලපෑමක් එල්ල කළ හැකි, ප්‍රධාන වෙළඳපොළවලින් ලබාගන්නා ලද අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය අයිතමයන්ගේ මිල විචලනයන් විශ්ලේෂණය ශක්තිමත් කිරීම සඳහා තෝරාගත් පාරිභෝගික අයිතම සඳහා දෛනික මිල වාර්තා සකස් කෙරේ. 2016 වසරේ සිට ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවිය හරහා දෛනික මිල වාර්තාව පරිශීලනය සඳහා පොදු ජනතාවට අවස්ථාව සලස්වා දී ඇත. තවද මහ බැංකු වාර්තාවේ සහ මෑතකාලීන ආර්ථික ප්‍රවණතා ප්‍රකාශනය සඳහා පරිච්ඡේද දෙකකට සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මාසික විවරණිකාව සඳහා සංඛ්‍යාන දෙපාර්තමේන්තුව දායකත්වය දක්වනු ලැබීය.

තවද, සංඛ්‍යාන දෙපාර්තමේන්තුව, දත්ත පරිශීලකයන්ගේ පහසුව පිණිස ඉලෙක්ට්‍රොනික දත්ත සංචිතයක් ස්ථාපිත කිරීම සඳහා මූලාරම්භක කටයුතු සහ සම්බන්ධීකරණ කටයුතු සිදු කළ අතර තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ තාක්ෂණික සහාය ඇතිව 2016 වසර තුළ දී මෙම සංචිතය අභ්‍යන්තර පරිශීලනය සඳහා දියත් කරන ලදී. මෙම දත්ත සංචිතය ශ්‍රී ලංකා මහ බැංකුවේ දෙපාර්තමේන්තු 9 කට අදාළ මූර්ත, මුදල්, රාජ්‍ය මූල්‍ය, විදේශ සහ මූල්‍ය යන අංශ ආවරණය කරන විවිධ මාතෘකා යටතේ වන කාල ශ්‍රේණි දත්තවලින් සමන්විත වඩාත් සවිස්තරාත්මක දත්ත ගබඩාවකි. එහි දත්ත අවශ්‍ය පරිදි තෝරා ගැනීම, සංඛ්‍යා සටහන් සකස් කිරීම, බාගත කිරීම සහ අනාගත පරිශීලනය සඳහා ගබඩා කිරීම වැනි විවිධ අවශ්‍යතාවයන් සඳහා පහසුකම් සලසා ඇත. තවදුරටත් වැඩි දියුණු කරන ලද මෙම දත්ත සංචිතය ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවිය තුළින් මහජනතාව වෙත නිකුත් කිරීමට 2017 වසර ආරම්භයේ දී කටයුතු කර ඇත.

## 29. ක්ෂුද්‍රමූල්‍ය ආයතන අධීක්ෂණ

2006 අංක 6 දරන ක්ෂුද්‍රමූල්‍ය පනත (ක්ෂුද්‍රමූල්‍ය පනත) ප්‍රකාරව ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාර නියාමනය සහ අධීක්ෂණය සඳහා ක්ෂුද්‍රමූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී. ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාර පවත්වාගෙන යෑමට අවශ්‍ය බලපත්‍රය ලබා ගැනීම සඳහා ලැබෙන අයදුම්පත් පරීක්ෂා කිරීම, ව්‍යවස්ථාපිත පරීක්ෂා සහ විතැන් පරීක්ෂා මගින් බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් අධීක්ෂණය කිරීම, බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් ආශ්‍රිතව ඇතිවන ගැටලු සහ ඒවායේ ප්‍රගතිය පිළිබඳව මුදල් මණ්ඩලයට නිරතුරුව වාර්තා කිරීම, බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් වෙත රීති සහ විධාන නිකුත් කිරීම, බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් සඳහා නියාමන අනුමැතිය ලබා දීම, බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම්වල බලපත්‍රය අහෝසි කිරීම සහ ඇවර කිරීම, ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචිය සහ අධීක්ෂණය සඳහා ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයා (රෙජිස්ට්‍රාර්වරයා) වෙත ප්‍රතිපත්ති, ප්‍රමිති සහ මාර්ගෝපදේශ නිකුත් කිරීම, ක්ෂුද්‍රමූල්‍ය අංශය පිළිබඳ පර්යේෂණ කිරීම සහ පුහුණු වැඩසටහන් සහ මහජන දැනුවත් කිරීම් පැවැත්වීම ක්ෂුද්‍රමූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව සතු වගකීම් වේ. 2016 වසර තුළ ක්ෂුද්‍රමූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව සිදු කළ ප්‍රධාන කාර්යයන් සහ සෙසු ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

**(i) බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් වෙත රීති සහ විධාන නිකුත් කිරීම**

2016 ඔක්තෝබර් 27 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි මුදල් මණ්ඩලය විසින් බලපත්‍රය සඳහා වන නිර්ණායක සහ බලපත්‍ර ගාස්තුව යනුවෙන් රීති දෙකක් ද අවම මූලික ප්‍රාග්ධනය, ව්‍යවස්ථාපිත සංචිත, තැන්පතු, අවම ද්‍රවශීලී

වක්කම් අනුපාතිකයක් පවත්වා ගැනීම, කොටස් හිමියන් ඇගයීම, අධ්‍යක්ෂවරුන්ගේ සහ ප්‍රධාන විධායක නිලධාරී හෝ සාමාන්‍යාධිකාරීවරයාගේ උචිත බව සහ යෝග්‍යතාවය ඇගයීම, ණය පහසුකම් සඳහා වන නියාමන රාමුව සහ තොරතුරු සැපයීමේ අවශ්‍යතාවය යනුවෙන් විධාන අටක් ද නිකුත් කරන ලදී.

**(ii) රෙජිස්ට්‍රාර්වරයා සහ අනෙකුත් උනන්දුවක් දක්වන පාර්ශ්වයන් සමග නිරතුරුව රැස්වීම් පැවැත්වීම**

ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධාන නියාමනය කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති, ප්‍රමිති සහ මාර්ගෝපදේශ සම්පාදනය කිරීම සඳහා ක්ෂුද්‍රමූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් රෙජිස්ට්‍රාර්වරයා, ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධාන සහ ලංකා ක්ෂුද්‍රමූල්‍ය වෘත්තිකයින්ගේ සංගමය සමග නිරතුරුව රැස්වීම් පවත්වන ලදී.

**(iii) ක්ෂුද්‍රමූල්‍ය අංශය පිළිබඳ සමීක්ෂණයක් පැවැත්වීම**

ලංකා ක්ෂුද්‍රමූල්‍ය වෘත්තිකයින්ගේ සංගමයේ ද සහාය ඇතිව නියාමන අවශ්‍යතාවයන් හඳුනාගැනීම මෙන්ම සඵල සහ කාර්යක්ෂම නියාමන පද්ධතියක් ස්ථාපිත කිරීමේ අරමුණු ඇතිව ක්ෂුද්‍රමූල්‍ය ආයතන සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදු කරන ලදී.

**(iv) ක්ෂේත්‍ර අධ්‍යයන සිදු කිරීම**

ක්ෂුද්‍රමූල්‍ය අංශය තුළ ඇති වර්තමාන පරිචයන්, පද්ධතීන් සහ ක්‍රියාවලීන් පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම සඳහා ක්ෂුද්‍රමූල්‍ය ආයතන කිහිපයක ක්ෂේත්‍ර අධ්‍යයන සිදු කරන ලදී. තවද, බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් සහ ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධාන වෙනුවෙන් රෙගුලාසි සකස් කිරීම සඳහා ආසියානු කලාපය වෙත විශේෂ අවධානයක් යොමු කරමින් ක්ෂුද්‍රමූල්‍ය අංශය නියාමනය කිරීම පිළිබඳ ජාත්‍යන්තර අත්දැකීම් ද අධ්‍යයනය කරන ලදී. මීට අමතරව, ක්ෂුද්‍රමූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවෙහි කාර්ය මණ්ඩලය ක්ෂුද්‍රමූල්‍ය අංශය නියාමනය කිරීම පිළිබඳ හසළ අත්දැකීම් ඇති කලාපීය මහ බැංකුවක නියාමන සහ අධීක්ෂණ පද්ධතීන් අධ්‍යනය කිරීම සඳහා අධ්‍යයන චාරිකාවක ද යෙදෙන ලදී.

**(v) දැනුම්වත් කිරීම් සහ ශක්‍යතා වැඩිදියුණු කිරීම**

සණස සමුපකාර සමිති, දිවිනැගුම බැංකු සමිති සහ රාජ්‍ය නොවන සංවිධාන කිහිපයක් සඳහා ක්ෂුද්‍රමූල්‍ය පනත සහ ඒ යටතේ නිකුත් කර ඇති රෙගුලාසි පිළිබඳ දැනුවත් කිරීම් සිදු කිරීම මගින් ක්ෂුද්‍රමූල්‍ය අංශයෙහි ශක්‍යතා වැඩිදියුණු කිරීම සහ දැනුවත් කිරීම දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. එසේම ලංකා ක්ෂුද්‍රමූල්‍ය වෘත්තිකයින්ගේ සංගමය සහ ස්වේච්ඡා සේවා සංවිධාන ක්‍රියාකාරී පෙරමුණ මගින් සංවිධානය කරන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා ද ක්ෂුද්‍රමූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව සිය දායකත්වය ලබා දෙන ලදී.

# 30. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ

2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත හා 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත අනුව පිළිවෙළින් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් නියාමනය හා අධීක්ෂණය කිරීම බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත. මීට අමතරව, 2016 වර්ෂය තුළ දී ප්‍රාථමික අලෙවිකරුවන්ගේ කාර්යයන් අධීක්ෂණය කිරීමේ කාර්යභාරය ද බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පවරන ලදී.

ව්‍යවස්ථාපිත පරීක්ෂණ (එතැන් පරීක්ෂණ) හා අඛණ්ඩ සුපරීක්ෂණ (දුරස්ථ පරීක්ෂණ) සිදු කිරීම, විචක්ෂණ නියාමන රෙගුලාසි නිකුත් කිරීම, නියාමන අනුමැතීන් ලබාදීම සහ අනවසරයෙන් පවත්වාගෙන යන මුදල් ව්‍යාපාර පිළිබඳ විමර්ශනය කිරීම බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් වේ. මීට අමතරව, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, මූල්‍ය ආයතනවල ශක්‍යතා වැඩිදියුණු කිරීම, අධිකරණ කාර්යයන් සඳහා පහසුකම් සැපයීම සහ මහජන පැමිණිලි සඳහා මැදිහත්වීම වැනි වෙනත් විවිධ කාර්යයන්වල ද නිරත වේ.

2016 අවසානය වනවිට, බලපත්‍රලාභී මුදල් සමාගම් 46 ක්, ප්‍රාථමික අලෙවිකරුවන් 15 ක් සහ ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතන 70 ක් පැවැතිණි. එම බලපත්‍රලාභී මුදල් සමාගම්, ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ සමාගම් සහ ප්‍රාථමික අලෙවිකරුවන්ගේ නාම ලේඛනය මෙම කොටස අවසානයේ දක්වා ඇත. 2016 වර්ෂයේ දී නිකුත් කරන ලද නියාමන අවශ්‍යතා මෙම වාර්තාවේ තුන්වැනි කොටසෙහි දැක්වේ.

## 30.1 බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අධීක්ෂණය කිරීම

(අ) ව්‍යවස්ථාපිත පරීක්ෂණ පැවැත්වීම (එතැන් පරීක්ෂණ)

(i) 2016 වර්ෂය තුළ දී ප්‍රධාන වශයෙන් ම බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල කාර්යක්ෂමතාව සහ ස්ථාවරත්වය ඉලක්ක කරගත් අධීක්ෂණ ක්‍රමවේදයන් ක්‍රියාත්මක කරන ලදී. මෙම රාමුව යටතේ මූල්‍ය ආයතනයක දිගුකාලීන ස්ථාවරත්වය සඳහා ආදායම් ප්‍රවාහයේ වර්ධනය, සේවා කළඹෙහි විවිධාංගීකරණය සහ වෙළෙඳපොළ වෙනස්වීම්වලට අනුරූප වීමට ඇති හැකියාව සම්බන්ධයෙන් ඉතා ගැඹුරින් අගය කෙරේ. මීට අමතරව, බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්හි ව්‍යාපාරික ක්‍රියාකාරීත්වය සඳහා මූල්‍ය අතරමැදිකරණ පිරිවැය කළමනාකරණය හා එහි ඵලදායීතාවන් විමර්ශනයට භාජනය කෙරේ.

(ii) බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව 2016 වර්ෂය තුළ දී බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් 30 ක වාර්ෂික එතැන් පරීක්ෂණ සිදු කරන ලදී. ණය අලාභ සඳහා ප්‍රමාණවත් නොවන

වෙන්කිරීම්, අභ්‍යන්තර පාලනයේ දුර්වලතා, ආයතනික යහපාලන විධානයන්ට අනුකූල නොවීම්, ව්‍යාපාර මෙහෙයුම් කටයුතුවල සිදුවන අකාර්යක්ෂමතා, ක්ෂුද්‍ර මූල්‍ය වැනි නව ව්‍යාපාරික කටයුතුවල ඇතිවිය හැකි ගෙවීම් පැහැර හැරීමේ අවදානම සහ ඇතැම් ආයතනවල දිගුකාලීන ස්ථාවරත්වය සඳහා ව්‍යාපාර මෙහෙයුම් කටයුතුවල ඇති ගැටලු මෙකී පරීක්ෂණවල ප්‍රධාන සොයාගැනීම් විය.

(iii) මීට අමතරව, මූල්‍ය වාර්තාකරණය සහ ගැටලුකාරී අන්තර් සමාගම් ගනුදෙනු වැනි මෙහෙයුම් කටයුතු වලට අදාළ විශේෂිත ගැටලු සහ අධීක්ෂණයේ දී හඳුනාගත් දුර්වලතා හා සම්බන්ධ සීමිත විෂය පථයක් ඉලක්ක කරගත් පරීක්ෂණ 6 ක් ද සිදු කරන ලදී.

(iv) පරීක්ෂණවල දී හඳුනාගත් මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද ක්‍රියාකාරී සැලසුම් සහ නිර්දේශයන් අදාළ බලපත්‍රලාභී මුදල් සමාගම් හා විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලයන් වෙත දැනුම් දී එකඟ වූ කාල රාමුව තුළ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම සහතික කිරීම සඳහා නිරන්තර පසු විපරම් සිදු කෙරේ.

**(ආ) අඛණ්ඩ සුපරීක්ෂණ සිදු කිරීම (දුරස්ථ පරීක්ෂණ)**

බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල මූල්‍ය තත්ත්වය ඇගයීම සහ පැන නැගිය හැකි ගැටලු පිළිබඳව පූර්ව අනතුරු ඇඟවීම් කල්තියා හඳුනාගෙන ඒ සඳහා සුදුසු නිවැරදි කිරීමේ පියවරයන් කඩිනමින් ගැනීමේ අරමුණින් බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව අඛණ්ඩව සුපරීක්ෂණ කටයුතු සිදු කරන ලදී. සමාගම් විසින් කාලාවර්තිතව ඉදිරිපත් කරනු ලබන මූල්‍ය තොරතුරු, විගණන වාර්තා, කළමනාකරණ ලිපි, බාහිර ශ්‍රේණිගත කිරීම් සහ පුවත්පත් වාර්තා පදනම් කරගනිමින් මෙම අඛණ්ඩ සුපරීක්ෂණ කටයුතු සිදු කෙරිණි. පවතින ද්‍රවශීලතා ගැටලු හේතුවෙන් ව්‍යාපාර කටයුතු වලින් බැහැරව සිටින බලපත්‍රලාභී මුදල් සමාගම් 2 ක හැර අනෙක් සියලුම බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල අවශ්‍ය නියාමන ක්‍රියාමාර්ග ගැනීමට සුපරීක්ෂණ වාර්තා මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා පිළියෙල කරන ලදී. බලපත්‍රලාභී මුදල් සමාගම්වල අභ්‍යන්තර අධීක්ෂණ ශ්‍රේණිගත කිරීම් ක්‍රියාත්මක කිරීමට සහ සුපරීක්ෂණයේ දී හඳුනාගත් දුර්වලතාවයන් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට අඛණ්ඩ සුපරීක්ෂණය මගින් හැකි විය. තවද, අඛණ්ඩ සුපරීක්ෂණ ක්‍රියාවලියට පහසුකම් සැලසීම සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ කාර්තුමය කාර්යසාධන වාර්තා 4 ක් පිළියෙල කරන ලදී.

**(ඇ) දුර්වල බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා අර්බුද නිරාකරණය කිරීමේ ක්‍රියාමාර්ග**

2016 වර්ෂය තුළ දී, ඍණ ප්‍රාග්ධනයක් සහ ප්‍රමාණවත් නොවූ ද්‍රවශීල තත්ත්වයක් සහිත දුර්වල සමාගම්වල දිගුකාලයක සිට පැවැති ගැටලු නිරාකරණය කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලදී. ඒ අනුව, නිසි ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නීතිමය හා වෙනත් අවසරයන්ට යටත්ව මූල්‍යමය වශයෙන් පීඩාවට පත් සමාගම් 3 ක අර්බුද නිරාකරණය කිරීමේ සැලැස්ම සඳහා මුදල් මණ්ඩලය විසින් මූලික අනුමැතිය ලබා දෙන ලදී. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව දැනට විස්තරාත්මක ක්‍රියාකාරී සැලසුම් පිළියෙල කිරීම සහ ඉහත සඳහන් පූර්ව අවශ්‍යතාවන් සම්පූර්ණ කිරීමෙහි නිරතව සිටී. සමාගම් 3 ක් ප්‍රතිව්‍යුහගත කර ස්ථාවර මට්ටමක පවත්වා ගැනීම සඳහා එහි අධ්‍යක්ෂ මණ්ඩලය වෙනස් කරන ලදී. මීට අමතරව, මෙම සමාගම්වල ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල, ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සහ බාහිර විගණකවරුන් සමඟ නිරන්තර රැස්වීම් පැවැත්වූ අතර මෙම දුර්වල සමාගම් ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා සුදුසු ආයෝජකයන් සහභාගී කරගැනීම සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් එම සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩල යොමු කරවන ලදී.

## 30.2 ප්‍රාථමික අලෙවිකරුවන් අධීක්ෂණය කිරීම

**(අ) ව්‍යවස්ථාපිත පරීක්ෂණ සහ අඛණ්ඩ සුපරීක්ෂණ සිදු කිරීම**

ප්‍රාථමික අලෙවිකරුවන් සඳහා පවතින අධීක්ෂණය තවදුරටත් විධිමත් කිරීමේ සහ වැඩිදියුණු කිරීමේ අපේක්ෂාවෙන් ප්‍රාථමික අලෙවිකරුවන්ගේ අධීක්ෂණ හා නියාමන කාර්යයන් 2016.06.03 දින සිට රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවෙන් බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත මාරු කිරීමට මුදල් මණ්ඩලය විසින් තීරණය කරන ලදී. ප්‍රාථමික අලෙවිකරුවන් අවදානමට නිරාවරණය වීමට ඇති හැකියාව විනිශ්චය කිරීමේ ක්‍රමවේදය තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණින් පරීක්ෂණවල විෂය පථය පුළුල් කළ අතර ව්‍යවස්ථාපිත පරීක්ෂණ ක්‍රියාවලිය ශක්තිමත් කරන ලදී. 2016 ජූනි මාසයේ සිට අධීක්ෂණ කාර්යයන් බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවට භාර දුන් පසු ප්‍රාථමික අලෙවිකරුවන් දෙදෙනෙකුගේ ව්‍යවස්ථාපිත පරීක්ෂණ අවසන් කෙරිණි.

**(ආ) එන්ට්‍රස්ට් සෙකියුරිටීස් පීඑල්සී සමාගමේ අර්බුද නිරාකරණය කිරීමේ ක්‍රියාමාර්ග**

එන්ට්‍රස්ට් සෙකියුරිටීස් පීඑල්සී සමාගමේ දුර්වල මූල්‍ය භාවිතයෙහි ප්‍රතිඵලයක් ලෙස 2016 වර්ෂය තුළ දී ඍණ ද්‍රවශීලතා තත්ත්වයන් හේතුවෙන් රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළෙහි ඇතිවිය හැකි අවදානම හා එමගින් සමස්ත මූල්‍ය පද්ධතියෙහි ඇතිවිය හැකි ගැටලුවක් ඉස්මතු විය. මෙහි දී රාජ්‍ය සුරැකුම්පත්වල ප්‍රතිමිලදී

ගැනුම් ගිවිසුම් විශාල ප්‍රමාණයක ගෙවීම් පැහැර හැර තිබිණි. ඉදිරියේ දී මේ හේතුවෙන් මුදල්, බැංකු හා මූල්‍ය පද්ධතියෙහි සහ විශේෂයෙන්ම රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළෙහි ඇතිවිය හැකි සමස්ත ස්ථාවරත්වයේ බිඳවැටීම වැළැක්වීමේ අරමුණින් මහ බැංකුව එන්ට්‍රස්ට් සෙකියුරිටීස් පීඑල්සී සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවට නව අධ්‍යක්ෂ මණ්ඩලයක් පත්කොට එන්ට්‍රස්ට් සමාගම් සමූහයේ සිදු වී ඇති දුර්වල මූල්‍ය භාවිතය හා මූල්‍ය අක්‍රමිකතා සම්බන්ධව පුළුල් විමර්ශනයන් සිදු කළ අතර එහි දී නිරාවරණය කරගත් තොරතුරු නීති බලාත්මක කිරීමේ අධිකාරීන් (මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය) වෙත යොමු කරන ලදී. මේ අතර, අර්බුද නිරාකරණය කිරීමේ සැලැස්ම සඳහා නීතිමය හා මූල්‍ය අවසරයන්ට යටත්ව සුරක්ෂිත ප්‍රතිමිලදී ගැනුම් හා ස්ථිර පදනමක් මත වූ ගනුදෙනු මෙන් ම සුරක්ෂිත නො වූ ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනු පියවීම සඳහා මුදල් මණ්ඩලය විසින් මූලික අනුමැතිය ලබා දී ඇත.

## 30.3 විචක්ෂණ නියාමන නිකුත් කිරීම, ප්‍රතිපත්ති සම්පාදනය හා නියාමන අනුමැතීන්

(අ) විධානයන් සහ විචක්ෂණ අවශ්‍යතා නිකුත් කිරීම

(i) **බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල ව්‍යාපාර ස්ථාන විවෘත කිරීම, වැසීම හා ස්ථානය වෙනස් කිරීම සම්බන්ධ විධානය**

බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල ව්‍යාපාර ස්ථාන විවෘත කිරීම, වැසීම හා ස්ථානීය වෙනස් කිරීම් සම්බන්ධයෙන් දැනට පවතින ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීමට හා විධිමත් කිරීමට නව නියාමන රාමුවක් හඳුන්වා දෙන ලදී.

(ii) **තැන්පතු හා ණය සාධන පත්‍ර සඳහා උපරිම පොලී අනුපාත සම්බන්ධ විධානය**

තැන්පතු හා ණය සාධන පත්‍ර සඳහා ගෙවිය හැකි උපරිම පොලී අනුපාතය තීරණය කිරීමේ පදනම ලෙස භාවිතා වූ භාණ්ඩාගාර බිල්පත්වල බර තබන ලද සාමාන්‍ය ඵලදා අනුපාතය ගණනය කිරීමේ පදනම කාර්තුමය ගණනය කිරීමේ සිට අර්ධ වාර්ෂික ගණනය කිරීම දක්වා සංශෝධනය කරන ලදී. පොලී අනුපාතයෙහි ක්ෂණික වෙනස්වීම් මගින් ඇතිවන බලපෑම අවම කිරීම සඳහා මෙම සංශෝධනය සිදු කරන ලදී.

(ආ) නියාමන රාමුව සමාලෝචනය කිරීම

(i) 2016 වර්ෂය තුළ දී බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් බලපත්‍රලාභී මුදල් සමාගම් වෙත නිකුත් කර ඇති පවත්නා නියාමන රාමුව තවදුරටත් විධිමත් කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමේ අරමුණින් සවිස්තරාත්මක අධ්‍යයනයක් හරහා සමාලෝචනය කරන ලදී. මෙහි පරමාර්ථය වූයේ දැනට බැංකු අංශයේ භාවිත ප්‍රශස්ත පරිචයන් සහ ගිණුම්කරණ ප්‍රමිතීන්වල මෑත කාලීන වර්ධනයන්ට සමගාමීව සුදුසු වෙනස්කම් සිදු කිරීම ය. ඒ අනුව, අදාළ පාර්ශ්වකරුවන්ගෙන් ද අදහස් විමසීමෙන් පසු එම සංශෝධනයන් ඉදිරියේ දී ප්‍රකාශයට පත් කරනු ඇත.

(ii) ප්‍රාථමික අලෙවිකරුවන්ගේ නියාමන ක්‍රමවේදය නැවත සලකා බැලීමට සහ පවත්නා අධීක්ෂණ ක්‍රමවේදය සඳහා අවශ්‍ය වෙනස්කම් නිර්දේශ කිරීම සඳහා සහකාර අධිපති, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ අධිකාරී සහ එම දෙපාර්තමේන්තුවල අදාළ නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් 2016 වර්ෂය තුළ දී මුදල් මණ්ඩලය විසින් පත් කරන ලදී. එම කමිටුව විසින් සකසන ලද නිර්දේශ ඇතුළත් වාර්තාව අවශ්‍ය කටයුතු සඳහා මහ බැංකුවේ ඉහළ කළමනාකාරීත්වය වෙත ඉදිරිපත් කරන ලදී.

(ඇ) නියාමන අනුමැතීන් ලබාදීම

(i) 2016 වර්ෂය තුළ දී, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සඳහා සාංගමික ව්‍යවස්ථාවලීන් වෙනස් කිරීමට, පාලිත සමාගම් පිහිටුවීමට, ණය සාධන පත්‍ර නිකුත් කිරීමට, කොටස් ප්‍රාග්ධනය වැඩි කිරීමට, නව ආයෝජකයන් හරහා ප්‍රාග්ධනය යෙදවීමට, ව්‍යාපාර මෙහෙයුම් කටයුතු සඳහා බාහිර සේවාවන් ලබා ගැනීමට, නව අධ්‍යක්ෂවරුන් සහ විධායක කාර්යයන්හි නියුතු නිලධාරීන් පත් කිරීමට, ලියාපදිංචි ලිපිනයන් වෙනස් කිරීමට, ව්‍යාපාර ස්ථානවල ස්ථානය වෙනස් කිරීමට, ව්‍යාපාර හිමිකම මාරු කිරීමට සහ නව ශාඛාවන් 101 ක් විවෘත කිරීමට අනුමැතීන් ලබා දෙන ලදී.

(ii) සර්වෝදය ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් ලිමිටඩ් වෙත කල්බදු මූල්‍යකරණ බලපත්‍රය ලබා දුන් අතර මහජන බැංකුවේ ඉල්ලීම පරිදි, එම බැංකුව වෙත නිකුත් කර තිබූ කල්බදු මූල්‍යකරණ බලපත්‍රය අවලංගු කරන ලදී. මීට අමතරව, හොංකොං ඇන්ඩ් ෂැංහයි බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් ආයතනය ප්‍රාථමික අලෙවිකාරත්වයෙන් ඉවත් විය.

## 30.4 අනවසරයෙන් පවත්වාගෙන යන මුදල් ව්‍යාපාර පිළිබඳ විමර්ශනය

දෙපාර්තමේන්තුව විසින් වෙළෙඳපොළ තොරතුරු හා මහජන පැමිණිලි පදනම් කරගෙන අවසර නොමැතිව මුදල් ව්‍යාපාරවල නිරතවීම් පිළිබඳව තවදුරටත් පරීක්ෂණ කටයුතු සිදු කරන ලදී. 2016 වර්ෂය අවසාන වන විට විමර්ශන

## ඇමුණුම II-3

## නීති ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වී නියාමනය වන ආයතන (2016 වර්ෂය අවසානයට)

### බලපත්‍රලාභී මුදල් සමාගම්

1. අබාන්ස් ෆිනෑන්ස් පීඑල්සී
2. අයිඩියල් ෆිනෑන්ස් ලිමිටඩ්
3. ආර්පිකෝ ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී
4. ඇසෝසියේටඩ් මෝටර් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී
5. ඊටීඅයි ෆිනෑන්ස් ලිමිටඩ්
6. එච්එන්බී ග්‍රාමීන් ෆිනෑන්ස් ලිමිටඩ්
7. එල්බී ෆිනෑන්ස් පීඑල්සී
8. එල්ඕඑල්සී ෆිනෑන්ස් පීඑල්සී
9. එලයන්ස් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී
10. ඒඑම්ඩබ්ලිව් කැපිටල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී
11. ඒෂියා ඇසෙට් ෆිනෑන්ස් පීඑල්සී
12. ඔරියන්ට් ෆිනෑන්ස් පීඑල්සී
13. කලම්බො ට්‍රස්ට් ෆිනෑන්ස් පීඑල්සී
14. කැන්රිච් ෆිනෑන්ස් ලිමිටඩ්
15. කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී
16. කොමර්ෂල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී
17. චිලව් ෆිනෑන්ස් පීඑල්සී
18. ටීකේඑස් ෆිනෑන්ස් ලිමිටඩ්
19. ට්‍රේඩ් ෆිනෑන්ස් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට්ස් පීඑල්සී
20. ද ස්ටැන්ඩර්ඩ් ක්‍රෙඩිට් ෆිනෑන්ස් ලිමිටඩ්
21. ද ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී
22. නේෂන් ලංකා ෆිනෑන්ස් පීඑල්සී
23. පීපල්ස් මර්චන්ට් ෆිනෑන්ස් පීඑල්සී
24. පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී
25. බිම්පුත් ෆිනෑන්ස් පීඑල්සී
26. බ්‍රැක් ලංකා ෆිනෑන්ස් පීඑල්සී
27. මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී
28. මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී
29. මල්ටි ෆිනෑන්ස් පීඑල්සී
30. මෙල්ස්ටා රීගල් ෆිනෑන්ස් ලිමිටඩ්
31. යූබී ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ්
32. රිචඩ් පීරිස් ෆිනෑන්ස් ලිමිටඩ්
33. වැලිබල් ෆිනෑන්ස් පීඑල්සී
34. සමිට් ෆිනෑන්ස් පීඑල්සී
35. සර්වෝදය ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් ලිමිටඩ්
36. ස්වර්ණමහල් ෆිනෑන්ෂියල් සර්විසස් පීඑල්සී
37. සිටි ෆිනෑන්ස් කෝපරේෂන් ලිමිටඩ්
38. සියපත ෆිනෑන්ස් පීඑල්සී
39. සිංගර් ෆිනෑන්ස් (ලංකා) පීඑල්සී
40. සිංහපුත්‍ර ෆිනෑන්ස් පීඑල්සී
41. සිටිසන්ස් ඩිවලොප්මන්ට් බිස්නස් ෆිනෑන්ස් පීඑල්සී
42. සෙන්කඩගල ෆිනෑන්ස් පීඑල්සී
43. සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී*
44. සෙන්ට්‍රල් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී
45. සෙරන්ඩිබ් ෆිනෑන්ස් ලිමිටඩ්
46. සොෆ්ට්ලොජික් ෆිනෑන්ස් පීඑල්සී

* ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පත් කරන ලද කළමනාකරණ නියෝජිතයෙකු විසින් කළමනාකරණය කෙරෙන අතර, ප්‍රතිව්‍යුහගත කෙරෙමින් පවතී. ඒ අතරතුර තැන්පතු රැස් කිරීම අත්හිටුවා ඇත.

### ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතන

**(අ) බලපත්‍රලාභී වාණිජ බැංකු**

1. අමානා බැන්ක් පීඑල්සී
2. එම්සීබී බැන්ක් ලිමිටඩ්
3. කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී
4. ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී
5. නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී
6. නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී
7. පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී
8. යුනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී
9. ලංකා බැංකුව
10. සම්පත් බැන්ක් පීඑල්සී
11. සෙලාන් බැන්ක් පීඑල්සී
12. හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී

**(ආ) බලපත්‍රලාභී විශේෂිත බැංකු**

1. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
2. ලංකාපුත්‍ර ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ්
3. ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව
4. ශ්‍රී ලංකා සේවින්ග්ස් බැන්ක් ලිමිටඩ්
5. සණස ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

**(ඇ) විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්**

1. ඇසෙට්ලයින් ලීසිං කම්පැනි ලිමිටඩ්
2. ඉසුරු ලීසිං කම්පැනි ලිමිටඩ්
3. එල්ඕඑල්සී මයික්‍රෝ ක්‍රෙඩිට් ලිමිටඩ්
4. එස්එම්බී ලීසිං පීඑල්සී
5. කෝපරේටිව් ලීසිං කම්පැනි ලිමිටඩ්
6. නිවෙස්ට් කැපිටල් ලිමිටඩ්
7. යුනිසන්ස් කැපිටල් ලීසිං ලිමිටඩ්

**(ඈ) ඉහත සඳහන් සියලුම බලපත්‍රලාභී මුදල් සමාගම්**

### ප්‍රාථමික අලෙවිකරුවන්

1. ඇකියුටි සෙකියුරිටීස් ලිමිටඩ්
2. එන්එස්බී ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පැනි ලිමිටඩ්
3. එන්ට්‍රස්ට් සෙකියුරිටීස් පීඑල්සී
4. කැපිටල් එලයන්ස් ලිමිටඩ්
5. කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී
6. නැට්වෙල්ත් සෙකියුරිටීස් ලිමිටඩ්
7. පර්පෙචුවල් ට්‍රෙෂරීස් ලිමිටඩ්
8. පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී
9. මහජන බැංකුව
10. යුනියන් බැන්ක් ඔෆ් කලම්බූ පීඑල්සී
11. ලංකා බැංකුව
12. වෙල්ත්ට්‍රස්ට් සෙකියුරිටීස් ලිමිටඩ්
13. සම්පත් බැන්ක් පීඑල්සී
14. සෙලාන් බැන්ක් පීඑල්සී
15. ෆස්ට් කැපිටල් ට්‍රෙෂරීස් පීඑල්සී

කටයුතු 14 ක් ක්‍රියාත්මක වෙමින් පැවැති අතර අවසර නොලත් මුදල් ව්‍යාපාර ලෙස තීරණය කරන ලද සමාගම්වලට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම ආරම්භ කිරීම සඳහා නීතිපතිතුමන්ගෙන් උපදෙස් ලබා ගන්නා ලදී.

### 30.5 මහජනයා දැනුම්වත් කිරීම් සහ බලපත්‍රලාභී මුදල් සමාගම් / විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ ශක්‍යතා වැඩිදියුණු කිරීම

(අ) මහජන දැනුම්වත් කිරීමේ වැඩසටහන්

බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අනවසර මූල්‍ය ආයතනවල සහ ආයෝජන ක්‍රමවල ආයෝජනය කිරීමේ ඇති අවදානම පිළිබඳ මහජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන් 28 ක් පැවැත්වූ අතර විද්‍යුත් මාධ්‍ය දැන්වීම් 9 ක් ප්‍රචාරණය කරන ලදී. බලපත්‍රලාභී බැංකු හා බලපත්‍රලාභී මුදල් සමාගම්වල නම් ලැයිස්තු හා වෙනත් ප්‍රයෝජනවත් තොරතුරු ඇතුළත් අත්පත්‍රිකා 15,000 ක් පමණ මහජනයා අතර බෙදාදෙන ලදී.

(ආ) බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ ශක්‍යතා වැඩිදියුණු කිරීම

බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ ක්‍රියාකාරීත්වය, නියාමන වර්ධනයන් සහ කාලීන ආර්ථික ප්‍රවනතා සම්බන්ධ අදහස් හුවමාරු කර ගැනීමේ පරමාර්ථයෙන් මහ බැංකු අධිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල ප්‍රධාන විධායක නිලධාරීන් සමග බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් රැස්වීම් කිහිපයක් පවත්වන ලදී. මීට අමතරව, දෙපාර්තමේන්තුව විසින් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් හා මෙම අංශය ආශ්‍රිත කරුණු සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට බාහිර විගණකවරුන් සහ ජාත්‍යන්තර නියෝජිතයන් සමග අඛණ්ඩව තොරතුරු හුවමාරු කර ගන්නා ලදී. තවද, දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු විදු පියසෙහි සහ ප්‍රාදේශීය කාර්යාලවල පැවැති පුහුණු වැඩමුළු සඳහා සම්පත් දායකත්වය ලබා දෙන ලදී.

### 30.6 අනවසර මූල්‍ය ආයතන සම්බන්ධයෙන් ඇති නීතිමය කාර්යයන් සඳහා පහසුකම් සැපයීම

(i) ගෝල්ඩන් කී ක්‍රෙඩිට් කාඩ් කම්පැනි ලිමිටඩ් ආයතනය

මහ බැංකුව විසින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද ගෝල්ඩන් කී ක්‍රෙඩිට් කාඩ් කම්පැනි ලිමිටඩ් ආයතනයේ ආරක්ෂිත තැන්පත්කරුවන්ට අදියර 3 කින් තැන්පතු ආපසු ගෙවීමේ ක්‍රමවේදය අනුව, රජය විසින් තුන්වන අදියරෙහි ගෙවීම් කටයුතු සිදු කිරීමේ ක්‍රියාවලියෙහි නිරතව සිටී. මුළු අරමුදල් අවශ්‍යතාව වන රුපියල් මිලියන 4,055 න් දැනට රජය විසින් රුපියල් මිලියන 500 ක් ලබා දී ඇත. 3 වන අදියරෙහි අරමුදල් වාරික ලෙස නිකුත් කිරීමට රජය විසින් තීරණය කර ඇති අතර අරමුදල් ලැබුණු පසු ඉතිරි තැන්පත්කරුවන් සඳහා ගෙවීම් සිදු කෙරේ.

(ii) වෙනත් අනවසර මූල්‍ය ආයතන

ද ෆිනෑන්ස් ඇන්ඩ් ගැරන්ටි ප්‍රොපර්ටි ඩිවලොපර්ස් ප්‍රයිවට් ලිමිටඩ් (The Finance and Guarantee Property Developers Private Ltd.) සහ එෆ් ඇන්ඩ් ජී රියල් එස්ටේට් කම්පැනි ලිමිටඩ් (F&G Real Estate Company Ltd.) ආයතනයන්හි තැන්පත්කරුවන් විසින් 2015 වසර තුළ ඉදිරිපත් කරන ලද පැමිණිල්ලට අනුව එම සමාගම් දෙකෙහි තැන්පත්කරුවන්ට ස්වාධීන සංගම්වලින් දෙදෙනෙකු බැගින් නියෝජනය වන පරිදි, ද ෆිනෑන්ස් ඇන්ඩ් ගැරන්ටි ප්‍රොපර්ටි ඩිවලොපර්ස් ප්‍රයිවට් ලිමිටඩ් සහ එෆ් ඇන්ඩ් ජී රියල් එස්ටේට් කම්පැනි ලිමිටඩ් ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩල සඳහා සාමාජිකයන් 4 දෙනෙකු පත් කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණය අනුමැතිය ලබාදෙන ලදී. මහ බැංකුව විසින් 2013.10.23 දින ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම ඉදිරියටත් ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත තවදුරටත් නියෝග කරන ලදී. ද ෆිනෑන්ස් ඇන්ඩ් ගැරන්ටි ප්‍රොපර්ටි ඩිවලොපර්ස් ප්‍රයිවට් ලිමිටඩ් සහ එෆ් ඇන්ඩ් ජී රියල් එස්ටේට් කම්පැනි ලිමිටඩ් ආයතන වෙත පත් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩල ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දුන් ක්‍රියාකාරී සැලැස්මට හා විධානවලට අනුකූල වීමට අපොහොසත් වී ඇති බවට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අනාවරණය කරගන්නා ලදී. එම නිසා, ද ෆිනෑන්ස් ඇන්ඩ් ගැරන්ටි ප්‍රොපර්ටි ඩිවලොපර්ස් ප්‍රයිවට් ලිමිටඩ් සහ එෆ් ඇන්ඩ් ජී රියල් එස්ටේට් කම්පැනි ලිමිටඩ් ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩල වෙත 2016.09.30 දින සිට බලපැවැත්වෙන පරිදි නව සාමාජිකයන් 4 දෙනෙකු පත් කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කරන ලදී. තවද, ශ්‍රේෂ්ඨාධිකරණය විසින්, ද ෆිනෑන්ස් ඇන්ඩ් ගැරන්ටි ප්‍රොපර්ටි ඩිවලොපර්ස් ප්‍රයිවට් ලිමිටඩ් සහ එෆ් ඇන්ඩ් ජී රියල් එස්ටේට් කම්පැනි ලිමිටඩ් ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩල වෙත තවත් අධ්‍යක්ෂවරයෙකු 2016.11.22 දින පත් කරන ලදී.

### 30.7 මහජන පැමිණිලි හැසිරවීම

බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සම්බන්ධව ප්‍රධාන වශයෙන් අසාධාරණ පාරිභෝගික සැලකීම් සහ ලබාගත් ණය සඳහා සහන ඉල්ලීම් සම්බන්ධව මහජනතාවගෙන් ඉදිරිපත් වූ පැමිණිලි විශාල ප්‍රමාණයක් සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව ඒ සම්බන්ධව විමසීම් කිරීමෙන් සහ එවැනි චෝදනා අදාළ බලපත්‍රලාභී මුදල් සමාගම් හා විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත යොමු කිරීමෙන් විසඳුම් ලබා දීමට මැදිහත් විය.

# 31. පුහුණු හා සංවර්ධන

ශ්‍රී ලංකා මහ බැංකුවේ මානව ප්‍රාග්ධන සංවර්ධනයෙහි මතු වෙමින් පවතින අවශ්‍යතා සපුරාලීමේ අරමුණින් මුදල් මණ්ඩලය විසින් 2015 ජූලි මස දී පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව නැවත ස්ථාපිත කරන ලදී. පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම සහ බැංකුවේ පුහුණු අවශ්‍යතා සපුරාලීම සඳහා උපාය මාර්ග සකස් කිරීම, වාර්ෂික පුහුණු සැලැස්ම සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම, බුද්ධිමය ශක්‍යතාව වර්ධනයට පහසුකම් සැපයීම, බැංකුවේ කාර්ය මණ්ඩලයට අවශ්‍ය පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා පහසුකම් සැලසීම, විදේශීය/දේශීය කෙටි කාලීන පුහුණු අවස්ථා සලසා දීම සහ කාර්ය මණ්ඩලයේ දැනුම හුවමාරු කර ගැනීම සඳහා පහසුකම් සැලසීම, පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් වේ.

### පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු

2016 වසර තුළ දී ඕස්ට්‍රේලියාවේ, එක්සත් රාජධානියේ සහ ඇ.එ.ජනපදයේ පිළිගත් විශ්වවිද්‍යාලයක ශ්‍රී ලංකා මහ බැංකුවේ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන් තිදෙනෙකුට ආචාර්ය උපාධිය හැදෑරීම සඳහා ද, නිලධාරීන් 15 දෙනෙකුට විද්‍යාපති/ශාස්ත්‍රපති උපාධිය හැදෑරීම සඳහා ද අවශ්‍ය පහසුකම් සපයන ලද අතර එක් නිලධාරියෙක් මෙරට විශ්වවිද්‍යාලයක ආචාර්ය උපාධිය හැදෑරීම ආරම්භ කළේය. මේ අතර, සිය ආචාර්ය උපාධිය සම්පූර්ණ කළ නිලධාරීන් තිදෙනෙක් සහ විද්‍යාපති/ශාස්ත්‍රපති උපාධි සම්පූර්ණ කළ නිලධාරීන් 18 දෙනෙක් 2016 වසර තුළ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජකාරී කටයුතු සඳහා නැවත පැමිණියහ. 2012 සිට 2016 දක්වා බැංකුවේ ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු ආරම්භ කරන ලද හා සම්පූර්ණ කරන ලද නිලධාරීන් සංඛ්‍යාව පහත සංඛ්‍යා සටහන් අංක II-25 න් පෙන්වයි.

### කෙටිකාලීන පුහුණු අවස්ථා

ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්ය මණ්ඩලයෙහි නිපුණතා ඉහළ නැංවීමේ අරමුණින්, පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව බැංකුවේ කාර්ය මණ්ඩලයට සුදුසු කෙටිකාලීන විදේශීය හා දේශීය පුහුණු අවස්ථාවන් 1,246 ක් සපයන ලදී. 2015 වර්ෂයේ අවසානයේ දී සිදු කරන ලද වාර්ෂික නිපුණතා හඳුනා ගැනීමේ අභ්‍යාසය හරහා මෙම පුහුණු අවශ්‍යතා හඳුනා ගන්නා ලදී.

### කෙටිකාලීන විදේශ පුහුණු අවස්ථා

2016 වසර තුළ දී පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව පිළිගත් විදේශ පුහුණු ආයතන සහ එංගලන්ත මහ බැංකුව, ජර්මන් මහ බැංකුව, ඉන්දියා මහ බැංකුව, මලයාසියානු මහ බැංකුව, කොරියානු මහ බැංකුව සහ ඇමෙරිකාවේ ෆෙඩරල් සංචිත බැංකුව යන මහ බැංකු මගින් විශේෂිත පුහුණු වැඩසටහන්, වැඩමුළු, සම්මන්ත්‍රණ සහ අධ්‍යයන චාරිකා ලෙස පවත්වනු ලබන කෙටිකාලීන විදේශ පුහුණු අවස්ථා 319 ක් සඳහා පහසුකම් සපයන ලදී. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව, දකුණු හා නැගෙනහිර ආසියානු රටවල පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය (SEACEN), ජාත්‍යන්තර පියවීම් බැංකුව (BIS) වැනි අරමුදල් සපයන ජාත්‍යන්තර ආයතන සහ පර්යේෂණ ආයතන විසින් ඉදිරිපත් කරන ලද පුහුණු අවස්ථා සඳහා ද ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්ය මණ්ඩලය සහභාගී විය. පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව, විදේශීය අධ්‍යයන චාරිකා 10 ක් සඳහා 2016 දී පහසුකම් සලසන ලදී. 2016 වසර තුළ දී ශ්‍රී ලංකා මහ බැංකු නිලධාරීන් සඳහා ලබා දී ඇති කෙටිකාලීන විදේශ පුහුණු අවස්ථා පිළිබඳ විස්තර සංඛ්‍යා සටහන II-26 මගින් පෙන්වයි.

**II-26 සංඛ්‍යා සටහන**

**කෙටිකාලීන විදේශ පුහුණු අවස්ථා - 2016**

| ක්ෂේත්‍රය | පුහුණු වැඩසටහන් ගණන | පුහුණු අවස්ථා ගණන |
|---|---|---|
| මුදල් ප්‍රතිපත්තිය, ආර්ථික විද්‍යාව සහ සංඛ්‍යානය | 57 | 71 |
| මූල්‍ය පද්ධති ස්ථාවරත්වය | 47 | 62 |
| අවදානම් කළමනාකරණය, නීති හා අනුකූලතා | 27 | 34 |
| ආයෝජන කළඹ කළමනාකරණය | 27 | 40 |
| මහ බැංකු කටයුතු | 11 | 14 |
| තොරතුරු තාක්ෂණය/ගෙවීම් හා පියවීම් | 20 | 27 |
| ව්‍යවහාර මුදල් කළමනාකරණය | 8 | 9 |
| මානව සම්පත් කළමනාකරණය | 5 | 11 |
| ක්ෂුද්‍ර මූල්‍ය | 7 | 15 |
| වෙනත් | 14 | 36 |
| **එකතුව** | **223** | **319** |

පුහුණු වැඩසටහන් හරහා ලබා ගත් දැනුම හා අත්දැකීම් භාවිතා කරමින් සිදු කළ යුතු විවිධ පැවරුම් පැවරීම මගින් අදාළ නිලධාරීන් හට ලැබුණු කෙටිකාලීන විදේශ පුහුණුවල සඵලතාව ඇගයීම අඛණ්ඩව කරගෙන යන ලදී. මෙම කටයුතු බැංකුවේ ඉහළ කළමනාකාරිත්වය විසින් පත් කරන ලද පුහුණු

**II-25 සංඛ්‍යා සටහන**

**ශ්‍රී ලංකා මහ බැංකුවේ ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ සිය පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු ආරම්භ කරන ලද හා සම්පූර්ණ කරන ලද නිලධාරීන් සංඛ්‍යාව (2012 - 2016)**

| සුදුසුකම් | 2012 | | 2013 | | 2014 | | 2015 | | 2016 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ආරම්භ කළ | සම්පූර්ණ කළ | ආරම්භ කළ | සම්පූර්ණ කළ | ආරම්භ කළ | සම්පූර්ණ කළ | ආරම්භ කළ | සම්පූර්ණ කළ | ආරම්භ කළ | සම්පූර්ණ කළ |
| ආචාර්ය උපාධිය | 4 | 2 | 6 | 0 | 5 | 2 | 3 | 1 | 4 | 3 |
| විද්‍යාපති/ශාස්ත්‍රපති උපාධිය | 18 | 17 | 11 | 19 | 24 | 11 | 19 | 21 | 15 | 18 |

අනු කමිටුවක් විසින් අධීක්ෂණය කරනු ලැබීය. ඒ අනුව, 2016 වසර තුළ දී පුහුණු අනු කමිටු 06 ක් පැවැත්වූ අතර එහිදී ලබා දුන් පැවරුම් 37 ක් කෙටිකාලීන විදේශ පුහුණු වැඩසටහන් සඳහා සහභාගි වූ නිලධාරීන් විසින් සම්පූර්ණ කර භාරදෙන ලදී. 2016 දී නිලධාරීන් විසින් සම්පූර්ණ කර ඇති පැවරුම් පිළිබඳ විස්තර පහත සංඛ්‍යා සටහන II-27 තුළ සාරාංශගත කොට ඇත.

**II-27 සංඛ්‍යා සටහන**

**2016 වසර තුළ කෙටිකාලීන විදේශ පුහුණු වැඩසටහන්වලට සහභාගි වූවන් විසින් සම්පූර්ණ කරන ලද පැවරුම්**

| වර්ගීකරණය | පැවරුම් ගණන |
|---|---|
| මූල්‍ය ආයතන අධීක්ෂණය කිරීම සඳහා වන මාර්ගෝපදේශ | 2 |
| ලිපි, ඉදිරිපත් කිරීම් හරහා දැනුම හුවමාරු කර ගැනීම හා කාර්යමණ්ඩල දැනුම්වත් කිරීම | 64 |
| පද්ධති හා ක්‍රියා පටිපාටි වැඩි දියුණු කිරීම සඳහා වන යෝජනා | 8 |
| **එකතුව** | **74** |

## කෙටිකාලීන දේශීය පුහුණු අවස්ථා

2016 වසර තුළ දී, පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව, රැස්වීම්, අන්තර්ජාතික සාකච්ඡා, සම්මන්ත්‍රණ, සමුළු සහ ශාස්ත්‍රීය සම්මන්ත්‍රණ ඇතුළු කෙටිකාලීන දේශීය පුහුණු අවස්ථා 927 ක් බැංකුවේ කාර්ය මණ්ඩලය වෙත ලබා දෙන ලදී. මෙම පුහුණු වැඩසටහන් බැංකු විදු පියෙස සහ වෙනත් පිළිගත් දේශීය පුහුණු ආයතනයන්හි දී පවත්වන ලද අතර ඒවා ප්‍රධාන වශයෙන් ආර්ථික විද්‍යාව, සංඛ්‍යාන විද්‍යාව, ගිණුම්කරණය, බැංකුකරණය, තොරතුරු තාක්ෂණය, නීතිය, විගණනය, අරමුදල් කළමනාකරණය, අවදානම් කළමනාකරණය, ලේඛන කටයුතු පිළිබඳ කාර්යයන්, මානව සම්පත් කළමනාකරණය, බැංකු හා මූල්‍ය ආයතන අධීක්ෂණය, මූල්‍ය වෙළඳපොළ, විදේශ විනිමය, ව්‍යවහාර මුදල්, ප්‍රාදේශීය සංවර්ධනය යන අංශ යටතේ විය. බැංකු විදු පියස සහ අනෙකුත් පුහුණු ආයතන මගින් පැවැත් වූ පුහුණු වැඩසටහන් සඳහා සහභාගි වූ නිලධාරීන් සංඛ්‍යාව පිළිවෙළින් 461 ක් සහ 466 ක් විය.

## වැඩමුළු සහ දැනුම හුවමාරුව

2016 වසර තුළ දී පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව, බැංකු විදු පියස සමග එක්ව චෝහාරක ගිණුම්කරණය (Forensic Accounting) යන ක්ෂේත්‍රය ආවරණය කරමින් මහ බැංකු නිලධාරීන්ගේ කාලීනව වැදගත් කුසලතා වැඩි කිරීමේ අරමුණින් වැඩමුළුවක් සංවිධානය කරන ලදී. තවද, 2016 දී, පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව ඉහළ පෙළේ ව්‍යුහගත පුහුණු වැඩසටහන් 02 ක් ද සංවිධානය කරන ලදී. මෙයට අමතරව, අනිකුත් දෙපාර්තමේන්තුවල සහයෝගය ඇතිව පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරනු ලබන මාසික ආර්ථික සංසඳ මාලාව යටතේ බැංකුවේ කාර්ය මණ්ඩලයට දැනුම වර්ධනය කර ගැනීම සඳහා පහසුකම් සලසමින් වසර තුළ දී ආර්ථික විද්‍යාව, බැංකු කටයුතු සහ මූල්‍ය කටයුතු පිළිබඳ කාලීනව වැදගත් විවිධ මාතෘකා පිළිබඳ ක්ෂේත්‍රයේ විශේෂඥයන් විසින් දේශන 06 ක් පවත්වන ලදී. මෙයට අමතරව, පුහුණු හා සංවර්ධන දෙපාර්තමේන්තුව, විදේශීය පුහුණු සඳහා සහභාගි වූ නිලධාරීන් විසින් පවත්වන ලද ඉදිරිපත් කිරීම් 04 කට සහ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතුවලින් පසුව සේවයට වාර්තා කරන ලද නිලධාරීන් විසින් පවත්වන ලද ඉදිරිපත් කිරීම් 09 කට පහසුකම් සලසන ලදී.